# සමීපාතීතයෙහි බෞද්ධාචාර්යයෝ

(ඡායාරූප 20කින් යුක්තයි)

පොල්වත්තේ අගගාරාමාධිපති, දර්ශනවිශාරද
අගගමහාපණ්ඩිත පොල්වත්තේ බුද්ධදත්ත
කල්‍යාණිවංසනිකායේ මහානායක මහාස්ථවිරතුමන් විසින්
සම්පාදිතයි.

# සමීපාතීතයෙහි බෞද්ධාචාර්යයෝ

(ඡායාරූප 20කින් යුක්තයි.)


පොල්වත්තේ අග්ගාරාමාධිපති

දර්ශනවිශාරද

අග්ගමහාපණ්ඩිත පොල්වත්තේ බුද්ධදත්ත

කල්‍යාණීවංශනිකායේ මහානායක මහාස්ථවිරතුමන් විසින්

සම්පාදිතයි.



මේ පොතේ කතෘ වූ
පොල්වත්තේ ශ්‍රී බුද්ධදත්ත නායක මාහිමියෝ

# හැඳින්වීම

"ගුරුකුල" සඟරාවේ පළකිරීම සඳහා මා යැවූ පැරණි ලිපි කීපයක් දුටු ඒ සඟරාවේ හා "ලංකාදීප" පත්‍රයේ කර්තෘ ධුරය දැරූ ජූලියස් ලැනරෝල් මහතා බුරුම නිකාය පිහිටි තැන් පටන් ඓවන තෙක් ශාසනේතිහාසය අඳුරුව තිබේයයි ද එයට පිහිටක් මාගෙන් ලබාගත හැකිවේතැයි සිතන බවද මට දන්වා එවීය. ඒ මහතා අදහස් කළ කාරණය "සමීපාතීතයෙහි බෞද්ධා-චාර්යයෝ" නමැති මේ පොතෙන් ඉටුවන්නේය.

"ථෙරවාදී බෞද්ධාචාර්යයෝ" නමින් මා පළකළ පොතේ බුද්ධඝෝෂ මාහිමියන් පටන් සරණංකර සංඝරාජතුමන් දක්වා සිටි මහතෙරවරුන්ගේ සොයාගතහැකි චරිතයන් ඇතුළත් කෙළෙමි. සියම්නිකාය ලක්දිව පිහිටි කාලයේ පටන් මේ ළඟ කාලය දක්වා විසූ ප්‍රකට ආචාර්යවරයන්ගේ චරිත මේ පොතේ ඇතුළත් කරන ලදි. උත්වහන්සේලාගේ චරිතකථා ලියනවිට ඒ ඒ කාලයට අයත් ශාසනේතිහාසය ද නිතැතින්ම ලියවේ. විශේෂයෙන් සංඝාරවාදයේ ඉතිහාසයත් ඒ වාදය නිසා අමරපුරනිකාය බිහිවීම සැටිත් දක්වීමට වෙහෙසගතිමි. සංඝරවාදයේ ඉතිහාසය මට පවා පැහැදිලිවූයේ මේ පොත ලිවීමට කරුණු සෙවීමේදීය.

ලැනරෝල් මහතා මුලදී කී පරිදි මට ලියාඑව්වේ "ගුරුකුල" සඟරාවට යැවූ ලිපි නිසා පමණක් නොවේ, කලකට පෙර මා ලියූ "කල්‍යාණීශාසනවංශය" නමැති පොතත් දැක සිටි බැවිනි. ඒ පොත ලිවීම සඳහා කරුණු සෙවීමේදී දෙඩන්දූවේ ශෛලබිම්බාරාමයෙහි තිබෙන පරණ ලිපි රාශියක් කියවන්නට සිදුවිය. ඒ ලිපිවලින් ඒ කාලයේ ඉතිහාසයද හෙළිකරගත හැකිවිය. දැන් මේ පොතටද ඒ ලිපිවලින් බොහෝ උපකාර ලැබී තිබෙන බව පොත කියවනවිට වැටහෙනවා ඇත.

මෙහි තිබෙන කරුණු සියල්ලම වාගේ අන්‍ය පොත්පත් හා ලිපි ආශ්‍රයෙන් ලබාගත් ඒවායි. ඒ පොත් අතරෙහි "සංඝරාජ සාධුචරියාව, කරතොටවත, අගලකඩ මහාසාමි චරිතය" යන පොත්ද ශ්‍රී සුමංගල චරිතාදි එක් එක් ආචාර්යවරයා සඳහා වෙන්

වශයෙන් ලියූ චරිතපොත්ද වෙති. ඒ ඒ කරුණු ලබාගත් තැන් ඒ ඒ චරිතයන්හි දක්වා ඇති බැවින් පොත්වල නාමාවලියක් නොයොදෙමි. පොත්වලින් ලබාගත නොහැකි කරුණු ඇතැම් ස්ථවිර වරයන්ගෙන් ලබාගතිමි. ඒ නම් ද ඒ ඒ තැන සඳහන්කොට ඇත.

සමීපාතීතයෙහි සිටි සියලුම බෞද්ධාචාර්යයන්ගේ චරිත මෙහි ඇතුළත්යයි නොකියමි. මෙහි සංග්‍රහ කළයුතු තවත් බොහෝ චරිත ඇත. නිදර්ශන වශයෙන් කියතොත්. ඇම්. ධර්මරත්න ලක් මිණි පහන් කතෘතුමා, අරංගල සිරිධම්ම මහාස්ථවිරතුමා යන ආචාර්යවරයන්ගේ චරිත මෙහි නැත. ඇති තරම් චරිත සියල්ල එක්කිරීම තනි පුද්ගලයකු විසින් කළ හැකි නොවේ. එසේම තවත් චරිත මෙයට එක්කළා නම් මෙය මුද්‍රණය කරවීමත් අපහසුවෙන්ට තිබුණි. මෙවැනි පොත් මුද්‍රණයට ආධාර දෙන්නෝ ලක්දිව නැත්තාහ. එබැවින් මා තැබූ ආදර්ශය ගෙන මෙවැනි සැලකිය යුතු චරිතයන් එක්කොට තවත් පොත් පළකරනමෙන් ලක්දිව සිටිනා සියගණනක්වූ ප්‍රාචීන පඬිවරුන්ගෙන් ඉල්ලා සිටිමි. "අසවල් චරිතය මෙහි ඇතුළත් නොකළේ කුමක් හෙයින්ද"යි මාගෙන් නොවිචාළ මැනවි. මට පහසුවෙන් සොයා ගතහැකි චරිත පළකරනු මිස එවැනි චරිත සියල්ල සෙවීමට මා බැඳී නැත.

මෙහි දක්වෙන චරිතයන්හි ඇතැම් සදෙස් තැන් ඇතිවිය හැක. එවැනි තැන් දුටුවිට කරුණා පෙරදැරිව මට දන්වා එවන සේ ඉල්ලමි. එසේ වැරදී ලියවුණු එක් තැනක් අත්තුඩාවේ ඥාණරතනස්ථවිරයන් විසින් කලින්ම පෙන්වා දෙනලදින් එය සංශෝධනය කෙළෙමි.

මේ චරිතයන් මේ කාලයේදී ලියා නොතැබුවහොත් තව නම් කල්යනවිට මේවා ද බුද්ධඝෝෂචරිතාදිය මෙන් සොයාගැන්ම අපහසු වෙනවා ඇත. එබැවින් මෙය ආධුනිකයන්ට හා අනාගත පරම්පරාවට කරන උපකාරයකි.

මේ පොතේ ඡායාරූප යෙදීමට මුලදී අදහස් නොකළ නමුත් පසුව එසේ කළොත් යහපතැයි සිතුණි. මෙහි තිබෙන ඡායාරූප අතුරෙන් බුලත්ගම මාහිමියන්ගේ ඡායාරූපය උත්වහන්සේගේ අනුශිෂ්‍යවරයෙක් වූ පණ්ඩිත වතුගෙදර අමරසීහ ස්ථවිරයන් විසින් සපයා එවනලදි. අඹගහවත්තේ නායක සවාමීන්ද්‍රයන් ඇතුළු පස්නමකගේ ඡායාරූප මහාබෝධි යන්ත්‍රාලයෙන් ලබාගතිමි. මෙසේ මේ සඳහා මට උපකාර කළ හැම දෙනාට මාගේ අවංක සතුතිය පිරිනමනු ලැබේ. පොතේ පිටකවරයේ තිබෙ

ඡායාරූපය පරණ ඉංග්‍රීසි පොතකින් ලබාගනිමි. එහි දෙඩන්දූවේ පියරතනතිස්ස - වැලිගම සිරිසුමංගල ආදි සම්පාතීනයෙහි විසූ ස්ථවිර පිරිසක් දක්නා ලැබේ. මෙහි බුරුම සඟපිරිසක්ද පෙනෙන බැවින් බුරුමරටින් දළදාකරඬුව ගෙනා කාලයේදී ගත් ඡායා රූපයකැයි සිතමි. අඩුගණනේ මෙය අවුරුදු හැටක්වත් පරණ වියයුතුය.

මේ පොතේ මුද්‍රණය අවසන්වෙන්නට ළංවූ අවස්ථාවේදී ටී. ඇස් ධම්මබන්ධු මහතාගේ "සිංහල වීරයෝ" නමැති පොතද "අඹගහවත්තේ ඉන්දාසභවරඤාණසාමි" නායකමාහිමියන්ගේ චරිතය ද පළවූහ. ධම්මබන්ධු මහතාගේ පොතේ ලක්මිණිපහන් කතුතුමාගේ චරිතය ඇතුළත්ව තිබෙනු දැක ප්‍රීතියට පත්වූ අතරම ඒ මහතා සියම් රටට ගොස් අභිධර්මය ඉගෙනගත්තේය යන ප්‍රවෘත්තිය දැක මහත් කම්පාවටත් පත්වීය. ඒ මහතා බුරුම රටට ගොස් අභිධර්මය උගත් බව අද ලක්දිව වසන බොහෝ දෙනෙකුත් දන්නා කාරණයකි. එතුමාට "බුද්ධසාසන මහාසූරසේනාපති" උපාධිය දෙන ලද්දේ බුරුම කාම්බෝජයයි කියනු ලබන තිබෝ ප්‍රදේශයේ මහා රාජා විසිනි.

අඹගහවත්තේ මාහිමියන්ගේ චරිතය වනාහි අනාතුකකාංසස-සට හා පරවමහතායට කවදත් පුරුද්දක් ඇති මහාස්ථවිරතුමෙකු විසින් ලියනලද්දකි. මගේ කල්‍යාණී ශාසනවංශයට විරුද්ධව ලියූ කොටසක්ද එහි වේ. ඓතිහාසික කාරණයක් බොරුකිරීම හෝ ස්ථිරකිරීම ඓතිහාසික ලිපි පෙන්වීමෙන්ම කළයුතු වුවත් මේ ග්‍රන්ථකර්තෘතුමා එය කරතිබෙන්නේ පෞද්ගලික අපහාස කිරීමෙනි. මා ගැන ලියන එතුමා "පොල්වත්තේ බුද්ධදත්ත ස්ථවිරයන් වහන්සේ වනාහි............විතණ්ඩවාදියෙක් විය.........සුනක්ඛත්තපාක්ෂිකයෙකි............දෙවිඹුන් විශ්වාස නොකරන දේව විරෝධියෙකි..............තම දැනීමට අගෝචරවූ සියල්ල ප්‍රතික්ෂේප කරන වාචීකවාචියෙකි" යනාදිය ලියා තිබේ. තවත් තැනක "මේ දෙපක්ෂයට බුද්ධදත්තලාගේ ඊනියා කල්‍යාණී වංශයෙන් ශුද්ධිය ලබාදුන්නායයි ඔප්පුකරන්නට" යනාදිය ලියා තිබේ. රාමඤ්ඤනිකායේ මහොපාධ්‍යායධුරය දරණ වයෝවෘද්ධ මහාස්ථවිරතුමකුගේ වාග්ව්‍යවහාරය මෙතරම් දරුණුනම් ඊට පහත් පිරිසගේ වාග්ව්‍යවහාරය කෙබඳුද්දැයි සිතාගැන්මට නොහැකිය.

මෙතරම් දරුණු වාග්ප්‍රහාර දෙදූ මේ ස්ථවිරතුමා මගේ කීම බොරුකිරීම සඳහා ගෙනහැරපා තිබෙන දෙවානඳ උපසංඝරාජ-යන්ගේයයි කියන ලිපියකින් "බුද්ධවර්ෂ 2427 (ක්‍රි. ව. 1883)

දෙසැම්බර් මස 30 වෙනිදින බලපිටිමෝදර ගඟේදී" මිරිස්සේ ධම්මානන්ද නායකමාහිමියන් දල්හිකම්යක් ලැබූබව පෙන්වයි. (175 වෙනි පිටේද මේ කාරණයත් වර්ෂසංඛ්‍යාවත් මෙසේම දක්වා තිබේ. මිරිස්සේ මාහිමිතුමා අපවත්වූයේ බු ව. 2420 ඇසළමස පුරපෑලවියදය. උත්වන්කත්සේගේ ආදාහනය පිළිබඳ ලිපියක් ක්‍රි. ව. 1876 යේ ලක්රිවිකිරණ පත්‍රයේ පළව තිබේ. ක්‍රි. ව. 1876 දී අපවත්වූ තෙරනමක් 1883 දී දල්හිකම්යක් ලැබුවේයයි කීම කොතරම් සත්‍යයක්ද? මිරිස්සේ මාහිමියන්ගෙන් පසු අපේ නිකායේ නායකධුරය ලැබූ උඩුගල්පිටියේ මාහිමිතුමාද බු. ව. 2426 දී අපවත් විය. ඊටත් අවුරුද්දකට පසු මිරිස්සේ මාහිමියන් රාමඤ්ඤනිකායිකයන්ගෙන් දල්හිකම්යක් ගෙන තිබේ. ඉතිහාස ලියතොත් ලියන්ට ඕනෑ මෙහෙම තමයි. විවාදයකදී අසභ්‍ය වචන යොදා පෞද්ගලික අපහාස කරන්නේ කාරණය ඔප්පු කිරීමට සාධක නැතිවූවිට බව ලෝකයා දනී. මට විරුඬව ලිවීමට පිටු 12 කටත් වඩා යොදා තිබෙනන් එහි ලියාතිබෙන්නේ ඔවැනි ප්‍රලාපයි.

**වෙනස් කළ යුතු තැනක්:**

20 වෙනි පිටේ පොල්වත්තේ සිඬාර්ථ මහාසථවිරතුමන්ගේ ශිෂ්‍යයන් දක්වන වාක්‍යය මෙසේ වියයුතුය:-

"මුත්වන්කත්සේගේ ශිෂ්‍යයන් අතරෙහි වටිගෙදර සුධර්මාරාමාධිපති කහංකේ අත්ථදස්සී මහාසථවිරතුමාද උයන්වත්තේ රේවත නායක මහාසථවිරතුමා ද වෙති."

පොල්වත්තේ බුඬදත්ත මහාසථවිර.

2-2-1950.
අම්බලම්ගොඩ අග්ගාරාමයේදීය.

# පටුන.


| | | | |
|---|---|---|---|
| | | | පිට |
| 1. | තිබ්බටුවාවේ සිද්ධාර්ථ බුද්ධරක්ෂිත මාහිමියෝ | | 1 |
| 2. | ගිනිගත්පිටියේ සංඝරක්ඛිත මහතෙර | | 1 |
| 3. | සිටිනාමලුවේ ධම්මජෝති මහාස්වාමි | | 2 |
| 4. | වේහැල්ලේ ධම්මදින්න මහාස්වාමි | | 2 |
| 5. | කඹුරුපිටියේ ගුණරතන නායකමාහිමි | | 4 |
| 6. | අත්තරගම රාජගුරු බණ්ඩාර පඬිතුමා | | 4 |
| 7 | කරතොට කීර්ති ශ්‍රී ධර්මාරාම නායක මාහිමියෝ | | 5 |
| 8. | බෝවල ධම්මානන්ද මාහිමියෝ | | 10 |
| 9. | මොරතොට ධම්මක්ඛන්ධ නායක මාහිමි | | 13 |
| 10. | අගලකඩ ධම්මරක්ඛිත ,, ,, | | 15 |
| 11. | මිහිරිපැන්නේ ධම්මරතන හෙරණපාණෝ | | 17 |
| 12. | පොල්වත්තේ ශ්‍රී සිද්ධාර්ථ මහාස්වාමි | | 20 |
| 13. | අඹගහපිටියේ ඤාණවිමලතිස්ස මාහිමියෝ | | 20 |
| 14. | කපුගම ධම්මක්ඛන්ධ | ,, | 28 |
| 15. | කතළුවේ ගුණරතනතිස්ස | ,, | 33 |
| 16. | අත්තුඩාවේ ධම්මරක්ඛිත | ,, | 39 |
| 17. | බෝගහපිටියේ ධම්මජෝති | ,, | 45 |
| 18. | මාතර ධම්මාරාම | ,, | 47 |
| 19. | බෝපාගොඩ සිරිසුමන රාජගුරු | ,, | 50 |
| 20. | ලංකාගොඩ ධීරානන්ද | ,, | 56 |
| 21. | බෙන්තර අත්ථදස්සි | ,, | 64 |
| 22 | වලානේ ශ්‍රී සිද්ධාර්ථ | ,, | 70 |
| 23. | බුලත්ගම ධම්මාලංකාර සිරිසුමනතිස්ස මාහිමියෝ | | 73 |
| 24. | මිරිස්සේ ධම්මානන්ද නායක | ,, | 78 |
| 25. | රත්මලානේ ශ්‍රී ධර්මාලෝක | ,, | 88 |
| 26. | සිප්කඩුවේ ශ්‍රී සුමංගල නායක | ,, | 92 |
| 27. | අඹගහවත්තේ ඉන්දාසභවරඤාණසාමි | ,, | 98 |
| 28. | අඹගහපිටියේ විමලසාරතිස්ස නායක | ,, | 109 |
| 29. | දෙඹත්දූවේ පියරතනතිස්ස ,, | ,, | 112 |

| | | |
|---|---|---|
| | | පිට |
| 30. | වැලිගම ශ්‍රී සුමංගල ,, ,, | 116 |
| 31. | රත්දෙඹේ ධම්මාලංකාර ,, ,, | 120 |
| 32. | බිමත්තේ අභයතිස්ස ,, ,, | 122 |
| 33. | වස්කඩුවේ ශ්‍රී සුභූති ,, ,, | 126 |
| 34. | යාත්‍රාමුල්ලේ ධම්මාරාම ,, ,, | 131 |
| 35. | මොහොට්ටිවත්තේ ගුණානන්ද මහාස්වාමි | 136 |
| 36. | මොරගොල්ලේ බුද්ධසිරිතිස්ස මහාස්ථවිරතුමා | 139 |
| 37. | අලුත්ගම ශ්‍රී ශීලස්කන්ධ නායක මාහිමියෝ | 140 |
| 38. | රත්මලානේ ධර්මාරාම ,, ,, | 144 |
| 39. | අම්බලම්ගොඩ දේවානන්ද උපසංඝරාජ නායක මාහිමියෝ | 149 |
| 40. | බැද්දේගම රතනපාල ,, ,, | 151 |
| 41. | අම්බලම්ගොඩ ශ්‍රී ධම්මාධාර රාජගුරු මහාස්ථවිරතුමා | 154 |
| 42. | කාෂාවරණ වංග මහාස්ථවිරතුමා | 162 |
| 43. | මහගොඩ ඥානේශ්වර නායක මාහිමියෝ | 164 |
| 44. | කහවේ රතනසාර ,, ,, | 166 |
| 45. | ලුණුපොකුණේ ශ්‍රී ධම්මානන්ද ,, ,, | 170 |
| 46. | මොරටුවේ මේධානන්ද මහාස්ථවිරතුමා | 174 |
| 47. | වැලිපටන්විල දීපංකර ,, | 176 |
| 48. | කොග්ගල ගුරුතුමා (පණ්ඩිතතිලක) | 179 |
| 49. | දොන් අන්දිරිස් ද සිල්වා බටුවන්තුඩාවේ පඬිතුමා | 182 |
| 50. | ගරු ජේම්ස් ද අල්විස් ,, | 185 |
| 51. | තුඩාවේ පණ්ඩිතගුණවර්ධන ,, | 187 |
| 52. | රොබට් සීසර් චිල්ඩර්ස් ,, | 189 |
| 53. | තෝමස් විලියම් රයිස් ඩේවිඩ්ස් ,, | 190 |
| 54. | විල්හෙල්ම් ගයිගර් ,, | 196 |
| 55. | සයිමන් ද සිල්වා වාසල මුදලිතුමා | 198 |
| 56. | දෙඹන්දුවේ ශ්‍රී ධර්මසේන විද්‍යාසාගර පඬිතුමා | 199 |
| | සංඥානාම සූචිය | 207 |

# සම්පාතීතයෙහි බෞද්ධාචාර්යයෝ

නමෝ බුද්ධාය.

## 1. තිබ්බටුවාවේ සිද්ධාර්ථ බුද්ධරක්ෂිත මාහිමියෝ.

(ක්‍රි. ව. 1700 – 1770 පමණ.)

සරණංකර සංඝරාජ මාහිමියන්ගේ ප්‍රධාන ශිෂ්‍යවූ සිද්ධාර්ථ බුද්ධරක්ෂිත මහාස්ථවිරතුමා දඹදෙණියේ පණ්ඩිත පරාක්‍රමබාහු රජු පටන් කීර්තිශ්‍රීරාජසිංහ රාජකාලය දක්වා මහාවංශය පාළියෙන් ලිවීය. ශ්‍රීසද්ධර්මාවවාදසංග්‍රහ නමැති විශාල සිංහල බණ පොතක් ද සතිපට්ඨානසූත්‍රයට සන්නයක් ද සම්පාදනය කොට සද්ධම්මෝපායන නමැති පාළිපොත එළුවට නැඟීය. පනාලියේ ගල්ලෙණෙහි බුද්ධ රූපයක් බඳවා රිදීවිහාරය මහත් ප්‍රතිසංස්කරණයට පමුණුවා, බොහෝ පොත්පත් ලියවා රිදීවිහාරයෙහි තැබ්බවීය. මූන්වහන්සේ සංඝරාජෝත්තමයන් ජීවත්ව සිටියදීම අපවත් වූහ.

## 2. ගිනිගත්පිටියේ සංඝරක්ඛිත මහා ස්ථවිරතුමා.

(බු. ව. 2253 – 2310 පමණ.)

සරණංකර සංඝරාජතුමත් විසි වයස් පිරි සාමණේර නමක්ව සිටි කාලයේදී සත්කෝරළේ රජමහ විහාරයේදී පිණ්ඩපාතයේ යෑම ආදී මහණ පිළිවෙත් පුරන්ට පටන් ගත්තේය. එකල්හි තෙළෙස් (13) වියැති සංඝරක්ඛිත හිමියෝ 'සිල්වත්' ව්‍යවහාරයෙන් පැවිදිව ශබ්දශාස්ත්‍ර උගනිමින් බු. ව. 2269 යේදී මහණ පැවිද්ද ලැබීය. බු. ව. 2296 යේදී උපාලි මහාස්ථවිර ප්‍රමුඛ සියම් සංඝයා වෙතින් උපසම්පදාව ලැබීය. උපසම්පදාවෙන් දශ වස් පිරුණු පසු සත්කෝරළේ සංඝනායක තනතුරට පත්ව මැද්දේපොල විහාරස්ථානයෙහි විසීය. සංඝරාජෝත්තමයාණන් අපවත්වූ පසු උන්වහන්සේට පින් පැමිණවීම සඳහා පිච්චමල් තුන්ලක්ෂ හැටදහසක් ද පහන් දෙදහසක් ද පුදා සියක්නමක් භික්ෂූන්ට සිවුරු සියයක්, කලාල පැදුරු 400ක්, කෝප්ප 180ක්, ලේන්සු 140ක් යනාදිය පරිත්‍යාගකොට පින් පැමිණවිය.

# 3. සිටිනාමළුවේ ධම්මජෝති

# 4. වේහැල්ලේ ධම්මදින්න මහාස්වාමිවරු.

(ක්‍රි. ව. 1698 – 1779 පමණ)

"සංඝරාජ සාමිදරුවෝ ව්‍යාකරණ උගත්තා ප්‍රසථාවේම පළමුවෙන්ම ව්‍යාකරණ ඒ සාමිදරුවන්ගෙන් උගත් සිටිනාමළුවේ සිල්වත් පින්වත් ගුණවත් නම උපාලි මහාස්ථවිර සාමීන්ගෙන් සාමණේරකමත් උපසම්පදාවත් ලැබ සවකීය රාජ්‍යවූ මාතොට දිශාවටම ගොස් කහඳුවේ මුදියන්සේ විසින් කරවා දෙනලද එම ගම පන්සැල්හි විසීමෙන්, සඟිඅටුවාදී බොහෝ පොත් ලියවීමෙන්, ඒ දේ තෝරා කීමෙහි සමර්ථකරවූ වේහැල්ලේ ධම්මදින්න උන්නාන්සේ ඇතුළුවූ ශිෂ්‍යගණයා බොහෝකොට අපිස් සතොස් ගුණ ලෙසින් කල් යවා එම කහඳුවේදීම කාලක්‍රියා කළාය" යන වාක්‍යය සංඝරාජ සාධුචර්යාවෙහි එන්නකි.

"ඒ සිටිනාමළුවේ උන්නාන්සේගේ ශිෂ්‍යවූ වේහැල්ලේ යථොක්ත ධම්මදින්න උන්නාන්සේට මාලිම්බඩ උන්නාන්සේට ලැබී තිබුණු පැල්මඩුල්ල - කුට්ටාපිටිය දෙකත් සහ මාතොට දිශාවේ සංඝයාට නායක තනතුරත් ලබා දෙමින් සමතොළ පූජාවත් පවත්වන හැටියට සංඝරාජ සාමිදරුවන් විසින් පමුණුවන ලද්දාවූ ඒ ධම්මදින්න නායකඋන්නාන්සේ ද තමන් වහන්දෑගේ ශිෂ්‍යවූ පොළොම්මාරුවේ, දම්පහල යන උන්නාන්සේලා දෙනම්ට අංගොතතරසඟිය පාඩම් කරවා නුවර අඬගාගෙන ආනෑතේදී වසූරි රෝග පැමිණ ඒ දෙනම මූලාසිවුණාය." යන්නත් ඒ පොතේම පෙනේ.

අගලකඩ මහාස්වාමි චරිතයෙහි මුන්වහන්සේ ගැන මෙසේ දැක්වේ:- "වේහැල්ලේ නම් ඇති දහම් දන උගත් සිල්වත් තෙම "කොටවාය" නම් ගම වසනුයේ සෙංකඩගල නුවර උපසම්පදාව පිහිටවූ බව අසා පිරිස් සහිතව එහි සම්ප්‍රාප්තව සංඝරාජ මහා ස්වාමිපාදයන් වහන්සේ වෙතින් වේහැල්ලේ ධම්මදින්න යන නමින් ප්‍රව්‍රජ්‍යෝපසම්පදාව ලද්දේය. ඉන්පසු කරුණා ගුණයෙන් ආර්ද්‍රවූ ඒ සංඝරාජෝත්තමයන් වහන්සේ කීර්තිශ්‍රී රාජසිංහ මහ රජතුමාණන්ගේ ද සමානච්ඡන්දයෙන් කුට්ටාපිටිය නම් ගම්වරය සමඟ ශ්‍රීපාදස්ථානයේ හිමිකම් හා පාතරට සංඝනායක පදවිය ද දෙවා වදාළ සේක."

සාරතොටවත නමැති ග්‍රන්ථයෙහි දැක්වෙනසේ මේ වේහැල්ලේ ධම්මදින්න මහාස්ථවිරතුමා තංගලු දිස්ත්‍රික්කයේ

ඛහගල් විහාරයට අයත් "කහඳගල" නම් විවේකාරාමයෙහි මහත් ශිෂ්‍ය සමූහයකට ධර්මශාස්ත්‍ර උගන්වමින් විසීය. ලක්දිව උපසම්පදාව පිරිහී ගිය බැවින් පණස්විය ඉක්මෙන තුරුත් උපසම්පදාව ලැබීමට නොහැකිව සිටි හෙරණඛාණෝ බු. ව. 2296 යේදී සියම් රටින් උපසම්පදාව ගෙනැවිත් මෙහි උපසම්පන්නයන් ඇතිකළ බව අසන්ට ලැබී මහත් ප්‍රීතියෙන් සවකීය ශිෂ්‍යයන් දෙවිසිනමක් සමඟ මහනුවරට ගොස් උපසම්පදාව ලබාගත්හ. මින්පසු මෙතුමාට පාතරට නායකකම් පමණක් නොව සබරගමුවේ පොත්ගුල් විහාරයත් පැල්මඩුල්ලේ විහාරයත් ලැබුණ බැවින් වරින්වර ඒ විහාර දෙකේ වාසයකොට සගරද හිමියන් ජීවත්ව සිටියදීම පොත්ගුල් විහාරයේදී අපවත් වූහ.

මුත්වහත්තේගේ ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාව පාතරට බොහෝසේ පැතිරගිය එකක් විය. කරණකොටවත නමැති පොතේ දක්වෙන පරිදි සංක්ෂේපයෙන් ඒ පරම්පරාව මෙසේයි. (1) මාලිම්බඩ මහාස්ථවිරතුමා, (2) පාතරට නායක ධුරය දැරූ කඹුරුපිටියේ ගුණරතන මහාස්ථවිර, (3) එම නායක ධුරය දැරූ දෙවෙනි කඹුරුපිටියේ මහාස්ථවිර, (4) මහකඳුරුපොකුණේ සුවර්ණජෝති මහාස්ථවිර, (5) කෝන්ගස්තැන්නේ මහාස්ථවිර, (6) මහකිරිතැළියේ මහාස්ථවිර, (7) පල්ලත්තර පුඤ්ඤසාර මහාස්ථවිර, (9) කැටගොඩ රතනජෝති මහාස්ථවිර, ([illegible]) අගලකඩ ධම්මරක්ඛිත පාතරට නායක මහාස්ථවිර.

(1) මෙසින් මහකඳුරුපොකුණේ සුවර්ණජෝති මහ තෙරුන්ගේ ශිෂ්‍යයා කරණකොට නායක ස්වාමීන්ද්‍රයෝය. ඒ සම්බන්ධයෙන් සංඝරාජ සාධුචරියාවෙහි මෙසේ දක්වේ:- "සබඳ සිරිනාමනුමේ උන්නාන්සේගේ [illegible] කඳුරුපොකුණේ වහන්දගේ ශිෂ්‍යවූ කරණකොට උන්නාන්සේ ද මල්වත්තේ විහාරේදීත් අත්තරගම බණ්ඩාර ගුරුන් කෙරෙහුත් උගතමනා ලිම් කිම් බණ දහම් ශබ්ද ශාස්ත්‍රාදිය ඉගෙණ ශිෂ්‍යගණ පරිහරණයෙන් කල් යවනවාය." මේ සුවර්ණජෝති මහාස්ථවිරතුමා කොටවාගේ ද ඛහගල් විහාරයේද කංගල්ලේ මහාවිහාරයේද වාසයකොට පසුව මාතර නගරයේ චේරගම්පිට විහාරයේ නිත්‍ය වාසයට පැමිණියේය.

(7) පල්ලත්තර පුඤ්ඤසාර මහා ස්ථවිරතුමා ගාල්ලේ කච්චිවත්තේ විහාරයෙහිත් තෙල්වත්තේ තොටගමු විහාරයෙහිත් විසීය. හික්කඩුවේ ශ්‍රී සුමංගල මාහිමිතුමා මේ පරම්පරාවෙහි වූවෙකි.

මෙහි කියවුණු සිටිනාමලුවේ මහා සථවිරතුමා දුරාවේ කුලයට අයත් යසිද වේහැල්ලේ නායක හිමිතුමා හැකති කුලයට අයත් යසිද ප්‍රකාශ කරන ලිපි අපට දකින්ට ලැබී තිබේ.

## 5. කඹුරුපිටියේ ගුණරතන නායක මහා ස්ථවිරතුමා.

(ක්‍රි. ව. 1700 - 1780 පමණ)

වේහැල්ලේ ධම්මදින්න මහතෙරුන්ගේ ශිෂ්‍ය දෙනමක් මහනුවරදී වසූරිය වැලඳීමෙන් අපවත්වූ බව උඩින් කියවුණි. ඒ මහාස්ථවිරතුමාගේම ශිෂ්‍යවූ කඹුරුපිටියේ ගුණරතන මහා-ස්ථවිරතුමා අංගුත්තරනිකාය - මැදුම්සඟිය - ධම්මසංගණිය - පාරාජිකපාළිය - අභිධර්මාර්ථසංග්‍රහ යන පොත් කටපාඩම් කර සිටියෙකි. වසූරි රෝගය පැමිණි අවස්ථාවේදී එතුමා සංඝරාජ මාහිමියන් සමග සතර කෝරළේ සත්කෝරළේ දෙකෙහි ඇවිද රෝගය සංසිඳුණු පසු මහනුවරට ඇවිත් කීර්තිශ්‍රී මහරජු සහිත පිරිසක් මැදදී සඟිබණ කටපාඩමෙන් කීය. මෙසේ නොයෙක් තැන ධර්මදේශනා කරමින් වසනවිට සවකියාවායයි වේහැල්ලේ මහතෙරුන් අපවත්වූ බව අසා එහි යන්ට සැරසෙන විට සංඝරාජතුමා ඒ ධම්මදින්න මහතෙරුන්ට දී තිබුණ පාතරට නායක පදවියත් ශ්‍රීපාදයේ නායක පදවියත් මෙතුමාට පැවරීය. එහි ගොස් හැරී අවුත් මල්වතු විහාරයේ වසන කාලයේදී සංඝරාජ තුමන්ගේ අපවත්වීම සිදුවිය. උන්වහන්සේගේ මරණමංචකයේදී ආසන්න බණ කීවේ මේ ගුණරතන මහා-ස්ථවිරතුමාය.

## 6. අත්තරගම රාජගුරු බණ්ඩාර පඬිතුමා.

(ක්‍රි. ව. 1700 - 1770 පමණ)

විමලධර්ම මහරජුගේ කාලයේ පටන් පැවතෙන බණ්ඩාර පරම්පරාවක උපත් මේතෙම බාලකාලයේදී මහනුවර පෝයමලු විහාරයෙහි විසූ කොබ්බෑකඩුවේ සිරිනිවාස නායක තෙරුන්-ගෙන් ලිවීම් කීම් ඉගෙන වැලිවිට සංඝරාජෝත්තමයන්ගෙන් පාලි ව්‍යාකරණාදිය ඉගෙන වසන්නේ කීර්තිශ්‍රී රාජසිංහ මහරජුගේ අවසරය ලබාගෙන පැවිදිවී උපාලි මහතෙරුන් ප්‍රමුඛ සංඝයා පැමිණි කල්හි උපසම්පදාව ලැබීය. පසුකලක උපාධ්‍යාය භාවයට පත්ව බොහෝ ශිෂ්‍යයන් පුහුණු කරවමින්

සිටිනාවිට පරසතුරු උපද්‍රවයක් පැමිණි බැවින්, මහරජුගේ නියමය ලෙස මහණකම අතහැර ගියේය. ඒ සතුරු උවදුරු ඉක්මගිය පසු රාජගුරු භාවයට පැමිණ කාරක පුෂ්පමඤ්ජරිය, සූධීරමුඛමණ්ඩනය, ශබ්දමාලාව, වෘත්තාවතාරය යන පොත් නිපදවිය.

මිලිඳු ප්‍රශ්නය සිංහලට නැගූ හීනටිකුඹුරේ සුමංගල මහා ස්ථවිරතුමා මේ බණ්ඩාර රාජගුරු තුමාගේ පැවිදි කාලයේ ශිෂ්‍යයෙකි.

## 7. කරතොට කීර්තිශ්‍රීධර්මාරාම නායක මාහිමියෝ

(බු. ව. 2278-2370.)

වර්තමාන යුගයෙහි පාතරට දියුණුවූ ධර්මශාස්ත්‍රීය පරම්පරාවේ ආදි පුරුෂොත්තමයෙක්වූ කරතොට නායක ස්ථවිරතුමා බු. ව. 2278 දී මාතර කන්දබඩ පත්තුවේ කරතොට නම් ගමේදී ජනිත විය. එගම්හි උසස් පෙළපතකට අයත් විජේසිංහ අප්පුහාමි ද සමරකෝන්ගෙයි ලොකුහාමිනේ ද මෙතුමාගේ මවුපියෝ වූහ. මෙකල මෙන් පාඨශාලා සුලභ නොවූ ඒ කාලයේදී සිංහල බාලයන් අකුරු ඉගනීම කළේ පන්සල්වලය. එබැවින් මෙකුමරුට අකුරු ඉගැන්වියයුතු කාලය පැමිණිවිට මාතර වේරගම්පිට විහාරයෙහි වැඩවිසූ මහකඳුරුපොකුණේ සුවර්ණජෝති මහාස්ථවිරයන් වෙත පමුණුවන ලදී. අකුරු ඉගෙනීමේදී මහණ වෙන්ට කැමති වූ මේකුමරා යොග්‍ය වයසේදී එකී සුවර්ණජෝති මහතෙරුන් වෙත පැවිදිවිය.

පැවිදිවීමේදී ධර්මාරාම නාමය ලැබූ මේ සාමණේරයන් කලකට පසු මහනුවර මල්වතු විහාරයට පමුණුවා ඉගැන්වීම සඳහා අත්තරගම රාජගුරු බණ්ඩාර තුමාට භාරදුන්හ. ඒ පඬිතුමා වෙතින් සිංහල-පාලි-සංස්කෘත භාෂාවන්ද අන්‍ය ශාස්ත්‍රයන් ද ඉගෙන ව්‍යක්තභාවයට පත් මේ සාමණේර තෙමේ එහිදීම උපසම්පදාව ලැබ රාජගුරු බණ්ඩාරතුමාට සහායාචාර්යයකු වශයෙන් ඉගැන්වීම ද කෙළේය.

මෙකල මහනුවර රාජ්‍යය කෙළේ කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමාය. තෙතිස් වසක් රාජ්‍යය කළ ඒ ධාර්මික රජු බු. ව. 2323 දී පරලොව ගිය පසු එතුමාගේ සොහොයුරු කුමරෙක් රාජාධිරාජසිංහ නමින් රාජ්‍යයට පත්විය. මේ රජුගේ කාලයේදීත් මල්වතු විහාරයෙහි ඉගැන්වීම කරමින් සිටි කරතොට ධම්මාරාම ස්ථවිර තුමාට සබරගමු දිශාවේ හා ශ්‍රීපාදස්ථානයේ නායක පදවිය ලැබුණි

මින්පසු උඩ පාත දෙරටේ මහානායක පදවිය තමන්වහන්සේට පත්කළයුතු යයි ඉල්ලීම නිසා උදහසට පත් රජතෙමේ මේ නායක සඵවීරතුමා මහනුවරින් පිටකරන ලෙස නියම කෙළේය. (උඩරට - පාතරට භේදය මෙහිදී මතුවූවා වියහැක.) රාජ නියමය පරිදි එතුමා කටුගස්තොටින් එතර කරවා සිරබාරයේ තබන ලදී. එකල්හි මහා විවේකය ලත් මෙතුමා සංස්කෘත පාණ්ඩිත්‍යය හෙළි කරමින් කවි තුනකින් කවි දොළසක් කියැවෙන පරිදි බාරස කාව්‍යය නමැති දුෂ්කර ප්‍රබන්ධය ලියා රජතුමන් වෙත යැවීය. රජතුමා ද සිංහල කාව්‍ය බන්ධනයෙහි දක්ෂව අනදීන ජාතකය කවියට නැගූ පුද්ගලයකු වුවත් මේ කාව්‍යය තේරුම් ගැනීමට අසමර්ථ වූ බැවින් එසල මල්වතු විහාරයේ විසූ උගතුන් සහිත සභාවකට මෙය තෝරන සේ බාර කෙළේය. ඒ සභාවේ කිසිවකු-වත් මෙය තේරිය නොහැකිවූ බැවින් රාජගුරු බණ්ඩාරතුමාගේ මෙහෙයීම ලෙස රජතුමා කරතොට නාහිමියන් නිදහස්කොට ගෙන්වා ප්‍රබන්ධය කියවා අදහස් පැහැදිලි කරන සේ ඉල්වීය. එවිට නාහිමියෝ කවි දොළස වෙන් වශයෙන් කියවා අර්ථ පැහැදිලි කළහ. මෙසින් පැහැදුණු රජතුමා එවේලෙහිම වස්ත්‍ර යුග්මයක් පූජාකොට අටකලන් කෝරලයේ සංඛපාල විහාරය ඇතුළු "පල්ලේබැද්ද" නම් ගම පඬුරුගම් වශයෙන් දී පාතරට නායක පදවිය ද පැවරීය. ගලින් තෙලූ බුද්ධ ප්‍රතිමාවක් සහිත ගුහාවක් ඇති මේ සංඛපාල විහාරය දුටුගැමුණු රජුගේ ඵුසදෙව නම් යෝධයා විසින් කරවන ලද්දකැයි කියත්.

"පල්ලේබැද්ද" ගම පරිත්‍යාග කිරීමේදී උන්වහන්සේට දුන් තුඹපත මෙසේයි:- "පාතරට තනතුරට පත් කරතොට ධර්මාරාම නායක උන්නාන්සේ විසින් බාරස කාව්‍ය ගබ් නාමචක්‍ර නම්වූ අති දුෂ්කර ප්‍රබන්ධය කොට ශ්‍රීලංකේශ්වරවූ උතුම් ශ්‍රීරාජාධිරාජසිංහ මහ වාසලට දක්වාපු දවස ශ්‍රීනෙත්‍රයෙන් බලාවදාරා කාව්‍යශාස්ත්‍රඥ බැවින් කවි තුනකින් කවි දොළසක් ද අවිරුද්ධව තිබෙන්ඩ කිරීම ඉතා දුෂ්කරය, ආශ්චර්ය අද්භූතයයි විශේෂයෙන් පැහැද වදාරමින් සතුති ප්‍රශංසා සමග අතසී පිළීකට්ටුවක් ලැබී අනතුරුව සපරගමු දිශාවෙන් අටකලන් කෝරලය බද තඹගමු පත්තුවෙන් සංඛපාල විහාරය පිහිටි පල්ලේබැද්ද යන ගම ලැබෙන්ඩ කාරුණාවට ඒත්තු වී සෙසු ලැබුම් සේ නොව මෙම ගම සපාරම්භයිමට ඇතුළත්වූ උඩවැල්ලාවේ අස්වැද්දුම පටන් සජීව අජීව - වස්තුසුද්ද දිශාපති-දිශාවැසි කොයිතරම් කෙනෙක් විසින්වත් කිසිම ආරෝවක් නගතමක් බලයක් පුළුවන්කමක් කරන්ඩ කරවන්ඩ බැරි ලෙසට ද මෙම නායක උන්නාන්සේගේම මනාප අභිප්‍රායක් කිරීමට පුළුවන්

ලෙසට ද බලෙන් සමග සියළුම ගම තිරවුල් කොට තැපසරුප් මගයෙන් සිවුපසය පිණිස නින්දබත්ගම් කොට පූජාකර වදාළ බවට— සකවර්ෂ එක්වාදහස් සත්සිය අටට පැමිණි මේ වර්ෂයෙහි දුරුතු පුර දසවක් ලත් ගුරුදින මේ තුඩපත ලියා දුන්සේදීත්—

ඒ වගත් මෙසේම- යටිනුවර අතපත්තු වූ ද මහ අරමුදලේ මන්ත්‍රී නිලේ ද සළුවඩන නිලේ ද ගිලීමලේ බඹරබටුව සපරගමු දිශාව ඇතුළුව මහනුවර උඩගම්පගේ මහඅදිකාරම් නිලමේ කරවන මැදුඹම්වෙල වික්‍රමසිංහ චන්ද්‍රශේකර කරුණාතිලක සෙනෙවිරත්න පණ්ඩිත මුදියන්සේ රාළහාමි වම්හ”

මෙසේ රජපූජිත වූ කරතොට නාහිමියෝ බු. ව. 2329 යේදී උඹරට වාසය අත්හැර මාතරට පැමිණ එහි වෙහෙරගම්පිට විහාරස්ථානයේ නැවතුණාහ. ඒ කාලයේදී මෙහි ඕලන්දආණ්ඩුව පැවැත්තේය. එකල විසූ ආණ්ඩුකාරයා “ෆෙන්ද ග්‍රාෆ්” නමැත්තෙකි. ඒ ආණ්ඩුකාරයා සමග ලියුම් ගනුදෙනු කළ කරතොට නාහිමියන්ට ස්වකීය නායක පදවියේ බලය පාවිච්චිකිරීමට ආණ්ඩුකාරයාගෙන් බලපත්‍රයක් ලැබුණා පමණක් නොව ඕලන්ද ආණ්ඩුවෙන් මාස්පතා පතාග 25 ක් ගෙවන ලෙස තියමයක් ද ලැබුණි.

ඕලන්ද ආණ්ඩුවට යටත්ව පැවති පාතරට පෙදෙස බු. ව. 2340 දී ඉංග්‍රීසීන්ගේ පෙරදිග ඉන්දියානු සමාගමට අයිති විය. ඒ කාලයේදී මාතර පළාතේ දිශාපති ධුරයට පත් ජෝන් ඩොයිලි මහතා කරතොට නාහිමියන්ගෙන් සිංහල ඉගෙනගත්තේය. පසුව ඒ මහතා ලංකාණ්ඩුවේ ප්‍රධාන භාෂාපරිවර්තක ධුරයට පත් විය. මහනුවර ඉංග්‍රීසීන්ට යටත්වූවාට පසු එහි රෙසිඩන්ට් ධුරයට පත්ව ගියේය. ක්‍රි. ව. 1805 ගේදී ලක්දිව මුදුබඩ පලාත්වල ආණ්ඩුකාර ධුරයට පත් සර් තෝමස්මේට්ලන්ඩ් මහතා මාතර විසූ තෝමස් ඊඩන් නමැති දිශාපතිතුමාට එවූ ලිපියක ඒ පලාතේ ප්‍රකට උගතකුව වසන කරතොට මාහිමියන් ආශ්‍රය කරමින් මිත්‍රව වාසය කරන ලෙස දනුම්දී තිබේ. ඉන් අවුරුදු හතකට පසු මුළු ලක්දිව ආණ්ඩුකාර ධුරයට පත් සර් බ්‍රවුන්රිග් තුමා කරතොට මාහිමියන් කැඳවා තොරතුරු විමසා එතුමාගේ නායක පදවිය එසේම ස්ථිර කෙළේය.

මෙසේ ලෝක ශාසන සංග්‍රහ කළ මුන්වහන්සේ දෙයානූ වසක් ආයු වලදා බු.ව.2370දී ස්වර්ගස්ථ වූහ. මුන්වහන්සේගේ භස්මාවශෙෂ තැන්පත් කළ ස්තූපය වේරගම්පිට විහාරස්ථානය සමීපයෙහි තිබේ. මුන්වහන්සේගේ අපවත්වීම සම්බන්ධයෙන් සුප්‍රකට බෝවල ධම්මානන්ද නාහිමියන් කළ ශ්ලෝකයක් මෙසේයි:-

"ශ්‍රීශාකෙ ඛත්විසෞඛ්‍යෙ දශසතකිරණෙ යුග්මගෙ භාගධෙයෙ
ශ්‍රීමර්තෞ පූජිපක්ෂෙ හරිහරගුරුතො යුක්තිථෞ හෞම්වාරෙ
විංශත්‍යාද්‍යා මහොඝො තිධතමුපගතො නෙතුරාද්‍යඃසත්‍යාපෙක්ෂා
ධර්මාරාමාභිධානො යතිරධිතිපුණො ධර්මවිඥකලාප්‍ය."

කරතොට නායක මාහිමියන්ගෙන් ඉගනීම ලැබූ ශිෂ්‍යයන් අතර අතිශයෙන් ප්‍රකට භාවයට පැමිණියෝ නම්- 1. ගාල්ලේ මේධංකර, 2. කටුකුරුන්දේ ධම්මානන්ද, 3 මිහිරිපැන්නේ ධම්මරතන, 4. වලගෙදර ධම්මදස්සී, 5. හෙට්ටිගොඩ සුමංගල, 6. බෙන්තර අත්ථදස්සී යන මහා ස්ථවිරවරුය.

මේ නායක මාහිමියන් පිළිබඳ ජීවන චරිතය ලිවීමට බොහෝ සේම උපකාර වූයේ මාතර වේරගම්පිට විහාරවාසිවූ ද විද්‍යාකීර්ති පිරිවෙන්හි ආචාර්යවූ ද වේරගම්පිට නන්දාරාම ස්ථවිරතුමන් විසින් සම්පාදිතව 1940 දී මුද්‍රිත වූ "කරතොට චත" නමැති පොතයි. පල්ලේබැද්ද පරිත්‍යාග කිරීමේ තුඩපත හා බෝවල ස්වාමීන්ද්‍රයන්ගේ ශ්ලෝකය උපුටාගන්නා ලද්දේ ඒ පොතෙනි. කරතොට මාහිමියන් කළ පාලි-සංස්කෘත ප්‍රබන්ධ කීපයක් ද බාරසභාව්‍යඞ්ග චක්‍රය ද ඒ චක්‍රයෙන් කියවෙන කවි දොළස හා ඒ කවිවල සන්න ද ඒ පොතේ දක්වා තිබේ. එයින් කරතොට මාහිමියන් බැල කාලයේ දී බුද්ධවන්දනාව පිණිස කළ ධර්ම රාජාෂ්ටකයේ මුල් ගාථාව මෙසේයි:-

"ඵුල්ලින්දීවරතුල්‍යනීලනයනං සම්පුණ්ණසොම්මානනං
චන්දාදිච්චසහස්සනින්දිතපභං ලොකෙකබන්ධුං ථුතං
සංසාරොදධිපාරගුං අමතදං සබ්බඤ්ඤුභාවං ගතං
සිස්සාලීහි නිසෙවිතඞ්ඝිකමලං තං ධම්මරාජං නමෙ."

කීර්තිශ්‍රී රාජසිංහාෂ්ටකයේ දෙවෙනි ගාථාව:-

"පත්වේනෙනා සුගතනත්තනං සිරිධරො රාජාධිරාජස්සරො
සත්‍යාමින්දු'තිය බුද්ධසූනුයතයො ලඞ්කාසිමං සාසනං
සොධෙත්වාන සුජොතයිත්ථ මතිමා කාසායවත්ථෙහි යො
සො'යං ධම්මිකසීහලින්දපවරො රාජා චිරං ජීවතු."

මේ පාලි ප්‍රබන්ධයන් හැම ආකාරයෙන්ම චමත්කාරජනක බව කියනු කැමැත්තෙමි. විස්තර දැනගනු කැමැත්තන් ඒ පොත කියවනු මැනවි. මේවා විභාගවිය නොදී මුද්‍රණයෙන් ප්‍රචාරය කිරීම ගැන නන්දාරාම ස්ථවිරතුමාට සාහිත්‍යාභිලාෂීන්ගේ ස්තුතිය හිමිවිය යුතුය. කරතොට මාහිමියන්ගේ පමණක් නොව තවත් බොහෝ ප්‍රකට තෙරවරුන්ගේ චරිත පිළිබඳ කරුණු ඒ පොතෙන් දැනගත හැක.

එතුමාගේ බාරස කාව්‍ය ගර්භචක්‍රය මෙසේයි:-

| | 6 | | | | | | | 5 | | | | | | | 4 | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 4 | 3 | 2 | 1 | | | | 4 | 3 | 2 | 1 | | | | 4 | 3 | 2 | 1 | |
| 1 — 1 | සි | සි | සි | සි | ද | ස | ල | නි | නි | නි | නි | නි | ර | ජ | ල | ල | ල | ල | 4 |
| 2 | සි | රි | ව | ල | දි | ය | ත | ව | ස | ව | මු | සි | ත | ද | කු | ස | ක | ල | 3 |
| 3 | සි | දි | බ | ව | ගි | ම | ත | ර | ග | ත | ග | මි | ණ | ප | ළ | ත | ස | ල | 2 |
| 4 | සි | රි | ග | ත | නි | ර | ත | ත | ම | දි | මි | ත | ව | ත | නු | ව | ත | ල | 1 |
| | ත | ස | ත | ග | | | | නි | ර | ය | ද | | | | නි | ස | දු | වි | |
| | ද | ර | පු | ත | | බර | | මි | හ | ද | ම | | නාම | | දි | ද | ර | ද | |
| | ත | ස | ත | ත | | | | ද | සි | ද | ත | | | | ස | සෙ | ම | සි | |
| 2 — 1 | ත | ව | ර | ද | ත | ව | ස | සි | රි | ප | ත | ල | ම | කි | ම | ත | ර | ක | 4 |
| 2 | ත | ර | ම | ත | ත | ත | ත | ව | සු | ල | ව | ත | ම | සු | ප | ස | ස | ක | 3 |
| 3 | ත | ත | ස | ද | ද | ම | ත | ස | ල | ස | නි | රි | සි | රු | ත | ද | පි | ක | 2 |
| 4 | ත | ත | සු | ස | ත | ද | පු | ර | ත | ර | සු | ත | ම | දු | වි | ත | ග | ක | 1 |
| | දු | ක | ව | ත | | | | ත | ව | ද | ද | | | | ස | ස | බි | ත | |
| | මි | ද | ළු | ප | | ශබ | | ව | ද | ත | රි | | සඝ | | ක | ව | ද | ග | |
| | ද | ව | ව | නි | | | | ස | ව | නි | සි | | | | ක | ත | ම | ත | |
| 3 — 1 | ග | ත | ස | දි | ස | සො | ස | ද | ග | ණු | ත | ද | ව | නි | ද | ම | ස | ද | 4 |
| 2 | ග | රු | පි | සු | ළ | ළු | ළ | ත | ර | ස | ක | ත | ව | ග | ත | ත | මි | ද | 3 |
| 3 | ග | ත | ත | ද | ත | ත | ල | ත | පි | ය | සි | ග | ර | ක | ප | ප | ප | ද | 2 |
| 4 | ග | ග | ග | ග | ත | ර | ගි | ස | ස | ස | ස | ක | ජ | ර | ද | ද | ද | ළ | 1 |
| | 1 | 2 | 3 | 4 | | | | 1 | 2 | 3 | 4 | | | | 1 | 2 | 3 | 4 | |
| | 10 | | | | | | | 11 | | | | | | | 12 | | | | |

මෙසින් කියවෙන 1 වෙනි කවිය මෙසේයි:-

සිසි සිසි දසල නිනිනිනි නිරජල ල ලල  
සිරි වල දියත වසවමු සිතද කුස කල  
සිදිබව ගිමත රගතගමිණ පළත සල  
සිරිගත නිරත තමදිමි තවතනුව තල

12 වෙනි කවිය මෙසේ යි:—

දත තද තඹකස විතපම සදිනි තුළු කු ල  
දපත මිතවසත දසත සෙද සවත ස ල  
දපමත මද බිය පිසරම රදු තස ක ල  
දද දද තගණ කකකක සිදවි ලලල ල

# 8. බෝවල ධම්මානන්ද මහාස්වාමිතුමා.

(අපවත්වීම බු. ව 2377 දී)

පාතරට පවත්නා ශාසන පරම්පරාවන් අතුරෙන් එකක මූල පුරුෂයා වූ බෝවල මහාස්වාමිතුමා මාතර පලාතේ "බෝවල" නමැති ගමේ ඉපද මල්වතු විහාරයට පැමිණ සංඝරාජ මාහිමියාණන් ගේ ශිෂ්‍යවූ දරමිටිපොල ධම්මරක්ඛිත මහස්ථවිරතුමන් ආශ්‍රය කරමින් ඉගනීම කොට හැරී අවුත් මාතර පලාතේ පෙතාන්ගහවත්ත නම් විහාරයෙහි නැවතී මහත් පිරිසකට ධර්මශාස්ත්‍රදානය කරමින් ශික්ෂාකාමී උතුමෙක්ව විසීය. පළමුවෙන්ම බුරුමරට සෝයාගොස් උපසම්පදාව ගෙනවුත් මෙහි අමරපුරනිකාය පිහිටුවා වදාල අඹගහපිටියේ ඤාණවිමලතිස්ස මහා ස්වාමීන් ද අමරපුර ධම්මරක්ඛිත වංශය පිහිටුවා වදාල අත්තුඩාවේ ධම්මරක්ඛිත මාහිමියන් ද රාමඤ්ඤ කල්‍යාණීවංශය මෙහි පිහිටුවා වදාල කතළුවේ ගුණරතන මාහිමියන් ද මෙතුමන් වෙත ඉගනීම කළ බව අසන්ට ලැබේ. මෙසින් සියලුදෙන කෙසේ වෙතත් වැඩිදෙනෙකුන් මූන්වහන්සේ වෙත මුලදී පැවිදිවූහයි ද සිතන්ට අවකාශ තිබේ.

මූන්වහන්සේ කලින්කල මාතර හිත්තටියේ රජමහා-විහාරයෙහි වසමින් සරම් මුදලිතුමන් ආදීන්ට අවවාදානුශාසනා කළහ. බෝවල මහාස්වාමීන් මාතරට පැමිණියේ කරතොට මහාස්වාමීන් මෙහි පැමිණෙන්ට පෙරය. ශ්‍රී රාජාධි රාජසිංහ රජතුමා එකල පාත රට විසූ උගතුන් ගැන විමසා මාතර ඉලංගක්කෝන් මහමුදලිඳු වෙත මේ කවිය එවීය:—

"ස ත් වර සතර සිල් පිරිසිදු මිතුරු සො ද
ලෙ ත් දූරු සපුන සිවු සිකපද කපුන බ ද
මෙ ත් සුරගුරු ලකුණු දූරු එලු සකුමග ද
දූ ත් විසිතුරු යති මාතොට කොපමණ ද

එයට පිළිතුරු වශයෙන් ඒ මුදලිඳු විසින්:—

"ක ර තොට බෝවල ද ගාල්'කුරුසි නම් න
කි ර ම ද කිවිඳු දෙණගම දම්කිත් පවු න
තෙ ර සත් ගල්ඇටුඹේ දම් බහු වටි න
ප ර සිදු සමත් යති රට පාත මෙපම ණ"

යන කවිය ලියා යවන ලදැයි කියත්. 1. කරතොට, 2. බෝවල, 3. ගාල්ලේ මේධංකර, 4. අකුරැස්සේ සුවණ්ණජෝති, 5 කිරම ධම්මානන්ද, 6. දෙණගම ධර්මකීර්ති ගුණරතන, 7. ගල්ඇටුඹේ පියදස්සි යන ස්වාමිවරුන් ගේ නම් මෙහි පෙනේ. මෙයින්

3. ශාල්ලේ මේධංකර මහාස්වාමිතුමා සබරගමුවේ හා ශ්‍රීපාදයේ නායක ධුරය ලැබ බු. ව. 2380 දී අපවත්විය. 4. අකුරැස්සේ සුවණ්ණජෝති මහාස්ථවිරතුමා කත්දබ්බපත්තුවේ කළුගල විහාරයේ සාළිඇලේ මණිරතන ස්වාමිපාදයන්ගෙන් ඉගනීම ලබා බු.ව.2379දී මාතර-හම්බන්තොට දෙදිශාවේ නායක පදවිය ලැබීය. 5. කිරම ධම්මානන්ද මහාස්ථවිරතුමා ද මණිරතන මහා ස්වාමීන්-ගෙන් ඉගෙනගත්තෙකි. මෙතුමා සියබස්මල්දම, විබත්මල්දම, මහාකණ්හ ජාතකය, දෙවධම්ම ජාතකය, සම්බුලා ජාතකය, නන්දිය වෙළඳ කථාව ආදි කාව්‍යග්‍රන්ථයන් තිපදවීය.

6 දෙනගම ගුණරතන මහාස්වාමීන්ගේ ගුරුවරයා සපුගොඩ සිධාර්ථ මහාස්ථවිරය, එතුමාගේ ගුරුවරයා රන්සෑගොඩ ධම්මදස්සි මහාස්ථවිරය. ඒ ස්ථවිරතුමා මාතර කත්දබ්බපත්තුවේ කළුගල විහාරයෙහි සිල්වතෙක්ව වසනකල වේහැල්ලේ ධම්මදින්න මාහිමියන් සමග මල්වතු විහාරයට පැමිණ උපසම්පදාව ලැබුවෙකි.

7 ගල්ඇහිඹෙ පියදස්සි ස්ථවිරතුමා සාළිඇලේ මණිරතන මහතෙරුන්ගේ ශිෂ්‍යයෙකි. බොහෝ ශිෂ්‍යයන්ට ඉගැන්නූ කාව්‍ය රචනාවෙහි දක්ෂයෙකි.

(මේ කරුණු හා කවි උපුටාගන්නා ලද්දේ කරතොටවත නමැති ග්‍රන්ථයෙනි.) ගුත්තිල කාව්‍ය වර්ණනා මුඛබන්ධයෙහි මේ ශාස්ත්‍ර පරම්පරා ගැන මෙසේ ලියා තිබේ—

“පාතරටින් නොයෙක් යථෝක්ත විද්‍යාස්ථානයෙහි ශාස්ත්‍රාද්‍යග්‍රහණය කළාවූ කරතොට ස්වාමිය, බෝවල ස්වාමිය, සාලිඇළේ ස්වාමිය යන මුන්වහන්සේලා තුන්නම මහත් පාණ්ඩිත්‍යයට පැමිණ පහත රට ස්වකීය වාසභූමින් කරා ඇළඹ බොහෝ කීර්තියෙන් යුක්තව විරාජමාන වූහ.........මෙයින් බෝවල ස්වාමීන්වහන්-සේගේ ගෝල පරම්පරාවෙන් හා වල්පල ගුරුන්නාන්සේගේ ගෝල පරම්පරාවෙන් ද පැවත එන්නෝ ඉතා ස්වල්ප දෙනෙකි. එහෙයින් දැනට ලංකාවේ උඩ-පාත දෙරටෙහිම විශාලව පවත්නාවූ පණ්ඩිත පරම්පරාව නම් කරතොට ශාඛාවෙන් එන පරම්පරාවයි කරතොට ස්වාමීන් වහන්සේ හට විශෙෂාචාර්‍ය්‍ය වූයේ අත්තරගම රාජගුරු බණ්ඩාර මැතිතුමා බැවින් මේ ශාඛාවේ මූල ඒ මැතිතුමා බව දත යුතුය.”

බෝවල මහාස්වාමීන්ගේ අපවත්වීම බු. ව. 2377 දී සිදුවිය. සරම් මුදලිතුමන් කරවූ ගංගාරෝහණ පූජාමහෝත්සව කාලයේදී කරතොට බෝවල මහාස්වාමි දෙනම ලවා ආසන දෙකේ ධර්මදේශනා කරවූ බව අසන්නට ලැබේ. ඒ මහාපූජාවේ

ප්‍රවෘත්තිය මෙසේසි:— ගඟබඩපත්තුවේ මුදලි කනතුර දූරු "දවිත් ද සේරම්" මුදලිතුමා මාතර වැලිවේරියේ සිරිවඩ්ඩනවලව්වේ විසිය. මේතුමා බෝවල මහාසවාමීන්ද්‍රයන් නිතර ආශ්‍රය කෙළේය. මෙතෙමේ මාතරින් හැ. 14 ක් දුරවූ අකුරැස්සේ ගොඩපිටියේ විහාරයෙහි තෙමහල් ධර්මශාලාවක් කරවිය. එය පූජාකිරීමේ උත්සවයේදී නොයෙක් පූජාභාණ්ඩයන් රැගත් විශාල පිරිසක් ද භික්ෂුසංඝයාද ඔරුපාරුවල නංවාගෙන අතර පිහිටි ගම්වලදී ධර්මදෙශනා පවත්වමින් තිල්වලා ගඟදිගේ ගමන්කොට දශදිනකින් ගොඩපිටියට පැමිණියේ ය. මේ කාලය තුළදී මාතර සිට ගොඩපිටිය දක්වා පිහිටි ගම්වලදී ධර්මදේශනා දෙවිස්සක් පවත්වනලදී. මෙයින් ප්‍රථම දේශනාව මාතර මහවලව්වේ බණමඩුවේදී "ජයතිලක අභයසිරිවර්ධන ඉලංගක්කෝන්" මුදලිතුමාගේ දායකත්වයෙන් ද අවසාන දේශනාව ගොඩපිටියේ ජේතවනාරාමයේදී සරම් මුදලිතුමාගේ දායකත්වයෙන් ද පවත්වන ලදී. මේ ප්‍රථම – අවසාන ධර්මදෙශනා දෙක කරතොට-බෝවල මහාසවාමි දෙනම විසින් පවත්වන ලදී.

මේ මහපින්කම සම්බන්ධයෙන් "තෝමිස් මුහන්දිරම්" නමැති කිවියා විසින් ගඟාරූවණ්ණනා නම් කාව්‍යයක් කරනලදී. එහි සරම් මුදලිතුමාට ප්‍රශංසා පිණිස එතුමාගේ නාමය ඇතුළත් වනසේ යෙදූ කවිය නම්:-

"සසර සරන සව්සත් දම් අමාවෙන් සතොස්වා
සගපවග සැපත් දුන් දම්රදුන් දම් සඟුන් සෙව්
පෙර මැදග වණීන් මේ තුන්ගෙණේ මුල්කෙමෙන් නම්
පතල මැති සදෙක් වී මේ පුරේ කිත් දෙදෙක් වත්"

යන්නයි. මෙහි "සසර-සරණ-සව්සත්දම්" යන තුන් ගණයේ පෙර, මැද, අග තිබෙන අකුරු ගැණීමෙන් සරම් නාමය සෑදේ යයි කිවියා අදහස් කළ නමුත් එයින් කියවෙන්නේ සරම් නොව "සරදම්" යයි මිරිසැන්නේ ධම්මරතන හිමිතුමා කීය. ගරු ජේම්ස් ද අල්විස් මැතිතුමා සිදත්සඟරාව ඉංග්‍රීසියෙන් පළකර-වීමේදී මේ මතය වැරදි බවට වාක්‍යයක් එහි ලිවිය. එකල මහණකමේ සිටි කොග්ගල (ධම්මතිලක) කිවිඳු මීට විරුද්ධව ශාසනාලංකාරය නම් සඟරාවෙහි ලිපියක් පළකරවිය. මේ නිසා හටගත් වාදය "සව්සත්දම් වාදය" නමින් ප්‍රකට විය. මෙහිදී ලක්දිව සිටි උගත්තු සියලු දෙනම වාගේ දෙපක්ෂයකට වී තියම් නමින් හා බොරු නම්වලින් වාදයට සහභාගි වූහ. ජේම්ස් අල්විස් මැතිතුමන් විසින් සිදත් සඟරා ව්‍යාඛ්‍යානය පළකරවන ලද්දේ ක්‍රි ව. 1852 දීය. එබැවින් මේ වාදය සිදුවූයේ ඉන්පසු වර්ෂවලදීය.

## 9. මොරතොට ධම්මක්ඛන්ධ නායක මාහිමියෝ.

(උපදීම බු. ව. 2278.)

ලක්දිව සියම්නිකාය පිහිටෙව් මුල් අවස්ථාවේදී සියම් මහ තෙරවරුන්ගෙන් උපසම්පදාව ලැබූවන් අතරෙහි ප්‍රකටව පෙනෙන එක් නමක් නම් මොරතොට ධම්මක්ඛන්ධ මහානායක ස්ථවිර තුමායි. මෙතුමා ශකවර්ෂ 1656 යේදී සතරකෝරලයේ "මොර-තොට" නම් ගමේදී උපන්නේය. මෙතුමාගේ පරම්පරාව කෝට්ටේ භුවනෙකබාහු රජු කල දඹදිව මදුරාපුරෙන් මෙහි පැමිණි බ්‍රාහ්මණයන් නවදෙනගෙන් බාලවූ බාලසුබ්‍රහ්මණ නමැත්තාගෙන් පැවතාවේ යයි කියත්. ඒ බාලසුබ්‍රහ්මණයන්ගේ මුනුබුරෙක් සීතාවක රාජසිංහ රජුගෙන් ගම්වර කීපයක් හා "රණසිංහ මුදලි" යන නාමයද ලැබ මොරතොට ගමේ වාසයට පැමිණියේය. ඒ රණසිංහ මුදලිගේ පස්වෙනි මුණුබුරුව මෙකුමරා උපන්නේය.

තෙළෙස් හැවිරිදි වියේදී මෙකුමරා පැවිදිවෙන්ට කැමැත්ත දැක්විය. මවුපියන් ඊට තරමක් නොකැමති වුවත් හෙතෙම එය නොසලකා පැවිදිවී උගතයුතු බණදහම් හා ශාස්ත්‍රයන් ඉගෙන ගත්තේය. ලක්දිවට සියමෙන් උපසම්පදාව ගෙනෙන ලද්දේ බු. ව. 2296යේදීය. ඉන් දෙවර්ෂයකට පසු හෙවත් ශ. ව. 1676 යේදී මොරතොට සාමණේරතැන උපාලිමහතෙරුන් ප්‍රමුඛ සංඝයාගෙන් උපසම්පදාව ලැබීය. එය ලබන්ට මත්තෙන් රජ ඇමතියන් සහිත සංඝසභා මධ්‍යයේදී තමතමන් උගත්දේ පාඩම්කීම සිරිතක්ව පැවති බැවින් මේ හෙරණතුමා ද මහපිරිස් මැද හිඳගෙන උගත් දේ පාඩම් දුණි. එවිට ප්‍රීතියට පත් කීර්තිශ්‍රී රාජසිංහ මහරජ ඔහු ගිහි කරවා කුමාරාභරණ පලන්දවා මගුලැතුපිට හිඳුවා නුවර පෙළහර කරවා මල්වතු විහාරයේ සීමාමන්දිරයට පැමිණෙව්ය. එහිදී උපසම්පදාව ලැබූ ධම්මක්ඛන්ධ භික්ෂුවට උපාලි මහතෙරුන් විසින් "නිග්‍රෝධ" යන නාමය දෙනලදී. උපසම්පදාවෙන් පසළොස් දිනක් ඇතුළත ප්‍රාතිමෝක්ෂය පාඩම් කළ මේ නිග්‍රෝධ භික්ෂුනම සංඝයා මධ්‍යයේදී ප්‍රාතිමෝක්ෂය දෙසූවිට ප්‍රීතිමත්වූ උපාලිමහතෙරතුමා මෙතුමාගේ නිග්‍රෝධ නාමය වෙනස්කොට ධම්මක්ඛන්ධ යයි නම් තැබීය.

ක්‍රමයෙන් ධර්මවිනයාදියෙහි දක්ෂයෙක් වූ මේ ධම්මක්ඛන්ධ භික්ෂු තෙමේ ව්‍යක්ත ධර්මදේශකයෙක් විය. රජතුමා පවා එතුමාගේ ධර්ම දේශනාවන්ට පැහැදී නොයෙක් පූජා කෙළේය. "දෙගල්-දොරුව" විහාරයද මෙසේ ප්‍රසන්නවූ රජු විසින් ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවට හිමිවනසේ පුදන ලද්දකි. පසු කලක මුන්වහන්සේ ගංගාරාමයෙහි නැවතී බොහෝ ශිෂ්‍යයන්ට ධර්ම ශාස්ත්‍රයන් ඉගැන්වූ බැවින් මහරජ ඒ ආරාමයද එතුමන්ට පිදී.

සරණංකර සංඝරාජතුමන්ගේ ඇවෑමෙන් ඒ නිකාය පාලනය කළේ "තිබ්බොටුවාවේ සිද්ධාර්ථ බුද්ධරක්ෂිත මහානායක ස්ථවිර තුමාය ඊට අනතුරුව මැදවල ආනන්ද රතනජෝති, දරම්ටිපල ධම්මරක්ඛිත යන මහාස්වාමි දෙනම ක්‍රමයෙන් එය පාලනය කළහ. ඊට අනතුරුව රාජාධිරාජසිංහ රජු විසින් මහානායක පදවිය මොරතොට මාහිමියන්ට* පත්කරනලදී. මේ රජු මොරතොට මාහිමියන්ගෙන් ධර්මශාස්ත්‍ර උගත්තකුවූ බැවින් සඟරජ හිමියන්ට දී තිබුණු රාජගුරු පදවිය ද මෙතුමන්ට පැවරීය.

කීර්තිශ්‍රීරාජසිංහයන් විසින් මල්වතු විහාරයේ ගොඩනංවා තිබුණු පෝයගෙය දිරාපත්ව තිබුණු බැවින් මොරතොට මාහිමියෝ රජුගේ අවසරය ලබාගෙන මහදිසාපතීන්ට දන්වා මිනිසුන් ගෙන්වා පරණ ගෙය ඉවත්කොට සතරරියන් පමණ උස්කොට වේදිකාවක් බන්දවා එහි ගල් අතුරවා එය මත්තෙහි දූන් පවත්නා සීමාගෙය ගොඩනැංවූහ † එය ගෙවදීමේ පින්කමේදී භික්ෂූන් සියක්නමක් වැඩහිඳුවා නමන්වහන්සේට ලැබී තිබුණු බොහෝ වටිනා පිරිකර සහිතකොට සංඝ දක්ෂිණාවක් පිරිනැමූහ.

(මුංඛොමුවේ අභයසිංහ නමැති කිවියරයකු විසින් මූන්-වහන්සේගේ චරිතය කවියෙන් රචනා කරනලදී. කවි 166කින් යුත් ඒ පොත ගුත්තෑපාන වජිරඤාණ ස්ථවිරයන් විසින් සකස් කරන ලදින් 1949 යේදී පළවිය. ඒ පොතට ලබුගම ලංකානන්ද ස්ථවිරතුමන් ලියූ ප්‍රස්තාවනාව අගනා එකකි. මේ චරිතය සඳහා බොහෝ කරුණු උපුටා ගත්තේ ඒ පොතෙනි.)

1913 ජූනි මස පළවූ "සිංහල මිත්‍රයා" සඟරාවේ පහත පෙනෙන වාක්‍ය වෙති:- "කාව්‍යශාස්ත්‍රයෙහි අති දක්ෂයෙක් වූ රාජාධිරාජසිංහ මහරජතුමා මොරතොට යතීන්ද්‍රයාගේ ගෝල රත්නය වේ. එක් දිනක් මහරජතුමා යතීන්ද්‍රයාණන් වහන්සේ පරීක්ෂා කරන පිණිස ස්ත්‍රීආභරණයන්ගෙන් සැරසී මධ්‍යම රාත්‍රියෙහි මහාස්ථවිරයන් වහන්සේ සැතපී හුන් ශාලාව ළඟට ගොස් දොරට තට්ටුකර සවර්ණ වළලු ලන ලද්දාවූ ශ්‍රී හස්තය ජනේලයෙන් ඇතුළට දුන්නේය. ස්ථවිරතුමා ඒ දැක ඒ වේලාවට

---

* "මොරතොටවත" නමැති කවිපොතේ ප්‍රස්තාවනාවෙහි කියවෙන්නේ තිබ්බොටුවාවේ මහානායක හිමියන්ට අනතුරුව මොරතොට මහා ස්වාමීන්ට නායකධුරය ලැබුණු බවය. මා විසින් කරතොටවත නමැති පොතේ තිබෙන පිළිවෙළ බලා මෙය සකස් කරන ලදී.

† මේ සංස්කරණයේදී පරණ සීමාගල් උගුල්ලා එහා මෙහා කිරීම නිසා මෙය අසීමාවක් විශයි අස්ගිරිවාසීහු මෙයට චෝදනා නැඟූහ.

තමත් සැතපී හුන් ස්ථානයට වෙන කිසිවෙක් නොඑන බැවි ස්ථිරලෙස සලකා තමත් පරීක්ෂාකරණ පිණිස රජතුමා ආව-වහැයි සලකා යහනෙන් නොනැගිටම හිඳගෙන:

“ල ක ල මූවනඹර සියොගත සිවුමැ ලි යේ
ඇ ස ළු මස දුපිම් යනවා දෙව්නෙ ළි යේ
අ ස ල න නම් නිතර දකුමට සිතු ඇ ලි යේ
මෙකල සිරිලකට අගරද තුඹද ලි යේ”

යන මේ කවිය කීවේය. ඒ ශ්‍රවණය කළාවූ මහරජතුමා සිත්හි සංකා පසිඳ ඉතා ප්‍රීතියට පැමිණ;

“අ ම ර ගුරු හරණ සත දත් පිතා ව ත්
වි ත ර නොවන ගුණ නැණ සපිරිතා ව ත්
ප ව ර නමැති මොරතොට යති මතා ව ත්
ස ස ර වසනතුරු මට වාසනා ව ත්”

යන මේ කව කියා රජමැදුර කරා වැඩියේය.”

1913 අප්‍රේල් මස පළවූ ඒ සඟරාවේ කලාපයක ද මේ කවි දෙක පළව තිබේ. ඒ ලිපියෙහි “දිනක් රාජාධිරාජසිංහ රජතුමා දවස සිටි උගත් මොරතොට සවාමීන් වහන්සේ ගැන කේලාම්කාරයකු විසින් ප්‍රසිද්ධ කළ බොරුවක් රජතුමාට ආරංචිවී එය විමසන පිණිස එක් දවසක් රාත්‍රියේ රජතුමා ස්ත්‍රියකගේ විලාසයෙන් ගොස් ස්ථවිරයන් වහන්සේ සිටි කාමරයට ජනේල-යෙන් අත දුම්මේය. ස්ථවිරයන් වහන්සේ ද එය දුන මෙහි පහත පෙනෙන කවිය එවලේම කියන ලදැයි කියා තිබේ” යන වාක්‍යය පෙනේ. එතැන දක්වෙන පළමු කවියේ තෙවැනි පදය අග “සිතු ඇලියේ” යන්න වෙනුවට “සිතපිරියේ” යයි දක්වා තිබේ.

## 10. අගලකඩ ධම්මරක්ඛිත නායක මාහිමියෝ

(අපවත්වීම ක්‍රි: ව 1803.)

සරණංකර සංඝරාජ මාහිමියන්ගේ උත්සාහයෙන් සියම් රටෙන් උපසම්පදාව ගෙනැවිත් මෙහි උපසම්පන්න භික්ෂූන් ඇති කළ පසු රුහුණුරට කොටවාය පෙදෙසේ විසූ “වෙහැල්ලේ” නමැති සිල්වත්නැන පිරිත් සහිතව මහනුවරට පැමිණ සංඝරාජ තුමන් වෙතින් පැවිදි – උපසම්පදා ලැබීය. උපසම්පදාවේදී වෙහැල්ලේ ධම්මදින්න යන නම ලැබූ එතුමාට සංඝරාජතුමා කීර්තිශ්‍රී රාජසිංහ රජුගේ කැමැත්ත ඇතිව ශ්‍රීපාදස්ථානයේ නායක

පදවිය හා පාතරට සංඝනායක පදවිය පැවරීය. ඒ වේහැල්ලේ ස්වාමීන්ද්‍රයන් පාතරට නොයෙක් ප්‍රදේශයන්හි ජනතාවට ධර්මානු-ශාසනා කරමින් වසනකල මොරවක්කෝරළේ අලපලාදෙණිය නම් ගමේ "අතුකෝරළ දශනායක" පෙළපතේ ඉපද මාතර ගඟබඩපත්තුවට අයත් වැලිහේනේ අගලකඩ පෙදෙසෙහි වූ මැණියන්ගේ නෑ පවුලක වැඩුණු තරුණයෙක් පැවිදි උපසම්පදා ලබනු කැමැත්තෙන් මහනුවර සංඝරාජයන් වෙත පැමිණියේය. සංඝරාජතුමා ඉගැන්විය යුතුදේ උගන්වා ඒ තරුණයා පැවිදිකොට උපසම්පදාව දෙවා අගලකඩ ධම්මරක්ඛිත යන නම තැබීය.

කලක් ආචාර්යයන් වෙත විසූ මේ ධම්මරක්ඛිත භික්ෂු තෙමේ සිය ගම්පෙදෙසට පැමිණ වැලිගම "අග්‍රබෝධි විහාරය"යි ප්‍රකටවූ තැන වල්බිහිව තිබුණෙන් එය ශුද්ධකරවා කුටියක් සාදවාගෙන නැවතී එය දියුණු කරන්ට පටන් ගත්තේය. ක්‍රමයෙන් පැවිදි ශිෂ්‍ය පිරිසක් ද ඇතිකළ මුන්වහන්සේ ඒ කාරණය මහරජුට දන්නුවිට රජතුමා වේහැල්ලේ මාහිමියන් ගෙන් හිස්වූ පාතරට නායක පදවිය මුන්වහන්සේට පැවරීය. රාජාධිරාජසිංහ මහරජු විසින් රන් පිළිමයක් හා රන්කරඬු-වක් ද ඇත්දත් යුවලක් හා විසිතුරු වටාපතක් ද සෙමරවල් විදුනා දෙකක් හා පිත්තල කනප්පයක් ද මුන්වහන්සේ වෙත එවා කොත්වත් ආදියද පුදන ලදී. ඒ පූජාවස්තුවලින් සමහරක් මේතාක් අග්‍රබොධි විහාරයෙහිද සමහරක් ගොඩපිටියේ රජමහ විහාරයෙහි ද ඇතැයි කියත්.

මුන්වහන්සේ එකල ජරාවාසව පැවති වැලිගම්ගණේ රාජකුල වඩන විහාරයද ජරාවාස හරවා දියුණු කරවූහ. මේ විහාර දෙක ම ඇතුළත් වනසේ පගන්වැට බන්දවා පහන් ලක්ෂයක පූජාවක් කරවන ලදැයි අසන්ට ලැබේ. අග්‍රබෝධි විහාරයෙහි ගල්වැම් උඩ ගොඩනගා තිබුණු පුරාණ පිළිමගෙය විශාල කරවා සංස්කරණය කරවන ලදී. ගොඩපිටියේ විහාරයේ තිබෙන පිළිමගෙය ක්‍රි: ව: 1788 පමණේදී කරවන ලදැයි කියත්.

මුන්වහන්සේ අපවත් වූයේ ශකවර්ෂ 1724 දී හෙවත් ක්‍රි: ව. 1803 දීයයි "අගලකඩ මහාස්වාමි චරිත"යෙහි දක්වේ. මේ චරිතය සම්පාදිත වූයේ ගාල්ලේ වලහන්දූවේ සුදර්ශනාරාමාධිපති කතළුවේ ශ්‍රී සුමංගල නායක ස්ථවිරතුමන් විසිනි. අගලකඩ මහාස්වා-මීන්ගේ අපවත්වීම සම්බන්ධයෙන් ඒ පොතේ දක්වෙන ප්‍රවෘත්ති යක් මෙසේයි:- "එක් දිනක් රාත්‍රි පශ්චිම යාමයෙහි අග්‍රබෝධි විහාරස්ථානයෙහි සිටි දිනකා නමැති අතවැසි කොළුවෙක් සමීප-යට පැමිණ ගල්කැටයක් මුන්වහන්සේගේ අල්ලේ තබා ගිය

බැව් ස්වප්නයෙන් දුටු පසුදා උදෑසන අතැවැසි ගෝලපිරිස කැඳවා මේ ස්වප්නය කියාදී එහි විස්තර ඇසූ නමුත් කිසිවකුටත් එහි යථාර්ථය නොහැඟුනෙන් තමන්වහන්සේම විසඳනසේක් "දිනයා නම් සදිනකි, හෙවත් දවස් හයකි, අතේ ගල්කැටය නැබීම නම් කැටදීමයි. එහෙයින් මේ ස්වප්නයෙහි තත්ත්වාර්ථය නම් අද පටන් සදිනක් ගියතැන මගේ ජීවිතය අවසන්වන බව ඒකාන්තය" යි විසඳූසේක............... ස්වප්නදර්ශනයෙහි පටන් පස්දිනක් ගත වන තුරුත් නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේට ස්වල්පමාත්‍රවූත් අසනීපයක් නොතිබුණේය. සවන දින ඉර හැරෙන තුරුත් එබන්දක් නොපැවතිණ. නමුත් එදින ඉර හැරුනාට පසු තමන් වහන්සේට මඳක් අසනීප බැව් කියා සැතපෙන ආසනයට වැඩ සියලු ගෝලබාලයන්ට අවවාද අනුශාසනා දී ස්මෘතිසම්ප්‍රයුක්තව ස්වර්ගපරායණ වූසේක."

කවීන්ද්‍රයෙක්ව විසූ කිරම ධම්මානන්ද ස්ථවිරතුමා මුත්වහන්සේගේ ශිෂ්‍යයන් අතරෙන් එක්නමකි.

## 11. මිහිරිපැන්නේ ධම්මරතන හෙරණපාණෝ.

(ක්‍රි. ව. 1768 – 1851)

සිංහල කාව්‍ය බන්ධනයෙහි අතිසමතකුසේ ප්‍රකට වූ මුත්වහන්සේ ක්‍රි. ව. 1768 දී ගාල්ලේ තල්පේපත්තුවේ පිහිටි "මීරිපැත්ත" නමැති ගමේ "ගගුලපිටියේවත්ත" හෙවත් "වෙදආරච්චිගේ වත්ත" යන ඉඩමේදී උපන්නේය. "කුමාරසිංහ ආරච්චිගේ දොන් පිලිප්පු ද සිල්වා, මිරිස්සේ මහමේස්ත්‍රි නවිටම්බුගෙයි කරලිනා" යන දෙදෙන මෙතුමාගේ මව්පියෝ වූහ. 1775 පමණේදී මීරිපැත්තේ බෞද්ධයෝ දුන් මීරිපැත්තේ පද්මාරාමය තිබෙන තැන ගෙයක් සාදා කබුකුරුන්දේ ධම්මානන්ද තෙරණුවන් එහි වස් වසවා ගත්හ. පිලිප්පු සිල්වාගේ පුත්‍රයා ද නොයෙක්විට ඒ ස්ථානයේ පැවැත්වූ ධර්මදේශනා ඇසීමට පැමිණියේය. වයස අවුරුදු නවවූ තැන් පටන් මැණියන් සමග ගොස් අටසිල් ගැනීමට පුරුදුව සිටි මේ බාලයා වයස 16 කල්හි ඒ ධම්මානන්ද ස්ථවිරතුමන් වෙත පැවිදිවිය.

පැවිදි වූ තැන් පටන් එළු – පාලි – සංස්කෘත භාෂාවන් හා ඡන්දෝලංකාරාදිය ඉගෙනගත් මෙතුමා බාලකාලයේ පටන්ම සිංහල ප්‍රබන්ධකරණයෙහි යෙදුණේය. ඒ ප්‍රබන්ධ රාශිය "මිහිරිපැන්නේ ප්‍රබන්ධ" නමින් පොතක් වශයෙන් පළකොට තිබෙන බැවින්

ඒ සම්බන්ධයෙන් මෙහි වැඩිදුර ලියයුතු නොවේ. මෙතුමා බොහෝසේ වාසයකළේ තමන්ගේ කාලයේදී ම දියුණුවට පැමිණි මීරිපැන්නේ පද්මාරාමයෙහිය. ජීවිතාන්තය දක්වාම උපසම්පදාව නොලබා සිටියේයයි කියත්.

මෙතුමාගේ ආචාර්ය වූ කටුකුරුන්දේ ධම්මානන්ද මහා-සථවිරතුමා කරතොට ධම්මාරාම නායක මාහිමියන්ගේ උගත් ශිෂ්‍යවරයෙකි. එතුමා ගාලුපලාතේ කටුකුරුන්දේ පුරාණ විහාරයෙහි විසිය සරම් මුදලිඳු කරවූ ගංගාරෝහණ පූජාව සම්බන්ධයෙන් තෝමස් මුහන්දිරම් මහතා රචනා කළ පොතේ "සතර සරණ" ආදි කවියෙන් "සරම්" නාමය නොකියවේ යයි මුලදී දෙස් කීවේ මේ මිහිරිපැන්නේ යතිතුමාය පළකළ "සව්සත්දම් වාදය" ඇතිවූයේ මේ ද්වේෂදර්ශනය මුල්කොටගෙනය. මේ ධම්මරතන ස්වාමිතුමා විසිපස් හැවිරිදි කාලයේ පටන් ඇස් නොපෙනීමෙන් හා ඇඟපත වෙව්ලීමෙන් පෙළුණබව 1911 දී බෙන්තොට ඇල්බට් සිල්වා මහතා පළකරවූ "මිහිරිපැන්නේ ප්‍රබන්ධ" නමැති පොතේ දක්වා තිබේ. "ඥානාදර්ශනය" සඟරාවේ 9 වෙනි කොටසේ 69 වෙනි පිටේ ද මෙතුමාගේ ජීවිත කථාව පළවී තිබේ.

මෙතුමාගේ අපවත්වීම ක්‍රි. ව. 1851 අප්‍රේල් 30 ද සිදුවිය. ඒ සම්බන්ධයෙන් ගරු ජේම්ස් අල්විස් මන්ත්‍රීතුමන් බැඳි කවිතුන මෙසේයි —

"සි ය ලු කු ල න් අතුරෙන් බලැති මහමේ  ර
වි ල ස කි වි න් මුදුනත සැදි නැණ පත  ර
ය ති උ තු ම න් අප දම්රුවන කිවිය  ර
මෙලොව දුකින් මිදි බැව් දැනගන මිතු  ර

අටලෝදහම් පැමිණෙන බව සැම සත  ට
එම විහිගුම් කිවියර කිව් බස දම්  ට
සිතු කරහිම් දුක හැර දමමින් ඔබ  ට
මම අයදිමි මොක්සැප අත්වන ලෙස  ට

ත ඹු රු කැ ල න් මුකුලිත වන බව සව  ස
ක වු රු වී සි ත් වත් වැලකිය නොහැකි බ  ස
සි හි ක ර මි න් එහි අරුතත් සොයා නො  ස
දුක නොවෙමින් කල් යැව්වොත් ඉතා ය  ස"

මූන්වහන්සේ කාව්‍යකරණයෙහි දක්‍ෂයෙක්ව එකල විසූ උගතුන්ගෙන් සම්භාවනා ලැබූ නමුත් මෙතුමා බැන්ද කවි හැමදෙනට තේරුම් ගතහැකි ලිහිල් බසින් වූහ. ඒ සඳහා

බොහෝ නිදර්ශන දැක්වීමට මෙහි අවකාශ නැතත් එකක් දෙකක් දක්වනු ලැබේ. මහවලතැන්නේ දිශාපතිතුමාගෙන් ඇත්දතක් ලබාගැනීම සඳහා යැවූ කවිපෙළෙන් එකක්:—

"සෙව්වන්දී ගලකිත් තැනූ පිළිමයක් තිබ්බේ අපේ පන්සැලේ
ඒ පිල්මේ වැඩඉන්ට ඇත්දලවලින් සාදන්ට ඕනෑ ගෙයක්,
ඒ සන්දා මැතිඳුන්ට මේ ලෙස ලියා පෙත්වා එවූවා තමියි
ලෙව් රැන්දී යසරුස් දිලෙන්ට මැතිඳුන් දුන්නොත් හොඳය්-
ඇත්දතක්."

අනුන්ගේ දේ සොරකම් කරන ලසගා නමැත්තාට කළ යාගයක්:—

"ක රා වේයන තමින් ඉදලා දරා ගොවිගම බාගය ක්
සො රා කොස් පොල් තෙලාගෙණගිය නමුත් පෙර කිපවාරයක්
ද රා ගෙන මම උනිම් මෙවිතර දිනක් නොව අමතාප යක්
සො රා ගත් බලූ තිසා ලසයට කරමි ඒ ගැන නාග යක්"

"ක පා අගමුල ගත්තු කඳ සේ දෙකොණ එකලෙස වටිනු රෑ
දෙපා තබමින් බකල ගමනට කොරලවිකා සියලඟ දූ රෑ
උ පා වෙත් රු ගොසින් අල්ලන කුකුළු-එළු-බලූනේ ම රෑ
අ පා යටවත් එපාවඳ මේ රෑදුරු ගුණ දූරු ජඩ සෙ: රෑ"

"රෝග තිබුණත් කෑම කත්තට පිරිය ඇත ලසයගෙ නි තෝ
බා ග යක් වත් බඩට ආහර දෙතුන්ද නැත හාම තෝ
වේ ග යක් ලෙස අමුඩගසමින් කරයි සොරකම් රාම් තෝ
සා ග යක් කර මෙපුද දෙනතුරු නොදෙඩවා ඉඳු සටම: තෝ"

"හ සි ත් ඉඳලා රාටිකක් බී ගෙදර අවුදින් පෙර ලියෝ
ගොසින් වටපිට බලබලා සෙද නැම්බට කපමින් හෙර ලියෝ
නොසිත් කරපිට තබා ගෙණවුත් ගෙදර දමමින් ඔහි ලියෝ
එ සි ත් උණ බැස ගියයි ලසාගෙ බුලත්කන රොහුහැඹිලියෝ"

මුන්වහන්සේගේ ශිෂ්‍යයන් අතරෙහි තල්අරඹේ ධම්මකඛන්ධ, මඩිහේ සිරිසුමිතත, තංගල්ලේ සුමනතිස්ස, දලුවත්තේ ජිනානන්ද, සිටිනාමලුවේ ධම්මාරාම යන සථවිරවරු ද දොන් අන්ද්‍රිස් තුඩාගේ පණ්ඩිතගුණවර්ධන මුහන්දිරම් මහතා, ලක්ෂ්මණ් පහන් පත්‍රාන ආරම්භකළ දොන් ජොහානස් පණ්ඩිතතිලක ගුරුතුමා, දොන් ජොහානස් විජයසිංහ ජයවර්ධන, අන්ද්‍රිස් දියස් ධීරසේකර කඹුරුගමුවේ ගුරුන්නාන්සේ, මීරිපැන්නේ දොන් කරෝලිස් කුමාරසිංහ වෙදආරච්චි මහතා ආදීන්ගේ නම් පෙනෙත්.

## 12. පොල්වත්තේ ශ්‍රී සිද්ධාර්ථ මහාස්වාමිතුමා.

(අපවත්වීම බු. ව. 2424.)

පරවාද මර්දනයෙහි අතිදක්ෂයකු සේ ප්‍රකටව සිටි මූත්වහන්සේ දික්වැල්ලේ “හැටුම් පොත” විහාරයේ වැඩවිසූ පිලානේ සොමානන්ද මහාස්ථවිරතුමාගේ ශිෂ්‍යයෙකි. මෙතුමා පළමුවෙන් “පරපාමුල්ලේ ධම්මාරාම” තෙරුන් වෙතින් ධර්මශාස්ත්‍ර ඉගෙන ඉන්පසු මහනුවර ගංගාරාම විහාරයට ගොස් එහි විසූ වත්තේගම නායක හිමියන්ගෙන් ඉගනීම කෙළේය. පසුව මාතර වටගෙදර සුධර්මාරාමයට පැමිණ එහි ආධිපත්‍යය ලබා එකල ඇතිවූ වාදවලදී ඉදිරිපත්ව දුර්මත නිරාකරණය කෙළේය. එතුමන් ඉදිරිපත් වූ වාද වලින් සමහරක් මෙසේයි:—

හිත්තටියේදී දෙඩම්පහල දීපඞ්කර මහාස්ථවිරතුමන් සමග නිර්වාණ වාදය කළහ. වැවුරුකන්නලදී වැලිහිටියේ සුමන තෙරුන් සමග පත්තානිකකුජ්ජන වාදය කළහ. අහංගම්කත්දේදී මාතර ධම්මාරාම මහතෙරුන් සමග දේවපූජා වාදය කළහ. තංගල්ලේදී තෝලංගමුවේ තෙරුන් සමග පාරුපනවාදය කළහ. ගාල්ලේ කඩවතදී පිරිත් වාදය කළහ. බු. ව. 2424 දී නිර්වාණ ප්‍රාප්ත වූ මූත්වහන්සේගේ ශිෂ්‍යයන් අතරෙහි වටගෙදර සුධර්මාරාමාධිපති සතංකේ අත්ථදස්සී මහාස්ථවිරතුමා ද මාතර කිතුලේවල ජයමහා විහාරාධිපතිව සිටි බඹරැන්දේ රතනසාල මහාස්ථවිරතුමා ද වූහ. උයන්වත්තේ රේවත නායක ස්ථවිරතුමා මෙතුමාගේ ධර්මානෙතවාසිකයෙක් විය.

මූත්වහන්සේ උපත් “පොල්වත්ත” වනාහි ලක්දිව එතම්න් ප්‍රකට ගම් අතුරෙන් වැලිගම පිහිටි “පොල්වත්ත” වියයුතුය.

## 13. අමරපුරනිකායේ ආදිකර්තෘවරයා වූ අඹගහපිටියේ ඤාණවිමලතිස්ස නායකමාහිමියෝ

(බු ව. 2310 - 2378)

සියම් නිකාය පිහිටුවීම නිසා සරණංකර සංඝරාජතුමාට යම් ගෞරවයක් හිමිවියයුතු නම් ඊට නොදෙවෙනි ගෞරවයක් අමරපුරය සොයා ගොස් එතුවරින් උපසම්පදාව ලබාගෙනවුත් මෙහි අමරපුරනිකාය පිහිටෙව් ඤාණවිමලතිස්ස මාහිමියන්ට හිමිවියයුතුය. සරණංකර සංඝරාජතුමා කිසිවිටකත් පිටරටකට නොගියේය. ඤාණවිමල මාහිමිතුමා දුම්තැව් දුම්රිය ආදී කිසිවක් නොතිබුණු ඒ කාලයේ ජීවිතාශාව හැරපියා බොහෝදුර පිහිටි රටකට ගිය බැවින් උන්වහන්සේගේ වීරභාවය වඩාත් පැසසිය යුතුය.

මුන්වහන්සේගේ ජන්මභූමිය වනාහි ගාල්ල වැල්ලබඩ පත්තුවේ බලපිටි පෙදෙසට අයත් "මහකැරැව" නම් ගමය. එගම විසූ "කාරලූ සිල්වා" (=කරෝලිස් සිල්වා) වෙදආරච්චි මහතා එතුමාගේ පියා විය. මෑණියෝ මදනල්නා නමැති උපාසිකාවකි. සොහොයුරන් සතරදෙනකුත් හා සොහොයුරියන් දෙදෙනෙකුත් සිටි මේ පවුලේ වැඩිමලා වූ මුන්වහන්සේගේ උත්පත්තිය සිදුවූයේ බු. ව. 2310 දීය. අකුරු කරවියයුතු වයස පැමිණිවිට සිය පියතෙමේම මේ බාලයාට අකුරු ඉගැන්විය.

මේ වෙදආරච්චි මහතාගේ බාලසොහොයුරෙක් සියම්නිකායේ පැවිදිව වැලිතර සඟබඩු මුදලිතුමන් ආදීන්ගේ ආධාරෝපකාර ඇතිව පෙර "අඹගහපිටි වලව්ව" යයි ප්‍රකටව තිබුණු අඹගහපිටි විහාරයෙහි විසීය. වෙදරාලහාමි සවකීය පුත්‍රයාගේ දක්ෂභාවයත් පුණ්‍යමහිමයත් දැන සත්හැවිරිදි වයසේදී සියපුතු මහතවුන් සුළු පිය තෙරුන්ට බාරදුණි. මේ කාලයේදී මාතරපලාතේ උපන් බෝවල ධම්මානන්ද සළුවීරතුමා මහනුවර සිට මාතරට වඩින්නේ එක්දිනක් තවාතැන් ගැනීම සඳහා අඹගහපිටි විහාරයට පැමිණියේය. ත්‍රෛවාසික තෙරනම උන්වහන්සේට ආදරගෞරව- යෙන් උපස්ථාන කෙළේය. මෙහි නැවතී සිටියදී බෝවල හිමියෝ මේ බාලයා දැක පැහැදී ඔහු පැවිදිකරවා ඉගැන්වීම සඳහා තමාට බාර දෙන ලෙස ත්‍රෛවාසික තෙරුන්ගෙන් ඉල්ලීය. එතුමා ද මවු පියන්ට දන්වා අවසර ලබාගෙන මේ කුලදරුවා බෝවල මහා සළුවිරතුමන්ට බාරදුණි. ඒ මහාස්වාමිතුමා මසකටත් අධික කාලයක් අඹගහපිටියේ වැඩසිට මාතර බලා ගියේය. නැවත මහනුවරට වඩින ගමනේ අඹගහපිටියට අවුත් මේ කුලදරුවා කැඳවාගෙන එහි ගියේය. එය සරණංකර සංඝරාජ හිමිතුමන් වැඩසිටින කාලය විය. බෝවල හිමියෝ මේ කුලදරුවා සමග එහි වසමින් උගතයුතු බණදහම් උගන්වා අවසන්හි සංඝරාජ හිමියන් ලවා පැවිදිකරවා අත්වැසි වූ ඤාණවිමල යන නාමය ද දෙවූහ.

මෙසේ පැවිදි වූ ඤාණවිමල හෙරණතෙමේ සංඝරාජයන් වෙත වසමින් පාලිභාෂාව හා ධර්මවිනය ඉගෙනගනිමින් අවුරුදු සතක් එහිම විසීය. සංඝරාජතුමන් මේ ශිෂ්‍යයා කෙරෙහි ඇලුම් ඇතිව සිටි බවට සාධකයක් නම් දැන් අම්බරුකාරාමයෙහි තිබෙන ඇතැම් පුස්කොළ පොත්වල අග සංඝරාජතුමන් විසින් "ඤාණ- විමලතැනට ලියවා දෙනලදී" යන්න සඳහන්ව තිබීමයි. මෙසේ සෑහෙන තරමට ධර්මශාස්ත්‍ර ඉගෙනගත් ඤාණවිමල සාමණේර තෙමේ සිය ගම්වැසියන්ට ධර්මශාස්ත්‍රයෙන් අනුග්‍රහ කරනු කැමතිව

ස්වකීය විහාරස්ථානයට හැරීයන්ට සිතා ඒබව සංඝරාජතුමන්ට දැනුම්දී සමුගෙන සිය ගමට පැමිණියේය. එහිදී සහබන්ධු මුදලි ආදීන්ට ධර්මානුශාසනා කරමින් තවත් සාමණේර සත්නමක් ද ඇතිව ස්වකීයාරාමයෙහි විසීය. මුන්වහන්සේට තිස් හවුරුදු පමණ වයස් ඇති කල ස්වකීය සුළුපිය ආචාර්යවරයා අපවත්විය.

මින්පසු උපසම්පදාව ලබාගැනීම සඳහා සියම්රටට යනු කැමති මුන්වහන්සේ "බෝවල ධම්මානන්ද" නායක ස්ථවිරතුමාට හා සංඝ රාජහිමිතුමන්ට ඒ බව දන්වා උන්වහන්සේලාගෙන් ලියුම් ලබා ගෙන බු. ව. 2342 කේ මැදින් මස පුරපක්ෂයේදී තවත් සාමණේර පස්නමක් හා ගිහියන් තිදෙනෙකුත් සමඟ ගාල්ලවරායෙන් නැව් නැගී ඉන්දියාවට ගොඩබැස්සේය. එහිදී හමුවූ නාවිකා පිරිසක් බුරුමරටට වෙළඳාම් සඳහා ගොස් පුරුදු බැවිනුත් එහි බෞද්ධාගම බබලමින් තිබෙන බැවිනුත් සියම්රටට යාමට වඩා ඊට ළඟින් පිහිටි බුරුමරටට යාම පහසු බව මේ පිරිසට කීයේය. ඊට එකඟ වූ ඤාණවිමල මාහිමිතුමා ඔවුන් හා බුරුම රටට යන්ට කැමතිවිය. මේ කාලයේදී මුහුදුත් එතර රටකට යාමේ දුෂ්කරතාවය අවබෝධ කළ හැක්කේ ගමනේ විස්තර දුටුවිටය. මුන්වහන්සේගේ චරිත කථාවල ඒ විස්තරය දක්වන්ට නොලැබෙතත් දඩල්ලෙන් ගිය පිරිසේ ගමන් විස්තරය දඹුලූශාසනවංශයෙන් ගෙන කපුගම ධම්මක්ඛන්ධ මාහිමියන්ගේ චරිතයෙහි ඇතුලත්කොට ඇත.

මෙසේ ජීවිතාන්තරායන් පවා නොතකා දුර රටකින් මේ බෞද්ධපිරිස පැමිණි බව දැනගත් "සිරිපවර විජයානන්තඥාන - ත්‍රිභවනාදිත්‍යාධිපති-පණ්ඩිත" මහාධම්ම රාජාධිරාජයෝ අතිශයින් ප්‍රීතියට පත්ව මේ පිරිස පිළිගෙන සංඝරාජතුමන් වෙත පැමිණ වූහ. ලක්දිව ශාසනවර්ධනයට පුලපුලා සිටි "ඤාණාභිවංස - ධම්ම සෙනාපති-මහාධම්ම රාජාධිරාජගුරු" සංඝරාජ මාහිමියෝ ද අතිශයෙන් ප්‍රමුදිත වූවෝ දුරසිට පැමිණි නෑපිරිසක් මෙන් මේ පිරිස පිළිගෙන සිව්පසයෙන් අනුග්‍රහ කරවූහ. ඉක්බිති සංඝරාජ විහාරයට උතුරු දෙසින් මහරජු ගොඩනැංවූ අගනා විහාරයක මේ පිරිස නවත්වා එහි වස් එලඹෙන්ට සලස්වා ඒ කාලය තුළදී උපසම්පන්නයන් විසින් දතයුතු ප්‍රාතිමොක්ෂාදිය ඉගැන්වීය.

මෙසේ උපසම්පදාව දීමට සුදුසු කාලය පැමිණිවිට සංඝ රාජතුමා ඒ කාරණය මහරජුට දැන්විය. මහරජතෙමේ සාමණේර පිරිස රජමැඳුරට ගෙන්වා සංග්‍රහකොට ඉක්බිති මේ සියලුදෙන සිවුරු හරවා පිරිසේ ප්‍රධානවූ ඤාණවිමල හෙරණපාණන් රාජකීය වස්ත්‍රාභරණවලින් සරසවා රජව[illegible]න් නැගී[illegible] ඇ[illegible]දුන්

සෑටයම්ස් හෙඩ් රත්සිම්ගෙයක හැංචා රත් ආලේප කළ ඡත්‍ර දෙකක් දෙපසින් අල්වත්ට සලස්වා හිස මත්තෙහි ඇත්දතින් හා මුතු මැණික්වලින් සැරසූ ඡත්‍ර විශෙෂයක් දරත්ට සැලැස් විය. නෙත්නන්ද කුමාරාභරණවලින් සරසවා වෙස් වෙස් ශෛලාවල තැංවීය. ඉක්බිති සේසත් ආලවට්ටම් ආදිය ගත් මහ පිරිනකින් ද සෙනාපති ආදීන් සහිත රාජකීය පිරිවරින් ද යුත් මහපෙළහරකින් නුවර ප්‍රදක්ෂිණා කරවා "මංගලජණාගාර" නම්වූ තෙමහල් පායට පැමිණවීය. ඉක්බිති අගමෙහෙසිය ප්‍රමුඛ අන්තඃපුර සතුන් පිරිවරාගත් රජතෙමේ එහි පැමිණ ඒ පිරිසට සංග්‍රහකොට අටපිරිකර පුද බුද්ධාභිෂ ප්‍රාර්ථනා කෙළේය. ඉක්පසු සමී සුධර්මා නම් මහා ශාලාවට පමුණුවා මොවුන්ට උපසම්පදාව දුන්මැනවැයි සංඝරාජයන් ප්‍රමුඛ සඟපිරිසට බාරකෙළේය.

ඊට අනතුරුව ඤාණාභිවංස සංඝරාජයන් ප්‍රමුඛ එක්පණස් නමක් මහාසංඝයාවහන්සේ ඒ සුධර්මා ශාලාවට නුදුරු තැන්හි පිහිටි "සුවණ්ණගුහා" නැමති සීමාවට පැමිණ බු. ව. 2345 සේ ඉල් මස පුර තුදුස්වක්ද දවල් පිටවර සය පමණ කාලයේදී සුසිස් හැවිරිදි වූ ඤාණවිමල සාමණේරයාණන් උපසම්පන්න කළහ. ඤාණාභිවංස සංඝරාජතුමා එතුමාට උපාධ්‍යාය විය. (1) උත්තර දේවිගාරාමාධිපති සද්ධීරතුමා ද, (2) පාසාදවිහාරවාසී සද්ධීරතුමා ද (3) සුවණ්ණලෙණාකාරවාසී සද්ධීරතුමා ද කර්මාචාර්ය වූහ. එදිනම (1) මාදම්පේ උත්තමධීරතිස්ස, (2) කොස්ගොඩ විපුලතිස්ස, (3) බාහම්ණවත්තේ ජිනපාලතිස්ස, (4) බෝගහවත්තේ ජයසුම ජිනතිස්ස, (5) වතුරේගම ධම්මාධාරතිස්ස යන පස්නමද උපසම්පදාව දුන්හ. මේ පිරිස සමඟ ගිය "සාද" නම් උපාසක තැන ද එදින පැවිදිකොට ධම්මතිස්ස යන නම දෙන ලදී. ඉන් ටික කලකට පසු ඒ ධම්මතිස්සයන්ට ද උපසම්පන්න කළහ.

මේ උපසම්පදාව ගැන ලියන බුරුම ශාසනවංසපදීපිකාවෙහි මෙසේ කියවේ:– "කලියුගෙ එක වාසඨාධිකෙ වස්සසතෙ නගසො ච සම්පත්තො සීහළදීපතො අම්බගහපතිස්සො.......... ඉමෙ ජසාමණෙරා දස ධාතුයො ධම්මපණ්ණාකාරඤ්චාය ආනෙත්වා අමරපුරං නාම මහාරාජධානි නගරං ආගතා සද්ධිං එකෙන උපාසකෙන" යනාදිය දක්වා තිබේ. එහි කියවෙන බුරුම කලියුග වර්ෂ 1162 යි. එය ක්‍රිස්තු වර්ෂයෙන් 1800 යි. ඒ පොතේ කියවෙන ලෙස මේ පිරිසට කර්මාචාරී වූවෝ නම්:– 1. නාවින්දාභිසද්ධම්මධජ මහාධම්මරාජගුරු, 2. ජනිඤ්ඤාභිධජ මහාධම්මරාජගුරු, 3. මුනිඤ්ඤ ඝොෂ මහාධම්මරාජගුරු යන තුන්නමයි.

මෙසේ උපසම්පදාව ලැබූ පසුත් මේ පිරිස කලක් සංඝරාජයන් වෙත නැවතී තවදුරටත් ධර්මවිනයාදිය ඉගෙන ගත්තෝය. මින් පසු ලක්දිව ශාසනවර්ධනය සඳහා සියරටට යනු කැමති බව දන්නූ විට මහරජතුමා තුන්පිටක පෙළපොත් හා අටුවා ටීකාදිය සම්පාදනය කොට දුණි. සංඝරාජතුමා උපසම්පදාදීපක සන්දේශයක් හා සිවුරු පිරිකරාදිය සපයා දුණි. නිස්සයාචාර්ය අග්ගසාර නම් තෙරනම ඇතුළත් බුරුම තෙරුන් තුන්නමකට ද මේ පිරිස සමග ඒම සඳහා නියම කෙළේය. මෙසේ සිය අදහස් මුදුන් පමුණුවා ගත් මේ පිරිස අමරපුරයෙන් පිටත්ව ක්‍රමයෙන් ගමන්කොට බු. ව. 2346 යේ මැදින් මාසයේදී කොළඹ වරායට ගොඩබැස්සේය. සවතිය දෙහිමිත්‍ර-දුගසාදීන් විසින් උත්සව සහිතව අඹගහපිටියට පමුණුවනු ලැබූ මේ පිරිස අම්බරුක්ඛාරාමයෙහි වාසග්‍රහණය කෙළේය. මේ පිරිස දැකීමට අවට ගම්වලින් ආ නිලධාරීන් හා පැවිද්දන් ඇතුළු පිරිස ඉතා මහත්විය. මේ පිරිස දැකීමෙන් ඔවුන්ට ඇතිවූ ප්‍රීතිය ද එසේම මහත්විය.

ඉක්බිති එම්වර්ෂයේ වෙසක් පුරපසළොස්වක්දා මාදූගඟේ උදකුක්ඛෙපසීමාවට පැමිණි මේ භික්ෂුපිරිස උපසම්පදාව ලබනු කැමතිව නොයෙක් දෙසින් පැමිණි අපේක්ෂකයන්ට අග්ගසාර මහාස්ථවිරතුමන් උපාධ්‍යායකොට උපසම්පදාව දී ලක්දිව අමරපුර නිකාය පිහිටුවිය.

නැවත වරක් බුරුම රටටයාම.

වීරපුරුෂයෝ විපත්-අභාවරායනවලදී පසුබසින්නෝ නොවෙත්. එබැවින් ඥාණවිමලතිස්ස විරයාණෝ අවුරුද්දකට වැඩිකලක් ගතකරමින් ගමන් කළයුතුවූ බුරුමරට ගමනට පසුබට නොවී අග්ගසාර මහතෙරුන් මෙහි තවතා තමන් කීපදෙනෙකුත් සමග නැවත අමරපුරයට ගොස් උගතයුතුදේ උගනිමින් දෙවර්ෂයක් පමණ එහි වැස "මහාධම්මරාජාධිරාජගුරු" උපාධියද ලාංකික අමරපුරනිකායිකයන්ගේ ගණනායක පදවිය ද ඒ පිළිබඳ වූ ක්‍රි. ව. 1802 දිනම දරණ රාජසන්දේශය ද ලබාගෙන ලක්දිවට නැවී ආවේය. (මා අසාතිබෙන සැටියට නම් මුන්වහන්සේ දෙවෙනිවර එහි වැඩියේ පළමුවර සම්පූර්ණකොට දිය නොහැකිවූ පොත් පත් ලබාගැනීම සඳහාය. දැන් තිබෙන මුද්‍රිත පොත් මෙන් පුස්කොළ පොත් රාසක් එකවරට ලබාගැනීම අපහසු කාරණයකි. එබැවින් අඩුපොත් ලියවා සම්පූර්ණකරදීම සඳහා පසුව කිසියම් දූතයකු එවන ලෙස මහරජතුමා දැනුම් දී තිබුණි. මෙය කෙනෙකු නොයවා උන්වහන්සේම ඒ සඳහා වැඩියේ එකල ලක්දිව නොතිබුණු පෙළ

අටුවාපොත් ආදිය ගෙනැවිත් මෙහි පැවති අඩුව පිරිමසාලීමේ උදුර අදහසිනි) බුරුම මහරජුගේ සන්දේශය දුටු එවකට ලංකාණ්ඩුකාරධුරය දරූ සර් එඩ්වර්ඩ් බාර්න්ස් තුමා මෙතුමාගේ නායකධුරය ස්ථිරකොට 1825 දතම දරණ අක්ත සාඩදුසියක් දුණි මුත්වහන්සේගේ අවසරය නැතිව පාතරට ඉංග්‍රීසි ආණ්ඩුව යටත් පෙදෙසේ කිසිවකු පැවිදි නොකල යුතුයයි නියමයක් ද ඒ වර්ෂයේදීම කරනලද නමුත් මේ මහාස්වාමීන්ගේ ඕනෑකමින්ම ඒ නීතිය අවලංගු කරවන ලදි.

**රාජ්‍යානුශාසනය කළ ශිෂ්‍යයෙක්.**

දෙවෙනිවර මුත්වහන්සේ සමග බුරුම්රටට ගිය ශිෂ්‍යයෙක්වූ "වතුරේගම ධම්මාධාරතිස්ස" ස්ථවිරතුමා ඇසැම්රට රජුගේ ආරාධනාව ලෙස එහිගොස් රාජගුරුපදවියට පත්විය. ඒ කාලයේදී ඇසැම්යට අයත් ප්‍රදේශයකට පහරදීම පිණිස ඉංග්‍රීසිහු පැමිණියහ. ඇසැම්රජ ධම්මාධාරස්ථවිරතුමාට රාජ්‍යය භාරකොට යුද්ධ පිණිස ගියේය. එහිදී රජු මලබැවින් රට වැසියෝ ද ඇමතිවරු ද සාකච්ඡාකොට මේ ස්වාමීන්වහන්සේ රජකමට තෝරාගත්හ. ඉංග්‍රීසින් ක්‍රමයෙන් රට අල්වාගෙන නුවර සමීපයට ආකල්හි ඇමතියන් යුඩයට සැරසුණු නමුත් ස්ථවිරතුමා යුඩයේ ආදීනව කියාදී සමාදානයෙන් ඉංග්‍රීසින්ට රට පාවාදෙන්ට සැලැස්විය. (චරිතයේ අගතිබෙන ලිපිය බැලිය යුතු)

ඤාණවිමලතිස්ස මාහිමියන්ගේ තවත් බොහෝ ව්‍යක්තතර ශිෂ්‍යයෝ වූහ. මෙතුමාගේ ඇවෑමෙන් නිකාය පාලනය කළ බෙරතුඩුවේ ධම්මාධාරතිස්සනායක මහාස්ථවිර තුමා මෙතුමාගේ සොහොයුරෙකුගේ පුතෙක්විය. තවත් දීප්තිමත් ශිෂ්‍යයෙක් නම් කහවේ ඤාණානන්දතිස්ස මහාස්ථවිරතුමාය. සීමාලංකාර සංග්‍රහයට සන්නයක් මුන්වහන්සේ විසින් ලියනලදී. "හෙළදිව් අබ්දනවත" ආදී ග්‍රන්ථකීපයක් කළ මාතර සරණපාල මහා ස්ථවිර තුමා තවත් ශිෂ්‍යයෙකි.

මෙසේ ලංකාශාසනය වර්ධනයකොට ලක්දිවට මහත් සෙතක් සැලසූ මුන්වහන්සේ ජීවිතකාලයේදී බොහෝ වෙහෙස වින්ද නිසාදෝ දීර්ඝකාලයක් ජීවත්නොවී හැටහත්වියෙහිදී බු ව 2378 වේ ඇසළමස පුරදියවක්ද උදෑසන් කාලයේදී අපවත්වූහ. අපවත්වෙනවිට උන්වහන්සේ වැඩසිටියේ වැලිතර "නායක පන්සල"යයි කියනු ලබන පුෂ්පාරාම යෙහිය.

මුන්වහන්සේගේ ආදර්ශන මහෝත්සවය ගරුගම්භීරාකාරයෙන් පැවැත්වූ බව කියයුතු නොවේ. භස්මාවශේෂය ගෙන අම්බරුක්ඛාරාමයේ සෑයක් බන්දවනලදී. කලකදී එය දිරාපත් වූයෙන් මෙකල අම්බරුක්ඛාරාමයේ ආධිපත්‍යය උසුලන පණ්ඩිත අහුන්ගල්ලේ විමලකිත්තිතිස්ස මහාස්ථවිරතුමාගේ අනුශාසනාව පරිදි එය අලුතෙන් ගොඩනංවනලදී.

මේ චරිතය ලිවිමට ඕනෑ තොරතුරු සියල්ල මේ විමල කිත්තිතිස්ස ස්ථවිරතුමන් සපයාදුන් බව කෘතඥතා පූර්වකව මෙහි සඳහන් කරමි. 1922 කේ පෙබරවාරි මාසයේ පළවූ සුරසඳ සඟරාවෙහි ද මේ චරිතය පළවී තිබේ. එය ද මෙහිදී කියවා බැලීමි.

මේ චරිතයෙහි කියවුණු වතුරේගම ධම්මාධාරතිස්ස ස්ථවිර තුමන් ගැන 1901 පළවූ ඥානාදර්ශ සඟරාවේ පස්වෙනි කොටසේ 74 වෙනි පිටේ මෙසේ පළවතිබේ:- "ලක්දිව අමරපුර සමාගම පිහිටුවීම පිණිස ක්‍රි ව. 1798 දී අඹගහපිටියේ ඥාණ විමලතිස්ස නායක ස්ථවිරයන්වහන්සේ බුරුම රටට වඩිද්දී උන්වහන්සේ කැටුවගිය මහපිරිසෙන් මුන්වහන්සේ එක් නමක් වීය. මෙකී නායක ස්ථවිරයන්වහන්සේ බු ව. 2344 (ක්‍රි ව. 1802) දී මෙහි නැවත එද්දී උන්වහන්සේ සමග මේ වතුරේගම් සාමීන්වහන්සේ නෑවිත් බුරුමයෙහිම නැවතී ආගමධර්මය ඉගෙණ රජ්ජුගෙන් රාජගුරු නාමයක් ද ලබාගෙන ඉතා ප්‍රසිද්ධ භාවයට පැමිණියේය. මේ කාලයේදී එවකට බුරුම් රාජ්‍යයට අයිතිව තිබුන ප්‍රදේශයක්වූ ඉන්දියාවේ නැගෙනහිර කෙළවර පිහිටි ඇසෑම් පලාතේ ආණ්ඩුකාරධුරයට කෙනෙක් අමුතුවෙන් පත්කිරීම උවමනාවිය. මේ කාලයේදී මුන්වහන්සේ රජ්ජු හා ඉතා මිත්‍රව විසූ හෙයිනුත් රටේ වියවුල් හටගෙන තිබුන හෙයිනුත් රජ්ජුවිසින් ඒ ධුරය උන්වහන්සේට පවරණ ලදින් එය උන්වහන්සේ පිළිගෙණ ප්‍රව්‍රජ්‍යාවෙහිම සිට එහි කටයුතු දැහැමින් ඉටකෙළේලු.

"ඉක්බිති ඉංග්‍රීසි ආණ්ඩුවත් බුරුමආණ්ඩුවත් අතර පළමු වෙනි බුරුම යුද්ධය පටන්ගත් කාලයේදී, එනම් ක්‍රි. ව. 1824 දී, ඉංග්‍රීසි යුද්ධසේනාව මේ ඇසෑම් පලාත අල්ලාගැණීමට ගොස් එහි අගනුවර වටලා යටත්ව පලාත බාරදෙනලෙස උන්වහන් සේට පත් යවා යුද්ධයට සැරසී සිටි වේලෙහි බුරුම සේනාව විසින් පොලොවයට වෙඩිබේත් පිප්ප වලලා ඉංග්‍රීසීන් විනාශකර දැමීමට හා ඔවුන් සමග සටන් කිරීමටත් අවසරගැණීමට කළ යෝජනා කිසිවකට උන්වහන්සේ කැමතිනොවී තමා ශ්‍රමණ

භූමියෙහි සිටි බැවින් ප්‍රාණඝාත අකුසලයට අසුනොවී ගැලවෙනු පිණිස උපායක් සලකා ඉංග්‍රීසි සේනාධිපතියා විසින් එවකලද පතට උත්තර යවන්නේ ඔහු සමග සාකච්ඡාකිරීමට කැමති බැව් දන්වා යවා ඊට එකඟවූ බැවින් මාර්ගයේ ස්වභාවය නොපෙණෙන පිණිස උන්වහන්සේගේ ඇස් කඩකින් වසා රැකවල් සහිතව එකි මූලාදානියා වෙත ගෙනයන ලදී. එහිදී උන්වහන්සේ විසින් බොහෝවූ යුධෝපකරණ ද හතු පිප්පුතා වාගේ තිබුන ඉටිහෙවල් රැස ද දැක භය පත්ව තමා ප්‍රව්‍රජිතයෙක් බැවින් ප්‍රාණවධයට බැඳිය නොහැකි බවත් උන්වහන්සේ ආරක්ෂාකර ගන්නවා නම් තමාගේ පලාත සමාදානයෙන් ඉංග්‍රීසි ආණ්ඩුවට භාරදීමට සතුටුබවත් සේනාධිපතියාට දන්වූයෙන් ඊට එතෙම ඉතා ප්‍රසන්නව ඇසැම් පලාත අත්පත් කරගෙන වතුරේගම සාමිත්වහන්සේ ඉන්දියාවේ ආණ්ඩුවට භාර කෙළේය.

"ඒ ආණ්ඩුව විසින් වාසය පිණිස කලිකතාවේ විශාල ගෙයක් වත්තක් ඇතුළුව සියලු වියදම් දී උන්වහන්සේට සංග්‍රහකෙළේය මෙහි සිටින කාලයේදී උන්වහන්සේ ලක්දිව සිංහලයෙක් බැව් දැනගත් නිසා ඉන්දියාණ්ඩුවෙන් උන්වහන්-සේගේ කරුණු අසා එව්වේය. එවකට මහබද්දෙ පළමුවෙනි මුදලිවුරය දූරු ඩී. සී. ඩී. ඒ. ඩබ්ලිව්. ඩබ්ලිව්. රාජපක්ෂතුමාගෙන් කරුණු අසා අරිණලදින් උන්වහන්සේගේ වැදගත්කම් ආදිය ගැණ කාරණා ආණ්ඩුවට ඔප්පුකරණ ලද්දූහ. ඒ කරුණු මෙරට ආණ්ඩුව ඉන්දියාවේ ආණ්ඩුවට දන්වා යැවූකල උන් වහන්සේ කෙරෙහි ඒ ආණ්ඩුව වඩ වඩා ප්‍රසන්නවිය. පසුව උන්වහන්සේ ස්වකීය රටට ඒමට අදහස දන්වූයෙන් ඉන්දියාවේ ආණ්ඩුව විසින් නැවක් ආදී ගමනට උවමනා සියල්ල සපයා දී නොයෙක් තෑගිබෝග සහිතව මෙහි පිටත්කර එවකලදී මීට පසුව මූන්වහන්සේ නැවතත් විදේශීව ගොස් සියම, කාම්බෝජය, බෙනාවිය ආදී නොයෙක් රටවල සංචාරණයකොට ආවේය. උන්වහන්සේ අභිධර්මයට ද තර්ක ව්‍යාකරණාදි ශාස්ත්‍රවලට ද සමත්කෙක්ව විසුවේය. වර්ෂ 78 ක් ආයු වළඳා ක්‍රි. ව. 1855 දී හලාවතදී කළුරිය කෙළේය.

"රූණභාමිතේ"යයි ප්‍රකටව විසූ කිවිවරියක් මූන්වහන්සේට එවූ කවියකට මූන්වහන්සේ යැවූ පිළිතුරු කවිය මෙසේයි:-

"නෙක රටවල ඇවිද මම දැකපු විසිතු රූ
ඒ ක මුවකින් වනා නිමවනු බැරි අපූ රූ
මෙ ක තට සරිලියක් මම් නුදුටිමි මිතු රූ
ල ක රජ මහිමි නම් අද දෙමි නෙක ඉසු රූ"

## 14. කපුගම ධම්මක්ඛන්ධ මහා ස්වාමිපාදයෝ

(බු. ව. 2311-2380 ක්‍රි. ව. 1768-1837)

අමරපුරනිකායේ දඹලුශාඛාව ඇතිකළේ මූන්වහන්සේය. කපුගම වනාහි දෙවුන්දරට අයත් පෙදෙසකි. දෙවුන්දර දේවාලයේ කපුවක් විසූ බැවින් එගමට ඒ නම ලැබුණේයයි දෙවුන්දර ඉතිහාස ලිවූමෝ කියත්. "කපුගම බෝද්දූර දිනසේන ද සිල්වා උපාසකමහත්මයා සහ වාච්චි ජයසිංහ කළුහාමි උපාසිකාම්හත්මිය යන දම්පතීන්ට බු. ව 2311 (ක්‍රි. ව. 1768) දී පුත්කුමරුවෙක් ලැබුණේය. මොහුට "කන්දේරිස්" යන නම තබනලදී. දඹල්ලේ විසූ රාජපක්ෂ මහ මුදලිඳු දෙගුරුන්ගේ කැමැත්ත පරිදි මේ කුමරුවා කැඳවාගෙන ගොස් මහණකරවා වල්පොල ගුරුන්නාන්සේට බාර කරන ලදුව මනාසේ උගත්තේය" යන වාක්‍යය ගන්දර පී. ඩී. ඇස්. වීරසූරිය මහතා ලියූ "දෙවුන්දර ඉතිහාසය" නම් පොතේ 181 වෙනි පිටේ දක්වේ. මෙතුමන්ගේ මවුපියනම් හා උත්පත්ති වර්ෂය දක්වන අන්කිසි ලිපියක් දකින්ට නොලැබුණි.

වතුගෙදර විජයශ්‍රීවර්ධන මුදලිඳුරාමාධිපතිව වැඩවිසූ රත්ගම සිරිසුමන මහාස්ථවිරතුමන් විසින් සමපාදිතව 1909 යේදී මුද්‍රිතවූ "අභයතිස්සනායක ස්ථවිරචරිත"යෙහි වනාහි කපුගම ධම්මක්ඛන්ධ නායකස්ථවිරයන් වහන්සේ වැලිවිට පිණ්ඩපාතික සරණංකර සංඝරාජමහාස්වාමිපාදයන් වහන්සේගේ ශිෂ්‍ය වල්පොල* මහාස්ථවිර පාදයන්ගෙන් ප්‍රව්‍රජ්‍යාපසම්පදාව ලබා ධර්මවිනය ශබ්දශාස්ත්‍ර උගෙණීමෙන් ප්‍රසිද්ධ බවට පැමිණිකල එවකට සියම්නිකායේ පහත රට නායකපදවිය ඉසුලූ මිදිගම ධම්මානන්ද

---

* උඩදී "වල්පොලගුරුන්නාන්සේ"යයි කියවුණු පුද්ගලයාමය. ගුත්තිල කාව්‍යවර්ණනා මුඛබන්ධයෙහි මේ වාක්‍යය පෙනේ:- "කරතොට බෝවල යන පැවිදි පණ්ඩිතයන් සේම සංඝරාජස්වාමීන් වහන්සේ වෙයින් හා උන්වහන්සේගේ පිරිවර පණ්ඩිතයන් වෙතින් ද ශාස්ත්‍රාද්‍යග්‍රහණය කළාවූ ගිහි පණ්ඩිතයෝ තුන්දෙනෙක් ද ලංකාවේ පහතරට හොබවමින් සිටියාහුය. ඔවුහු නම් කපුගම් ගුරුන්නාන්සේය, වීරගුළේ ගුරුන්නාන්සේය, වල්පලගුරුන්නාන්සේ යයි ප්‍රකටවූ පඬිවරයෝ වෙත්. මොවුහු ද ශාස්ත්‍රාද්‍යග්‍රහණය කරණ කාලයෙහි පැවිදිව සිටියාවූ අයයි. මෙයින් වීරගුළේ ගුරුන්නාන්සේහට විශේෂාචාර්යවූයේ අත්තරගම රාජගුරුබණ්ඩාර මැතිතුමා යයි කියති. වීරගුළේ ගුරුන්නාන්සේ අතින් ශාස්ත්‍රය ලැබ ඉතා ප්‍රගුණත්වයට පැමිණි ශිෂ්‍යයා, නම් මිරිස්සේ ධම්මානන්ද නායකස්ථවිරයන් වහන්සේය."

"වල්පල ගුරුන්නාන්සේ නම් පඬිවරයා දඹලුපැවිදි පරම්පරාවේ ප්‍රථම පුරුෂවූ සිරිධම්මක්ඛන්ධනායකස්වාමීන් වහන්සේට ආචාර්ය විය."

නායක ස්ථවිරපාදයන් වහන්සේ සිය කැමැත්තෙන් උන්වහන්සේගේ නායකපදවිය උන්වහන්සේ ප්‍රධාන 25 නමක් සහ ඒ. බී. ඒ. ඩබ්ලිව්. වික්‍රමරත්න රාජපක්ෂ අතපත්තු මුදලිතුමාද විජයසුන්දර ශ්‍රීවර්ධන රාජපක්ෂ මුදලි තුමාද අත්සන් කරණලද අක්ත කඩදාසියකින් ශ්‍රී බුද්ධ වර්ෂ 2347 ක්වූ ඇසළමාසයේදී ඉහතකී කපුගම ධම්මක්ඛන්ධ මහා ස්ථවිරයන් වහන්සේට පත්කරණ ලද්දේය" යන වාක්‍යය පෙනේ.

අඹගහපිටියේ ඤාණවිමලතිස්ස මාහිමියන් බුරුම රටට ගොස් අමරපුරයෙන් උපසම්පදාව ලබාගෙන ලක්දිවට පැමිණි පසු බුරුම රටේ තොරතුරු දැනගත් මූත්වහන්සේ ද පිරිසක් සමග බුරුම රටට යනු කැමති වූහ. ඒ බව සවකීය දායකයන්ට දැන්නූ විට දබල්ලේ විසූ "අදිරියන් ආබ්‍රෙව් රාජපක්ෂ මහමුදලි" තුමා ඇතුළු දායකයන් විසින් රුත්ගුත් මහසෑයට පිදීම සඳහා පූජාවස්තු ද අමරපුරවැසි මහතෙරවරුන්ට පිදීම පිණිස නොයෙක් පිරිකර ද බුරුම මහරජුට තෑගිදීමට පඬුරු ද පිළියෙළ කරන ලදී.

පාලියෙන් ලියා තිබෙන දබලුශාසනවංශයෙහි දැක්වෙනසේ ඒ බඩු ලැයිස්තුව මෙසේයි:- බුරුම තෙරවරුන්ට පූජා සඳහා සියුම් කපු පිළියෙන් සෑදූ සිවුරු, රතු-කහ-සුදු පැහැති ඇතිරිලි, අඩිපියන් සහිත යකඩ පාත්‍ර, යකඩ තැටි, පිත්තල පඩික්කම්; මහරජුට දීම සඳහා රියනක් පමණ උසැති පිත්තල පිළිමයක්, වියතක් උසැති ලෝහ පිළිමයක්, අනුරාධපුර මහා බෝධියෙන් ලබා ගත් ලීකැබැල්ලක්, සර්වඥධාතු දශනමක් හා රහත්ධාතු පස්නමක්, කැටයම් සහිත රියනකට වැඩිතරම් උසැති හඳුන් ලීපෙට්ටි දෙකක් හා ඇත්දත් කැටයමෙන් යුත් මිටි රියනක් පමණැති පෙට්ටියක්; යන පිරිසේ ප්‍රයෝජනය සඳහා සිවුරු-ඇතරිලි-කුඩා-සෙරෙප්පු හා බෙහෙත් තෙල් තිස්වර්ගයක්ද කැපකරුවන් අතට බාරදුන් වරාගත් දෙසියයක් හා රිදීමුදල් රාශියක්ද යන මේවායි. "ම්‍රම්මවංශ විනිශචය" නමැති පොතේද මේ බඩුවලින් බොහොමයක නම් දක්වා තිබේ.

මෙසේ ඔනෑදේ සම්පාදිතවූ පසු ධම්මක්ඛන්ධ ස්ථවිර තුමා ධම්ම රක්ඛිත, ධම්මදින්න, ගුණරතන, සුමන යන නම් ඇති භික්ෂූන් සතරනමක් ද "සංඝතිස්ස, ජානානන්ද" යන සාමණේර දෙනමක් ද කැපකරුවන් තුන්දෙනෙකුත් ද සමග බු. ව. 2351 වෙනි වර්ෂයේ බිනරමස අවපක්ෂයේ දෙවෙනිද ගාලුවරායේදී "සම්මට්ටි" නමැති මිනිසකුගේ යාත්‍රාවක නැගී එමවර්ෂයේ වප්මස ශුකල පක්ෂයේ පස් වෙනිද නාගපට්ටනයට පැමිණියේය.

එහිදී මේ පිරිසට අමරපුරයට (දෙවෙනිවර) ගොස් හැරී එන "බොධිරුක්ඛාරාමතිස්ස, බ්‍රාහ්මණාරාමතිස්ස" යන දෙනම හමුවූහ. ඉක්බිති වප්මස එකොළොස් වෙනිදා "සලංගු" නමැති යෝනක මිනිසකුගේ නැවක නැගී ඒ මාසයේ කළුවර පක්ෂයේ දෙවෙනිදා සින්නපට්ටනමට පැමිණියාහ. එහිදී ඒ පිරිසට ඤාණවිමලතිස්ස මහාස්ථවිරතුමා* හමුවිය. (කලින් නම් කියවුණු බොධිරුක්ඛාරාමාදි දෙනමද මූන්වහන්සේගේ පිරිසට අයත් වූවෝය.)

සිත්තපට්ටනමට පැමිණි මේ පිරිසට බුරුමරට දෙසට යන නැව් නැති බැවින් එහි පස්මසක් නවතින්ට සිදුවිය. එනුවර පෘතිගීසි මිනිසකුගේ ඉඩමක විසූ මේ පිරිස රත්ගුත් නුවර නැවතීමට යන "කැප්ටන් කොටෙන්" නමැති ඉංග්‍රීසිමහතකුගේ නැවක නැගී නවම්මස කළුවර පොහෝදා උදෑසන සිත්ත පට්ටනමෙන් නික්ම බක්මස පුරපක්ෂයේ පස්වෙනිදා රත්ගුත් වරායට පැමිණියේය. රත්ගුත් පෙදෙසේ වැසි මණ්ඩලික රජතුමා මේ ප්‍රවෘත්තිය අසා මේ පිරිස තමන් වෙත ගෙන්වා තොරතුරු විචාරා අමරපුරයේ රාජාධි රාජයන්ට දන්වා අවසරය ලැබෙන තුරු මෙහිම විසුව මැනවැයි කියා එනුවර ගණාචාර්ය මහතෙරුන් වෙත නවත්වා උපස්ථාන කරවිය.

ඉක්බිති මෙපුවත අමරපුරයේ මහරජු වෙත දන්වා යවන ලදින් ඒ පිරිස අමරපුරයට එවනසේ අණ ලැබුණ බැවින් 2352 වෙනි වර්ෂයේ ඇසළමස අවපක්ෂයේ සවෙනිදා රත්ගුමෙන් නැව්නැග බිනරමස අවපක්ෂයේ 12 වෙනිදා අමරපුර තොටට පැමිණියහ. දෙදිනක් නැවේම වාසය කල පසු මහරජු එවූ සිරිනන්දසූර නමැති පණ්ඩිතාමාත්‍යයා මේ පිරිස හා සාකච්ඡා කොට අසෝකාරාමයෙහි සංඝරාජයන් වහන්සේ වෙතට පමුණුවා එහි වසන්ට සැලැස්වීය. ඉක්බිති වප්මස 9 වෙනිදා යථෝක්ත ඇමතියා විසින්ම මේ පිරිස අවානුවර රාජභවනයට† පමුණුවන ලදින් ඇතුළු නුවරම පිහිටි රජ මහාවිහාරයෙහි කීපදිනක් විසීය. ඉන්පසු ඒ ඇමතියාගේ මග පෙන්වීමෙන් ගොස් ඒ මහරජු කරවූ ස්වර්ණාලිප්ත මහා චෛත්‍යය ද ශ්‍රීපාද සටහන ද දැක වැඳපුදා පසුදා මහරජු කරවූ පස්රියන් උසැති "චන්‍ද්‍රමුනි" ලෝහ පිළිමය වැඳ උසින් පසළොස් රියනක් ද පළලින් දෙළොස් රියනක් ද වටින් සතිස් රියනක් ද ඇති

---

* පළමුවර බුරුමයට ගොස් 1800 දී මෙහි පැමිණි මූන්වහන්සේ ඉන් අවුරුදු කීපයකට පසු නැවත බුරුම රටට වැඩියේය.

† මේ කාලයේදී රජතුමා විසුවේ "අවා" නමින් ප්‍රකට රතන පුරයේය. අමරපුරය ඊට නුදුරු තැන ගඟේ අනික් ඉවුරේ පිහිටා තිබුණි.

අත්විශාල ලෝහ ඝණ්ටාව බලා රත්පිදියෙන් සැරසූ තෙමහල් පියසි ඇති ගෙයක වසන ජිදූනාත ඇත්රජු ද දැක නවදිනක් රජමහවෙහෙර වැස අමර පුරයට අවුත් සත්රියන් උසැති මහාමුනි නමැති පස්ලෝ පිළිමය ද වැඳ නැවත අශෝකාරාමයෙහි වාසයට පැමිණියහ.

ඊට පසුදින ඒ පණ්ඩිතාමාත්‍යයා විසින් මේ පිරිස අමාත්‍ය මණ්ඩලය සහිත මහරජු වෙත පමුණුවනලදින් මහරජුට තමන්ගේ උපසම්පදාව ලැබීමේ අදහස දැන්නූ විට රජතුමා "ස්වාමීනි, හිරණ්‍යසිත් ගෝවින්ද නම් බ්‍රාහමණයෙක් මෙහි එන්නේය, ඔහුගේ ඒම දක්වා නැවතී සිටිය මැනවැ"යි කීවිට නැවත අමරපුරයේ අශෝකාරාමයට පැමිණ එහිම විසීය. භාරමසක් ඇවෑමෙන් ඒ බ්‍රාහමණයා ආවිට සංස්කෘත භාෂාවෙන් ප්‍රශ්න විචාරීම් ආදිය කරවා අශෝකාරාමයට නැගෙනහිර දෙසැ පිහිටි මහාමංගල සීමාව නොයෙක් විධියෙන් සරසවා "ඤාණාභිවංස ධම්මසේනාපති" සංඝරාජ මහතෙරුන් ප්‍රමුඛ එකුන්තිස්නමක් තෝරා "මේ පිරිසට උපසම්පදාව දුනමැනවැ"යි බාර කෙළේය.

ඉක්බිති බු. ව. 2352 කේ මැදින්මස අවපක්ෂයේ දශවෙනිදා සංඝරාජතුමන් උපාධ්‍යාය කොට මණිමාලාලංකාර මහ තෙරුන් හා අනොමසිරි මහ .තෙරුන් කර්මාචාර්‍ය කොට ධම්මක්ඛන්ධාදි පස්නම පූනශික්ෂාව ලැබූහ. ඊට පසුදා එම සීමාවේම රැස්වූ සතළොස් නමක් විසින් පෙරකී උපාධ්‍යාය-කර්මාචාර්‍යයන්ම ඇතිව "සංඝතිස්ස ජනානන්ද" යන සාමණේර දෙනමට උපසම්පදාව දෙනලදී. ඊට පසුදා සවස ඒ සීමාවේ රැස්වූ අටවිසිනමක් විසින් "ඤාණාලංකාර සද්ධම්මධජමහාධම්ම රාජගුරු" මහතෙරුන් උපාධ්‍යාය කොට ගුණසිරි මහතෙරුන් කර්මාචාර්‍ය කොට පුනශික්ෂාව ලැබූ පස්නමට හා උපසම්පදාව ලැබූ දෙනමට දළ්හීකර්මය කරනලදී.

ඉක්බිති මහරජතුමා ශිෂ්‍යදෙනම සහිත තෙරුන් පස් නමට ලක්දිවට ගෙන ඒම සඳහා ධර්මග්‍රන්ථ රාශියක් බාරදුණි. ඉන්පසු නාමප්‍රඥප්ති දෙමින් 1. ධම්මක්ඛන්ධ මහාස්ථවිරතුමාට "සද්ධම්මවංස පාල සිරිධම්මක්ඛන්ධ රාජගුරු" යන නාමය දුණි. 2. ධම්මරක්ඛිත තෙරුන්ට "ඤාණාභිවංස සිරිධම්මරක්ඛිත"යයිද, 3. ධම්මදින්න තෙරුන්ට "ආරියවංස ඤාණාභිධම්මචාරී" යයි ද, 4. ගුණරතන තෙරුන්ට "බුද්ධවංස සාරදස්සී" යයි ද, 5. සුමන තෙරුන්ට "ඤාණාලංකාර අත්ථදස්සී" යයි ද, 6. සංඝතිස්ස භික්ෂුනමට "ඤාණසාගර සාසනවංස" යයි ද, 7. ජනානන්ද භික්ෂුනමට "ගුණාලංකාර ජිනවංස" යයි ද නම් දුණි.

මෙසේ උපසම්පදාව හා පොත්පත් ආදිය ලබාගත් මේ පිරිස මහරජුගෙන් හා සඟරජුනෙන් අවසර ලබාගෙන 2352 මැදින්මස අවපක්ෂයේ 12 වෙනිදා නැව්නැගී එම වර්ෂයේ බක්මාසයේ පුරපසළොස්වක්දා රත්ගුත් නුවරට ආයේය. එවිට හංසාවතියේ නිවැසි නිලධාරීහු මේ පිරිස පිළිගෙන "බුද්ධරක්ඛිත මහාධම්මරාජගුරු" යන උපාධිය ලැබූ ගණාචාර්ය මහතෙරුන්ගේ ආරාමයට පමුණුවා එහි වාසය කරවූහ. එහි වසන විට දෙඩන්දූවෙන් ගිය එක් කැපකරුවෙක් අතීසාර රෝගයෙන් මළේය. එවිට ඔහුගේ වැඩිමහලු සොහොයුරා වූ කැපකරුවා පැවිදිවෙන්ට කැමතිවිය. එයසා හංසාවතියේ මණ්ඩලික රජතුමා සිවුරු පිරිකර දී මේධානන්ද මහතෙරුන් ප්‍රමුඛ විසිපස් නමක් සංඝයා වෙත පමුණුවා ඔහු පැවිදි කරවා උපසම්පන්න කරවිය. ඔහට "බුද්ධරක්ඛිත" නාමය දෙනලදී.

එ දවස්හිම අත්තුඩාව ගමේ ධම්මරක්ඛිත භික්ෂුවගේ අතවැසි සාමණේර දෙදෙනෙක් ඒ සීමාවේදී ඒ උපාධ්‍යාය-කර්මාචාර්යයන් ඇතුව උපසම්පදාව ලැබූහ. ධම්මරක්ඛිත භික්ෂු-තෙමේ ද ඒ උපාධ්‍යාය - කර්මාචාර්යයන්ම ඇතිව පුනශික්ෂාව ගත්තේය. ඉන්පසු අත්තුඩාවේ භික්ෂූනම හා පිරිසත් ධම්මක්ඛන්ධතෙරුන් සමග එහි නැවතී සිටියේය. බොධිරුක්ඛා-රාමතිස්ස තෙරය ඥාණරතනතිස්ස තෙරය යන මේ දෙනම ද පිරිසක් සමග එකල හංසාවතියට පැමිණ සිටියාහ.

ඉක්බිති ධම්මක්ඛන්ධතෙරුන් ප්‍රමුඛ පිරිස 2353නේ මැදින්මස පුරපක්ෂයේ 11 වෙනිදා හංසාවතියෙන් පිටත්ව ඒ වර්ෂයේ බක්මස පුරපක්ෂයේ 13 වෙනිදා නාගුරුපට්ටනමට අවුත් එහි "අබ්දුල් කාදර්" නමැති ධනවතකුගේ බඩුගබඩාවේ නැවතුනේය. එහි වසනවිට ඥාණරතන නමැති තෙරනම සිවුරුහැර ගියේය. මේ තොරතුරු ලක්දිවට දන්වා එවන ලදින් දඩල්ලේ දායකවරු ගාල්ලෙන් නැවක් පිටත්කර නාගපට්ටනමට යැවූහ. ඒ නැව නාගපට්ටනමට පැමිණි බව දැනගත් ධම්මක්ඛන්ධාචාර්යතුමා හා පිරිස නාගුරුපට්ටනමෙන් නාගපට්ටනයට පැමිණියේය. එහිත් යෝනක ධනවතකුගේ ගබඩාවක කිපදිනක් වසන අතර හංසාවතියේදී මහණවී උපසම්පදාව ලැබූ බුද්ධරක්ෂිත භික්ෂුනම සාමණේර බවට පත්විය.

ඉන්පසු ඉල්මාසයේ පුරපස දෙවෙනිදා නැව් නැගී උඳුවප්මස පුරපස 11 වෙනිදා දෙඩන්දූවේ වරායට සම්ප්‍රාප්තවිය. එවිට දායකවරු අවුත් මහපෙළහරින් දඩල්ලේ වාලුකාරාමයට වැඩමවාගෙන ගියහ. ඉක්බිති ධම්මක්ඛන්ධ තෙරණුවෝ බුරුම

උපසම්පදාව ලැබ සිටි තෙරවරුන් රැස්කරවා බු. ව. 2354යේ දුරුතුමස අවපස 1 වෙනිදා ගිංගගේ උදකුක්ඛෙප සීමාවේ දී බොහෝ දෙනෙකුන්ට පුනඃශික්ෂාව දුණි ඉන් මසකට පසු වෙසක්මස පුර පස්වෙනිදා රාත්‍රියේදී වාලුකාරාමයෙහි සීමාවක් බැන්දවීය.

(මේ කරුණු සියල්ලම මාගේ පෑලියෙන් ලියා තිබෙන දඹුලු ශාසනවංශය අනුව ගෙණ ලියනලදී. මේ වන් මාස දිනාදිය විස්තර මෙසේ දක්වනලද්දේ ඒකාලයේදී බුරුමරට ගමන කොතරම් අපහසු දෙයක්ව තිබුණේද්දයි වටහා ගැනීම සඳහාය. මේ කාලයේදී ගිය හැම පිරිසකටම මෙවැනි කරදර විඳින්ට සිදුවූ බවද මෙයින් වටහා ගතයුතුයි. ලක්දිව සිට කෙළින්ම බුරුමරටට යන නැව් ඒකාලයේදී නොවූහ. හැමදෙනම මෙහෙත් ඉන්දියාවට ගොස් ඉන්දියාවෙන් යෝනක වෙළඳුන්ගේ නැව්වල නැගී ගිය බව පෙනේ.

මින්පසු සියම් නිකායේ විසූ අභංගම ධම්මධජ, විලේගොඩ සුමංගලසාර හුඹුහුම්පොලවිහාරයේ වැඩසිටි මහිලවැවේ නායක ස්ථවිර, කුවරගම වැඩසිටි දුල්වෑවේ නායකස්ථවිර, ඉඳුක්වත්තේ නායකස්ථවිර, මාදිලිගම මහාස්ථවිර ආදි බොහෝ තෙරවරු දඹල්ලට පැමිණ පුනඃශික්ෂාව ලබාගෙන ගියහ මින් පසු වරකා පොරන ගොඩ, කෝලත්ගමුවේ, රඹුපොල යන ස්ථවිරවරුන් ප්‍රමුඛ පිරිසක් දඹුලුපරපුරෙන් උපසම්පදාව ලබා ගත්තෝය. (මේ නම් ලබාගත්තේ පැරැළියේ ජිනරතන මහාස්ථවිරතුමන්ගේ ලිපියකිනි )

මෙසේ අමරපුරනිකාය වර්ධනය කළ කපුගම ධම්මක්ඛන්ධ මහා ස්ථවිරතුමා කලකට පසු සිවුරු හැර ගොස් ආණ්ඩුවේ තනතුරක් ලබාගෙන "සමරනායක මූසවෙට්ටි මුදලි" යන නමින් ප්‍රකටව සිට බු. ව. 2380 බිනරමස අවපක්ෂයේ 12 වෙනිදා පරලෝක ගතවීය ඒ මුදලිතුමා ක්‍රිස්තුභක්තිය වැළඳගෙන සිටියේයයි ද ඇතැම් ලිපිවලින් පෙනේ.

## 15. කතළුවේ ගුණරතනතිස්ස මහාස්වාමිතුමා.

(ක්‍රි. ව. 1752 – 1832)

මෙකල ලක්දිව පවත්නා කල්‍යාණිවංශික නිකාය පිහිටුවා වදුශ්‍රී මුත්වහන්සේ ගාලුදිස්ත්‍රික්කයේ හල්ජේ පත්තුවේ කතළුවේ නම් ගමේදී බු. ව. 2295 දී උපන්හ. මෙතුමාගේ පියා කරාවේ උසස් පෙළපතකට අයත් හෙඩිපිතන්ත්‍රිගේ කුමාරදාස වෙදමහතාය. තුඩා කාලයේදීම මෙකුමරුගේ ධනපූර්ණ

ලක්ෂණයක් දුටු මවුපියවරු නියම කාලයේදී මොහුට අකුරු පුහුණු කරවූහ. මේ කාලය වනාහි ලක්දිව භික්ෂූන්ගෙන් හිස්වූ කාලයක් විය. මෙතුමා උපන්නේ සියම් රටින් උපසම්පදාව ගෙනැවිත් මෙහි භික්ෂූන් ඇතිකරන්ටත් වර්ෂයකට පෙරය. සියම් නිකාය පිහිටි ලගදී මහනුවර පලාතේ භික්ෂූන් සුලභ වෙන්ට ඇතත් පාතරට භික්ෂූන් දකින්ට ලැබුනේ ඉතා විරල වශයෙනි, බෞද්ධාගම පැවැත්තේ නාමමාත්‍රයෙනි. එක්වරක් මෙතුමාගේ පියා සංඝිකදානයක් දෙන්ට කැමතිවී ඒ සඳහා භික්ෂූන් ලබාගත්තේ කතළුවේ අටදාගේ වත්තේ වලව්වේ විසූ මුදලිතුමෙකුට ලොකු පිත්තල පඩික්කම් දෙකක් තෑගි කොට ඒ මුදලිතුමාගෙන් ස්ථවිරනමකට දීමට ලියුමක් ගෙනගාමෙනැයි පරම්පරාගත කථාවක් පවතී.

මෙසේ භික්ෂූන්ගේ දුර්ලභත්වය ඇතිබැවින් මේ පිත්ලකුණිස් පුත් කුමරුවා පැවිදිකරවුවහොත් යෙහෙකැයි කල්පනාකල කුමාරදාස මහතා තම ගම අසල පන්සල් නොතිබුණ බැවින් මාතර අසල පෙතාන්ගහවත්ත නම් තැන විසූ බෝවල ධම්මානන්ද මාහිමියන් වෙත ගෙනගොස් මෙකුමරු භාරකළේය.* උගතමනා බණදහම් උගත්පසු පැවිදිකරනු ලැබූ මේ තෙමේ අභිනවූ ගුණරතන යන නාමය ලැබී. ඉන්පසුත් ඒ ආචාර්යයන් වහන්සේ වෙත ධර්මශාස්ත්‍ර උගනිමින් සිටින අතර උපසම්පදාව ලැබීමට යෝග්‍ය වයස පැමිණීයෙන් ආචාර්යපාදයෝ ඥාතීන් හා සාකච්ඡාකොට බු. ව. 2316 දී වශේගොඩ ධම්මකුසල මහා ස්ථවිරතුමන්ගේ ප්‍රමුඛත්වයෙන් තෙල්වත්තේ තොටගමුවිහාරයේ පුරාණ ඛණ්ඩසීමාවේ පැවැත්වූ උපසම්පදාකර්මයේදී මේ ගුණරතන නම් ද උපසම්පන්න කරවූහ. ඒ සීමාව තැන සම්මතයයි පසු කලෙක කථාබස් ඇතිවූ බැවින් පරිශුද්ධ භික්ෂුභාවය අපේක්ෂා කළ ගුණරතන භික්ෂුතෙමේ නැවත බු ව. 2341 දී ඉඳුරුවේ ඉන්ද්‍රජෝති මහාස්ථවිරතුමන්ගේ ප්‍රධානත්වයෙන් තංගල්ලේ කැටන්තොට උදකුක්ඛේප සීමාවේ පැවැත්වූ උපසම්පදා වාරයේදී වශේගොඩ මහාස්වාමීන්ගේ ශිෂ්‍යවූ ධම්මානන්ද මහා ස්ථවිරතුමන් උපාධ්‍යාය කරගෙන උපසම්පදාව ලැබීය.

මේ දෙවෙනි උපසම්පදාවේ සීමාව ගැනත් කලහකට පසු දෝෂාරෝපණ ඇතිවූ බැවින් ද සියම්නිකායේ මූලස්ථාන වූ අස්ගිරි-

---

* අත්තුඩාවේ ධම්මරක්ඛිත මාහිමියන් ද මෙතැන පැවිදිව සිටි බැවින් ඉස්වහන්සේත් එයි පැවිදිවියයි අනුමානයෙක් සලකනු ලැබේ. කරතොට නැමතිපොතේ එය එසේම බව දක්වා තිබේ ඤාණවිමලතිස්ස මාහිමියන් පැවිදිකරන ලද්දේත් බෝවල මහාස්වාමීන් විසිනි.

මල්වතු විහාරවාසීන් අතර සීමා පිළිබඳ විවාදයක් ඇතිවී ඒ ඒ පක්ෂයට උපසම්පදාව සැකැයි චෝදනා කරගත් බැවින්ද සැකයට පත් මුන්වහන්සේ පිටරටකට ගොස් උපසම්පදාව ලබාගැනීමට අදහසක් ඉපදවූහ. මුන්වහන්සේට අවුරුදු පණසක් පමණ වයස් වූ කල්හි අඹගහපිටියේ ඥානවිමලතිස්ස මහාස්වාමිතුමා බුරුම රටට ගොස් පරිශුද්ධෝපසම්පදාව ලබාගෙන මෙහි පැමිණිබව අසන්ට ලැබුණි. උන්වහන්සේ හමුව ඒ සම්බන්ධ ප්‍රවෘත්ති හරිහැටි දැනගත් මුන්වහන්සේත් එහි යාමට ස්ථිරලෙස සිතාගෙන තමා සමග යන පිරිසක් සොයාගෙන තමන්ට මාර්ගෝපදේශකයකු වශයෙන් යාම සඳහා ඥානවිමලතිස්ස මාහිමියන් සමග බුරුමයට ගිය බෝගහවත්තේ ඤාණජිනතිස්ස ස්ථවිරතුමන් කැමති කරවා ගත්තේය.

ඉක්බිති ඥාතිමිත්‍රාදීන්ගෙන් ලත් අනුග්‍රහ ඇතිව ආචාර්යයන් වහන්සේගෙන් අවසර ලබාගෙන 1. බටපොලේ කල්‍යාණතිස්ස, 2. වැලිකොන්දේ ධම්මරතන, 3. කොග්ගල ධම්මසාර, 4. වැලිකොන්දේ පඤ්ඤාතිස්ස, 5. කාරන්දෙනියේ ගුණසාර, 6. මිරිස්වත්තේ මේධානන්ද, 7. කිරින්දේ සීලානන්ද යන සාමණේර නම් හා සැපකරුවන් තිදෙනෙකුත් සමග බු. ව. 2351 බිනර මස පුර අටවක්දා දෙඩන්දූවරුගෙන් ගුලුප්පුවක නැගී මුන්වහන්සේ ගමනාරම්භ කළහ. ලක්දිවින් පිටත්ව දසදිනකට පසු මේ පිරිස නාගපට්ටනමට පැමිණියේය. එහි කිපදිනක් වැස යෝනක වෙළෙන්දන්ගේ රුවල් නැවක නැග රම්ඤ්ඤරට දෙසට යාත්‍රාකළහ. එකොළොස් දිනක් නිරුපද්‍රතව නැව යාත්‍රාකළ පසු එහි සිටි යෝනකයෝ එළු බැටළු ආදි සතුන් රැසක් මරා බිලි පූජාවක් කළහ. එදා රෑ මධ්‍යමයාමයේදී මහත් වැසි සහිත කුණාටුවක් හටගෙන නැවේ රුවල් ඉරී කුඹගස් කැඩී ගියහ. නැව ඒ මේ අත පාවෙන්ට විය. නාවිකයෝ ද වෙළෙන්දෝ ද බියපත්ව තම තමන්ගේ දෙවියන්ට යාච්ඤා කරන්ට වූහ. ගුණරතන ස්වාමිපාදයෝ සියපිරිය අමතා "විපත්තියේදී ශෝකකිරීමෙන් ඵලයක් නැත. සිදුකටයුතු උත්තමාර්ථයක් ඇතිව ආ අපට විපතක් සිදුවුවත් ශෝකයට කාරණයක් නොවේ" යයි අවවාද කළහ.

තෙදිනකට පසු කුණාටුව නැවතී අහස පැහැදිලි විය. ඒ තෙදිනතුළ නැවේ සිටි කිසිවෙක් ආහාර පිසීමට හෝ කෑමට නොසිතීය. ඒ භය ඉක්මගිය පසු ආහාර සපයා අනුභවකොට නැව යාත්‍රාකරවන්ට නොහැකි බැවින් ඇත මෑත බලන නාවිකයන්ට බොහෝ ඈත ගොඩබිමක් පෙනුණි. එය රම්ඤ්ඤරට බව දැනගත් ඔවුන් ප්‍රීතියට පත්වූ නමුත් ගොඩබිම අටගව්වක් පමණ

දුරවූ බැවින් ද බරු-හම්බන් ආදියක් නැතිබැවින් ද ගොඩට ලංවීමට අවකාශයක් නැති විය. එවිට ශ්‍රියාශූරවූ වැලිහොන්ගේ ධම්මරතන හිමිතුමා කැඩී බිඳී ගිය ලී හා උණලී එක්කොට පහුරක් බන්දවා නාවිකයන් සතරදෙනෙකුත් එහි නංවා අනතුර අඟවන කොඩියක් ද ගොඳ එය ගොඩට යැවීය. ඒ නාවිකයන් රත්ගුත් වරායට පැමිණ එහි සීලධාරීන්ට මේ ප්‍රවෘත්තිය දන්වූ විට ඔවුහු ශක්තිසම්පන්න නැවක් යවා අනතුරට පත් නැව වරායට ගෙන්නට සැලැස්සූහ.

එකල්හි රාමඤ්ඤ රට බුරුමරජුට යටත් පෙදෙසක් වූ බැවින් බුරුමරජු යටතේ ප්‍රාදේශික රජෙක් එහි විසීය. සිංහලවීපයෙන් ශ්‍රමණ පිරිසක් නැගී ආ නැවක් අනතුරට පත්ව ඇදගෙන එන ලදැයි දැනගත් ඒ මණ්ඩලික රජතුමා ඒ පිරිස ගෙන්වා සංග්‍රහ කොට ඔවුන් පැමිණි අදහස ගැන විචාළේය. පිරිසිදු උපසම්පදාව ලැබීමේ අදහසින් තමන් පැමිණි බව කීවිට රජතුමා "මේ කුණාටු-වෙන් බොහෝ නැව් හම්බන් විනාශ වූහ; නමුත් ඔබවහන්සේගේ සීල බලයෙන් මේ නැව විනාශ නොවීය. නැවියන්ට ජීවිතය ලැබුණෙත් ඔබ නිසාමය" යනාදිය කියා එක්වර ගණාචාර්ය මහා ස්ථවිරතුමන්ගේ ආරාමයට පමුණුවා උපස්ථාන කිරීම සඳහා නියුක්ත යෙදවීය.

මූදේදී ඇතිවූ පීඩා නිසා ද නුපුරුදු ආහාරපාන හා ඍතුගුණ නිසා ද කීපදිනකට පසු සාමණෙර තුන්නමකට අතිසාර රෝගය වැලඳුණි. එවිට රජතුමා දක්ෂ වෛද්‍යයෙක් ලවා ප්‍රතිකාර කරවා පසළොස් දිනක් තුළ උන්වහන්සේලා සුවපත් කරවීය. ඉක්බිති මණ්ඩලික රජතුමා රත්ගුත් නුවරින් හැ. 45 ක් උතුරෙන් පිහිටි සංඝාවතී නුවර පිහිටි කල්‍යාණී සීමාරාමයේ විසූ එකල රාමඤ්ඤ රට සංඝනායකවූ ඤාණාභිධජ රාජගුරු මහතෙරුන් වෙත මේ පිරිස කැඳවාගෙන ගොස් තොරතුරු කියා බාරකොට මේ පිරිස ධර්මයෙන් අනුග්‍රහකළ මැනවැයි කීය. මේ පිරිස උපසම්පදාව ලබාගන්ට ආ බව දැනගත් රාජගුරු මාහිමියෝ කල්‍යාණී සීමාව පිළිබඳ ප්‍රවෘත්තිය පිරිසට කියාදුණි. "මින් අවුරුදු තුන්සිය ගණනකට පෙර රාමඤ්ඤ රට පාලනය කළ ධම්මචේතිය මහ රජතුමා එකල ලක්දිව ජයවර්ධන පුරයෙහි විසූ භුවනෙකබාහු මහරජු වෙත භික්ෂුපිරිසක් යවා ලාංකික සංඝයාගෙන් කැලණි ගඟේදී උපසම්පදාව ලැබූ ඒ පිරිස සිහරටට පැමිණි පසු බු. ව. 2018 දී මේ සීමාව බැන්ද විය. ඒ රජතුමා ජීවත්ව සිටියදීම බුරුම-රාමඤ්ඤ දෙරට වැසි භික්ෂූන් පසළොස්දහසකට අධික

සංඛ්‍යාවක් මේ සීමාවේදී සිංහල උපසම්පදාව ලබාගත්හ. එබැවින් ඔබවහන්සේ බුරුම මහරජුට දැනුම් දී මෙහිදීම උපසම්පදාව ලබා ගැනීම ඉතා යෙහෙකැ''යි උන්වහන්සේ කීහ.

එයසා අතිශයෙන් ප්‍රීතිමත්වූ කතළුවේ ස්වාමිපාදයෝ ඒ අදහස මණ්ඩලික රජතුමාට දැන්නූහ. රජතුමා ද ඒ අදහසට සතුටුවී මහරජුගෙන් අවසර ලබාගැනීම සඳහා තමන් අගනුවරට යන විට සිංහලපිරිසෙන් දෙනමක් එවනු මැනවැයි කීය. ඉක්බිති ස්වල්ප දිනකට පසු මණ්ඩලිකරජු රතනපුර නමැති අගනුවරට යන බව කී කල්හි කතළුවේ ස්වාමිපාදයෝ වැලිකොත්දේ ධම්මරතන, කොග්ගල ධම්මසාර, දෙනම්ට එහි යන්ට නියම කළහ. නියමිත දිනයේදී මණ්ඩලිකරජ සාමණේරදෙනමට රත් ආලේප කළ පඩවු දෙකක් පිළියෙල කරවා තෙමේත් එවැනි පඩවුවක නැගී පඩවු දශයක නැගුණු පිරිවර ඇතිව හංසාවතියෙන් පිටත්වී එරාවතී ගඟේ ගමන් කොට ක්‍රමයෙන් අගනුවරට පැමිණ රාජභවනයට ගොස් මහරජතුමන්ට ගෞරව දක්වා දක්දිවින් පැමිණි සිංහල ශ්‍රමණ පිරිස ගැන තොරතුරු දැන්විය.

එකල බුරුම-රාමඤ්ඤදෙරටම පාලනය කළ ශ්‍රද්ධාසම්පන්නවූ "සිරිපවරවිජයානන්තයස-ත්‍රිභවනාදිත්‍යාධිපති-පණ්ඩිත මහාධම්මරාජාධිරාජ" තෙමේ එහි පැමිණි සාමණේරදෙනමට වැඳ සැපදුක් විචාරා සංඝරාජාරාමයට පිටත්කරවිය. පසුදිනක තෙමේ ඤාණාභිවංසධම්මසේනාපති සංඝරාජයන් වහන්සේ වෙත එළඹ වැඳ "ස්වාමීනි, ජීවිතාන්තරාය නොසලකා උපසම්පදාව ලබාගැනීමට දුරුරටකින් පැමිණි මේ පිරිසට උපසම්පදාව ලබාදුන මැනැවැ"යි කීය. එවිට සාමණේරවරුන්ගේ අදහස් දැන සිටි සංඝරාජතුමා "මහරජතුමනි, මේ පිරිස කල්‍යාණිසීමාවේදී උපසම්පදාව ලැබීමට කැමැත්තෙන් සිටී. මෙකල එහි සංඝනායකවූ ත්‍රිපිටකධර මේධානන්දධජ මහතෙර ආදී මහාස්ථවිරවරයෝ වැඩ සිටිති. එබැවින් මේ පිරිසට උපසම්පදාව දෙනමෙන් නියම කොට කෘත්‍යසංවිධානය සඳහා ඌ මේ උන් නමැති පණ්ඩිතාමාත්‍යයා ද එහි යැවීම සුදුසුය"යි කීය.

මේ කීමට එකඟ වූ මහරජතුමා හංසාවතියේදී උපසම්පදාව කරවන මෙන් මණ්ඩලිකරජතුමාට නියම කොට ඒ පිරිසට උචිතා සිවුරු පිරිකර ඌ මේ වුන් ඇමතියාට බාර කොට "මේ පිරිස සමග ගොස් උපසම්පදාවේ කටයුතු සියල්ල නොපිරිහෙළා සිද්ධකරව"යි අණකෙළේය. මණ්ඩලිකරජු සහිත මේ පිරිස ක්‍රමයෙන් අවුත් හංසාවතියට ළඟා විය. ඉක්බිති බු. ව. 2351 මැදින්මස පුර

පසළොස්වක්ද මණ්ඩලිකරජ ඌ මේ වුන් ඇමතියා හා සාකච්ඡා කොට සීමාමන්දිරය හා අවට භූමිය සරසවා මේධානන්දධජ රාජගුරු මාහිමියන් ප්‍රමුඛ මහාස්ථවිරයන් එක්තිස්නමක් කල්‍යාණී සීමාවට රැස්කරවා මේ පිරිසට උපසම්පදාව දෙනසේ ඉල්ලා සිටියේය. ඉක්බිති ඒ රාමඤ්ඤ සංඝතෙමේ මේ පැවිදි පිරිස සිවුරු හරවා සුදු පිළී අන්දවා නැවත පැවිදි කරවීය. ඉන් පසු එදින සවස දෙකට පමණ මේධානන්දධජ මාහිමියන් උපාධ්‍යාය කොට (1) ඤාණගම්භීරධජ, (2) පඤ්ඤාසාරධජ, (3) ආචාරවංසධජ යන රාජගුරු මහාස්ථවිර තුන්නම කර්මාචාරී කොට ගුණරතනතිස්ස යතිතුමන් පළමු කොට උපසම්පන්න කළහ. ඊට අනතුරුව ඒ උපාධ්‍යාය-කර්මාචාරීවරයන්ම ඇතිව කල්‍යාණතිස්ස, ධම්මරතන, ධම්මසාර තුන්නමට උපසම්පදාව දුන්හ. ඉතිරි සාමණේර සතර නමට හා කැපකරුවෙක්ව සිට එදින පැවිදිවූ වල්පිට සුමනතිස්ස සාමණේර නැනට මේධානන්දධජ මාහිමියන් උපාධ්‍යාය කොට (1) කෛලාසමහාස්ථවිර (2) සුධම්ම මහාස්ථවිර, (3) උත්තර මහාස්ථවිර යන තුන්නම කර්මාචාරී කොට උපසම්පදාව දුන්හ.

මෙසේ උපසම්පදාව ලබාගත් පිරිස කලක් සවකීය උපාධ්‍යායයන් වහන්සේ වෙතම වසමින් ධර්මවිනයෙහි සැක ඇති තැන් විචාරා දැනගනිමින් විනයකර්ම කිරීමේ පුරුද්දක් ද ඇතිකර ගත්තේය. ඉක්බිති සියරටට එනු කැමති ඒ පිරිස උපසම්පදාව කළ සැටි දක්වන සන්දේශයක් ද නිශ්‍රයාචාර්ය බවට සුදුසු තෙර නමක් ද දෙනසේ උපාධ්‍යායභූත මාහිමියන්ගෙන් ඉල්ලා සිටියේය, එවිට ඒ මහාසවාමිතුමා පාළියෙන් ලිවූ සන්දේශයක් දී එක් එක් නමට ප්‍රාතිමෝක්ෂපොත බැගින් පුද සවකීය ශිෂ්‍යයන් අතුරෙන් ව්‍යක්ත ප්‍රතිබලවිනයධරයෙකුවූ කෛලාස නැමති තෙරුන්ට මේ පිරිස හා ලක්දිවට යන්ට නියම කෙළේය. මණ්ඩලේශ්වර රජුට මේ කාරණය දැන්නූවිට හෙතෙමේ උවමනා මාර්ගෝපකරණාදි සියල්ල සම්පාදනය කොට දුණි. මෙසේ ආචාර්යෝපාධ්‍යාය මහ තෙරවරුන්ගෙන් සමුගෙන රාමඤ්ඤරටින් පිටත්වූ මේ පිරිස නාගපට්ටනමට පැමිණ එතැනින් හුළුප්පුවල නැගී බු. ව. 2353 පොසොන් මස පසළොස්වක්ද (ක්‍රි. ව. 1810 ජූනි මස 17වෙනිදා) දෙඹත්දූවරායට පැමිණියේය.

මෙසේ පරිශුද්ධොපසම්පදාව ලබාගෙන පැමිණි කතළුවේ මහාසවාමීන්වහන්සේ කල්‍යාණීවංශොපසම්පදාව ලබාගනු කැමති කුල පුත්‍රයන්ට උපසම්පදාව දීම සඳහා සියපිරිස සමග ඒ ඒ පෙදෙස්වලට ගොස් උපසම්පදාකර්මයන් කළහ. සියම් නිකායෙන් අවුත් පුනශික්ෂාව ලබනු කැමති භික්ෂූන්වහන්සේට පුනශික්ෂාව දුන්හ.

පැවිදිවනු කැමැති කුලපුත්‍රයන් පැවිදිකරවූහ. මෙසේ ශාසන වර්ධනයෙහි යෙදුණු මුන්වහන්සේ කලින්කල කතළුවේ විහාරය, දෙඹත්දුව දෙහගල්ලේ විහාරය, අම්බලම්ගොඩ පුරාණ සුභද්‍රාරාමය (දැන් රත්කොත් විහාරය), රත්දෙබේ මහාමඞ්ගල සමුද්‍රාරාමය, අලුත්ගම වාලුකාරාමය, කළුතර වැල්ලබඩ විහාරය (දැන් පුලිනතලාරාමය), කරගම්පිටියේ සුබෝධාරාමය ආදී සවකීය විහාරස්ථානයන්හි වාසය කළහ.

ජීවිතාශාව හැරපියා පරිශුද්ධ ශීලසම්පදාපෙක්ෂාවෙන් දුරු රටකට ගොස් උපසම්පදාව ලබාගෙනවුත් ලක්දිව බොහෝ කුලපුත්‍රයන්ට පැවිද්ද හා උපසම්පදාව දෙමින් ධර්මශාස්ත්‍ර දානය ද කෙරෙමින් බුද්ධශාසනය සවශක්තිප්‍රමාණයෙන් බැබලවූ බෝධිසත්වචරිතශ්‍රී ඇති කතළුවේ ගුණරතනතිස්සාභිධාන ඒ මහාස්වාමිපාදයාණෝ රාමඤ්ඤකල්‍යාණිවංශය මෙලක පිහිටෙව් තැන් පටන් දෙවිසි වර්ෂයක් එහි සංඝනායකත්වය උසුලා බු. ව. 2375 හේ ඇසළපුර විසේනියලත් සඳුදා (ක්‍රි. ව. 1832යේ ජුලිමස) කළුතර වැල්ලබඩ විහාරස්ථානයේදී අනිත්‍යභාවෝපගත වූහ.

මේ කරුණු උපුටාගන්නාලද්දේ පාළියෙන් ලියාතිබෙන "කල්‍යාණිවංස ගුණරතනතිස්ස සාසනවංසො" නමැති පුස්කොළ පොතෙහි. මා විසින් සම්පාදිතව 1935 දී මුද්‍රිතවූ "කල්‍යාණිශාසනවංශය" නමැති පොතෙන් වැඩිවිස්තර දතහැක.

## 16. අත්තුඩාවේ ධම්මරක්ඛිත මහාස්වාමිතුමා.

(බු. ව. 2319 - 2317.)

මෙකල ලක්දිව පවත්නා "අමරපුර ධම්මරක්ඛිතවංස"යයි කියනුලබන නිකායේ ආදිපුරුෂොත්තමයා ලෙස සලකන්නේ අත්තුඩාවේ ධම්මරක්ඛිත මහාස්ථවිරතුමාය. ක්‍රි ව. 1775 හේ (බු. ව. 2319යේ) දී දකුණුපළාතේ මාතර නගරයට නුදුරුවූ "අත්තුඩාව" නම් ගමේ "තල්ලවත්ත" නම් ඉඩමේදී වැදගත් කුලපරම්පරාවක මෙතුමාගේ උත්පත්තිය සිදුවිය. ක්‍රමයෙන් වැඩුණු මේ පින්වත් කුමාරතෙමේ පැවිදිවීමෙහි ආශා උපදවා මාතර අසල "වටගෙදර" විහාරයේදී පැවිදිවිය. ඉන්කලකට පසු වැඩිදුර ඉගෙනීම සඳහා එවකට "පෙතංගහවත්තේ" විහාරාධිපතිව වැඩවිසූ දකුණුලක මහ පඬිරුවනක් වූ බෝවල ධම්මානන්ද මහාස්වාමින්වහන්සේ වෙත පැමිණියේය.

බෝවල මහාසාමීන් වෙත ඉගනීමෙහි යෙදුණ ධම්මරක්ඛිත සාමණේරතෙමේ ගුරුවරයාට සුවචකීකරුව වත් පිළිවෙත් නොපිරිහෙළා ඉගනීම කෙළේ ය. උපසම්පදාව නොලබාම දෙතිස්වියෙ වනතෙක් සිටි එතුමා උපසම්පදාව ලබාගැනීමට ඉක්මන් නොවූයේ එකල සියම්නිකායේ පැවති වාදවිවාදදිය නිසායයි සිතිය හැක බෝවල මහාසථවිරතුමා ද ශිෂ්‍යාගරුක උතුමෙක් විය එබැවින් අත්තුඩාවේ හෙරණපාණන් උපසම්පදාව ලබනු කැමතිබව ස්වකීයාචාර්යවරයාට දන්වූවිට බුරුමරටට ගොස් උපසම්පදාව ලබාගැනීම යෙහෙකැයි උපදෙස් දුන්හ. මේ උපදෙස් දුන් කාලය වනාහි ක්‍රි ව 1807 පමණ ය. එවිට පළමුවෙන්ම බුරුමරට සොයා ගොස් උපසම්පදාව ලබාගත් ඥාණවිමලතිස්ස මාහිමියන් ලක්දිවට පැමිණ "අමරපුරනිකාය" පිහිටුවා අවුරුදු කීපයක් ගතවී තිබුණි. උන්වහන්සේගෙන් දැනගත් තොරතුරු නිසා තවත් බොහෝ දෙනෙක් බුරුමරටට යෑමට උත්සාහවත් වූහ 1807 පමණේදී එසේ උත්සාහවත් වූ පිරිස්තුනක් බුරුම-රාමඤ්ඤ දෙරටට ගිය බව පෙනේ ඒ පිරිස් තුනෙන් පළමුකොට පිටත්වගොස් තිබෙන්නේ අත්තුඩාවේ මහාසාමීන් ප්‍රමුඛ පිරිසය.

මෙසේ බුරුමරටට යෑමට උපදෙස් දුන් බෝවල මහා-ස්වාමිපාදයෝ බුරුමරට සංඝරාජමාහිමියන්ට දීම සඳහා පාලි සන්දේශයක් ද ලියාදුන්හ ඉක්බිති අත්තුඩාවේ ස්වාමිපාදයෝ යථොක්ත ඥාණවිමලතිස්ස මාහිමියන්ගෙන්ද සන්දේශයක් ලබාගෙන පොල්වත්තේ සරණපාල, කිරින්දේ ධම්මානන්ද යන සාමණේර දෙනම හා "සලෝ" නමැති උපාසකයකු සමඟ බු ව. 2350ගේදී නැව් නැගී දුරු කතරගෙවා බුරුමරට අමරපුර රාජධානියට පැමිණියේය.

එකල එහි "සිරිපවර-විජයානන්තයස-පණ්ඩිත ත්‍රිභවනා-දිත්‍යාධිපති" මහරජතුමා රාජ්‍යය කෙළේය. ඒ රජතුමාට ධර්මයෙන් අනුශාසනා කරමින් රටවැසි මුළු සංඝසංහතියම පාලනය කළේ ඊකාවාසී "ඤාණාභිවංශ ධම්මසේනාපති" මහාසථවිරතුමාය. මේ කාලයේදී මේ සංඝරාජතුමා උපසම්පදාවෙන් සූතිස් (34) වස් ඇතිව සිටියේය අත්තුඩාවේ ස්වාමීන් ගෙනගිය සන්දේශයක් කියවා බැලූ සංඝරාජතුමා ඒ පිරිස සතුටෙන් පිළිගෙන නවාතැන්දී සංග්‍රහ කරවින ටිකකලක් උපසම්පදාව ලබන්නන් විසින් උගතයුතුදේ පුහුණු කරවා මේ පිරිස උපසම්පදාව ලැබීමට යොග්‍යත්වයට පැමිණිවිට මේ කාරණය මහරජතුමාට දන්වා යැවීය. මහරජතෙමේ සියලු පුවත් විමසා අතිශයින් සතුටුව

ඒ පිරිස රජකුමරුන් මෙන් අන්දවා රන්සිවි ගෙවල තංවා මහපෙළහරින් නුවර ඇවිදුවා රජමැදුරට පමුණුවා “මගුල් සැණකෙළි මැදුර” නමැති තෙමහල්පායෙහි හිඳුවා රජ බිසෝ ඇඳීන් සමග අවුත් අලුත් සිවුරු පිරිකර ආදිය පිදීය

ඉක්බිති සපිරිවරින් සුධර්මා නමැති මහාශාලාවට යවා මේ පිරිසට පැවිදි-උපසම්පදාවත් දුනමැනවැයි ඇමතියකු ලවා මහා සංඝයාට ආරාධනා කරවිය. ඉක්බිති යථෝක්ත සංඝරාජ ප්‍රමුඛ තිස්පස්නමක් මහාසංඝයාවහන්සේ සුවණ්ණගුහා නමැති සීමාවට රැස්ව බු. ව. 2351 ඇසළ පුර පසළොස්වක් ලත් සඳුදා දවල සත් පියවර ඉක්මිකල්හි සංඝරාජතුමන් උපාධ්‍යායකොට වජිරඝෝෂ, ඤාණවංශ, විමලඛන්ධ යන මහතෙර තුන්නම කර්මාචාර්යකොට අන්තුඩාවේ සාමණේරයන් උපසම්පන්නකොට “ධම්මරක්ඛිතතිස්ස” යන නාමය දුන්හ. එදිනම ඉතිරි දෙනමත් සලෝ උපාසකතැනන් පැවිදිකරවා උපසම්පන්න කළහ

ඉක්බිති වජිරඝෝෂ නමැති ගණාචාර්යතුමන්ට බාරදෙනු ලැබූ මේ පිරිස උගතයුතු දේ ඉගෙනගනිමින් සෑහෙන කලක් එහි විසීය. “ලක්දිවට එනු කැමති බව සංඝරාජ මහතෙරුන්ට දන්නූ කල්හි එපවත් මහරජතුමාට සැලකෙළේය. රජතුමා මැනවැයි පිළිගෙන සියලු මාගෝපකරණ හා කපු කෞශෙය්‍ය සිවුරු යනාදි කැපවූ මහඟු පිරිකර ද ලහිරුම්බලකට බඳු ස්වර්ණාලිප්ත ඡත්‍රයක් ද සාරාර්ථදීපනී නම් විනයටීකාව ද කඞ්ඛාවිතරණී නම් අටුවාව ද කිරිගරුඬ ප්‍රතිමාවක් හා රජතමය බුද්ධප්‍රතිමාවක් ද යන මේ වස්තූන් පහන් සිතින් බුදුබව පතා පූජාකෙළේය. ඉක්බිති සංඝරාජතෙරුන්වහන්සේ ද එසේම කැප මහඟු පිරිකර ද උභය ප්‍රාතිමෝක්ෂය හා පට්ඨානප්‍රකරණය ද යමකප්‍රකරණය ද අභිධර්මාර්ථසංග්‍රහ නම් ප්‍රකරණය ද යන වස්තූ-වලින් සංග්‍රහකොට අවවාදානුශාසනාවන් ද දී සියලුදෙනම බුරුම දේශයෙන් ලක්දිව් බලා පිටත්කර එවීය.”

මෙහි අන්තිමට දක්වූ වාක්‍යය වනාහි 1922කේ ජූලිමාසයේ පළවූ “පුරසඳ සඟරා” වෙන් ගත්කාලදී එහි පළවූ මූන්-වහන්සේගේ චරිතය දෙවුන්දර ධර්මරක්ෂිත පිරිවෙනෙන් ලැබුණ බව කියා තිබේ. එහි ගිය කාටත් ලැබුණු සිවුරු පිරිකරාදිය මූන්වහන්සේ ප්‍රමුඛ පිරිසටත් ලැබී මෙරටට ගෙනා බව එහි කියවෙතත් “පැලෑනේ ශ්‍රී වජිරඥාන නායක මාහිමියන්” විසින් සම්පාදිත වූ ශ්‍රී ධර්මරක්ෂිත චරිතයෙහි කියවෙන්නේ “මෙහි පෙරළා වඩනා ගමනේදී මහරජතුමාත් සඟරජතුමාත් බොහෝ කැපසරුප් පිරිකර පිළිම පොත්පත් ආදිය දුන් නමුත් එයින්

පොත් හා යොගාවචර භික්‍ෂූන්හට ප්‍රයොජනවත පත්කුඩයක් හා පමණක් පිළිගත්හ" යන්නකි. මේ දෙකෙන් කොයි එක පිළිගතයුතු දැයි අපි නොදනිමු.

මෙහි පැමිණි පසු බෝවල නායක මාහිමියන්ට මේ සියලු පුවත් දන්වා උන්වහන්සේ විචාරා යැවූ ප්‍රශ්නවලට ලැබුණු උත්තර ද දැනුම්දුන් පසු ඒ මාහිමියෝ බුරුමරට දෙසට හැරී පත්කඩ හෙළා වැන්දහයි මේ ලිපි දෙකේම කියා තිබේ.

මේ පිරිස එද්දී සඟරද හිමියන්ගෙන් ඤාණවිමලතිස්ස මහාසවාමීන්ට දීම සඳහා සන්දේශයක් ලබාගත්තේය. මේ පිරිස මෙහි පැමිණි වර්ෂය අත්තුඩාවේ මාහිමියන්ගේ චරිත කථාවල දකින්ට නොලැබීම පාඩුවකි. යට කී "ශ්‍රී ධර්මරක්‍ෂිත චරිතය" නමැති පොතේ අත්තුඩාවේ මාහිමියන් උපසම්පදාවෙන් පසු පස්හවුරුද්දක් බුරුමරටේ නැවතී සිටි බව කියවේ. නමුත් "කල්‍යාණිවංස ගුණරතනතිස්ස සාසනවංස" නමැති පාලි භාෂාවෙන් සම්පාදිතව පුස්කොළවල ලියාතිබෙන පොතේ කියවෙන්නේ බු. ව. 2352දී ගුණරතනතිස්ස මහාසවාමීන් ප්‍රමුඛ පිරිස කල්‍යාණි සීමාවේදී උපසම්පදාව ලැබූ දවසේදී අමරපුරයට ගොස් හංසාවතියට හැරී ආ අත්තුඩාවේ මහාසවාමීන් ප්‍රමුඛ පිරිස ඒ සීමාවේදීම දල්හිකර්මය ලබාගෙන ඉන් ටිකදිනකට පසු ලක්දිවට හැරී ආ බවය. එහි තිබෙන වාක්‍ය මෙසේයි:— "ඉතො පුබ්බෙ ලංකාදීපතො අමරපුරං ගන්ත්වා ඤාණාභිවංස සංඝරාජං උපජ්ඣාචරියං කත්වා උපසම්පන්නො හත්ථුණ්ඩාභිධානගාමෙ ධම්මරක්ඛිත භික්ඛු ච, තෙමේවුපජ්ඣායං කත්වා පුනසික්ඛං චේව උපසම්පදං ච ගන්තා ධම්මක්ඛන්ධථෙරාදයො ච ඉමස්මිං කාලෙ සිරිමහාඅමරපුරා ‘ගන්ත්වා සකරඨං ගන්තු කාමා හංසාවතියං පටිනිවත්තිත්වා ඨිතා ...... ...... අථ හත්ථුණ්ඩාභිධානගාමෙ ධම්මරක්ඛිතනාමිකස්ස භික්ඛුනො අන්තෙවාසිකා වෙ සාමණෙරා තදහෙව තායං සීමායං උපසම්පාදෙසුං, ධම්මරක්ඛිතභික්ඛුපි දල්හිකම්මාය පුනසික්ඛං අග්ගහෙසි" ඒ වාක්‍යයන්ගේ සිංහල අනුවාදය මෙසේයි:— "මෙයින් පෙර ලක්දිවින් අමරපුරයට ගොස් ඤාණාභිවංස සංඝරාජයන් උපාධ්‍යාය කොට උපසම්පන්න වූ අත්තුඩාව ගමේ ධම්මරක්ඛිත භික්‍ෂුව ද ඒ සංඝරාජයන්ම උපාධ්‍යායකොට දල්හිකර්මයත් උපසම්පදාවත් ගත් ධම්මක්ඛන්ධ ස්ථවිරාදීහු ද ඒ කාලයේදී අමරපුර මහානගරයෙන් පිටත්ව සිය රටට යනු කැමතිව හංසාවතියට ඇවිත් සිටියාහුය. ඉක්බිති අත්තුඩාව ගමේ ධම්මරක්ඛිත භික්‍ෂුවගේ අතවැසි සාමණෙර දෙනමක් එදවස්හිම ඒ සීමාවේදී උපසම්පන්න කරවූහ. ධර්මරක්‍ෂිත භික්‍ෂුව ද දල්හිකරණය සඳහා පුනශික්‍ෂාව ගත්තේය."

මේ ලිපියේ මුලදී අත්තුඩාවේ මහාසවාමිතුමා බුරුමරටට ගියේ සාමණේර දෙනමක් හා උපාසකයකු සමග යයි දක්වන ලද්දේත් වජ්‍රඥාන නාහිමියන්ගේ පොත අනුවය. ගුණරතනතිස්ස ශාසන වංසයෙහි වනාහි තවත් භික්ෂූන් තුන්නමක් උන්වහන්සේ සමඟ ගිය බව කියවේ. එහි ඤාණවිමලතිස්ස මාහිමියන් බුරුමරටට ගොස් උපසම්පදාව ලබාගෙන ආ බව දක්වා ඊට අනතුරුව "තතොපච්ඡා හත්ථුණ්ඩගාමෙ ධම්මරක්ඛිතාමේකො සාමණේරො තීහි භික්ඛූහි ච විහි ච සාමණේරෙහි සද්ධිං අමපුරනගරං ගච්ඡාමීති වත්වා අගමාසි" (=ඉන් පසුව අත්තුඩාව ගමේ ධම්මරක්ඛිත නමැති එක් සාමණේර දෙනමක් ද සමග අමරපුර නගරයට යමියි කියා ගියේය)යි කියා තිබේ. දඹුලු සාසනවංශයෙහිත් මේ වාක්‍යය මෙසේම තිබේ. ඒ පොත් දෙකේම ඒ පිරිස් තුන වෙන වෙන නැව්වලින් වැඩිකලක් ගතවෙන්ට පෙර ලක්දිවට පැමිණි බවත් කියවේ

"ගුණරතනතිස්ස සාසනවංස"යෙහි කියවෙන කථාව සවිර කරන කීමක් දඹුලු ශාසනවංශයෙහිත් තිබේ. කපුගම ධම්මක්ඛන්ධ මාහිමියන් ප්‍රමුඛ පිරිස අමරපුරයට ගොස් දළ්හිකම් උපසම්පදාවත් ලබාගෙන හැරී එන අතර හංසාවතී නුවර නැවතී සිටින කල්හි දෙඹන්දූවෙන් ගිය එක් කැපකරුවෙක් පාචනරෝගය සෑදී මළේය. එවිට ඔහුගේ වැඩිමහලු සොහොයුරා පැවිදිවෙනු කැමති විය. එය දැනගත් මණ්ඩලික රජතුමා ඔහුට සිවුරු පිරිකර දී මෙධානන්ද මහතෙරුන් ප්‍රමුඛ විසි පස්නමකට බාරකොට කල්‍යාණී සීමාවේදී පැවිදිකරවා උපසපත් කරවිය මේ ප්‍රවෘත්තිය දක්වූ අනතුරුව එදිනම සිදුවූ අත්තුඩාවේ මහාසවාමීන්ගේ දළ්හී කම්ය හා ශිෂ්‍ය දෙනමගේ උපසම්පදාව ගැන මෙසේ කියවේ—

"තස්මිං හි දිවසෙ හත්ථුණ්ඩගාමිකස්ස ධම්මරක්ඛිත භික්ඛුස්ස අන්තෙවාසිකා ද්වෙ සාමණේරා තස්සං යෙව සීමාය නමෙවූ පජ්ඣායං කත්වා තෙ යෙව කම්මවාචරියෙ කත්වා උපසම්පන්නා ධම්මරක්ඛිතභික්ඛු පි නමෙවූපජ්ඣායං කත්වා තෙ යෙව කම්මවාචා චරියෙ කත්වා පුනසික්ඛං ගණ්හිත්වා තතො පට්ඨාය මම්මක්ඛන්ධ නාමෙන ගණාචරියෙන සද්ධිං සම්මෝදිත්වා විහාසි" (=එදවස්හි අත්තුඩාවේ ධම්මරක්ඛිත භික්ෂුවගේ අතවැසි සාමණේර දෙනමක් ඒ සීමාවේදීම ඒ තෙරුන්වහන්සේම උපාධ්‍යායකොට ඒ තෙරවරුන්ම කම්වාචී කොට උපසම්පදාව ලැබූහ. ධම්ම රක්ඛිත භික්ෂුව ද ඒ උපාධ්‍යාය කම්වාචීයන්ම ඇතුව පුනශික්ෂාව ලබා එතැන් පටන් ධම්මක්ඛන්ධ ගණාචාර්යතුමන් හා සතුටු සාකච්ඡා කරමින් විසීය.)

මාතර ධම්මාරාම මාහිමියන් කතළුවේ මාහිමියන් ප්‍රමුඛ පිරිසෙන් උපසම්පදාව ලැබූ අවසරාවෙහි අත්තුඩාවේ මාහිමියෝ එතුමාට කම්මාචාරී වූහ. එබැවින් උන්වහන්සේට ඊට පෙර ලක්දිවට පැමිණ සිටිය යුතුය.

මූන්වහන්සේ ලක්දිවට පැමිණි පසු දෙවුන්දර පරම විචිත්‍රාරාමයෙහි නිත්‍යවාසීවූහ. ඒ විහාරයේ සීමාව උන්වහන්සේ විසින් බන්දවන ලද්දේ බු. ව. 2356 යේදී යයි "දෙවුන්දර ඉතිහාසය" නම් පොතේ දැක්වේ. එය කරන්ට ඇත්තේ මෙරටට ඇවිත් මාස කීපයක් වත් ගතවූවාට පසුවය. බුරුම රටේ සිට මෙහාට ඒමටත් මාස හත අටක් ගතවෙන්ට ඇත. 2356 ත් 2351 ත් අතරේ තිබෙන්නේ යන්තම් අවුරුදු පහකි. ගමනට ගතවූ කාලයත් විහාරස්ථානයේ නැවති සීමාව බැඳීමට කටයුතු පිළියෙළ කළ කාලයත් අත්හරිනවිට නිස මිදීම සඳහා සම්පූර්ණ පස් අවුරුද්දක් අමරපුරයේ ගතකිරීමට උන්වහන්සේට අවකාශ නොලැබිය හැකිය.

මූන්වහන්සේගේ පිරිස විනයකම්කිරීමට සෑහෙන තරම් පිරිසක් නොවූ බැවින් මූන්වහන්සේ ලක්දිවට පැමිණි තැන් පටන් ජීවිතාන්තය දක්වා කතළුවේ ගුණරතනතිස්ස මහාසාමීන්ගේ පිරිස හා එක්ව විනයකම් කළහ.

මෙසේ ලෝකශාසනාභිවෘද්ධියෙහි නිරතව විසූ මූන්වහන්සේ උත්පත්තියෙන් පණස් අට හැවිරිදි කල්හි (බු. ව. 2377) ක්‍රි. ව. 1834 අප්‍රේල් මස 10වෙනි දින අපවත්වූහ. 1. හික්කඩුවේ සුමන, 2 පොතන්ගහවත්තේ සුභූති, 3. හක්මන ඉන්දසාර, 4 අහංගම ධම්මරතන, 5 සීනිමෝදර සාරානන්ද, 6. දෙවිනුවර රතනජෝති, 7. කහඳුවේ රතනසාර, 8. බෙලිවත්තේ පඤ්ඤාසාර යන අටනම මූන්වහන්සේගේ ශිෂ්‍යයෝ වූහයි චරිත කථාවෙහි පෙනේ.

ඥාණවිමලතිස්ස මාහිමියන්ට දීම සඳහා ඥාණාභිවංශ සංඝරාජතුමන් දුන් පාලි සන්දේශයේ පිටපත යථොක්ත චරිත කථාවෙහි ඇතුලත්කොට තිබේ. එහි ඇති එක් අඩුවක් නම් සන්දේශය එවූ වර්ෂසංඛ්‍යාව ඇතුලත් නොවීමයි. බුරුමරටෙන් එවනලදින් අපට දකින්ට ලැබුණු හැම සන්දේශයකම එවූ අවුරුද්ද සඳහන්කොට තිබෙනු දුටිමි. නමුත් මේ සංදේශය එවූ වර්ෂසංඛ්‍යාව හෙළි නො කිරීමෙත් නිස්සයමුත්තකවීමෙත් සම්බන්ධයක් තිබේදැයි විමසිය යුතුය.

පුරසඳ සඟරාවේ පළවූ ලිපියෙහි දෙවුන්දර මහා විහාරයේ නම බීරණවෙනසාරාම යයි දක්වා තිබේ. මින්පෙර කිසිවිටෙකත් අපට මේ නම අසන්ට නොලැබුණි. පුරාණ නම එය වියහැක

"ගිරිහෙළපුර" යන්න හා මේ නමේ සම්බන්ධයක් ඇද්දැයි දෙවුන්දර ඉතිහාසය ලියන්නන් විසින් විමසියයුතු. තවද මුත්වහත්තේ අපවත් වූ දිනය 1834 මැයි මස 10 වෙනිදා යයි පුරසඳ සඟරාවේ පෙනේ. "ශ්‍රී ධර්මරක්ෂිතචරිත" යෙහි අප්‍රේල් 10 වෙනිදා යයි කියා තිබේ.

## 17. බෝගහපිටියේ ධම්මජෝති මහාස්වාමිපාදයෝ.

(බු. ව. 2324-2400 පමණ)

ලක්දිව අමරපුරනිකාය පිහිටි නොබෝ කලකින් බුරුමරටට ගොස් උපසම්පදාව ලබාගත් මුත්වහත්තේ උඩරට අමරපුරනිකාය පිහිටුවීමේ ආදිකර්තෘවරයා සේ සලකත්. "බෝගහපිටිය" වනාහි කොස්ගොඩට අයත් පෙදෙසකි. මේ පෙදෙසෙහි බු. ව. 2324 පමණේදී උපන් කුලදරුවෙක් දෙමව්පියන්ගේ හා වැඩිමහලු සොහොයුරාගේ කැමැත්ත අනුව පැවිදිකිරීම සඳහා කොස්ගොඩ වැලිකන්දේ පුදගීතාරාමාධිපතිව වැඩසිටි ඥානවිමල මහාස්ථවිර තුමන් වෙත පමුණුවන ලදී.

උගතමනා දේ උගත්පසු පැවිදිකරනු ලැබූ මේ හෙරණ තෙමේ කලකට පසු කිසියම් භේදයක් නිසා වැලිකන්දේ විහාරයෙන් අස් විය. ඉක්බිති එතුමාගේ සොහොයුරා බෝගහ පිටියේ "සිරිවිජය බෝධිරාජාරාමය" නමින් පසුකල ප්‍රකට වූ ආරාමභූමියෙහි ආවාසයක් කරවාදී උඩරටින් පහත රටට ඇවිත් බොහෝ දෙනෙකුන්ට ධර්මශාස්ත්‍රඥානය ලබාදුන් "වීරගුලේ ගුරුතුමන්" එහි පමුණුවා ඒ හෙරණපාණන්ට බණදහම් ආදිය ඉගැන්විය.

අඹගහපිටියේ ඥාණවිමලතිස්ස මාහිමිතුමන් පිරිසක් සමඟ බුරුමරටට ගොස් උපසම්පදාව ලබාගෙනවුත් ලක්දිව අමරපුර නිකාය පිහිටෙව්වේ මේ කාලයේදීය. ඒ පිරිසෙහි "බෝගවත්තේ ජයතුජිනතිස්ස ස්ථවිරතුමා මේ බෝගහපිටියේ ධම්මජෝති හෙරණපාණන් දැක ස්වකීය ශිෂ්‍යභාවයෙහි තබා ගත්තේය. නොබෝ කලකින් මේ සාමණේරතැන උපසම්පදාව ලැබීමට යෝග්‍ය වයසට පත්වූ බැවින් තමා ද අමරපුරයට ගොස් උපසම්පදාව ලබා ගැනීමට කැමති බව ස්වකීයාචාර්යපාදයන්ට දැන්විය. ආචාර්ය තෙමේ ශිෂ්‍යයා සමග ගොස් ගල්වෙහෙර වලව්වේ එවකට විසූ "කොර්නේලිස් ද ආබෲව් රාජපක්ෂ සෙනෙවිරත්න මහවිදානමුදලි" තුමන්ට හා ශිෂ්‍යනමගේ සොහොයුරු වූ "අබරන් ද සොයිසා ගාර්දිලයේ ආරච්චි"

මහතාට මේ කරුණ දන්විය. ඒ දෙදෙන හා තවත් දුයක වරුන් ඊට කැමතිවූ බැවින් ඔවුහු ගමනට උවමනා වියදම් ආදිය සපයා දුන්හ. උපසම්පදාව ලබනු කැමති තවත් සාමණේර සතරනමක් ද කැපකරුවන් දෙදෙනෙක් ද සමග ගමනට සැරසුණු ධම්මජෝති සාමණේරතෙම බු. ව. 2349 යේ නවම්මස සතවක්ද ගාලුවරායෙන් නැව් නැංගේය.

ක්‍රමයෙන් යාත්‍රාකොට ඒ වර්ෂයේ බක්මස අව තෙලෙස්වක්ද අමරපුර රාජධානියට පැමිණියේය. එහි ගොස් ඤාණාභිවංස ධම්මසෙනාපති සංඝරාජයන් වෙත වසන්නේ බුරුම මහරජුට කාරණය දන්වා මහරජුගේ නියමයෙන් "සුවණ්ණගුහා" නම් සීමාවට මහාසංඝයා රැස්වූ කල්හි බු. ව. 2350 වැන්නෙහි ඇසළමස පුර සතවක්ද දවල් සත්විසි පැය ඉක්ම් කල්හි "ඤාණාභිවංස ධම්ම සෙනාපති මහාධම්ම රාජාධි රාජගුරු" සංඝරාජ මාහිමියන්වහන්සේ උපාධ්‍යායකොට (1) පාසාණුසාසපත විහාරවාසී මහාස්ථවිර, (2) රතනභූමිරම්ම විහාරවාසී මහා ස්ථවිර, (3) රවිවංස-කිත්තිපුරාමච්චවිහාරවාසී මහාස්ථවිර යන තුන්නම කර්මාචාර්යකොට උපසම්පදාව ලැබීය.

උපසම්පදාව ලැබූ මේ පිරිස කලක් සංඝරාජාරාමයෙහිම නැවතී උගතමනා විනයධර්මාදිය ඉගෙනගත්තේය. සංඝරාජ තුමා බුරුම බසින් තිබුණු "වේද විනිච්ඡය" නම් ග්‍රන්ථය පාලියට නගා තවත් දහම් පොත් සමග ධම්මජෝති භික්ෂු නමට බාරදුණි. මින්පසු සිය පිරිස සමග ලක්දිවට පැමිණි බෝගහපිටියේ ස්ථවිරතුමා සවකියාරාමයෙහි වසමින් බොහෝ කුලදරුවන් පැවිදිකොට ශාසනවර්ධනය කෙළේය. පසුකලක උඩරට ද අමරපුරනිකාය පතුරුවා හැරීම මැනවැයි සිතූ මූන්වහන්සේ භික්ෂු පිරිසක් සමග සබරගමු පලාතේ හා ඌව පලාතේ සැරිසරමින් ඒ පලාත්වල සියම්නිකායේ පැවිදිව සිටි පිරිසිදු උපසම්පදාව ලබනු කැමති බොහෝ දෙනකුන්ට උප සම්පදාව ලබාදුන්හ. සපුගහගොඩ-පස්සර-රඹුක්පොත යන තැන්හි විහාරවල සීමාබන්ධනයක් කළහ.

මෙසේ පිහිටෙව් අමරපුරනිකායේ උඩරට කොටසේ ප්‍රධානත්වය ජීවිතාන්තය දක්වා මූන්වහන්සේම ඉසුලූහ. උන්වහන්සේ ගේ ඇවෑමෙන් රඹුපොල ශ්‍රී සුජාත මහාසවාමි පාදයෝ එහි ප්‍රධානත්වයට පත්වූහ. එතුමන්ගේ ඇවෑමෙන් හුණුවල සාගත මහාස්ථවිර තුමා ද ඉන්පසු විදුරුපොල රතනජෝති මහාස්ථවිරතුමා ද එහි පාලකත්වයට පත්වූහ. ඉන්පසු කලක එය නොයෙක් ශාඛාවලට බෙදී ගියේය.

(1942-1-15 වෙනිදා පළවූ "සදමිණ" පත්‍රයේ පළවූ ලිපියකින් කරුණු උපුටා මෙය සම්පාදිතයි.)

ධම්මජෝති ස්වාමිපාදයන්ගේ ප්‍රධාන ශිෂ්‍යයාලෙස පෙනෙන්නේ බෝගහපිටියේ ධීරක්ඛන්ධ මහාස්ථවිරතුමාය. සද්ධම්මවංස නිකායේ මහානායක ධුරයත් උසුලමින් බොහෝ කලක් වැඩසිට නොබෝදා අපවත්වූ සීලක්ඛන්ධ මාහිමියෝ ඒ ධීරක්ඛන්ධ මහාස්ථවිරතුමන්ගේ ශිෂ්‍යයා විය.

## 18. මාතර ධම්මාරාම මහාස්වාමිපාදයෝ.

(ක්‍රි. ව. 1780 - 1876)

මෙකල "මාතරනිකාය" නමින් ප්‍රකටව පවත්නා සද්ධම්ම-යුක්තික නිකාය පිහිටුවීමේ ආදිකර්තෘවරයා වූ මාතර ධම්මාරාම මාහිමිතුමා වනාහි මාතර නගරයට අයත් නූපේ පෙදෙසෙහි වැදගත් පවුලක ක්‍රි. ව. 1780 දී උපන්නේය. ඔහට පස් හවුරුදු කල්හි සිය පියාණන් විසින්ම අකුරු ඉගැන්වීම කරනලදී. වැඩිදුර ඉගනීම ලබාදෙනු කැමති වූ පියතෙමේ මේ බාලයා තාඹවුන්නේ ලංකා විහාරාධිපතිව වැඩවිසූ මිරිස්සෙ සංඝරක්ඛිත මහාස්ථවිර තුමාට බාරකෙළේය. ඒ විහාරයෙහි නැවතී ඉගෙනගත් බාලයාගේ සිත පැවිදිවීමට නැඹුරු වූ බැවින් දෙමවුපියන් විසින් බු. ව. 2340 ඇසලමස පුර අටවක්දා සුබමොහොතින් පැවිදි කරවන ලදී. එවිට ඔහුගේ වයස 17 ක් පමණ යයි පෙනේ.

මුන්වහන්සේ පැවිදිවූයේ සියම්නිකායේය. මේ කාලයේදී ලක්දිව බුරුමනිකාය නොපැවැත්තේය. ඒ සියම්නිකායේ සංඝයා දෙපක්ෂයක්වී සීමා පිළිබඳ වාදයක් ඇතිකරගත් බැවින් බොහෝ දෙනෙක් උපසම්පදාව ලැබීමට මැලිව සිටියහ. මාතර මහා ස්වාමීන්ගේ ආචාර්යවරයා වූ සංඝරක්ඛිත මහාස්වාමිතුමා ද මේ නිසා විසිවයස් පිරි සවකීය ශිෂ්‍යයා උපසපන් කරවීමට ඉක්මන් නොවිය. මෙසේ වසන අතර සියම්නිකායේ පැවිදිවී උපසම්පදාව ද ලබා සිටි කතළුවේ ගුණරතනතිස්ස මහාස්ථවිරතුමා තමා උපසම්පදා ලැබූ සීමාවලත් ශුද්ධියක් නැත යන අදහස් ඇතිව පිරිසක් රැස්කොට ගෙන රාමඤ්ඤරටේ කල්‍යාණී සීමාවට පැමිණ උපසම්පදාව ලබා ගෙන බු. ව. 2353 නේදී ලක්දිවට පැමිණියේය. මේ කාලය වන විට මාතර ධම්මාරාම සාමණේර තැන තිස්වියට ලංව සිටි බව පෙනේ.

ගුණරතනතිස්ස මාහිමියන් මෙහි පැමිණිපසු සියම්නිකායේ සිටි තෙලිකඩ සොණුත්තර, හේනකඩුවේ ධම්මරතන, තංගල්ල් ධම්මදින්න ආදි ස්ථවිරයෝ එතුමන් ප්‍රමුඛ පිරිසෙන්

උපසම්පදාව ලබාගත්හ. මිරිස්සේ සංඝරක්ඛිත මහාස්ථවිරතුමන්ගේ ශිෂ්‍ය වූ යටකී මාතර ධම්මාරාම, කෝට්ටගොඩ ධම්මානන්ද, රැකව ධම්මසාර යන තුන්නම ද මුත්වගත්තේගෙන් උපසම්පදාව ලබනු කැමතිව අම්බලම්ගොඩට පැමිණ එහි මාදම්පා ගඟේ උදකුක්ඛෙප සීමාවේ රැස්වූ ගුණරතන මාහිමියන් ප්‍රමුඛ සංඝයාගෙන් බු ව 2357 පොසොන්මස අව අටවක් ලත් ශනිදින කල්‍යාණී වංශෝපසම්පදාව ලැබීය. එතුමන්ට උපාධ්‍යාය වූයේ ගුණරතනතිස්ස මාහිමියෝය අත්තුඩාවේ ධම්මරක්ඛිත, බටපොලේ කල්‍යාණතිස්ස, කිරින්දේ සීලානන්ද යන තුන්නම කම්මවාචී වූහ වැලිකොන්දේ ධම්මරතන, කොග්ගල ධම්මසාර, වල්පිට සුමනතිස්ස, අහංගම සීලවිමල, මිරිස්වත්තේ මේධානන්ද, බෝපිටියේ සුමන, හක්මන සීලරතන යන මහතෙරවරු ඒ පිරිසේ ගණපූරණය සඳහා වැඩහුන්හ.

උපසම්පදාව ලබා පස්වසක් ගුරුවරුන් ආශ්‍රය කරමින් වැස නිස්සයමුත්තක වූ ධම්මාරාම භික්ෂුතම මාතර-අහංගම ආදී පෙදෙස්වල ධර්මදේශනාදිය කරමින් මිනිසුන්ගේ සිත් දිනා ගත්තේය. එකල අහංගම මහාවිහාරයෙහි විසූ ධම්මධජ නායක ස්ථවිරතුමා ධම්මාරාම තෙරුන්ගේ ශීලාදි ගුණයන්හි පැහැදුනේ විය. එබැවින් වයෝවෘද්ධව සිටි ඒ නායක ස්ථවිරතුමා ස්වකීය ආරාමයේ පාලනය ධම්මාරාම ස්ථවිරතුමාට පවරාදී ටිකකලකට පසු අපවත් විය. ඉන්පසු මාතර මහාස්වාමිතුමා අහංගම මහාවිහාරය ස්වකීය නිත්‍යවාසය කරගත්තේය.

ක්‍රි ව 1841 කේදී මාගල්ලේ පඩවිතොට පෙදෙස් සතිපිරිත් පිංකමක් විය. භික්ෂූන් අතර පවත්නා තේරුමක් නැති ඇතැම් සිරිත් ගැන විරුද්ධ වූ මාතර මහාස්ථවිරතුමා "පිල් බෙදී ගිහිසවරණයෙන් පිරිත්දේශනාව නොකටයුතුය" යනාදී වශයෙන් තමා තුළ පවත්නා අදහස් එහි රැස්වූ සංඝයා මධ්‍යයෙහි ප්‍රකාශ කෙළේය. එහි සිටි සංඝයා අතරෙන් වැලිකොන්දේ ධම්ම-රතන මහාස්ථවිරතුමන් ප්‍රමුඛ පිරිසක් ඒ මතය පිළිනොගෙන පින්කමෙන් ඉවත්ව ගියේය. මින්පසු දල්හිකම්මාදිය පිළිබඳවත් මතභේද ඇතිවූයෙන් කලකට පසු මාතර මාහිමියෝ කල්‍යාණී වංශයෙන් වෙන්ව සද්ධම්ම යුක්තික නම් නිකායක් පිහිටුවාගත්හ. මෙය සිදුවූයේ කතළුවේ මාහිමියන්ගේ අපවත්වීමෙන් පසු ක්‍රි. ව. 1841 පමණේදීය. මාතර මාහිමියන් නිකාය වෙන් කරගත් කාලයේදී ඒ පක්ෂයෙහි ප්‍රකටව සිටි මහතෙරවරු නම්:- රැකව ධම්මසාර, බලපිටියේ ගුණරතන, පැරැළියේ ජිනරතන, හික්කඩුවේ සුමනතිස්ස, කහඳමෝදර ධම්මානන්ද, තංගල්ලේ ජිනරතන ආදීහුය.

පෙරකී පිරිත් පිංකමේදී මාතර මාහිමියන් කෙරෙහි අතිශයින් පැහැදුණු "දොන් බස්තියන් ද සිල්වා ජයසූරිය ගුණවර්ධන" රජවාසල මුදලිතුමන් ආදී පිරිස විසින් පඩව්තොට පෙදෙසෙහි ශංඝාරාම නමැති අංගසම්පූර්ණ විහාරයක් කරවා මාතර මාහිමියන්ට පුදන ලදී. මේ මුදලිතුමා බුරුමරට මෙන්ඩුන් මහ රජුට හස්තක් යවා තමාගේ ආරාමයෙහි වස්විසීම සඳහා උගත් බුරුම තෙරවරුන් දශනමක් එවනසේ ඉල්ලා සිටියේය. ඒ සඳහා තැවක් පිටත්කර එවා සියලු වියදම් දැරීමට තමා කැමති බවත් දැන්වීය. බුරුම මහරජුට නොයෙක් තෑගිබෝග ද යැවීය.*

මෙන්ඩුන් මහරජතුමා ලක්වැසි මහතෙරවරුන්ගේ තොරතුරු දැනගෙන මෙහි සිල්වත් ගුණවත් මහතෙරුන්ට පිදීම සඳහා සිවුරු පිරිකර හා පොත්පත් ආදිය දී ඇමතියන් දෙදෙනෙකුන් ලක්දිවට එවීය. "තේමියු ධම්මසිරිරාජා," "තේමියු සූරසීහ" යන නම් ඇති ඒ ඇමති දෙදෙන විසින් මාතර මහාසවාමීන් වහන්සේටත් කෞෂෙය්‍ය සිවුරු දෙකක් ද බුදුපිළිමයක් ද බුරුම කම්වාක්‍ය පොතක් ද දළැත් පෙට්ටි දෙකක් ද පූජාකරන ලදහ.

"වැලිගම ශ්‍රී සුමංගල" නාමයෙන් පසුකලක ලක්දිව ප්‍රකට වූ නායක මාහිමිතුමා වනාහි පළමුවෙන් මාතර මහාසවාමීන් වහන්සේගේ නිකායේ උපසම්පදාව ලබා ඒ මහාසවාමීන් වහන්සේ සමග කලක් අහංගම මහාවිහාරයෙහි ද ගාල්ලේ ශංඝාරාමයෙහි ද විසූ උතුමෙකි. උන්වහන්සේ උපසම්පදාව ලැබුවේ ක්‍රි. ව. 1850 හේ දෙසැම්බර් මස 8 වෙනිදා යයි "සද්ධර්ම යුත්තික භික්ෂුවංශ"යෙහි දක්වා තිබේ. මාතර මාහිමිතුමා මුන්වහන්සේට පොත්පත් දීමාදියෙන් බොහෝ උපකාර කළ බවත් ඒ පොතේ කියවේ. වැලිගම මාහිමියන් අහංගම පලාතේ වසන කාලයේදී හටගත් දේවපූජා වාදයෙන් උන් වහන්සේ ජයගත් බැවින් එතුමන්ගේ කීර්තිය පැතිරගියේයයි ද ඒ පොතෙන්ම පෙනේ. කලකට පසු වැලිගම මාහිමියන් හා උන්වහන්සේගේ ආචාර්ය වූ පැරැලියේ ජිනරතන මහාස්ථවිරතුමන් ප්‍රමුඛ පිරිසක් මාතර මාහිමියන්ගේ නිකායෙන් අස්වී මූල් නිකාය වූ කල්‍යාණිවංශයට එක්විය. (ඒ සම්බන්ධ විස්තර මෙහි දැක්වෙන ශ්‍රී සුමංගල චරිතයෙන් බලාගතයුතු.)

ඒ අඩුව පුරවන්ට මෙන් බටපොලේ කල්‍යාණතිස්ස කල්‍යාණී වංශික නායක මාහිමිතුමන්ගේ දෙවෙනි ශිෂ්‍යයා වූ

---

* මුදලිතුමන් සැවූ පාලි සන්දේශයත් බුරුමරටින් ලැබුණු පාලි සන්දේශයත් පිටපත් "සද්ධර්මයුක්තික භික්ෂුවංශය" නමැති පොතේ ඇතුළත් කොට තිබේ.

අලුත්ගම සංඝරතන මහාස්ථවිර ප්‍රමුඛ පිරිසක් බු. ව. 2410 යේදී මාතර මාහිමියන්ගෙන් උපසම්පදාව ලබාගෙන ඒ නිකායට ඇතුල්විය (කළුතර අශෝකාරාමය වනාහි ඒ සංඝරතන මහා ස්ථවිරතුමන් නිසා ඇතිවූ විහාරස්ථානයෙකි) තැවත බු ව. 2417 දී පොල්දූවේ ධම්මසාර, අඟුලුගහ සීලරතන, දත්තෙදර සුමනජෝති, පොතුපිටියේ සීලරතන ආදී 26 නමක් අහංගම ගොය්යාපාන නදියේදී මාතර මාහිමියන්ගෙන් උපසම්පදාව ලබාගත්හ.

මෙසේ සවනිකාය දියුණුකළ මාතර මාහිමියෝ බු ව. 2419 ක්‍රි. ව. 1876 මාර්තු මස 20 වෙනි සඳුදින මධ්‍යම රාත්‍රිකාලයෙහි අහංගම මහාවිහාරයේදී අපවත් වූහ. ආදාහනොත්සවය ඒ මස 23 වෙනිදා අහංගමදී සිදුකරනලදී.

## 19. බෝපාගොඩ ඤාණාලංකාර සිරිසුමන මහාධම්ම රාජගුරු මහාස්ථවිරතුමා.

(බු. ව. 2321-2407 පමණ)

අමරපුර නිකායේ දඬලුශාඛාව පිහිටෙව් "කපුගම ධම්මක්ඛන්ධ" මහාස්ථවිරතුමන් සිවුරුහැර යාමෙන් පසු ඒ කොටසේ ප්‍රධානත්වයට පැමිණියේ කපුගම මහාසවමීන් සමග බුරුමරටට ගොස් පුනශික්ෂාව ලබාගත් බෝපාගොඩ ඤාණාලංකාර සිරිසුමන මහාස්ථවිරතුමාය. මුන්වහන්සේ සහිත පිරිස බුරුමරටේදී පුනශික්ෂාව ලැබූ ආකාරය දක්වන ලිපියක් උන්වහන්සේ විසින්ම සම්පාදිතව මිරිස්සේ ධම්මානන්දාභිධාන කල්‍යාණිවංශික සංඝපිතෘතුමාට ක්‍රි. ව. 1863 ඔක්තෝබර් 14 දතමින් එවා තිබේ. එය මෙසේයි:—

"ප්‍රවාරොදර පවිත්‍ර නෛකප්‍රමාත්‍ය ගුණගණොපලක්ෂිත වූ අපායුෂ්මත් මිරිස්සේ ධම්මානන්ද ගණනායක ස්ථවිරයානෝ වෙත දන්වා එවන වගනම්—

අමරපුර නම් වූ ම්‍රම්මදේශයට අපි පැමිණෙන කාලයට සංඝරාජව එහි වැඩසිටිය "ඤාණාභිවංස ධම්මසෙනාපති මහා-ධම්මරාජාධිපති රාජගුරු" නම්වූ මහාස්ථවිරතුමානන් වහන්සේට ඡද්දන්තනාගරාජ ස්වාමී වූ මහාරාජෝත්තමයානන්ගේ ආඥාවෙන් අපාචාර්‍ය වූ "සද්ධම්මවංසපාල සිරිධම්මක්ඛන්ධ" නාමොපලක්ෂිත ස්ථවිරයන්වහන්සේ ඇතුළුවූ අපි උපසම්පදාකරන්ට දැනුන්දුන්විට යථොක්ත සංඝරාජෝත්තමයානන් වහන්සේ විසින් අපට දල්හිකම් නම් වූ උපසම්පදාකර්මය කරණ බව නියම කළාය. එවිට අපාචාර්යයන් වහන්සේ විසින් පුරාණ ශික්ෂාව පසුදුරා

ප්‍රව්‍රජ්‍යොපසම්පදාව ලබා ගත්ට කැමති බව ශලකලතැන පොරාණ සික්ඛාව ප්‍රත්‍යාඛ්‍යානය කොට නව සික්ඛාග්‍රහණය අයුතුය යනාදි කාරණා දත්වා ඒ සංඝරාජොත්තමයාණන් වහන්සේ ද තෙලෙස් වාරයක් දල්හිකම් නම් වූ උපසම්පදාකර්මයට පැමිණි බව දැනුම් දී **විනයාලංකාර නම් වූ ප්‍රකරණය බලන්ට දුන්නාය.**

ඊට පසු සැසනක්‍රත්‍යයෙහි නියුක්ත "සිරිනන්දසුර" නම් වූ මහාමාත්‍යයානෝ අප සමීපයට එව්වාය. ඒ පණ්ඩිත මහාමාත්‍යයා විසිනුදු දල්හිමම්යෙහි පවිත්‍රය ද නිර්දෙෂය ද බොහෝසෙයින් වර්ණනාකර ගියාය. නැවත එම සංඝරාජොත්තමයානන් වහන්සේ විසින් මහාමංගල නම් වූ සීමාවෙහිදී බුදුන් පිරිනිවී දෙදස් තුන්සිය දෙපණස් වරුසයට පැමිණි මැදින්දින අවදසවක් ලත් කුජ දින සවස්භාගයෙහිදී හතර පියර හමාර කාතිසමට එම "ඤාණාභිවංස ධම්මසෙනාපති මහාධම්ම රාජාධිරාජගුරු" නම් වූ සංඝරාජොත්තමයානන් වහන්සේ උපාධ්‍යව මණිමාලාලංකාර මහාසථවිරයන්‍යහන්සේ ද ගුණසිරි මහාසථවිරයන් වහන්සේ ද කම්මාවාසීව සද්ධම්මවංසපාල සිරි ධම්මකඛන්ධාවාසීවරයන් වහන්සේ ඇතුළු වූ අපි පස්නමට දල්හිකම් නම් වූ උපසම්පදාකර්මය කළ බවද අපි කැටුව ගිය සාමණේරනම උපසම්පදා කළබව ද අත්තුඩාවේ ධම්මරක්ඛිත සථවිරයානෝ හංසාවතියෙහිදී පඤ්ඤාසාර මහාසථවිරයානෝ උපාධ්‍යකොට තිස්සගාචාරීන්වහන්සේ ඇතුළු වූ කම්මවාසීවරයන් ඇතිව බඩසීමාවේදී අපි ඉදිරිපිට දල්හිකම් කළ බව ද යන මේ කාරුණු කල්පනාවට ගනිමින් දැනට අමරපුරයෙහි වැඩහිටින "ඤෙයධම්මාලංකාර-කිත්තිසිරිධජ-මහාධම්ම රාජාධිරාජගුරු වූ" සංඝරජ්ජුරුවන්ගේ සත්දේස ලියකියමත් ද "පඤ්ඤාසාමි සිරිකවිධජ-මහාධම්ම රාජාධිරාජගුරු" තෙරුන්නාන්සේගේ සන්දෙශයක් ද සාමීන්ද්‍රශයෙහි රාජශ්‍රියට පැමිණ සිටිනා රාජාධිරාජොත්තමයාණෝ සුපිරිසිදු ධම්මයුත්තික නිකායෙහි ප්‍රධානව සිටියදී "රාජානුජමකුටසම්මත-වජිරඤාණ තෙරුන්නාන්සේ" නමින් එවා තිබෙන සන්දේසයත් ද බලා තෝරුන්ගෙණ දල්හිකම් නම් වූ උපසම්පදාකර්මය පාල්‍යට්ඨකථා ටීකාදියට අවිරුද්ධව තිබෙන ගරු වූ පිරිසිදු විනයකර්මයක් බව උභයාපෙක්කාමි වූ සර්ධාවන්ත සත්පුරුෂයන්ට තෝරුන්කර දෙනමෙත් සැකවින් මෙයින් පෙන්වා එව්වේ—

දඩල්ලේ විහාරාධිවාසී ඤාණාලංකාර-සිරිසුමන මහාධම්ම-රාජගුරු ගණාවාසී-අමරපුර සමාගමේ නායක උන්නාන්සේ වන මා විසින් ක්‍රිස්තුවරුෂයෙන් එක්දස් අටසිය හැටනුනක් වූ ඔක්තෝම්බ්‍ර මස දහහතරවෙනි දිනදීය."

සමථයකට පැමිණවිය නොහැකි වූ සීමාසංකරවාදය හටගත්තේ මෙතුමන්ගේ කාලයේදීය. එය කුමක්දැයි තේරුම්ගැනීම සඳහා තරමක්දුර සිට ඉතිහාසය දැක්විය යුතුය.

අඹගහපිටියේ ඤාණවිමලතිස්ස මාහිමියන්ගෙන් ප්‍රභව වූ සඟ පිරිසත් දඹල්ලේ සඟපිරිසත් එකම සලාගම ගෝත්‍රයට අයත්වූහ. එබැවින් කොටස් දෙකක්ව විසීම යුතු නැතැයි සැලකූ ඒ කුලයේ මුදලිවරු ආදීහු සාකච්ඡාකොට දෙපක්ෂයේ සමගියක් ඇතිකරවූහ. එය සිදුවූයේ බු ව. 2363 දී හෙවත් දඹල්ලේ පිරිස මෙහි පැමිණ අවුරුදු දශයකට පමණ පසුව බව පෙනේ. ඒ සමගිය සම්බන්ධ විස්තරය පැරැලියේ ජිනරතන මහාස්ථවිරතුමාගේ ලිපියක මෙසේ දැක්වේ:— “මේ ඇර වැලිතර - කොස්ගොඩ සංඝයා සහ දඹල්ලේ සංඝයාත් දේසේ ගොහින් ආ ලඟදී එම සංඝයා අතරෙහි බලවත් විරුඬයක් ඇතිව තිබුණු කාලයක් ඇති. ඒ කාලයෙහි සලාගම ජාතියෙහි වැදගත් රදළ මහත්වරුන් විසින් ඒ දෙපක්ෂයම සමගි කරවීම පිණිස ඉහතකී සියලුම සංඝයා කොස්ගොඩ අඹගහපිටියේ විහාරස්ථානයට රැස්කෙරෙව්වාය. කතළුවේ විලේගොඩ නායක හාමුදුරුවරු දෙනම ප්‍රමුඛ ඒ දෙනම ගණනේ හිටිය තෙල්වත්තේ බටපොල, අලුත්වල, වල්පිට දෙඩන්දූව, අම්බගොඩ, වැලිකොත්දේ, කොග්ගල, ඕකේවල මේ ආදී තවත් බොහෝමයක් සංඝයා ද ඉහතකී විහාරස්ථානයටම සලාගම ජාතියේ මුදලි මන්ත්‍රිශ්වරාදීන් ගේ ආරාධනාවෙන් වැඩමවූවාය. ජාතිකීපයක නායක-අනුනායක ස්ථවිරාදි දූත උගත් වැදගත් සංඝයාවහන්සේ රැස්වූ එම ස්ථානයෙහි දී යටකී සංඝයා සමගිකරවීම පිණිස පස්දිනක් කථාව පවත්වා සමගිකරවා ඉක්බිති අමරපුරයට හා හංසාවතියට ගොහින් උපසම්පදා-දල්හී-කම්මාදි විනයකර්මයන් ලබාගෙන ආ සංඝයා හැර අනිකුත් සියලුම සංඝයා දල්හීකම්මය ලැබූ පිළිවෙල මෙහි මතු ප්‍රකාශවෙන ක්‍රමයෙන් බලාගතයුතුයි.”

මෙසේ කියා ඊට අනතුරුව ඒ ඒ පිරිස් දල්හීකම්මය ලබාගත් සැටි දක්වා තිබේ. මේ අවස්ථාවේදී දඹල්ලෙන් පැමිණ සිටියේ “බෝපාගොඩ නායක හාමුදුරුවන් ප්‍රමුඛ පිරිස” යයි ඒ ලිපියේ කියැවෙන බැවිනුත් ගුණරතනතිස්ස සාසනවංසයෙහි මේ සමගිය ගැන කියන්ට පටන්ගැනීමේදී “අථ ධම්මකඛාභිධාන ථෙරෙ අචිරවිබභනෙත වාලුකාතිතෙථ ඤාණවිමලතිසසතෙථරාදයො ච බොධිරුකඛපිඨෙ ධම්මජොතිනාමතෙථරො ච එවං මනතයිංසු” (=ඉක්බිති ධම්මකඛනධ තෙරුන් සිවුරු හැර ගොස් කලක් ගතවූ පසු වැලිතර ඤාණවිමලතිස්ස ස්ථවිරාදීහු ද බෝගහපිටියේ ධම්මජෝති ස්ථවිර

තුමා ද මෙසේ සාකච්ඡා කළහ)යි කියවෙන බැවිනුත් මේ කාලය වනවිට "කපුගම ධම්මක්ඛන්ධ" ස්ථවිරතුමා සිවුරු හැර සිටිබව පිළිගත යුතුය.

මෙසේ අඹගහපිටියේ-දඹල්ලේ යන දෙපක්ෂය සමගි වී එක් නිකායක්ව වැලිතර මාදුගගේදී උපසම්පදාකර්මයන් කරමින් කලක් විසූහ. අමරපුරනිකායේ ආදි කර්තෘවරයා වූ ඥාණවිමලතිස්ස මාහිමිතුමා බු ව 2378 (ක්‍රි. ව 1834) ඇසළ මාසයේදී අපවත් වූ බැවින් ඉන්පසු මුළු නිකායේ නායකධුරය බෝපාගොඩ මාහිමියන්ට පවරනලදී. ක්‍රි ව. 1835 පෙබරවාරි 25 වෙනිදා සර් රොබට් විල්මට් හෝටන් ආණ්ඩුකාරතුමා විසින් ඒ නායකධුරය ස්ථිර කරන ලදැයි අභයතිස්ස චරිතයේ කියවේ.

මෙසේ දෙපක්ෂය එක්නිකායක්ව සිටියදී බු ව. 2388 දී මාදුගගේ සීමාවට පහසුවෙන් යාම සඳහා ගොඩ සිට පාලමක් සාදා පාලම සීමාවට සම්බන්ධ නොකොට අඩි කීපයක් මෙහා දී නවත්වා පාලමේ සිට සීමාවට ඇතුල්වීමට ශක්තිමත් ලෑල්ලක් දමා තිබුණි. සංඝකර්ම කරනවිට ඒ ලෑල්ල ඉවත්කරන ලදී. අවුරුදු සතක් මෙසේ විනයකර්ම කළ පසු මේ පාලම හා ලෑල්ල දැමීම නිසා ගාම සීමාවත් උදකුක්ඛෙප සීමාවත් සංකර වන්නේය යන මතයක් බෝපාගොඩ නායක මාහිමියන්ගේ ප්‍රධාන ශිෂ්‍ය වූ ලංකාගොඩ ධීරානන්ද මහාස්ථවිරයන් විසින් උපදවන ලදී. එසේ සංකරවීමක් නැතැයි අඹගහපිටියේ පක්ෂය කියා සිටි නමුත් දෙපක්ෂයේම තීම පිළිගන්නා පිරිස් ඇතිවූයෙන් මෙහි විනිශ්චය ලබාගැනීම සඳහා බුරුමරට ඥෙයධම්ම සංඝරාජයන් වෙත සන්දේශ යැවූහ. එරටින් ද විනිශ්චය දී සමගිවීමේ අනුසස් කියා එවූ නමුත් සම්බන්ධයක් ඇති නොවීය.

බෝපාගොඩ නායකහිමිතුමා මුලදී සවශිෂ්‍ය ලංකාගොඩ මහ තෙරුන්ගේ තීම පිළිගෙන ඒ සංකරයයි කියනු ලබන සීමාවේ උපසම්පදාව ලැබූ භික්ෂුපිරිසක් දෙඩන්දූවේ ශෛලබිම්බාරාමයට කැඳවාගෙනවුත් ඒ අසල උදකුක්ඛෙප සීමාවේදී කල්‍යාණිවංශික සංඝයා ලවා නැවත උපසම්පදා කරවාගත්තේය. ඒ උපසම්පදාව කරවූ පිළිවෙළ ගුණරතනතිස්ස සාසනවංසයෙහි මෙසේ දක්වේ:- "අථාපරභාගෙ වාලුකාතිත්ථෙ උදකුක්ඛෙපසීමාය උපසම්පන්නෙනා සික්ඛාකාමෙන ආයස්මා ධීරානන්දො නාම ථෙරො එවං චින්තෙසි: ඉතො සත්තවස්සතො පභුති වාලුකාතිත්ථෙ උදකුක්ඛෙපසීමාය කතානි උපසම්පදකම්මානි සීමාසංකරෙන විපන්නානි, මයං තං කිං කරිස්සාමාති චින්තයමානො සෙලබිම්බවිහාරවාස සිරිසුමනාභිස්ස

මහාථෙරො ච පියරතනතිස්සමහාථෙරො චාති ද්වෙ ථෙරෙ ලෙඛන පෙසනෙන වාලුකාරාමං පාපෙත්වා යථා වුත්තසංකරවිපත්තිං තෙහෙව සද්ධිං කථෙත්වා "තුම්හාකං ආචරියවරෙහි විසුං උපසම්පදකම්මානං කතත්තා තස්ස පයොජනං ඉදානි පඤ්ඤායති; තස්මා තුම්හාකං ආචරියවරානං පක්ඛතො කම්මාරහෙ භික්ඛූ තුම්හාකං විහාරං සන්නිපාතාපෙථාති වත්වා සංකරවිපත්තිභූතෙහි වීසති මත්තෙහි භික්ඛූහි සද්ධිං ඤාණාලංකාර - සිරිසුමනතිස්සාභිධාන-නායකත්ථෙරවරො ච ධීරානන්දත්ථෙරො ච සෙලබිම්බවිහාරං සම්පාපුණිත්වා විහාරාසන්නෙන පතිසිතජාතස්සරෙ සංකරවිපත්ති රහිතාය උදකුක්ඛෙපසීමාය නිසීදිත්වා සුසම්මත ධම්මසාර ගණනායකත්ථෙරාදයො අතිරෙකවීසතිවග්ගං භික්ඛුසංඝං ගණපූරකං කත්වා ඤාණාලංකාර සිරිසුමනතිස්සත්ථෙර මුපජ්ඣායං කත්වා බුද්ධස්ස භගවතො පරිනිබ්බාණා තිසතාධිකානං ද්වින්නං වස්සසහස්සාන-මුපරිපඤ්චනවුතිමෙ සංවච්ඡරෙ සංකරවිපත්තිභූතානං භික්ඛූනං වස්සග්ගෙන එකෙකං භික්ඛුං සීමාමාලකං ගහෙත්වා කම්මවාචං අනුවාචාපෙත්වා පුනසික්ඛාය දින්නාය ධීරානන්දථෙරො "තුම්හෙහි අජ්ජ පභූති වස්සගහණං කාතබ්බ"න්ති ආදිනා නයෙන ඔවාදානුසාසනිමකාසි."

ශෛලබිම්බාරාමය මූලස්ථානය කරගත් කල්‍යාණිවංශිකයෝ වනාහි අමරපුරනිකායිකයන් හා සමගි සම්භෝග ඇතුව විසූ නමුත් ඔවුන්ගේ උපසම්පදාකර්මයන් වෙන් වශයෙන් පැවැත්වූහ. එබැවින් සීමාසංකර දෝෂය ඇතිවූ විට මාදුගගේත් ගිංගගේත් උපසම්පදාවලට සම්බන්ධ නොවූ පිරිසක් සිටීම ප්‍රයෝජනවත් විය. එබැවින් ලංකාගොඩ මහාස්ථවිරතුමා මේ කාරණය සම්බන්ධයෙන් ශෛලබිම්බාරාමයෙහි විසූ සිරිසුමනතිස්ස-පියරතනතිස්ස දෙනම දඩල්ලට ගෙන්වා ඒ පිරිස වෙන්ව සිටීමේ ඵලය දැන් පෙනේයයි කියා සංකර විපතට අසුවූ භික්ෂූන්ට නැවත උපසම්පදාව දීම සඳහා කල්‍යාණිවංශික සංඝයා රැස්කරදෙන සේ ඉල්ලා සිටියේය. ඒ ඉල්ලීම පිළිගත් ඒ දෙනම සවකීයාවාසී කොග්ගල ධම්මසාර නායක මාහිමිතුමන්ට දැනුම්දී සංඝයා රැස්කරවූ විට ලංකාගොඩ ස්වාමිපාදයාණෝ සංකරයට අසුවූ විසිනමක් පමණ භික්ෂූන් හා සවකීයාවාසී බෝපාගොඩ නායක මාහිමියන් සමග දොඩන්දූවට අවුත් එහි උදකුක්ඛෙපසීමාවේදී ඒ එක් එක් භික්ෂුනම සීමාවට ගෙන කල්‍යාණිවංශිකයන් ලවා උපසම්පදාව දෙවූහ. එය සිද්ධවූයේ බු. ව. 2395හේ දීය. උඩ දැක්වූ පාලිපාඨවලින් දැක්වෙන්නේ මේ අදහසයි. ඒ දෙවෙනි උපසම්පදාව ලත් භික්ෂූන්ට එදින සිට වස් ගණන්කරන සේ ලංකාගොඩ මහාස්ථවිරතුමා අවවාද කෙළේයයි ද එහි කියවේ.

මෙසේ ඒ භික්ෂූන්ට ප්‍රතිකර්ම කරවූ අවස්ථාවේදී බෝපාගොඩ-ලංකාගොඩ යන ගුරුගෝල දෙනමගේ විරුද්ධයක් නොවීය. ඉන් පසු බෝපාගොඩ මාහිමිතුමා ලංකාගොඩ මහතෙරුන්ගේ අදහස හැරදමූ බැවින් දෙනමගේ විරුද්ධය ඇතිවිය. ඒ විරුද්ධය නිසා සද්ධම්මවංසනිකාය ඇතිවීය. එහි ප්‍රභවය බු. ව. 2395 න් පසුව බව මේ ලිපියෙන් ඔප්පුවේ. මේ සංකරවාදය ගැන කරුණු දක්වන බුරුම සාසනවංසය යථොක්ත පාලම දැමීම සිදුවූයේ බු. ව. 2390දී යයි කියයි. ඒ නිසා අමරපුරනිකාය හෙද වූ සැටි දක්වා ඊට අනතුරුව බුරුමරටින් විනිශ්චය ලබාගැනීම පිණිස දූතයන් එවූ සැටි මෙසේ කියවේ:— 'අථ ධීරානන්දපක්ඛෙ භික්ඛූ තප්පක්ඛිකස්ස සීලක්ඛන්ධථෙරස්ස සිස්සෙ ධම්මක්ඛන්ධ වනරතනභික්ඛූ අම්හාකං ජම්බුදීපෙ රතනපුණ්ණනගරං පෙසෙසුං සංඝරාජ මහාථෙරස්ස සන්තිකෙ ඔවාදස්ස පටිග්ගහණත්ථාය. තෙ ච කලියුගෙ අට්ඨාරසාධිකෙ ද්විවස්සසතෙ සහස්සෙ ච සම්පත්තෙ කත්තිකමාසස්ස ජුණ්හපක්ඛඅට්ඨමියං සීහළදීපතො නික්ඛමිත්වා අංගවජ්ජන්තා එකූනවීසාධිකෙ ද්විවස්සසතෙ සහස්සෙ ච සම්පත්තෙ ඵග්ගුණමාසස්ස ජුණ්හපක්ඛසත්තමියං රතනපුණ්ණනගරං සම්පත්තා." (= ඉක්බිති ධීරානන්ද පක්ෂයෙහි භික්ෂූහු එම පක්ෂයෙහි වූ සීලක්ඛන්ධ තෙරුන්ගේ ශිෂ්‍ය වූ ධම්මක්ඛන්ධ-වනරතන යන භික්ෂුදෙනම අපගේ දඹදිව රතනපුණ්ණ නුවරට එවූහ. ඒ එව්වේ අපේ සංඝරාජයන් වෙතින් අවවාද ලැබීම පිණිසය. ඒ භික්ෂූහු බු. කලියුග 1218වේ* ඉල්මස පුර අටවක්ද ලක්දිවින් පිටත්ව 1219 යේ මැදින්මස පුර සතවක්ද මෙහි පැමිණියහ.)

තවදුරටත් ඒ පොතේ මෙසේ කියවේ:— ඉක්බිති මහරජ-තුමා සංඝරාජාරාමයෙහි විහාරයක් කරවා ඒ භික්ෂූන් නවත්වා උපස්ථාන කරවීය. සංඝරාජතුමා නොයෙක් පොත් බලා විනිශ්චයක් ලියා ඔවුන්ට දුණි. එසේ කොට ඒ වර්ෂයේ පළමු ඇසළ මස අව දසවක්ද ඔවුන් පිටත්කර එවීය. ඉන්පසුත් "ඤාණාලංකාරසුමන මහා ධම්මරාජගුරු ගණාචාර්යයන්ගේ පක්ෂයෙහි වූ භික්ෂූහු ඒ පක්ෂයෙහි වූ පඤ්ඤාමෞලි තෙරුන්ගේ ශිෂ්‍ය වූ විමලජෝති-ධම්මානන්ද යන භික්ෂූන් අරියාලංකාර නම් සාමණේරනමක් හා උපාසකයන් සතරදෙනෙකුත් සමග මෙහි එවූහ. ඔවුහු බු. කලියුග වර්ෂ 1220 ඉල්මස පුරපක්ෂයේ පස්වෙනිද මෙහි පැමිණියහ. සංඝරාජතුමා නැවතත් විනිශ්චයක්

---

* මේ වර්ෂයට 635 එක්කිරීමෙන් ක්‍රිස්තුවර්ෂය ලැබේ. 1181 ක් එක්කිරීමෙන් බුද්ධවර්ෂය ලැබේ.

දුන්නේය. මහරජතුමා ඒ භික්ෂූන්ට පුනශික්ෂාව දෙවා සාමණේර-නම උපසම්පදා කරවා ප්‍රත්‍යයෙන් සංග්‍රහ කෙළේය"

සිංහල ලිපිවල මෙහි කී සාමණේරනැනගේ නම ගුණාලංකාර යයි පෙනේ. එහි ගිය ගිහියන්ගේ නම් එන්ද්‍රිංස්හාමි, අප්පුහාමි, ගාබ්‍රියෙල් කොරනේලිස් යයි පෙනේ. මෙකල සංඝරාජ ධුරය දැරුවේ ඤෙය්‍යධම්මසංඝරාජ තුමාය. ඒ සංඝරාජතුමත් එවූ සන්දේශයෙහි එකල බෝපාගොඩ නායකහිමියන් 76 හැවිරිදිව සිටි බව කියවේ. සංඝරාජයන්වහන්සේ එතුමාට වඩා බාලවූ බැවින් අතිශය ගෞරවාදරයෙන් නමස්කාර කරන බව ලියාතිබේ එපමණක් නොව බෝපාගොඩ මාහිමියන්ට "ජිනොරස-අමරවංසධජ-මහාධම්මරාජාධිරාජගුරු" යන නාමය රාජගුරු අකතය සහිතව එවූහ තවත් සිවුරු පිරිකර ද පූජාවශයෙන් එවූහ. මුන්වහන්සේ ක්‍රි ව. 1864 අගෝස්තු මස 20 වෙනිදා රත්ගම රාජාරාමයේදී අපවත්වූහ.

සංකරවාදය පිළිබඳ තවත් විස්තර "ලංකාගොඩ ධීරානන්ද" මහාස්ථවිරතුමන් පිළිබඳ චරිතයේදී කියවෙනවා ඇත.

## 20. ලංකාගොඩ ධීරානන්ද මහාස්ථවිරතුමා.

(ක්‍රි ව. 1811-1871)

එක්සත් අමරපුරනිකායේ නායකධුරය දැරූ බෝපාගොඩ නායක මාහිමියන්ගේ ශිෂ්‍යයන් අතරෙහි අතිව්‍යක්ත ශිෂ්‍යයා සේ පෙනෙන ලංකාගොඩ ධීරානන්ද මහාස්ථවිරතුමා මෙකල පවත්නා "අමරපුර සද්ධම්මවංසනිකායේ" ආදිකර්තෘවරයා සේ සලකති. සීමා සංකරවාදය උපදවනලද්දේ මුන්වහන්සේ විසිනි. එය සිදුවූ සැටි බෝපාගොඩ නායක මාහිමියන්ගේ චරිතයෙහි සංක්ෂෙපයෙන් දක්වනලදී. මේ විවාදය සමථයකට පමුණුවා දෙපක්ෂය සමගි-කරවීමට බුරුම මහරජතුමා ද එරට සංඝරාජතුමත් ද මෙරට බොහෝ දෙනෙක් ද උත්සාහ ගත් නමුත් එය ව්‍යර්ථ විය. සිය මතය අත් නොහළ ධීරානන්ද මහාස්ථවිරතුමා ස්වමතානුවර්තිකයන් සමඟ එක් වී මූල්නිකායෙන් අස්වී "සද්ධම්මවංසනිකාය" පිහිටුවා ගත්තේය. මූලදී එකක්ව පැවති නිකාය මෙසේ දෙකක් වූ බැවින් මූල්නිකායේ පිරිසට ද සියනිකාය හැඳින්වීම සඳහා විශේෂණ පදයක් ඕනෑවිය. එබැවින් ඔවුහු එයට "මූලවංස" යන කොටස එක්කර ගත්හ. අඹගහපිටියේ පිරිස එසේ මූලවංස යන්න එක්කරගත් නමුත් බෝපාගොඩ නායක මාහිමියන්ගේ පරම්පරාව විශේෂණයක් නැතිව "අමරපුර" නාමයෙන්ම තවම සිටින බව පෙනේ.

සීමාසංකරවාදයේ විනිශ්චයක් බුරුම සංඝරාජතුමාගෙන් ලබා ගැනීම සිඳහා පළමුවර බු. ව. 2401 පමණේ දී ධම්මක්ඛන්ධ වනරතන සහ දෙනමක් අමරපුරයට යවා ගෙන්වා ගත් සන්දේශය වනාහි දීඝී එකකි. ඒ සන්දේශයේ පිටපත් අන්‍ය නිකායවල සංඝයාට බලාගැනීම සඳහා යවන ලදී. ඒ පිටපතක් එවද්දී මිරිස්සේ ධම්මානන්ද නායක මාහිමිතුමන්වෙත "තුඩුවේ වත්තේ පඤ්ඤාසීහ" මහාස්ථවිරතුමන් එවාතිබෙන ලිපිය මෙසේයි:-

"ක්‍රි. ව 1859-5-10 දින රත්ගම මණ්ඩලාරාමයේදී ය.

"ශ්‍රීමත් ජිනෙන්ද්‍ර ශාසනොදයකාමී වූ අම්බලංගොඩ පොල්වත්තේ විහාරාධිවාසී වූ මිරිස්සේ ධම්මානන්ද ස්ථවිරයන් වහන්සේ සහ දෙත්බදූව ශෛලබිම්බ විහාරාධිවාසී වූ උඩුගම්පිටියේ සුමනතිස්ස ස්ථරයන් වහන්සේවිසින් බලා කල්පනාවට ගෙන තමන් ඇතුළත්ගෙනේ අනිකුත් ස්ථවිර මධ්‍යමාදි සබ්‍රම්චරුන් වහන්සේලාට තේරුම් දීම පිණිස ලියා යවන වගසැටි නම්:-

මීට අවුරුදු කීපයකින් ඉහත බලපිටිමෝදර ගගේ උදකුක්ඛෙප සීමාවේ කර්ම කිරීමට පත්උනු සංඝයාවහන්සේගේ පහසුවෙන් ඇමට කරතිබුනු පාලම නිසා උනු සීමාසංකර වාදයෙන් වෙන්ව පුරාණ අමරපුරනිකාය ප්‍රවෙනිය නොහැර සිටි අපේ සංඝයාට ඇතුළත් වඤ්ඤාකඩුවේ ආයුෂ්මත් සරණපාල ස්ථවිරයන් වහන්සේ ගේ අන්තෙවාසී වූ ධම්මක්ඛන්ධ-වනරතන යන නම් ඇතිදෙනම අමරපුර දේශයට ගොස් සංඝරාජ මහාස්ථවිර ප්‍රමුඛ ධර්මවිනයෝධර පීකාවාසීයන් වහන්සේලා ඇතුළු වූ සංඝයාවහන්සේට ඉහත සඳහන්කල වාදය තත්වාකාරයෙන් සැලකොට විනිස්චය කර දී වදාල මෑනවැයි යාඥා කල නිසා ඒ අපගේ නිකායාධිපතීන්ද්‍ර මහා සංඝ රාජ මහා ස්වාමිපාදයන් වහන්සේ විසින් අමරපුරනිකාය ප්‍රවේනිය රැකීමෙන් ශාසනානුපස්ථම්භය පිණිස අපකෙරෙහි දයාවෙන් ලියා එවූ සීමාවිනිශ්චය පිළිබඳ ලෙඛණය අපේ සංඝයා සහ අපි බලා සතුටුව එම ලියමනේ පිටපත ආයුෂ්මතුන් වහන්සේලා විසිනුත් බලා දැනගෙන සැමැත්වීමට නියම්කරගත් සැටියක් මෙහි දැක්වීමට මණ්ඩලාරාමාධිවාසී අපේ මහාස්ථවිරස්වාමිපාදයන් වහන්සේ දැනුවත්ව කරපුටුගල ධම්මදින්න ස්ථවිරස්වාමිදරුවන්වහන්සේ ප්‍රධාන සංඝයාවහන්සේ වෙනුවෙන් මේ සමග එවූවේ

හිතේසීවූ තුඩුවේවත්තේ සි. අ. පඤ්ඤාසීහ
හික්ෂුවන මමය"

(අත්සන බුරුම අකුරෙනි,)

මේ ලිපියෙහි "මණ්ඩලාරාමාධිවාසී අපේ මහා ස්ථවිර සාමිපාදයන් වහන්සේ" යයි කියාතිබෙන්නේ "ලංකාගොඩ ධීරානන්ද" මහාස්ථවිරතුමන් ගැනය. උන්වහන්සේ පසුකලක රත්ගම මණ්ඩලාරාමයෙහි විසූ බව බු. ව. 2404 දී බුරුමරට ඤෙය්‍යධම්මසංඝරාජයන් වෙත යැවූ සන්දේශයෙහි තිබෙන "ලංකාදීපෙ ගාලුනගරාසන්නෙ රත්ගම නාම ගාමෙ මණ්ඩලාරාම අධිනිවාසමුපගතෙන ලංකාගොඩ සිරිසිඩමම වංසපාල-ධීරා-නන්දාභිධානෙන ලබ්ධසම්මතිකෙන අමරපුරනිකායිකෙන තිංස වස්සිකෙන ථෙරෙන" යන වාක්‍යයෙන් පෙනේ. මේ කාලයේදී උන්වහන්සේ උපසම්පදාවෙන් තිස්වස් ඇතිව සිටි බවත් එහි කියවේ.

උන්වහන්සේ සංඝරාජතුමන්ට යැවූ සන්දේශය අතිදීර්ඝ එකකි. එහි අමරපුරනිකායේ මූලෝත්පත්තිය ද සංකරවාදය ඇතිවූ සැටි ද ඒ සම්බන්ධ විවාදකළ සැටි ද විස්තර කොට තිබේ.

ඒ සන්දේශයෙහි කියවෙනසේ සංකරවාදය පිළිබඳ කරුණු උන්වහන්සේගේ වචනවලින් සිංහලට නගා කොටින් මෙහි දක්වනු ලැබේ:- කුලවංශයෙන් කොටස් සතරක් වූ භික්ෂූන් අතරෙන් මූල් සමූහයේ භික්ෂූන්ගේ උපසම්පදාකර්මය සඳහා බලපිටිය ගමේ මාදුගඟේ ගල්කණු සිටුවා ඒ කණුමත්තෙහි තාව-කාලිකව සාදන සීමාවක් විය. මෙයින් පසළොස් අවුරුද්දකට පෙරදී* ඒ සීමාවට පහසුවෙන් යාම සඳහා ගොඩසිට පාලමක් සාදා, සීමාවෙන් මෙහා දෙතුන් පියනක් දුරදී නවත්වා තබනලදී. එතැන් පටන් අවුරුදු දහයක් මුළුල්ලේ ඒ සීමාවෙහි ඒ පාලම එසේ තිබියදී උපසම්පදාවන් කරනලදී. පාලමේ ලණු ලී ආදීය අදකුක්ඛෙපසීමාව ඇතුළට පිවිස සිටිවිට ගාමසීමා-උදකුක්ඛෙප සීමාවන්ගේ සංකරය වන්නේයයි සැලකූ මම ඒ කාරණය මාගේ ආචාර්යවූ එක් විහාරයෙහි විසූ නායක මහාස්ථවිරතුමාට දැන්නුවෙමි. අටුවාදියෙහි ආ කරුණු ද පෙන්නුවෙමි. ඒ මහතෙරතුමා මාගේ වචනය පිළිවෙන සම්ප ගම්වලවැසි සංකරසීමාවේ උපසම්පන්නවූ භික්ෂූන් දෙඩන්දූවට පමුණුවා එහි ගඟේදී නැවත උපසම්පන්න කරවිය. (ඒ ගමෙහි කරාවේ භික්ෂූන්ගේ උපසම්පදාව පවත්වන තැනක් ඇත්තේය.) ඉක්බිති වැලිතර ආදී දුරපෙදෙස්වල සිටින සංකරවූ භික්ෂූන්ට ද එහි ඇවිත් උපසම්පදාව ලබාදෙන ලෙස නායකමහස්ථවිරතුමාගේ අණින් ධම්මාධාරණියසාදි තෙරවරුන්ට ලියුම් යැවීම් එය ලැබ ඒ තෙරනම සංඝයා රැස්කොට "අසවලා මෙවැනි ලිපියක් එවා තිබේ. ඒ ගැන කුමක් කළයුතුද"යි විචාල

---

* සන්දේශය ලිව්වේ බු. ව. 2404 දීය.

විට ධම්මාධාර තෙරුන් ගේ ශිෂ්‍යවූ ඤාණානන්දතිස්ස තෙරද "බලපිටියේ තෙර ආදීහුද "එසේ නොකළ යුතුය; සංඝයා මැදදී ඔහු (=ලංකාගොඩ තෙරුන්) හා සාකච්ඡාකරන්නෙමු"යි කියා දූවේ පන්සල නමැති තැන සංඝයා රැස්කරවා මා හා වාද කළහ. මම ඒ සීමාසංකරය සිදුවෙන සැටි අටුවාටීකාවලට අනුව දැක්වීමි. ආවාසී නායක ස්ථවිරතුමා ඤාණානන්දීන්ට පක්ෂවී අටුවා ක්‍රමය නිස්සාරයයි කීය.

ඊළඟ වර්ෂයේදී කළුතර පලාතේ තල්පිටිය නම් ගමේ පන්සලේදී සංඝයා රැස්කරවා ඤාණානන්දතිස්ස තෙමේ මා හා වාද කෙළේය. එහිදීද මම සංකරවන බව කීවෙමි. තුන්වෙනි වර්ෂයේදී පඤ්ඤාමොලි භික්ෂුව වසන බූස්සේ පන්සලේ සංඝයා රැස්වූ අවස්ථාවේදී නායකමහාස්ථවිරතුමා ද මම ද හිඳගෙන අසංකරපක්ෂය වෙනුවෙන් කථාකිරීම සඳහා සරණපාලතෙරුන් හා පඤ්ඤමොලි ආදි කීපනමක්ද සංකරපක්ෂය වෙනුවෙන් කථා කිරීම සඳහා සිරිසුමන තිස්ස - පඤ්ඤාසීහාදී කීපනමක් ද පත් කෙළෙමු. එසේ කරන ලද්දේ ගුරුගෝල දෙනම දෙපක්ෂයට සිට ගෙන ඉදිරිපිටදී කථාකිරීමෙන් සිත්හරක්වීමට ඉඩ ඇතිවිය හැකි බැවිනි. මෙසේ වරින්වර විවාද කිරීම නිසා බොහෝ ස්ථවිරවරු මගේ කීම පිළිගත්හ.

නැවත මෙයින් හවෙනි වර්ෂයේදී නායකස්ථවිරතුමා මේ වාදය ගැන කථාකිරීමට අසවල්ද, අසවල් තැනට ආයුතුයයි ලිපියක් වාලුකාරාමයෙන් ඉවත්ව සිටි මවෙත එවීය. එවිට මම "මින් පෙර නොවරක් ස්වකීය සංඝයා මධ්‍යයේදී කරුණු විස්තර කෙළෙමි. මේ වර ලක්දිව කොයිනිකායවලත් ධර්මවිනයධර තෙරවරුන් ගෙන්වනොත් මම පැමිණෙන්නෙමි"යි ලියා යැවීමි. නමුත් ඤාණානන්දතිස්සාදි විරුද්ධපක්ෂයෙහි වූවෝ දූවේ පන්සලට රැස්ව තමන්ට අනුවර්තීකවූ හැටහත්නමකගේ අනුමැතිය ඇතිව "අසවලා විනය විරුද්ධදෙයක් ප්‍රකාශ කරයි. හෙතෙම සංඝභේද කරන්නෙකි. ඔහු උත්තර දෙනතුරු ඔහු හා ධර්මාමිෂසම්භෝග නොකළයුතුය"යි ලියවිල්ලක් නායකමහතෙරුන් ලවා ලියවා සංඝයාගේ අණක්ලෙස ප්‍රකාශකරවූහ. ඉක්බිති කීප දිනක් ඇවෑමෙන් මම අපේ නායක මාහිමියන්ට සමානවස් ඇති ධර්මවිනයධරවූ ධම්මදින්න මහතෙරුන් ලවා "අසවල් දවසේදී කොස්ගොඩ ගනේගොඩැල්ලේ විහාරයට රැස්වුව මැනවි එහිදී උත්තර දෙන්නෙමි" යන අදහස් ඇති ලිපයක් පළකර හැරියෙමි. නායක මාහිමිතුමන් හා ඤාණානන්ද තිස්සාදීන් හැර අන්‍යවූ සියයකට අධික භික්ෂූහු එහි රැස්වූහ. එහිදී මම

සීමාසංකරය සිදුවෙන හැටි විස්තර කෙළෙමි. සභාවේ ප්‍රධානත්වය දැරූ ධම්මදින්න මහාසථවිරතුමා ඒ මතය පිළිගෙන රැස්වසිටි භික්ෂූන්ගේ අත්සන් ලියවිල්ලකට ගතයුතුයයි නියම කෙළේය. තවද නාංශසමහතෙරුන් ප්‍රමුඛ පිරිස විසින්මට චෝදනා කොට පළකළ ලිපිය ගණන් නොගත යුතුයයිද ඒ සභාව තීරණය කෙළේය. ඤාණානන්දතිස්සාදීහු යම්තාක් කල් ධර්මලබ්ධියෙහි නොපිහිටන්නාහු නම්, යම්තාක් කල් ඒ අශුද්ධ සීමාවෙහි උපසම්පදා කර්ම කරන්නාහු නම් ඒතාක් කල් ඔවුන් හා ධර්මාමිෂසම්භෝග නොකටයුතුයයිද ප්‍රකාශයක් කරවීය. එතැන් පටන් නාංශස මහතෙරුන් ප්‍රමුඛ හැටහැත්තෑ නමක් ඉවත්ව සිටියාහ.

ඉක්බිති බුරුමරටට ගිය ධම්මඛන්ධ භික්ෂුව අන සංඝරාජයන් වහන්සේ එවූ සීමාවිනිශ්චය ප්‍රකාශකිරීමෙන් මහාසේ විනයන් සපිරවීය. දෙවෙනිවර සංඝරාජතුමන් එවූ ලිපි හෝ චිත්‍ර හෝ මා විසිනුත් අන් බොහෝ දෙනෙකුත් විසිනුත් නොදක්නා ලදහ.

මින්පසු තෙවෙනිවර සංකරවාදය නිසා බිඳුණු සංඝයා සමගි කරවීම සඳහා පරමානන්දවිහාරවාසී සිරිසුමනතිස්ස බූස්ගේ පඤ්ඤාමොලි යන දෙනමට ඔබවහන්සේ එවූ ලියුම සිරිසුමන තිස්ස තෙරුන් විසින් මා ඉදිරියෙහි කියවන ලදී. මම වනාහි කවදත් සමගියට කැමැත්තෙන් සිටිමි. නමුත් මේ සමගිය කරවීමට ක්‍රියාකළ පිරිස පිළිපැද්ද හැටි යෝග්‍ය නොවීය. මේ සංකරවාදය වනාහි සලාගම භික්ෂූන් අතරේ උපන් එකකි. එබැවින් ඒ සම්බන්ධ සමගියද සලාගම භික්ෂූන් වසන ගමකදීම කළ යුත්තකි. එසේම අශුද්ධ සීමාවේ උපසම්පදාව ලැබූවන් නැවත උපසම්පදා කොට අලුතෙන් වස්ගණන් කරන්ට නියම කළයුතුය. එසේ කරවා සමගි කොට සංඝරාජතුමන්ට දැන්විය යුතුව තිබුණ නමුත් එවැනි සමගියක් කිසිවකු විසින් නොකරන ලදී. පසුගිය ඇසළමස පුරපක්ෂයේ දෙළොස්වෙනිදා කරාවේ භික්ෂූන් වසන ගමක්වූ අම්බලන්ගොඩ ඒ කුලයේ භික්ෂූන් වසන ආරාමයක රැස්වීමක් පවත්වන ලදී. එය සඳහා ලියුම් යැව්වේ (බුලත්ගම) සිරිසුමනතිස්ස භික්ෂුවය. ගණනායක (බෝපාගොඩ මහාසථවිරතුමා සහිත පිරිසක් ද මම ද ඤාණානන්ද තෙරුන්ගේ මතය පිළිගත් ඇතැම් භික්ෂූහුද එහි පැමිණියෙමු. පාලිභාෂාව දන්නා සලමොන් ද සොයිසා අප්පුහාමි ඇතුළු බොහෝ ගිහි-යෝද බලපිටි උසාවියේ විනිශ්චයකාරයා ද විජයගුණරත්න අභයසිංහ මුදලිතුමා ද එහි පැමිණ සිටියහ.

එකල්හි සිරිසුමන-පඤ්ඤාමොලි භික්ෂුදෙනම අස්නෙන් නැගිට සංඝරාජතෙරුන්ට වැඩිමහලු තෙරවරුන් වෙත ගොස් සංඝරාජ-

යන්ගේ වචනයෙන් ඔවුන්ට වැන්දහ. ඉන්පසු ඔබතුමන් එවූ ලිපිය සම්පූර්ණයෙන් කියවා ඒකේ සංක්ෂිප්ත සිංහල අනුවාදයක් ද කියාදී සංඝරාජයන්ගේ ඉල්ලීම ලෙස සමගිවුව මැනවැයි යාචඤා කළහ. ඤාණක මහාස්ථවිරතුමා අපි එසේ සමගිවෙමුයි කීය. මමත් එසේ කීමි. එවිට මා හා සමාන ලබ්ධිඇත්තන්ගෙන් කීපනමක් සංඝරාජයන් විසින් පළමු-දෙවෙනිවාරවල එවූ ලිපිවල කෙටි තේරුම මේ සභාවට කියාදුන මැනවැයි ඉල්ලා සිටියහ. සුමනතිස්ස-පඤ්ඤාසාමොලි දෙනම "ඒ ලිපි අපි මෙහි නොගෙනාවෙමු"යි කීහ. එවිට මාගේ අතවැසිවූ පඤ්ඤාසීහ භික්ෂුනම "මා ළඟ පළමුවර එවූ ලිපිය තිබේ"යයි කියා එහි තිබෙන සීමාසංකරය සිදුවෙන සැටි දක්වෙන වාක්‍යය කියෙව්වේය. සිරිසුමන භික්ෂුනම එය කීපවාරයක් පාළියෙන් කියෙව් නමුත් සිංහලෙන් තේරුම නොකීවේය. ඉක්බිති පඤ්ඤාසීහ භික්ෂුවම එහි අර්ථය කියාදුණි. එකල්හි පඤ්ඤාසාමොලි ආදීහු "මෙතෙක් ප්‍රමාණය, වැඩිදුර නොකියවුව මැනවැ"යි කියමින් තරයේම එය වැළැක්වූහ. ඉන්පසු මාගේ පක්ෂයේ එක්නමක් "මේ සන්දේශයෙහි තිබෙන සංකරදෝෂය දක්නාහේක්ද"යි භික්ෂු පිරිසෙන් විචාළවිට සරණපාලස්ථවිර-පඤ්ඤාසාමොලි ආදීහු 'අපි දකිමු"යි කීහ. එසේ නම් එසේ වැටහීම ඇත්තන්ගේ නම් ලියාගත යුතුයැයි මා කීවිට සිරිසුමනභික්ෂුව නම් ලියන්ට පටන්ගත්තේය. එසේ ලියා ඒ ඒ නම් ඉදිරියේ අත්සන් තැබුව මැනවැයි කීවිට සරණපාලස්ථවිරාදීහු "අපි අත්සන් නොතබමු"යි කීහ. එවිට "මොවුහු අවංකව සමගිය කැමැත්තාහු නොවෙති"යි මම වටහාගතිමි.

ඉන්පසු ඤාණකමහාස්ථවිරතුමා "සංකරදෝෂයක් නැත; එහි කළ කර්මයක් කොප්‍යනොවේය"යි ප්‍රකාශකෙළේය. උන්වහන්සේ එතාහි දූත් වයෝවෘද්ධය, අප ඇතැම් කෙනෙකුන්ගේ ගුරුවරයාය, ශ්‍රාවකාකාරයෙන් කියන කල්හිත් කරුණු පිළිනොගනිත්. ඒ නිසා කිසිවෙක් එහිදී උන්වහන්සේට විරුද්ධව කථා නො කෙළේය. මේ කථාවත් නිසා රාත්‍රියේ ප්‍රථමයාමයත් ඉකුත්විය. එදින වැඩ මෙතෙකින් අවසන් විය. මේ සමගිය කරවන්ට උත්සාහ කළ සැටියයි.

මම එදින රෑම අන්‍ය ආවාසයකට ගියෙමි. පසුදා සිරිසුමන-පඤ්ඤාසාමොලි ආදීහු ද ඤාණකස්ථවිරතුමා ඇතුළත් දෙපක්ෂයේ පිරිසක් ද කරාවේ භික්ෂුහුකීපනමක් ද එකතුව මාදම්පාමෝදර ගඟේ දී විනය කර්මයක් කළාහයි අසන්ට ලැබුණි. මම එහි නොගියෙමි."

මින්පසු මේ සන්දේශයෙහි බුලත්ගම සිරිසුමන මහාස්ථවිරතුමා ඔවුනොවුන් අතර භේද ඇතිකරන්නෙක යනාදිය කියමින්

එතුමාට දෙස්නගා තිබේ. හික්කඩුවේ සිරිසුමංගල මහාස්ථවිර තුමා සංකරයක් නැතැයි යන මතය ප්‍රකාශකරන බැවින් තමා හා කොසතුටෙන් සිටින බවත්, පෙර මිත්‍රව සිටිබවත් කියා තිබේ. මෙසේ නොයෙක් කරුණු දක්වා නැවතත් සමගියක් ඇතිකර-වන්ට උත්සාහගන්නා ලෙස සංඝරාජතුමාගෙන් ඉල්ලා තිබේ. "සක්‍යසීහස්ස භගවතොපරි නිබ්බානතො චතුසත්තාධිකානං ද්විනනං වස්ස සහස්සානමුපරි චතුත්ථේ වස්සෙ සාවනමාසකාළපක්ඛඑකාදසමියං රවිදිනෙ පහිතමිදං" යන්නෙන් දූතම දක්වා සන්දේශය අවසන්කර තිබේ.

ලංකාගොඩ ස්වාමිපාදයන්ට විරුද්ධව බෝපාගොඩ නායක මාහිමියන් ප්‍රමුඛ සංඝයා විසින් ප්‍රකාශපත්‍රයක් යවන ලදැයි යට කියනලදී. ඒ ප්‍රකාශ ගැන කල්‍යාණිවංශිකයන්ගේ අදහස් දැන ගනු කැමති ලංකාගොඩ ස්වාමිපාදයන් එවූ ලිපියක් මෙසේයි:-

"වරුෂ 1855 ක්වූ ජූනි මස 11 වෙනි දිනදී ය. දෙඩන්දූව ශෛලබිම්බාරාමාධිවාසී කළුරිය කළ ආයුෂ්මත් කොග්ගල ධම්මසාර නායක ස්ථවිරයානන් වහන්සේගේ ප්‍රධාන සිෂ්‍ය උඩුගම්පිටියේ සුමනතිස්ස සුගතොරසඥානන් සහ පියරතන නැන විසින් යථොක්ත නායකස්ථවිරයන් වහන්සේව ප්‍රධානකොටයට ගෙන සිටිය අතිකුත් ස්ථවිර මධ්‍යමාදි සංඝයාට දැනුන් දීමෙන් බලාගන්නා පිණිස ලියායවන වග සැටි නම්:-

අප බුද්ධරජාණන් වහන්සේගේ සූත්‍රානුලොමනයින් ප්‍රවර මහා මහින්දස්ථවිර පරම්පරාවෙන් පැවති මහා අට්ඨකථාටීකාදියේ කියා තිබෙන සැටියටැ ග්‍රාමෝදකුක්ෂේප සීමාවන්ගේ අන්‍යොන්‍ය සම්බන්ධයක් ඇති කල්හි සීමාසොධනාදිය නොකොට කම් කිරීම අයුතු බව අපේ නායක ස්වාමිදරුවන් ප්‍රධාන සංඝයාවහන්සේ ඉදිරියේ කියන්ට පලමුකොට නතිකොට නායක ස්වාමිදරුවන් වහන්සේට මම පොත්වලින් පෙන්නා දී සැලකර තිබියාම ඒ බව සැබෑලෙස පිළිගෙන සංකරදෝෂය ඇතුව තිබුනු සීමාවේ දී උපසම්පදකම් ව්‍යවහාරයට පැමිණ සිටිය නම්ලාගෙන් බොහෝ දෙනෙකුට එම නායක ස්වාමිදරුවන් වහන්සේම වැඩහිඳ සංඝයා ලවා ඊට ප්‍රතිකම් කෙරෙව් බව මෙහාලාත් දන්වා ඇත

එම ස්වාමිදරුවන් වහන්සේ ප්‍රධානව සංඝයා ඉදිරියේ කියා පොත්වලින් පෙන්නා දීමේ දී අඹගහපිටියේ ඤාණවිතැන ප්‍රතිවාදකාරයෙක් වීමෙන් නායක ස්වාමිදරුවන් වහන්සේ තම්මවා ගැනීමෙන් ඒ නැනගේ මතයට අනුකූලවාදී කෙනෙක් වත් සිට මම කී සීමාසංකරදෝෂය අටුවාවේ තිබෙන කිමක් බව සැබෑ ලෙසන් වදල බව ඒ සභාවේ සිටිය බොහෝ අය දන්නවාත් ඇත.

මේ සමාගමේ නායක ස්වාමිදරුවන්වහන්සේ ප්‍රධානව වැඩසිටියෙ වී නමුත් ඒ ස්වාමිදරුවන්වහන්සේ වෙනුවෙන් මේ ගමාගමේ සිෂ්‍යකාමී බොහෝ සංඝයාට විනේකර්මාදි කටයුතු බොහෝකලක පටන් ඒ ස්වාමිදරුවන්වහන්සේ අභිමුඛයේදී ද අනභිමුඛයේ දී ද ප්‍රසිද්ධලෙස කරකියාදීමෙන් උපකාරව සිටින්නේ මම නිසා මාලගට විනේකටයුතු කලමනා අහබලාගැනීම සඳහා පැමිණි අයට කියා තේරුත්කර දීමෙන් ඉඟතකී සීමාසංකරදෝෂය නිසා ප්‍රතිකර්ම කරවාගන්ට පැමිණියවුන්ට සංඝයා ලවා ප්‍රතිකර්ම කරවාදීමෙන් අමරපුරවංශාගත අපේ සමාගමට උපකාරව පසුවෙන අතර ප්‍රතිවාදක-ප්‍රතිවාදානුවාදක දෙදෙනා අතරෙන් ප්‍රතිවාදානුවාදක කෙනෙක්ව ප්‍රසිද්ධයෙන් සිටින අපේ නායක සාමිදරුවන්වහන්සේ සැසන විනාසයට මුල්වන සීමාසංකරදෝෂය අවුවාටීකාදී පොත්වල ඈ පිලිවෙලින් නොවරදවා එලිදරව්කොට සමාගමට ආලයෙන් පෙන්වාදුන් මා කෙරෙහි කරුණා නොකොට ද්‍වේෂ සිතින් දූනට මා ගැන මේ සමග එවූ පිටපතේ අන්දමින් ලියමනක් ලියා පිරිසක් අතර කියවාදී තිබෙනවාය.—

ඉන් නිසා ධර්මාමිසසමෙහගයෙන් අප හා සමග සමගි කම් කොට එන මෙතැන්ලා පිළිබඳ එහි සංඝයාවහන්සේටත් මේ කාරණම දන්විය යුතුය කියා හැඟී මා විසින් එවූ බැවින් එහි සංඝයා අතර මේ ලිවුන් පිටපතේ වග ධර්මවිභාගානුකූලව අගති විරහිතව විභාගපරීක්ෂාකොට තිසිවූ අන්දමින් සංඝසම්මතියෙන් තිසි වූ ලියවිල්ලක් මට ඔතැකරන බැවින් එසේ කරවා අප්‍රමාදව එවන හැටියට සෑහෙන විශුද්ධිකල්පනාවෙන් මේ සමග තිබෙන ලිවුන් පිටපත සමග මේ වග ලියා එව්වේ දබල්ලේ වාලුකාරාමවාසී සිරිසද්ධම්මවංසපාල ධීරානන්දතෙරුන්නාන්සේ”

(අත්සන බුරුම අකුරෙන්.)

මුන්වහන්සේ විසින් අර්ථකථාචාර්‍ය්‍ය බුද්ධදත්තමහාස්වාමීන් විසින් සම්පාදිතවූ විනයවිනිච්ඡය නමැති පොතට සිංහලපදගත සන්නයක් සම්පාදිත විය. ඒ පොතේ රෝයල් පිටු 431 කින් යුත් කොටසක් දූන් මුද්‍රණයට පත්ව තිබේ. දූන් සද්ධම්මවංසනිකායේ මහානායක ධුරය දරන කොළඹ ජයසේඛරාරාමාධිපති කලල්ලේ ධම්මරක්ඛිත මහාස්ථවිරතුමන් විසින් සකස්කරනලද ඒ පොතේ සංඥපනයෙහි ලංකාගොඩ මාහිමියන්ගේ මුල්කාලය සම්බන්ධයෙන් මෙසේ දක්වා තිබේ:— “මුන්වහන්සේ දක්ෂිණලංකාවෙහි මාදම්පා නම් නියම්ගම ලංකාගොඩ නම් පියසෙහි සුප්‍රසිද්ධ වැදගත් ප්‍රභූකුලයක සඤ්ජාතවූයේ එවකට මාදම්පේ කුලීගොඩ පුරාණවනවාස විහාරාධිපතිව වැඩවිසූ ප්‍රියශීලී දෙල්දූව ධර්මරක්ෂිතාභිධාන මහා

ස්වාමිපාදයන්වහන්සේ වෙත බාලවියෙහිම දෙමාපියන් විසින් පමුණුවන ලද්දේ අක්ෂරාභ්‍යාසය හා හෙරණ බණදහම් ප්‍රගුණ කරවා පැවිදිකරන ලද්දේ විය. වත්පිළිවෙත් ආදිය පුරුදු කරවීමෙන් ටික කලකින්ම මුන්වහන්සේගේ ශ්‍රද්ධාමතිමය හා සුසීල ගුණයත් ප්‍රඥා පාටවයත් දත් සිය ඇදුරුපාණන්වහන්සේ විසින් එකල දඩල්ලේ වාලුකාරාමාධිපතිව වැඩවිසූ ලංකා අමරපුර නිකායේ මහානායක පදවියට ම්‍රම්මදෙශයෙහි මහරජ තුමන් විසින්ද ලංකාණ්ඩුව විසින්ද රාජසන්නසින් පත්කරනු ලැබූ සුප්‍රසිද්ධ කීර්ති ශ්‍රීන් විරාජමාන බෝපාගොඩ සිරිසුමනඤාණා-ලංකාරමහාධම්මරාජගුරුගණාචරිය නායකමාහිමියන් වහන්සේ වෙත ධම්විනය ශබ්දශාස්ත්‍ර ප්‍රගුණකරවීම පිණිස භාරකළේත් ....................බහුශ්‍රැත මහා ප්‍රාඥ ස්ථවිරොත්තමයාණකෙනෙක් වූහ.”

මුන්වහන්සේ ක්‍රි ව. 1871 ජනවාරි මස 21වෙනි දින කොළඹ දෙමටගොඩ ජයසේඛරාරාමයේදී අපවත්වූහ.

## 21. බෙන්තර අත්ථදස්සී මහාස්වාමිතුමා

(අපවත්වීම ක්‍රි ව. 1845.)

ශ්‍රීකල්‍යාණී සාමග්‍රීධම් සංඝසභාවේ උපාධ්‍යාය ධුරන්ධරව බෙන්තර වනවාස විහාරයෙහි වැඩවිසූ බෙන්තර අත්ථදස්සී මහාස්ථවිරතුමා වනාහි වලානේ ශ්‍රීසිද්ධාර්ථ මහාස්වාමිතුමන් මෙන්ම පණ්ඩිතයන්ට ආචාර්‍ය්‍යවූ උතුමෙකි. 1. හැක්‍රාමුල්ලේ ධම්මාරාම, 2. මාවැල්ලේ ධම්මානන්ද, 3. කෝම්මල ඉන්දසාර, 4. පොතුවිල ඉන්දජෝති, 5 අඹගහපිටියේ ඉන්දසභවරඤාණසාමි ආදි මහාස්ථවිරවරු මුන්වහන්සේ වෙත පැවිදිවූ ශිෂ්‍යයෝ වූහ. වැලිගම ශ්‍රීසුමංගල නායකමාහිමිතුමා මුන්වහන්සේ වෙත උගත් ශිෂ්‍යයෙක් විය.

අත්ථදස්සී මහාස්ථවිරතුමා පළමුවෙන් ශාස්ත්‍රාගම ඉගෙනගත්තේ කරතොට ධම්මාරාම පාතරට නායක හිමිතුමන්ගෙනි. ඒ නායකහිමියන්ගෙන් උගත් ඉතාබාලශිෂ්‍යයා මුන්වහන්සේ යයි කියත්. මුන්වහන්සේගේ පැවිදිපරපුර වනාහි වැව ඉන්දසාර මහාස්වාමින්ගෙන් පැවතෙන්නේ යයි සිතිය හැක. කරතොටවංශ නමැති පොතේ “මාතර හිත්තටියේ රජමහාවෙහෙර වැඩවිසූ වැව ඉන්දසාර තෙරුන්වහන්සේගෙන් “වැව පරම්පරාව” ඇතිවිය. උන්වහන්සේගේ ශිෂ්‍යවරයෙක් බෙන්තර බොධිමලු විහාරයෙහි නිත්‍යවාසී විය. උන්වහන්සේගෙන් ඇතිවූ සිසුපරපුර එ[illegible]ස

බොධිමලුපරපුර නමින් ප්‍රසිද්ධ වූහ''යි කියා තිබේ අත්ථදස්සී මහාස්ථවිරතුමා මේ පරම්පරාවේයයි සිතමි. මෙකියන ඉඳුසර හිමිතුමා වනාහි සියම්නිකාය පිහිටුවන කාලයේදී සිල්වත් කෙනෙක්ව සිට සියම්නිකාය පිහිටි පසු වේහැල්ලේ ධම්මදින්න හිමියන් හා මහනුවරට ගොස් උපසම්පදාව ලබාගත්තෙකි.

මුත්වහත්සේ විසින් බු ව. 2388 දී සියම් රටට යැවූ සන්දෙශ දෙකක් තිබේ. ඉන් එකක් ඉතා දීඝී එකකි. එහි මුත්වහත්සේ තිපදවූ විවාද කිපයක් ගැන කරුණු දක්වා ඒවා ගැන සියම් තෙර වරුන්ගේ අදහස් විචාරා තිබේ. එපමණක් ද නොව මල්වතු-අස්ගිරි දෙපාශ්වයේ භික්ෂූන් ඔවුනොවුන්ට චෝදනා කරගැනීම නිසා කලකිරුණු මුත්වහත්සේ රාමඤ්ඤරටින් කල්‍යාණිවංශික නිකායේ භික්ෂුපිරිසක් මෙරටට එවනසේ ද එයින් ඉල්ලා තිබේ. ඒ පාලි සන්දෙශයේ තිබෙන කරුණු සංක්ෂෙපයෙන් දැක්වීම ඒකාලයේ ඉතිහාසය ඉගනීමට උපකාරවෙන බැවින් ඇතැම් කරුණු සිංහලට නගා මෙහි දක්වමි. ඒ දීඝී සන්දෙශය පටන් ගෙන තිබෙන්නේ:-

> ''සංඝරාජ නමො තුය්හං අයොදය-යතීසභ
> නිවෙදයාම තුම්හාකං පවත්තිං සාසනෙ ඉධ''

යන ගාථාවෙනි. 3 වෙනි ගාථාව මෙසේයි:-

> ''ලඞ්කිත්ථියා සෙඛරසත්තිකාසෙ
> මසක්කසාරලකම්භසාදිසෙ
> විචිත්තනානාපණ පන්ති-සොභිතෙ
> පසිද්ධ-සෙඛඛණ්ඩසිලාභිධානකෙ''

මෙතැන් පටන් ගාථා 148කින් කියවෙන ප්‍රවෘත්ති මෙසේයි:-

බු. ව වර්ෂ 2291 දී කීර්ති ශ්‍රී රාජසිංහ රජ රාජ්‍යයට පැමිණ බුද්ධශාසන දියුණු කරනු කැමතිව සන්දෙශ හා පඬුරු දී ඇමති පිරිසක් සියම් රටට යවා දශනමකට අධික සඟ පිරිසක් එවනසේ ඉල්ලා සිටියේය. ඒ සන්දෙශාදිය ලැබූ ධාර්මික සියම් මහරජතුමා, දූතයන්ට සංග්‍රහකරවා සංඝයාවහන්සේ සමඟ සාකච්ඡා කොට උපාලි ස්ථවිරාදි දශාධික සඟ පිරිසක් නොයෙක් පොත් ද ප්‍රති-පඬුරු හා සන්දෙශද දී මෙරටට එවීය. ඉක්බිති ලක්දිව රජතුමා ඒ පිරිස සාදරයෙන් පිළිගෙන උපස්ථානකොට මල්වතුවිහාරයෙහි වාසය කරවා බු. ව. 2296 දී සරණංකර සාමණේරාදීන්ට උපසම්පදාව දෙවීය. එතැන් පටන් අවුරුදු හැටදෙකක් මෙහි ශාසනය නිර්මලව පැවැත්තේය.

මෙයින් අවුරුදු 28කට පෙර ශ්‍රී වික්‍රමරාජසිංහරජ අධාර්මිකවූ බැවින් ලක්වැසියෝ ඉංග්‍රීසීන් හා එක්ව ඒ රජු අල්වා රටින් පිට යැවූහ. ඉන් පසු කලක අස්ගිරියේ වැසි භික්ෂූන් නිසා ශාසනයේ අර්බුදයක් ඇතිවිය. කරුණාවට ආකාරවූ සරණංකර සංඝරාජතුමා ජෙසකාරකුලාදියෙන් පැමිණි නොයෙක් බාලයන් පැවිදි කරවීය. නමුත් රජතුමා ඔවුන්ට උපසම්පදාව දීම වැළැක්විය. ඉන්පසුව රාජ්‍යය ලැබූ රජවරු දෙදෙනත් එසේ කළහ. එබැවින් ඒ සාමණේරවරු අමරපුරයට ගොස් උපසම්පදාව ලබාගෙන ආවාහුය. ඔවුහු ක්‍රමයෙන් වැඩෙමින් පාතරට විසූහ. සිංහල රජු අල්වාදූන් පසු ඔවුහු උඩරටට ද ගොස් ඒ නිකාය පැතිරවූහ ඉක්බිති තෝලංගමුවේ නමැති උපාලිවංශික භික්ෂුනමක් සියම්නිකායේ උපසම්පදාව සදොස් යයි ප්‍රකාශ කෙළේය. ඒ සඳහා ඔහු කී කරුණු මෙසේයි:- මෙහි පැමිණි සියම් භික්ෂූහු බඩසීමාව හා ගාමසීමාවේ ගැටීමක් ඇතිකළහ; සීමාන්තරයක් නොතැබූහ. රජුට දත්වා බිම්කොටසක් ඉල්ලාගෙන එහි සීමා නොබැඳ උපසම්පදාකරති, සිවුරට උඩින් පටිය බඳිති, දෙපටසිවුරක් පාවිච්චි නොකරති, දෙපට අඳනයකුත් නැත; බැමලොම් කපති යනාදියයි.

උපාලිවංශිකයෝ ද බුරුමවංශිකයන්ට දල්හිකම්කිරීමාදිය ගැන දෙස් කියත්. මෙසේ මේ දෙනිකායේ විවාද නිසා අද ලක්දිව සස්නෙහි අර්බුදයක් ඇතිව තිබේ. තවත් කාරණයක් ඇසුව මැනවි:-ලක්දිව රුහුණුදෙසට අයත් බෙම්තොට වනවාස විහාරයෙහි වසන අත්ථදස්සී නම් මා විසින් උපදවන ලද වාද කීපයක් ද වෙති. මධ්‍යම දේශයෙහි යම් වර්‍ෂයකදී අධිමාසය හරිනු ලැබේ නම් ඒ වර්‍ෂයේදීම මෙහිත් අධිමාසය හැරිය යුතුයයි මම කියමි. මධ්‍යදේශයෙහි මාසගණන්කරනු ලබන්නේ පුරපසළොස්වකෙන් පුරපසළොස්වකටය. අන්‍ය ප්‍රත්‍යන්තදේශයන්හි අමාවකෙන් අමාවකට මාස ගණිනු ලැබේ. මම වනාහි බු. ව. 2381 දී අධික හැරියෙමි. අන්‍යයෝ ඊළඟ වර්‍ෂයේදී අධික හැරියාහ. මේ කාරණය පරීක්‍ෂා කළ මැනවි.

දෙවෙනිවාදය සංඝිකදත් පිළිගන්නා ආකාරය ගැනයි. තෙවෙනි එක එක් උපචාරසීමාව තුළ බඩසීමාදෙකක් සාදාගෙන විනයකම් කිරීම යුතුයයි බුරුම වංශිකයන් කීම හා එය අයුතුයයි අත්ථදස්සී ස්ථවිරතුමන් කීමයි. මේ විවාදවල විනිශ්චයක් එවනසේ ඉල්ලා අනතුරුව

"උපසම්පදනතු තිස්සාය උපපන්නාවාදපච්චයා
බහවො භික්ඛවො කංඛාසල්ලවිඩ්ඪා වසන්ති හි"

යනාදි ගාථා පසළොසකින් "මෙරට බොහෝ භික්ෂූහු උපසම්පදාව නිසා උපන් වාද හේතු කොට සැක නමැති හුලින්

විදිත ලදුව වසත්. එබැවින් පින්වත් ස්වාමිවරු මෙකල රාමඤ්ඤ රටෙහි පවත්නා උපසම්පදාව පරීක්ෂාකොට එහි නිකාය දෙකක භික්ෂූහු වසත් නම් ඒ දෙකෙන් කල්‍යාණී නම් ඇති නිකායෙන් අතිරේක දශවර්ගික භික්ෂු සංඝයා මේ ලක්දිවට එවත්වා. එහි කල්‍යාණී නමින් නිකායක් නැත්නම් අන්කාරණක් කියමි; සියම් රටෙහි නිකාය දෙකක් තිබේ, ඒ නිකාය දෙකේ භික්ෂූන් රාජ මන්දිරය අසල පිහිටි පෝයගෙහි රැස්කරවා රජතෙමේ එහිදී උපසම්පදාව කරවන්නේ යයි සියම් රටින් ආ අයගෙන් අසන්ට ලැබුණි. තවද සියම්රට ධම්මයුත්තික නිකායෙන් මෙහි පැමිණි භික්ෂූහු සෙංකඩගල නුවරදී එහි වසන භික්ෂූන් හා එක්ව පෝය කළෝය. එබැවින් ස්වාමිවරුනි, ඒ නිකාය දෙකෙන්ම සංඝයා මෙහි එවනු ලැබේ නම් ඉතා යෙහෙකි.”

“තවද ස්වාමිවරුනි, මෙකල ලක්දිව බහුශ්‍රැත සිල්වත් භික්ෂූහු ඉතා අල්ප වෙති මාගේ මේ ලිපිය සියම්රට මහරජතුමන්ට පෙන්වා දශවර්ගාතිරේක සංඝයා මෙරටට එවන්නාහු නම් එය මෙරට සස්නට උපකාර කිරීමකි.”

“සම්බුද්ධපරිනිබ්බාණා වෙසාඛස්සාධිකෙ පන
සතත්තයඬ්ඪසීතිම්හි පුණ්ණෙ සංවච්ඡරෙ පන
මෙසරාසිං සමාගන්ත්වා සූරෙ තෙරසමෙ දිනෙ
අට්ඨදසාදිභික්ඛුහි අනෙකනයමණ්ඩිතං
සන්දෙසපණ්ණං පවරං පෙසිතනති විචක්ඛණා
සම්මා යෙව ච ජානන්තු ජිනසාසනවෙදිනො”

යන ගාථා තුනෙන් දිනම දක්වා සන්දේශය අවසන් කොට මින් පෙරත් මේ සන්දේශය එවන්ට උත්සාහ ගත් නමුත් මහනුවර වැසි භික්ෂූන් විසින් එය වළක්වන ලද බවත් ඒ කාරණය මීට පෙර පැමිණි විපස්සී නමැති භික්ෂුවත් සිඛාඤ්ච නම් භික්ෂුවත් දන්නා බවත් ලියා තිබේ. ඉන්පසු වරක ආ බුද්ධඝෝෂාදි භික්ෂූන්ට මේ සන්දේශය පෙන්වා ඔවුන් නැව් නගින අවස්ථාවේදී කොළඹට යැවූ නමුත් එය ගෙන ගිය දූතයන්ට හමුනොවී ඒ පිරිස නැව් නැග ගිය බවත් කියවේ.

මේ සන්දේශයට විරුද්ධව මහනුවර සංඝයා විසින් සන්දේශයක් දී භික්ෂුසාමණේර පිරිසක් සියමට යවන ලදී. එයත් දීර්ඝ සන්දේශයකි. එහි:-

“ලංකාදීපෙ රොහණම්හි හිමතිත්ථවහයෙ සුභෙ
ගාමෙ’සි චතුවාසවහ-විහාරං සුමනොරමං
තස්මිං වසන්තො තාමෙත අට්ඨදස්සිති පකතො
භික්ඛු අහොසි තෙනාපි එවරූපානි දානි තු
පකාසිතානි වාදනි තානි එත්ථ කථීයතෙ”

යනාදි වශයෙන් මුලින් කී සන්දේශයේ හැම කරුණුම ඊට සමාන ගාථාවලින්ම විස්තරකොට තිබේ.

මහනුවරින් යැවූ බු. ව. 2388 දූතම දරන සන්දේශයක “බෙන්තර වැසි අත්ථදස්සී භික්ෂුව විසින් සියම් මහරජු වෙත එවූ සන්දේශය ගැන ශ්‍රීවර්ධනපුරයෙහි ඇමතියෝ හෝ මල්වතු අස්ගිරි වැසි ස්ථවිරාදීහු හෝ නොදනිත්. පාතරට මූද අසල වසන භික්ෂුවක් විසින් නොදැනීමෙන් එවන ලද්දකි”යි දක්වා ඊට අනතුරුව “බු ව. 2384 වෙනි වර්ෂයේදී සියම්රට රතනකෝසින්ද නුවර පවරනිවෙසාරාමවාසී චූල නිකායික සුභූති-අමරමොලි දෙනම ඇතුළත් භික්ෂූහු පස්නමක් ද දෙවෙනිවර සුභූති-පිලින්දිවච්ඡ දෙනම ඇතුළත් සත්නමක් ද පැමිණියාහ. ඒ පිරිස් ගෞරවයෙන් පිළිගෙන උපස්ථානකොට දළදා පෙන්නුවෙමු”යි කියා තිබේ.

මින්පසු මෙහි ශාසනපරම්පරාව කියාගෙන ගොස් සියම් රටින් මුලදී පැමිණි උපාලිස්ථවිරාදී පසළොස් නමකගේ නම් දක්වා දෙවෙනිවර පැමිණි විසුද්ධාචරිය ආදි සතනමකගේ නම් දක්වා තිබේ. බු. ව 2360 දී චන්දජෝති, පුඤ්ඤදස්සිය, ඉන්දරතන, ඤාණජෝති, බුද්ධධර, ධම්මධර යන ස්ථවිරවරු සියම් රටින් අවුත් අවුරුද්දක් පමණ කල් මෙහි වැස දළදා බලා හැරියාහ”යි දක්වා ඊට අනතුරුව “බහිරඬෙ සමුද්දතෙන පෙසකාරා අවන්තිරට්ඨං ගන්ත්වා මයං උපසම්පන්නාති ආගන්ත්වා නිකායං පවත්තෙන්ත්වා අඹංසුතං නිකායං රාජ-රාජමහාමත්තාදිහි පවත්තිතනිකායං න හොති” (=පාතරට මූද අසල පේසකාරයෝ අවන්ති රටට ගොස් අපි උපසම්පන්න වීමුයි කියමින් අවුත් නිකායක් පිහිටුවා ගෙන සිටිත්. ඒ නිකාය රාජ-රාජමහාමාත්‍යාදීන් විසින් පිහිටුවන ලද නිකායක් නොවේ,) යනාදිය ලියා තිබේ.

මෙහි අවන්ති රට යයි ලියා තිබෙන්නේ බුරුමේ අවා නුවර ගැන විය යුතුයි. දඹල්ලෙන් උපසම්පදාව ගේන්ට ගිය පිරිස පැමිණි කාලයේ දී බුරුම රජ විසුවේ රතනපුර යයි කියනු ලබන අවානුවරය.

මෙසේ සන්දේශාදිය යවා සියමෙන් භික්ෂුපිරිසක් ගෙන්වා ශාසන ශෝධනයක් කිරීම නො හැකි වූ බැවින් අත්ථදස්සී මහා ස්ථවිරතුමා තමන්ට අනුවර්තීක වූ පිරිසක් සමග කැලණිගඟේ දී උපසම්පදාව කරන්ට පටන් ගෙන “කල්‍යාණිසාමග්‍රීධර්ම සංඝ සභාව” පිහිටුවා, මහනුවරින් උපසම්පදාව ගේන්ට යාම අත්හිටෙව්වේය මුලදී උන්වහන්සේට අනුමතික වූ බලවත්තු නම් 1. මලිගස්පේ ධර්මකීර්ති මංගල නායක මහාස්ථවිර,

2. පාතදුරේ ඉන්දසාර මහා ස්ථවිර, 3. වලානේ සිද්ධාර්ථ මහා ස්ථවිර, 4. පැපිලියානේ මහාවිහාරවංශාලංකාර නායක මහා ස්ථවිර යන මේ ස්ථවිරවරුය.

මාදම්පේ සිරිවඩ්ඪනාරාමාධිපතිව විසූ "සිරිපඤ්ඤරංස පණ්ඩිත ධම්මතිලක" නායක මහාස්ථවිරතුමන් විසින් සම්පාදිතව 1911 දී මුද්‍රිතවූ විමතිච්ඡේදනය නමැති පොතේ බෙන්තර අත්ථදස්සි ස්වාමීන්ද්‍රයන් ගැන ලියා තිබෙන කරුණු මෙසේයි:- සියම්නිකායේ ප්‍රභවය විස්තර කිරීමෙන් පසුව "යම් කරුණක් හේතුකොට ගෙණ බෙම්තොට අත්ථදස්සි මහාස්ථවිරයන්වහන්සේ අට්ඨකථාටීකා මතානුකූලව ආමානතාවතික්‍රමයෙන් අධිකහරිමින් පවත්වාගෙණ ආ වස්විසීම වෙනස්කොට බුද්ධවර්ෂ දෙදහස්තුන්සිය හැත්තෑ-හතරේදී පෞර්ණිමානතාධික ක්‍රමයෙන් වස්එළඹීමට පටන්-ගත්තේය. ඉන් විවාද ඉපදී සියම්-අමරපුර දෙනිකායික සංඝයා සමග ඔබිමොබ ලියුම් යැවීමෙන් හා විවාදකථා කරමින් කලක් පසුවෙන අතර ක්‍රිස්තුවර්ෂ එක්දහස් අටසිය පණහේ පමණ හරියේදී කළුවාමෝදර ගඟ අසල කෙරුණු මහබණපිරිත් පිංකම අවසානවූ දින එගම්වැසි දයකමහතුන්ගේ ආරාධනාවෙන් බෙම්තොට අත්ථදස්සී මහාස්ථවිරයන් වහන්සේ ප්‍රධාන සංඝයා ද අඹගහපිටි වෙහෙර වැඩ සිටි සද්ධම්මජෝතිපාල ඤාණානන්ද මහාස්ථවිරයන් වහන්සේ ආදි ·අමරපුර නිකායික සංඝයාද සිජ්ඣඹුවේ ත්‍රිපිටකවාගීශ්වරාචාය්‍ය මහානායක ස්ථවිරයන්වහන්සේ ප්‍රධාන සඟකොටසක් හා බටුවන්තුඩාවේ ශ්‍රීදේවරක්ෂිත පඬිතුමා ආදි ගිහි පිරිසක් ද දෙපක්ෂයෙන් පැමිණ දානශාලාවට රැස්වී පෞර්ණිමානතාවධිය සම්බන්ධව වාදකථාව කරණ අතර සද්ධම්ම-ජෝතිපාල ඤාණානන්ද මහාස්ථවිරයන් වහන්සේට පැමිණි කථාචාරයෙක්හිදී කෝට්ටේ ජයවර්ධනපුරයෙහි සිටි භුවනෙකබාහු මහරජාණන් දවස රාමඤ්ඤරට ධම්මචේතිය මහරජතුමා එරට කෙලෙසී තිබුණ ශාසනය ශුද්ධකිරීමට අමාත්‍යයන් සමග ලක්දිවට සංඝයා එවූ නැව්දෙකෙන් එකක් වාතවේගය නිසා පසුවී අවුත් වැලිගම වරායෙන් බැස ජයවර්ධනපුරට ආ ගමනේ ප්‍රමාදය "කල්‍යාණිප්‍රකරණයේ" දක්වාපු "තස්මිං ඛො පන නාගසිඛි-නාගසඞ්ඛරාජභූතෙ සංවච්ඡරෙ...... ..............නගරං සම්පත්තා" යන මෙහි ජේන..............යෝගයන්ගේ විෂමත්වය පෙනීමෙන් අමරපුර සමාගමේ බොහෝ සංඝයා වෙනස්වත් වස් එළඹුනාහුය. නමුත් අඹගහපිටි වෙහෙර සංඝයා සංකරවාදයෙන් වෙන්වූවාහින් පසු මෙරට ව්‍යවහාරකරණ කලියුග වර්ෂයෙන්ම මණ්ඩලකොට ලැබෙන ක්‍රමයට..................වස් එළඹෙත්" යනාදිය දකින්ට ලැබේ.

මේ පොතේ දැක්වෙන පරිදි අත්ථදස්සී ස්වාමීන්වහන්සේ පළමුවෙන් වස්විසීම වෙනස්කෙළේ බු. ව. 2374 දීයයි පෙනේ.

ක්‍රි. ව. 1902 පළවූ ඥාණාදර්ශ සඟරාවේ හවෙනි කොටසෙහි ඩී. ආර්. කන්නන්ගර නමැත්තකු පළකරවූ ලිපියක "ශ්‍රීකල්‍යාණී සාමග්‍රීධර්ම සංඝසභාවේ මහෝපාධ්‍යායධුරන්ධරව බෙන්තර වනවාස මහාවිහාරාධිපතිව වැඩවිසූ සකලවිද්වජ්ජන තිලකතුල්‍ය ධන්‍ය-පුණ්‍ය-ගුණාවාස ශ්‍යාමනිකායාලංකාරභූත ශ්‍රී ලංකාශාසනාම්බර ශිශිරරෝපම දශදිශාභ්‍යන්තරයෙහි පතළාවූ අතිශුභ්‍රතර කීර්ති මාලාවිරාජිත ප්‍රවචනාමහසණ්ඩාකාර අතිතීක්ෂ්ණතර විශිෂ්ට බුද්ධිමත් ශ්‍රද්ධා-ශීල-ශ්‍රැත-ත්‍යාග-ප්‍රඥා-වාග්මාධූර්‍යසෞජන්‍යතාදි නෛකගුණගණාන්විත අතුලලසනීය වචන ඇති බහුශ්‍රැත ශික්ෂාකාමී ගණාචාර්‍ය බෙන්තර අත්ථදස්සී මහාස්ථවිරස්වාමිපාදයන් වහන්සේ" යන්න දක්නාලැබේ.

ඒ ලිපියෙහිම මූන්වහන්සේගේ අපවත්වීම දක්වමින් "ශකවර්ෂ එක්දහස් සත්සිය හැටහයේදී මූන්වහන්සේගේ ආචාර්‍යවූ බෙන්තර අත්ථදස්සී මහාස්ථවිරපාදයන්වහන්සේ ස්වර්ගස්ථවීවදාළේය"යි ලියා තිබේ.

## 22. වලානේ ශ්‍රී සිද්ධාර්ථ මහා ස්වාමිපාදයෝ.

(ක්‍රි. ව. 1811-1868)

පාතදුඹරා තොටමුණට අයත් වලාන නමැති ගමේ විසූ වැදගත් කුලපරම්පරාවක උපන් මූන්වහන්සේගේ උත්පත්තිය සිදුවූයේ ක්‍රි. ව. 1811 මාර්තුමාසයේදීය. එකල වලානේ විහාරාධිපතිව වැඩ විසූ ගිඹඩව මහාස්ථවිරතුමා පින්ලකුණින් යුත් මෙකුමරු දැක පැවිදිකරවීමට සුදුස්සෙකැයි සලකා සත්-හැවිරිදිකල්හි මවුපියන්ගෙන් ඉල්වා තමන්වෙත තවත්වාගෙන සාමණේර බණදහම් ආදිය උගන්වා දොළොස් හැවිරිදි කල්හි (1823 දී) මහඅරුග්ගොඩ ඉන්ද්‍රසාරාරාමයේදී මහෝත්සවයෙන් යුක්තව මෙකුමරු පැවිදිකරවීය. පැවිදිකරවා ටිකකලක් තමන්වහන්සේම ශබ්දශාස්ත්‍රාදිය උගන්වා වැඩිදුර ඉගනීම සඳහා පාතදුඹරේගල්ගොඩ විහාරාධිපතිව වැඩවිසූ නෑදිමාලේ රේවත මහාස්ථවිරතුමන්ට බාරකෙළේය. එහි කලක් විසූපසු උපසම්පදාව ලැබීමට යෝග්‍ය වයස පැමිණියෙන් 1831දී මහනුවර මල්වතුවිහාරයට පැමිණ යථෝක්ත රෙවත මහාස්ථවිරතුමන් උපාධ්‍යාය කරගෙන උපසම්පදාව ලබා සිද්ධාර්ථ නාමයෙන් ප්‍රකට විය.

උපසම්පදාව ලබාගෙන අවුත් ස්වකීයාරාමයෙහි ටිකකලක් වැස එකල ප්‍රබුද්ධ උගතෙක්වසිටි පැල්මඩුල්ලේ විහාරයේ විසූ ගාල්ලේ මේධංකර ශ්‍රීපාදයේ නායක මහා ස්වාමීන් වෙත පැමිණ තවදුරටත් ඉගනීම කෙළේය. ඒ නායකස්ථවිරතුමන් හදිසි ආබාධයකින් අපවත්වූ බැවින් සිද්ධාර්ථභික්ෂුතෙමේ වලානට හැරී අවුත් ටිකකලක් විසීය. ඒ අතරෙදී යථෝක්ත නායකස්ථවිර-තුමන්ගේ ශිෂ්‍යවූ ඉඳුරුවේ සුමංගල මහාස්ථවිරතුමා නායක පදවිය ලබාගෙන පැල්මඩුල්ලේ විහාරයෙහි ඉගැන්වීම පටන්ගත් බැවින් 1836 දී සිද්ධාර්ථභික්ෂුතෙමේ නැවත එහි ගොස් ඉගනීම පටන් ගත්තේය.

ඒ ඉගනීම අවසන්කොට 1838 දී වලානේ විහාරයට හැරී අවුත් යථෝක්ත ප්‍රව්‍රජ්‍යාචාර්යයන් වහන්සේ හා උපාධ්‍යායයන්-වහන්සේ ආශ්‍රය කරමින් ගිහිපැවිදි පිරිසකට ධර්මශාස්ත්‍ර ඉගැන්වීම හා පලාත්වාසීන්ට ධර්මානුශාසනා කරමින් සයවර්ෂයක් පමණ එහි විසීය. ඒ කාලය තුළ එහි පැමිණ උගත් පිරිස අතරෙහි 1. බෙල්ලත්විල බෝධිසමීප විහාරාධිපතිව විසූ උඩුගම්පොල රතනපාල මහාස්ථවිර, 2. බද්දේගම සරණංකර මහාස්ථවිර, 3. වේරහැර සෝභිත මහාස්ථවිර, 4. මාලේවන සෝභිත මහාස්ථවිර, 5. තලන්ගම මහාස්ථවිර, 6. පැල්පල මහාස්ථවිර, 7. ගණේගොඩ මහාස්ථවිර, 8. වැලිකෑමැල්ලේ මහාස්ථවිර, 9. කෝදාගොඩ මහාස්ථවිර යන ස්ථවිරවරුද, දොන් අන්ද්‍රිස් ද සිල්වා බටුවන්තුඩාවේ පඬිතුමා ද වූහ.

මෙසේ බොහෝදෙනාට උගන්වමින් පුස්තකාලයක් පිහිටුවීම සඳහා බොහෝ පොත් ලියවමින් සිටිනාතර රත්මලානේ පදිංචිව විසූ දොන් පුරෝලිස් ලේකම් රාළහාමි ප්‍රධාන දායකමහතුන්ගේ ආරාධනාවෙන් 1849 යේදී දැන් රත්මලානේ පරමධම්මචේතිය පිරිවෙණ යයි ප්‍රකටව තිබෙන ස්ථානයට වැඩමවා වස්වැස එය නිත්‍යවාසය කරගෙන ඉගැන්වීම පටන්ගත්තේය. මේ කාලයේදී කොළඹ පිටකොටුවේ පදිංචිව සිටි ජයසූරිය ආරච්චිගේ තෙඅනිස් පෙරේරා අප්පුහාමිගෙන් ද දොන් පිලිප් ද සිල්වා ඇපා අප්පුහාමි ගෙන් ද මුන්වහන්සේට බොහෝ උපකාර ලැබුණාහ. මේ ස්ථානයෙහි වාසයකරද්දී මුන්වහන්සේගෙන් ඉගනීම කළ ශිෂ්‍යයන් අතුරෙහි පණ්ඩිත ශිරෝමණි හික්කඩුවේ ශ්‍රී සුමංගල නායක මාහිමිතුමා, රත්මලානේ පුරාණ විහාරාධි-පතිව වැඩසිට පසුව විද්‍යාලංකාර පිරිවෙණ ආරම්භකළ පූජ්‍යපාද ධම්මාලෝක මාහිමිතුමා, මහනුවර ප්‍රාචීනපුස්තකාලය බාරවසිටි සූරියගොඩ සෝණුත්තර මහාස්ථවිර, කැලණි විහාරාධිපතිව සිටි

දෙම්පේ බුද්ධරක්ඛිත නායක ස්ථවිර, අටමස්ථානේ නායකව වැඩසිටි සිරිසුමන මහාස්ථවිර, ලබුගම සෝණුත්තර මහාස්ථවිර, හිගුල්වල ජිනරතන මහාස්ථවිර, කොටුවේගොඩ ඤාණානන්ද මහාස්ථවිර, මැදගම රේවත ස්ථවිර ආදීහු ද මොරටුවේ විසූ සිරිදියෙස් ද සිල්වා ගුරුතුමා, වාද්දුවේ විසූ දෙන් පුරෝලිස් සමරසිංහ කවිරත්න වෛද්‍යාචාර්‍ය, බෞද්ධවිවාහ රෙජිස්ට්‍රාර් ධූරය දැරූ දෙන් හර්මානිස් සමරසිංහ කවිරත්න වෛද්‍යාචාර්‍ය ආදීහු ද වෙති.

මූන්වහන්සේ වෙතින් පැවිදිවී ශිෂ්‍යභාවයට පත්ව පසුව ප්‍රකට භාවයට පැමිණි මහාස්ථවිරවරයෝ සතළොස් නමක් ද වූහ. පසුකලක කෝට්ටේ නිකායේ මහානායක ධූරය දැරූ බඳුරලියේ ධීරානන්ද මහාස්ථවිරතුමා ද පානදුරේ ධම්මානන්ද මහාස්ථවිරතුමා ද පසුකලක පරමධම්මචේතියපිරිවෙනේ අධිපති වූ අරුග්ගොඩ සීලානන්ද මහාස්ථවිරතුමා ද ඒ ශිෂ්‍යයන් අතරෙහි වෙති. මෙසේ මහපඬිවරුන්ට ආචාර්‍ය වූ බැවින් "පණ්ඩිතාචාර්‍ය" යන නාමය ලැබීමට අතිශයෙන්ම යොග්‍යවූ මූන්වහන්සේ පනස්හයවසක් ආයුවළඳා බු. ව 2410ගේ නවන්මස අවසැටවක-ලත් ගුරුදින අපවත්වූහ. ඒ අපවත්වීම සම්බන්ධයෙන් ශ්‍රී සුමංගලනායක මාහිමියන් සෑදූ ප්‍රබන්ධය මෙසේයි:-

1. "ශාකෙ නන්ද-ගජාද්‍රි-සාගරසුතෙ කුම්භම් ප්‍රයාතෙ රවෞ
රාත්‍රෞ ගීෂ්පතිවාසරෙ රසතිථෞ මාසස්‍ය පක්ෂෙ පරෙ
ශ්‍රී සෞද්ධෝදනිශාසනාම්බරරවිර් විද්‍යාසරිත් සාගරස්
සිද්ධාර්ථාඛ්‍යයතීශ්වරො ගුණධනඃ ප්‍රාපත්සුරෙන්ද්‍රාලයම්.

2. යස්‍යාස්වාද්‍යකථාරසං සුවිශදං විශෙෂශ්ගුධා තෙප්සිතා
ලාවණ්‍යත හිරණ්‍යගර්භ ඉව යඃ ප්‍රීත්‍යායුජ්ජන්මිතාම්
යො ගොෂ්ඨීෂු පුරස්කෘතඃ ශාන්තිධරෙස් සිද්ධාර්ථනාමා යතිස්
තස්‍යායුඃ රස බාණකෙරිහ ගතං සංවත්සරෛස්සත් මිතම්'

මූන්වහන්සේ මුල්කාලයේ වැඩවිසූ ආරාමය දූන් "වලානේ සිරිසිද්ධාර්ථාරාමය"යි ප්‍රකටව පවතී. මෙකල කෝට්ටේ නිකායේ මහානායක ධූරය දරන කිරුළපණේ ශ්‍රී විමල මහාස්ථවිරතුමා වාසයකරන්නේ මේ විහාරයෙහිය.

මූන්වහන්සේගේ චරිතකථාව සොයාගැනීම සඳහා කීප තැනකට ලියා යවා තිබෙතු අතර 1927 නොවැම්බර් මස පළවූ "විද්‍යාරවින්ද" සඟරාවේ ඒ චරිතය පළකර තිබෙනු දූක බොහෝ කරුණු එයින් උපුටා ගතිමි.

## 23. බුලත්ගම ධම්මාලංකාර-සිරිසුමනතිස්ස මහාස්වාමිපාදයෝ

(ක්‍රි. ව. 1796 - 1891 පමණ)

ගාල්ලේ මිණිවන්ගොඩ පරමානන්ද මහාවිහාරාධිපතිව වැඩ විසූ මූන්වහන්සේ වනාහි අමරපුර නිකායකු වුවත් සියම්-අමරපුර-කල්‍යාණිවංශිකාදි හැම නිකායික මහතෙරවරුන් සමග මිත්‍ර සම්බන්ධයක් ඇතිව විසුවාහු ද එසේම සියම්-බුරුම-කාම්බෝජාදී බෞද්ධ රටවල මහතෙරවරුන්ගෙන් හා මහරජවරුන්ගෙන් ගෞරව ලැබූවාවූ ද උතුමෙකි. මූන්වහන්සේගේ ජන්ම භූමිය මධ්‍යම පළාතේ අලුත්නුවරට නුදුරු උඩබුලත්ගමය. කුලපරම්පරාව වනාහි කෙහෙල්ගමුවේ රදලපෙරුවට අයත්වූ ද දළදා මාළිගාවේ දියවඩන නිලය දැරූවාවූ ද පෙළපතකි.

මූන්වහන්සේ කුඩාකාලයේදී පළමුවෙන් "අලුත්නුවර සිල්වත් තැන" නමින් ප්‍රකටව සිට පසුව පාතරටට අවුත් උපසම්පදාව ලබාගෙන "අලුත්නුවර පඤ්ඤාතිස්ස මහාස්ථවිර" යයි ප්‍රකට වූ ස්ථවිරතුමන්ගෙන් උඩරටදී අකුරු හා චිත්‍රශිල්පය ඉගෙන ගත්තේය. පසුකලක ගම්පල "නියම්ගම්පාය" විහාරයේ අධිපතිව වැඩවිසූ කිරින්දේ මහාස්ථවිර තුමන් සමීපයෙහි පැවිදි විය.

උඩ නමදක්වූ "පඤ්ඤාතිස්ස" මහාස්ථවිරතුමා වනාහි අලුත්නුවර පෙදෙසේ මොහොට්ටාල තනතුර ලැබූ උසස් පෙළපතක උපන්නෙකි. එතුමා "මඩගල්ල" නමින් ප්‍රකටව තිබුණ වනවාසයෙහි විසූ "වගියාකුලමේ බුද්ධරක්ඛිත" ස්වාමීන්වහන්සේ වෙත පැවිදි විය. උඩරට සිංහල රාජබලය පවත්නා කාලයේදීම පාතරටට පැමිණි මූන්වහන්සේ ගාල්ලේ මිණිවන්ගොඩ පරමානන්දවිහාරය පිහිටි තැන නැවතී සිටගෙන ඒ ස්ථානය දියුණු කළහ. මේ කාලයේදී කපුගම ධම්මක්ඛන්ධ මහාස්ථවිර තුමා බුරුමරටට ගොස් උපසම්පදාව ලබාගෙන ඇවිත් දඩල්ලේ වාලුකාරාමයේ මහාමංගල නම් සීමාව බැන්දවීය. පිරිසිදු උපසම්පදාව ලබනු කැමති පඤ්ඤාතිස්ස හිමිතුමා දඩල්ලට පැමිණ බෝපාගොඩ නායකහිමියන් උපාධ්‍යාය කරගෙන එකී සීමාවේදී උපසම්පදාව ලැබීය. උන්වහන්සේගේ පාතරටට පැමිණීම ක්‍රි. ව. 1812 ට පෙර සිදුවීයයි කියත්.

බුලත්ගම සාමණේරතුමා ද පරණ ඇඳිනීම නිසා අලුත්නුවර ස්වාමීන්වහන්සේ වසන තැනට එන්ට අදහස් කොට 1825 පමණේදී ගාල්ලට පැමිණ පරමානන්දවිහාරයෙහි නැවතී පඤ්ඤාතිස්ස හිමිතුමන්ගේ ප්‍රධාන ශිෂ්‍යා වී දඩල්ලේ එම සීමා-

වේදීම අඹගහපිටියේ ඤාණවිමලතිස්ස නායකමාහිමියන්වහන්සේ උපාධ්‍යාය කොටගෙන උපසම්පදාව ලැබීය. (1) බෝගහපිටියේ සරණපාල (2) ලංකාගොඩ ධීරානන්ද (3) අලුත්නුවර පඤ්ඤාතිස්ස යන ස්ථවිර තුන්නම මෙතුමාට කම්මාවාචීවූහයි අනුමානයෙන් සිතනු ලැබේ.

ක්‍රි. ව. 1834 රේ දී මුන්වහන්සේ ස්වකීයාචාර්‍ය අලුත්නුවර මහාස්වාමීන් සමග දඹදිව සිද්ධස්ථාන වන්දනාවට ගොස් වන්දනා කිරීමෙන් පසු අවුරුදු දෙකක් පමණ කල්කටාවේ නැවතී හින්දු සංස්කෘත භාෂාවත් ඉගෙන ගත්තේය. ඒ ගමනේදී සියම්-බුරුම-කාම්බෝජ යන රටවලට ද පැමිණ ඒ රටවල සංඝ රාජාදීන් හා රජ ඇමති ආදීන් සමග ඇඳිනීම ඇතිකරගෙන ආචාර්‍යයන් වහන්සේ සමගම පෙරළා සිය රටට වැඩියේ ය. නැවත 1837 දී ආචාර්‍යවරයා සමග බුරුමරටට යන්ට සූදානම්වූ අවස්ථාවේදී බුලත්ගම මහාස්වාමීන්ට වැළඳුනු ආබාධයක් නිසා ඒ ගමන නොගියේය. පඤ්ඤාතිස්ස මහාස්ථවිරතුමා ඒ ගමනේ බුරුමරටට ගොස් එහිදී අපවත්විය. අපවත්වීම සම්බන්ධයෙන් බුරුම සාසනවංසයෙහි මෙසේ කියවේ:-

“තස්ස රඤ්ඤො කාලෙ කලියුගෙ නවනවුතාධිකෙ වස්සසතෙ සහස්සෙ ච සම්පත්තෙ සීහළදීපතො පඤ්ඤාතිස්සො නාම ථෙරො සද්ධිං සුනන්දෙන නාම භික්ඛුනා ඉන්දසාරෙන නාම සාමණෙරෙන එකෙන උපාසකෙන එකෙන දාරකෙන ච අමරපුරං නාම නගරං සම්පත්තො...... අපරභාගෙ කලියුගෙ විවස්සාධිකෙ විසතෙ සහස්සෙ ච සම්පත්තෙ පඤ්ඤාතිස්සත්ථෙරො ජරරොගෙන අභිභූතත්තා සංඛාර ධම්මානං සභාවම්පනතිවත්තිතත්තා කාලමකාසි .........අථ මහාරාජා සරීරනික්ඛපනකිච්චං බහූහි සාධුකීළනසභා-ගෙහි අකාසි” (=ඒ-සිරිපවරාදිත්‍යලොකාධිපති විජය-මහරජුගේ කාලයේ දී බු. කලියුගයෙන් 1199 ය පැමිණි කල ලක්දිවින් පඤ්ඤාතිස්ස නම් ස්ථවිරනමක් සුනන්ද නම් භික්ෂුවක් ද ඉන්දසාර නම් සාමණේරනමක් ද එක් උපාසකයෙක් ද එක් ළමයෙක් ද කැටිව අමරපුර නගරයට පැමිණියේ ය. පසුව කලියුග 1202 ක්දී ඒ පඤ්ඤාතිස්ස ස්ථවිරතුමා උණරෝගයෙන් පෙළී සංස්කාර ස්වභාවය නොඉක්මවූ බැවින් කළුරිය කෙළේය. ඉක්බිති මහ රජතුමා නොයෙක් පූජෝත්සවයන් පවත්වා ආදාහන කළේය.) මේ කියවෙන වර්ෂය ක්‍රිස්තු වර්ෂයෙන් 1837 ය. අපවත් වී තිබෙන්නේ ඉන් අවුරුදු තුනකට පසු ක්‍රි. ව. 1840 දීය.

ක්‍රි. ව. 1886 යේදී සියමේ චූලාලංකාර මහරජතුමාගේ ආරාධනාවෙන් එහි වැඩමකළ බුලත්ගම මාහිමියෝ රජමාළිගාව අසල විහාරයක වස් එළඹ සාරමසක් මහරජුගේ [illegible]

ලැබූහ. ඒ ගමනේදී මූත්වහන්සේගේ දීප්තිමත් ශිෂ්‍යයෙක් වූ කෝදාගොඩ පඤ්ඤාශෙඛර මහසථවිරතුමා ද මූත්වහන්සේ සමග ගියේය. වස් අවසානයේදී රජතුමා සියම් පටපිළියෙන් මැසූ සිවුරු සහිත අටපිරිකර ද රන්පිළිම, රන්කරඬු ආදිය ද එතුමන්ට පිදීය. බුරුම රට තිබෝරජතුමානෙන් ද එවැනි පූජා වස්තු ලැබී තිබෙන් එයින් සමහරක් තවමත් පරමානන්ද විහාරයේදී දක්ක හැක. සියම් රටට වැඩමවන්ට පෙරදීම 1582 දී චූලාලංකාර රජතුමා "අඩසාලිනී පදයෝජනා"දී පොත් ඇතුළත් පෙට්ටි දහයක් මෙතුමන් වෙත එවීය.

ඒ පොත් මෙහාට පැමිණිවිට ගාලුවරායේ සිට පෙලහරකින් වැඩමවාගෙන යාමේදී අවසර නැතිව පල්ලියක් අසළින් ගේවිසි ගසාගෙන යතලදැයි කියා බුලත්ගම මාහිමියන්ට විරුද්ධව නඩුවක් පවරන ලදින් එකල ගාල්ලේ සිටි "මේෂන්" නඩුකාරතුමා එතුමාට රු: පණසක දඩයක් ගැසීය. ඒ සඳහා ගත් ඇපෑලේදී දඬුවම අවලංගුකොට උත්වහන්සේගෙන් සාමව අයදිනයේ පොලිස් නඩුකාරයාට නියමකර තිබේ. බුලත්ගම මාහිමිතුමා මේ කාරණය සියම් මහරජතුමාට දන්වා යැවීය. මහරජතුමා වික්ටෝරියා අධිරාජිනියට මේ කාරණය දන්වා යවනලදින් ඒ අධිරාජිය විසින් බුලත්ගම මාහිමියන්ට කැමති විටක කැමති මගක පෙලහරක් ගෙන යාමට හැකිවනයේ බලපත්‍රයක් එවන ලදී. ක්‍රි. ව. 1848දී "වෛකවුන්ට් ටොරින්ටන්" ආණ්ඩුකාරතුමා භික්ෂූන්ගෙන් ඇහබද්ද අයකිරීමට ආඥකලවිට එයට විරුඬව කියා එය අස්කෙරෙව්වේ බුලත්ගම මාහිමිතුමාය.

1880 දී කර්නල් ඔල්කට් තුමා හා බ්ලවැස්කි මැතිණිය ප්‍රමුඛවෙන් ලක්දිවට පැමිණි අවසථාවේදී බුලත්ගම මාහිමියෝ ගාල්ලේ දෙවන්ආරච්චි මහතාගේ විශාලගෙයි. ඒ පිරිසට තවාතැන් දෙවා පිරිස පිළිගැනීමට මහසභාවක් රැස්කරවීය. සිප්කඩුවේ ශ්‍රී සුමංගල-දොඩන්දූවේ පියරතනතිස්සාදි නායක මාහිමිවරුන් හා මොහොට්ටිවත්තේ ගුණානන්ද සවාමින්වහන්සේ ආදි එකල ප්‍රකටව සිටි ගිහි පැවිදි උතුමන්ගෙන් යුත් ඒ සභාවේ දී ඔල්කට් මහතා පන්සිල් ගෙන බෞඩයෙක් විය. මේ පන්සිල්දීම කෙළේ බුලත්ගම මාහිමියෝ යයි එතුමන්ගේ ශිෂ්‍යානුශිෂ්‍යයෝ කියත්. මා විසින් සම්පාදිත වූ කල්‍යාණී-ශාසනවංශයෙහි දක්වෙන්නේ, පියරතනතිස්ස මාහිමිතුමන් ගෙන් පන්සිල් ගත්බවය. රාමඤ්ඤනිකායිකයෝ එය අක්මීමන ධම්මාරාම නම් තෙරකෙනෙකුන්ගෙන් යයි කියත්. ඔල්කට් මහතා අමෙරිකාවේ සිටියදීම පියරතනතිස්ස මාහිමියන්ට එවූ

ලිපි රාශියක් දැනුත් ශෛලබිම්බාරාමයෙහි තිබේ. එසේම මොහොට්ටිවත්තේ හිමිතුමන්ගේ පානදුරාවාද පොත කියවීමෙන් ඒ මහතා පෙරදිගට ආබැවින් ඒ හිමිතුමන් හා ලියුම් ගනුදෙනු කළාට සැකනැත. බුලත්ගම මාහිමියන් ආදී තවත් උතුමන්ට ද ලියුම් එවන්ට ඇත මට වඩා වැඩිතර මහතෙරවරුන්ගෙන් අසන්ට ලැබුණ පරිදි පන්සිල්දීම පියරතන මාහිමියන් විසින් කරනලද්දේ එහි ලිව්වෙමි. බුලත්ගම මාහිමියන් පියරතන මහාසවාමින්ට වඩා වැඩිතරයකු බැවින් උන්වහන්සේ පන්සිල් දීම සිද්ධනොවිය හැක්කක් නොවේ. නමුත් එවැනි සම්බන්ධයක් නැති රාමඤ්ඤනිකායික තෙරනමකගෙන් එය සිද්ධවීයයි පිළි-ගැනීමට අවකාශයක් නැත.

සිංහල බෞද්ධයන්ට අයත් මුද්‍රායන්ත්‍රාලයක් පළමුකොට පිහිටුවන ලද්දේ බුලත්ගම මාහිමියන් විසිනි. ඒ සම්බන්ධයෙන් 1935 ජුනි මස පළ වූ ශ්‍රද්ධාප්‍රකාශ සඟරාවේ ලිපියක: "ලක්දිව ඇතිවූ ආදිම සිංහල මුද්‍රණාලයත් සිංහල ප්‍රවෘත්තිපත්‍රයත් පවත්ගන්නා ලද්දේ බුලත්ගම ධම්මාලංකාර සිරිසුමන නම් වූ මහාසථවිරයකෙනෙකුන් විසින් බැව් ප්‍රකටය. ක්‍රි. ව. 1863 දී උන්වහන්සේ පිහිටුවූ මුද්‍රණාලය ලංකෝපකාරය නම් විය. 1862දී පටන්ගත් ප්‍රවෘත්තිපත්‍රය ලංකාලෝකය නම් විය" යන්න පෙනේ. බද්දේගමවාදය පානදුරාවාදය ආදි වාදවලදී ඉදිරිපත්ව පෙනිසිට මුන්වහන්සේ මිථ්‍යාවාදීන්ට උත්තර දීම සඳහා නොයෙක් පත්‍රිකාදිය සවකීය යන්ත්‍රාලයෙහි මුද්‍රණය කරවූහ.

ලක්දිව රාමඤ්ඤනිකායේ ආදි කතෘභූත අඹගහවත්තේ (ඉන්ද සභවරඤාණසාමි) සරණංකර සථවිරතුමා පළමුවෙන් බෙන්තර අත්ථදස්සී මහාසථවිරතුමන්ගේ ශිෂ්‍යයෙක්ව සිට පසුව සියම් නිකායෙන් අස්වී ගාල්ලට අවුත් බුලත්ගම මාහිමියන්ගේ ශිෂ්‍යභාවයට පත්විය. උන්වහන්සේ බුරුමයට වැඩියේ බුලත්ගම මාහිමියන්ගේ ලියුම් රැගෙන එතුමන්ගේ ශිෂ්‍යයකු ලෙසය.

බුලත්ගම මහාසවාමීන්වහන්සේ උඩරට උපන් ගොවිවංශික-යකුවූ බැවිනුත් අමරපුර නිකායේ පැවිදි උපසම්පදාව ලබාසිටි බැවිනුත් උඩපාත දෙරටේ හැමනිකායිකයන් හා මිත්‍රව විසූහ. මුන්වහන්සේ හික්කඩුවේ ශ්‍රීසුමංගල මාහිමියන්වහන්සේට නොයෙක් අයුරින් හිතවත්ව ක්‍රියා කෙළේය. උන්වහන්සේගේ එකාංශපාරුපනය හැරදැමීමට හේතුවූයේත් බුලත්ගම මාහිමි-යන්ගේත් උත්සාහයයි අසන්ට ලැබේ. ලක්දිව පවත්නා නිකාය භේදය නැතිකොට එක්නිකායක් කිරීමට නොහැකිනම් සියලු දෙනම දෙවුරවසා සිවුර පෙරවන්ට සැලැස්සීමට උන්වහන්සේ

මහත් උත්සාහ ගත්හ. ඒ සඳහා සියමෙන් ධම්මයුත්තික නිකායේ සඟපිරිසක් ගෙන්වා ගැනීම සඳහා එහි වජිරඤාණ මහරජතුමන් වෙත නොයෙක්විට ලියුම් යවා සඟපිරිසක් එවීමට රජතුමන් කැමතිකරවා ගත්හ. සියම් මහරජු විසින් අනොමසිරි මහතෙරුන් වහන්සේ ප්‍රමුඛ මහතෙරුන් දශනමක් තමාගේම නැවකින් ලක්දිවට එවනලද නමුත් මෙහි සංඝයා අතර ඒ ගැන නොකැමැත්තක් ඇතිවූයෙන් ඒ සියම් භික්ෂුපිරිස සිද්ධස්ථාන වන්දනාකරගෙන සියරටට හැරී ගියේය.

ඉද්දමල්ගොඩ දිශාපතිතුමන් විසින් පැල්මඩුල්ලේදී කරවූ ත්‍රිපිටකශුද්ධිය සඳහා උපදෙස් දෙමින් මූලිකව ක්‍රියාකළෝද බුලත්ගම මාහිමියෝය.

1897 දී චූලාලංකාර සියම් මහරජතුමා "මහාචක්‍රී" නම් නැවෙන් යුරෝපය බලායන්නේ ඒ වර්ෂයේ අප්‍රේල් මස 17 වෙනිදා ගාල්ලට පැමිණ බුලත්ගම මාහිමියන් විසූ ආරාමය හා උන්වහන්සේගේ ශිෂ්‍යයන් දකිනු කැමතිව සිය පිරිවර සමග මිණිවන්ගොඩ පරමානන්ද විහාරයට ගියේය. එකල්හි ආරාමාධිපතිව වැඩ විසුවේ උන්වහන්සේගේ ප්‍රධාන ශිෂ්‍යවූ සද්ධම්මාලංකාර කවිධජ විනයාචරිය කොග්ගලසංඝතිස්ස මහාස්වාමිතුමාය. මේ මහරජුගේ පැමිණීම සිහිපත්වීම සඳහා ඒ විහාරස්ථානයේ දායක මහතුන් විසින් මහරජුගේ නමින් අතිවිශාල ධර්මශාලාවක් මහත්ධනව්‍යයකින් ගොඩනංවන ලදී.

මෙසේ අනල්ප ලෝකශාසන සංග්‍රහකළ බුලත්ගම මාහිමියෝ ක්‍රි. ව. 1891 කේ ජූනිමාසයේ දී රෝගාතුරවී එම වර්ෂයේ අගෝස්තු 24 වෙනිදා අපවත්වූහ. ඒ අවසන් කාලයේදී ගාල්ලේ ඇඩ්මන්ඩ් රෝලන්ඩ් ජයතිලක ගුණරත්න වාසල මුදලිතුමා ප්‍රධාන දායකයා ලෙස උන්වහන්සේට උපස්ථාන කෙළේය.

මූන්වහන්සේගේ ප්‍රධාන ශිෂ්‍යවූ කොග්ගල සංඝතිස්ස මහා ස්වාමීන් වහන්සේ ද සියම් මහරජතුමන් ආදි ගිහි උතුමන්ගේත් මහාසංඝයා වහන්සේගේත් ගරුබුහුමන් ලැබූ ව්‍යක්ත පඬිවරයෙක් වූහ. දෙවෙනි ශිෂ්‍යයාවූ කෝදාගොඩ පඤ්ඤාසේඛර මහාස්ථවිර තුමා සබරගමු පලාතේ අමරපුර නිකායිකයන්ගේ සංඝනායක ධුරය ඉසිලීය. 1882 දී සියම් මහරජු විසින් ලාංකික භික්ෂූන්ගේ ප්‍රයෝජනය සඳහා මෙරටට එවූ' සියම් අකුරෙන් ලියූ පාළි පොත් අතරෙහි වූ අට්ඨසාලිනීඅත්ථයෝජනා නැමැති ග්‍රන්ථය සිංහල අකුරෙන් මුද්‍රණය සඳහා පිළියෙළ කර දුන්නේ මූන්වහන්සේය. ඒ කාලයේදී මෙතුමා කතළුවේ "රත්මැල්ලේ" විහාරස්ථානයෙහි

විසිය. ඒ පොත මුද්‍රිතවූයේ බු. ව. 2433 තේදී කතළුවේ පිහිටි ලංකොපකාර යන්ත්‍රාලයෙහිය. ඉන් අවුරුදු තුනකට පසු උන් වහන්සේ විසින්ම පිළියෙළකොට දෙන ලදින් සම්මෝහවිනෝදනී අත්ථයොජනාව ඒ යන්ත්‍රාලයෙහිම මුද්‍රිතවිය. එහි රෝයල් පිටු 253 කි. පළමු කී පොතේ රෝයල් පිටු 275 කි.

(මේ චරිතය සම්පාදනය සඳහා ගාල්ලේ පරමානන්ද විහාරවාසී වූ ද බුලත්ගම මාහිමියන්ගේ අනුශිෂ්‍යයකුවූ ද පණ්ඩිත වතුගෙදර අමරසීහ සථවිරතුමන්ගෙන් බොහෝ උපකාර ලැබුණ බව කෘතඥතාපූර්වකව සඳහන් කරමි.)

## 24. මිරිස්සේ ධම්මානන්ද කල්‍යාණිවංශික මහානායක සථවිරතුමා.

(ක්‍රි. ව. 1799-1876.)

අම්බලම්ගොඩ පොල්වත්තේ අග්ගාරාමාධිපතිව වැඩවිසූ මූන්වහන්සේ වනාහි එකල පාතරට විසූ ශාස්ත්‍රාගමධාරී පඬිවරුන් සවල්පදෙනාගෙන් එක්තමක්විය. සරණංකර සංඝරාජ මාහිමිතුමන්ගේ ශිෂ්‍ය වීරගුළේ ගුරුතුමාගෙන් ශාස්ත්‍රාද්‍යග්‍රහණය කළ මූන්වහන්සේ බු. ව. 2395 දී කල්‍යාණිවංශික සංඝනෙතෘපදවියට පත්වූහ.

මූන්වහන්සේගේ නිත්‍යවාසස්ථානයවූ අම්බලම්ගොඩ පොල්වත්තේ අග්ගාරාමය එකල නොයෙක් පෙදෙස්වලින් පැමිණි විද්‍යාර්ථි ගිහි පැවිද්දන්ගෙන් පිරුණු විද්‍යාස්ථානයක් විය. මූන්වහන්සේගේ ඇවෑමෙන් පිළිවෙළින් මේ නිකාය පාලනය කළ සංඝපිතෘවරයෝවූ උඩුගල්පිටියේ සිරිසුමනතිස්ස-දොඩන්දූවේ පියරතන තිස්ස යන මහාස්වාමිවරයෝ ද මේ මිරිස්සේ මාහිමියන්ගෙන් ශාස්ත්‍රාගම උගත් ශිෂ්‍යයෝ වූහ. ප්‍රව්‍රජ්‍යාවෙන් කොග්ගල මාහිමියන්ගේ ශිෂ්‍යවූ මේ නම් සඳහන් කළ මහාස්වාමිදෙනම නිකාය පාලනය පිළිබඳ සියලු ක්‍රියාවකදීම් මිරිස්සේ මාහිමියන්වහන්සේට උපස්තම්භක වූහ.

අවුරුදු විසිදෙකක් කල් පැවති මූන්වහන්සේගේ නිකාය පාලන කාලය තුළ වැදගත් කරුණු රාශියක් සිදුවිය. ඉන් එකක් නම් බු. ව. 2405 හේදී පුවක්දණ්ඩාවේ පඤ්ඤානන්ද මහා සථවිරතුමන් ප්‍රමුඛ පිරිසක් රාමඤ්ඤරටට යැවීමයි. අනික නම් ඒ පිරිස එහි ගොස් රාමඤ්ඤඋපසම්පදාව ලබාගෙන ආ පසු අඹගහවත්තේ ඉන්දසභවරඤාණසාමි මහාස්වාමීන් ප්‍රමුඛ පිරිසක්ද

පුවක්දණ්ඩාවේ මහාස්වාමීන් ප්‍රමුඛ පිරිසක්ද පැරැලියේ ජිනරතන මහාස්ථවිරතුමන් ප්‍රමුඛ මාතරනිකායේ සිටි 16 නමක්ද මිරිස්සේ නායක මාහිමියන් උපාධ්‍යාය කොට දල්හිකම් ලබා උන්වහන්සේගේ නිකායට එක්වීමයි. මෙය සිද්ධවූයේ දෙඩන්දූවේ ශෛලබිම්බාරාමයතන උදකුක්ඛේපසීමාවේදීය.

ඒ සමගියට පත් අවස්ථාවේදී ලියූ පොරොන්දුපත්‍රයේ අත්සන් තැබූවෝ නම් 1. කොග්ගල පඤ්චදූපාරාමවාසී අරියවංසපාල කතලුවේ ධම්මරතන, 2. සිප්කඩුවේ ජිනනන්දාරාමවාසී අලුත්වල සරණංකරතිස්ස, 3. පැරැලියේ පද්මගබ්භාරාමවාසී ජිනරතන, 4. කෝට්ටගොඩ සුදස්සනාරාමාධිවාසී ධම්මානන්ද, 5. වැරැල්ලානේ නෙළුම්විල විහාරවාසී ගාල්ලේ ශ්‍රී සුමංගල, 6. අඹගහවත්තේ ඉන්දාසභවරඤාණසාමි, 7. පුවක්දණ්ඩාවේ කල්‍යාණිවංස පඤ්ඤානන්ද යන මහාස්වාමිවරුය. මෙහි ගාල්ලේ ශ්‍රීසුමංගලයයි පෙනෙන්නේ පසු කලක "වැලිගම ශ්‍රී සුමංගල" නාමයෙන් ප්‍රකටවූ නායක මහා ස්වාමීන්වහන්සේගේ නාමයයි. උන්වහන්සේ වැලිගම උපන් නමුත් කුඩාකාලයේදී ගාල්ලේ නෑගෙදරක ඇතිදැඩිවූ බැවින් ඒ කාලයේදී "ගාල්ලේ සුමංගල" යයි නම ව්‍යවහාර කර තිබේ.

**මිරිස්සේ මාහිමියාණන්ගේ ස්වර්ගාරෝහණය.**

මෙසේ මහත් ශිෂ්‍යසමූහයකට ධර්මශාස්ත්‍රප්‍රදානයෙන් හා නිකායාභිවෘද්ධිය පිළිබඳ නානාකෘත්‍යයන්හි නියුක්තවීමෙන් මහත් ශාසනාභිවෘද්ධියක් කළ ශ්‍රේෂ්ඨ පණ්ඩිතරත්නයක්වූ මිරිස්සේ මහාස්වාමීන්වහන්සේ 78 වසක් ආයුශ්‍රීවිඳිනයකොට ශ්‍රී බුද්ධ වර්ෂ 2420 ක්වූ ඇසළමස පුරපෑළවියලත් ගුරුදින පෙරවරුවේදී තමන්වහන්සේගේ නිත්‍යවාසස්ථානයවූ අම්බලම්ගොඩ පොල්වත්තේ අග්ගාරාමයේදී සමෘතිසම්ප්‍රජන්‍යයෙන් යුක්තව දිවඞ්ගතවූහ. මූන්වහන්සේගේ ආදාහනෝත්සවය අතිගම්භීරාකාරයෙන් පැවැත්වූ සැටි ක්‍රි: ව: 1876 දී පළවූ "ලක්රිවිකිරණ" ආදී පත්‍රවල පළව තිබේ. එකල අම්බලම්ගොඩ ජනප්‍රධානයාව විසූ "රොබට් ලුවිස් ගුණවර්ධන" මුදලිමැතිතුමා ක්‍රිස්තියානිකයෙක්වූ නමුත් මේ නායක මහාස්වාමීන්වහන්සේට ස්වකීයාචාර්යවරයෙකුට මෙන් බොහෝ ගරුබුහුමන් පවත්වමින් විසූවෙකි. මූන්වහන්සේගේ ආදාහන කෘත්‍යය සම්බන්ධ කටයුතුවලදී මේ මුදලිමැතිතුමා ඉදිරිපත්ව අග්ගාරාමයේ සිට අම්බලම්ගොඩ සුනන්දාරාම විහාරස්ථානය දක්වා සැතැප්මක් පමණ දික්වූ මාර්ගය මුළුල්ල තොරන් බැඳීම වියන් ඇදීම සුදුවැලි ඇතිරීම ආදියෙන් අත්‍යලංකාරයෙන් සරසවා සුනන්දාරාමාසන්න ආදාහනභූමියෙහි

සත්මහල්තොරන් සතර මැද විශාලදරසැයක් කරවිය. විසිතුරු රන්සිවිගෙයක තැබූ මෘත දේහය ආශ්චර්‍යවත් මහපුදපෙළහරින් ගෙනගොස් අතිවිශාල ජන සන්නිපාතය මධ්‍යයෙහිදී ආදාහන කරනලද්දේය. ඒ සම්බන්ධයෙන් 1876 යේ සැප්තැම්බර් 12 වෙනිදා “ලක්රිවිකිරණ” පත්‍රයේ පළවූ වාර්තාවෙන් උන්වහන්සේගේ බාල කාලය පිළිබඳ ප්‍රවෘත්ති හෙළිවෙන බැවින් ඒ ලිපියේ කොටස් උපුටා දක්වමි:-

“ප්‍රවරතර නෛකශ්‍රීන් විරාජමානවූ අම්බලම්ගොඩ පොල්වත්තේ අග්‍රාරාමාධිපති ලජ්ජී පෙසල ශික්ෂාකාමී ධර්මවිනයධර ආචාර්‍ය සිරිමුනිවරවංසපාල ධම්මානන්ද ගණනායක මහාස්ථවිර ස්වාමිපාදයන්වහන්සේ ශ්‍රීබුද්ධවර්ෂයෙන් 2342 ක්වූ පොසොන්මස පුර දසවක් ලත් සොම්දින දිවාභාගයෙහි මාතර දිස්ත්‍රික්කේ මිරිස්ස යන ගමේදී උපන්නේය. මෙම ස්ථවිරයන් වහන්සේ ඉපද එකොළොස් වර්ෂයක් ගතඋනායින් පසු නොහොත් බුද්ධ වර්ෂයෙන් 2353 ක්වූ බුද්ධවර්ෂයෙහි ආචාර්‍ය කතළුවේ ගුණරතන තිස්ස මහාස්ථවිර ස්වාමිපාදයන් වහන්සේ සමග මීට අවුරුදු 66 කට ප්‍රථම දඹදිව රාමඤ්ඤදේශයට පැමිණ එහි එකාදසවිපත්තියෙන් විනිර්මුක්තව ත්‍රිවිධසම්පත්තියෙන් යුක්තකොට සම්මතකරනලද කල්‍යාණිසීමාවෙහිදී ගරහ-පරූපවාදවිරහිත මහාවිහාරපරම්පරාගත පිරිසිදු උපසම්පදාව ලබාගෙන පසුව ලක්දිවට පැමිණ සද්ධාවන්ත කුලපුත්‍රයන්ට පැවිදි උපසම්පදා දෙමින් යථාශක්තීන් ශාසනාභිවෘද්ධි කරමින් වැඩසිටි පරලෝකප්‍රාප්තවෙත්ව යෙදුනු බටපොළේ කල්‍යාණතිස්ස මහාස්ථවිරයන්වහන්සේ ආශ්‍රයකොට උන්වහන්සේ විසින් දෙනලද අවවාද-අනුශාසනා අසමින් ශාසනයෙහි පිහිටි ප්‍රසන්න සිත් ඇතිව සද්ධාපෙරදූරිව යථොක්ත බටපොළේ කල්‍යාණතිස්ස මහාස්ථවිරයන් වහන්සේම ආචාර්‍ය කොට ප්‍රව්‍රජ්‍යුපසම්පදාව ලබා ප්‍රධාන ශිෂ්‍යත්වයෙහි පිහිටා වැඩසිටි-යේය:”

“මෙම ස්ථවිරයන්වහන්සේ වනාහි උඩපාත දෙරට ප්‍රකටවම විසූ ආචාර්‍ය වීරගුලේ ගුරුතුමන් ආශ්‍රයකරමින් පසුව නෛරුක්තිකාදී ශබ්දශාස්ත්‍ර ඉගෙන ධර්මවිනයධරකමින් සහ ලජ්ජීපෙසල-ශික්ෂාකාමීභාවයෙන් ද නොඅඩුව ප්‍රසිද්ධ ස්ථවිරකෙනෙක්ව වසනකල ආචාර්‍ය කතළුවේ ගුණරතනතිස්ස මහාස්ථවිරයන්වහන්සේගේ නිකායෙහි භික්ෂුසංඝයාවහන්සේ තමන් නිකායෙහි සංඝස්ථවිර භාවයට ව්‍යවස්ථාකොට පත්කරගත්තේය මෙසේ සංඝනායක ස්ථවිරභාවයෙන් වැඩසිටි මූන්වහන්සේ ග්‍රහස්ථ ප්‍රව්‍රජිත බොහෝ දෙනාහට ශාස්ත්‍රාගම පුහුණු කරවමින් ලොකශාසනාභිවෘද්ධිය

කරමින් 78 ක් පරමායු වළඳා ශ්‍රී බුඩවරුෂයෙන් 2420 ක්වූ ඇසළ මස පුර පැලවිය ලත් ගුරුදින දහවල් ප්‍රථමයාමයේදි තමන් වහන්සේ ආශ්‍රයකළ ගිහිපැවිදි බොහෝදෙනාගේ මනොසනතාපය කිරීමෙන් තමන්වහන්සේගේ නිත්‍යවාසය වූ පොල්වත්තේ අගාරාම විහාරයෙහිදී පරලොකප්‍රාප්තවෙන්ට යෙදුනාය.'' (මෙහි අක්ෂර වින්‍යාසාදිය පෙර සැටියෙන්ම තිබෙන්ට හැරිබව සැලකිය යුතු.)

**හංසාවතියට පැවිදි පිරිසක් යැවීම.**

මිරිස්සේ මාහිමියන්ගේ නිකායපාලනය පවත්නා කාලයේදී රාමඤ්ඤරට වසන සවංශික භික්ෂූන්වහන්සේ හා සම්බන්ධකම් ඇතිකරගැනීමට මේ නිකායිකයන්ට ඕනෑවිය. දෙඩන්දූව ශෛලබිම්බාරාමයෙහි විසූ උඩුගල්පිටියේ සිරිසුමනතිස්ස, දෙඩන්දූවේ පියරතනතිස්ස යන මහාසවාමීදෙදෙන ඒ සඳහා බොහෝ උත්සාහවත් වූහ. බු ව. 2405 දී මේ මහාසවාමවරුන් විසින් පැවිදි 18 නමකගෙන් යුත් පිරිසක් එකල රත්ගුත් නුවර විසූ රාජපූජිත මහාසවාමිවරයා වූ සඩම්මාභිවංසතෙරුන් වෙත සන්දෙශයක් දී යවනලදී. ඒ පිරිසේ ප්‍රධානයා වූයේ පුවක්දණ්ඩාවේ පඤ්ඤානන්ද සථවිරතුමායි. ඊට වැඩිමහලු සොභිත නම් සථවිරනමක් ද ඒ පිරිසෙහි විය. මේ පිරිස අත හංසාවතියට යැවූ පාලිසන්දෙශයෙන් නොයෙක් විස්තර දතහැකි බැවින් ඒ සන්දෙශයේ ප්‍රයෝජනවත් කොටස්වල සිංහලානුවාදය මෙහි දක්වනු ලැබේ. (සන්දෙශය ලියනලද්දේ පියරතනතිස්ස මාහිමියන් විසිනි.)

**සන්දෙශානුවාදය:-**

''සකල ලොකවාසීන් විසින් වැන්දයුතු සජ්ඣෙදනතධාතවාදී නොයෙක් ශාරීරිකධාතූන් පිහිටුවා කළ ධාතුගර්භයක් හා සමානවූ සජ්රතනායන් උපදනා ආකරයන්ගෙන් ගැවසීගත් ලංකාවීපයෙහි රුහුණුජනපදය තුළ ප්‍රාකාරගොපුරාදියෙන් අලංකාරවූ ගාලූනගර යට වයඹදෙසින් අඩයොදුනක් දුර පිහිටි සිංහල භාෂාවෙන් ''දෙඩන්දූව'' යයි නම් ඇති නියම්ගමෙහි ශාරීරිකාදීත්‍රිවිධචෛත්‍ය-යෙන් අලඞ්කෘතවූ ශෛලබිම්බවිහාර නම් ප්‍රකට විහාරයක් බබලයි.

''හංසාවතී නුවර පරිශුඬ කල්‍යාණීසීමාවෙහිදී උපසම්පදාව ලබා සිංහලවීපයට පැමිණි සුසම්මතධම්මසාර ගණනායකසථවිර නමැති එක් ගණනායකසථවිරනමක් ඒ ශෛලබිම්බවිහාරයෙහි

වාසයකොට මෙයින් උඩ අටවෙනි වර්‍ෂයේදී කලුරියකෙළේය. ඒ මහාස්ථවිරොත්තමයාගේ ප්‍රධාන ශිෂ්‍යවූ දූතට ඒ විහාරයෙහිම වසන්නාවූ භික්‍ෂුභාවයෙන් අටවිසිවස් ඇති සිරිසුමනතිස්ස ස්ථවිරය, එහිම උපස්ථවිරභාවයෙන් වාසයකරන භික්‍ෂුභාවයෙන් පසළොස් වස් ඇති පියරතනතිස්ස ස්ථවිරය යන අප දෙනම එක්ව සාකච්ඡාකොට අප්‍රමාණවූ රතන් - පසේබුදු - සක්විතිරජ ආදි මහෙශාඛ්‍යයන්ට උත්පත්තිස්ථානවූ ජම්බුද්වීපයෙහි සකල නගරාග්‍ර යුක්ත-හංසාවතී නගරයෙහි* පිහිටි "ශ්වේදගුං" මහාචෛත්‍යයට නැගෙනහිර දෙසැ අරණ්‍යවිහාරයෙහි වසන්නාවූ නොයෙක් දෙශයන්හි පැතිරගිය ශීලසුගන්ධ ඇති සල්ලෙඛාදි ගුණයුත් ප්‍රියසබ්‍රහමචාරීවූ අපගේ ආචාර්‍යප්‍රවෙණිගවූ ශාසන-වංශය මනාකොට පාලනය කරන්නාවූ විනයක්‍රමයෙහි දක්‍ෂවූ භදන්තායුෂ්මත් සද්ධම්ම මහා ස්ථවිරතුමන්ගේ† පාදපද්මාභි-වාදනයෙන් තදනුවර්තිකවූ ආයුෂ්මත් ඤාණසර ස්ථවිරතුමන්ට ද වායාම ස්ථවිරතුමන්ට ද කල්‍යාණී සීමාවෙහි වසන ආරණ්‍යක වණ්ණිම ස්ථවිරතුමන්ට ද දූත්වීම සඳහා මේ සන්දේශකථාව එවනලදී.

'මීත් පෙර වනාහි වැලිතර ගමෙහි පුෂ්පාරාම නම් සාමණේර නම අන්‍ය සාමණේර කීපනමක් සමග අමරපුරයට ගොස් උප සම්පන්නව ඤාණවිමලතිස්ස යයි ලැබූ නම් ඇත්තේ අමරපුරවැසි ස්ථවිර තුන්නමක් සාමණේරනමක් සමග නමා දසවෙනිකොට

---

* "ශ්වේදගුං" මහසෑය පිහිටියේ "තිගුම්බ" නමැති රැන්ගුන් නගරයෙහිය. නමුත් එය හංසාවතී (පේගු) දිස්ත්‍රික්කය තුළ පිහිටි බැවින් නොයෙක්විට හංසාවතී නාමයෙන් ද ව්‍යවහාර කරනු ලැබේ. නියම හංසාවතී නගරය පිහිටියේ මීට හැතැ: 45 ක් උතුරෙනි.

† මේ සද්ධම්ම මහාස්ථවිරතුමන්ගේ ප්‍රවෘත්ති දක්වන පුරාණ සිංහල ලිපියක මෙසේ සඳහන් වේ: "මේ ඇර හංසවතී නුවර මීට අවුරුදු හතරකට පමණ ප්‍රථම අනූවස් ඉක්මූනාවූ සද්ධම්ම මහාස්ථවිර නම් මහතෙරුන් වහන්සේ නමක් වැඩසිටියාය. ඒ තෙරුන් වහන්සේ ඤාණාභිවංස සංඝ රජ්ජුරුවන් සියැසින් දුටු කෙනෙක. සියලුම විනයපිටකය බුරුම භාෂාවෙන් දන්න වදල කෙනෙක ඒ තෙරුන්වහන්සේගේ ශීලසමාධ්‍යාදි ගුණයට පැහැදුනාවූ පණ්ඩිත මහාධම්මරජතුමානෝ රාජවිභොගයකින් හා සේසතකින් ද පුද කරලා තිබෙනවාය ඒ පූජාවස්තු දෙක හා තෙරුන් වහන්සේ ද ලංකාවෙන් හංසාවතීනුවරට ගිය පුවක්දණ්ඩාවේ පඤ්ඤානන්දාදි බොහෝ සංඝයා දැකලා තිබෙනවාය. උන්වහන්සේ කල්‍යාණීමහා සීමාසන්නයෙහිවූ ආරණ්‍යයක අනවැසි බොහෝ ශිෂ්‍යගණයන් සංඝයා සමග වැඩ ඉන්නවාය; ධූතාංගධර කෙනෙක පඤ්ඤානන්දාදි සංඝයාගේ උපසම්පදාවෙහිදී ඒ මහතෙරුන්වහන්සේ උපාධ්‍යායවූසේක."

ඇත්තේ ලක්දිවට අවුත් අතිරේකපංචවර්ගීගණයා සමග උපසම්පදාපේක්ෂකයන් උපසම්පන්නකරවා ශාසනය දියුණුකරන්ට උත්සාහ කරන්නේ නැවතත් භික්ෂූන් කීපනමක් සමග අමරපුරයට ගියේය. ඊට පසුව අත්තුඩාවේ ධම්මරක්ඛිත සාමණේරතෙමේ භික්ෂූන් තුන්නමක් හා එක් සාමණේරනමක් සමග අමරපුරයට ගියේය. මෙසේ දෙතුන්වරක් භික්ෂුශ්‍රාමණේරවරුන් ගියකල්හි අපගේ ප්‍රාචාර්ය වූ ගුණරතනතිස්ස ස්ථවිරතෙමේ පරිශුද්ධෝපසම්පදාව ලබනුකැමැත්තේ පෙර අමරපුරයට ගොස් ඇවිත් සිට බෝගහවත්තේ ස්ථවිරතුමා සමග මන්ත්‍රණයකොට ඒ ස්ථවිරතුමා ද කල්‍යාණීතිස්ස - ධම්මසාර - ධම්මරතන - සුමනතිස්ස ආදි සාමණේර අටනමක් ද කැටිව සම්බුදු පරිනිර්වාණයෙන් දෙදහස් තුන්සිය එක්පණස්වනවර්ෂයෙහි හංසාවතී නගරයට පැමිණියේය."

(මීට අනතුරුව උපසම්පදාව ලැබූ සැටි විස්තරකොට තිබේ.)

මෙසේ ලැබූ උපසම්පදා ඇති ගුණරතනය, කල්‍යාණීතිස්සය, ධම්මසාරය, ධම්මරතනය යන මේ ආදි භික්ෂූහු දසදෙන සමගි සතුටුවෙමින් රාමඤ්ඤදෙශිකවූ එක්නිශ්‍රයාචාර්යවරයකු සමග ලංකාද්වීපයට පැමිණ මේ සිංහලද්වීපයෙහි උපසම්පදාදිකර්මයන් කරමින් විසූහ.

උන්වහන්සේලා අතුරෙහි අපගේ ආචාර්යතෙමේ පෙරකී සුසම්මතධම්මසාර සංඝනායක මහාස්ථවිර තෙමේමය. උන්වහන්සේ අපගේ නිකායෙහි ගණාචාර්යව සිට මින් පෙර අටවෙනි වර්ෂයෙහි දිවංගත වූහ. උන්වහන්සේ සමග කල්‍යාණී සීමාවෙහි උපසම්පන්නව ආ අන්‍ය ස්ථවිරවරු ද කාලක්‍රියා කළහ; (මැලිකොන්දේ) ධම්මරක්ඛිත ස්ථවිරතුමා පමණක් දැන් ඉතිරිව සිටී. මේ පිරිස විසින් මෙහි පිහිටෙව් උපසම්පදා පරම්පරාවෙහි එක්සියපණසකට අධිකවූ භික්ෂු සමූහයක් අදදින විද්‍යමාන වේ.

මේ ද්වීපයෙහි අන්‍යවූ ද බොහෝ ම්‍රම්මවංශික භික්ෂූහු වෙසෙති. ළඟදී ඔවුනතුරෙහි උපන් සීමාසංකරය මුල්කොට ගෙන අන්‍යෝන්‍යයෙන් හා විවාදකරන්නාවූ ඒ භික්ෂූහු දැන් පක්ෂ දෙකක් වී සිටිති. එසේ වුවත් පෙර අමරපුරාධිවාසී සංඝරාජයාණන්ගේ අනුදැනීමෙන් ලැබූ උපසම්පදා ඇති බැවිනුත් (අමරපුර - හංසාවතී) දෙනුවර වැසි ස්ථවිර - උපස්ථවිරාදීන් එකසම්භෝගිකත්වයෙන් දක්නාලද බැවිනුත් ඇතැම්විට අපි ද සංකරලබ්ධික ම්‍රම්මවංශිකයන් හා එකසම්භෝගිකව වසමු.

මෙය වනාහි අපේ නිකාය පිළිබඳ අතිවිස්තර නොවූ වාර්තාවකි. මෙසේ ප්‍රව්‍රජ්‍යෝපසම්පදා වශයෙන් අපගේ ආචාර්ය පරම්පරාවෙන් ආවාවූ ඥාතිස්වභාව ඇති හංසාවතිනුවර වැසි ලජ්ජීකුක්කුච්චකාවූ පින්වත් ආයුෂ්මතුන්වහන්සේලාගේ ප්‍රවෘත්ති තත්වූ පරිදි විචාරන්ට ද අසන්ට ද ඔබතුමන්ලාගේ ශිෂ්‍යවූ ශික්ෂාකාමී සිංහල අපි සියලු දෙන කන් තමා ඊට අවනතව බොහෝ කලක් උන්නෙමු. ඒ අතර ලඟදී රත්නපූර්ණ (මණ්ඩලේ) නුවරට ගොස් මෙහි පැමිණි ඉන්ද්‍රසභවරඤාණසාමි ආදි සිංහල භික්ෂූන් වෙතින් "මෙකල හංසාවතියෙහි අරණ්‍යවාසී සද්ධම්ම මහාස්ථවිරාදිවූ අපගේ ආචාර්ය වංශප්‍රවේණිය පාලනයකරන්නාවූ උතුමන්ගේ හා සාදන්‍යවූ ස්ථවිර මධ්‍යමාදීන්ගේ විනයප්‍රතිපත්ති පූරණයෙන් ද පර්යාප්ති ධාරණයෙන් ද අපගේ ආචාර්යවංශය මධ්‍යාහ්න සූර්යයා මෙන් බබලන්නේය" යි කී වචන අසා අපි සියලුදෙන ගලාශන මඝොෂයක් වැනි ප්‍රීතිවේගයෙන් පැතිරගිය සිතැත්තෝ වීමු.

එබැවින් ධූතවාදී වූ විනයධර වූ සල්ලේඛවෘත්ති ඇති එකාශාසනික වූ ඔබවහන්සේලා දකිනුකැමති පසළොස්කට අධික සංඛ්‍යාවක් ගිහිපැවිද්දෝ දූත් ලක්දිවින් නික්මුණාහ. (ඒ පිරිසෙහි වූ) සොභිතස්ථවිරතුමා වස්ප්‍රමාණයෙන් සතළොස් (17) වස් ඇති වුවත් අරණ්‍යවාසී පඤ්ඤානන්ද ස්ථවිරතෙමේ පිරිස පාලනයකිරීම අවවාද දීම ආදියෙන් ප්‍රධානය. ඒ ස්ථවිරතෙමේ ලජ්ජීය, කුකුස් උපදවනසුලුය, ශික්ෂාකාමීය, සිවුපසෙහි නොඇලුනේය; සෑ මලුවස් ආදියෙහි නිතර උත්සාහ ඇත්තේය. අපි දෙනම ඒ ස්ථවිරයන්ට කර්මාචාර්ය වීමු. මොහු සමග පැමිණි ගුණානන්ද සාමණේර තෙමේ අපගේ කිකරුවූ මනාව හික්මුණු ශිෂ්‍යයෙකි. හෙතෙමේ තරුණ වුවත් වෘද්ධයන්ට ගෞරව කරන්නෙක් ද චෛත්‍යාඞ්ගණාදියෙහි වත් පුරන්නෙක් ද ශබ්දශාස්ත්‍ර ඉගනීමෙහි දක්ෂයෙක් ද වේ. පඤ්ඤානන්ද ස්ථවිරයන්ට අනුවර්තීකවූ අන්‍යයන්ගෙන් බොහෝ දෙනෙක් ද එබඳුම වෙති. ඒ සියල්ලෝම සභාගවූ සමානසම්භෝග ඇත්තෝය.

ඒ සියලු ගිහිපැවිද්දෝ අනතුරු රහිතව ඔබවහන්සේලාගේ සමීපයට පැමිණියාහු තම මිත් පෙර අපවත්වූ ඔබවහන්සේලාගේ ද අපගේ ද ආචාර්යවංශප්‍රවේණිය පාලනය කල මහතෙරවරුන් කෙරෙහි ගෞරවය නිසා අපගේ එකනිකායිකබව දැඩිතරවීම පිණිස උපසම්පදාදි විනයකර්මයන් කැමතිවන්නා වූ මොවුන්ට විනයක්‍රම පරිද්දෙන් ඔබවහන්සේලාට රුචිවන දෙයක් කරමින් පිළිසරණ වුව මැනවි විදෙශික බැවින් මනා රක්ෂණාවරණ ගුප්තීන් ද විධාන කල මැනවි.

මොවුනතුරෙන් ගුණානන්ද සාමණේරතෙමේ ද "දොන් ලුවිස් වණිසූරිය" නමැති කැපකරුවා ද "දොන් ජුවානිස්" නමැති කැපකරුවා ද යන මේ තිදෙන අප විසින්ම ආයුෂ්මත් තෙරවරුන් සමීපයට එවනලදහ. මේ උපවාසකයන් දෙදෙනට හා ගුණානන්ද සාමණේරනමට පරිශුද්ධ කල්‍යාණීසීමාවෙහිදීම ඔබවහන්සේලා විසින්ම පැවිද්දත් උපසම්පදාවත් දියයුතුය. මේ පඤ්ඤානන්ද ස්ථවිරාදීන්ට ද සියලු ආකාරයෙන් සංවිධාන කරත්වා. ඉදින් අමරපුරයටත් යනු කැමතිවෙත් නම් ඒ අවකාශය ද දෙත්වා. එසේ නොවෙත් නම් ප්‍රමාද නොකොට ලක්දිවටහැරීම පිණිස අවකාශ දෙත්වා.

සම්බුද්ධශාසනයෙහි සැදැහැයෙන් පැවිදිවූ සසරදුක් දක්නාවූ බුදුරදුන්ගේ වචන පිළිපදින්නාවූ අපගේ ආචාර්යප්‍රාචාර්යවරයන් ඉසුළූ ශාසනභාරය ඉසිලීමෙහි උද්‍යුක්තව යෙදුණු ප්‍රියතර ඥාතීන්ට සමානවූ භදන්තායුෂ්මත් ස්ථවිරවරයන්ගේ ආචාර්යවරයෝ අසුවල් ආචාර්යවරයන්ගේ සමීපයෙහි ඒ ප්‍රාචාර්යවරයෝ අසුවල් අචාර්යවරයන්ගේ සමීපයෙහි (උපසම්පන්නවූහ)යි මෙසේ ඔබවහන්සේලාගේ සියලු ආචාර්ය පරම්පරාව සංග්‍රහකොට තම තමාගේ ආචාර්යයන් සමීපයට පමුණුවා පිරිසිදු ශාසනවංශයෙහිවූ පූජ්‍යාචාර්යවරයන්ගේ නම ද ශාසනවංශය ද ලියා ඔබවහන්සේලාගේ ශිෂ්‍යවූ සමානවංශික වූ සිංහල අප කෙරෙහි අනුකම්පා සහගත සිතින් කල් නොයවා එවුව මැනවයි දෙතුන්වරක් අයදිමු.

(මේ අතරේ කොටසක් හැරදමනලදී)

භවත් ආයුෂ්මතුන්වහන්සේලාගේ සමීපයට එළඹෙන ගුණානන්ද සාමණේරනමගේ අතට බාරදී අපගේ ආචාර්ය වංශපාලක සද්ධම්ම මහාස්ථවිර-කෙසර-වාසාම-වන්දිම ස්ථවිර යන සතරනමට දීම පිණිස කැපබඩු ස්වල්පයක් එවම්හ; ඒ දුගී පඬුර අපට හිත වැඩ සැප පිණිස අනුකම්පාවෙන් පිළිගන්නා ලෙස අයදිමු.

මේ සන්දේශය වනාහි සම්‍යක්සම්බුද්ධ භාග්‍යවතුන්වහන්සේ පිරිනිවන්පෑමෙන් පසු ශාසනායුෂය දෙදහස් සාරසියපසක්(2405) වූ කල්හි වප්මස කළුවරපක්ෂයෙහි සත්වෙනි සඳුදා ශ්වේදගුං මහා චෛත්‍යයට නැගෙනහිර දිශාවෙහි වූ අරණ්‍ය විහාරයෙහි වසන්නා වූ සද්ධර්මසාගරයෙහි බැසගත් ආයුෂ්මත් සද්ධම්ම මහා ස්ථවිරතුමන්ට සිංහලද්වීපයෙහි දොඩන්දූව ශෛලබිම්බවිහාරයෙන් එවනලදූයි දතයුතු."

පැල්මඩුල්ලේ පොත්ශුද්ධිය කරනලද්දේත් මුන්වහන්සේගේ පාලනය පවත්නා කාලයේදීය. ඒ සම්බන්ධයෙන් උන්වහන්සේ

වෙත එවා තිබෙන ආරාධනා ලියුමෙන් පොත්ගුඩිය ගැන කරුණු රැසක් හෙළිවන බැවින් එය මෙහි ඇතුළත් කරනු ලැබේ:-

"1865ක්වූ ජූනිමස 18වෙනි දින පැල්මඩුල්ලේ දීය.

අම්බලන්ගොඩ පොල්වත්තේ විහාරාධිවාසී මිරිස්සේ සිරිමුනිවර ධර්මානන්ද ගණනායක ස්ථවිරයන්වහන්සේ ප්‍රධාන කොට දෙඩන්දූවේ ශෛලබිම්බාරාමවාසී උඩුගම්පිටියේ සුමන තිස්ස ස්ථවිර ස්වාමීන්ද්‍රයන් ගෞරව නමස්කාර පෙරටුව ලියා එවන වගනම්:—

මේ කාලයට අපේ තුම්පිටකේ පොත්වහන්සේලා ධර්මවිනය ධර සම්මුතියන්වහන්සේලා ලවා වරද හැරවීම් වශයෙන් සුද්ධකරවා ලියා තැබුවොත් බුද්ධශාසනයට මහත් උපකාර වන්නේය යන කල්පනාවක් දැනට අවුරුදු කීපේක සිට කල්පනාකරලා ඒගැන ප්‍රමුඛුවා ගන්න සම්මුතිස්ථවිරාදි අෂ්ටාසීපුද්ගල මහාසංඝයාවහන්සේට ආවාස පහසු ආදිය පිණිස පවුම් හාරදහසක් පමණ වියදම් කොට සංඝාරාමයක් මාහැඟි ලෙසින් සබරගමුවේ පැල්මඩුල්ලේ සුදර්ශනධර්මශාලාසන්තනයෙහි කරවා ඒ මහාසංඝාරාමය සංඝිකව පූජාකරන පින්කම මේ ජූනිමස පසළොස්වෙනිද පටන්ගෙන එම මස විසිතුන්වෙනි දින පූජාව අවසානකොට ඉන්පසු සත් දවසක් වනතුරු පූජාපෙළහරාදි පින්කන් කරනවාය.

යථොක්ත ත්‍රිපිටකශුද්ධිය කරණ පිළිවෙළාදිය ගැන මේමස දහහත්වෙනි දින සබරගමු පලාතේ සහ ඌවදිසාවේ ද රදල මහත්වරු සහ අවශේෂ සමූහයාත් බුලත්ගම ස්ථවිරයන්වහන්සේ ප්‍රධාන කොට ඇති සංඝයාවහන්සේ සුදර්ශනාධර්මසභාරයට රැස්ව කථා කොට නියම කරගත්තාය. එනම් උත්තමානන්දවහන්සේ ආදි ආණ්ඩුකාර මහත්තුන්වත් දැනුම්දීම සහ මහනුවර විහාර දෙකේ නායකස්ථවිරාදි සංඝයාවහන්සේට ද ඒ පලාතේ රදල වරුන්ට ද කොළඹ සහ ගාල්ල මාතර නායකස්ථවිරාදි සංඝයා වහන්සේට ද ඒ පලාතේ වැදගත් මහතුන්ට ද අමරපුර සමාගමේ ඒ ඒ ආවාසී පක්ෂවල මහාස්ථවිරාදි සංඝයාවහන්සේට ද යන මේ ගෘහස්ථ ප්‍රව්‍රජිත බුද්ධශාසන ගෝපනාදියට කැමතියන් විසින් මේ සර්වසාධාරණ ශාසනාභිවෘද්ධියට සහායොපකාරාදිය වීමෙන් මැදහත්ව සිටින්ට ලිවුන් යවනවාය.

එපමණකුත් නොව එම නිකායපක්ෂවල තුමූත් ශාස්ත්‍රාගමධාරී සම්මුතියන්වහන්සේලා පුළුපුලුවන් කාලවලදී පමුණුවාගැනීම ද ඕනෑකරනවාය. මේ බව කල් ඇතුව ශාමවහන්සේලා සමග කථා බස්කරකියාගන්ට නොලැබුනු සෙයින් මේ ක්‍රියාව ආරම්භකරණ

පමණකට සෑහෙන වහන්සේලා හත් අටනමක් මේ වස්කාලේට පමුණුවාගන්ට ඕනෑ කරන සෙයින් සිජ්ඣඩුවේ සවාමීන්ද්‍රයන් ඇතුළුව නමක් දෙනමකව වඩින්ට ආරාධනාකර ඇරියාය. එසේම දෙඩන්දූවේ විහාරවාසී පියරතනසාමිට ද වැරැල්ලාතේ විහාරවාසී වැලිගම සිරිසුමංගල සාමිට ද තුඹවහන්සේ ප්‍රධාන උඩුගම්පිටියේ සිරිසුමනතිස්ස සප්විරසාමීන් වහන්සේත් විසින් මෙදෑ මෙහි වස්විසීමට ද – පොත් වරද හැරීම පටන් ගන්නා ගැන ද ඒ දෙදෙනා වහන්සේ පිටත්කර එවාවදුරණවාත් ඇර බුලත්ගම සාමීන්වහන්සේ ද ඒ හාමුදුරුවන්ගේ ගෝලනමකුත් සමග වඩින බවත් දූත වදාල මැනවි.

මෙදෑ වස්විසීම සහ පොත් ශුඩකිරීමේ ආරම්භය කොට වස් පවාරණ උනාසින් පසු පොත් වරදහරින වැඳගත් කාලේදී සාමීන් වහන්සේ ප්‍රධාන ඒ ගනතේ මේ ගැන කටයුතු කරන්ට යෝග්‍ය සංඝයාවහන්සේ කීපනමක් පමුනුවාගන්ට ඕනෑ කාලේ දී ශලකර එව්වාම වඩිනවා සහ මීට සංඝයාවහන්සේ ගෙන් ලැබිය යුතු සහාය උපකාර ද එසේ ම ග්‍රහසථ උපාසකාදීන් ලවා කරවන උපකාර ද කරවන සම්‍යක් කල්පනා සිත්හි මෙනෙහිකර වදාල මැනවි.

ඉහත කී බුලත්ගම සාමීන්වහන්සේ ප්‍රධානව පියරතන – සිරි සුමංගල සාමිවරු දෙනමත් සමග මෙදෑ මෙහි වස්විසීම ආදියට ඒ සාමින්වහන්සේලා එවාවදුරන්ට ඕනෑය. තවද මේ ත්‍රිපිටක පොත් සොධනය කොට ශාසනොපකාරය කිරීම ශාසනාභිවෘඩි කාමී සෑසන භාරය උසුලන සංඝයාවහන්සේ ඊට උපකාර අපට කියා ලබාගෙන කරන්ට යුතු ගරුතර ක්‍රියාවක් බව වැඩිදුර කල්පනා කරනවා නම් මේ වග ඇසූ පමණින් මෙහි වැඩමවා වෙහෙසෙන්ට යුතුය.

ඒ නිසා එන පසලොස්වක්දිනට කල් ඇතුව පැල්මඩුල්ලට වඩින්ට දවස් බලා දෙඩන්දූවෙන් පිටත්ව කළුතරට වැඩියාම එතන පටන් පාරුවකින් ගගේ වඩින්ට ඕනෑය. ඒ ගැන දුර බැහැර නිසා කාටත් පහසු අන්දමකින් වැඩමවා ගන්ට කියන්ට නිසි අය පංගාර්තුකර එවනවාය. පිටත්වී වදුරණ දවසත් සමග මීට උත්තර එවා වදාල මැනව.

ඒවගත් මෙසේම ලියා සැලකර එව්වේ ඌවේ ද සබරගමුවේ ද දෙපලාතේ රදලමහත්වරු ප්‍රධාන සමූහයාගේ කැමැත්තත් ඇතුව නවදුන්-කුකුළු දෙකෝරලේ රට කරවූ සබරගමු සමන් මහ දේවාලේ බස්නායක තිලය ලැබී කරවන ඉද්දමල්ගොඩ අභයකෝන් අතපත්තු මුදලිනාමාභිධාන බස්නායක රාලහාමි විසිනි.

ඉද්දමල්ගොඩ.”

## 25. රත්මලානේ ශ්‍රී ධර්මාලෝක මහාස්වාමිපාදයෝ

(ක්‍රි. ව. 1828-1887.)

විද්‍යෝදය පිරිවෙණ නිසා ශ්‍රී සුමංගල නාමය සදානුස්මරණීය වූවා සේ විද්‍යාලංකාර පිරිවෙණ නිසා ශ්‍රී ධර්මාලෝක නාමය සදා-නුස්මරණීය විය. විද්‍යෝදය පිරිවෙණට අවුරුදු දෙකකින් බාලවූ මේ පිරිවෙණ අද මහත් අභිවෘද්ධියකින් යුක්තව ලක්වැසි ගිහිපැවිදි මහත් සමූහයකට වැඩ සාදාදෙමින් පවතී. ශ්‍රී ධර්මාරාම නායක මාහිමියන් වැනි පැවිදි පණ්ඩිතරත්නයන් ද ශ්‍රීමත් ජයතිලක ඇමතිතුමන් වැනි ගිහි පඬිවරුන් ද ඇති කළ ධර්මාලෝක මාහිමි තුමා ඒකාන්තයෙන්ම මහාභාග්‍යසම්පන්නයෙකැයි කිය යුතුය.

මෙතුමා ක්‍රි. ව. 1828 මැයි මස 28වෙනි දින රත්මලාන තම ගමේදී උපන්නේය. 'රයිගම විදානෙලාගේ දොන් කොර්නේලිස් අප්පුහාමි ද "අබේවීරගේ දොන අද්‍රියානා" හාමිනේ ද මෙතුමාගේ මව්පියෝ වූහ. මේ කොරනේලිස් අප්පුහාමි වනාහි රයිගම රාජධානියක්ව පැවති කාලයේදී ශබ්දවේධී ධනුර්ධරයකු වශයෙන් ප්‍රකටව සිටි "සද්ද විද්ද රාජපක්ෂ දඬයක්කාර මුහන්දිරම්" මහතාගේ මුනුපුරෙකි. මෙකුමරුට අකුරු කරවිය යුතු වයස පැමිණිවිට රත්මලානේ පුරාණ විහාරස්ථානයේ වැඩවිසූ තලන්ගම සෝභිත මහාස්ථවිරයන්ගේ නියමය පරිදි උන්වහන්සේගේ ශිෂ්‍යවූ අඹුපේ සෝණුත්තර ස්ථවිරතුමන්ට බාරදෙන ලදී.

මෙකුමරු ඉගෙනීමෙහි දක්ෂයකු බව දැනගත් ආචාර්ය මහා ස්ථවිරතුමා මොහු පැවිදි කරවීමට දෙමව්පියන් කැමති කරවා ගත්තේය. 1837දී යථෝක්ත සෝභිත මහා ස්ථවිරතුමන් උපාධ්‍යාය කොට සෝණුත්තර ස්ථවිරතුමන් ආචාර්යත්වයෙහි තබා මෙකුමරා පැවිදිබිමට පත් කරන ලදී. පැවිදිවීමේදී ධම්මාලෝක නම ලැබූ හෙරණතෙමේ පැවිදිවූ දිනයේදීම බෙල්ලන්විල බෝධිසම්පාරාමාධිපති උඩුගම්පල රතනපාල මහාස්ථවිරතුමන් සමග ආසන දෙකේ හිඳගෙන ධර්මදේශනාවක් පැවැත්විය. මේ කාලයේදී කොළඹ පලාතේ තිබුණු එකම බෞද්ධ විද්‍යාස්ථානය කෝට්ටේ රජමහා විහාරය විය. මලිගස්පේ මංගල නමැති නවකෝරලේ නායක ස්ථවිරතුමා එහි ආචාර්ය විය. වැඩිදුර ඉගෙනීම ලබනු කැමති ධම්මාලෝක හෙරණතෙමේ ද මේ ස්ථානයට පමුණුවා මංගල නායක ස්ථවිරතුමාට බාරදෙන ලදී.

මෙසේ කලක් ඉගෙනීමෙහි යෙදී සිටින අතර 1838දී වලානේ ශ්‍රී සිද්ධාර්ථ මහාස්ථවිරතුමා රත්මලානේ ආරාමාධිපතීන් වහන්සේගේ හා දායකමහතුන්ගේ ආරාධනාවෙන් එහි වස් විසීමට

පැමිණියේය. සොණුත්තර මහාස්ථවිරතුමා තම ශිෂ්‍යයාට ස්වකීයාරාමයේදී ඉගනීම පහසු බැවින් මංගල නායක ස්ථවිරතුමන්ගේ අවසරය ඇතුව සවශිෂ්‍යයා රත්මලානට කැඳවා ගෙනවුත් පණ්ඩිතාචාර්ය වලානේ සිද්ධාර්ථ මහාස්ථවිරතුමන්ට භාරදුණි 1847 දක්වා මෙතුමා වලානේ මහාස්ථවිරතුමන් ගෙන් ඉගනීම කෙළේය. වලානේ මහාස්ථවිරතුමන් පිටපළාත්වල වස්විසීම සඳහා නොයෙක් විට වැඩමවූ බැවින් 1849 දී මුන්වහන්සේ ස්වකීයාචාර්ය පරපුරට සබඳකම් ඇති බඹරගල විහාරස්ථානයේ විසූ බෝගහවත්තේ මහා ස්ථවිරතුමන් වෙත ගොස් ටික කලක් නැවතී සිට ජ්‍යොතිශ් ශාස්ත්‍රය ඉගනීමේ කැමැත්ත දූන්නු විට ඒ මහා ස්ථවිරතුමා පට්ටියේගම මහවාසල ගණිතාචාර්යයන්ගේ ශිෂ්‍යවූ පල්ලේවත්තේ මහාස්ථවිරයන් වෙත පමුණුවා එය ඉගනීමට අවකාශ ලබාදුණි.

මුන්වහන්සේ සත්කෝරළේ වැඩ සිටියදී විහාර කීපයක ජරාවාස හරවා සියතින්ම චිත්‍රකර්මාන්ත කොට එහි මනා අභ්‍යාසයක් ලැබූහ. මේ කටයුතු නිසා දෙතිස්විය පැමිණෙනතුරුත් මෙතුමා උපසම්පදාව නොලබා සිටියේය. බඹරගල විහාරයේදීත් ශිෂ්‍යයන්ට ඉගැන්වීමේ යෙදී සිටි ධම්මාලොකයති තෙමේ මැණියන්ගේ ඉල්ලීම ලෙස 1854 පමණේදී ශිෂ්‍ය පිරිසකුත් සමග රත්මලානේ ස්වකීය විහාරස්ථානයට පෙරළා වැඩියේය. නමුත් 1860 වන තුරුත් එතුමා අනුසම්පන්නවම විසීය.

1860 දී උපසම්පදාව ලබනු කැමති වූ මුන්වහන්සේ ස්වකීය උපාධ්‍යායභූත කළුත්ගම සොභිතමහතෙරුන් අපවත්වී සිටි බැවින් ගම්පහ රේවත මහතෙරුන් ප්‍රමුඛ පිරිසක් සමග ඒ සඳහා මහනුවර මල්වතු විහාරයට පැමිණියහ. එකල මහානායක ධුරය දැරුවේ පරකුඹුරේ සරණංකර මහාස්ථවිරතුමාය. උපසම්පදාපෙක්ෂක ධර්මාලොකයති තෙමේ මහානායක ප්‍රමුඛ මහා සභා මධ්‍යයේ දී තමන් විසින් විරචිතවූ මංගලාෂ්ටකයක් ව්‍යාකරණ-ජන්දොලංකාර-විස්තර ව්‍යාඛ්‍යා සහිත කොට කියැවීය. එයින් ප්‍රීතියටපත් සභා තොමෝ මහවාසල වෙනුවෙන් උපසම්පදාකිරීමට තෝරාගනු ලබන අපෙක්ෂකයා වශයෙන් මෙතුමන් තෝරාගති. ඒ අනුව දියවඩනනිලමේ විසින් පුදනලද පටසිවුරුවලින් යුත් අටපිරිකර ලබා ගෙන මහානායක මාහිමියන් උපාධ්‍යාය කොට ගෙන මෙතුමා උපසම්පදාව ලැබීය. උපසම්පදාව ලබා රත්මලානේ ස්වකීය විහාරයට පැමිණි පසු ඒ උපසම්පත් ප්‍රතිලාභය නිමිති කොට විහාරාධිපති සොණුත්තර තෙරපාණන්ගේ අනුශාසනාව පරිදි සතියක පිරිත් පින්කමක් පවත්වා මහාසංඝයා වහන්සේට පිරිකර සහිත දානයක් පිරිනමන ලදී.

මෙතැන් පටන් රත්මලානේ පුරාණවිහාරය විද්‍යාස්ථානයක් මෙන් ප්‍රකට විය. හැම පළාත්වලින්ම හැම නිකායවලින්ම විද්‍යාර්ථීහු ශාස්ත්‍රලාභය සඳහා මෙහි පැමිණියහ. ලංකාණ්ඩුවේ භාෂා පරිවර්තක ධුරය බොහෝ කලක් උසුලමින් සිංහලපාඨශාලීය පොත් මුලින්ම සම්පාදනය කළ "සයිමන් ද සිල්වා සෙනෙවිරත්න පණ්ඩිතශේඛර" රාජවාසල මුදලිතුමා මෙහි උගත් ශිෂ්‍යයන් ගෙන් එක් අයෙකි. අඟුලානේ වී. ආබ්‍රහම් ප්‍රතාඥ වෙදමහතා ආදී ප්‍රකට ජ්‍යොතිශ්ශාස්ත්‍රඥයෝ බොහෝ දෙනෙක් ද මෙහි උගත් ශිෂ්‍යයෝ වූහ. දොන් පිලිප් ද සිල්වා ඇපා අප්පුහාමි පවා නොයෙක් විට ජ්‍යොතිශ්ශාස්ත්‍රය පිළිබඳ කරුණු ධර්මාලෝක මාහිමියන් ගෙන් විචාරා අවිවාදයෙන් පිළිගත්තේය.

මුත්වහත්සේගේ කීර්තිය ස්ථාවර කිරීමට ශිෂ්‍යරත්නයක් 1864 දී මුත්වහත්සේට ලැබුණි. ඒ ශිෂ්‍යයා නම් පසු කලක විද්‍යාලංකාර පරිවෙණාධිපතිවූ පණ්ඩිතශේඛරායමාන රත්මලානේ ධර්මාරාම නායක හිමිතුමාය. 1864 මැයි මාසයේදී මුත්වහත්සේ වෙත පැවිදිවූ ධම්මාරාම මාහිමිතුමා පඬිවරයකු වශයෙන් ලොව ප්‍රකටවූ පසුත් ස්වකීයාචාර්යයාණන්ට කළයුතු වත්පිළිවෙත් නොපිරිහෙලා ඉටුකළ බව අසන්ට ලැබේ.

## විද්‍යාලංකාර පිරිවෙණේ ආරම්භය

ක්‍රි. ව. 1874 දී ශ්‍රී ධර්මාලෝක මහාස්ථවිරතුමා කැලණි විහාරාධිපතිව විසූ මාපිටිගම ධම්මරක්ඛිත, එතුමාගේ ශිෂ්‍ය සංඝරක්ඛිත යන තෙරදෙනමගේ හා පෙතියාගොඩ දායකමහතුන්ගේ ආරාධනාවෙන් පෙතියාගොඩ විහාරයෙහි වස් විසීය. 1875 හේදී දළුගම තොරණ ළඟ වස්විසීය. මේ දෙවතාවේම ශිෂ්‍යවූ ධර්මාරාමස්ථවිර තුමාද ඒ තැන්වල විසීය. එහිදී ඒ පළාතේ විද්‍යාස්ථානයක් පිහිටුවීමට යෝජනාකළ දායකවරු "විද්‍යාලංකාර දායක සභාව" නමින් සභාවක් පිහිටුවා ගත්හ. "දොන් ආබ්‍රහම් සමරතුංග රත්දුනු බස්නායක" මුහන්දිරම් මහතා ඒ සභාව පිහිටුවීමෙහි ප්‍රමුඛ විය. ඒ සභාවේ මෙහෙයීමෙන් ධර්මාලෝක මාහිමිතුමා ස්වකීය අග්‍රශිෂ්‍ය ධර්මාරාම මාහිමියන්ගේ සහාය ඇතිව විද්‍යාලංකාර නම් පිරිවෙණක් පිහිටුවිය. එහි මුල් අවස්ථාව පිළිබඳ විස්තරයක් 1937 අගෝස්තු මස පළවූ ප්‍රභාෂෝදය සඟරාවෙන් උගෙන මෙහි දක්වමි:-

"පොල් අතු සෙවෙනි කළ ඉතා කුඩා පැලෙක ගුරුගෝලයෝ දෙනමක් ඉගැන්වීමක් ආරම්භ කළෝය. කොළඹ නගරයෙන් පිටත, එයට නුදුරුව, එතරම් එළිපහළි නුවූ භූමිභාගයක පිහිටි මේ කුඩා පැල දෙදෙනා වහන්සේගේ සැතපීමට තුබූ ඇඳන් දෙකෙන්

පිරිගියේය. ඒ අසල තවත් පොල්අතු මඩුවෙකි. එහි පසෙක කවිච්චියක් තිබිණ. ඒ වටා කුඩා බංකු පෙළක්විය. එහි ආසන-රණ වශයෙන් යෙදූ සියල්ලම සිවුරුය. තුවා ඇතිරිලි ආදිය වෙනුවට පරණ සිවුරු ප්‍රයෝජනයට ගැනීම මහාතෙරුන්වහන්සේගේ සිරිතය. බාහිර ඔපයෙන් නොමැඩුණු කීර්තිප්‍රශංසායෙන් නොසැලුණු මේ මහාස්ථවිර පාදයන් වහන්සේ පූර්වෝක්ත ආසන-යෙහි වැඩහිඳ උදය සවස දෙවේලෙහි ගිහිපැවිදි ගෝලයන්ට ධර්ම ශාස්ත්‍රයන් හදාරවති. උන්වහන්සේගේ මේ සද්ව්‍යාපාරයට ස්වකීය ශිෂ්‍යයන්වහන්සේගෙන් ද මහත් ආධාරයක් ලැබුණේය."

"මේ වනාහි මෙයින් අවුරුදු දෙසැටකට පළමුව සිදුවූවකි. ශාස්ත්‍රාගමය පිළිබඳ දුර්දශාවෙක පොත් පත් දුර්ලභ අවධියෙක ධර්මශාස්ත්‍රය කරුණු දූෂිතව පැවති සමයෙක අඥානාන්ධකාරය පැතිරී ගිය අවසරයෙක අවනතවගිය ශාස්ත්‍රාගමය උන්නතමාර්ග-යෙහි තංවා ලීමට කරුණාමූර්තිධර පණ්ඩිතාචාර්ය රත්මලානේ ශ්‍රී ධර්මාලෝක මහාස්ථවිරපාදයන් වහන්සේ තදග්‍රශිෂ්‍ය රත්මලානේ ශ්‍රී ධර්මාරාම යතීන්ද්‍රයන් හා පැලියගොඩ විද්‍යාලංකාර ශාස්ත්‍රාශාලාව පිහිටුවා මෙරට ධර්මශාස්ත්‍ර ප්‍රචාරයෙහි නිරතවූයේ මේ ක්‍රමයෙන්ය."

1875 සේ සිට 1887 දක්වා දෙළොස් වර්ෂයක් මුළුල්ලේ උන්වහන්සේ මේ විදුහල මඟින් මහත් පිරිසකට ධර්මශාස්ත්‍ර දානය කළහ. මෙසේ සුළුවෙන් පටන්ගත් මේ පිරිවෙණ අද ගොඩනැගිලිවලින්, ඉගැන්වීමෙන් හා පණ්ඩිතාචාර්යවරයන්ගෙන් ලක්දිව අන්කිසි ස්ථානයකට නොදෙවෙනි තත්වයකට පැමිණ තිබෙන බව ප්‍රකට කාරණයක් බැවින් මා විසින් විශෙෂයෙන් කියයුත්තක් නොවේ.

"සතියේ දවස්වල ඉගැන්වීම කරවූ මේ යතීශ්වරයෝ සිකුරාදා සවස කැලණියේ දුම්රියපළෙන් පිටත්ව රත්මලාන බලා වඩිති. නැවත පෙරළා වඩින්නේ සඳුදා දවල් දුම්රියෙනි. තමන් වහන්සේ කල්‍යාණී පුරයෙහි ලැගුම් ගන්ට පෙර බොහෝ කලක් වාසයකළ රත්මලානේ පුරාණ විහාරස්ථානයට වැඩ එහි දායකයන්ට ධර්මානු-ශාසනා කරන අටියෙන් කළ මේ ගමන උන්වහන්සේගේ ජීවිතාන්තය දක්වා කඩනොවූ ගමනකි. උන්වහන්සේ ස්වකීය ජන්මග්‍රාමයට ගුරුභූමියට කෙතරම් ඇලුම් කළෝදයත් එහි බෞද්ධලමයින් අන්‍ය ලබ්ධික පාඨශාලාවලට යැමෙන් ඔවුන්ගේ ගුණධර්ම තුනීවී යන බව දැන වර්ෂ 1879 යේ දී රත්මලානේ ශ්‍රී ධර්මාලෝක බෞද්ධ පාඨශාලාව පිහිටුවා වදාළෝය" යන්නත් යථෝක්ත "ප්‍රභාෂෝදය" සඟරා කලාපයෙහි එන්නකි.

**ග්‍රන්ථ සම්පාදනය.**

මුන්වහන්සේ ඉගැන්වීමෙහි පමණක් නොව ග්‍රන්ථසම්පාදන-යෙහිත් ව්‍යාපෘතවූහ. 1875 හේදී සංස්කෘත ශ්ලෝකවලින් රාජ චරිත නම් ග්‍රන්ථයක් සම්පාදනය කොට සත්වෙනි ඇඩ්වඩ් මහරජු වේල්ස්හි කුමාරයා වශයෙන් මෙහි පැමිණි අවස්ථාවේදී ඔප්පුකළහ. විනයකතිකාවත, සත්‍යවිලාසිනී යන ග්‍රන්ථදෙකක් ද ධර්මාරාම නායකමාහිමිතුමන්ගේ සහායඇතිව සංස්කෘත වරනැගිල්ලක් ද සම්පාදනය කළහ. ගුරුළුගෝමීන්ගේ ධර්මප්‍රදීපිකාව සකස්කොට මුද්‍රණයකරවූහ. බු. ව. 2416 දී සත්‍යසමුච්චය නමැති සඟරාව පටන්ගත්තාලද්දේ මුන්වහන්සේගේ අනුශාසනයෙනි.

මෙසේ නොයෙක් ලෝකශාසනසංග්‍රහ කළ මුන්වහන්සේ සැට වසක් පිරිකල්හි 1887 අගෝස්තු මස 11 වෙනිදා ගිලන්බවට පැමිණ 15 වෙනිදා රාත්‍රි රත්මලානේ පුරාණවිහාරයේදී අපවත්වූහ. එම මස 18 වෙනිදා ආදාහනෝත්සවය පවත්වනලදී.

ඒ සම්බන්ධයෙන් එකල සඳරැසපත්‍රයේ පළවූ කතෘවාක්‍යයේ කොටසක් මෙසේයි:- "ශ්‍රී බුද්ධවර්ෂයෙන් 2431 ට පැමිණි මෙම වර්ෂයෙහි සිංහරව් පළමුවෙනිභාගවූ සඳුදා රාත්‍රිභාගයේ ධර්මාලෝක ස්ථවිරයාණන් වහන්සේ පරලොකප්‍රාප්තවූ බව මෙහි අත්තැනක තිබෙන දැන්වීමෙන් පෙනේ. මේ ස්ථවිරයන්වහන්සේ ලංකාවේ ප්‍රසිද්ධ ශාස්ත්‍රඥයන් අතර ගණන්ගෙන සිටි ප්‍රසිද්ධ පණ්ඩිත කෙනෙකි. සිංහල-මාගධ-සංස්කෘත භාෂා හා බුද්ධධර්මය ආයුර්වේද ජ්‍යොතිශ්ශාස්ත්‍රාදියෙහි කරණලද පරිශ්‍රම ඇති බුද්ධිමතෙකි........ පැලියගොඩ විද්‍යාලංකාර පිරිවෙණ පිහිටුවා අවුරුදු 12ක් පමණ වේලල් පටන් ගෘහස්ථ-ප්‍රව්‍රජිත සමූහයකට ශාස්ත්‍රාගම පුහුණු කර ගෙණ ආවේය. දෙශනාකිරීම් වශයෙනුත් ප්‍රශ්න විසඳීම් ආදියෙනුත් මහජනයාට ශාස්ත්‍රාගම සම්බන්ධ කරුණු අවබොධ කරණ කෙනෙක්ව සිටියේය............ ලංකාවේ ඉතා වැදගත් ග්‍රන්ථයක්වූ ධර්මප්‍රදීපිකාව ආණ්ඩුවේ ඉල්ලීමට මේ සාමීන් විසින් සවකීය ශිෂ්‍ය-යන් වහන්සේගේත් ආධාර ලැබගෙන සංශොධනය කරණලදුව දැන් මුද්‍රණය කොට සුලභව තිබේ..............."

## 26. සිප්කඩුවේ ශ්‍රී සුමංගල නායකමාහිමියෝ.

(ක්‍රි. ව. 1826-1911.)

අද්‍රාතීතයෙහි විසූ බෞද්ධාචාර්යවරයන් අතුරෙන් අතිශයෙන් ප්‍රකට කීර්තියක් ඇතිව සිටියේ මුන්වහන්සේය. ලක්දිව ප්‍රධාන බෞද්ධවිද්‍යාස්ථානය බවට පත්වූ විද්‍යෝදය මහාවිද්‍යාලය පිහිටෙව් මුන්වහන්සේ එය පිහිටෙව් තැන් පටන් ජීවිතාවසානය දක්වා

එහි වසමින් විද්‍යෝදයය කළහ. අඟනුවර පිහිටි අග්‍රබෞඩවිද්‍යාලයේ ආධිපත්‍යය ඉසිලීමත් පිටකත්‍රයෙහි නොපැකිළෙන බුඩිප්‍රභාවයත් ශාස්ත්‍රාන්තරයත්හි හා භාෂාන්තරයත්හි දක්‍ෂව විසීමත් මූත් වහන්සේගේ කීර්තිය මහත්සේ පැතිරයාමට හෙතුවූහ. වර්ත්මානයෙහි ලක්දිව උගතුන්සේ ප්‍රකටවූ බොහෝ දෙනෙක් මූත්වහන්සේගේ පාසෙවනෙහි වැඩුනෝය. ලක්දිව ධර්මශාස්ත්‍ර පිරිහී තිබුණ කාලයක, බෞඩබලය හිනවී තිබුණ කාලයක, පොත් පත් සුලභ නොවූකලක, ශාස්ත්‍රප්‍රදීපය දල්වා, බෞඩබලය දියුණුකොට, බුඩිශාසනය දියුණුකරනු කැමතිවූ මූත්වහන්සේ බටුවන්තුඩාවේ දේවරක්‍ෂිත පඬිතුමාගේ ද ආධාරය ඇතිව ඉගනීමට උචිතා පොත් ශුඩකොට පළකරවීමාදියෙන් කළාවූ මෙහෙය ලාංකිකබෞඩයන් විසින් පහසුවෙන් මතකනැතිකළහැක්කක් නොවේ.

ගාලුකෝරලේ වැල්ලබඩ පත්තුවට අයත් හික්කඩුව නම් ගමේදී 1826 යේ ජනවාරි මස 20 වෙනි දින මෙතුමාගේ උත්පත්තිය සිදුවීයයි මාතලේ රතනජෝති ස්ථවිරතුමන් විසින් ලියනලදුව නායකමාහිමියන් ජීවත්ව සිටියදීම 1901 දී පළවූ ශ්‍රීසුමංගලචරිතයෙහි කියවේ. යගිරලනායක ස්වාමීන්ද්‍රයන් විසින් සම්පාදිතව 1947 දී පළවූ චරිතයෙහි 1827 ජනවාරි 20ද උපත සිදුවීයයි දක්වා තිබේ. එගම විසූ "දොන් ජොහානිස් සිල්වා අබේවීර ගුණවර්ධන" ලියන ආරච්චි මහතා එතුමාගේ පියා විය. සොහොයුරන් සදෙනෙකුත් අතරෙන් පස්වෙනියාවූ මෙකුමරු දීපන්මන් අභාගතයක් ඇත්නකු බව දැනගත් පියතෙමේ සවහැවිරිදි වයසේදී හික්කඩුවේ තිලකාරාමාධිපතිව වැඩවිසූ අරුණ්ගමුවේ රෙවත මහාස්ථවිරතුමන් වෙත බාරකෙළේය. යගිරළ මහාස්වාමීන්ගේ පොත් කියවෙන්නේ 1832 දී ඒ ආරාමාධිපතිව වැඩවිසූ හික්කඩුවේ සොභිතමහාස්ථවිරතුමන් ලවා අකුරු කියවූ බවයි. ශ්‍රීසුමංගලමාහිමියන්ගේ හැමලිපියකම වාසෙන් පෙනෙන්නේ රෙවත ස්ථවිරතුමාගේ නාමයයි සොභිත නාමයක් නොපෙනේ.

රෙවතමහාස්ථවිරතුමන් වෙතින් උගතයුතුදේ ඉගෙන ගත් පසු ඒ මහාස්ථවිරතුමා මෙකුමරු තොටගමුවේ විජයබා පිරිවෙන් විහාරස්ථානයට පමුණුවා එහි පෝයගෙයිදී "මැලැගොඩ ගුණරතන" නායකස්ථවිරතුමන් ලවා 1840 දී පැවිදිකරවිය. රෙවත මහාස්ථවිරතුමා මේ සාමණේරයන් අවුරුදු කීපයක් තමන් වෙත රඳවාගෙන ධර්මශාස්ත්‍ර උගන්වා වැඩිදුර ඉගනීම සඳහා 1844 දී රත්මලානේ පරමධම්මචෙතියාරාමයෙහි විසූ වලානෙන් ශ්‍රී සිඩාර්‍ථ

මහාස්ථවිරතුමන් වෙත පැමිණවිය. පසුකලක "බටුවන්තුඩාවේ පඬිතුමා"යයි ප්‍රකටවූ තැනැත්තා මේ කාලයේදී වලානේ මහා ස්ථවිරතුමන් වෙත ඉගෙනීමෙහි නියුක්ත දේවරක්ඛිත නමැති භික්ෂු නමක්ව සිටියේය. සුමංගලසාමණේරතෙමේ ඇතැම්විට මේ දේවරක්ඛිත භික්ෂුවගෙන් ද ඉගනීම කෙළේය. මේ කාලයේදීම කොළඹ විසූ කාශිනාථ නම් බ්‍රාහමණපඬිවරයාගෙන් සංස්කෘතද ඉගෙන ගත්තේය.

දක්ෂතාවය නිසා සාමණේරකාලයේදීම උගතකුසේ ප්‍රකටවූ සුමංගලහිමිතෙමේ උපසම්පන්නවීමට යෝග්‍ය කාලය පැමිණිවිට සවකීයාචාර්යවරයන් හා 1848 දී මහනුවර මල්වතුවිහාරයට පැමිණියේය. එහිදී එතුමන් රචනාකළ ප්‍රබන්ධයක් මහාසංඝයාට ඔප්පු කළවිට එහි සිටි ඇතැම් ස්ථවිරවරු මෙය මේ සෙරණ තැනගේම කෘතියක් විය හැකිදැයි සැක පහළ කළහ. එවිට මූත්වහන්සේ එතැන හිඳගෙනම අභිනව ප්‍රබන්ධයක් තනා කියවා ඒ සභාව විස්මයට පත්කරවූහ මහාසංඝතෙමේ අතිශයෙන් සතුටුව ගල්ගිරියාවේ ධම්මරක්ඛිත සුමංගල මහානායකහිමියන් උපාධ්‍යායකොට මෙතුමාට උපසම්පදාව දුණි.

උපසම්පදාවෙන් පසුත් කලක් රත්මලානේ නැවතී ඉගෙන ගන්නා අතර ඒ විද්‍යාස්ථානයේ ගුරුවරයකු වශයෙන් ද ක්‍රියා කෙළේය. ඉක්බිති තොටගමුවිහාරයට පැමිණ ටිකකලක් නැවතී සිට හික්කඩුවේ තිලකාරාමය නිත්‍යවාසය කරගත්තේය. 1855 පමණේදී ගාල්ලේ බෝගහවත්තේ සුදර්ශන පරමානන්ද විහාරයට පැමිණ එහි විද්‍යායතනයක් පිහිටුවා ඉගැන්වීම කෙළේය. මේ කාලයේදී ගාල්ලේ මිණිවන්ගොඩ පරමානන්දවිහාරයේ විසූ බුලත් ගම සිරිසුමනතිස්ස මහාස්ථවිරතුමා මූත්වහන්සේගේ හිතවත් මිත්‍රයෙක් විය. මේ කාලයේදී මූත්වහන්සේ බුලත්ගම මහා ස්වාමීන් හා සාකච්ඡාකොට එකල පැවති අධිමාසවාදසීමවාදාදිය නිසා භෙදවූ සංඝයා එක්සත්කරවීමේ මාර්ගී සෙවූ බව සියම්-බුරුමරටවලට යැවූ බොහෝ ලිපිවලින් පෙනේ. ඒ දෙනම එක්ව යෝජනාකරතිබෙන එක් උපක්‍රමයක් නම් සියමේ රාජපූජිතව පවත්නා ධම්මයුක්තික නිකායෙන් දශවර්ගාධික සංඝයාවහන්සේ ගෙන්වා මල්වතු-අස්ගිරි-කෝට්ටේ ආදි හැම පක්ෂවලටම අයත් සංඝයාට අලුතෙන් උපසම්පදාව දෙවා සමගිකරවීමයි. ඒ උත්සාහය අනුව සියම් මහරජුට ලියුම් යවා ඒ රජු විසින් තමාගේම තැවකින් ධම්මයුත්තික සඟපිරිසක් මෙහි එවතලද නමුත් මෙහි සඟපිරිස්වල එකමතිකත්වයක් ඇතිනොවූයෙන් ඒ කටයුත්ත සිදු නොවීය. මේ කාරණය යගිරල මහාස්වාමීන්ගේ ශ්‍රීසුමංගල

චරිතයේ ඇතුලත් ලිපිවලින් ද ප්‍රකටවේ. එහි ප්‍රථම කොටසේ අග තිබෙන සද්ධම්මසඞ්ගලදීපංකරහිමියන්ට යැවූ පාලි ලිපියෙන් එය ඉතා පැහැදිලිවේ.

එහි තිබෙන ගාථා දෙකක් මෙසේයි:-

1. "මඤ්ඤන්ති එතරහි යෙ යතයො පසිද්ධා
සික්ඛාය ගාරවයුතා පටිපත්තිකාමා
හුත්වාන තෙ බහුවිධා ඉධ ගුම්බගුම්බා
ආචිණ්ණකප්පකලුසස්ස පවාහනාය

2. සංගම්ම තෙ ඉධ මයා පි ච මන්තයන්ති
සද්ධම්මයුත්තිකතිකායික සුද්ධිමෙකං
ගණ්හාම තො ඉති පවත්ත කථාවසෙන
සංඛෙපතො ඉධ ලිඛාමි හි තං පවත්තිං."

ක්‍රමයෙන් මූත්වහන්සේගේ කීර්තිය ලක්දිව සැමතැන පැතිර ගිය බැවින් ඉද්දමල්ගොඩ දිශාපතිතුමන් ඇතුළු සබරගමුවේ රදළ මහතුන්ගේ ඉල්ලීම ලෙස 1867 දී මූත්වහන්සේට ශ්‍රීපාදස්ථානයේ නායකපදවිය පවරනලදී. 1870ව පමණේදී කොළඹ විසූ දොන් පිලිප් ද සිල්වා ඇපා අප්පුහාමි, අන්ද්‍රිස් ප්‍රේරාධර්මගුණවර්ධන මූහන්දිරම් මහතා, දොන් කරෝලිස් හේවාවිතාරණ ආදි මහතුන්ගේ ඉල්ලීම ලෙස ගාල්ලෙන් අස්ව කොළඹට පැමිණ කොටහේනේ පරමානන්දවිහාරයෙහි තැවතී සුළුවශයෙන් ඉගැන්වීමක් ආරම්භ කෙළේය. 1873 දී විද්‍යෝදය පිරිවෙණ පිහිටි තැන නිත්‍යවාසයට පැමිණ එහි ඉගැන්වීම පටන්ගත්තේය. අද ලක්දිව ප්‍රධාන පිරිවෙණබවට පත්ව තිබෙන්නේ ඒ කාලයේදී ඉතා සුලුවශයෙන් පටන්ගත් මේ පිරිවෙණයි.

ක්‍රමයෙන් දියුණුවූ මේපිරිවෙණේ කීර්තිය පරදේශවල ද පැතිරගියෙන් සියම්-බුරුම-කාම්බෝජ-ජපන් ආදි රටවලින් ද ශිෂ්‍යයෝ පැමිණෙන්ට වූහ. කල්කටාවේ මහාමහොපාධ්‍යාය සතීශ චන්ද්‍රවිද්‍යාභූෂණ පඬිතුමා ද කෝසම්බී ධම්මානන්ද නමින් කලක් පැවිදිවී සිටි මහාචාර්යතුමා ද මෙතුමාගෙන් පාලි උගත් භාරතීයයෝ වූහ. ජේම්ස් ද අල්විස්, ටී. බී. පානබොක්කේ යන මන්ත්‍රීවරුද මුලින්ම සඳරුසේ කතෝලිකය දරූ වේරගම බොඩිනායක පුංචි බණ්ඩාර මහතාද මූත්වහන්සේගේ ගිහි ශිෂ්‍යයන් අතරවූහ. මහාවංශය ඉංග්‍රීසියට නැගූ ලූයී විජයසිංහ මුදලිතුමා හා ගාල්ලේ ඊ. ආර්. ගුණරත්න වාසලමුදලිතුමා බෞද්ධයන් බවට පත්කළේ මූත්වහන්සේ යයි කියත්.

1888 දී චූලාලංකාර සියම් මහරජු විසින් මේ පිරිවෙණේ දියුණුව පිණිස රුපියල් දසදහසක පරිත්‍යාගයක් කරනලදී. අදත් ස්‍යාම රාජත්‍යාගය දෙනුලබන්නේ ඒ මුදලේ පොලියෙනි. වර්තමානයුගයේදී ලක්දිව පහළවූ ආදිම සඟරාවයයි කියයුතු සමයසඟරාව මුන්වහන්සේගේ උපදෙස් අනුව 1873 ජනවාරි මාසයේදී පිටකරනලදී. 1882 දී සරසවිසඳරැස පත්‍රය පටන් ගන්නාලද්දේත් මුන්වහන්සේගේ මෙහෙයීමෙනි.

ගාලුපලාතේ ප්‍රධාන සංඝනායක පදවිය ඉසුළූ මහගොඩ ධම්මදස්සී ස්ථවිරතුමාගේ ඇවෑමෙන් 1880 දී ඒ පදවිය ශ්‍රීසුමංගල මාහිමියන්ට පවරණලදී. කෝට්ටේ මහාවිහාරාධිපතිව වැඩවිසූ බලිගස්පේ මංගලනායක මහාස්වාමීන්ගේ අපවත්වීමෙන් හිස්වූ කොළඹ නවකෝරළේ නායක පදවියටද 1890 වේදී මුන්වහන්සේ පත්කරනලදහ. ඉන් පසුකලක මල්වත්තේ සංඝසභාවේ උපාධ්‍යාය පදවියක් ද "ත්‍රිපිටකවාගීශ්වරාචාර්ය" උපාධිය ද ඒ සංඝසභාව විසින් දෙනලදහ.

1901 දී පළවූ ශ්‍රීසුමංගලචරිතයෙහි මෙසේ දැක්වේ:– "ක්‍රිස්තුවර්ෂ 1855 මහනුවරදී කළ ධර්මසාකච්ඡාවකදී මුන්වහන්සේ ධර්මවිනය පෙන්වා අධර්මපක්ෂය මැඩ පැවැත්වූ බැවින්. මල්වතු විහාරවාසී මහානායක-අනුනායකස්ථවිර ප්‍රමුඛ කාරකසංඝසභාව විසින් වටාපත් - පටසිවුරුආදියෙන් පුද, මල්වතුවිහාරය පටන් පේරාදෙණිය දක්වා මහපෙළහරකින් වැඩමවාගෙණගොස් මේ ශතවර්ෂයේදී පෑතරට මහණුන්නාසේ කෙනෙකුට නොසැළ තරම් ගරුබුහුමන් මේ නායකස්ථවිරපාදයන් වහන්සේට කරණලද්දේය." මේ ධර්ම සාකච්ඡාව නම් බෙන්තර අත්ථදස්සීමහා ස්ථවිරතුමන් මහනුවරට ගෙන්වා අභිමානවාදයට විරුද්ධව සුමංගල මහාස්ථවිරතුමන් ලවා කරුණු කියවීමයයි යගිරල මහාස්වාමීන්ගේ ශ්‍රීසුමංගලචරිතයෙන් දතහැකිව තිබේ.

1901 කේ පළවූ පොතෙහි පහළ පෙනෙන කාව්‍ය ද විද්‍යමාන වෙති:– "ක්‍රිස්තියානීන් විසින් බුද්ධාගමට විරුද්ධව අච්චුගස්වා ප්‍රසිද්ධ කරණ පොත්වල නිස්සාරතාවය පෙන්වා බුද්ධාගමේ වර්ධනය සඳහා පොත්පත් අච්චුගස්වා පළකිරීමට අච්චුකන්තෝරුවක් තැබීම අවශ්‍යබැව් ගාල්ලේ පරමානන්දවිහාරාධිපති ගෞරවාර්හ ධර්මාලංකාර ශ්‍රී සුමනතිස්ස මහාස්ථවිරපාදයන්වහන්සේ හා සමග සාකච්ඡා කිරීමෙන් මෙම බුලත්ගම මහාස්ථවිරයන්වහන්සේගේ ප්‍රධානත්වය පිට ලංකෝපකාර අච්චුකන්තෝරුව පිහිටුවන ලද්දේය. ක්‍රිස්තියානීන්ගේවාද අභිභවනය පිණිස අච්චුගස්වා ප්‍රසිද්ධකරණලද සුදර්ශනය, ලබ්ධිතුලාව, ආගම පරීක්ෂාව, බෞද්ධාග්නාරය යනාදි



අඹගහවන්තේ ඉන්දසභවරඤාණසාමි
නායක මාහිමියෝ



කතළුවේ ශ්‍රී ගුණරතන තිස්ස
නායක මාහිමියෝ



මිරිස්සේ ධම්මානන්ද නායක මාහිමියෝ



හික්කඩුවේ ශ්‍රී සුමඞ්ගල නායක මාහිමියෝ



වංගජාතික කෘපාවරණ
මහා ස්ථවිර තුමා



බුලත්ගම ධම්මාලංකාර
සිරි සුමන තිස්ස මාහිමියෝ



දෙඩන්දූවේ ශ්‍රී පියරතන තිස්ස නායක මාහිමියෝ



වැලිගම ශ්‍රී සුමඞ්ගල නායක මාහිමියෝ



රන්දෙඹේ ධම්මාලංකාර නායක මාහිමියෝ



වස්කඩුවේ ශ්‍රී සුභූති නායක මාහිමියෝ



රත්මලානේ
ශ්‍රී ධර්මාරාම නායක මාහිමියෝ



අලුත්ගම ශ්‍රී සීලක්ඛන්ධ නායක මාහිමියෝ



පෝරඹ ශ්‍රී ධර්මාධාර රාජගුරු මාහිමියෝ



කහවේ ශ්‍රී රතනසාර නායක මාහිමියෝ



ශ්‍රී දෙවානන්ද උප සංඝරාජ මාහිමියෝ



ලුණුපොකුණේ
ශ්‍රී ධර්මානන්ද නායක මාහිමියෝ



පණ්ඩිත තිලක කොග්ගල
ගුරුතුමා



බටුවන්තුඩාවේ ශ්‍රී දේවරක්ෂිත
පඬිතුමා



විල්හෙල්ම් ගයිගර් පඬිතුමා

පොත්වලටත් "ලංකාලෝකය" නම් ප්‍රවෘත්තිපත්‍රය පළකිරීමටත් උපදෙස් දුන්නේය. බෞද්ධක්‍රිස්තියානි දෙපක්ෂය අතර බද්දේගම සිදුවූ ආගම්වාදයකදී ක්‍රිස්තියානීන් විසින් ලියවිල්ලකින් අසනලද ප්‍රශ්නයකට මිනිව්වූ 45ක් ඇතුළතදී පුල්ස්කැප් කඩදහි පිටු 11කින් යුත් උත්තර ලියුමක් ලිවුවේය. බෞද්ධ-ක්‍රිස්තියානි දෙපක්ෂය අතර සිදුවූ ලොකප්‍රසිද්ධ පාණදුරාවාදයේදී බෞද්ධපක්ෂයේ කථාකාර බෞද්ධවාගීශ්වර ප්‍රසිද්ධ මොහොට්ටිවත්තේ ගුණානන්දසාමින්නාන්සේ තමන්ට උපකාර පිණිස මේ නායකස්ථවිරපාදයන් වහන්සේ වැඩමවාගෙණ ගියේය"

"මුන්වහන්සේ ලක්දිව උපාලිවංසික (සියම් සමාගමේ) භික්ෂූන් අතුරෙහි කල්‍යාමෙන් හටගත් විනයට වැරදි හැසුරුම් දූක ධර්මයෙන් විනයෙන් ආදරසිත් පෙරදූරිව අවවාදකොට මනා ශාසන චාරිත්‍ර පුරුදු කරවූයේය. ඒ කාලයෙහි විහාරයේදී මෙන් සිවුරු එකාංශකොට පෙරවා ඇතුළුගම්හිත් හැසිරෙණ භික්ෂූන්-වහන්සේලාට බුදුන්ගේ විනයානුකූල වූ සුපටිච්ඡන්නපාරුපණය කරන්ටයයි අවවාද කරමින් තමන්වහන්සේත් ඒ සුපටිච්ඡන්නය (ගැටවට්ටුව) පටන් ගත්තේය."

"ඉද්දමල්ගොඩ අභයකෝන් අතපත්තු මුදලිතුමා විසින් කරවනලද පොත් සංගායනාවේදී ඒ සම්බන්ධ කටයුතුවල ප්‍රධානියෙකු ලෙස මුන්වහන්සේ පත්කරගන්නා ලද්දේය." මෙය සිදුවූයේ ක්‍රි. ව. 1857 දීය.

"චූලාලංකාර සියම් රජතුමා ලඞ්කාවට ආ ගමන නායකස්ථ-විරයන් වහන්සේ රජගෙදරටම කැඳවා පිළිසඳර කථාකෙළේය. ඔබවහන්සේගේ කීර්තිය අපරටේත් සඳරුස්මෙන් පැතිර තිබේ. ..........ඒ මහරජතුමා මෙසේ ප්‍රීතිවාක්‍ය පහළකෙරෙමින් කොසෙය්‍යසිවුරුවලින් යුක්තවූ අටපිරිකරක් පූජාකෙළේය." මෙය සිදුවූයේ 1896 යේදීය

"දළදාවහන්සේට පුදනු පිණිස නොයෙක් රුවනින් විසිතුරු කොට විශ්වකර්ම නිර්මිතයක් මෙන් දක්ෂශිල්පීන් විසින් නිමවනලද දෙරියන් පමණ උස්වූ ගතරත්මුවා මහකරඬුවක් රුහුණ සංඝනායකධුරන්ධර වජිරාරාමරාජගුරු මහතෙරුන්වහන්සේ ප්‍රමුඛ ශික්ෂාකාමී භික්ෂූන්වහන්සේලාගෙන් ද රාජකුමාර-කුමාරිකාදීන් ගෙන් ද යුත් දහසක් පමණ ජනයෝ බුරුමරටින් අවුත් දළදා මන්දිරයට යන ගමන් නායකස්ථවිරපාදයන්වහන්සේ දකිනු පිණිස විද්‍යෝදය පිරිවෙණට පැමිණ එහි ලැගුම් ගත්හ. නායක ස්ථවිරපාදයන්වහන්සේ ඒ සියලුදෙනාටම සුදුසු පරිද්දෙන් සංග්‍රහ

සභාදිය දෙවා ආගන්තුක සත්කාර කරවූයේය. ඒ සියල්ලෝම උන්වහන්සේ කෙරෙහි ප්‍රසන්නව මාහැඟි පටසිවුරු ආදිය පුදමින් ආශීර්වාද කළෝය."

"රුෂියන් ආණ්ඩුවට අයිති සයිබීරියාවේ පත්ලක්ෂයක නායක වූ වාගීන්ද්‍ර ධර්මාධාර මහාපණ්ඩිත චක්‍රවර්ති නම් ශ්‍රමණොත්තමකෙනෙක් රුෂියන් කුමාරයෙකු හා ලංකාවේ රුෂියන් නානාපතියත් කැටුව 1901 දී පිරිවෙණට පැමිණ පිළිසඳර කථාකොට පැහැදී ඒ රටේ උත්තමයින්ට කරණ ප්‍රධාන වැදගත් පූජාවකැයි රත්රන් කරඬුවක් සහිත පොතක් ද අනර්ඝ පටවස්ත්‍රයක් ද පූජාකෙළේය."

මෙසේ අනල්ප ලෝකශාසන සංග්‍රහකළ මූන්වහන්සේ සුවාසූ වයස්වනතුරුත් උද්‍යෝගීව ක්‍රියාකොට 1911හේ අප්‍රේල්මස 21 වෙනි දින රෝගීව ඒ මස 29 වෙනිදා රාත්‍රි එකට පමණ අපවත්වී වදාළාහ. ආදාහනෝත්සවය මැයිමස තුන්වෙනි දින අතිගම්භීරාකාරයෙන් කොළඹ කනත්තේ සොහොන් භූමියේදී සිදුකරනලදී.

මූන්වහන්සේ විසින් (1) වර්ණප්‍රශ්නය, (2) සන්ධිග්‍රන්ථය, (3) සත්‍ය සංග්‍රහය, (4) බ්‍රහ්මධර්මය, (5) ආඛ්‍යාත ව්‍යාඛ්‍යාව, (6) සිදත්සඟරා සන්නය, (7) වර්ණරීතිය, (8) කාව්‍යශේඛර සන්නය, (9) මාසර්තුලක්ෂණය, (10) බාලාවතාරයට සුබෝධිකා නමින් විශාල ටීකාවක් සම්පාදිතවිය සීමාවිභාගය ආදි පොත් සම්පාදිත වූහ. බටුවන්තුඩාවේ පඬිතුමා හා එක්ව පාළිමහාවංසය ශුද්ධකොට දුන්නා පමණක් නොව එය සිංහලට නැගීමේ බැරෑරුම් කාර්‍යයද ඉටුකළහ.

මූන්වහන්සේගේ සවිස්තර චරිතපොත් ඇති බැවින් අපවිසින් මීට වැඩි විස්තරයක් ලියයුතුයයි නොසිතමි

## 27. අඹගහවත්තේ ඉන්ද්‍රාසභාවර ඤාණසාමි නායක මහාස්ථවිරතුමා

(බු. ව 2376 - 242[illegible])

මෙකල "රාමඤ්ඤ නිකාය" යයි ලක්දිව ප්‍රකටව පවත්නා නිකාය පිහිටුවීමේ මූලිකයා වූ මේ මහා ස්ථවිරතුමා ගාලුපලාතේ අක්මීමන නම් ගමේ "අඹගහවත්ත" යයි ප්‍රකට ඉඩමේදී බුද්ධ වර්ෂ 2376 ඉල් මාසයේදී උපන්නේය. "දොන් මතෙස් ද සිල්වා මදනායක රාළහාමි," ඉදිපල වැලිච්චගේ ලෙනෝහාමි රත්නායක මැතිණිය" යන දෙදෙන මෙතුමාගේ දෙමව්පියෝ වූහ. මහමෝදර විහාරස්ථානයේ විසූ පිලාණේ මහාස්ථවිරයන් වහන්සේ ලවා මෙකුමරුට කුඩා කාලයේදී අකුරු උගන්වනු ලැබීය.

පිලානේ මහාසථවිරතුමා මෙකුමරු මහණකමට යෝග්‍ය බව දැන දෙමව්පියන්ගේ අනුමතිය ලබාගෙන ගාල්ලේ තුවක්කුගල එත්තේ විහාරාධිපතිව වැඩ විසූ අක්මීමන සොභිත මහාසථවිරතුමන්ට බාරකෙළේය. ටික කලකට පසු ඒ මහාසථවිරතුමා මෙකුමරු පැවිදි කොට සරණංකර යන නම තැබීය. එකල ගාලුපලානේ උගතෙකු සේ ප්‍රකටව සිටි "ප්‍රපතෙත්ත" රාළහාමිගේ මෙහෙයීම ලෙස මේ හෙරණ තම වැඩිදුර ඉගනීම සඳහා පණ්ඩිතාචාර්ය බෙන්තර අත්ථදස්සී මහාසථවිරතුමන් වෙත ගුරුවර දෙමාපියන් විසින් පමුණුවන ලදී.

විසිවයස් පිරුණු කල්හි සියම්නිකායෙන් උපසම්පදාව ලබාගත් නමුත් එකල මල්වතු-අස්ගිරි විහාර අතර ඇති වූ සීමා විවාදදිය නිසා කලකිරීමට පත් මෙතුමා ගාල්ලේ පරමානන්දවිහාරයෙහි විසූ බුලත්ගම ධම්මාලංකාර සිරි සුමනතිස්ස මහතෙරුන් වෙත එළඹ අමරපුරනිකායේ පැවිද්ද ලබා ගත්තේය.

මෙකල බුරුම රටට ගොස් පැවිදි උපසම්පදාවත් ලබාගෙන ආ වනරතන - ධම්මක්ඛන්ධ දෙනම ගාල්ලේ දී මුණ ගැසී ඒ රට ප්‍රවෘත්ති දැන ගෙන එහි යනු කැමතිව දීපේගොඩ සීලක්ඛන්ධ, පැල්පොල දම්මදස්සී යන භික්ෂු දෙනමක් ද වැලිගම ධම්මපාල, කෝදාගොඩ සුමංගල යන සාමණේර- දෙනමක් ද කැපකරුවන් දෙදෙනෙකුත් ද සමග බු ව. 2404 නිකිණි මස අවවිශේනියලත් ගුරුදින[1] ගාල්ලෙන් නැව් නැගී කල්කටාවට පැමිණ[2] එහිදී හමුවූ චන්ද්‍ර නමැති කුසිනාරාවේ උපන් බෞද්ධොපාසකයකු කැටිව ආරකන්රට ධඤ්ඤවතී නුවරට පැමිණියේය.[3]

එහි වැසි භික්ෂූන්වහන්සේ සමග සාකච්ඡා කරමින් ටික දිනක් වැස නැවත එයින් නැව් නැගී හංසවතී නුවරට පැමිණ තිස් දිනක් පමණ නැවතී සිට එනුවරින් නැව් නැගී එකල බුරුම රට අගනුවර වූ රතනාපුණ්ණ- (=මන්ඩලේ), නුවරට සම්ප්‍රාප්තවිය. එනුවර වැඩවිසූ "ඤෙය්‍යධම්මාභි මුනිවර ඤාණකිත්තිසිරිපවර"

1 1908 නොවැම්බර් මස පළවූ "ඤාණොපායනී" සඟරාවේ තිබෙන්නේ මේ දිනමයි. 1926 ජූනි 26 වෙනිදා "ලක්මිණ" පත්‍රයේ පළවූ ලිපියක කියවෙන්නේ "වප්මස අව එකොළොස්වක් ගුරුදින" යන ලෙසිනි. කොයිඑක සැබෑදැයි නොදනිමු.

2. "ඤාණොපායනී" සඟරාවේ කියවෙන්නේ "දඹදිව ගෞඩදේශයෙහි බංගාල්නුවරට පැමිණ එහි කොසිනාරක භික්ෂූන් වසන විහාරයකට පැමිණ තිස්දිනක් පමණ වැස.........බංගාල්නුවරින් නික්ම" යන ආකාරයෙනි.

3. මේ විස්තරය 1958 පෙබරවාරි 3 ද පළවූ විදූරණ්‍ය සඟරාව අනුව ලියන ලදී.

සංඝරාජයන් වහන්සේ වෙත එළඹිවිට සංඝරාජතුමා ආගන්තුක සත්කාර කරවා නවාතැන්දී මේ පිරිස පැමිණිබව මහරජතුමාට දැනුම් දුණි. එවිට රජතුමා මේ පිරිස රාජමන්දිරයට කැඳවා පැමිණි තොරතුරු විචාළවිට පිරිසිදු උපසම්පදාව ලබනුකැමැත්තෙන් ආබව අසා ප්‍රීතියට පත්ව මේ පිරිසේ අදහස ඉටුකරදෙනසේ සංඝරාජ මාහිමියන්ට දන්වා බු. ව. 2405 හේ පොසොන්මස පුරවිසේනියලත් කුජදින විසුංග්‍රාම සීමාව වූ සංඝරාජාරාමයේ දී සංඝරාජතුමන් උපාධ්‍යාය කොට මේ පිරිසට උපසම්පදාව දෙවිය* කලින් අරකන් රටේදී පැවිදිව සිට සිවුරු හැරි අනෙක්වූ යථොක්ත කුසිතාරාවේ උපාසකයාද මේ අවස්ථාවේදී පැවිදිවී උපසම්පදාව ලැබීය.

උපසම්පදාව ලැබූ සරණංකර භික්ෂූනමට ඉන්දාසභවරඤාණ සාමි යයි ද සීලක්ඛන්ධභික්ෂූනමට සද්ධම්මවර ජෝතිපාල යයි ද, ධම්මදස්සී භික්ෂුවට ජම්බුධජ-ඤාණරංසි යයි ද, ධම්මපාලභික්ෂුවට උක්කංස-පරමසාරගවෙසී යයි ද, සුමංගල භික්ෂුවට ජිනවංස-ධම්මරක්ඛිත යයි ද කොසිතාරක භික්ෂුවට පුණ්ණාචාර ධම්මධාරී යයි ද ඒ සංඝසභාව විසින් නම්දෙන ලදී. උපසම්පදාව ලබා එක් වර්ෂයක් පමණ ගතවෙනතුරු මේ පිරිස සංඝරාජයන් වෙත වසමින් උගත යුතුදේ ඉගෙනගත්තෝය. මේ කාලයතුළදී බුරුමබසින් ලියා තිබුණු එරට ශාසනවංශය "පඤ්ඤාසාමිසිරිසාවිධජ මහාධම්මරාජ ගුරු" නමැති සංඝරාජයන් වහන්සේගේ ප්‍රධාන ශිෂ්‍යතෙරනම ලවා පාලිභාෂාවට පෙරළවා ගත්තාලදී. ඒ පොතෙහි මේ පිරිස ගැන ලියමින්: "තතො පච්ඡා ච කලියුගෙ ද්වාවීසාධිකෙ විඞසසසතෙ සහස්සෙ ච සම්පත්තෙ මාඝමාසස්ස කාලපක්ඛ එකාදසමියං සීහළ-දීපතො යෙව ද්වෙ භික්ඛූ තයො සාමණේරා චත්තාරො උපාසකා සරජත-සුවණ්ණකරණ්ඩකං, සරජතසුවණ්ණචෙතියධාතුං, හත්ථි-දන්තාමයං බුද්ධරූපං, මහාබොධිපත්තානි, මහාබොධිනවං, මහා බොධිපතිඨානභූමිං, සීහළදක්ඛිණසාඛාබොධිපත්තානි දුතියසත්ථා භාය අභිමිසඨානභූමිං ච ධම්මපණ්ණාකාරත්ථාය ගහෙත්වා රතන-

---

* යථොක්ත "ඤාණොපායනී" සඟරාවේ තිබෙන "රාමඤ්ඤනිකායේ කතිකාවත" නමැති ලිපියේ තියවෙන්නේත් 2405 වෙසක් මස පුරදශවක් නිපියලත් දින" උපසම්පදාව ලැබූ බවයි. ඒ නිකායිකයන්ම ලියා තිබෙන "බෞද්ධ සහෝදරයා" සඟරාවේ පළවූ ජායාරූපයක යටිස් පෙනෙන්නේ ක්‍රි ව 1861 ජූනි 12 වෙනිදා උපසම්පදාව ලැබූ බවයි. එය පොසොන් මාසයයි ලිපිවල මේ විසදෘශත්වය කුමක්හෙයින්දැයි නොදනිමි. ඒ කතිකාවත් ලිපියෙහි සීමාව ගැන කිසිවක් කියා නැත. "විංසුගාම සීමාව" හෙවත් රාජනිසමයෙන් ඒ සඳහා වෙන්කළ ග්‍රාම සීමාව පසුකලක මේ නිකායිකයන්ට රුචිනොවූ බැවින් එය හැරදමන ලදැයි සිතේ බුරුමරටේ රතනාපුණ්ණනුවරට රාමඤ්ඤ සම්බන්ධයක් නැත. ඒ සම්බන්ධය ඇති වූයේ පුවක්දණ්ඩාවේ පඤ්ඤානන්දහිමියන් ප්‍රමුඛ පිරිස හා එක්වීමෙනි.

පුණ්ණං නාම මහාරාජධානිනගරං සම්පත්තා. තෙසම්පි ධම්මරාජා එතුහි පච්චයෙහි සංගහං කත්වා සංඝරඤෙඤ ආරාමෙ වසාපෙසි භික්ඛුනං ච පුත්තසික්ඛං ගණ්හාපෙසි, සාමණේරානං උපසම්පිද-කම්මං ගහඩානං ච පබ්බජ්ජකම්මං ගණ්හාපෙසි." (=ඉත්පසු බු. කලියුගයේ 1222 කේ උඳුවප්මස අවපක්‍ෂයේ එකොළොස්වෙනිද, සිංහලද්වීපයෙන් භික්‍ෂූහු දෙනමක් ද සාමණේරතුන්නමක් ද උපාසකයෝ සතරදෙනෙක් ද රන්රිදීදෙකින් නිමවූ ධාතුසහිත කරඬුවක් ද ඇත්දත් බුදුරුවක් ද මහාබෝධියේ කොළ හා පොතු ද එය පිහිටි තැන පස් ද දක්‍ෂිණශාඛාබෝධියේ කොළ ද අනිමිසලෝචන සතිය පෙන්වන රූපයක් ද දහම්පඩුරුවිශයෙන් රැගෙන රතනා පුණ්ණ මහාරාජධානියට පැමිණියාහ ධාර්මික මහරජතුමා ඔවුන්ට සිවුපසයෙන් සංග්‍රහකොට සංඝරාජාරාමයෙහි වාසයකරවා භික්‍ෂූන්ට පුත්තශික්‍ෂාව ද සාමණේර වරුන්ට උපසම්පදාව ද ගිහියන්ට පැවිද්ද ද ගැන්විය) යි කියනලදී. මේහි කියවෙන බුරුම වර්‍ෂය ක්‍රිස්තු වර්‍ෂයෙන් 1860 බව පෙනේ. ඒ පොතේ අවසන්හි:

"ලංකාගතෙන සනෙතන චිත්‍රඤාණෙන භික්ඛුනා
සරණංකරනාමෙන සඩම්මඨිතිකාමිනා
දූරතො යෙව දීපම්හා සුමංගලෙන ජොතිතා
විසුඩසීලිනා චෙව දීපන්තරඤ්ඤභික්ඛුනා
අජ්ඣෙසිති චාභියාචිතො පඤ්ඤසාමීති නාමකො
අකාසි සුබුඩං ගන්ථං සාසනවංසප්පදීපිකං"

යන ගාථා පෙනේත්

ඉක්බිති සියරටට එනු කැමති බව මහරජතුමන්ට හා සංඝ රාජතුමන්ට දන්නූවිට ගමනට උවමනා දේ සපයා දෙනලද්දේය. පොත්පත්-පිළිම-අටපිරිකර ආදිය පුදනලද්දේය. ඒ බඩු සහිත පිරිස ආරක්‍ෂා සහිතව ගාලූවරායට පමුණුවනයේ ඉල්ලා එකල රත්ගුමේ විසූ ඉංග්‍රීසි ආණ්ඩුකාරතුමාට ලිපියක් ද මහරජතුමා එවිය. මන්ඩලේ නුවරින් නැව්නැගී එරාවතී ගඟේ යාත්‍රාකොට රත්ගුන් නුවරට සපිරිමෙරින් පැමිණි ඉන්දසභ සද්ධර්මතුමා හංසා-වතී නුවරට ගොස් ධම්මචේතිය මහරජු විසින් ලක්දිවින් උපසම්පදාව ගෙන්වා ඒ භික්ෂූන් ලවා බැන්දවූ කල්‍යාණිසීමාවේදී දළ්හිකම් ලැබිය. ඒකාධ්‍යුත්ත අවසන්කොට රත්ගුමේ ආණ්ඩු කාරයාට දන්නූවිට ඒ ආණ්ඩුකාරතැන මිද්‍රාසියේ ආණ්ඩුකාරයාට ලිපියක් දී මේ පිරිස මිද්‍රාසියට යැවීය. සොළොස්දිනක් එහි නැවතීමෙන් පසු ලක්දිවට එවනලැබූ මේ පිරිස ගාලූවරායට පැමිණ බුලත්ගම සිරිසුමනතිස්ස මහාසාමීන්ට අයත්ව තිබුණු විජයානන්ද විහාරයෙහි නැවතුණි.

මෙහි පැමිණි මේ පිරිස "ලක්වැසි සියම් අමරපුර සමාගම් දෙකෙහිම කිසිවෙක් සමග ධර්මාමිසසම්භෝගයෙන් මදකුදු නැතිව ................. වාසයකළාහුය" යි රාමඤ්ඤනිකාය කතිකාවත සෑදූවන් කියතත් එය සත්‍යයෙන් ඇත් බව ඓතිහාසික ලිපි කියවන්නන්ට පෙනේ. බුරුම රාමඤ්ඤ දෙරවේදී මේ පිරිස උපසම්පදාව ලබාගත්තේ පෙර අමරපුර නිකායිකයන් හා කල්‍යාණි වංශ නිකායිකයන් උපසම්පදාව ලබාගත් තෙරවරුන්ගේ ශිෂ්‍යයන් ගෙන්මය. එබැවින් මේ පිරිසට අමුතු පිරිසිදු එකක් ලැබුණායයි ඔප්පුකරන්ට උත්සාහගැනීම නිෂ්ඵල එකකි.

මින්පසු බු. ව. 2406 දී බැදිගම සොභිත පුවක්දණ්ඩාවේ පඤ්ඤානන්ද දී අටලොස්නමකින් යුත් භික්ෂුපිරිසක් දොඩන්දූවේ ශෛලබිම්බාරාමයේ විසූ කල්‍යාණිවංශික සංඝපිතෘදෙනමගෙන් ද ගාල්ලේ විසූ අමරපුරවංශික බුලත්ගම හිමියන්ගෙන් ද සන්දේශ රැගෙන රාමඤ්ඤරටට ගොස් එරට සංඝනායක සධම්මවර මහාස්වාමීන්වහන්සේ ප්‍රධාන 150 නමක් පමණ වූ මහාසංඝයා වෙතින් උපසම්පදාව ලබාගෙන මෙහි පැමිණියේය. ඒ ගමනේ විස්තරය මිරිස්සේ ධම්මානන්ද නායකමාහිමියන්ගේ චරිතයෙන් බලාගත හැක.

බුලත්ගම ධම්මාලංකාරසිරිසුමනතිස්ස මහාස්වාමීන්වහන්සේ එකාහි නානානිකායික බොහෝ දෙනෙකුන්ගේ හිතවතෙක් වූහ. අම්බගහවත්තේ ස්වාමීන්වහන්සේ උන්වහන්සේගේ ශිෂ්‍යභාවෝපගතව සිටියෙකි. රත්නපුර නුවරින් උපසම්පදාව ලබාගෙන අං අම්බගහවත්තේ ස්වාමිපාදයන් ප්‍රමුඛ ඒ පිරිස ඉතා කුඩා බැවින් විනයකර්මාදිය කරගැනීම අපහසුවිය. එබැවින් ඒ පිරිසත් මාතර නිකායේ පිරිසකුත් මිරිස්සේ ධම්මානන්ද නායකමාහිමියන්ගේ පාලනය යටතේ පවත්නා පුරාණ කල්‍යාණවංශයට එක්කිරීමට බුලත්ගම ස්වාමිපාදයෝ උත්සාහවත් වූහ. ඒ බව මෙහි පහත දැක්වෙන ලියුමෙන් පැහැදිලිවේ:--

"ප්‍රියසීලිවූ අපේ උඩුගම්පිටියේ ස්ථවිරයන්වහන්සේ ප්‍රධාන කොට අපේ පියරතනනැත විසින්ද බලාවදාරණ පිණිසයි.

හංසාවතියට ගොස් උපසම්පදාව ඇවිත් සිටින අපේ සභාග පිරිසිදු අභිනව උපසම්පදා සංඝයා දසවිසිනමින් ඇතිව අපේ සමාගමේ අමරපුර ආචාර්යපරම්පරාවේ කරගෙන එන දල්හීකර්මයක් කර සියළු මුළු සමාගමම එකවිට බැරිනුමුත් කොටවෙනස් අපි වස් එක අදහමකින් සමගිව එකාකාරයකින් පවතින්ට සුදුසුව මේ කාලයට පෙනෙනවාය.

ඒ බව මුලිනුත් මමත් කියලත් ඇති අඹගහවත්තේ තැනලාත් කිවාත් ඇති. වැලිගමතැනලා අපිත් දැනට කථාකර ගත්තාය ඒ නිසා අපායුස්මතුන්ලා දෙනම මේ වග හිතට ගෙන මිරිස්සේ අපේ නායකස්ථවිරසාමීන් සමගත් කථාකරගෙන එන පසළොස්වක් දින දී රැස්වෙන සංඝයාවහන්සේ හා සමගත් කථා කර තීන්දු හොඳ උත්තර ලැබෙන ලෙස හිත්වලට ගෙන දූත් පටත් ඒට නිසි නිසි ඇත්තන් සමග කථාකර සූදානම්ව ක්‍රියා සිඩියට නිසිලෙස කල්පනාකර වදාරන්ට කලින් සැලකර එවීමි; වැලිගමතැනගේත් කල්පනාව එකතුවයි මෙසේ දැනුන්දුන්නේ.

පාතඳුරා වඩිනබව දැනගත්නිසා අදම ලියා එවුවාය. මීට එතකල් හොඳ උත්තර එවාලා වඩින්ට ඕනැය. මේ අභිප්‍රායේ ආනිසංසගුණ අප්‍රමාණව ඔතුමන්නට ඇතිබව නුවනින් සලකා වදාළමැනවි,

මේ විගට-අවංක සුමිත්‍ර,
බුලත්ගම උන්වහන්සේය.
(අත්සන) D. S. Sumanatissa.

18 $\frac{6}{11}$ 63 දින දීය."

මෙසේ මේ බුලත්ගම මහාස්වාමීන්වහන්සේ ආදී බොහෝ දෙනෙකුන්ගේ බලවත් ඕනෑකම ලෙස මාතරනිකායේ 16 නමක් ද අඹගහවත්තේ ස්වාමිපාදයන් ප්‍රමුඛ පස්නමක් ද කල්‍යාණිවංශයට ඇතුළත්කරගැනීම සඳහා දෙඹන්දූව ශෛලබිම්බාරාමයට රැස් වූ මහාසංඝයාවහන්සේ පුඩික්දණ්ඩාවේ පඤ්ඤානන්ද ස්ථවිරාදී අභිනව කල්‍යාණිවංශික භික්ෂූන් ද කැටිව ආරාමයට නුදුරු තැන උදකුක්ඛේපසීමාවට පැමිණ මිරිස්සේ ධම්මානන්ද නායකමාහිමියන් වහන්සේ උපාධ්‍යායත්වයෙහි තබාගෙන කල්‍යාණිවංශොපසම්පදා ඇති භික්ෂූන් ලවා කම්මවාක්‍ය කියවා දළ්හිකම්කොට ඒ මුලකී පිරිස්දෙක කල්‍යාණිවංශයට ඇතුළ්කරගත්හ.

ඒ අවස්ථාවේ දී ලියා අත්සන්කොට ශෛලබිම්බාරාමයෙහි තැන්පත්කිරීම සඳහා දුන් ලේඛනය මෙසේයි:—

"ශ්‍රී බුද්ධවර්ෂයෙන් 2407 වෙනි වර්ෂයෙහි ඇසළ මස පුර දෙවෙනි දින දෙඹන්දූව ශෛලබිම්බාරාමයෙහි දීය.

"මෙම ලඞ්කාද්වීපයෙන් මීට අවුරුදු සැටගණනක් පමණ කාලයෙහිදී මරම්ම-රාමඤ්ඤරට දෙකට ගොස් උපසම්පදා දළ්හීකර්මයන් ලබාගණ ලක්දිවට පැමිණ ප්‍රව්‍රජ්‍යොපසම්පදාදි කර්මයන් කොට ශාසනය ප්‍රතිෂ්ඨාකිරීමෙන් ඒකසම්භොගව විසූ ඒ ඒ ආචාර්‍ය්‍යවරයන් වහන්සේලාගේ ශිෂ්‍යපරම්පරානුගත සංඝයා

කලින් කල පිළිගන්නා ලද සමහර වාදවිවාදාදීන් කරණකොටගෙන මදකලක් අසමගිව විසීම ද එසේම සමගිව විසීමදැයි යනාදීන් සම්මිශ්‍රව පැවතුණේ වී නමුදු මූල් වංශයෙහි ප්‍රව්‍රජ්‍යොපසම්පදාදියට හානියක් නොව ඒ සියලු ස්ථවිරාදීන්ගේ හෙදවූ සමාගම පැවතුනාය.

"ඒ අතර අහංගම විහාරවාසී මාතර ධම්මාරාම ස්ථවිරයන් වහන්සේ විසින් හික්මවනලද ශිෂ්‍යානුශිෂ්‍යාදීන් සමග ඒ ස්ථවිරයන්වහන්සේගේ පක්ෂය පමණක් දළ්හීකර්මවාදාදිය නිසා හෙදව විසිපස් අවුරුද්දක් පමණ වෙන්ව පැවතුනාය.

"ඒ අතර අපේ අමරපුරසමාගමෙන්-ආචාර්යවරාදීන්ගෙන් ලියමන් ඇතිව මරම්මරාමඤ්ඤ රටදෙකට ගොස් උපසම්පදා දළ්හීකර්මයන් ලැබූ සද්ධම්මවරජෝතිපාල, ජම්බුධජඤාණරංසි, ඉන්දසභවරඤාණසාමි, කල්‍යාණිවංශසොභිත, කල්‍යාණිවංශපඤ්ඤානන්ද, කල්‍යාණිවංශගුණරතන, කල්‍යාණිවංශධම්මානන්දාදිවිසිඅටනමක්* භික්ෂූන් ඤෙය්‍යධම්මාභිමුනිවර ඤාණකිත්තිසිරිධජ ධම්මසෙනාපති මහාධම්මරාජාධිරාජගුරු මහාසංඝරාජ ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසින් ද, කල්‍යාණිවංශ සංඝනායක වනවාසී රාජගුරු මහාසද්ධම්මවංශ මහාස්ථවිරයන්වහන්සේ විසින් ද යථොක්ත භික්ෂූන්ගේ ආචාර්යවරාදි ස්ථවිරයන්වහන්සේලාට දෙවනු හාරදී එවාවදාරන්ට යෙදුනාය.

"එකල්හි ඉහතකී මාතර ධම්මාරාම ස්ථවිරයන්වහන්සේට පක්ෂව විසූ පැරැලියේ ජිනරතන ස්ථවිරයන් ද කහඳමෝදර ධම්මානන්ද ස්ථවිරයන් ද ගාල්ලේ සිරිසුමඞ්ගල ස්ථවිරයන් ද යන තුන්නම ඇතුළුවූ සොළොස්නමක් භික්ෂූහු පෙරකී ධම්මාරාම ස්ථවිරයන් විසින් උපදවනලද ආචාර්ය පරම්පරානුගත කර්මාහීවූ දළ්හීකර්මය අශුද්ධයයි ප්‍රකාශකිරීමෙන් සභාගනොව තුබූ ලබ්ධිය හැරදමා අම්බලම්ගොඩ අග්ගාරාමාධිවාසී සිරිමුනිවරසද්ධම්මවංස ධම්මානන්ද නායකස්ථවිරයන්වහන්සේ ප්‍රධානකොට ඇති සංඝයාවහන්සේ සමග සමගිසම්භෝගාදිය සඳහා යථොක්ත කල්‍යාණිවංශොපසම්පදා භික්ෂූන්ගෙන් මෙකියනලද උභය පක්ෂයෙහි† භික්ෂූහු සමාන ලබ්ධියෙන් යුක්තව සමගිකමින් දළ්හීකරණය පිළිගෙන මේ සියලු භික්ෂූන්ගේ සාමාග්‍රිකයෙන් යුක්තවූ ශික්ෂාසාජීවසංඛ්‍යාත ධාර්මිකසම්භෝගය සිද්ධඋනාය.

* අඹගහවත්තේ ස්වාමිපාදයන් ප්‍රමුඛ පිරිසත් පුවක්දණ්ඩාවේ ස්වාමිපාදයන් ප්‍රමුඛ පිරිසත් එක්කොට විසිඅටකැයි කියාතිබේ. ඒ පිරිස්දෙකේ උපාධ්‍යායවරයන්ගේ නම් ද එකට මිශ්‍රකොට ලියාතිබේ.

† උභයපක්ෂය නම් මරම්ම (රතනාපුණ්ණ) සට ගොස් උපසම්පදාව ලැබූ සද්ධම්මවරජෝතිපාලාදී පිරිස හා මාතරනිකායෙන් වෙන්වූ පිරිසයි.

"මේ සියලු කාරණා පණත්තමක් පමණ මහසඟමැද සිඩවූ බවට මෙහි අත්සත්කළේ,

කොග්ගල පඤ්චවුපාරාමවාසී ආරියවංශපාල කතලුවේ ධම්මරතන තෙරුන්නාන්සේ.
(අත්සන අරියක අකුරෙන්.)

සිප්කඩුවේ ජනනන්දාරාමාධිවාසී අලුත්තල සරණඞකරතිස්ස තෙරුන්නාන්සේ.
(අත්සන අරියක අකුරෙන්.)

පැරැලියේ පදුමගබ්භාරාමවාසී ජිනරතන තෙරුන්නාන්සේ.
(අත්සන සිංහලෙන්.)

කෝට්ටගොඩ සුදස්සනාරාමාධිවාසී ධම්මානන්ද තෙරුන්නාන්සේ.
(අත්සන අරියක අකුරෙන්.)

වැරැල්ලානේ තෙළුම්විල විහාරවාසී ගාල්ලේ ශ්‍රී සුමඞ්ගල තෙරුන්නාන්සේ
(අත්සන බුරුම අකුරෙන්.)

අම්බගහවත්තේ ඉන්දාසභවරඤාණසාමි.
(අත්සන සිංහලෙන්.)

පුවක්දඬාවේ කල්‍යාණිවංස පඤ්ඤානන්ද.
(අත්සන සිංහලෙන්.)"

මෙසේ කල්‍යාණිවංශයට ඇතුල්වූ සඟපිරිස් අවුරුදු කීපයක් ගතවනතුරු සංඝනෙතාවූ මිරිස්සේ මාහිමියන්වහන්සේට අවනතව උන්වහන්සේගේ රක්ෂාවරණය ලබාගනිමින් විසූහ. එසේ වසන කාලයේදී අම්බගහවත්තේ ඉන්දාසභ මහාස්වාමීන්වහන්සේ විසින් මිරිස්සේ මාහිමිතුමන් වෙත එවූ ලිපියකින් ඒ කාලයෙහි පැවති තත්වය අවබෝධ කටහැක්කේය.

"බුඩ 2408-10-7 දින— ක්‍රි: 1865-1-18 දින
පයාගල දීය.

සීලාදිනෙකගුණගණාභරණවිභූසිත අපේ මිරිස්සේ නායක සථවිරස්වාමිපාදයන්වහන්සේගේ ශ්‍රීපාදවන්දනාභිවාදනය කිරීමෙන් ලියාසැලකරසිටින වගනම්-

ස්වාමීන්වහන්සේ වෙත මාවිසින් එවනලද ලියමනට පිළිතුරු ද ලැබී මම ද මහත් ස්නෙහයකින් බලාගත්තෙමි. එහි සඳහන්ව තිබී ගිය අන්දමට මදක් කණගාටු ද වූයෙමි. එනම් අපේ

පියරතන වැලිගම උඩුගම්පිටියේ තුන්නමට එම පින්කම ඉෂ්ටකරදීමටත් ස්වාමීන්වහන්සේගේ අවසුවක් ගැන තැවින් සිටිනබවත් දැනගත් නිසාය ස්වාමීන්වහන්ස, ඉදින් යන් අවසුවකින් සාමිදරුවන් වහන්සේට මේ එන මාසේපෝයලත් සිකුරාදා සවස පටන් ධර්මදේශනාවට වැඩම්වන්නට බැරිකමක් තිබෙනවානම් එම දිනට වැරැල්ලාගේ ස්වාමිදරුවෝ ඇතුළුව ඉහත නියමකළ තුන්නමගෙන් දෙනමකුත් සමග තවත් ධර්ම-දේශනාවක් පැවැත්වීමට පුළුවන්වාසින් සෑහෙන ගමක්දෙනමකුත් ඇතුව පිටත්කර එවනහැටියට ද මාසේපෝය ගිය අටොසපෝය-ලත් සෙනසුරාදා සවස පටන් සතියක් පිරිත්ධර්මය නොකඩව පැවැත්වීමට ස්වාමීන්වහන්සේ සමග දසනමක් ලැබෙන හැටියට ඉතා ඕනෑකමින් යටහත්ව යාඥා කරමි. මේ සැලකරසිටින කාරණය මීට වෙනස් උනිනම් මහත් වේදනාවට අපි පැමිණෙන බව දැනවදාළ යුතුය.

"තවද, ස්වාමීන්වහන්ස, ස්වාමීන්වහන්සේගේ සහ සමාගමේ සංඝයාවහන්සේගේත් හිත්වේදනාවීමට නිසික්‍රියා අපි වෙනුවෙන් කෙරෙනබවක් දැනගන්නට ලැබී සිත් දූෂ්‍යයක් වෙලා තිබෙනබව අපට දැනගන්නට ලැබුනාය. එසේ යන් වරදක් කෙරීතිබෙනවා නම් ඒ මාවෙනුවෙන් නොව කිසි දෙයක් නොදන්නා හිතුවක් ක්‍රියා කරන අපට එකතුව සිටින ධම්මානන්ද-ගුණරතන කියන දෙනමගෙන් වෙන්ට ඕනෑය. ඒ දෙනමගේ හිතුවක් සමහර ක්‍රියාවල ආදීනව අපටම දැනීගොස් අපි ද ඒ අයට ප්‍රිය නැතුව සිටිනවාය. අපේ අදහස නම් ස්වාමීන්වහන්සේලාට යටහත්ව ඒ ගුණ දැනඹිනිකම් සිට අපේ සැම ක්‍රියාම පැවැත්වීමෙන් ආරක්ෂාව ලබාගන්නා හැටියටමය.

"මා වෙනුවෙන් ස්වාමීන්වහන්සේටවත් සමාගමේ සංඝයාට-වත් දොසාරෝපනයවසයෙන් යමක් කිව්වේවත් කියන අදහසක් ඇත්තේවත් නැතුවා සත්තකය. අපට විපක්ෂ අය විසින් යන් මෝඩයෙක් කොහැනකදීවත් ඔහුගේ බාලකමට දෙඩවාපු දෙඩවීමක් මාත් ස්වාමීන්වහන්සේලා සමග විපක්ෂ කරවන අදහසකින් මමත් ඇතුලත්කොට ප්‍රකාශකරලා තිබෙන බොරු ප්‍රබන්ධයක්බව දැනවදාරමින් සැම අතින්ම අපට ආරක්ෂාකර-ගැණීමට ස්වාමීන්වහන්සේම ආධාර උපකාරවෙනහැටියට නැවත නැවතත් යාඥා කරමි.

මෙම්ගට සිකාරු සිස්‍යභූත
අඹගහවත්තේ ඉන්දසභාභිධාන උන්නාන්සේය.
(අත්සන) ඉන්දසභ."

කල්‍යාණිවංශික සංඝනායක මිරිස්සේමාහිමියන්වහන්සේ එකල්හි කොයිතරම් ප්‍රභූත්වයකින් යුක්තව විසුවෝ ද යත්හත් අඹගහවත්තේ සවාමිපාදයාණන් කීකරු ශිෂ්‍යයකුමෙන් උන් වහන්සේට සලකා තිබෙන බවත් මේ ලියුමෙන් ප්‍රකටගත හැකිය. එසේම කල්‍යාණිවංශයට එක්වී අවුරුද්දක් ගතවෙන්ට පෙරම භේදයකට මුලපුරත්තන් සිටිබව ද මෙයින් ඔප්පුවේ.

**අඹගහවත්තේ මහාසවාමීන් ප්‍රමුඛ අන්‍ය නිකායක් ඇතිවීම.**

අඹගහවත්තේ මහාසවාමීත්වහන්සේ රතනාපුණ්ණ නුවරින් උපසම්පදාව ලබාගෙනවුත් අවුරුද්දකට දෙකකට පමණ පසු උන්වහන්සේගේ ආචාර්යභාවෝපගතව සිටි බුලත්ගම මහා සවාමීත්වහන්සේගේ බලවත් ඕනෑකම ලෙස ඒ පිරිස මිරිස්සේ මාහිමියාණන් ප්‍රමුඛ කල්‍යාණිවංශයට එක්කරනලද බව යට කියනලදී. නමුත් කුලපලහිලව් අදමෙන් එදත් පැවති බැවින් මේ දල්හීකම්ය සළ ටිකකලකින්ම ඇතැම් කෙනෙක් කුලය ගැන සලකන්ට පටන් ගත්හ. පුවක්දණ්ඩාවෙ සවාමිපාදයන් ප්‍රමුඛවූ පිරිසේ බොහෝ දෙනෙක් ගොවිවංශයට අයත්වූහ. එබැවින් ඒ වංශයෙහිමවූ අඹගහවත්තේ සවාමිපාදයන් මූල-ස්ථානයෙහි තබාගෙන ඒ වංශිකයන් බලපවත්වන නිකායක් සෑදගැනීමට කුමන්ත්‍රණ ඇතිවූහ. යටදක්වූ ලියුමේ කියවෙන්නේ එවැනි කුමන්ත්‍රණකාරයන් ගැනය. අඹගහවත්තේ සවාමිපාදයන් වහන්සේ මුලදී ඒ ලියුමේ කියනලෙස ඔවුන්ට අවනතනොවී සිටිනමුත් අවුරුදු කීපයකට පසු ඔවුන්ගේ මතයට අනුකූල වී පුවක්දණ්ඩාවේ සවාමිපාදයන් ආදී පිරිසක් ද සමග කල්‍යාණි වංශයෙන් වෙන්වී අන්‍ය නිකායක් පිහිටුවාගන්ට කැමතිවූහ.

මෙසේ අන්‍යනිකායක් පිහිටුවාගත්පසුත් අඹගහවත්තේ සවාමිපාදයන්වහන්සේ මිරිස්සේ මාහිමියාණන් ආදී තමහට උපකාරවූ කල්‍යාණිවංශික උතුමන් කෙරෙහි භක්ත්‍යාදරයකින් යුක්තව විසූහ. නමුත් උන්වහන්සේගේ පිරිසෙහිවූ “හිතුවක්-ක්‍රියාකරන්නන්”යයි උන්වහන්සේ විසින්ම නම්කරනුලැබූ ඇතැම් පුද්ගලයන් මුලසිටම පූර්වෝපකාරී කල්‍යාණිවංශික උතුමන්ගේ ගුණමැකීමට මානබැලූ බවපෙනේ. උන්වහන්සේගේ ඇවෑමෙන් පසු මේ පුද්ගලයෝ මිරිස්සේ මාහියන් ප්‍රධානවකළ ඒ දල්හී-කම්ය අඹගහවත්තේ සවාමිපාදයන් ප්‍රමුඛ පිරිසෙන් ලබාගත් එකක්සේ පෙන්වීමට පොත්පත් ලියා පළකළහ. ඔවුන්ගේ ඒ කීමේ කිසිදු සත්‍යයක් නැතිබව මෙහි උඩින් දක්වූ පොරොන්දු පත්‍රය හා අඹගහවත්තේ සවාමිපාදයන්ගේ ලිපිය කියවන්නකුට

පැහැදිලි වන්නේමය. ඒ පොරොත්දුපත්‍රයේ අඹගහවත්තේ සවාමිපාදයන්ගේ හා පුවක්දණ්ඩාවේ සවාමිපාදයන්ගේ අත්සන් මිස මිරිස්සේ, උඩුගල්පිටියේ, පියරතනතිස්ස යන මහාසවාමි-වරුන් ගේ අත්සන් විද්‍යමාන නොවෙති. ඒ අවස්ථාවේදී මේ ලිපිය ලියා අත්සන් නොතබන ලද්දේ නම් ගුණමකු පුද්ගලයන්ගේ අසත්‍යවචනයන් සපිරකරගන්ට හැකිවෙනවා ඇත. මේ ලිපිය තිබියදී නම් ඔවුන් කියනදේ පිළිගැන්විය නොහැක.

අඹගහවත්තේ සවාමිපාදයන් වහන්සේ අපවත්වෙන්ට අවුරුදු සවල්පයකට පෙර අම්බලම්ගොඩ දේවානන්ද උපසංඝ රාජතුමන්ගේ උපසම්පදාකර්මයක් වෙනුවෙන් පියරතනතිස්ස මාහිමියන් වෙත එවා තිබෙන ලිපියක් මෙසේයි:-

“බු. ව 2428. 10/17 දින ක්‍රි: ව: 1884. 12/19
පය්‍යාගල ධර්මගුප්තපිරිවෙණේදීය.

දෙඹන්දුව ශෛලබිම්බාරාමවිහාරස්ථානේ වැඩසිටින
පියරතනතිස්ස සථවිරයන් වහන්සේ වෙතටයි.

අම්බලම්ගොඩ කරන්නකන්දේ විහාරස්ථානයේ නිවාසී දේවානන්දනමලාගේ උපසම්පදාව ගැන අන්‍යෝන්‍යයන්ගේ විරුද්ධ භාවයක් තබානොගෙණ සමගි අදහසින්ම උපසම්පදාව සිදුකර දෙනහැටියට මම ද පුළුවන් දුරට වෙහෙසමාන්සි දරා නැවත වැලිගම සථවිරයන්වහන්සේ සම්බව් කථාකරගන්නා අදහසින් මෙතුවක්කල් උත්තරයක්නේවා පමාඋනෙමි. ඊයේ දවස වැලිගම සථවිරයන්වහන්සේ සමග සම්බව් කථාකරගත්තෙමි. ඒත් මෙහි එවූ ලියමනේ අදහසම නිච්චාමිස ඉන් අමුත්තක් නැත. දැනට පැමිණිතිබෙන හැටියට සහ අපි ඒ ඇක්කන්ට දීලාතිබෙන චචනේහැටියටත් මේ මස 30වැනිදින අම්බලම්ගොඩට පැමිණෙන්-නට ඕනෑය. ඒ නිසා මෙබඳු කටයුතු පැමිණිවිට හොඳින් ඉවසීම ඇතුව මින් වන වැඩ අවැඩ සිත්හි ලා සලකාගෙනම කරන්ට ඕනෑ නිසා කරුණාකර ශාසනික කටයුත්තක් බැවින් එදිනට අම්බලන්ගොඩට වැඩමවන හැටියට ද කල්පනාවට ගන්නවත් හැර මෙතන අනුමින්වත් මීට සෑහෙන හැටියක් එහිදීම අවසර ලැබෙන්ට ඕනෑය.

මමද අම්බලන්ගොඩ වැසි උභයපක්ෂයෙහි ඇත්තන් අභිමුඛ යේදීම අවසර ලැබෙණ හැටියක් දැනගෙන සෑහෙන හැටියකින් ක්‍රියා කරණ අදහස තිබෙනවාය. එසේ නැතිව මම දූත් දෙපැත්තකින් හිරවී සිටිනනිසා එකපැත්තකින්වත් නින්දා

ගැරහුම් චෝදනාදියෙන් ගැලවෙන්ට බැරි තරම්ය. එබැවින් භවත් ස්ථවිරයන්වහන්සේ මීට අනුකම්පාකොට සාමග්‍රිධර්මයන්ට මතු පළුදුනොවන්නාවූ පරිද්දක් හොඳින් කල්පනාවට රැගෙන ශාසනාභිවෘද්ධි යහපතක්ම අපට අවසර ලැබෙන්ට ඕනෑය. මේ ගැන පැමිණි තිබෙන විස්තර කරුණු මම දැනගත්තේ වැලිගම් ස්ථවිරයන්වහන්සේගෙන්ය. ප්‍රථමයෙන් මම දී තිබෙන ලියකියමන්වල ප්‍රකාරයට නොපැමිණියේ වී නම් මට චෝදනා කරමින් විරුද්ධපක්ෂයක් කරගන්නවාට හැකනැතිබැවින් ඉහත නියමකළ දිනට අපට නැවින් බැරිනිසා අපි පැමිණෙන්නෙමුය. එවිට කරුණාසින් පෙරදූරිව කියයුතු කාරණා අවසර ලැබෙන හැටියට මෙයිං ලියා සැලකර එව්වේ

කීකරු හිතෛෂී අඹගහවත්තේ
ඉන්දාසභ ව. ඤා. සා.”

රාමඤ්ඤ නිකායිකයන් ලිවූ වාර්තාවල රාමඤ්ඤරටට ගිය පිරිස කාගේවත් සන්දේශ ගෙනගිය බවක් නොකියවේ. ඒ ගෙන ගිය සන්දේශ පිටපත් හා මෙහාට ගෙනා සන්දේශ පිටපත් අදත් විද්‍යමාන බැවින් අද මෙහි පවත්නා අන්‍ය නිකායිකයන්ගෙන් කිසිත් උපකාරයක් නොලැබූ සේ මේ වාර්තා ලිවීම යුතු නොවේ.

මෙසේ නා නා අවස්ථාවන්ට පත්වීමෙන් පසු රාමඤ්ඤ නමින් නිකායක් ඇතිකළ අඹගහවත්තේ ඉන්දාසභවරඤාණ සාමි මහාස්ථවිරතුමා 1886 යේ ජනවාරි මස 29 වෙනිදා සවස 6 . 30 ට පමණ පයාගල ධර්මගුප්ත පරිවේණස්ථානයේදී අපවත්විය. (මුන්වහන්සේ උපන්දිනය හා අපවත්වූ දිනය මට දැනගත හැකිවූයේ “බෞද්ධ සහෝදරයා” සඟරාවේ පළවූ එතුමන්ගේ ඡායාරූපයකට යටින් ලියා තිබුණු වාක්‍යවලිනි. අන්‍ය වාර්තාවක එය දකින්ට නොලැබුණි )

## 28. අමරපුර ගණපාමොක්ඛාචරිය විමලසාරතිස්ස මහා ස්වාමිපාදයෝ.

සාසනවංසදීප නමැති පාලිමහාකාව්‍යය ලිවීමෙන් අමරනීය නාමයක් ඇතිකළ විමලසාරතිස්ස මාහිමිතුමා වනාහි අමරපුර නිකායේ ආදිකර්තෘභූත ඤාණවිමලතිස්ස මාහිමියන්ට ගිහිකමිනුත් මහණකමිනුත් මුනුබුරෙක් විය. වැලිතර පෙදෙසට අයත් “මහකැරැව” නම් ගමේ විසූ මහබද්දේ කන්කානම් ධූරය දැරූ

"අව්වාහන්දි ලක්හයිදේ" මහතා මෙතුමාගේ පියා විය. බු. ව. 2368 වේදී "බෙලිගහවත්ත" නමින් ප්‍රකට කුලගෙහිදී මෙතුමාගේ උත්පත්තිය සිදුවිය.

කුඩාකල සිටම ශාස්ත්‍රාභ්‍යාසයෙහි ඇල්මක් දක්වූ මේ ළදරුවා ගැන කහවේ "සිරිසද්ධම්මජෝතිපාල ඤාණානන්ද" මහා ස්ථවිරතුමා දැනගෙන තමන්ට ඥාතිසම්බන්ධයක් ඇති මේ බාලයාගේ දෙමවුපියන් ගෙන්වා ඔහු පැවිදිකරවීමේ අනුසස් දක්වීය. මවුපියන් කැමැත්ත දුන්විට ඔහුට ඉගැන්විය යුතුදේ උගන්වා ශුභ මොහොතක් බලා ස්වකීය සමානාචාර්යක ධම්මාධාරතිස්ස නායක මාහිමියන් ලවා පැවිදි කරවීය. මේ සාමණේරනම අභ්‍යයන් මසකින් පමණ පාඩම් කරන, ඉගෙනගන්නා දෙය සතියකින් පමණ ඉගනීමට සමර්ථවිය. විමලසාර යන නම ලබාසිටි මේ හෙරණතෙමේ උපසම්පදාව ලබන්ට පෙරම ධර්ම-විනය-ශබ්දශාස්ත්‍රාදියෙහි ව්‍යක්ත පඬිවරයකු සේ ප්‍රකට විය. මූන්වහන්සේ බොහෝවිට රාත්‍රි මධ්‍යමයාමය පසු වෙනතුරුත් පොත්පත් කියවමින් එකිනෙක සසඳ බලමින් කාලය ගත කළහ.

උපසම්පදාව ලැබීමට යෝග්‍ය කාලය පැමිණි කල්හි බු ව 2388 වෙසක්මස පුරපසළොස්වක්දා බලපිටිමෝදර උදකුක්ඛෙප සීමාවට රැස්වූ මහාසංඝයාවහන්සේ විසින් ධම්මාධාරතිස්ස නායක මාහිමියන් උපාධ්‍යාය කොට මේ විමලසාර හෙරණතැන උපසම්පන්න බවට පමුණුවනලදී. මින්පසු කලක මූන්වහන්සේ ස්වබුද්ධිප්‍රභාවය විදහාපාමින් ගාථා 1671කින් යුත් සාසනවංසදීප නම් ග්‍රන්ථය සම්පාදනය කළහ. මෙය වනාහි මූලසිටම ශාසන ප්‍රවෘත්ති දක්වමින් අවුත් අමරපුරනිකායේ පිහිටුවීම ප්‍රකාශ කරන රම්‍යභාෂා විලාසයෙන් යුත් ග්‍රන්ථයකි. එකල සිටි ස්වදේශීය-විදේශීය උගතුන්ගෙන් එයට බොහෝ පැසසුම් ලැබුණි.

මේ කාලයේදී සීමාසංකරවාදය ඇතිවූයෙන් එය නිරාකරණය සඳහා මූන්වහන්සේ විසින් සීමාලක්ඛණදීපනී නමැති විශාල ග්‍රන්ථය සම්පාදිතවිය. බු ව 2421 වෙනි වර්ෂයේ බක්මස අවපක්ෂයේ සත්වෙනිදා වැලිතර මහාකප්පිනවලව්වට රැස්වූ විශාල ගිහිපැවිදි පිරිස මැදදී බුරුමරටෙන් වැඩම්මවා සිටි ජාගර මහතෙරුන් වහන්සේ හා විමලසාරතිස්ස මහාස්ථවිරතුමන් අතර සීමා පිළිබඳ විවාදයක් විය. එහිදී විමලසාර මහාස්ථවිරතුමන් ඇසූ ඇතැම් ප්‍රශ්නවලට පිළිතුරුදීම ජාගරමහතෙරුන්ට අපහසුවීයයි කියත්.

සඞ්කිය ආචාර්යවරයන් දෙනමගේ අපවත්වීමෙන් පසු බු. ව. 2410 දී මේ විමලසාර මාහිමියෝ නිකායපාලකත්වයට පත්වූහ. මුන්වහන්සේ සවතීනාරාමයෙහි "සුගතශාසනෝදය" නමින් විද්‍යායතනයක් පිහිටුවාගෙන බොහෝ ගිහිපැවිදි සමූහයකට ඉගැන්වීම ද කළහ. "මූලවංසික ගණාචරිය බුද්ධසිරිතිස්ස" මහා-සථවිරතුමා ද මීගමුවේ 'ආසභතිස්ස" නායක සථවිරතුමා ද නාන්දුරාමතිස්ස මහාසථවිරතුමා ද "ධම්මාරාමතිස්ස-විමලධීරතිස්ස" යන නායක මහාසථවිරවරු ද තොටගමුවේ පඤ්ඤාමොලිතිස්ස මහානායක සථවිරතුමා ද, රුවන්පුර පාලියෙස් ද සිල්වා අමරසේකර වෙදමහතා ද, පෙත්තෝරිස් ද සිල්වා වෙදආරච්චි මහත්මයා ද, ප්‍රැන්සිස් ද සොයිසා අභයශ්‍රීවර්ධන රාජනීතිඥතුමා ද, ඩබ්ලිව් අරාලිස් ද සිල්වා (ඇල් ආර් සී පී; ඇස්. ඇල්. ඇfප් පී) වෛද්‍යාචාර්යතුමා ද මුන්වහන්සේගේ දීප්තිමත් ශිෂ්‍යයෝ වූහ. බල්තසාර් වීරසිංහ වික්‍රමරත්න මුදලිතුමා ශිෂ්‍යයෙක් ද දායකයෙක් ද විය. ලුවිස් ද සොයිසා විජයසේකර ජයතිලක මහමුදලිතුමා ලංකාණ්ඩුවේ ඉල්ලීම ලෙස මහාවංශය ඉංග්‍රිසියට නැගීම සඳහා පෙළපොත මුන්වහන්සේලවා ශුද්ධකරවා ගත්තේය.

අඹගහපිටියේ මහාවිහාරයට එන මාර්ගය කලින් තිබුණේ විහාරයට පැත්තකිනි. එය දැන් තිබෙන සේ කෙළින් දැම්මවීමට මුන්වහන්සේට සහ දායකවරුන්ට ඕනෑවිය. ඒ මාර්ගය "සැම්සන් ද ආබෲව් විජයගුණරත්නරාජපක්ෂ" වාසලමුදලි-තුමන්ගේ ඉඩමක් මැදින් දැමියයුතු විය ඒ සඳහා අවසර ගැනීමට දායකයන් විසින් මුදලිතුමාට අයැදුම්පත්‍රක් දෙනලදී. මුදලිතුමා ඒ සඳහා එහි අවුත් විහාරදොරටුව ළඟ සිටගෙන නායක මහාසථවිරතුමන්ට එතැනට වඩිනසේ කිවායැවීය. නමුත් නායක සථවිරතුමා ගිහියකුගේ ඉල්ලීමු පිට එතැනට යන්ට නොකැමැති විය. එය දැනගත් මුදලිතුමා නොසතුටුවී පාරට අවසරය නොදී හැරීගිය නමුත් පසුව කරුණු සලකාබලා ඉතා සතුටෙන් ඒ අවසරය දුන්නේය.

ගාල්ලේ අතපත්තුවලව්වේ විසූ ඊ. ආර්. ගුණරත්න වාසල මුදලිතුමා වරක් මුන්වහන්සේ තමාගේ සිම්බලි ආවාසයට වැඩමවා දන්දී බණ අසන රිසියෙන් ආරාධනාවක් එවීය. මුන්වහන්සේ අතවැසි කිපනමක් සමග එහි පැමිණි අවස්ථාවේදී ගාලුපළාතේ බොහෝ මහාසථවිරවරුද එහි පැමිණියහ. මුදලිතුමා මුන්වහන්සේ දැක පිළිසඳර කථාකිරීම පිණිස එහි අවුත් වැඳ නමා ගෙන්වාගෙන ආ පුටුවක වාඩිවෙන්ට අවසර ඉල්වීය. මේ මහාසථවිරතුමා එය

තුසුදුසු යයි කියා වලක්වාලිය. මුදලිතුමා "මින් පෙර මෙහි පැමිණි මේ මහාසථවිරවරුන් මට එසේ ඉදීමට අවසර දුන් නිසා මේ වරත් එසේ කෙලෙමි"යි කියා සමාව ගෙන පැදුරක වාඩිවිය.

මුන්වහන්සේගේ ජීවිතකාලය දීඝී නොවීය. වයස 65 පමණ වූ කල්හි බු ව. 2432දී උන්වහන්සේගේ අගනා ජීවිතය මාරයා විසින් පැහැරගන්නාලදී. මුන්වහන්සේ සිහිපත්වීම පිණිස ද අම්බරුක්ඛාරාමයෙහි සමාරකයක් ගොඩනංවා තිබේ.

(මේ චරිතකථාව ලිවීමට උවමනා කරුණු මෙකල අම්බරුක්ඛාරාමාධිපතිව සිටින "පණ්ඩිත විමලකිත්තිතිස්ස" මහාසථවිරතුමන් විසින් සපයා දෙනලදී)

## 29. දෙඩන්දූවේ පියරතනතිස්ස මහානායක මාහිමියෝ.

(ක්‍රි. ව. 1826-1937)

ආරියවංසාලංකාර-සාසනධජ-විනයාචරිය දෙඩන්දූවේ පියරතනතිස්ස මහාසථවිරතුමා බු. ව. 2426දී කල්‍යාණිවංශිකයන්ගේ සංඝනායක පදවියට පත්විය. තෙවෙනිවර මේ නිකාය පාලනය කල කොග්ගල ධම්මසාර නායක මාහිමියන්ගේ ශිෂ්‍යරත්නයක් වූ මුන්වහන්සේ වනාහි සියලුදෙනගේ මනනුවන් ඇදගන්නා රූප සම්පත්තියකින් හා වාක්චාතුයීයකින් යුක්තවූවෙකි. ඥාති පරම්පරා වශයෙන් ද මුන්වහන්සේ පාතරට කරාවගොත්‍රයේ ප්‍රභූන් සියලුදෙනටම වාගේ සම්බන්ධකම් ඇතිව විසූහ මිරිස්සේ-උඩුගල් පිටියේ යන මහාසවාමිවරයන්ගේ පාලනකාලයන් තුළ ද මුන්වහන්සේ නිකායපිලිබඳ කටයුතුවල යෙදී බුරුම-සියම් රටවලට සන්දෙශ යැවීම් ආදිය කළහ.

දෙඩන්දූවේ කීර්තිමත් වීරසූරිය පෙළපතට අයත් "දොන් දනියෙල් වීරසූරිය" මහතා මුන්වහන්සේගේ පියාණෝ වූහ. ක්‍රි. ව. 1826යේ දෙසැම්බර් මස 12වෙනිදා උපන් ධන්‍යපුණ්‍ය ලක්ෂණොපෙත මෙකුමරුට යොග්‍යවයසේදී අක්ෂරාභ්‍යාසය කරවා තවහැවිරිදි වයසේදී පැවිදිකරවීම සඳහා කොග්ගල නායක මාහිමියන් වහන්සේට බාරකරනලදී. උන්වහන්සේ විසින් පැවිදිකරවනු ලැබූ මේ පියරතන සාමණෙරතැන ටිකකලක් උඩුගල්පිටියේ මහාසවාමින්වහන්සේ වෙත ඉගනීමෙහි යෙදී සිට වැඩිදුර ඉගනීම පිණිස ඒ ධර්මාචායීයන්වහන්සේ සමගම

අම්බලම්ගොඩ පොල්වත්තේ අග්‍රාරාමයට පැමිණ මිරිස්සේ නායක ස්වාමිපාදයන් වහන්සේගෙන් ධර්මවිනය ශබ්දශාස්ත්‍රාදිය ඉගෙනගනිමින් නැවතී සිටියේය.

උපසම්පදාව ලැබීමට යොග්‍යවයස පැමිණිකල්හි ශෛලබිම්බාරාමය අසල උදකුක්ඛෙපසීමාවෙහි රැස්වූ කල්‍යාණිවංශික මහාසංඝයා වහන්සේ විසින් බු. ව. 2389 යේ වෑෂභරවි 24 නාග දසවක් තිපිගලත් ගුරුදින රෑ දසපැයට පමණ කොග්ගල ධම්මසාර නායක මාහිමියන්වහන්සේ උපාධ්‍යායකොට, කතළුවේ ධම්මරතන, මිරිස්සේ ධම්මානන්ද, උඩුගල්පිටියේ සිරිසුමනතිස්ස යන මහාස්වාමිතුන්නම කර්මාචාර්ය කොට මේ පියරතනතිස්ස ශ්‍රාමණේරයාණෝ උපසම්පන්නයට පමුණුවනලදහ.

උපසම්පන්නවූ පසුත් අවුරුදු කීපයක් අග්‍රාරාමයෙහි නැවතී ඉගනීම කළ මූන්වහන්සේ එය අවසන්කොට ස්වකීයාරාමයට පැමිණ නානා පෙදෙස්හි ධර්මදෙශනාදිය කළහ. පැල්මඩුල්ලේදී පැවැත්වූ ධර්මදෙශනාවකදී ප්‍රසන්නභාවයට පැමිණි ඉද්දමල්ගොඩ දිශාපතිතුමන් විසින් මූන්වහන්සේ ධර්මාසනයෙන් වඩාගන්නා ලදැයි ප්‍රකටව පවතී. මූන්වහන්සේ කලින් කල කොළඹ, ගාල්ල, රත්නපුරය, පානදුරේ, බේරුවල, අලුත්ගම, අම්බලම්ගොඩ, පටබැඳිමුල්ල, පොල්වත්ත, කහව, හික්කඩුව, රත්ගම, ගිංතොට, උණවටුන, හරුම්ල්ගොඩ, කතළුව, වැලිගම, දෙවුන්දර ආදී නොයෙක් නගරග්‍රාමයන්හි වස්වසමින් රටවාසීන්ට අනුශාසනා කළහ.

සබරගමුවේ ඉද්දමල්ගොඩ දිශාපතිතුමාගේ අයදීම ලෙස බු. ව. 2411 දී පැල්මඩුල්ලේ ධර්මශාලාවේදී පැවැත්වූ ධර්මවිනය පුස්තක සංශෝධනය සඳහා මූන්වහන්සේ ද කැඳවනලදහ. ඒ අවස්ථාවෙහි ලේඛකශවරතුමන් ද ඇතිව පැවැත්වූ ගිහිපැවිදි මහාසභාවේදී මූළු සංඝපක්ෂය වෙනුවෙන් කථාකිරීමට තෝරන ලද්දේ මේ පියරතන මාහිමිතුමාය.

**ප්‍රථම බෞද්ධ පාසැල පිහිටුවීම.**

ලක්දිව පළමුවෙන් බෞද්ධ පාඨශාලාවක් පිහිටුවනලද්දේ මූන්වහන්සේ විසිනි. දොඩන්දුවේ “ලොකාර්ථසාධක” සමිතිය මගින් ශෛලබිම්බාරාමය අසල ගොඩනගා තිබුණ “ජිනලබ්ධි-විශොධක” නම් ශාලාවක ක්‍රි. ව. 1869 යේදී මේ ආදිම බෞද්ධ පාඨශාලාව ආරම්භකරනලදී. අවුරුදු කීපයකට පසුව ආණ්ඩු-වෙන් ලැබුණු ආධාර ඇතිව අභිවෘද්ධියට පැමිණවූ මේ පාඨශාලාව පසුකලක කොළඹ පරමවිඥනාර්ථ බෞද්ධසමාගමට බාරදෙනලදින් මේතාක් පවත්නා බව සැලකියයුතුයි.

පාතදුරේ උපාධ්‍යාය බෞඩපාඨශාලාව ද මුත්වහත්සේගේ උත්සාහයෙන් පිහිටුවතලද්දැයි කියත්.

මේ ඇදිම බෞඩපාඨශාලාවේ ඉගැන්වීම සඳහා බෞඩ පාඩම් පොතක් නොමැතිවූ බැවින් මුත්වහත්සේ විසින් ඒ සඳහා පොතක් සම්පාදනය කොටමුද්‍රණය කරවතලද්දේය එකල බෞඩයන්ට ධර්මය ඉගනීමට ලිත්ල්භාෂාවෙන් සම්පාදිත ධර්මපුස්තකයක් අවිද්‍යමානවූ බැවින් මූත්වහත්සේ විසින් "ශෙදයාඑදීපනී" "ජිනධර්මවිකාශිනී" යන ධර්මපුස්තකවයක් සම්පාදනය කොට පළකරවන ලදහ තවත් ධර්මිනය සම්බන්ධ වැදගත් ග්‍රන්ථයක් මූත්වහත්සේ විසින් සම්පාදිතවූහ මෙයින් "විනයනිතිය" නමැති ග්‍රන්ථය පම්ණක් මුද්‍රණයට පැමිණ තිබේ එය වනාහි භික්ෂූත්වහත්සේට ද බෞඩ මහාජනයාට ද ආණ්ඩුවේ නිලධාරින්ට ද විනයපිළිබඳ කරුණු-වලදී ඒකසේ ප්‍රයොජනවත්වන පරිදි පිළියෙලකරන ලද්දකි

කර්නල් ඔල්කොට්තුමා ලක්දිවට පැමිණෙන්ට පෙර සිටම මූත්වහත්සේ එතුමාගේ හිතමිත්‍රයෙක්ම විසූහ කර්නල්තුමා ලක්දිවට පැමිණ බෞඩයෙක් වෙන්ට පෙරදීම තමාවිසින් නිව්යෝර්ක් නුවර පිහිටුවා තිබුණු පරමවිඥානාථ සමිතියේ ගරු අනුශාසකධුරයකට මුත්වහත්සේ පත්කොටගෙන 1878දී ඒ සම්බන්ධ සන්නස ද එවීය. එතුමා පළමුවෙන් ලක්දිවට එන ගමනේදී කල්ඇතිව ඒබව පියරතන මාහිමිතුමන්ට දන්වා එවූ බැවින් උන්වහත්සේගේ උපදෙශානුගතව එතුමා පිළිගැනීමේ කටයුතු සුදනම් කරතලදී ගාලුවරායෙන් ගොඩබට එතුමා ගෞරවයෙන් පිළිගත් ගිහිපිරිස විසින් ගාල්ලේ "දොන් දනියෙල් ද සිල්වා විජයරත්න" ආරච්චිමහතාගේ අභිනව මන්දිරයට කැඳවාගෙන ගියකල්හි එහි රැස්ව සිටි බුලත්ගම සිරිසුමනතිස්ස, වැලිගම සිරිසුමඞ්ගලාදි මහාස්ථවිරයන් ඇතුළත් ගිහිපැවිදි මහා සභාවේදී තිසරණය සහිත පඤ්චශීලය සමාදන්ව ඒ මහතා බෞඩොපාසකභාවයට පැමිණියේය. මින් නොදිනකට පසු ඔල්කොට්තුමා හා පිරිස දෙඩන්දූවට පැමිණ දශදිනක් පමණ එහි තැවිනී සිටගෙන මුත්වහත්සේ හා සාකච්ඡා පැවැත්විය.

මුත්වහත්සේ හා හිතමිත්‍රභාවයට පැමිණි විදෙශීය උතුමෝ බොහෝ වූහ. බුරුමරට මණ්ඩලේනුවර ඤෙයාධම්මාභිවූනිවර ඤාණකිත්තිසිරිධජ ධම්මසේනාපති මහාධම්ම රාජාධිරාජගුරු සංඝරාජ මහාස්වාමිපාදයන්වහන්සේ ද, පඤ්ඤාසාමි සිරීසඞධජ මහා ධම්මරාජාධිරාජගුරු මහාස්ථවිරපාදයන් වහන්සේ ද, කල්‍යාණජොතසාසනධජ මහාධම්මරාජාධිරාජගුරු මහාස්ථවිර පාදයන් වහන්සේ ද මුත්වහත්සේගේ අදෘෂට මිත්‍රයෝ වූහ.

ධම්මිතය පිළිබඳ කරුණු සම්බන්ධව සංඝරාජතුමන්වහන්සේ හා මූන්වහන්සේ අතර කලින් කල සන්දේශ මගින් සාකච්ඡා ඇතිවිය. සංඝරාජයන් වහන්සේ විසින් විසිතුරු ලෙස පිළියෙළකළ බුරුම කම්මවාක්‍ය පොතක් මූන්වහන්සේ වෙත එවනලදී. කල්‍යාණිජෝතසාසනධජ රාජගුරු මහාස්ථවිරයන්වහන්සේ විසින් ද බුරුම මහරජ තුමාණන් විසින් ද මෙවැනිවූම කම්මවාක්‍ය පොත් දෙකක් දෙවරකදී දහම්පඬුරු කොට එවනලදහ. බුරුම අගබිසව විසින් මූන්වහන්සේගේ මාතෘඋපාසිකාමැතිණිය වෙත ද අගනා පට වස්ත්‍රාදි පාරිතෝෂිකභාණ්ඩ එවනලදහ.

බුරුමරටින් ලක්දිවට පැමිණ අනේක සසුන් වැඩ කළ සිරි සද්ධම්මවංසපාලමහාධම්මරාජාධිරාජගුරු ජගරමහාස්ථවිරපාදයන් වහන්සේ ද තුන්වරක් ලක්දිව් පැමිණි පඤ්ඤාසිරිසද්ධම්ම කවිධජ මහාධම්මරාජාධිරාජගුරු වජිරාරාමික මහාස්ථවිරපාදයන් වහන්සේ ද මූන්වහන්සේසමග මහත් හිතවද්භාවයකින් විසූහ. රාමඤ්ඤරට හංසාවතී නගරයෙහි ආරණ්‍යක සද්ධම්මවරමහාධම්ම රාජාධිරාජගුරු නායක මහාස්ථවිරපාදයන්වහන්සේ ද, කෝසර මහාස්ථවිර, ඤාණාම මහාස්ථවිර, චන්දිම මහාස්ථවිර යන මහාස්ථවිර යන්වහන්සේලා ද මූන්වහන්සේගේ සමානවංශික හිතමිතුරෝ වූහ.

සියම්රට වජිරඤාණ මහරජතුමා පැවිදිකල පටන් මූන් වහන්සේ හා අදෘෂ්ටමිත්‍රව විසුයේය. චූලාලංකාර මහරජතුමා ලක්දිවට පැමිණිකල්හි කොළඹ රජවාසලදී සම්මුඛවූ අවස්ථාවෙහි අගනා කෞශෙය්‍ය සිවුරු ආදිය පුදකිරීමෙන් මූන්වහන්සේ කෙරෙහි සගෞරවප්‍රසන්නතාවය ප්‍රකාශකෙළේය. කලිකතානුවර ආණ්ඩුවේ සංස්කෘත විද්‍යාමන්දිරයෙහි ප්‍රධානාචාර්ය ශ්‍රීතාරානාථතර්ක වාචස්පති භට්ටාචාර්ය බ්‍රාහ්මණ පඬිතුමා ද එතුමාගේ පුත්‍ර ශ්‍රීජීවානන්ද විද්‍යාසාගරභට්ටාචාර්ය පඬිතුමා ද මූන්වහන්සේගේ අදෘෂ්ට හිතමිත්‍රයෝ වූහ. මේ පඬිතුමන් දෙපල විසින් මුද්‍රණයට පමුණුවනු ලැබූ සංස්කෘත පොත් බොහෝ ගණනක පිටපත් මූන්වහන්සේ වෙත තෑගි වශයෙන් එවනු ලැබූහ. ලන්ඩන් නුවර පාලිපොත් සමාගමේ ප්‍රධාන තැන්පත් රිස්ඩේවිඩ්ස් පඬිතුමා ද මූන්වහන්සේ ගැන විශේෂ සැලකිමකින් යුතුකව විසීය.

උඩුගල්පිටියේ මහාස්වාමීන්වහන්සේගේ පාලනකාලය තුළදී ද අධිකරණවිනිශ්චයාදි නිකාය පිළිබඳ සියලු කටයුතුවලට උපස්තම්භක වෙමින් විසූ මේ පියරතන මහාස්වාමීන්වහන්සේ යථෝක්ත නායකමාහිමියන්ගේ ඇවෑමෙන් බු. ව. 2425දී නිකායපාලකත්වයට පත්වූහ. පස්විසිවසක් පමණවූ මූන්වහන්සේගේ පාලනකාලය තුළ නිකායාභිවෘද්ධිය සඳහා කළ සත්ක්‍රියාවෝ බොහෝ වූහ.

මේ කාලය තුළ නිකාය පිළිබඳ කටයුතුවල දී ශාසනවංසාලංකාර කවිධ්වජවිනයාචාර්‍ය වැලිගම සිරිසුමඞ්ගල නායකමහාස්වාමීන් වහන්සේ ද මුන්වහන්සේට සහාය වූහ. මේ කාලයේදී දෙඩන්දූව ශෛලබිම්බාරාමය දකුණු ලක්දිව පූර්වදිග භාෂාශාස්ත්‍රයන් හා ධර්ම විනය උගන්වන ප්‍රසිද්ධ විද්‍යාස්ථානයක් බවට පත්විය.

මුන්වහන්සේට උත්පත්තියෙන් සමඅසූවසක් පිරීමද, පැවිදි වීමෙන් සැත්තෑවසක් පිරීම ද උපසම්පදාවෙන් සැටවසක් පිරීම ද නිමිතිකොට ක්‍රි. ව 1906 දෙසැම්බර් මස 31 වෙනිදා දෙඩන්දූව ශෛලබිම්බාරාමයේදී මහෝත්සවයක් පවත්වනලදී. එදින දායක මහතුන් විසින් සියක්නමකට අධික මහාසංඝයාවහන්සේට "කංඛාවිතරණී" අටුවාව හා "විනයනීති" නම් (මුන්වහන්සේ ලියූ) පොත එක්කොට හමෙන් බැඳි පොත් 100 කින් ද නානාවිධ ගුරුලඝු භාණ්ඩයන්ගෙන් ද පරිෂ්කාර රාශියකින් ද යුත් මහා දානයක් පිරිනමා මහා සභාවක් පවත්වන ලදී. ඒ මහා සභාවේදී මේ මාහිමියාණන්ගේ ගුණවැණුම්වශයෙන් නොයෙක් දෙන කළ පද්‍යබන්ධන කියවන ලදහ. මේ අවස්ථාවේදී ස්වනිකායේ චිරස්ථිතිය සලකා මුන්වහන්සේවිසින් සම්පාදිතවූ අනුශාසනාපත්‍රයක් සහිත දඹදෙණි කතිකාවත ද බෙදාදෙන ලදී.

මෙසේ අසූවයස් පිරීමෙන් පසු තමන්වහන්සේගේ ජීවත කාලය අවසන්වෙන්ට ළංව තිබෙනබව වටහාගත් මුන්වහන්සේ ඒ ගැන බලාපොරොත්තුවෙන් විසූහ. නමුත් ජරාවෙන් ඇතිවිය යුතු කය නැමීම දත් වැටීම කන් නැසීම බුද්ධිය විකලවීම ආදී ප්‍රකට ජරාලක්ෂණයෝ මුන්වහන්සේට පහළනොවූහ. මෙසේ සැටවසකට අධික කාලයක් මුළුල්ලේ අනල්ප ලෝකශාසනෝපකාරී ක්‍රියාවන්හි යෙදෙමින් කල්‍යාණීවංශය යහතින් පාලනය කළ මුන්වහන්සේ 1907 හේ මැයිමස 16 වෙනිදා පටන් සිවුදිනක් රෝගීව සිට මැයි මස 20 වෙනිදා පෙරවරු 10 යුත් මිනිත්තු 10 ට ස්වර්ගලෝකපරායණ වූ සේක.

## 30. වැලිගම ශ්‍රී සුමංගල නායක මාහිමියෝ

(ක්‍රි. ව 1825-1905)

ලක්දිව සංස්කෘතභාෂාව ඉගනීමට මහත් රුකුලක් ලබාදුන් මුන්වහන්සේ ක්‍රි. ව. 1825 හේ දෙසැම්බර් මස 8 වෙනිදා* උදයවරුවේ දකුණුලක "වැලිගම" නමැති සුප්‍රකට නගරයෙහිදී උපන්හ. "ලොකුබඩු ජයසූරිය පටබැඳිගේ දොන් ආබ්‍රහම් ජයසූරිය අප්පුහාමි" මෙතුමාගේ පියා විය. කුඩාකාලයේදී

---

* දෙසැ: 7 වෙනිදා යයි ඇතැම් ලිපිවල පෙනෙතත් 1908 දී සිහලසමය කතෘ භූත ඇම් සී. ඇප් පෙරේරා මහතා "ඥානාදර්ශය" සඟරාවේ පළකරවූ ලිපියේ තිබෙන දිනය මෙහි ඇතුළත් කෙළෙමි.

ගම්වාසීහු මෙකුමරුට "පුංචිඅප්පුහාමි" යයි† ව්‍යවහාර කළහ. සියගෙදරදී ඔහුට ව්‍යවහාරකළ නාමය "අල්ලිස්" ය. සදෙනෙකුගෙන් යුත් පවුලේ සිවුවෙනියා වූ මෙකුමරු තුන්හැවිරිදි කල්හි ගාල්ලේ වැලිවත්තේ ගම්මුලාදෑනි ධූරය දරූ සිය මුත්තණුවන් වෙත පමුණුවන ලදින් පස් අවුරුද්දක් එහි විසීය. එකුමරුගේ සොහොයුරියක් ගාලුවැල්ලබඩපත්තුවේ වැරැල්ලානේ විසූ බැවින් අටහැවිරිදිකල්හි පියාණන් විසින් එහි ගෙනැවිත් නවත්වනලදී. මෙහි සිටියදී එකල ඒ ගමේ කෝම්මල විහාරයෙහි (?) විසූ පැරැලියේ ජිනරතන මහාස්ථවිරතුමන් වෙත අකුරු ඉගනීමට පත්කරනු ලැබූ මේ තෙමේ අතිදක්‍ෂලෙස ඉගනීම කෙළේය.

මෙකුමරුගේ දක්‍ෂභාවය දුටු මවුපිය ගුරුවරයෝ මොහු පැවිදි කළහොත් මහත් ශාසනසංග්‍රහයක් වන්නේ යයි සැලකූහ. දොළොස් හැවිරිදිකල්හි (ක්‍රි ව. 1837 දී) ජිනරතන මහාස්ථවිරතුමා සවකීයාචාර්ය විලේගොඩ පුඤ්ඤසාර නායකස්ථවිරතුමන් ලවා මෙකුමරු පැවිදිකරවා සිරිසුමංගල නම තබා කලක් තමන් වෙතම නවතා ගෙන ධර්‍මශාස්ත්‍ර ඉගැන්විය. එකුන්විසි හැවිරිදිකල්හි ගම්වැසි දායකමහතුන්ගේ ඉල්ලීම ලෙස මෙතුමා දම්සක් පැවතුම් සූත්‍රයෙන් මංගලධර්‍මදේශනාව පැවැත්විය. ඉන්පසු වැඩිදුර ඉගනීම සඳහා බෙන්තර අත්ථදස්සී මහාස්ථවිරතුමන් වෙත පමුණුවන ලදින් එතුමන්ගේ ශිෂ්‍යවූ පොතුවිල ඉන්දජෝති, යාත්‍රාමුල්ලේ ධම්මාරාම, අඹගහවත්තේ සරණංකර (=ඉන්දාසභවරඤාණසාමි) ආදි තෙර වරුන් සමග සමකාලිකව ඉගනීම කෙළේය.

උපසම්පදාව ලැබීමට යොග්‍යවයස පැමිණ, තිබුණ බැවින් ජිනරතන මහාස්ථවිරතුමා මේ සුමංගල හෙරණපාණන් අහංගම මහා විහාරයට පමුණුවා සද්ධම්මයුත්තික නිකාය පිහිටුවාවදාළ මාතර ධම්මාරාම මාහිමියන් උපාධ්‍යාය කොට පැරැලියේ ජිනරතන, කහඳමෝදර ධම්මානන්ද, හික්කඩුවේ සිරිසුමනතිස්ස යන තුන්නම කර්‍මාචාර්යයන් කොට බු ව. 2392 දී උපසම්පන්න කරවිය. උපසම්පන්න වූ සුමංගල භික්‍ෂුනම සවකීය උපාධ්‍යාය ධර්‍මාරාම මාහිමියන් සමග ගාල්ලේ ගංගාරාමයෙහි කලක් නැවතී සිටියේය. ඉන්පසු ටිකකලක් මාතර (ජයමහාවිහාරයෙහි?) නැවතී සිට නැවත වැරැල්ලානේ විහාරයෙහි වාසයට පැමිණියේය. මෙහිදී නොයෙක් දෙනාට ඉගැන්වීමෙන් ද වාදවිවාදාදියට සහභාගීවීමෙන් ද මෙතුමා උසස් පඬිවරයෙකු සේ ලක්දිව ප්‍රකට විය.

† "අප්පුහාමි" යන්න මෙකල බොහෝසේම ගොවිවංශිකයන්ට හිමිවී ඇතත් පෙර උසස් පෙළේ කෞරවවංශිකයනටත් මෙය හිමිව තිබුණු බව ඔවුන්ගේ නම්වලින් පෙනේ. සලාගම ගෝත්‍රයේ ද එය පාවිච්චිකළෝ වූහ. ජයසූරිය පෙළපත කෞරවවංශිකයෝ.

මාතරනිකායේ උපසම්පදාව ලැබූ මූන්වහන්සේ අවුරුදු 15 ක් නොවෙනස්ව එහි සිටියේය. ඉත්පසු මාතර මහාස්වාමීන්වහන්සේ හා ඇතිවූ මතභේදයක් නිසා මේ ස්ථවිරතුමන් හා එතුමන්ගේ ආචාර්ය ජිනරතන මහාස්ථවිරතුමන් ඇතුළු පිරිසක් ඒ නිකායෙන් අස්වී බු ව 2401 දී මුල් නිකාය වූ කල්‍යාණිවංශයට එක්විය ක්‍රි. ව. 1906 දී පළවූ "ශ්‍රී සුමංගල ස්ථවිර චරිත" යෙහි වනාහි මාතර නිකායේ උපසම්පදාව ලැබීම ගැන හෝ එයින් අස්වී කල්‍යාණිවංශයට ඇතුල්වීම ගැන කිසිවක් සඳහන් කොට නැත එයින් උන්වහන්සේගේ කීර්තියට කැළලක් වියහැකැයි ඒ පොත් කතෘ සිතුවා වියහැක. එය කෙසේවුවත් ඓතිහාසික සත්‍යයන් යටපත් කිරීම යුතු නොවේ. එහි උන්වහන්සේගේ ආචාර්‍ය්‍ය නාමයන් දැක්වීමේ දී ද ගම්වල නම් නැතිව ජිනරතන-ධම්මානන්ද-සිරිසුමන තිස්ස" යයි අවිශේෂයෙන් දක්වා තිබේ. ඒ කාලයේදී කහද-මෝදර - මාතර-මිරිස්ස යන ගම්තුනේ උපන් ධම්මානන්ද නමින් ප්‍රකට මහතෙර තුන්නමක් විසූහ. එසේම බුලත්ගම-උඩුගල්පිටිය භික්කඩුව යන ගම්තුනේ උපන් සිරිසුමන තිස්ස මහාස්ථවිරවරු තුන්නමක් විසූහ. එබැවින් මේ නම් අනියමයෙන් දැක්වීම අනාගත පරම්පරාව සැකයට හෙළන ක්‍රියාවකි.

සිරිසුමංගල මහාස්ථවිරතුමන් කල්‍යාණිවංශයට ඇතුල්වූ දවසේදී තවත් පිරිස් දෙකක් ඒ නිකායට ඇතුල්විය. ඒ දල්හී කර්මය කළ දවසේ ලියා අත්සන්කොට තිබෙන ලිපිය වනාහි වර්තමාන සංඝ පරම්පරාවට අයත් වැදගත් ලිපියකි. ඒ ලිපිය අඹගහවත්තේ මහා ස්වාමිපාදයන්ගේ චරිතයෙහි ඇතුළත් කරනලදී.

මේ සිද්ධියෙන් අවුරුදු හතරකට පසු පැල්මඩුල්ලේ පොත් ශුද්ධිය විය. ඉද්දමල්ගොඩ දිසාපතිතුමාගේ දායකත්වය ඇතිව එතුමාගේ මහෝත්සාහයෙන් ඒ පොත් ශුද්ධිය සඳහා පැල්මඩුල්ලට වැඩමවාගත් උගත් ස්ථවිරවරුන් අතරෙහි සිටි වැලිගම ශ්‍රී සුමංගල ස්ථවිරතුමාට විනයපිටකය ශුද්ධකිරීමට බාරදෙනලදී ඒ පොත් ශුද්ධකිරීම සඳහා සැපපහසු ඇති තැනක් ඕනෑ වූයෙන් එවකට කල්‍යාණිවංශිකසංඝනේතෘවූ මිරිස්සේ ධම්මානන්ද මාහිමිතුමන්ගේ හා පානදුරේ රත්කොත් විහාරාධිපතිව වැඩවිසූ ගුණරතන තිස්ස මහාස්ථවිරතුමන්ගේ අනුමැතිය ඇතුව කළුතර පලාත්වාසීන් විසින් මූන්වහන්සේ බු. ව. 2412 හේදී උතුරුකළුතර වැල්ලබඩ විහාරයට හෙවත් පුලිනතලාරාමයට පමුණුවාගන්නාලදහ.

මෙසේ ලෝකශාසනාභිවෘද්ධිදායක ක්‍රියාවන්හි යෙදී සිටින අතර බු. ව. 2420 දී ලක්දිවට පැමිණි ජාගර මහතෙරුන්

වහන්සේ සමග ලක්දිව හා නා නිකායික් සමගිකරවීම් ආදි කටයුතුවල ශ්‍රී සුමංගල මහාස්ථවිරතුමා ද යෙදුණි. ජාගර මහාස්ථවිරතුමාට සංස්කෘත භාෂාව ඉගනීමට මුන්වහන්සේ උපදෙස් දුන්නාහයි ද කියත්.

බු. ව. 2438 දී අම්බලම්ගොඩ සුභද්‍රාරාමයට රැස්වූ බුරුම නිකායේ කතළුවේ මහාසාමීන්ගෙන් ප්‍රමුඛවූ කොටයේ සංඝයා වහන්සේ විසින් දොඩන්දූවේ පියරතනතිස්ස, වැලිගම සිරි සුමංගල යන මහාස්ථවිර දෙනමට සියකොටයේ නායකධුරය (සම්මතව) පවරනලදී. පියරතනතිස්ස මාහිමියන්ට "අරියවංසා-ලංකාරසාසන ධජ විනයාචරිය" යන උපාධිය ද වැලිගම මාහිමියන්ට "සාසනවංසාලංකාර කවිධජ විනයාචරිය" යන උපාධිය ද පිරිනමලදී

බුරුමරට මන්ඩලේ නුවර වජිරාරාමාධිපති වූ පඤ්ඤාසිහසිරි සද්ධම්මකවිධජ මහාධම්ම රාජාධිරාජ ගුරු මහතෙරුන්වහන්සේ ලක්දිවට පැමිණි තුන්වාරයේදීම සිරිසුමංගල මාහිමියන්ටත් පටසිවුරු ආදී නොයෙක් ශ්‍රමණපරිෂ්කාරයන් පිදූහ ඒ බුරුම සංඝයා සමග මුන්වහන්සේ නොයෙක් පලාත්වලට ගොස් සංඝකර්මයන් කිරීමට සහභාගී වූහ. "ආසියාලෝකය" නමැති බුද්ධචරිතය රචනාකළ සර් ඇඩ්වින් ආනෝල්ඩ් පඬිතුමා ලක්දිවට පැමිණි අවස්ථාවේ මුන්වහන්සේ වෙත පැමිණ නොයෙක් දේ ගැන සාකච්ඡා කෙළේය.

හිතෝපදේශ නමැති සංස්කෘත ග්‍රන්ථය මුලින්ම සිංහලට නගනලද්දේ මුන්වහන්සේ විසිනි. ශ්ලෝකවලට පදගතාර්ථ ද කථාවලට භාවසන්න ද යොදා සම්පාදනය කළ මේ පොත ක්‍රි. ව. 1878 දී සුසෙව් ද සොයිසා දිශානායක වාසලමුදලිතුමන් විසින් ප්‍රචාරයට පමුණුවනලදී පාසැලාවල පාවිච්චියට යෝග්‍ය පොතක් සම්පාදනය කළමැනවැයි කීර්තිමත් "ද සොයිසා" පවුලේ මහතුන් විසින් ආරාධිතවූ මුන්වහන්සේ හිතෝපදේශ කථාවන්ම ආශ්‍රය කොට පාඩම්පොතක් පිළියෙළ කළහ. එය ශ්‍රීමත් චාර්ල්ස් හෙන්රි ද සොයිසා නමැති ධනකුවේරයා විසින් 1877 දී මුද්‍රණය කරවනලදී. ඊට කලින් උන්වහන්සේ ලියූ ඉතිහාසය නමැති ග්‍රන්ථය පානදුරේ පී. අර්නොලිස් දියස් මහතා විසින් පළකරවනලදී.

උන්වහන්සේ ලියූ පොත් අතුරෙන් අතිවිශාල පොත නම් මුග්ධබෝධ නමැති සංස්කෘත ව්‍යාකරණයට සැපයූ සිද්ධාන්ත ශේඛර නමැති සන්නයයි. පිටු 700 ක් පමණැති ඒ පොත

ලංකාණ්ඩුවේ වියදමෙන් 1897දී මුද්‍රිතවිය, ආණ්ඩුවේ ආරාධනයෙන් සම්පාදිත වූ හිතොපදේශ භාවසන්නයක් 1884දී පලකරනලදැයි ද අසන්නට ලැබේ. පානදුරේ රන්කොත් විහාරයෙහි වූ සෞගත විද්‍යාලය පිහිටුවනලද්දේ මූන්වහන්සේගේ ප්‍රධානත්වයෙනි.

මෙසේ නානා ශාසනික කෘත්‍යයන්හි යෙදීසිටි මූන්වහන්සේ 1905 හේ පෙබරවාරි මාසයේදී ගිලන්බවට පැමිණ එම වර්ෂයේ මාර්තුමස 13වෙනිදා අපවත්වූහ. උන්වහන්සේගේ ආදාහනෝත්සවය එම මස 18 වෙනිදා පුලිනතලාරාමයෙන් බටහිරදෙසැ භූමි භාගයකදී දසදහස්ගණන් පිරිස මැදදී ආදාහන කරනලදී. එකල සිටි ලංකාණ්ඩුකාර තැන්පත් සර් ආතර් බ්ලේක් මහතා ඒ ආදාහනයේදී තමා වෙනුවෙන් පෙනීසිටීම සඳහා සර් සලමොන් ඩයස් බණ්ඩාරනායක මහමුදලිතුමන් කළුතරට එවීය. ජේ. ඩබ්ලිව්. සී. ද සොයිසා සමාදන විනිශ්චයකාර මුදලිතුමා ආදාහනය සඳහා සඳුන්දර වොන් එකක් එවීය. හොරේතුඩුවේ සිමන් ප්‍රනාන්දු චන්ද්‍රශේඛර නමැති මහාධනේශ්වර මුදලිතුමා එහි පැමිණ නොයෙක් පරිත්‍යාගයන් හා පූජාවන් කෙළේය. එහි පැමිණි සංඝයා අතරෙහි ප්‍රමුඛවූයේ මූන්වහන්සේගේ සහාය ඇතිව කල්‍යාණිවංශය පාලනය කළ දෙඩන්දූවේ පියරතනතිස්ස නායක මාහිමිතුමාය. හික්කඩුවේ ශ්‍රී සුමංගල නායකමාහිමියෝ ද මූන්වහන්සේ අපවත්වූ විගස මෙහි අවුත් ස්වකීය ශෝකය ප්‍රකාශකොට වැඩියාහ.

## 31. රන්දෙඹේ ධම්මාලංකාර නායක මාහිමියන් වහන්සේ.

(ක්‍රි. ව. 1833 - 1893)

රන්දෙඹේ මහාමංගල සමුද්‍රාරාමාධිපතිව වැඩවිසූ අමරපුර සද්ධම්මවංසනිකායේ මහානායකධුරය දැරූ "සුගතසාසනධජවිනයාචරිය" ධම්මාලංකාර මාහිමිතුමා වනාහි දඹලූපරම්පරාවේ ශ්‍රේෂ්ඨ පඬිවරයෙකි. අම්බලම්ගොඩටත් බලපිටියටත් අතරේ පිහිටි "රන්දෙඹේ" නමැති ප්‍රකට ග්‍රාමයේ වැදගත්පවුලක උපන් මෙතුමා සියදෙගුරුන්ගේ මෙහෙයීම පරිදි "සිරිවිසුඩ-අරියවංසපාල-මහානිස්සයකාරකාචරිය" තුඩුවේවත්තේ පඤ්ඤාසීහ මහාස්ථවිරතුමන් වෙත පැවිදිය. ඒ පඤ්ඤාසීහමහාස්ථවිරතුමා මුලදී දෙඩන්දූවේ කුමාරමහාවිහාරයෙහි පිරිවෙණක් පිහිටුවාගෙන ඉගැන්වීම කෙළේය. ඉන්පසුව කොස්ගොඩ වැලිකන්දේ සුදර්ශනාරාමයෙහි නැවතී ඉගැන්වීම කෙළේය. මේ ධම්මාලංකාර හෙරණතුමා ද වැලිකන්දේ විහාරයෙහි නැවතී ඉගනීම කෙළේය.

උපසම්පදව ලැබීමට යොග්‍යකාලය පැමිණි කල්හි ආචාර්යයන් වහන්සේගේ උත්සාහයෙන් අම්බලගොඩ අසල මාදම්පාමෝදර උදකුක්ඛෙපසීමාවට රැස්කරනු ලැබූ මහාසංඝයා වෙතින් උපසම්පදව ලැබීය. බෝපාගොඩ සුමනාලංකාර සිරිසුමන මහා ධම්මාරාජාධිරාජගුරු මහානායකසාමිහිමිතුමා මෙතුමාට උපාධ්‍යාය විය. අම්බලම්ගොඩ පොල්වත්තේ අග්ගරාමාධිපතිව වැඩවිසූ සිරිමුනිවරවංසපාල මිරිස්සේ ධම්මානන්ද නායකස්ථවිරතුමා ද දඩල්ලේ විමලජෝති මහාස්ථවිරතුමා ද රත්දෙබෙ සෙලුතනාරාමාධිපතිව වැඩ විසූ ගුණානන්ද මහාස්ථවිරතුමා ද මුන්වහන්සේට කර්මාචාර්යවූහ. එය සිදුවූයේ ශකවර්ෂ 1776 වෘශ්චිකරවි 12 භාග රිවිදින රුවු දෙපැයහමාරය යයි දක්වා තිබේ. එය ක්‍රි. ව 1855 බව පෙනේ.

උපසම්පත්තියෙන් පසු මෙතුමා දූවේමෝදර බෙන්තාරාමයෙහි නැවති ලංකාගොඩ ධීරානන්දමාහිමිතුමන්ගෙන් හා ස්වකීයාචාර්යයාගෙන් වැඩිදුරටත් විනය ධර්මාදිය ඉගෙන ගත්තේය. මෙහිදී මුන්වහන්සේ තවත් වරක් පුනශික්ෂාව ලැබීය. ඒ පුනශික්ෂාව ගැනීමේදී ලංකාගොඩ ධීරානන්දමාහිමියෝ උපාධ්‍යාය වූහ. පුවක්දණ්ඩාවේ පඤ්ඤානන්ද-පැලෑනේ ධම්මානන්ද යන දෙනමද දෙඩම් පකළ නමින් පෙනෙන ස්ථවිරනමක් ද කර්මාචාර්යවූහ.

ක්‍රි ව. 1884 දී මුන්වහන්සේට ‘සද්ධම්මවංසනිකායේ නායක පදවිය පත්කරනලදී. සීමානයදප්පණ නමැති විශාල ග්‍රන්ථයක් මුන්වහන්සේ විසින් සම්පාදිතව පළකරනලදී. පැල්මඩුල්ලේ පොත්ගුඩියේදී මුන්වහන්සේ ද ඒ පණ්ඩිතසභාවට තෝරගන්නා ලදහ. සැටවිය පිරිසිටි මුන්වහන්සේ 1893 ජනවාරිමස 17 වෙනිදා කොස්ගොඩ වැලිකන්දේ සුදර්ශනාරාමයේදී කථාශේෂභාවෝපගත වූහ.

මුන්වහන්සේගේ ප්‍රාචාර්යයා නම් රත්දෙබෙ මහාමංගල සමුද්‍රාරාමයේ වැඩවිසූ දූවේ චන්දසාර මහාස්ථවිරතුමාය. ඒ චන්දසාර මහාස්ථවිරතුමාගේ ගුරුවරයා කල්‍යාණිවංශ ප්‍රතිෂ්ඨාපක සතළුවේ ගුණරතනතිස්ස මාහිමිතුමායි. දූවේ චන්දසාර මහා ස්ථවිරතුමාගේ ශිෂ්‍යයෝ නම්:-

1. වැල්ලබඩ චන්දජෝති
2. රත්දෙබෙ ධම්මජෝති
3. මාදම්පේ ගුණරතන
4. තුඩුවෙවත්තේ පඤ්ඤාසීහ
5. ඕමත්තේ අභයතිස්ස (නායක ස්ථවිර)

ආදි දශනමකි. මේ පරම්පරාවෙහි වූවෝ යථොක්ත රත්දෙඹේ මහාවිහාරය, විහාරගොඩ සෙලුත්තරාරාමය, පරගහතොට සුනන්දාරාමය, කරන්දෙනියේ තපෝධනාරාමය, කොස්අතුමානාතේ විහාරය, වල්ලබගල ගිරිසමන්තාරාමය, ගතේගොඩ සුභද්‍රාරාමය, අඹුගොඩ ජයසුමිතාරාමය, කොස්ගොඩ කැකිරිවත්තේ විහාරය, රත්ගම රාජාරාමය, කටුකොලියේ බෝධාරාමය, වතුගෙදර විජශ්‍රීවර්ධන මූදලින්දාරාමය ආදියෙහි වෙසෙත්. මේ පරම්පරාව කතළුවේ මහ ස්වාමීන්ගෙන් ප්‍රභවවූ නමුත් දත් එයින් වැඩි දෙනෙකුන් සද්ධම්මවංසනිකායට ඇතුලත්ව සිටින නිසා ඇතැම් කෙනෙක් පරම්පරාව දක්වන විට දූවේ චන්දසාර මහාස්ථවිරතුමන් දක්වා එය ලියා කතළුවේ මහාස්වාමීන්ගේ නම නොකියා හරිත්. ඇතැම්විට දූවේ මහාස්වාමීන්වහන්සේ දඹල්ලට සම්බන්ධකොට දක්වති. එය වනාහි ඇත්ත සැඟවීමකි. අභයතිස්සනායක ස්වාමිපාදයන්ගේ චරිතයෙහි කතළුවේ මහාස්වාමීන්වහන්සේගේ නාමය දක්වා තිබේ. ඒ පොත රත්ගම සිරිසුමන මහාස්ථවිරතුමන් විසින් ලියනලදුව 1909 යේදී මුද්‍රිතවූවකි (අභයතිස්ස නායක මාහිමියන්ගේ මෙහි එන චරිත බලනු මැනවි)

## 32 ඕමත්තේ අභයතිස්ස නායක ස්වාමින්ද්‍රයෝ.

(බු. ව. 2376-2450)

ඇල්පිටිපලාතේ ගණේගොඩ සුභද්‍රාරාම නමැති පුරාණ විහාරය, කරන්දෙනියේ තපෝධනාරාමය ආදියෙහි අධිපතිව වැඩවිසූ "සුගතසාසනසෝධක - විනයාචාරිය අභයතිස්ස" මහා ස්වාමිතුමා වනාහි බෙන්තර එල්ලාවිට කෝරලයට අයත් ඕමත්ත නම් ගමේදී ශකවර්ෂ 1755හේ වෘෂභරවි දශභාග සඳුදින අරුණෝදය කාලයේදී උපන්නේය. ගොවිවංශික "දොන් උපෝරිස් අප්පුහාමි" මෙතුමාගේ පියාවිය. සොහොයුරන් සිවුදෙනෙකුන් අතරෙහි තෙවෙනියා වූ මෙකුමරු කුඩාකලම පියා කාලක්‍රියා කෙළේය. ඉන්පසු මෑණියන්ගේ දෙවුසොහොයුරු "මල්ලව-ආරච්චිගේ දොන් අල්විස්" පොලිස් මුලාදෑනි මහතා විසින් මේ ළදරුවා පෝෂණය කරන ලද්දේය. මෙකුමරුගේ සුවිනීත ගුණය දුටු ඒ මහතා එකුමරුගේ වැඩිමහල් සොහොයුරු "දොන් ඊදිරිස් අප්පුහාමි" හා කථාකොට අකුරුඉගනීම සඳහා රත්දෙඹේ මහාමංගලසමුද්‍රාරාමාධිපතිව වැඩ විසූ දූවේ චන්දසාර මහාස්ථවිරතුමන්ට බාරකරනලදී.

රත්දෙඹේ ගම එකුමරු උපන්ගමට හැ: 17 ක් පමණ දුරවූ බැවින් ආරාමයෙහිම නැවතී ඉගෙනීම කළ මෙකුමරුන්ගේ [illegible] පැවැත්ම [illegible] ආචාර්යමහාස්ථවිරතුමා අවුරුදු තියකට

පසු කුමරුගේ නෑයන් හා සාකච්ඡාකොට දෙළොස් හැවිරිදි පමණ කල්හි පැවිදි කරවිය. පැවිදිවීමේදී අභයතිස්ස යන නාමය ලැබූ සාමණේර තෙමේ සුවිනීත ශික්ෂාකාමියෙක්ව උගතයුතුදේ ඉගෙනගත්තේය මේ ශිෂ්‍යයාට උසස් ඉගනීමක් ලබාදෙනු කැමති වූ ආචාර්යතුමා සාමණේරයන් දඩල්ලට කැඳවාගෙන ගොස් එහි වාලුකාරාමාධිපතිව වැඩවිසූ බෝපාගොඩ මාහිමියන්ට හා ඒ මාහිමියන්ගේ ශිෂ්‍යවූ ව්‍යක්තපණ්ඩිත ලංකාගොඩ මාහිමියන්ට භාරකෙළේය.

රත්ගම කිරිමැටියේ විහාරයේ වැඩවිසූ බේරුවල මහාස්ථවිර තුමන් වෙත මුලින් පැවිදිවී සිට ඒ මහාස්ථවිර තුමාගේ ඇවෑමෙන් ලංකාගොඩ මහා සවාමීන්ගේ අතවැසි බවට පත්ව සිට ඉන්පසු දූවේ චන්දසාර මහාස්ථවිරතුමාගේ ශිෂ්‍යභාවයට පැමිණි තුඩුවේ වත්තේ පඤ්ඤාසීහ ස්ථවිරතුමා කොස්ගොඩ වැලිකන්දේ සුදර්ශනාරාමයේ නැවතී ඉගැන්වීමක් ආරම්භ කළ විට අභයතිස්ස සාමණේරතෙමේ ද එහි නැවතී ඉගනීම කෙළේය. එසේ දඩල්ලෙන් ඉවත්වී කොස්ගොඩට ගියේ රන්දොඹේ ධම්මාලංකාර සාමණේරයාණන් ද කොස් ගොඩට භාරදී තිබුන නිසා ඒ දෙනම එකතැන විසීම සඳහාය.

මෙසේ කොස්ගොඩ නැවතී සිටින කාලයේදී චන්දසාර මහා ස්ථවිරතුමන් රෝගාතුරවූයෙන් මේ ශිෂ්‍යදෙනම ඉක්මනින් උප සම්පන්න කිරීමට එතුමාට ඕනෑවිය. ඒ නිසා "බෝපාගොඩ ඤාණාලංකාර සිරිසුමන" මහානායක හිමියන් ප්‍රධාන සංඝයා වහන්සේ මාදම්පාමෝදර උදකුක්ඛේපසීමාවට පමුණුවාගෙන අභයතිස්සධම්මාලංකාර යන මේ දෙනමට උපසම්පදාව දෙන ලදී. යථෝක්ත මහානායක මාහිමියෝ මෙතුමාට උපාධ්‍යාය වූහ. පොල්වත්තේ අගාරාමාධිපති "මිරිස්සේ ධම්මානන්ද" නායකමාහිමිතුමාද දඩල්ලේ විසූ "විමලජෝති" මහාස්ථවිරතුමාද විහාරගොඩ සෙලුත්තාරාරාමාධිපති "ගුණානන්ද" මහාස්ථවිර තුමා ද මෙතුමාට කර්මාචාර්යවූහ. මේ උපසම්පදාව සිදුවූයේ ශකවර්ෂ 1776 යේ වෘශ්චික රවි 12 වෙනි භාගයේ රිවිදිනය.

මින් ටික දිනකට පසු චන්දසාර මහාස්ථවිරතුමා ඒ හට ගෙන තිබුණු ව්‍යාධියෙන්ම සවර්ගපරායණවිය. ක්‍රි. ව. 1909 යේදී "සව් දියස් නාබ්‍රෙව් විජයශ්‍රීවර්ධන" මහතා විසින් පළකරවූ "අභයතිස්ස නායක ස්ථවිරචරිත" යේ 4 වෙනි පිටේ දක්වෙන වාක්‍ය කොටසක් මෙසේයි:- "මීට පසුදින චන්දසාර මහාස්ථවිර පාදයන්ගේ ප්‍රධානත්වය පිට පැවතුන රත්දොඹේ මහාමංගල සමුද්‍රාරාමය, පරගහතොට විහාරය, කරන්දෙණියේ විහාරය

ආදි ස්ථානත් සමග ගරු-ලඝු භාණ්ඩ ධර්මපුස්තකාදිය සවකීය ශිෂ්‍යහත්තමට බාරදී ඒ පැවතුන රෝගයම බලවත්වීමෙන් පරලොකප්‍රාප්ත වූහේය. මුන්වහන්සේ ගේ ආචාර්යයෝ නම් පසු කාලයකදී බුරුමරටට පැමිණ පරිශුද්ධෝප සම්පදාදිය රැගෙන විත් ශාසනසංග්‍රහ කළාවූ කතළුවේ ගුණරතන තිස්ස මහාස්ථවිර පාදයෝය. උන්වහන්සේගේ ආචාර්යවූයේ සියම් නිකායික මහාස්ථවිර තුමෙකි."

මින් පසුකලක අභයතිස්ස භික්ෂුතුමා ලංකාගොඩ ධීරානන්ද මාහිමියන් හා පඤ්ඤාසීහ මහාස්ථවිරතුමන් එවකට තැවති සිටි දූවේමෝදර බෙන්තාරාමයෙහි තැවති වැඩිදුර ඉගෙනීම කෙළේය. එහි වසන කාලයේදී ලංකාගොඩ මාහිමියන් උපාධ්‍යාය කොටගෙන නැවත වරක් උපසම්පදාව ලැබීය. ඉන්පසු පොහොද්දරමුල්ලේ වසන කාලයේදී ද එම මාහිමියන් උපාධ්‍යාය කොටගෙන කළුතර ගඟේදී පුනශික්ෂාව ලැබීය, උපසම්පදාව ලැබූ පළමු වස්කාලයේදී මුන්වහන්සේ ධම්මාලංකාර සවාමිපාදයන් සමග ඒ සවාමිපාදයන්ගේ සොහොයුරු "ජුවානිස් මැන්දිස් කරුණාරත්න" ආරච්චි මහතාගේ නිවසෙහි වස්විසූහ. දෙවෙනි තෙවෙනි වස්කාලවලදී ඔමත්තේ සවකීයඥතීන්ට සංග්‍රහකරමින් එහි වස්විසීය. 4-5-6 වෙනි වස්කාලවලදී කරන්දෙනියේ තපොධනාරාමයෙහි විසී

එක්හැලිගොඩ දිශාපතිතුමාගේ ආරාධනාව ලැබූ මෙතුමා ඒ පෙදෙසට පැමිණ එහි අභයතිලකාරත්නාරාමයෙහි සත වෙනි වස විසී. ක්‍රි. ව. 1855 දී බලපිටියේ "බස්තියන් මැන්දිස් ගුණසේකර විජයශ්‍රීවර්ධන" මුදලිතුමාගේ ආරාධනාවෙන් බලපිටියේ වැල්ලවත්තේ වස්විසී. 1870 වේදී බෙන්තර වලල්ලාවිටිකෝරලේ ඇල්පිටි ගමට අයත් ගණේගොඩ වන ගහනව තිබුණු පුරාණ බෞද්ධසිද්ධස්ථානයකදී රන්පිළිමයක් හා ලෝහපිළිම දෙළසක් ද ගල්කුලුණු ආදිය ද ඒ පළාතේ වාසීන් විසින් සොයාගන්නා ලදී. ඒ දායකවරු මේ පූජ්‍යවස්තූන් අභයතිස්සසවාමිපාදයන්ට බාරදී ඒ ස්ථානයෙහි අලුතෙන් ආරාමයක් ගොඩනැංවූහ. 1872 කේදී මුන්වහන්සේ පළමුවෙන් එහි වස්විසූහ. මින්පසු "සැම්සොන් දබ්‍රෙව් විජයගුණරත්න රාජපක්ෂ" රජවාසල මුදලි තුමාගේ ආරාධනාවෙන් 19 වෙනි වස වැලිතර මහාකප්පින මුදලින්ද්‍රාරාමයෙහි විසීය.

යථොක්ත රාජපක්ෂ මුදලිතුමාගේ මැතිණියවූ "කැරොලයින් ද සොයිසා ශ්‍රීවර්ධනරාජපක්ෂ ලමාතැනී" තොමෝ වැලිතර

මාදූගගේ පිහිටි කොත්දූවේ තිබුණු බෝරුක පුරාණ එකකැයි සලකා ඒ ස්ථානයෙහි අංගසම්පූර්ණ ආරාමයක් කරවා අභයතිස්ස මාහිමියන් කැඳවා එහි වස්වසවා ගත්තේය. එය 37 වෙනි වස විය. යථෝක්ත රාජ පක්ෂමුදලිතුමන් 1888 වේදී අභාවප්‍රප්තවූ පසු එතුමාගේ පුත්‍රවූ "චූඩර්දබ්‍රෙච් විජය ගුණරත්න රාජපක්ෂ මුදලිතුමා" 1894 රේ ජුනි මස 18 වෙනි දින සියගණනක් සංඝයාවහන්සේ කොත්දූවේ ආරාමයට පමුණුවා ඒ පවරබොධිරාජාරාමය අභයතිස්ස මාහිමියන් ප්‍රමුඛ සංඝයාට පූජාකෙළේය. 40 වෙනි වස ද උන්වහන්සේ එහි විසූහ.

ක්‍රි ව. 1896 යේදී සුප්‍රකට ආබ්‍රහම් මැන්දිස් ගුණසේකර මුදලිතුමාගේ පියාවූ බලපිටියේ බස්නායක වලව්වේ "බස්තියන් මැන්දිස් ගුණසේකර විජයශ්‍රීවර්ධන" මුදලි තුමන් හා "අසේනා ද සොයිසා" ලමාතැනිය විසින් අම්බලම්ගොඩට තුදුරු වතුගෙදර ගමේ විහාරයක් ගොඩනංවා එය අභයතිස්ස මාහිමිතුමන් ප්‍රමුඛ සංඝයාට පුදනලදී උන්වහන්සේ 41 වෙනි වස එහි විසූහ ඒ වර්ෂයේදීම උන්වහන්සේ අටපිරිකර 79 ක් සහිත සාංඝිකදානයක් කරන්දෙණියේ තපෝධනාරාමයේදී දුන්හ. 1900 යේ මාර්තු 15 වෙනිදා ඒ ආරාමයේදීම අටපිරිකර 88 ක් හා නොයෙක් ගරු ලඝු භාණ්ඩ ඇති දානයක් දෙසියනමකට දෙවිය.

1902 දී සබරගමුවේ අමරපුරනිකායික ධම්මපාල, වතුරාවිට සුමනසාර, පනාවැන්නේ ධම්මරතන යන මහතෙරුන් ප්‍රමුඛ සංඝයා ද සබරගමු මහ සමන් දේවාලයේ බස්නායක නිලය දරූ සමාදන විනිශ්චයකාර එක්නැලිගොඩ දිසාපතිතුමා ප්‍රමුඛ ගිහිපිරිසක් ද මූන්වහන්සේ සබරගමුවට වැඩමවාගෙන ගොස් ඒ වර්ෂයේ ජුනි 30 වෙනිදා ඒ පලාතේ සංඝනායක පදවියට මූන්වහන්සේ පත්කර ගත්හ. 48 වෙනි වස ඕමත්තේ සිරිසුනීන් කරවූ ආරාමයෙහි විසීය 50 වෙනි වස රත්ගම දෙවප්‍රතිරාජාරාමයෙහි විසීය. 1905 දී බලපිටියේ ඇම්. ඩී. සිල්වා රූපසිංහ (කඩදාසි) වෙළඳ මහතා බලපිටියේ සුභද්‍රාරාමයේ ගොඩනැංවූ දෙමහල්ගෙයි වස්විසීය. 52 වෙනි වසත් ඒ ආරාමයෙහිමය. 77 වසක් ආයු වැළඳූ මූන්වහන්සේ 1907 මැයි මස 26 වෙනිදා අපරභාග 4 ට පමණ යථෝක්ත සුභද්‍රාරාමයේදී අපවත්වූහ. ජුනි මස 1 වෙනි දින ආදාහනය සිදුකරන ලදී.

## 33. වස්කඩුවේ ශ්‍රී සුභූති නායක මාහිමියෝ.
(ක්‍රි. ව. 1835-1917)

පාලිනිඝණ්ඩුව සකස්කොට සිංහල-ඉංග්‍රීසි අර්ථ යොදා පළකරවීමෙත් ද "නිඝණ්ඩුසූචිය" සම්පාදනය කිරීමෙත් ද ලක්දිව ප්‍රකට වූ පවරතෙරුත්තිකාචරිය - මහාවිහාරී රාජගුරු "වස්කඩුවේ ශ්‍රී සුභූති මහානායක සත්විරතුමා" වනාහි යුරෝපීය පඬිවරයන්ට පෙරදිග භාෂාවන් ඉගනීමට නොයෙක් ආකාරයෙන් උපකාර කළ උතුමෙකි. එතුමාගේ නම නොදත් යුරෝපීය පඬිවරයෙක් ඒ කාලයේ දී නොවීය.

කළුතර තොටමුණට අයත් වස්කඩුව නම් ගමේ විසූ "කරුණාමූනි පතිස් ද සිල්වා" මහතා මෙතුමාගේ පියාය. මැණියෝ වනාහි ඕලන්ද ආණ්ඩුකාලයේදී කුරුඳු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන වෛද්‍ය නිලධාරිතනතුරට පත්ව සිටි "තිලමුනි බස්තියන් ද සිල්වා" වෙද මේසත්‍රිරාලහාමිගේ දුවක්වූ පුංචිහාමි උපාසිකාවය. ක්‍රි. ව. 1835 හේ වෑඹහරවිය තුළ මූන්වහන්සේගේ උත්පත්තිය සිදුවිය. නොහොයුරන් පස්දෙනෙක් ද සොහොයුරියන් දෙදෙනෙක් ද ඇති පවුලේ සියල්ලට බාලයා වූ මේතෙමේ උත්පත්තියෙන් සත් වෙනි වශීයේදී සිය ගමේ පිහිටා තිබුණු වෑස්ලියන් සමාගමේ ගොඩ්ජ්ලි පාදිලිතුමන්ගේ පාලනය යටතේ වූ පාඨශාලාවේ ඉගනීම සඳහා පමුණුවනලද්දේය. නොබෝ කලකදීම ඉගෙනීමේ සමර්ථවූ මේ ශිෂ්‍යයා පාඨශාලාවේ අතිදක්ෂයා වී තෑගි කීපයක් ද ලබා ගත්තේය

මෙසේ දක්ෂ බව දක්වූ මෙකුමරු පැවිදිකළහොත් සත්කීර්තිමතෙක් වන්නේයයි ජන්මපත්‍රයෙන් ද පෙනුණු බැවින් මවුපිය සොහොයුරෝ වස්කඩුවේ "කන්දේ විහාරයේ" වැඩසිටි ශ්‍රී සුමංගල නායක සවාමීන් වහන්සේගේ ප්‍රධාන ශිෂ්‍යවූ කලමුල්ලේ සුමනාරාමයෙහි වැඩවිසූ සරණපාල සීලක්ඛන්ධ මහාසත්විරතුමන්ට බාර දුන්හ. පැවිදිවීමට උවමනා බණදහම් පොත් උගත් පසු මහොත්සවයෙන් පැවිදිකරනු ලැබූ සුභූති සාමණේරතෙමේ මුද්‍රිතපොත් නොතිබුණු ඒ කාලයේදී නොයෙක් පොත් තමන්ම ලියාගෙන අතිදක්ෂව ඉගෙනීම කෙළේය.

තවදුරටත් ඉගෙනගනු කැමති මේ සාමණේරතෙම රත්නපුර පලාතේ වෙළදාමේ යෙදී සිටි සිය සොහොයුරන්ගේ ඕනෑකම ලෙස පැල්මඩුල්ලේ විහාරාධිපතිව වැඩවිසූ ශ්‍රීපාදස්ථානයේ හා සබරගමුවේ නායකධුරය දැරූ ශ්‍රීසුමංගල මාහිමියන්ට බාරදෙන ලදින් සත්අවුරුද්දක් එහි ඉගෙනීමේ යෙදී සිටියේය. එය

අවසන්කොට පැමිණිවිට ස්වකීය ඥාතීන් හා සහෝදරයන් විසින් අලුතෙන් සැදවූ වස්කඩුවේ අභිනවාරාමයෙහි ස්වකීයාවාසීයන් සමග නැවතුණේය. (මුන්වහන්සේගේ අවසාන කාලය දක්වාම සිය මෑණියන් සාදවා දුන් ලැගුම්ගෙහි විසූහයි කියත්) මේ කාලයේදී ස්වකීයාවාසී තුමන්ගේ අභිප්‍රායක් නිසා මේ ආරාමයට පැමිණසිටි මොහොට්ටිවත්තේ ගුණානන්ද ස්වාමීන් වහන්සේ මේ සාමණේරනමගේ ගුරුභාවය දැක ව්‍යාකරණ ප්‍රශ්න කීපයක් ද විචාරා සතුටුව තවදුරටත් සංස්කෘත ඉගැන්වීම පිණිස බටුවන්තුඩාවේ දේවරක්ෂිත පඬිතුමන් වෙත පැමිණවූහ ඊට පසු ඉන්දියාවෙන් පැමිණි බ්‍රාහ්මණ පඬිතුමකුගෙන් ද සංස්කෘත ඉගනීම කෙළේය.

**උපසම්පදාව ලැබීම.**

ක්‍රි. ව. 1859 යේ වෙසක් මස අව අටවක්ද, බලපිටියේ උදකුක්ඛෙප සීමාවේ රැස්වූ මහාසංඝයා වෙතින් “සිරිසද්ධම්ම වංසපාල ධීරානන්ද” නමැති ලංකාගොඩ මහාස්වාමීන් උපාධ්‍යාය කොටගෙන (1) වස්කඩුවේ සරණපාල සීලක්ඛන්ධ, (2) එකවාසී පඤ්ඤානන්ද මහාස්ථවිර, (3) ධම්මක්ඛන්ධ මහාස්ථවිර යන තුන්නම කම්මාවාසී කොටගෙන මුන්වහන්සේ උපසම්පදාව ලැබූහ. මොහොට්ටිවත්තේ ගුණානන්ද ස්වාමීන්ට විවාදවලදී උවමනාවූ ගැඹුරු ධර්මකොටස් සොයාදීමට මුන්වහන්සේ නොයෙක්විට වෙහෙස ගත්හ. මේතුමන් විසින් පළමුවෙන්ම පාලිනිඝණ්ඩුව සකස්කොට ඉංග්‍රිසි සිංහල අර්ථ යොදා ඇණ්ඩ්‍රූවේ යන්ත්‍රාලයේ මුද්‍රණයට පමුණුවන ලද්දේ 1864 දීය. මුන්වහන්සේ සකස්කළ නාමමාලා නමැති විශාල ග්‍රන්ථය 1876 යේදී මුද්‍රණය කරන ලදුව හත්වෙනි ඇඩ්වඩ් මහරජු වේල්ස්හි කුමාරයා වශයෙන් මෙහි පැමිණි අවස්ථාවේදී එතුමාට පිළිගන්වන ලදී. එය පෙර අවර දෙදිග නොයෙක් රටවල පඬිවරුන්ට යවන ලදින් නොයෙක් දෙනාගෙන් තුති පැසසුම් සහිත ලියුම් ලැබුණාහ.

1863 දී ලක්දිවට පැමිණ සිවිල් නිලයක් දරමින් සිට පසුව පාලි මහාඅකාරාදියක් සම්පාදනය කළ ආර්. සී. චිල්ඩර්ස් පඬිතුමාට ලියුම් මඟින් හා මසකට දෙතුන් වරක් හමුවීමෙන් පාලි ඉගැන්වීමට ද මේතුමා උත්සාහ ගත්තේය. පසුකලෙක උන්වහන්සේ විසූ ආරාමයෙහි ප්‍රාචීනභාෂා උගන්වන පිරිවෙණක් පිහිටුවනලදී. වැලිතර-කොස්ගොඩ-බදුල්ල-වලපනේ ආදී පලාත්වලින් පැමිණි ශිෂ්‍යයෝ එහි ඉගනීම් ලැබූහ. බුරුම-සියම්-කාම්බෝජ-චීන ආදී විදේශවලින් පැමිණි බොහෝ දෙනෙක් ද බුද්ධාගම හා සිංහල සංස්කෘතිය සම්බන්ධ දේ මෙහිදී ඉගෙන

ගත්හ "ඇල්. ඇජ්. ලී" "ඒ. ඇස්. පැග්ඩත්" යන ඉංග්‍රීසි නිලධාරීහු මෙතුමාගෙන් සිංහල ඉගෙනගත්තෝය. ආබ්‍රහම් මැන්දිස් ගුණසේකර මුදලිතුමා ද මෙතුමාගෙන් සිංහල ඉගෙන ගත්තෙකැයි කියත්.

මෙතුමන්ගේ ආචාර්යවූ සරණපාල මහාස්ථවිරතුමන් වෙත ධම්මක්ඛන්ධ නමින්* පැවිදිව සිට සිවුරුහැරගිය මෙතුමාගේ ඥාතියෙක්වූ "අගම්පොඩි සාලිස් ද සිල්වා" ගුරුතුමා බුරුමරටට ගොස් බුරුම මහරජුගේ වෛද්‍යයා වී බොහෝ කලක් එහි සිට ඒ මහරජුගෙන් තුන්පිටකයේ පුස්කොළ පොත් ද දුර්ලභ පාලි ව්‍යාකරණ පොත් රාශියක් ද කිරිගල්පිළිම කීපයක් ද ලබාගෙන ලක්දිවට අවුත් ඒ පොත්පත් ආදිය ශ්‍රීසුභූති මහාස්ථවිරතුමාට පූජාකෙළේය. මේ වෛද්‍යවරයාගේ මාර්ගයෙන් මෙතුමාගේ නම දැනගත් එරට රජතුමා ද කුමාරවරු ද සංඝරාජාදි මහතෙරවරුද නොයෙක්විට මෙතුමාට ලියුම් හා තෑගි එවූහ.

දෙවෙනිවර පාලිනිඝණ්ඩුව පළකරවන ලද්දේ 1883 දීය. යට නම දක්වූ චිල්ඩර්ස් පඬිතුමාගේ හා ලන්ඩන් නුවර ඉන්දියා ඔපිස් පුස්තකාලයේ අධිකාරිවූ ආර්. රෝස්ට් මහතාගේ ඉල්ලීම ලෙස අභිධානප්පදීපිකාවේ ඇතුළත් සියලු වචන ධාතු-ප්‍රත්‍යය-පදවිග්‍රහාදිය සමග අකාරාදි පිළිවෙළින් යොදා "නිඝණ්ඩුසූචිය" පිළියෙළ කළවිට රෝස්ට් පඬිතුමා ලංකාණ්ඩුවට දන්වා එය මුද්‍රණය කරන්ට සැලැස්විය. එයින් පිටපතක් 1893 දී ලක්දිවට පැමිණි වික්ටෝරියා අධිරාජිනියගේ ද්විතීය පුත්‍ර කොනෝට්හි ආදිපාදතුමන්ට පිළිගන්වනලදී. ලක්දිව හා ලෝකයේ නොයෙක් රටවල උගතුන්ට ඒ පොත යැවීම නිසා මුන්වහන්සේ වෙත එවනලද ස්තුතිපූර්වක ලිපි බොහෝ වෙයි.

මුන්වහන්සේ ගැන දැනගත් සියමේ චූළාලංකාර මහරජතුමා අභිධර්මපිටකයේ පදයෝජනා පොත් පෙට්ටි දෙකක් ද චීවර පිරිකර ද එවීය. ඒ රජු රාජ්‍යයට පත්වීමේ 25 වෙනි සංවත්සරය සිහිපත්වීම සඳහා මුද්‍රණය කරවූ සියම් තුන්පිටකයේ සම්පූර්ණ පිටපතක් ද රජුගේ අත්සන සහිත කොට එවීය. ඒ රජතුමා ලක්දිවට පැමිණි අවස්ථාවේදී කොළඹ රජවාසලදී හමුවූ මුන්වහන්සේට සියම් පටපිළියෙන් තැනූ තුන්සිවුරු රජතුමාගේ අතින්ම පුදකළදී. ජාතක අටුවාව ශුද්ධකොට යුරෝපයේ මුද්‍රණය කෙරෙව් මහාචාර්ය ෆව්ස්බෝල් මහතා, යුරෝපයේ අද්විතීය මහාපඬිවරයාවූ සිටි මැක්ස්මුලර්, චිල්ඩර්ස්, රීචඩ්,

* සංකරවාදයේ විනිශ්චයක් ලබාගැනීම සඳහා ලංකාගොඩ මාහිමි-යන්ගෙන් සන්දේශය රැගෙන බුරුමයට ගිය දෙනමෙන් එක්නමකි.

මොරිස් ආදී පඬිවරුන්ගෙන් මෙතුමාට ලැබුණු තෑගිද බොහෝය. හත්වෙනි ඇඩ්වඩ් මහරජතුමා වේල්ස්හි කුමාරයා වශයෙන් 1876 යේදී මෙහි පැමිණි අවස්ථාවේදී එකුමරු විසින් විල්ඩර්ස් සකස්කළ පාළි මහාඅකාරාදියේ පිටපතක් සිය අත්සන පිහිටුවා මෙතුමන්ට පුදන ලදී.

රත්දෙබේ මහාමංගලසමුද්‍රාරාමාධිපතිව වැඩවිසූ "සුගත සාසන ධජ-විනයාචරිය-ධම්මාලංකාර නායක ස්වාමීන්වහන්සේ අපවත්වීමෙන් පසු අමරපුර සද්ධම්මවංස නිකායේ නායක ධුරයට සුදුස්සෙකු තෝරාගැනීම සඳහා "විශුඩර් නතානියෙල්ද ආබෲව් විජයගුණරත්න" රජවාසල මුදලිතුමා වැලිතර මහා කප්පින වලව්වට ගිහිපැවිදි මහාසභාවක් කැඳවීය. 1893 දී රැස්වූ ඒ මහාසභාව විසින් ශ්‍රීසුභූතිමාහිමියන්ට හා කොස්ගොඩ වැලිකන්දේ සුදස්සනාරාමාධිපතිව විසූ සුමංගල මාහිමියන්ට නායකධුර දෙකක් පවරනලදී. ඉද්දමල්ගොඩ දිසාපතිතුමාගේ ආධාරයෙන් පැල්මඩුල්ලේ පැවැත්වූ ත්‍රිපිටක සංස්කරණයේදී මූන්වහන්සේ බොහෝ උත්සාහවත්ව ක්‍රියා කළහ.

එංගලන්තයේ සියම් තානාපතිධුරය දරූ නානා භාෂාවන් දත් "ප්‍රින්ස් චුම්සායි" සියම් රජකුමරා 1880 වේදී සියරටට හැරීයන්නේ ලක්දිවට ගොඩබැස සුභූති මාහිමියන් එකල වැඩවිසූ වැල්ලවත්තේ බෝධිරුක්ඛාරාමයට පැමිණ උන්වහන්සේ හා සාකච්ඡාකොට තමාගේ රාජකාරීයන් අවසන් කොට ලක්දිවට අවුත් පැවිදිවෙන්ට කැමති බව දන්වා සියරටට ගියේය. ඉන් අවුරුදු පසළොසකට පසු 1896 යේ ඔක්තෝබර් මාසයේදී මෙහි පැමිණ සුභූති මා හිමියන් විසූ වස්කඩුවේ අභිනවාරාමයෙහි නැවතී සිට ඒ වර්ෂයේ නොවැම්බර් 1 වෙනිද මූන්වහන්සේ උපාධ්‍යාය කොටගෙන පින්වත්තේ සීලානන්ද නායකස්ථවිර තුමන් වෙතින් පැවිද්ද ලැබීය. ඒ මඟුණකම බැලීම සඳහා ලක්දිව නොයෙක් පෙදෙස්වලින් පැමිණි පිරිස දසදහසක් පමණ වීයැයි කියත්. . කුමාර තෙමේ පළමුකොට තමාගේ නොයෙක් තනතුරුවලට අයත් නොයෙක් ඇඳුම්කට්ටලවලින් සැරසී ඡායා රූප ගෙන අවසන්හි තමාගේ රත්කඩුව දෙකට කඩා ධාතු මාලිගාවේ පාතමාලයේදී පැවිදිවීම ගැන ප්‍රකාශයක් කියවා දහස්ගණනක් රිදීමිල මහජනයා මැදට විසිකොට ධාතුමාලිගාවේ උඩුමාලිගයේදී සංඝයාට පූජාපවත්වා එහිදී පැවිදිවිය.

පැවිදිවීමේදී ජිනවරවංස නාමය ලැබූ මේ කුමාර සාමණේර තෙමේ වැලිතර මහාකප්පින වලව්ව අසළ පිහිටි උදකුක්ඛෙප

සීමාවේදී උපසම්පදාව ලැබීය. ඒ උපසම්පදාවට රැස්වූ සංඝයා වහන්සේ විසින් සුභූතිමාහිමියන්ට රාජගුරු නාමය දෙනලදී. දඹදිව මහාබෝධියෙන් ශාඛාවක් ගෙන්වාගනු කැමතිව මූන් වහන්සේ කලක් ලංකාණ්ඩුධුරය දැරූ සර් විලියම් හැත්රිග්‍රෑගරි මහතාණන්ට ඒ කාරණය දන්වා ඒ මහතාගේ මගින් ඉන්දියාණ්ඩුවට දන්වා ලබාගත් බෝධිශාඛාව 1892 කේ මාර්තු 15 වෙනිදා කොළඹට ගෙනෙන ලදින් මහපෙළහැරින් ගෙන ගොස් වැල්ලවත්තේ බෝධිරුක්ඛාරාමයෙහි රෝපණය කරනලදී.

එංගලන්තයේදී මූන්වහන්සේගේ නම දැනගෙන සිටි පාලි පොත් කීපයක් ශුඩකොට පලකරවූ, මැදුම්සගිය ඉංග්‍රීසියට් නැගු සර් රොබර්ට් චාමර්ස් මහතා ලංකාණ්ඩුධුරයට පත්ව මෙහි අවුත් වැඩ බාරගෙන ශ්‍රීසුභූතිමාහිමියන් ඒතාක් වැඩවසන බව දැනගෙන මහත් ප්‍රීතියට පත්ව එතුමන් රජවාසලට ගෙන්වා ඡායාරූපයක්ද ගත්තේය. ඒ මහතා මෙරට හැර යන්ට පෙර පෙර 1915 වේ නොවැම්බර් 24 වෙනිදා වස්කඩුවේ අභිනවාරාමයට පැමිණ එහි පුස්තකාලය ආදිය බලා මූන්වහන්සේ රැකබලා ගතයුතුයයි ඥතීන්ට හා ගම්වාසීන්ට අවවාද කොට මූන්මහන්සේට මහත් ගෞරව දක්වා හැරී ගියේය.

මෙසේ නොයෙක් ලෝකශාසන සංග්‍රහ කළ මූන්වහන්සේ අවුරුදු 82 ක් ආයුවළඳා 1917 අප්‍රේල් මස 19 වෙනිදා රාත්‍රී වස්කඩුවේ සියඅරමේදී අපවත්වූහ. ඒ මාසේ 26 වෙනිදා උන්වහන්සේගේ ආදාහනොත්සවය ගම්භීරාකාරයෙන් පවත්වන ලදී.

මූන්වහන්සේගේ ශිෂ්‍යවූ සියම්කුමාර තෙරනම 1903 සිට 1911 දක්වා කොටහේනේ දීපදුත්තාරාමයෙහි නිත්‍යවාසීව වැඩ විසීය. එතුමාගේ සීයා වනාහි බැංකොක්නුවර විසූ තුන්වෙනි රාම මහරජතුමාය. එතුමාගේ පියා සියමේ කම්ෂානානදෙපාතී-මේන්තුවේ අධිපති ධුරය දැරූ "ෆ්‍රෙයාවෞ රාජවරවංශ තෙය්සුර් ක්‍රම බුන් රාජසිංහ" කුමාරයායි. ක්‍රි. ව. 1852 කේ පෙබරවාරි මස 23 වෙනිදා උපන් මෙතෙමේ සිංගප්පූරුවේ ඉංග්‍රීසිවිද්‍යාලයකට පැමිණ ඉංග්‍රීසි ඉගෙන ඉන්පසු ලන්ඩන් නුවරට ගොස් සිවිල් ඉංජිනේරුවකුවීමට ඉගෙන 1876 යේදී කිංග්ස්කොලීජියේ නෑගි ද ලැබීය. 1879 යේදී එංගලන්තයට හා ජර්මනියට ගිය සියම් රාජදූත පිරිසේ භාෂාපරිවර්තකයා ලෙස මෙතුමා ක්‍රියා කෙළේය. ඒ ගමනේදී ජර්මන් අධිරාජයාගෙන් ද නාන්න මාන්න ලැබීය. සියම්රජ්ජු විසින් එරට ඉතාම උසස් නම්බුනාමය දෙනලදී. පසුකලක එංගලන්තාදි රටවල් කීපයක ප්‍රථම සියම්

තානාපතිවරයා ලෙස පත්කරනලද්දේ පළමුවෙන් ලන්ඩන් නුවරද ඉක්පසු පැරිස්නුවරද නැවතී සිටියේය. 1886 යේදී සියමට හැරීගිය එතුමා ඒ රටේ තැපැල් හා විදුලිපණිවුඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධානතනතුරට පත්කරනලදී. මින්පසු වරක රාජදූතයකුලෙස ජපන්රටට ගියවිට ජපන්මහරජුගෙන් එරට ඉතාම උසස් ගෞරවෝපාධිය ලැබීය. 1896 දී පැවිදිව දීර්ඝ කාලයක් දීපදුත්තමාරාමයේ වැස 1911 දී එහි රත්නචෛත්‍යයේ වැඩනිමකරවා සිය රටට ගිය එතුමා ඒ වර්ෂයේ මාර්තුමාසයේදී ගිහිබවට පත්විය. එවිට එතුමාගේ වයස 60 කි. ගිහිබවට පත්ව බැන්කොක්නුවර ශාන්තජීවිතයක් ගතකළ එතුමා 1935 මාර්තු මස 16 වෙනිදා පරලොකගතවිය. සියමේ රජවරුන් පස්දෙනකුන්ගේ රාජ්‍යකාලයන් තුළ එතුමා ජීවත්විය. එතුමාගේ අවසානකාලයේ දී ආනන්දකුමරා රාජ්‍යයට පත්ව සිටියේය.

එතුමාට අයත් පොත් පත් ආදිය දැනුත් දීපදුත්තමාරාමයේදී දක්නහැක. දැනට ඒ විහාරාධිපතිව වැඩවසන මාදම්පිටියේ ජිනානන්දනායකස්ථවිරතුමා ඒ කුමාරතෙරුන්වහන්සේගේ ශිෂ්‍යයාය. ඒ ආරාමභූමියේ තිබෙන "කුමාරවිද්‍යාලය" නමැති ඉංග්‍රීසි ශාස්ත්‍රශාලාව පිහිටුවනලද්දේ එතුමන්-සිහිපත්වීම සඳහාය. සියමේ ආනන්ද මහිඩොල් රජතුමා ද එතුමාගේ සොහොයුරුවූ දැන් රාජ්‍ය භාරය දරන භූමිපාල රජතුමාද එතුමන්ගේ මවුදේවිය හා පිරිසද තවත් සියම්රාජකුමාරවරු ද මේ ස්ථානය බැලීමට වරින් වර පැමිණියාහ.

## 34. යුරෝපීය පඬිවරුන්ට පාලි ඉගැන්වූ මහාස්ථවිර නමක්

(ක්‍රි. ව. 1829 – 1872)

යාත්‍රාමුල්ලේ ධම්මාරාම මහාස්ථවිරතුමා බොහෝ වයස්ගතවී අපවත්වූවේකැයි මේකල බොහෝදෙනකුන්ගේ හැඟීම වියහැක. මුලින්ම පාලි ඉංග්‍රීසි ශබ්දකෝෂයක් සම්පාදනය කළ ආර්. සී. චිල්ඩර්ස් මහතාටද එංගලන්තයේ "පාලිපොත් සමාගම" පිහිටුවා මහත් ශාස්ත්‍රසංග්‍රහයක් කළ මහපඬිවර රයිස්ඩේවිඩ්ස් මහතාටද පාලි ඉගැන්නූ මේ මහතෙරනම ජීවත්ව වැඩසිටියේ අවුරුදු 43ක් පමණය. පුදුමයකට මෙන් යටකී චිල්ඩර්ස් පඬිතුමාද නොනැසෙන කීර්තියක් ලබාගෙන පරලොක ගතවූයේ එපමණ වයස ඇති කල්හිය.

මුත්වහන්සේගේ අකාලමරණය ක්‍රි. ව. 1872 දී සිදුවූ බව චිල්ඩර්ස්මහතා විසින් ස්වකීය ශබ්දකෝෂ සංඥපනයෙහි දක්වා තිබේ. එබැවින් මෙතුමාගේ උත්පත්තිය ක්‍රි ව 1829 පමණේදීයයි සිතියහැක මෙතුමාගේ චරිතය පිළිබඳ කරුණු මට ලබාගතහැකි වූයේ ඥානදර්ශී සඟරාවේ සවෙනිකාණ්ඩයේ සවෙනිකලාපයේ පළවීතිබෙන ලිපියකිනි. මෙතුමා බෙන්තොටට අයත් "යාත්‍රාමුල්ල" නම් ගමේ විසූ "මලවරආරච්චිගේ දො[illegible]මත්" නමැති කෝම්මල්බැද්දේ පොලිස්විදාන මහතාට පුත්‍රව ශකවර්ෂ 1750 ගේ කුම්භරවියේදී උපන්නේය. කුඩාකලම ඉගනීමේ දක්ෂභාවයක් දැක්වූ බැවින් 14 හැවිරිදි කල්හි මව්පිය දෙතිත්විසින් එකල බෙන්තරවනවාස මහාවිහාරාධිපතිව වැඩසිටි පූජ්‍යපණ්ඩිත බෙන්තර අත්ථදස්සී මහාසථවිරතුමන් වෙත පැවිදිකරවන ලදී. අත්ථදස්සී මහාස්වාමීන්ගේ ප්‍රධාන ශිෂ්‍යයා මෙතුමායයි යථෝක්ත ලිපියෙහි පෙනේ. පැවිදිවූ තැන් සිට උගතයුතුදේ මනාසේ ඉගනීමෙහි සමර්ථවූ බැවින් සාමණේරකාලයේදීම මෙතුමා ශිෂ්‍යාවාසීයකු ලෙස පත්කරනු ලැබීය. එතුමා උපසම්පදාව ලැබුවේ වයස 24ක්වූ පසුය. අත්ථදස්සිමහාසථවිරතුමා සියමෙන් අලුත් සඟපිරිසක් ගෙන්වීම සඳහා එරටට සන්දේශ යවමින් උත්සාහයක් ගත් බැවින් මේ උපසම්පදාව ලැබීමේ ප්‍රමාදය සිදුවීයයි සිතමි.

බු. ව. 2398වේ වෙසක්මාසයේදී මෙතුමා මහනුවර මල්වත්තේ විහාරයේදී උපසම්පදාව ලැබීය. ඒ අවස්ථාවේදී උපසම්පදාව ලැබූ අත්ථදස්සිමහතෙරුන්ගේ අන්‍යශිෂ්‍යයෝ නම් (1) මාවැල්ලේ ධම්මානන්ද, (2) කෝම්මල ඉන්දසාර, (3) පොතුවිල ඉන්දජෝති (4) බෝපිටියේ සීලවංශ, (5) අඹගහවත්තේ ඉන්දාසභ, යන මොහුය. මෙහි "පොතුවිල ඉන්දජෝති" යයි කීයෙවිත්තේ වෛද්‍ය ශාස්ත්‍රයෙහි අතිදක්ෂයෙක්ව සිටි "පොතුවිල හාමුදුරුවෝ" යන නාමින් ලක්දිව ප්‍රකට මහාසථවිරතුමායි. "ඉන්දාසභ" නමින් කියවෙන්නේ දැන් පවත්නා ලංකාරාමඤ්ඤනිකාය පිහිටුවීමේ ආදිපුරුෂෝත්තමවූ "අඹගහවත්තේ ඉන්දාසභ වරඤාණසාමි" මහා-සථවිරතුමායි. මෙතුමා සියම්නිකායෙන් අස්වී අමරපුරනිකායේ "බුලත්ගම ධම්මාලංකාර" මහාස්වාමීන්ගේ ශිෂ්‍යභාවයට පත්ව ටිකකලක් සිට බුරුමරට මණ්ඩලේ (=රතනාපුණ්ණ) නුවරට පිරිසක් සමග ගොස් උපසම්පදාව ලබාගෙන ආවේය.

මෙකල සියම්නිකායේ කෝට්ටේ ශාඛාවයයි ප්‍රකටව පවත්නා "ශ්‍රී කල්‍යාණී සාමාග්‍රී ධර්මමහාසඞ්ඝසභාව" පිහිටුවනලද්දේ මෙකී බෙන්තර අත්ථදස්සී මහාස්වාමීන්වහන්සේගේ අධිම[illegible] පිළිබඳ

මතභේදයක් නිසාය. එය පිහිටුවන කාලයේදී කෝට්ටේ මහාවිහාරාධිපතිව වැඩසිටියේ "මලිගස්පේ ධම්කීර්ති මංගල" නායක ස්ථවිරතුමාය. පාතදූරේ ඉන්දසාර, වලානේ සිද්ධත්ථ යන මහාස්ථවිරවරුද ඒ සභාවට එක්වූහ. එය පිහිටෙව් තැන් සිට කෝට්ටේ උපසම්පදාව මහනුවර සම්බන්ධය නැතුව කරනු ලැබේ. යාත්‍රාමුල්ලේ ස්ථවිරතුමන් ඇතුළු පිරිසගේ උපසම්පදාව සිදුවී-තිබෙන්නේ මේ සභාව පිහිටුවන්ට පෙරබව ඒ පිරිස මහනුවරට යාමෙන් ඔප්පුවේ.

මෙතැන් සිට ඥානදර්ශී සඟරාවේ තිබෙන වාක්‍ය කොටස් උපුටා දක්වමි:- "ඒ කාලයේදී වනවාස මහාවිහාරස්ථානයෙහි හා ඊට අයත් විහාරවල භික්ෂුසාමණේරයන් වහන්සේලා බොහෝ ගණනක්ද, මොරගල්ලේ කන්දේවිහාරයේ සිරිනිවස ස්ථවිරයන් වහන්සේ, බත්තරමුල්ලේ සුභූති ස්ථවිරයන්වහන්සේ, වැලිකඩ ධම්මජෝති ස්ථවිරයන්වහන්සේ, කිඹියේ සුමනජෝති නායක තෙරුන්වහන්සේ, වරාපිටියේ මුනිවරසාසනාලංකාර සුභනපාල නායක තෙරුන්වහන්සේ ආදී පිටපළාත්වලින් පැමිණි බොහෝ පැවිදි පිරිසක්ද, ලොකප්‍රසිද්ධ රොබට් කයිසර් චිල්ඩර්ස් මැතිතුමා ගරුකටයුතු රිස් ඩේවිඩ්ස් විනිශ්චයකාරතුමා, පාන්තියේ චාර්ලිස් පේද්‍රික් මුණසිංහ මුහන්දිරම්තුමා ආදී බොහෝ ගෘහස්ථපිරිසක්ද මුන්වහන්සේ සමීපයෙහි ඉගනීම ලැබූහ."

"ඒ ගෘහස්ථ ශිෂ්‍යයන් අතුරෙන් චිල්ඩර්ස්මහතා කලක් බෙන්තර තානායමේ නැවතී සිටගෙන මුන්වහන්සේගෙන් ඉගෙනීම ලබා නැවත එංගලන්තයට ගියාට පසුත් නිතර නිතර ලිවුම් මාර්ගයෙන් කථාබස් කරගැනීමෙන් ඉගණීම ලැබුවා පමණක් නොව සංස්කෘතපොත් බොහෝ රාශියක් හා ඉංග්‍රීසි පොත්පත්ද වරින්වර මේ ස්වාමීන්වහන්සේ වෙත ත්‍යාගකර එව්වේය. ඒ පොත්පත් හා එතුමා විසින් මුන්වහන්සේ වෙත කලින්කල එවන ලද ලියුම් බොහෝ රාශියක්ද මේ දක්වා වනවාස මහාවිහාරස්ථානයෙහිවූ පුස්තකාලයෙහි ඇත්තේය. ඒ ලියුම් අතුරෙන් සමහරක් පාලිභාෂාවෙන්ද, සමහරක් සිංහල භාෂාවෙන්ද, සමහරක් ඉංග්‍රීසි භාෂාවෙන්ද එතුමාගේ අත්අකුරෙන්ම ලියනලද ලියුම් වෙත්."

"චිල්ඩර්ස් මහතා තමා විසින් කරනලද විශාල ග්‍රන්ථයක්වූ පාලිඅකාරාදියේ ප්‍රාරම්භයෙහි මේ ස්වාමිපාදයන්වහන්සේ ඇතුළු තවත් දෙපලක් ගැන කාරණාකියමින් මුන්වහන්සේ ගැන මෙසේ කියාතිබේ:- මගේ මේ පොත තැනීමේදී අමාරු පාඨයන් සම්බන්ධ

කාරණා ගැන ලංකාවාසී සිංහල බුඩාගම්කාරයන් තුන්දෙනෙකු-ගෙන් අනඝි උදව් ලැබීතිබේ. එයින් ප්‍රධාන ඇත්තානම් යාත්‍රාමුල්ලේ ධම්මාරාම ස්ථවිරයෝය. 1872ක්වූ ජනවාරිමාසයේදී උන්වහන්සේට පැමුණුනාවූ අකාලමරණය හේතුකොටගෙණ බුඩශාසනයෙහි තිබුණාවූ අනඝි ආභරණයක් නැතිවුනාමෙන් හැගේ, යනාදියයි."......................

"පූර්විග ශාස්ත්‍ර හා ආගමධර්මය සම්බන්ධව ලක්දිව තත්කාලික කිසිවකුට දෙවෙනිනොවන පණ්ඩිතොත්තමයෙක් වූයේ නමුත් ඉතා නිහතමානී කෙනෙක්වූද, සියලුදෙනා කෙරෙහි එකාකාර කරුණාගුණයෙන් යුක්තවූද, අතිශයෙන් ශික්ෂාගරුත්වය ඇති ප්‍රියශීලී ස්ථවිරතුමෙක්වූද මේ ස්වාමිපාදයන් වහන්සේ දුර්වල ශරීරයකින් යුක්තවූයේ නමුත් ආත්මාර්ථය නොසලකා නිතර ලොකශාසනොපකාරී කටයුතුවල යෙදීමෙන් පරාර්ථයම සලකා විසූ කෙනෙක්යයි කීම මූන්වහන්සේ දන්නා අඳුනන දහස්ගණන් ගිහි පැවිදි ජනයා එකහෙලා පිළිගත්තාවූ සත්‍යයක්මය. මූන්වහන්සේ චිල්ඩර්ස් මහතා ආදී උතුමන්ගේ ආරාධනාමෙන් ඛුද්දකපාඨාදි ධර්ම පුස්තක කීපයකට සන්නද ලියාතිබේ. ඒ පොත්පත්ද මේ දක්වා වනවාස මහාවිහාරස්ථ පුස්තකාලයෙහි ඇත්තාහ."

"එපමණකුත් නොව මූන්වහන්සේ විසින් ත්‍රිපිටක ධර්මයට අයත් සියලු වචනයන් සම්බන්ධව ඉතා විස්තර වශයෙන් විශාල අකාරාදි ග්‍රන්ථයක් කරන්ට පටන්ගෙණ ඒ වැඩේ කරගෙන එන අතර මූන්වහන්සේගේ අවසාන කාලය ලංවිය. ...............................වයස අවුරුදු 43තේදී මූන්වහන්සේට වැළඳුන අශ්මරිරෝගය අසාධ්‍යවීමෙන් සියලුදෙනාට වියයුතු මරණය මූන්වහන්සේටද වියයුතු බැවින් ශකවර්ෂ එක්දහස්සත්සිය නොයානුවැත්තෙහි මකර රවිහයභාග ගුරුදින දිවාභාගයෙහි යථොක්ත වනවාසමහාවිහාරස්ථානයේදී අපවත්වී වදාළේය." (මේ සඟරාව 1902දී පළවූවකි.)

මූන්වහන්සේ ගැන රය්ස්ඩේවිඩ්ස් පඬිතුමා දැක්වූ අදහස් මේ සඟරාවේ පළවූ ලිපියට ලැබිතැන. ඒ පඬිතුමා 1881 දී පැවැත්වූ Hibbert Lectures නම් කථාපංක්තියේ එක් කථාවක මෙසේ කියා තිබේ: "එතුමා පළමුවෙන් මා වෙත පැමිණෙනවිට ද මාරයාගේ හස්තය එතුමන් වෙතට ඇවිත් තිබුණි. එතුමා වේදනාසහගත නිදන්ගත රෝගයකින් පෙළෙමින් සිටියේය. මෙවැනි අවස්ථා-වකදී ආගන්තුකයකුට ඉගැන්වීම සඳහා ස්වකීයස්ථානයෙන් පිටත යාමගැන මම එතුමාට කෘතඥවෙමි එතුමාගේ ගිලීගිය ඇස්වල

අස්වාභාවික ආලෝකයක් තිබුණි. එතුමා කථාකරනවිට බොහෝසේම පාලිභාෂාව පිළිබඳ ප්‍රශ්න මගහැර ආගම සම්බන්ධ ප්‍රශ්නවලට බැස්සේය. එතුමා සූත්‍රපිටකයේ ගැඹුරු දැනුමක් ඇතිව සිටිබව මට වැටහුණි. ඒ කථා ඇසීමට මම ප්‍රියකෙළෙමි. එතුමාගේ විස්තරකළ නොහැකි විධියේ ආකර්ෂණගුණයද වාම්බවද උදාර අදහස් ඇතිබවද මාතුළ මහත් ගෞරවයක් පහළකරවිය.” (මේ වාක්‍යය 1923 දී පළවූ රයිස්ඩේවිඩ්ස් පඬිතුමාගේ ජීවන චරිතයෙහි තිබී උපුටාගන්නාලදී.)

මේ මහාස්ථවිරතුමන් විසින් විල්බර්ස් පඬිතුමාට ආශිර්වාද පිණිස ග්‍රන්ථිත පාලිඅෂ්ටකයක් ක්‍රි. ව. 1900 අප්‍රේල් මාසයේදී පළවූ මාගධිකා නමැති මාසික පාලිසඟරාවෙහි පළවතිබේ. එය මෙසේයි:-

1. “සිව – සිව - සිවදත්ති කුඤ්ඤදෙවිඤ ද ත්ති
තුහිත – සුරසවත්ති – සාදිසොදන – කි ත්ති
මුඛජිතසිතකන්ති දීඝකාලං සුම ත්ති
ජයතු ජයතු විල්බර්ස් නාම භූපාල ම ත්ති

2. ලලිතගතිසු දන්ති මාසුසසංකාස – ද ත්ති
සරදජලදපන්ති – සෙතවණ්ණා සස ත්ති
මුඛජිත — පෙ — භූපාල ම ත්ති

3. විබුධජනපණ්ණතො සො නිරුත්තාප පූ තො
සවණ – මතපණීතො කතනාවාක්‍යපනී තො
— පෙ —

4. විදිතවිවිධසත්ථො’ තත්ථාවිසද්ධපපස ත්ථො
විතරණසුවිභත්ථො තෙකභාසාසම ත්ථො
— පෙ —

5. සුජනභජනසංඝො දුජ්ජනාසඞ්ගසඞ්ගො
අභිතරිපු පබන්ධො වාරුරඞ්ග තරඞ්ගො
— පෙ —

6. ජනහිතසුවිලග්ගො කිදයම්ගො සුමග්ගො
විරතඅගතිමග්ගො සගගම්ගාතුම්ගො
— පෙ —

7. විවිධ-ධරණීපාලී-සුඩසංසෙවිතඩසී
තලීනතුපමහෙසි' හුද්‍දයඃ ලඩභොගො

— පෙ —

8. සුමතිරතනසාරො චාරුකාරුඤ්ඤනීරො
සුජන චරිත තීරො සිත්‍ධු භාග්‍යා ගභීරො
මූබජිතසිතකන්ති දීඝකාලං සුමන්තී
ජයතු ජයතු විල්බර්ස් නාම භූපාලමන්තී."

## 35. මොහොට්ටිවත්තේ ගුණානන්ද මහා ස්වාමිතුමා.

(ක්‍රි. ව. 1824-1891)

බෞද්ධවාගීශ මොහොට්ටිවත්තේ ගුණානන්දස්වාමිතුමාගේ නාමය අද බාලයෝ පවා දනිත්. ක්‍රිස්තුභක්තිකයන්ගේ නොයෙක් උපක්‍රමයන් නිසා බෞද්ධයන් ඉතා දුර්වලව සිටි කාලයක, අපි බෞඩයම්හයි කීමට උසස් පෙළේ අය නොකැමැතිව සිටි කාලයක, ඉදිරියට ඇවිත් ස්වකීය වාග්මිත්වයෙන් නොයෙක් තැන්හි වාදවිවාද කොට ක්‍රිස්තුභක්තිකයන් මැඩපවත්වා බෞද්ධයන්ට ජය ලබාදුන් මූන්වහන්සේ වර්තමාන බෞද්ධප්‍රබෝධයේ ආදිකර්තෘවරයෙකි.

මොහොට්ටිවත්ත හෙවත් "මිගෙට්ටුවත්ත" බලපිටියට දකුණුදෙසින් පිහිටි ගමෙකි. මේ ගමේ විසූ සලාගමගොත්‍රයට අයත් වැදගත් පවුලක ක්‍රි. ව. 1824දී මෙතුමාගේ ඉපදීම සිදුවිය. වැඩිවිය පැමිණ අකුරු ඉගෙනගත් මේ තෙමේ නොයෙක් විට ක්‍රිස්තුභක්තික දේවගැතිවරුන් හා සාකච්ඡාවල යෙදී සිටියේය. විසි අවුරුදු පමණ වයසැති කල්හි පැවිදිවීමේ බලවත් ආශාවක් මොහු තුළ උපණි. මේ කාලයේදී දොඩන්දූව කුමාර මහා විහාරයෙහි විශාල බණ පිරිත් පිංකමක් විය. මේ තරුණයා ද මේ පින්කම බැලීම සඳහා එහි ගියේය. (ඒ විහාරස්ථානයේ පොත් ලිවීම සඳහා ගොස් සිටියේයයි ද කියත්.) එකල මේ ස්ථානයේ අධිපතිව සිටියේ තොලිඟඩ සොණුත්තර මහාස්ථවිරතුමාය. තරුණයා කීපදිනක් එහි නැවතී සිටිමින් වත්පිළිවෙත් ද කෙළේය. මොහු කෙරෙහි පැහැදුණු තොලිඟඩ ස්වාමිපාදයෝ මොහුගෙන් තොරතුරු විචාරා පැවිදිවෙනු කැමති බව දැන ඒ පින්කම් කාලයේදීම ඔහු පැවිදිකරවිය. එවකට ඒ පලාතේ ජනප්‍රධාන-

යෙක්ව විසූ දොන් දනියෙල් වීරසූරිය රාලහාමි* මේ අලුත් සාමණේරනමගේ කැපකරුදායකයා බවට පත්විය.

මේ සාමණේරයන් කුමාරමහාවිහාරයෙහි නැවතී ඉගනීම කරන කාලයේදී ක්‍රිස්තියානීන් ගෙන් බෞද්ධයන්ට නොයෙක් ගැහැට ඇතිවිය. ගුණානන්දස්වාමීන්ට මෙය තුරුස්නේ විය. (මෙතැන් පටන් "බෞද්ධ සහෝදරයා" සඟරාවේ තිබෙන වාක්‍යයන්ම දක්වමි:-) "ක්‍රිස්තියානීන්ගේ ප්‍රබලත්වය වැඩියක් පැවැත්තේ කොළඹ නගරයෙහිය. එය කොතරම් උත්සන්නව පැවැත්තේදැයි යතහොත් වීපියක භික්ෂූන්වහන්සේ කෙනෙකුන්ට ක්‍රිස්තියානි කොල්ලන්ගේ අපහාස නොවිඳ යා නොහැකිය. මෙසේ හෙයින්............කොළඹ නගරයට පැමිණිය යුතුය යන කල්පනාවක් ගුණානන්දස්වාමීන් තුළ ක්‍රියාකරන්ට විය. මෙය ක්‍රමයෙන්ම වැඩී මූත් වහන්සේ කොළඹ කොටහේනේ දීපදුත්තමාරාම විහාරස්ථානයෙහි නිත්‍යවාසයට පැමිණියේය. එකල්හි කොළඹ නගරයෙහි මෝදර මිරන්දාරාමය, කුප්පියාවත්තේ ජයසේඛරාරාමය, කොටහේනේ පරමානන්දවිහාරය, හුණුපිටියේ ගංගාරාමය යනාදි ස්ථානකීපයක් තිබුණාහ. එසේත් භික්ෂු සංඛ්‍යාව ඉතාටිකය, ගුණානන්ද ස්වාමීන්වහන්සේ ක්‍රිස්තියානීන් නමැති ගජරැළමැදට කේශරසිංහරාජ විලාසයෙන් පැමිණ ක්‍රිස්තියානියෙහි අසාරත්වය හා බෞද්ධධර්මයෙහි නිර්මලසාරත්වය ද ප්‍රකාශකරමින් සිංහනාදකොට ඔවුන් මූළුගන්වන්ට පටන් ගත්තේය.

"මේ කාලයේදීම හික්කඩුවේ ශ්‍රී සුමංගල මාහිමියාණන් වහන්සේ ද කොළඹ වාසයට පැමිණියෙන් ගුණානන්ද ස්වාමීට එය මහත් උපකාරයක් වූවාට සැක නැත............ ගුණානන්ද ස්වාමීන් වහන්සේ ද ඔවුන් සේම ඒ ඒ තැන්හි පැමිණ දේශනා පැවැත්වීමෙන් ඔවුන් ගිය ගිය තැනින් එලවන්ට පටන්ගත්තේය. මෙසේ එකම බෞද්ධ වාගීශ්වර සිංහයකු නිසා සියලු ක්‍රිස්තියානි පිරිස මහත් තැතිගැන්මකට පැමිණ බෞද්ධයන් හා සම්මුඛවාදයට පෙලඹුණේය. ගුණානන්ද ස්වාමීහට ද වුවමනා තිබුණේ සියලු තැන්හි පැන පැන යන මොවුන් සම්මුඛයට පමුණුවාගෙන උන්ගේ දපි සුන්බුන් කිරීමය. එබැවින් ඔවුන් සම්මුඛවනසේ සලසාගෙන ප්‍රසිද්ධ වාදකථා පවත්වා ක්‍රිස්තියානිබලය මූලෝච්ඡේද

---

* 1914 මැයිමස පළවූ "බෞද්ධසහෝදරයා" වෙසක්කලාපයේ තිබෙන මෙතුමාගේ චරිතයෙහි මේ නම "දොන් දනියෙල් විජයසූරිය"යයි දක්වා තිබේ. එය වැරදීමක් බව මේ පුවත් දන්නා දෙඩන්දූවේ අයගෙන් දැන ගතිමි.

කරවා බෞද්ධබලය ප්‍රාණවත් කරන ලද්දේය. එයින් සමහරක් නම්:- 1865 දී වරාගොඩ වාදය, 1866 දී ලියනගේමුල්ලේ වාදය, 1871 දී ගම්පල වාදය, 1873 දී කළ පානදුරාවාදයත් වෙති.

"මුත්වගත්තේ විසින් නානා නිකායන්ට අයත් සියලුම ක්‍රිස්තියානි ලෝකයාගේ වාද මර්දනය කරන ලද්දේය. යට දක්වූ ප්‍රසිද්ධ වාදකථාවන් හැර ක්‍රිස්තියානියට විරුද්ධව මුත්වගත්තේ විසින් ඒ ඒ ගම් නියම්ගම් රාජධානීන්හි පවත්වනලද දේශනා පන්දහසකටත් අධිකයයි සලකනු ලැබේ. මෙසේ දේශනා පැවැත්-වීමෙන් ක්‍රියාකරන අතරම ක්‍රිස්තියානියෙහි නිස්සාරභාවය දක්වා ලියන ලද පත්‍රිකා ද මහාජනයා අතර විසුරුවන ලදී එසේම සත්‍යමාර්ගය, ලක්මිණිකිරුළ, ක්‍රිස්තියානිවාදවිඝාතනය, සත්‍ය ප්‍රකාශය, දිව්රැස යන පත්‍රමාර්ගයෙන් ද ක්‍රිස්තියානීන් බොහෝ දුර්වල කෙළේය.

"පානදුරාවාදය යුරෝප - අමෙරිකාදි දේශාන්තරයන්හි ද මිථ්‍යාවාදීන් කම්පිතකෙළේය ඒ වාද ලියවිලි කියවූ නුවණැති යුරෝපීය ක්‍රිස්තියානීහු බෞද්ධධර්මය කෙරෙහි විශෙෂ පරීක්ෂාවට පැමිණියහ. බ්ලැවැස්කි-ඕල්කට් යන උතුමන් දෙපලගේ ලංකාවට පැමිණීමට හා බෞද්ධසමය වැළඳගැන්මට ප්‍රධාන හේතුව නම් පානදුරාවාදය හා මොහොට්ටිවත්තේ ස්වාමිතුමාන් බැව් කියයුතුය. දීපදුත්තමාරාම විහාරස්ථානය සම්බන්ධයට පැමිණවීම මුත්වගත්තේගේ මහෝත්සාහය නිසා විය. පුරාණවස්තු පරීක්ෂකයන් විසින් අභයගිරි දාගැබ බිඳහෙළීමට පටන්ගත් ප්‍රස්තාවයෙහි මහාජනයා ප්‍රබෝධකරවා ආණ්ඩුවට කරුණු දන්වා එය වළකාලන ලද්දේ මෙතුමා විසිනි.

"විද්‍යෝදය පිරිවෙණ පටන්ගැන්මෙහිදී එහි භූමිය ගැනීම් ආදියට ප්‍රසිද්ධ දේශනා පවත්වා ආධාර ලබාදුන්නේය. කොළඹ පරමවිඥානාර්ථ සමාගම් අභිවෘද්ධියට ගෙනඒමට මුත්වගත්තේ විසින් දෙනලද අනුබල ඉතා සැලකිය යුතුය මෙසේ නානාවිධ ක්‍රමයෙන් සම්බුද්ධශාසනසංරක්ෂණය හා ක්‍රිස්තියානි ආදි මිථ්‍යාවාද බිඳහෙළීම කරමින් සිටි මෙතුමා 67 වසක් ආයු වළඳා බුද්ධ වර්ෂ 2434 සැප්තැම්බර් 21 වෙනි දින දීපදුත්තම විහාරස්ථානයේදී ස්වර්ගස්ථවී වදාළසේක." (ක්‍රි. ව. 1890 සැප්: 21 වෙනිදා දවල් 11 ට පමණ අපවත්වීයයි පෙනේ.) ආදාහනය එම මස 28 වැනිදා සිදුකරනලදී

1873 අගෝස්තු මස 26 - 27 - 28 යන දිනයන්හි පැවැත්වූ පානදුරාවාදය ඇඩ්වඩ් පෙරේරා නිතිඥ මහතා ඉංග්‍රීසියට නගා

ලංකා ටයිම්ස් පත්‍රයේ පළකරවිය. එය නැවත පොතක් වශයෙන් පළකරන ලදින් අමෙරිකාවේ විසූ බ්ලවැස්ට්කි මැතිණියට හා කර්නල් ඔල්කට් මහතාට දකින්ට ලැබුණි. ඔල්කට් මහතා ගුණානන්ද සවාමින් හා ලියුම් ගනුදෙනු කොට 1880 මැයි 24 වෙනිදා ලක්දිවට පැමිණ බෞද්ධයෙක් විය. ඒ වර්ෂයේම ජූනි 17 වෙනිදා ඒ මහතා විසින් පරමවිඥානාර්ථ බෞද්ධ සමිතිය පිහිටුවනලදී.

## 36. මොරගල්ලේ බුද්ධසිරිතිස්ස මහාස්ථවිරතුමා
(ක්‍රි. ව. 1839-1917)

වැලිතොට අම්බරුක්කාරාම (අඹගහපිටියේ) මහාවිහාරාධිපතිව වැඩවිසූ බුද්ධසිරිතිස්ස මහාස්ථවිරතුමා කළුතර තොටමුණට අයත් "මොරගල්ල" නම් ගමෙහි ක්‍රි. ව. 1839 දී උපන්නේය. එගම විසූ "කළුපෙරුම බස්තියන් ද සොයිසා මේස්ත්‍රිරාළහාමි" මෙතුමාණන් පියා විය. පස්හැවිරිදි කල්හි අක්ෂරාභ්‍යාසය කරවනු ලැබූ මේ බාලයා කුඩාකල සිට පින්කමෙහි ඇලුනේ විය. එබැවින් මොහු පැවිදිකරවීම යෝග්‍යයයි සිතූ මවුපියවරු මෙකුමරුට 12 හැවිරිදි කල්හි කළුවාමෝදර ක්ෂේත්‍රාසන්න විහාරවාසී ධම්මානන්දතිස්ස මහතෙරුන්වෙත පමුණුවා තමන්ගේ අදහස දන්නූහ. මහාස්ථවිරතුමා ද මොහුගේ ජන්මපත්‍රය බලා සතුටුව සාමණේර බණදහම් උගන්වා යෝග්‍ය කාලයේදී කහකඩේ සිරිඤාණානන්දතිස්ස මහාස්ථවිරතුමන්ට බාරදෙනලදින් එතුමන් විසින් ශුභ මොහොතකින් පැවිදිකරනලදී. පැවිදිවීමේදී බුද්ධසිරි නාමය ලැබූ මේ හෙරණ තෙමේ ඒ ආචාර්යපාදයන් වෙතින් ධර්මශාස්ත්‍රාභ්‍යාසය ගත්තේය.

මෙතුමන්ට උපසම්පදාව ලැබීමට යෝග්‍ය කාලය පැමිණිවිට යථොක්ත ධම්මානන්ද ස්ථවිරතුමා ද ආචාර්ය ඤාණානන්ද ස්ථවිරතුමා ද සාකච්ඡාකොට ශුභනින්ට දන්වා මාදුගගේ උදකුක්ඛෙපසීමාවේදී අමරපුර නිකායික මහාසංඝයා වෙතින් උපසම්පදාව ලබාදුන්හ. උපසම්පන්නවීමෙන් පසුත් විනය පුහුණු කළ මුත්වහන්සේ ක්‍රමයෙන් ගණාචාර්යභාවයට පත්ව "මොරගල්ල" නමැති සියගමෙහි වස්වසා එහි බාලයන්ගේ ඉගනීම සඳහා "බාලබෝධනී" නමැති පාසැලක් ආරම්භකරවූහ. මුත්වහන්සේගේ ප්‍රාචාර්යවූ අමරපුරනිකාය පිහිටුවා වදාළ ඤාණවිමලතිස්ස මාහිමියන්ට ඤාණාභිවංස ධම්මසෙනාපති සංඝරාජතුමන් පාලියෙන් ලියාදුන් උපසම්පදාපරිදීපක සන්දේශය කිරිගරුඬගලක බුරුමඅකුරෙන් කොටවා අම්බරුක්කාරාමයෙහි තැන්පත් කරවිය ඒ සන්දේශය

මුද්‍රණය කරවා ප්‍රචාරයට පත්කරවිය. 1. අධම්මකම්මුක්කොටනය, 2. සාමග්‍රීදශීතය, 3. අභිමානභෙදය, 4. මහිසෙදුදයවණිනා යන පොත් රචනා කළ මෙතුමා සාකියාචාර්ය ඤණානන්දමහාසථවිරතුමන් ලියූ සීමාලංකාර සංග්‍රහයේ සන්නය මුද්‍රණයට යොග්‍යවනසේ සකස්කොට දුණි.

සියම්රට චූලාලංකාර මහරජතුමා තුන්පිටකය මුද්‍රණයකරවා තම්රටෙත් පිටරටවලත් සැලකියයුත්තන් වෙත යවත්තේ මේ බුද්ධසිරිතිස්ස මහාසථවිරතුමන් වෙත ද තුන්පිටකයක් පරිත්‍යාග කොට එවීය. වික්ටෝරියා අධිරාජියගේ දීයමන්ති ජුබිලිඋත්සවය සඳහා ලක්දිවට ආ ඒ සියම් මහරජතුමා ලක්දිවට ගොඩබැස කොළඹ රජවාසල තැවතී ලක්දිව පූජ්‍ය මහතෙරවරුන් ඒ රජවාසලට කැඳවා සිවුරු ආදි උතුම් පිරිකර පුදත්තේ මේ බුද්ධසිරිතිස්ස මහතෙරුන් ද ගෙන්වා පිපිකරින් පිදීය.

වෘද්ධාවස්ථාවේදී ගිලන්වූ මුන්වහන්සේ සියගමේ අභිනවාරාම නම් විහාරයේ වසමින් ඥතීන්ගෙන් උපස්ථාන ලැබූ නමුත් නිරෝගී නොවූ බැවින් කලුවාමෝදර කල්‍යාණාරාමයට පැමිණිවිට ඒ ආරාමාධිපති සීලානන්ද මහාසථවිරතුමා මෙතුමන් සාදරයෙන් පිළිගෙන එහි නවත්වාගෙන උපස්ථාන හා පිළියම්කරවිය. මෙසේ වසන අතර දැඩි ගිලන්බවට පත් මුන්වහන්සේ බු. ව. 2460 වෙසක් පුර පසළොස්වක්ද කල්‍යාණාරාමයේදී අපවත්වූහ. ඉන් පස්දිනකට පසු අදාහනොත්සවය පවත්වනලදී.

## 37 ශ්‍රී ශීලස්කන්ධ නායක මාහිමියන්වහන්සේ.

(ක්‍රි. ව. 1848-1924)

දෙඩන්දුවේ පියරතනතිස්ස නායකමාහිමියන්ගේ ඇවෑමෙන් උන්වහන්සේගේ ප්‍රධාන ශිෂ්‍යවූ අලුත්ගම ශ්‍රී ශීලස්කන්ධමහාසථවිරතුමා කල්‍යාණිවංශනිකායේ පාලකධුරයට පත්විය.

ශකවර්ෂ 1769 දේදී කළුතර තොටමුණ බද අලුත්ගම පෙදෙසෙහි උපන් මුන්වහන්සේගේ පියාණෝ “නානායක්කාරවාසන්සෙම්බකුට්ටිකන්කානම්ගේ දොන් බස්තියන් ප්‍රනාන්දු” මහතාය. මෙකුමරුට යොග්‍යකාලයේදී අක්ෂරාභ්‍යාසය කරවූ මවුපියදෙදෙන නවහැවිරිදිවූ මොහු පැවිදිකිරීම සඳහා දෙඩන්දුවේ ශෛලබිම්බාරාමයෙහි වැඩවිසූ පියරතනතිස්ස මහාස්වාමින්වහන්සේ වෙත බාර කළහ. උන්වහන්සේ වෙතින් සාමණෙර බණදහම් ආදිය උගත් මෙකුමරු නව හැවිරිදි කල්හිම බෙන්තොටගඟේ සැදවූ විසිතුරු තුන්මහල් මණ්ඩපයකදී මහොත්සවයෙන් පැවිදි කරනලදී.

මෙසේ පැවිදිවූ ප්‍රතිභාශක්තියෙන් හා ධාරණශක්තියෙන් අනූනවූ මේ හෙරණපාණෝ පළමුකොට උඩුගල්පිටියේ මහාසවාමීන්වහන්සේ වෙතින් ද ඉන් පසු පියරතනතිස්ස මහාසවාමීන්වහන්සේගෙන් ද ඉගනීම කළහ. මොග්ගල්ලායන වෘත්තිය, මීරිත සන්නය, පදසාධනය පයෝගසිද්ධි ආදි එකල ඉතා දුලභව පැවති මෞද්ගල්‍යායනව්‍යාකරණය පිළිබඳ පොත් මහත් පරිශ්‍රමයෙන් සපයාගෙන ඒ ව්‍යාකරණයෙහි ද මහත් පටුත්වයක් ලබාගත්හ.

පිරුණු විසිවයස් ඇති මුන්වහන්සේ බු. ව. 2410යේ වෘෂභ රවි සත්විසිභාගයට පැමිණි පුරසතවක්ලත් ශනිදින රෑ දෙළොස් පැයට පමණ ශෛලබිම්බාරාමායතන උදකුක්ඛෙප සීමාවේදී මිරිස්සේ ධම්මානන්ද නායකමහාසවාමීන්වහන්සේ උපාධ්‍යාය කොට උඩුගල්පිටියේ මහාසවාමීන්වහන්සේ ද පියරතන මහා-සවාමීන්වහන්සේ ද වැලිගම සිරිසුමඞ්ගල මහාසවාමීන්වහන්සේ ද කර්මාචාර්‍ය්‍ය කොට එක්සාළිස්නමක් පමණ වූ කල්‍යාණිවංශික සංඝයා වෙතින් උපසම්පදාව ලැබූහ.

සංස්කෘත හැදෑරීම.

මේ කාලයේදී ලක්දිව සංස්කෘත හදාරන්නන් විරල වූ බැවින් මුන්වහන්සේ තද්භාෂාධ්‍යයනය සඳහා කලිකතානගරයට යන්ට කැමති වූ නමුත් ගුරුවර දෙනීහු එවැනි විදේශගමනයකට අවසර නුදුන්හ. නමුත් එසින් මනෙහුත්සාහී නොවූ මුන්වහන්සේ එකල ශෛලබිම්බාරාමයෙහි වැඩසිටි මාවැල්ලේ ගුණානන්ද සවාමීන්-වහන්සේ එහි යාමට සතුටුකරවාගෙන ඒ බව සවකීයමිත්‍ර තාරානාථ තර්කවාචස්පති පඬිතුමාට දන්වා යවා ක්‍රි. ව. 1873නේ ජනවාරි මාසයේදී උන්වහන්සේ කල්කටාවට පිටත්කර යැවූහ. ඒ ගුණානන්ද සවාමීන්වහන්සේ තාරානාථ පඬිතුමාගෙන් ව්‍යාකරණ කාව්‍යාලඞ්කාරාදිය ඉගෙනගනිමින් තමන් ඉගෙනගන්නා සියල්ල ශීලස්කන්ධ සවාමීන්වහන්සේ වෙත ලියා එව්ය පඬිතුමා ද නොයෙක්විට ලිපිමාරයෙන් මුන්වහන්සේගේ ඉගනීමට ආධාර කෙළේය. ගුණානන්ද සවාමීන්වහන්සේ මේ ආකාරයෙන් තුන් අවුරුදු සමසක් පමණ සංස්කෘතාධ්‍යායනයෙහි යෙදී සිටින අතර හදිසියෙන් හටගත් ආබාධයකින් කලිකතාවේදීම සවර්ගස්ථවූහ.

ක්‍රි. ව. 1884යේදී බෞද්ධපොත් කීපයක් සෙවීම සඳහා ලක්දිවට පැමිණි මිනෑයෙෆ් නමැති රුෂියන් මහපඬිතුමා එකල ගාල්ලේ පොලිස්නඩුකාරධුරය ඉසුලූ රයිස්ඩේවිඩ්ස් පඬිතුමා සමග

දෙබත්දූවේ ශෛලබිම්බාරාමයට පැමිණ පාලිවචන කීපයක පදසිද්ධි ගැන ශීලස්කන්ධ මහාස්වාමීන්වහන්සේ හා සාකච්ඡා කොට ඉතා සතුටුව ප්‍රශංසා කෙළේය. ඇමෙරිකාවේ පෝල්කේරස් පඬිතුමා නිර්මාණය ආදි කරුණු කීපයක් ගැන මුන්වහන්සේගෙන් අසා එවා ලැබුණ පිළිතුරු මුද්‍රණයකරවා එයින් පිටපත් සැටදහසක් විසුරුවා හැරියේය.

ඉන්දියාවේ රාස්විහාරී මුඛෝපාධ්‍යාය පඬිතුමා ද, එහිම කොල්හපුරයේ අප්පාශාස්ත්‍රී විද්‍යාවාචස්පති පඬිතුමා ද, ශ්‍රීමත් වේඩකාවරඩගනාථස්වාමි පඬිතුමා ද නොයෙක්විට මුන්වහන්සේ ගැන ප්‍රශංසාමුඛයෙන් ලිපි සම්පාදනය කළහ. කල්කටාවේ ආණ්ඩුවේ සංස්කෘත විද්‍යාමන්දිරයේ ප්‍රධානාචාර්ය ශතීශ්චන්ද්‍ර-විද්‍යාභූෂණ පඬිතුමා මුන්වහන්සේ දැකීම සඳහා ශෛලබිම්බාරාමයට පැමිණි අවස්ථාවේදී කථාවක් කරමින් "ශ්‍රී ශීලස්කන්ධ ස්වාමීන්-වහන්සේගේ නාමය භාරතීය උගතුන් අතර ඉතා ප්‍රකටය, මුන්වහන්සේ නිසාම ලක්දිව දෙබත්දූව නමින් නගරයක් ඇතැයි භාරතවාසීහු දැනසිටිත්. ලෝකාර්ථයෙහි නිරතවූ අසහායපණ්ඩිත මේ ස්වාමිපාදයාණෝ දීර්ඝකාලයක් ජීවත්වනසේක්වායි ආශංසනය කරමි" යනාදිය කීය.

මුන්වහන්සේගේ පාණ්ඩිත්‍යය හා සම්බුද්ධධර්මයාගේ උද්දීප්තිය සඳහා කළ අනල්ප පරිශ්‍රමයත් දැනගත් ස්වර්ගස්ථවූ ප්‍රාපරමින්ද-චූලාලංකරණ සියම් මහරජතුමන් විසින් ශ්‍රමණපරිෂ්කාර රාශියක් හා මහාර්ඝ ප්‍රතිමා තුන්නමක් ද ස්වකීය පිතෘභූත වජිරඤාණ මහරජතුමාගේ හා තමාගේ ඡායාරූප දෙකක් ද ලංකාණ්ඩුව බාරේ මුන්වහන්සේ වෙත එවනලදහ. අයෝධ්‍යදේශයේ ප්‍රතාපසිංහ මහරජතුමා මුන්වහන්සේගෙන් ප්‍රශ්නකීපයක් විචාරා එවා ඊට ලැබුණු පිළිතුරු ගැන සතුටුව සංස්කෘතග්‍රන්ථ එකොළොසක් ද තමාගේ ඡායාරූපය ද මුන්වහන්සේගේ පාණ්ඩිත්‍යවර්ණනාමුඛයෙන් රචිත වූ ශ්ලෝක 24 කින් යුත් ප්‍රබන්ධයක් ද තුටුපඬුරුකොට එවීය.

### ග්‍රන්ථ සම්පාදනය.

මේ මාහිමියාණන්වහන්සේ බුද්ධවංශය, අත්තනගලුවංශය, සුගතවිදත්ථිවිධානය, විදග්ධමුඛමණ්ඩනය, රාජප්‍රශස්තිය, දශරූපාවතාරය, හංසදූතකාව්‍යය, ප්‍රශ්නසාරය, බාලාව-බෝධනය, රඝුවංශය යන ග්‍රන්ථයන්ට ව්‍යාඛ්‍යානයන් කළහ. විශුද්ධිමාර්ගය, ධම්මපදය, දෛවඥකාමධේනුව, විශ්වප්‍රකාශය, වෘත්තරත්නාකරපඤ්චිකාව යන ග්‍රන්ථයන් සංස්කරණය කොට

නාගරාක්ෂරයෙන් මුද්‍රණය කරවා ප්‍රසිද්ධකළහ. භක්තිශතකය, අනුරුද්ධශතකය, ධාතුනාමාලාඛ්‍යාව, ත්‍රිකාණ්ඩශේෂ (කෝෂ) ය යන ග්‍රන්ථවලට සංස්කෘතටීකා ලියනලදින් මූලග්‍රන්ථයන් සමග නාගරාක්ෂරයෙන් මුද්‍රණය කරවනලදහ. මේ පොත් මෙසේ ප්‍රසිද්ධ කරවන ලද්දේ ඉන්දියාදේශවාසීන් තුළ බෞද්ධසමය සම්බන්ධව විශේෂ ගරුත්වයක් ඇතිකරලීම පරමාර්ථකොටගෙනය. සද්ධර්මමකරන්ද* නම් විශාල බුද්ධචරිත ග්‍රන්ථය ද, රාජරාජේශ්වරප්‍රශස්ති, ශ්‍රීමඞ්ගලාෂ්ටක, වරමඞ්ගලාෂ්ටක යන ග්‍රන්ථයෝ සංස්කෘත භාෂාවෙන්ම රචනාකරනලදහ. උපදේශවාක්‍යමඤ්ජරිය හා කායගතාසති යන ග්‍රන්ථද්වය (සිංහලභාෂාවෙන්) සංග්‍රහකරන ලදී.

මුන්වහන්සේගේ පාණ්ඩිත්‍යය භාරතාදි විදේශයන්හි ව්‍යාප්ත වීමෙන් ලඞ්කාවට අයත්වූ කීර්තිය ඉතා මහත්වේ. වර්තමාන කාලයෙහි සම්බුද්ධධර්මය ප්‍රකාශකොට ශාසනාභිවෘද්ධිය කිරීමේ පරමාධ්‍යාශයෙන් සංස්කෘතභාෂාමය විශාලග්‍රන්ථයක් රචනාකළා වූ ද සංස්කෘතභාෂාමය ටීකාකීපයක් සම්පාදනය කළාවූ ද මේ මාහිමියාණන් වහන්සේ නිසා ලක්දිවට බොහෝ ගෞරව ලැබී තිබේ. මුන්වහන්සේගේ ග්‍රන්ථකරණාදිය සලකා අප්පාශාස්ත්‍රීවිද්‍යාවාචස්පති ආදි භාරතීය පඬිවරුන් විසින් "ශ්‍රීබෞද්ධසිද්ධාන්තාචාර්ය" යන ගරු නාමය පිරිනමනලදී.

ශ්‍රීබුද්ධවර්ෂ 2450හේදී පියරතනතිස්සාභිධාන නායකමාහිමියන් වහන්සේගේ ඇවෑමෙන් හිස්වූ කල්‍යාණවංශිකයේ නායක පදවිය 2454දී "කල්‍යාණිවංශාවතංස ධර්මරක්ෂිත චන්ද්‍රකීර්ති" යන උපාධිනාමයන් සහිතව මුන්වහන්සේට පත්කරනලදී.

අවසාන කාලය.

එකශ්‍රැතිධාරී ශාරීපුත්‍රසංඝරාජ මහාස්වාමීන්වහන්සේගෙන් පසු සංස්කෘත ග්‍රන්ථසම්පාදකත්වයට පැමිණි එකම සිංහල පණ්ඩිතෝත්තමයාවූ මුන්වහන්සේ සරස්වතීමණ්ඩප නම් විද්‍යාලයෙහි ධර්මශාස්ත්‍රෝද්ග්‍රහණය සඳහා නානාදිශාවලින් පැමිණි බොහෝ ගිහි පැවිදි ශිෂ්‍යයන්ට ශාස්ත්‍රදානය කරන අතරම ශරීරාබාධයකින් දුර්වලව සිටි අවසානකාලයේදී පවා ග්‍රන්ථසම්පාදනය අත්නොහැරියේක. මුන්වහන්සේගේ මහත් ධෛර්යය ගැන පණ්ඩිත ඩබ්ලිව්. ඇෆ්. ගුණවර්ධන වාසලමුදලිතුමන්ගේ "ගුත්තිලකාව්‍යවර්ණනා" සංක්ෂේපනයෙහි මෙසේ දැක්වේ:-

* මෙය නාගරඅකුරෙන් මුද්‍රිතව ප්‍රචලිතව පවත්නේයි.

"මුන්වහන්සේලා දෙනමට අලුත්ගම ශ්‍රී ශීලස්කන්ධ නායක ස්ථවිරයන්වහන්සේය, තෙල්වත්තේ සාරාලංකාර මහාස්ථවිරයන් වහන්සේ යයි ගෝලදෙනමක් වූහ. එයින් ශ්‍රී ශීලස්කන්ධ නායක ස්ථවිරයන්වහන්සේ මහත්කීර්තියට පැමිණ ශාස්ත්‍රීයකර්මයන්හි යෙදී තවමත් විරාජමාන වේ. මුන්වහන්සේගේ චිත්තවීර්යයෙහි ප්‍රමාණයට ශරීරශක්තියත් තිබේ නම් මුන්වහන්සේගෙන් ලඞ්කාවෙහි ශාස්ත්‍රෝද්දීප්තිය පිණිස වන්නාවූ වැඩ අප්‍රමාණ වනු නිසැකය. දැනට ද ලැබීතිබෙන්නා වූ සඞ්ග්‍රහ ස්වල්ප නොවේ. මුන්වහන්සේගේ හා ස්වකීය ගෝලබාලයන්ගේ ද* ඉතා ප්‍රශස්‍යවූ ප්‍රයත්නයක් නම් ලොකයෙහි වඩා ප්‍රකට නොවූ සම්භාවනීය ග්‍රන්ථයන් ශෝධිතව්‍යාඛ්‍යාතකොට ප්‍රසිද්ධියට පැමිණවීමෙන් සුලභ කරවා ලීමය."

මෙසේ ස්වකීය ජීවිතය අවසානකාලය දක්වා පරාර්ථය සඳහාම යොදවා ලොකශාසනයට අපමණ වැඩ සලසා දුන්නාවූ ද ලක්දිවට නොනැසෙන කීර්තියක් ලබාදුන්නාවූ ද මේ මහාස්වාමීන්වහන්සේ ස්වකීය කීර්තිය චිරස්ථායී කළහැකි ශිෂ්‍යසමූහයක් ඇතිකොට සසැත්තෑවර්ෂයක් ආයුඃශ්‍රී විඳනය කොට ක්‍රි. ව. 1924 පෙබරවාරි මස 3 වෙනි ඉරුදින අපරභාග 6-30 ට පමණ ස්වකීයාරාමයේදී අපවත්වී වදාළසේක.

## 38. රත්මලානේ ධර්මකීර්ති ශ්‍රී ධර්මාරාම නායක මාහිමියෝ.

(ක්‍රි. ව. 1853-1918)

විද්‍යාලංකාර මහාවිද්‍යාලයාධිපතිව වැඩසිට එය ලොකප්‍රකට විද්‍යාස්ථානයක් බවට පත්කළ පණ්ඩිතාග්‍රගණ්‍ය ශ්‍රී ධර්මාරාම මාහිමි තුමා කොළඹපලාතේ කලපළුවාව නමැති ගමේදී බු. ව. 2396 යේ බිනර මස අවසැටවක්ද උපන්නේය. "බතඹුරේ වීරසිංහ මොහොට්ටාල" පරම්පරාවට අයත් ඇලෙක්සැන්ඩර් වීරසිංහ අප්පුහාමි මෙතුමාගේ පියා විය. වේරගල කළුබෝවිල අප්පුහාමිල්ලාගේ අලිසන්දිරි අප්පුහාමිගේ දියණියවූ දොන ඉසබෙලා ද අල්විස් සිරිවර්ධන හාමිනේ මැණියෝ වූහ. මෙතුමාගේ ජන්ම පත්‍රය සෑදූ බටුවන්තුඩාවේ පඬිතුමාත් දොන් පිලිප් ද සිල්වා ඇපා අප්පුහාමිත් මේ ළදරුවා මතුකල උසස් පැවිදි උතුමෙක් වන්නේ යයි ප්‍රකාශ කළහ. පස්හැවිරිදි වියේදී අකුරු උගන්වනු ලැබූ මේ බාලතෙමේ පසුකලක ශතකපොත් ඉගනීම සඳහා කිත්සිරිමෙවන්

* ලක්දිව ප්‍රකටව සිට නොබෝද කාලක්‍රියාකළ දෙඩන්දුවේ ධර්මසේන පඬිතුමා මුන්වහන්සේගේ ශිෂ්‍යයෙකි.

කැලණි විහාරයේ විසූ කොටගම සථවිරතුමාට බාරකරතලදී. ඒ ස්ථානයට ගෙදර සිට යාම ඊම දුරවූ බැවින් අලුත්කුරුවේ අස්ගිරිවල්පොල විසූ ඥතියෙකු වූ දිනෙස් අමරතුංග අප්පුහාමිගේ නිවසෙහි මේ බාලයා නවත්වා ඊට තුදුරු තැනක වස්වසා සිටි කහතුඩුවේ චන්‍ද්‍රජෝති මහාසථවිරතුමන් වෙත ඉගනීමට පත්කළහ.

මේ සථවිරතුමා මේ බාලයාට තැකම් ඇත්තෙක් විය. බාලයාගේ දක්‍ෂභාවය දුටු තෙරණුවෝ මවුපියන්ගේ නොකැමැත්ත තිබියදීම සත්හවුරුදු සිවුමසක් වයස් ඇතිකල්හි මෙකුමරු පැවිදි කරවූහ. කුඩාකලම දහම්දෙසීමට සමර්ථවූ බැවින් මවුපියන්ගේ නොකැමැත්ත ක්‍රමයෙන් මඟහැරීගියේය. වරක් මේ කුඩා සාමණේරයන්ගෙන් බණ ඇසූ "තිකුලස් ගුණතිලක" අතපත්තු මුදලිතුමා මුත්වහන්සේ උසස්ලෙස ඉගනීම් කළහැකි තැනකට වහාම පැමිණවිය යුතුයයි ආචාර්යතෙර ආදීන්ට කියාසිටි. බැවින් 1864 දී රත්මලානේ ධර්මාලෝක මහාසවාමීන් වෙත පමුණුවා ඉගනීමට බාරකරතලදී. මේ හෙරණපාණන් ගැන සතුටටපත් ධර්මාලෝක මාහිමිතුමා සවකීය ශිෂ්‍යයකු ලෙසම තැවත පැවිදිකරවා "රත්මලානේ ධම්මාරාම" යයි නම් තැබිය. මෙකල එතුමාගේ වයස 10 ක් විය.

මේ හෙරණතැන දිනකට ගාථා පණසක් සැටක් පමණ ද කට පාඩම් කරන්ට සමර්ථවිය. ඉගනීමට බොහෝ ඇලුම් කළ මෙතුමා තුදුස්වියේදී පාලි-සිංහල භාෂා දෙකේ සැහෙන දැනුමක් ඇත්තේ විය. මින්පසු නොයෙක් තැන සඟිබණ කීමෙන් කීර්තියක් ලබා ගත් මෙතුමාට සංසකෘත ඉගැන්වීමට උත්සාහවත්වූ ආචාර්යතුමා ඒ සඳහා පොත් සෙවූ නමුත් සම්පූර්ණ පොතක් සොයාගැනීම අපහසුවිය. මේ කාලයේදී ක්‍රි. ව. 1869 යේදී ඉන්දියාවේ තෙලිඟු රට බ්‍රාහමණ පඬිවරයෙක් කොළඹ සිටි කුමාරසවාමි (බ්‍රාහමණ) මහතා විසින් මෙරටට ගෙන්වතලදී ඒ පඬිතුමා ශ්‍රීරාමචන්‍ද්‍රභාරතී පඬිතුමාගෙන් පසු මෙරටට නොපැමිණි තරම් උගතකු වූ බැවින් මේ ගුරුශිෂ්‍ය දෙනම කොළඹ පොත්තම්බලම් මුදලිතුමාගේ සිවකෝවිලේ තැවතී සිටි, "මානුභූතෙශවරශර්ශාසත්‍රී" නමැති ඒ පඬිවරයා හමුවී සාකච්ඡා කොට එතුමාගෙන් සංසකෘත ඉගනීමට අවසර ලබාගත්හ. කොළඹ තැවතීමට සුදුසු තැනක් දයක මහතකු විසින් සපයාදෙතලදී.

ඒ පඬිතුමන් වෙත ඉගනීමට පැමිණි ධම්මාරාම හෙරණපාණන්ට පළමුවෙන් උගන්වතලද්දේ තර්කසංග්‍රහය යි කියත්.

ව්. පෙ. රණසිංහ, ඩබ්ලිව්. ගුණතිලක යන නීතිඥ මහත්වරු ද වරින්වර පැමිණ මේ පඬිතුමාගෙන් ඉගනීම කළහ. වැඩිකලක් ගතවෙන්ට පෙර මේ පඬිවරයා සියරටට හැරීයන්ට සැරසී මේ හෙරණපාණන් ශ්‍රීවිශවනාථ-ශිවාචාර්‍ය්‍ය කුමාරසවාමි පඬිතුමන් වෙත කැඳවා ගෙන ගොස් "මේ ශිෂ්‍යයා ඉගනීමෙහි අතිදක්‍ෂයෙක; මොහුට කළ හැකි හැම උපකාරයක් කළයුතුය; කැමති පොත පතක් බලන්ට දියයුතුය මා හැරී එනතෙක් මොහුට සාරසවත ව්‍යාකරණයත් රඝුවංශයත් කියවියයුතුය" යි කියා භාරකෙළේය. ක්‍රි ව. 1871 දී මේ ඉගනීම අවසන්කරනලදී. ශම්ශාසත්‍රී පඬිතුමා නැවැත හැරී අවුත් 1874 ජනවාරි 5 වෙනිද, කොළඹදී අපවත්වී යයි අසන්ට ලැබේ.

සාමණේර කාලයේදීම උගතයුතුදේ ඉගෙන පණ්ඩිතත්‍වයට පැමිණි මෙතුමා 1874 ජූනි මස මුල්සතියේදී මහනුවර මල්වතු විහාරයට පැමිණ මැදගම ධම්මරක්ඛිත දෙවමිතත මහානායක හිමියන් උපාධ්‍යායකොටගෙන උපසම්පදාව ලැබීය. ඒ අවසථාවේදී මෙතුමන් පාළියෙන් පමණක් නොව සංසකෘතයෙන් ද අෂ්ටකයක් ලියා ඔප්පුකළ බැවින් එය අපූර්වසිද්ධියක් විය. සංසකෘත භාෂාවෙන් අෂ්ටක සාදා ඔප්පුකළ අයෙක් ඉන් පෙර ඒ පෝයගෙට නොපැමිණියේ යයි බොහෝදෙන කීහ උපසම්පදාව ලබා රත්මලානට පැමිණි පසු මේ නවකභික්‍ෂුව විසින් සවකීය උපසම්පදාව පිළිබඳ ප්‍රවෘතති සංසකෘත ශ්ලෝකයෙන් නිබන්ධකෙළේය. ඉන් එකක් මෙසේයි:-

"උපාධ්‍යාය ආසීත් තදා දෙවමිත්‍ර-
මහාසවාමිපාදෙ යතීන්‍ද්‍රාධිනාථඃ
තථාචාර්‍ය්‍යවර්‍ය්‍යාවභූතං ගුණාඪ්‍යෞ
යතීන්‍ද්‍රෞ විදග්ධ්‍යාඛ්‍ය-සිද්ධාර්ථසංඥෞ"

උපසම්පදාවෙන් පසු පළමුවෙනි වස විසීම සඳහා මාපිටිගම ධම්මරක්ඛිත, එතුමාගේ ශිෂ්‍ය සංඝරක්ඛිත යන දෙනම ප්‍රධාන පෙතියාගොඩ දායකමහතුන් විසින් අරාධනා කරනලද්දේ සවකීයාචාර්‍ය්‍යවරයා සමග සියනෑකෝරළේ පෙතියාගොඩ විහාරයෙහි වස්විසීය. දෙවෙනි වස සියනෑකෝරළේ දළුගම (තොරණළුහ) ඒ දෙනම වස්විසූහ. ඒ කාලයතුළදී හෙවත් 1875 දී විද්‍යාලංකාර දායකසභාව පිහිටුවනලදින් මේ දෙනම විසින් සුළුවශයෙන් ඉගැන්වීමක් පටන්ගන්නාලදී. ක්‍රමයෙන් දියුණුව අද මහා විද්‍යාලයක් බවට පත්ව තිබෙන්නේ මේ විද්‍යාසථානයයි. මේ පිරිවෙණ පිහිටෙව් කාලයේදීම සත්වෙනි ඇඩ්වර්ඩ් මහරජතුමා වේල්ස්හි කුමාරයා මෙන් මෙරටට පැමිණියේය. ඒ අවසථාවේදී

රාජචරිත නමැති අභිනව ග්‍රන්ථයක් රචනාකොට ගුරුශිෂ්‍ය දෙනම විසින් ඔප්පුකරන ලදින් කුමාරයා එය පිළිගත් බව දන්වා සතුති කොට ලිපියක් එවීය.

1876 දී එකල ශිෂ්‍යයන්ට අවශ්‍යයෙන් ඕනෑව තිබුණු සංස්කෘත ශබ්දමාලාව මේ දෙනම විසින් සම්පාදිතව පළවිය. ඉන් පසු ආණ්ඩුවේ අයදුමෙන් ධර්මප්‍රදීපිකාව ශුද්ධකොට දෙනලදී 1887 අගෝස්තු 17 වෙනිදා ධර්මාලෝක ස්වාමීන්ද්‍රයන් අපවත්වූ බැවින් ධර්මාරාම ස්ථවිරතුමා විද්‍යාලංකාර දායකසභාව විසින් පරිවෙණාධිපති පදවියට පත්කරනලදී. මෙසේ පිරිවෙණේ ඉගැන්වීම කරන අතරම ජානකීහරණ නම් මහාකාව්‍යයේ සත්තය පමණක් තිබෙන බවත් මුල්පොත නැතිබවත් දුටු මුන්වහන්සේ ලාංකික මහාකවි-යකු විසින් නිබන්ධිත එකම සංස්කෘත මහාකාව්‍යයවූ එය පද්‍ය බන්ධයෙන් සංස්කරණයකොට එකල මහාධනේශ්වරයෙක්ව විසූ චාර්ලස් හෙන්රි ද සොයිසා දිශානායක මැතිතුමාගේ ධනව්‍යයෙන් පළ කරවූහ.

කොළඹ පලාතේ සංඝනායකධුරය උසුලමින් සිටි දෙදියවල බුද්ධරක්ඛිත සවාමිපාදයන් 1893 දී අපවත්වීමෙන් ඒ ධුරය හිස්විය. ඉන් දෙමසකට පසු තිබ්බොටුවාවේ සිද්ධාර්ථ සුමංගල මහාස්වාමිතුමා මහානායක පදවියට පත්ව විද්‍යාලංකාර පරිවෙණාධිපතීන් වහන්සේට මේ කොළඹපලාතේ නායකපදවිය පත්කරනු කැමති බව දැන්විය. පළමුකොට එතුමා ඊට නොකැමැති වූ නමුත් බොහෝදෙනෙකුන්ගේ ඉල්ලීම ලෙස එය බාරගන්ට කැමතිවිය 1894 ජූලි මස 13 වෙනිදා ඒ නායකධුරයේ අක්තපත්‍ර මුන්වහන්සේට දෙනලදී. මින්පසු හලාවතපලාතේ සංඝනායකපදවිය පුරප්පාඩු වූයෙන් ඒ පලාතේ මුදලිධුරය දැරූ අමරසේකර මැතිතුමා ආදි ගිහිපැවිදි පිරිසේ ඉල්ලීම ලෙස 1897 ඔක්තෝබර් 22 දා ඒ ධුරය ද මුන්වහන්සේට පවරනලදී.

1898 පමණේදී පිරිවෙණේ බොහෝ ගොඩනැගිලි ජරපත්වූහ. සෑහෙනතරම් ගොඩනැගිලි සෑදවීමට ඉඩම් ද නොපොහොනේ විය. මෙකල්හි සියනෑකෝරලේ ගම්සභා නඩුකාරතැනවූ ඩී. බී. පී. අබේසේකර මුදලිතුමන් සභාපතිකොට විද්‍යාලංකාර සභාව සංස්කරණය කරනලදින් පිරිවෙන් බිම අක්කර 8ක් පමණ විශාල කරන ලදී. හැන්රිකස් ලූසියස් දසනායක අබයරත්න ගුණවර්ධන වාසලමුදලිතුමන් පිදූ භූමියෙහි එච්. පී ප්‍රනාන්දු මුහන්දිරම්මහතා විසින් 1898 දී පිළිමගෙය සාදන්ට ආරම්භකරන ලදී. ඉන්පසු ඒ මහතාම මුල්ව ධර්මශාලාව ද භෝජනශාලාව ද ආවාසගෙය ද ගොඩනංවනලදින් 1900දී ගෙවදීමේ උත්සවය පවත්වනලදී.

නායකස්වාමිපාදයන් කොළඹ වැඩ ගමන්වලදී නැවතීමට යෝග්‍යස්ථානයක් තිබියයුතු බැවින් ඇන්ඩෲ පෙරේරා මහතා (සර්) ඩී. බී. ජයතිලක, විමලගුණවර්ධන මුදලිතුමා ආදීන් සාකච්ඡාකොට දෙමටගොඩ අගනා භූමියක් මිලට ගත්තාලදින් 1908 දී එහි ගෙයක් ගොඩනංවනලදී. මින්පසු වස්කාලවලදීත් තවත් නොයෙක් අවස්ථාවලදීත් නායකමාහිමිතුමා වරින්වර එහි විසීය. 1911 දී සිප්කඩුවේ ශ්‍රී සුමංගල නායකමාහිමියන් අපවත්වීමෙන් පුරප්පාඩු වූ "ත්‍රිපිටක වාගීශ්වරාචාර්ය උපාධ්‍යාය" පදවිය මල්වතු සංඝසභාව විසින් මූන්වහන්සේට පවරනලදී.

මේ කාලයේදී මූන්වහන්සේ නොයෙක්විට ආබාධවලින් පෙළෙන්නට වූ බැවින් 1912 දී විවේකගැනීම සඳහා බණ්ඩාරවෙලට පැමිණ ටිකකලක් නැවතී සිටියහ. 1913 සැප්තැම්බර් 24වෙනි දින උන්වහන්සේට සැටපිරීම නිමිත්තකොට මහෝත්සවයක් පවත්වනලදී. මූන්වහන්සේ රෝගීව සිටගෙනත් ශාසනප්‍රදානය අත්නොහල බව මෙකල විද්‍යාලංකාර පරිවේණාධිපතිව වැඩවසන කිරිවත්තුඩුවේ ප්‍රඥාසාර නායකස්ථවිරතුමන් විසින් මෙසේ ප්‍රකාශකොට තිබේ. "ලෙඩ ඇඳේ වැතිර සිටත් දවල් දෙකේ සිට රාත්‍රි අට වනතුරු ශ්‍රී ධර්මාරාම නායකමාහිමියන්වහන්සේ පොත්පත් කියාදුන් ආකාරය මටනම් තවම මතකය. හරියට වේලාවට වැඩකිරීම, නොපැකිල විවෙචනයකිරීම, නිදහස් මත ගරුකිරීම, ආචාර්යභක්තිය, මහාපාණ්ඩිත්‍යය ආදී උන්වහන්සේගේ උදාර ගතිගුණපවා එකල සිටි ශිෂ්‍යයන්ගේ ගුණ නුවණ දියුණුවට හේතුවූයේය." (1948 මැයි 5දා ලංකාදීප පත්‍රයෙහි )

මූන්වහන්සේ කල ශාසනසංග්‍රහන් අනාගතයෙහි පවත්වා ගෙන යාමට සමර්ථ ශිෂ්‍යරත්නයක් මේතුමන්ට ඇතිවිය. ඒ ශිෂ්‍යවරයා නම් එතුමන්ට අනතුරුව පරිවේණාධිපති වූ ලුණුපොකුණේ ධම්මානන්ද නායකමහාස්ථවිරතුමාය. මාහිමියන් වහන්සේ ක්‍රමයෙන් ගිලන්වූ බැවින් 1917 දී වීරගේත් විද්‍යාරත්න පිරිවෙණේ උගන්වමින් සිටි මේ ප්‍රධාන ශිෂ්‍යවරයා පැලියගොඩට ගෙන්වා උපාධිපතිපදවියට පත්කොට තමන්ගේ බර සැහැල්ලුකරගත්හ. මෙසේ අනල්පලෝක-ශාසනසංග්‍රහයන් කල මේ මහාපණ්ඩිතරත්නය 1918 වේ මැයි මස 3 වෙනි දින දෙමටගොඩ ධර්මප්‍රසාද විහාරස්ථානයේදී අභාවප්‍රාප්ත විය.

# 39. අම්බලම්ගොඩ දේවානන්ද උපසංඝරාජ මාහිමියෝ.

(ක්‍රි. ව. 1847-1936)

අම්බලම්ගොඩ කරිත්තකන්දේ පුරාණ සුභද්‍රාරාමාධිපතිව* වැඩවිසූ "ශාසනවංසාලංකාර කවිධජවිනයාචරිය" දේවානන්ද උප සංඝරාජ මහාස්ථවිරතුමා බු. ව. 2390 දී අම්බලම්ගොඩ පටබැඳි-මුල්ල පෙදෙසේදී උපන්නේය. "කුමුදප්පෙරුම සලමන් ද සිල්වා" උපාසකමහතා ද "අලුත්ගම ගුරුගේ පුංචිනෝනා" උපාසිකාව ද මෙතුමාගේ මවුපියෝ වූහ. මෙකුමරු පැවිදිකිරීමට පත්කරනු කැමතිවූ මවුපියෝ මොහුට අකුරු ඉගැන්වීම් ආදිය සඳහා එකල පුරාණ සුභද්‍රාරාමාධිපතිව වැඩවිසූ දොඩන්දූව පියදස්සි මහාස්ථවිර තුමන්ට බාරකළහ. ඒ පියදස්සී මහාස්ථවිරතුමන් විසින් සවකීය ශිෂ්‍ය වැරැල්ලාගේ පඤ්ඤාතිස්ස මහාස්ථවිරතුමන්ට බාරදෙන ලදින් ඒ ස්ථවිරතුමන් විසින් අකුරුකරවා සාමණේර බණදහම් ආදියද උගන්වනලදී. මෙකුමරු නවහැවිරිදි කල්හි ආවාසී මහ තෙරුන්ගේ මෙහෙයීමෙන් බු. ව. 2400 පොසොන් පසළොස්වක්දා මාදම්පාමෝදර උදකුක්ඛේප සීමාවට රැස්වූ සංඝයාමධ්‍යයේදී අම්බලම්ගොඩ පොල්වත්තේ අග්ගාරාමාධිපතිව වැඩවිසූ මිරිස්සේ ධම්මානන්ද නායකමාහිමියන් ලවා පැවිදිකරවනලදී.

පැවිදිවීමේදී දේවානන්ද නාමය ලැබූ මේ හෙරණතෙමේ කලක් මිරිස්සේ මාහිමියන් වෙතින් ඉගනීම කර පසුව කළුතර පුලිනතලාරාමයට පැමිණ වැලිගම ශ්‍රී සුමංගල මාහිමියන් වෙතින් දීර්ඝ කාලයක් ඉගනීම කෙළේය. බු. ව. 2410 යේදී යථෝක්ත මාදම්පාමෝදර සීමාවේදීම මිරිස්සේ නායකමාහිමියන් උපාධ්‍යායකරගෙන කතළුවේ ගුණරතනාතිස්ස මහාස්වාමීන්ගේ පරම්පරාවේ සංඝයාගෙන් උපසම්පදාව ලැබීය. වැරැල්ලාගේ පඤ්ඤාතිස්ස, දොඩන්දූවේ පියරතනාතිස්ස, වැලිගම සිරිසුමංගල යන මහාස්ථවිරවරු මෙතුමාට කර්මාචාර්යවරයෝ වූහ.

ඉන් පසුත් කලක් වැලිගම නායකමාහිමියන් වෙත වැස නිස මුත්තකවී නොයෙක් පලාත්වල වස්වසමින් මහජනයාට ධර්මශාස්ත්‍ර දෙකින් සංග්‍රහ කෙළේය. මේ කාලයේදී ගොරකානේ පදිංචිව විසූ බේරුවල සිරිදියස් ද සිල්වා ගුරුතුමාගෙන් සිංහලය පිළිබඳ ගුරුපදේශ ලැබීයයි ද කියත්.

ක්‍රි ව. 1886 යේදී බුරුමරට විසූ "අග්ගධම්මාලංකාර කවිධජාධි පති-මහාධම්ම රාජාධිරාජගුරු" මහාස්වාමීන්වහන්සේ අපවත්වූ

* පසුකලක මෙය "රත්කොත්විහාරය" යි ව්‍යවහාරයට පත්කරන ලදී.

බැවින් ඒ ආදුහනොත්සවය ලක්දිව බුරුමනිකායිකයන්ට දන්වා එවනලදී. ඒ සඳහා මෙරටින් යැවියයුත්තා කවරෙක්දැයි සාකච්ඡා ඇතිවී දේවානන්ද මහාස්ථවිරතුමා යැවියයුතුයැයි සම්මතවිය. මුන්වහන්සේ නවභික්ෂුනමක් ද පිරිපුන් විසිවයස් ඇති සාමණෙර නමක් ද කැපකරුවකු ද සමග ඒ වර්ෂයේදී ඒ ආදුහනොත්සවය සඳහා පිටත්ව ගොස් ඒ කටයුතු නිමවා හැරී ආවේය.

උඩ නම කියවුණු අග්ගධම්මාලංකාර මහාස්ථවිරතුමා වනාහි වජිරාරාමික මහතෙරුන්වහන්සේගේ ආචාර්යයායි. එබැවින් එහි පැමිණි දේවානන්ද ස්ථවිරතුමාට වජිරාරාමික මහතෙරණුවෝ හැම උපස්ථාන කරවූහ. පසුකලක බුරුමරටට නැවත ගොස් අභිධර්මය හදරනු කැමති වූ දේවානන්ද මහාස්ථවිරතුමා ඒ බව වැලිගම මාහිමියන්ට දන්වා එතුමන්ගෙන් සන්දෙශ රැගෙන 1890 වේදී බුරුමරටට ගොස් එහි මෝලමෙයින්නුවර රතනුමවඩු විහාරයෙහි වැඩවිසූ "පඤ්ඤාභිසිරිසද්ධම්මකම්බජ මහාධම්මරාජාධිරාජගුරු" උපාධිධාරී වජිරාරාමික මහතෙරුන් වෙත නැවතී සය අවුරුද්දක් පමණ කල් ඉගනීම කෙළේය.

ඉගනීම අවසන් කොට සියරටට හැරී අවුත් ශාසනසංග්‍රහ කරමින් වසන කාලයේදී වජිරාරාමික මහතෙරුන්වහන්සේ අපවත්වූ බැවින් 1910 යේදී තෙවෙනිවරටත් මුන්වහන්සේ බුරුම රටට වැඩමවා ආචාර්යපාදයන්ගේ ආදුහනොත්සවයට සහභාගීවී දඹදිවට වැඩමවා එහි සිද්ධස්ථානයන් ද වැඳපුදාගෙන ලක්දිවට හැරී ආහ.

ඉගනීම අවසන්කොට මෙහි පැමිණි මෙතුමා වජිරාරාමික මාහිමියන් විසින් සම්පාදිතවූ දුස්සීලදානාදිවිනිච්ඡය නමැති පාළි පොත සිංහලට නගා පළකරවිය. ලක්ෂ්මීණීපනත් කත්‍රතුමාගේ මහාපුරුෂාධානයට උත්තර වශයෙන් "බොධිසත්වොපපත්ති විනිශ්චය" නමැති ග්‍රන්ථයක් ලියා පළකරවිය. බුරුමරට ධඤ්ඤවඩ්ඩ නුවර කොසල්ලාලංකාර මහාස්ථවිරතුමන් ලියූ සාධුජනප්පසාදනී-යට උත්තරවශයෙන් "සාධුජනපපසාදනී" නම් පාලිග්‍රන්ථයක් ලියා පළකරවිය. සත්‍යාර්ථදීපනී, විමතිච්ඡේදනී යන පොත් දෙකක් ද සම්පාදිතවූහ. අනුරුද්ධාචාර්යයන්ගේ නාමරූප පරිච්ඡේදයට හා පරමත්ථවිනිච්ඡයට සන්නදෙකක් ලියා ධනවත් මහතුන් ලවා මුද්‍රණය කරවා තොමිලයේ දෙන්ට සැලැස්සීම මුන්වහන්සේගේ සත්කෘත්‍යයන් අතුරෙහි ඉතා උසස් තැනක් ගත්තේය.

මේ අභිධර්මපොත්වලට සත්හලිවීම නිසා අතිශයෙන් ප්‍රමුදිතවූ බුරුමරට සංඝරාජප්‍රමුඛ මහාසංඝසභාව විසින් 1928 දී මුන්වහන් සේට උපසංඝරාජපදවිය පත්කොට ඒ බව ඒ වර්ෂයේ පෙබරවාරි

6 වෙනිද විදුලි පුවතකින් මෙහාට දන්වනලදී. පසුව එහි අකන කඩදසිය ඉංග්‍රිසි ආණ්ඩුව බෑරේ එවනලදින් 1928 වේ ජූනිමස 30 වෙනි දින මොරටුවේ හොරේතුඩුවේ ගංගාරාමවිහාරයේදී එය පිළිගැන්වීමේ මහොත්සවය පවත්වනලදී. එම වර්ෂයේ ජූලිමස 14 වෙනිද ඒ සම්බන්ධයෙන් අම්බලම්ගොඩ රත්කොත් විහාරස්ථානයේ දීද මහොත්සවයක් පවත්වනලදී.

පාතදුරේ වැලිපිටියේ අභයකරුණාරත්න මුදලිතුරාමය, වලානේ සරණපාලාරාමය, කහඳමෝදර තිලකරත්නාරාමය, (පාතදුරේ) කෙසෙල්වත්තේ පූර්වාරාමය, හික්කඩුවේ ජනනන්‍ද-රාමය, අලුත්තල නන්‍දාරාමය, තංගල්ලේ ඇත්නැපිටිය, රද්දොළුවේ සුබොධාරාමය, පෝරඹ සුගතබිම්බාරාමය යන තැන්හි මූත්වහන් සේගේ ප්‍රධානත්වයෙන් සීමාබන්ධන කරනලදහ නමසකාරවාද-දල්හිකම්වාද-දුස්සීලදනවාද යන මේ වාදවලදී පුරෝගාමිව ක්‍රියා කළහ.

පුරා අවුරුදු 89ක් ආයුෂවැලඳූ මූත්වහන්සේ අවසානය දක්වාම වැඩි ඉන්‍ද්‍රියදුර්වලත්වයකට නොපැමිණ සිට ස්වල්පදිනක් රෝගිව වැස 1936 අප්‍රෙල්මස 2වෙනි දින පෙරවරුවේදී සවකීය මූලස්ථානයවූ රත්කොත් විහාරයේදී අපවත්වූහ. ඒ පිළිබඳ ආදහනොත්සවය ඒ මස 9වෙනි දින අතිශමහිරාකාරයෙන් පවත්වනලදී.

## 40. බැද්දිගම රතනපාල නායකමහාසවාමි.

(ක්‍රි. ව. 1855-1917)

රුහුණුරට ගිරිවාදතවිවෙහි බැද්දිගමයයි ප්‍රකට ගමක් වේ. එහි "දෙන් අබරම් දිශානායක අප්පුහාමි"යයි ප්‍රකට ගම්දෙටු මහතෙක් විය. හෙතෙම මැදගම "මහානාම සිරිවද්දන" පෙලපතේ කානතා-වක් හා විවාහයට පත්විය. ඒ දෙදෙනට දෙන් අන්‍දයස්, දෙන් ජොහානස් යන පුත්‍රයෝ දෙදෙනෙක් වූහ. එයින් දෙන් අන්‍දයස් දිශානායක තෙමේ කරතොට දෙන ගිමාරා විජයසිංහ නමැති කානතාව හා අවාහයට පත්විය. මේ මහතාගේ දරුවන් සිවුදෙන අතරෙන් බාලයා බු. ව. 2398 වේ ඇසළමස අවසනවක්ද උපන්නේය. දුටුදුටුවන්ගේ නෙත් සිත් ඇදගන්නා රූපසම්පත්ති-යකින් යුත් මේ කුමරා පස්හැවිරිදි වයසේදී පට්ටියපළ පුරාණ විහාරයෙහි වැඩවිසූ පට්ටියපළ සොභිත මහාස්ථවිරතුමන් වෙත අකුරු ඉගැන්වීමට බාරදෙනලදී ඉගනීමෙහි අතිශය දක්ෂභාවයක් දක්වූ මෙකුමරු ස්වල්ප කලකින් ලියන්නට කියවන්නට දක්ෂයකුවූ බැවින් මොහු පැවිදි කළ යුතුය යන්න බොහෝදෙනෙකුන්ගේ නිගමනය විය.

දසහැවිරිදි කල්හි ඒ සොභිත මහාස්ථවිරතුමන් විසින් පැවිදි කරනුලැබ රතනපාල නාමය ලැබූ මේ සාමණෙරතෙමේ ටික

කලක් ස්වකීයාචාර්යයන්ගෙන්ම ඉගෙනීම ලබා වැඩිදුර ඉගනීම පිණිස සියඹලාකඩුවේ අත්ථදස්සී නායකස්ථවිරතුමන් වෙත පමුණුවනලදී. මුත්වහන්සේගේ ව්‍යක්තභාවය දුටු එගම්වැසියෝ ද නායකස්ථවිරතුමා ද එතුමාගේ ඥාතීන්ට හා ගුරුවරයාට දන්වා මේ සාමණේරයන් නායකස්ථවිරතුමාගේ ශිෂ්‍යයකු බවට පත්කර ගත්හ. සොළොස්හැවිරිදි කල්හිම මෙතුමා නොයෙක් පෙදෙස්වල ධර්මදේශනාවන් සඳහා වැඩමවාගෙන යන ලද්දේය.

උපසම්පදාව ලැබීමට සුදුසුකාලය පැමිණිවිට ආචාර්යවූ අත්ථදස්සී නායකස්ථවිරතුමා මෙතුමන් සමග මහනුවර මල්වතුවිහාරයට පැමිණියේය. රතනපාල හිමියන්ගේ සුළුපියාවූ "දෙන් ජෙහාතන් දිශානායක" මහතා උඩරට කළුගමුව නම් පෙදෙසේ පදිංචිව "කළුගමුවේ තිලමේ"යයි ප්‍රකට වෛද්‍යයෙක්ව සිටියේය. හෙතෙමේ ස්වකීය ඥාතිපුත්‍රයාගේ උපසම්පදාමංගලයේදී ශිෂ්‍යපක්ෂයෙන් ඉටුවිය යුතුදේ සිඩකෙළේය. උපසම්පදාපෙක්ෂකයන්ගේ පාඨම්විභාගයේදී බැදිගම හිමියන් මහත් ව්‍යක්තභාවයක් පෙන්නුබැවින් මහාසංඝ සභාව අතිශයෙන් ප්‍රමුදිතවිය. එකල්හි මහානායකපදවිය දැරුවේ මැදගම ධම්මරක්ඛිත-දෙවමිත්ත මහාස්ථවිරතුමාය. උන්වහන්සේ උපාධ්‍යායකොට හිප් පාල සොභිත මහාස්ථවිරතුමා ද වැව්ගොන්නේ විපස්සී මහාස්ථවිරතුමා ද කර්මාචාර්යකොට රතනපාල හිමියන්ට උපසම්පදාව දෙනලදී.

උපසපත්වී පස්වර්ෂයක් ස්වකීයාචාර්යතුමන් වෙත වැස විනය ඉගෙන වැඩිදුර ඉගනීම සඳහා පැලියගොඩ විද්‍යාලංකාර පිරිවෙන්හි රත්මලානේ ධර්මාලෝක මහාස්වාමීන් වෙත පැමිණියේය. ඒ ධර්මාලොකමාහිමියන්ගෙන් හා උන්වහන්සේගේ ශිෂ්‍යවූ ධර්මාරාම මාහිමියන්ගෙන් ධර්මශාස්ත්‍ර උගත් බැදිගමරතනපාල භික්ෂුතෙමේ ස්වකීය ව්‍යක්තභාවය නිසා ඒ පිරිවෙනේ ආචාර්යධුරයකට පත් කරනලදී. ධර්මාලොක මාහිමියන්ගේ ඇවෑමෙන් මුන්වහන්සේ එහි උපප්‍රධානාචාර්ය බවට පත්වූහ. මෙසේ දෙලොස් වර්ෂයක් එහි ගතකළ පසු මාතර පලාතේ තැනුම්පත විහාරස්ථානයේ දායකවරු අවුත් රතනපාලස්ථවිරතුමන් ස්වකීය පලාතට වැඩමවාගෙනයන්ට ඕනැබව කියා බලවත් යාච්ඤා කළබැවින් පිරිවෙනේ ශිෂ්‍යයන් හා දායකයන් විසින් උත්සවයක් පවත්වා ගරුබුහුමන් දක්වා තුටු පඩුරු පිදූ පසු එසේ කැඳවාගෙන යන්ට අවසර දෙනලදී. එය සිදුවූයේ බු. ව. 2434 (ක්‍රි. ව. 1891) දීය.

තැනුම්පත විහාරස්ථානයෙහි නැවතී සුළුවශයෙන් ඉගැන්-වීමක් කරමින් සිටිනාතර මාතර විසූ "අංගණෙත්තා සුසානා ඉලංගක්කෝන් පිලිප් පණ්ඩිතරත්න" ලමාතැනීන් ප්‍රධාන දායක

සමූහයාගේ ඉල්ලීම ලෙස මාතර කඩවත්සතර තුළ මහාමහින්ද විද්‍යාමන්දිරය පිහිටුවීම සඳහා එහි පැමිණියේය. මෙය පිහිටුවීම උයන්වත්තේ කීර්ති ශ්‍රී ධම්මදින්න රේවත නායකස්ථවිරපාද-යන්ගේ උපදෙශ ඇතිව සිද්ධවිය. බු. ව. 2436 දී එය පිහිටෙවු තැන් පටන් 24 වර්ෂයක් උන්වහන්සේ එහි ඉගැන්වීම කළහ.

බු. ව. 2442 දී මූන්වහන්සේට ශ්‍රීකල්‍යාණීසාමග්‍රිධර්ම සංඝසභා-වෙන් කර්මාචාර්යධුරයක් ලැබුණි. ක්‍රි. ව. 1910 දී ඒ සංඝසභාව විසින් දකුණුපලාතේ ප්‍රධාන සංඝනායකපදවිය පිරිනමනලදී. මූන්වහන්සේ උත්පත්තියෙන්ම ලැබූ කපිකත්වය ඇත්තෙකු බැවින් වාදවිවාදවලදී ජයග්‍රහණය කිරීම මෙතුමාට අපහසු නොවීය. 1888 දී වලස්මුල්ලේ මඩමේදී සිදුවූ වාසිවාදය හෙවත් අටපිරිකරට දැලිපිහිය නොව වෑයක් හෝ පිහියක් ගතයුතුයයි රාමඤ්ඤනිකා-යිකයන් ඉපදෙවු වාදයේදී මූන්වහන්සේ පහසුවෙන්ම ජයගත්හ. කොස්ගමවාදය, බටපතේ වාදය, වත්තිරට බලල්ලේ වාදය, සත්කෝරළේ රම්වලවාදය, දික්වැල්ලේ සීමාවාදය, ඇල්ගිරියේ වාදය, කඩවැද්දුව වාදය, කඹුරුපිටියේ වාදය, කැලණියේ වාදය, කළුතර වාදය, රසීගම වරාවත්තේ වාදය යනාදි විවාදවලදී මූන්වහන්සේ ව්‍යක්තලෙස කරුණුපහදාදීමෙන් බොහෝ අවස්ථාවලදී අධර්මවාදීන් මැඩලූහ. මෙයින් වාදබොහොමයක් සද්ධම්මයුත්තික නිකායිකයන් හා රාමඤ්ඤනිකායිකයන් සමගය. කැලණිය කළුතර ආදියේ වාද දෙවුර වසා සිවුර පෙරවීමට එකඟවූ සවනිකායිකයන් සමගය. කොට්ටාව පලාතේ විසූ බැලගම සුභොධානන්ද නම් තවුසා සම්පාදනයකළ "වඳුරමහකසංග්‍රහය"ට උත්තර වශයෙන් පිටු 72 ක් ඇති "වඳුරමහකනිග්‍රහ" නමැති පොතක් ලියා ඒ තවුසා හමුවී කරුණු පහදාදී ඔහු නිහඬ කළහ.

මේ චරිතකථාවට කරුණු උපුටාගන්නාලද්දේ අපගේ මිත්‍රවූ කුඹුරුපිටියේ ගුණරතන ස්ථවිරතුමන් විසින් සම්පාදිතව 1918 දී මුද්‍රිතවූ "ශ්‍රීරත්නපාලමහාස්වාමිචරිත"යෙනි. මූන්වහන්සේ ස්ථා-නොචිත ක්‍රියාවෙහින් තැනට සුදුසු වචන කීමෙහින් අති දක්ෂයකුවූ බව මට අසන්ට ලැබී තිබේ. එයට නිදර්ශන ඒ චරිතකථාවෙහි නොදක්නා ලැබේ. මා අසා තිබෙන එක් සිද්ධියක් නම්:- සියම් නිකායට උපසම්පදාව නැතැයි අන්‍යනිකායිකයන් උපදවා තිබුණු වාදයක් සඳහා මාතරපලාතේ ස්ථානයක මහත් පිරිසක් රැස්විය. සියම්නිකාය පක්ෂයේ එක්වාදියෙක් බැදිගම නායකස්ථවිරතුමාය. අනික් හැමදෙනම රැස්වූ නමුත් මේ නායකමාහිමියෝ පැමිණ නොසිටියහ ඒ නොපැමිණීම ගැන පිරිස අතර කථාබස් පවත්නා විට මූන්වහන්සේ ගොත්බැඳි කරත්තයක නැගී හැමදෙනට

පෙනෙනයේ වාදමණ්ඩපය ලඟටම ඇවිත් බැස්සාන. එවිට විරුද්ධ පාක්ෂිකයෝ "ඔත්ත බලත්ත සියම්නිකායිකයෝ ප්‍රසිද්ධ ලෙසම ශික්ෂාපද මඩිමින් ඇවැත් සිදුකරගනිති"යි කියන්ට පටන්ගත්ත. එවිට තෙරණුවෝ සභාව මැදට අවුත් ඒ කාරණයම මුල්කොට-ගෙන කථාකරමින් "සියම්නිකායිකයන්ට උපසම්පදාව ඇතිබව විරුද්ධපාක්ෂිකයන්ගේ මේ කථාවෙන්ම ඔප්පුවෙයි; ඇවැත් සිදුවන්නේ උපසම්පදාව ඇත්තන්ටය, උපසම්පදාව නැත්තන්ට ඇවැත් සිදුවීමක් නැත. එබැවින් කරත්තයෙන් ආනිසා මට ඇවැත් සිදුවේයයි කියත් නම් මට හා මගේ නිකායේ සෙස්සන්ටත් උපසම්පදාව ඇතිබව ඔවුන් විසින් පිළිගන්නා ලද්දේය"යි කීය. විරුද්ධ පක්ෂය උත්තර නැතිව නිහඬ විය.

කවට වදන් කිමෙහි ද මුන්වහන්සේ දක්ෂයෙකුව සිටිබව අසන්ට ලැබේ. වරක් මුන්වහන්සේ විද්‍යෝදය පිරිවෙණට ආවිට මහයියන්නුඩුවේ දෙවමිතන නායකසථවිරතුමා "ඔත්ත, බැද්දේ සතා එනවා"යයි විහිලුවට කීය. බැදිගම නායකසථවිරතුමා එයට පිළිතුරු දුන්නේ "එහෙනම්, හෙය්යන් කැලේට දක්කන්ට වෙයි" යන්නෙනි "බැද්දේ සතා" නම් කොටියාය, "හෙය්යා" නම් හරකාය කොටියා හරකුන් කන බැවින් ඌ එනවිට හරකුන් ඉවත්කරන්ට සිදුවේයයි උපහාසය ගැබ්කරමින් එතුමා එකෙණෙහි පිළිතුරු දුන්නේය.

1915 වේදී ඇතිවූ සිංහල-මරක්කල කෝලාහල කාලයේදී මාතර ආණ්ඩුවේ නිලධාරීන් මෙතුමන් සහායකොට ගෙන කෝලාහල නවත්වාගත් බව කියත්.

දෙසැට හවුරුද්දක් ආයුවැලඳූ මුන්වහන්සේ 1917 දෙසැම්බර් මස 11 වෙනිද අපවත්වූහ. ඒ මස 13වෙනි දින ආදාහනෝත්සවය පවත්වනලදී.

## 41. අම්බලම්ගොඩ ශ්‍රී ධර්මාධාර රාජගුරු මහාස්වාමිතුමා

( ක්‍රි. ව. 1858-1936 )

අම්බලම්ගොඩ පොල්වත්තේ අග්ගාරාමාධිපතිව වැඩවිසූ මුන්වහන්සේ එකල "පෝරඹ වලව්ව" යයි ප්‍රකටව තිබුණු ස්ථානයෙහි විසූ දොන් සාමියෙල් ද සිල්වා අබේසේකර ලියන-ආරච්චි මහතාගේ බාලපුත්‍රයාය. ඒ මහතාට සිටි අනික් එකම පුත්‍රයා නම් මුන්වහන්සේගේ දෙටු සොහොයුරු "දොන් ජොහානිස් අබේසේකර අප්පුහාමි" ය. මෙතුමාගේ මහපියා මේ පලාතේ මුහන්දිරම් ධූරය උසුලමින් බොහෝ තේජස්ඇතුව විසූවෙකි.

මේ වලව්ව පිහිටි තැන වනාහි පෙර සිංහලරජුන්ගේ කාලයේ පටන් "කූනත්වාහල" යයි ප්‍රකටව තිබුණ තැනකි. කූනම නම් දෝලාවක් මෙන් උසස් පුද්ගලයන් නංවාගෙන කරතබාගෙන යන වාහන විශේෂයකි පෙර රජුන්දවස තිලධාරීන් රටේ සංචාරය කරනවිට නවාතැන් ගැනීමටත් කූනන් මාරුකිරීමටත් මෙකල තානායම් මෙන් මේ "කූනත්වාහලවල්" තිබෙන්ට ඇත.

. මුත්වහත්සේගේ මෑණියෝ වැලිගම ශ්‍රීසුමංගල නායක-මාහිමියන්ගේ මෑණියන් හා ඥාතිසම්බන්ධය ඇත්තෙකි. පියාවූ රාළහාමි එකල පොල්වත්තේ අග්ගාරාමයෙහි මහත් තේජසින් වැජඹුණු මිරිස්සේ ධම්මානන්ද කල්‍යාණිවංශික සංඝනායක මාහිමියන්ගේ දායකයෙක් විය. තමාගේ බාලපුත්‍රයා පැවිදිකළ-යුතුයයි පියාණන් විසින් නායකමාහිමියන්ට බාරදෙනලදින් යෝග්‍ය වයසේදී පැවිදි කරනලදී. මේ නායකමාහිමියන් 1876දී අපවත්වූ බැවින් පැවිදි වීමේදී ධම්මාධාර යන නම ලැබූ මෙතුමා ඒ අවස්ථාවේදී අටලොස් හැවිරිදි සාමණේරනමක්ව සිටිබව පෙනේ. මින් පසු වැඩිහිටියන් විසින් මුත්වහත්සේ දෙඩන්දූවේ ශෛලබිම්බාරාමයේ වැඩ සිටි උඩුගල්පිටියේ සිරිසුමනතිස්ස, දෙඩන්දූවේ පියරතනතිස්ස යන මහාස්වාමිවරයන්ට බාරදෙන ලදින් බොහෝ කලක් එහි ඉගෙනීමේ යෙදීසිටියාහ.

තරුණකාලයේදීම විදේශ සංචාරය කොට අභිධර්මය හා සංස්කෘතභාෂාව සම්බන්ධ ඉගනීම දියුණුකරගනු කැමතිවූ මුත්වහත්සේ 1890 පමණේදී කල්කටාවට ගොස් කලක් නැවතී සිට හැරී අවුත් කහඳුමෝදර පඤ්ඤාසීහ ස්ථවිරතුමන් සමග බුරුමරටට ගියහ. එහිදී බුරුම කාම්බෝජ යයි කියනුලබන තිබෝප්‍රදේශයේ මහාරාජාතුමා මේ දෙනම වස්වසවාගෙන උපස්ථානකොට ඒ දෙනම සමග දඹදිව සිද්ධස්ථාන වැඳීමට ගොස් සියරටට හැරීඅවුත් මේ දෙනමට 'රාජගුරු අක්තදෙකක් පිළිගැන්විය. එතුමාගේ රාජමුද්‍රාව යොදා තිබෙන ඒ අක්තයේ තිබෙන ඉංග්‍රීසි කොටස මෙසේයි:-

In the year 1256 wednesday, the 12th increase of the month of Tabaung and corresponding with English Era 1895, dated wednesday the 6th march, His Highness Kanbawza, ruling maharaja Sawbwagi of Oanbaung Thibaw, has this day venerated and honoured his venerable professor, from the old title of the Reverend U. Dhammadhara with the new title of Kanbawza-Ratthataing Oanbaung Tibaw maharajaguru Saddhammawansapala Siri Dhammadhara Thera."

"බුරුම ශකවර්ෂ 1256 යේ මැදින්මස පුරපක්ෂයේ 12 වෙනිදා වූ බදාදා—ඉංග්‍රීසි වර්ෂයෙන් 1895 ක්වූ මාර්තුමස 6 වෙනි බදාදා—කාම්බෝජ නමැති ඔත්බොත්තිබෝ ප්‍රදේශය ආණ්ඩුකරන මහාරාජා සෝඛ්වාජ්තුමා එතුමාගේ ගෞරවාභී පඬිවරයාවූ ගරුකටයුතු ශ්‍රී. ධම්මාධාරසථවිරතුමන්ට "කාම්බෝජරඨ්ඨෙන් ඔත්බොත්තිබෝ මහාරාජගුරු සද්ධම්මවංසපාල සිරිධම්මාධාරථෙර" යන නාමයෙන් පිදීය, ගෞරව කෙළේය." යනු එහි සිංහලානුවාදයයි.

1902 පමණේදී නැවත කල්කටාවට පැමිණි මෙතුමා වට්ටිගම බෞද්ධයන්ගේ ධර්මාංකුරවිහාරයේ නැවතී පාලි ඉගැන්වීම කෙළේය. මහාචාර්ය බී. ඇම්. බරුවා මහතා ඒ කාලයේදී මෙතුමාගෙන් පාලි උගත් ශිෂ්‍යයෙකි. ධර්මපාලමහතා කල්කටාවට පැමිණියේත් මේකාලයේදී ය. මේ දෙදෙන කෘපාචරණ නමැති වංගදේශීය මහාසථවිරතුමන් හා එක්ව බෞද්ධ කටයුතු එහි දියුණු කිරීමට බොහෝ උත්සාහ කළහ. ධර්මපාලචරිතය ලියන්නන් මේ ගැන යමක් නොකියතත් ධර්මපාලතුමන් අපාචාර්යතුමන් වෙත එවූ ලිපි රාශියක් මාළිගෙ තිබෙන බැවින් ඒ කාලයේ සම්බන්ධය ඒවායින් මනාසේ හෙළිවෙයි. 1896යේදී ධර්මපාලතුමා ගයාවේ සිට කල්කටාවේ විසූ මෙතුමන්ට එවූ ලිපියක් මෙසේයි:-

"ගයාව, 2439 ඔක් 22

ගෞරවාදර පෙරටුකොට ලියමි,

ස්වාමීනි,

ගිය බෘහස්පතින්දා කල්කටාවට එන්ට මෙහෙන් පිටත් වෙන්ට මගේ කල්පනාව තිබුනා—නමුත් ඒජන්ත උන්නැහේගේ බලවත් ඕනෑකම නිසා නැවතුනෙමි. මහාබෝධිගම මහන්තාට ගන්ට ඉඩකැරියොත් අපට ලොකු අන්තරායක් වේ. මහාබෝධියට දුම්රියපාර දීර්ඝකරන්ට මැත ඉවරයි. මහාබෝධිගම ගන්ට බැරිවුනොත් මතු වැඩට පාඩුයි. කල්කටාවේ ගෙයක් ඕනෑමයි. මේ සම්බන්ධ කටයුතු කරන්ට හාමුදුරුවො උත්සාහ ගන්ට ඕනෑ. රුපියල් 5000 ක් මහාබෝධිසමාගමෙන් මිට ලබාගැනීම පුළුවන. බුරුම ඇත්තන්ගෙන් කොපමණ ලැබේද? රු. 10000කට ගෙයක් ගන්ට නම් ඒ ඇත්තන්ගෙන් රු. 5000 ක් ඕනෑ. මහාබෝධිගම ගන්ට බැරිවුනොත් කල්කටාවෙන් ගෙයක් කාගෙන් උදව්වක් නොලැබුනත් ගන්ට ඕනෑ. මහාබෝධිගම ගැනීමට ද එහි සංඝයා නැවැත්වීමට ද මම කරණ උත්සාහය අත්නාරිමි මගේ ජීවිතය බෝධියට පූජාකෙළෙමි. ඒ නිසා මේ වැඩේ අත්හැරීම කරන්ට නම් බැහැ. දෙමව්පියෝ අත්හැර

මේ සියළු උත්සාහ ගත්තේ මම කල පොරොන්දුව නිසයි. ලෝකේ සතරදිග්භාගයේම සමාගමේ වැඩ පැතිර ගියේය. දැන් එය විනාශකර දැම්ම යුතු නැත.

පස්අවුරුද්දක් ගත් උත්සාහය නිරාඵලකවුනේ නැත. සිංහල දෙනා මා අත්හැරියත් මම බෝධිය අත්හරින්නේ නැත. කල්කටාවේ ස්ථානයක් කිරීම හාමුදුරුවන්ට භාරයි. බලවත් ලෙස උත්සාහ කලොත් මෙය සාඵලකරගැනීමට හාමුදුරුවන්ට පුළුවනි. බුරුමයින්ට නිතර මේ ගැන දේශනාකර ආවාසයක් කල්කටාවේ ඇතිකර ගැනීමේ ආනිසංස කියාදෙනු මැනවි.

හිතකාමී,

H. Dharmapala ”

කලිකතා විශ්වවිද්‍යාලයේ පාලිභාෂාව හා බුද්ධාගම පිළිබඳ අංශයක් ඇතිකරවීමට බොහෝසේ වීර්‍යගත්තේ මුන්වහන්සේයි. සර් ආශුතෝෂ් මුඛර්ජි වයිස්චාන්සලර්තුමා සමග නොයෙක්විට කල සාකච්ඡා නිසා ඒ පදවිය පිහිටුවන්ට නියම වූ අවස්ථාවේ මුන්වහන්සේ එහි නොසිටි බැවින් එතුමාට නොදන්වාම අන්‍යයන් ඒ ධුරය ලබාගත්බව ප්‍රකාශ කිරීම සඳහා එතුමන්ට ලැබීතිබෙන ලියුම් රාශියකි. එයින් අනගාරික ධර්මපාලතුමන් එවූ ලිපිය මෙසේයි:-

“4 A College Square

Feby 18, 2461/1918

නමෝ බුද්ධාය.

ප්‍රේමයෙන් අපේ ධම්මාධාර ස්ථවිරයන්ට ලියමි.

පාලි ඉගැන්වීම සම්බන්ධ සභාවක් යුනිවර්සිටියේ පවත්වනලදී. ආශුතෝෂ්මුඛර්ජි නඩුකාරතුමා විද්‍යාභූෂණ ආදී අය පැමිණියහ.

තමුන්නාන්සේ වෙනුවට පූර්ණානන්ද උන්නාන්සේ පත්කර ගෙණ තිබේ. තමුන්නාන්සේ නැවත කල්කටාවට එන්නේ නැත කියා කිරිපා උන්නාන්සේ කීවේය. ඒ නිසා පූර්ණානන්ද උන් නාන්සේ පත්කරගත්තාලදී. මේ කල ප්‍රයෝගය නිසා තමුන් නාන්සේ විසින් ආරම්භකල වැඩට බාධායි. විද්‍යාභූෂණ - කිරිපා යන මේ දෙදෙන මුල්ව තමුන්නාන්සේ වෙනුවට පූර්ණානන්ද පත්කරගෙණ තිබේ.

මේ ගැණ කටයුතු කිරීමට අප වෙනුවෙන් කිසිකෙනෙක් නැත. කුහකනිච්චකම් - කරන අය උත්තම පදවිවල සිටින බව මෙයින් පෙනේ. සිද්ධාර්ථ උන්නාන්සේත් රතනජෝති නමින්

තවත් ලංකාවේ උන්නාන්සේ කෙනෙකුත් පත්කරණලදී. නමුත් නාන්සේගේ තම මාවිසින් යෝජනාකළ බව දන්නවා ඇති. ආශු තොෂමුඛර්ජී නඩුකාරතුමාට මේ කළ අයුත්ත කියා ලියා ඇරිය යුතුයි. මේ ගැණ කටයුතුකරන්ට මෙහාට පැමිණෙනවාද?

හිතකාමී අනගාරික ධර්මපාල.

තෝරිස්මුදලාලිටද මේ ගැණ කීවා."

(මේ ලිපියේ "කිරිපා උන්නාන්සේ" යයි කියවෙන්නේ මෙහි අන් තැනක පළවෙන චරිතයක් ඇති ඤාණාවරණ මහාස්ථවිර තුමායි "විද්‍යාභූෂණ" යයි කියවෙන්නේ සතිශචන්ද්‍රවිද්‍යාභූෂණ පඬිතුමායි. "සිද්ධාර්ථ උන්නාන්සේ" යයි කියවෙන්නේ එකල එහි ඉගනීමේ යෙදී සිටි රඹුක්වැල්ලේ සිද්ධාර්ථ ස්ථවිරතුමායි.)

1918 වේ ජූලි 16 වෙනිදා එවූ දීර්ඝලිපියක ද මේ ගැන කියමින් "පූර්ණානන්ද-කිරිපා ආදී චට්ටිගම උදවිය අකෘතඥ අසත්පුරුෂ කොටසකි. ලංකාවේ භික්ෂූන් මෙහි නවතිනවාට බොහෝම අසතුටුයි. ප්‍රයෝගකොට නමුත්නාන්සේට නියමවී තිබුන පාලි ආචාර්යධුරය ලබාගත්ත. පූර්ණානන්ද, රාජගුර භගවාන්චන්ද්‍ර, බේනිමාධව මේ තුන්දෙනම පාලිආචාර්යයන් හැටියට පත්කරගණ තිබේ. සිද්ධාර්ථ උන්නාන්සේ ලංකාව වෙනුවෙන් පත්කරගැනීම සන්තුෂ්ටියකි. උන්නාන්සේ මෙදා මැට්රිකිලේෂන් විභාගය ඉතා හොඳින් පාස්කළා" යනාදිය ලියාතිබේ (මෙහි බේනිමාධව යන්නෙන් කියවෙන්නේ පසුකලක මහාචාර්ය බවට පත් බී. ඈම්. බරුවා මහතායි.)

1898 දී මේ රාජගුරු මහාස්ථවිරතුමා සවකීයමූලස්ථානයවූ පොල්වත්තේ අභයාරාමය තමාගේ නිත්‍යවාසස්ථානය කරගත්තේය. 1899 යේ නොවැම්බර්මාසයේදී මෙය ලියන මා පැවිදි කරවිය. 1901 දී සර් ජේම්ස් පීරිස් නයිට්තුමාගේ මැණියන්වූ අපලෝනියා ද සොයිසා පීරිස් මැතිණිය විසින් ගොඩනැංවූ දූත් ගෞතමී විහාරය යි ප්‍රකටව තිබෙන විහාරස්ථානයේ මුල් වස විසීම සඳහා දෙඹන්දූවේ පියරතනතිස්ස නායකමාහිමියන් සමග මාගේ ආචාර්යපාදයාණෝ ද මම ද පැමිණියෙමු. වස් අවසන්වී නායකමාහිමියන් වැඩියපසු ආචාර්යයන්වහන්සේත් මමත් එහි නැවතී සිටියෙමු. මේ කාලයේදී මට අභිධර්මය උගන්වනු කැමතිවූ මුන්වහන්සේ 1903 න් මුලදී මා කැටිව බුරුමරටට ගොස් මා සමගම මෝල්මේයින් නුවරට නුදුරු කොණ්නත්මනා විහාරයේ නැවතී සිටියහ. පෙර එහි වැසපුරුදු ඇති උන්වහන්සේගේ දායකයෝ එකල්හිත් අපට උපස්ථානකළහ.

අවුරුදු දෙකකට පසු මට අජීර්ණ රෝගයක් වැලඳුණ බැවින් එතුමා මා කැටිව ලක්දිවට හැරී ආවේය. එකල මගේ වයස 18 ක් විය. ඒ එද්දී උත්වහන්සේගේ දායකවරු තුන්පිටකයේ මුද්‍රිතපොත් පූජාකළහ.

එසේ ඇවිත් අගගාරාමයෙහි නැවතී සිට අවුරුදු දෙකකට පසු මා කළ ඉගනීම සම්පූර්ණ කරගැනීම සඳහා 1907 නේ මුලදී මම නැවත බුරුමරටට ගියෙමි. ආචාර්යපාදයෝ මෙහිම විසූහ. ඒ ගිය මම අභිධර්මය ඉගෙන ඒ පිළිබඳ පාඩම් විභාග දෙකකින් ද සමත්වී 1911 ගේ අප්‍රේල් මාසේ දී මෙරටට හැරී ආවෙමි. මා මෙහි සිටියදී 1914 දී පමණ මාගේ ආචාර්යවරයා නැවතත් ඉන්දියාවට ගොස් තාගෝර් මහකවියාගේ ශාන්ති නිකේතනයෙහි පාලිය හා බුඩාගම පිළිබඳ ආචාර්යධුරය දැරීය. 1918 දී උඩදුක්වූ ලියුම් ධර්මපාලතුමා එවා තිබෙන්නේ උත්වහන්සේ නිවාඩුවක් ගතකිරීම සඳහා මෙරටට පැමිණ සිටියදී ය. ඒ වර්ෂයේදී මේ ආරාමයේ පැවැත්වූ කොත්පැලඳවීමේ පින්කම සඳහා උත්වහන්සේ මෙහි පැමිණියහ. නැවත ටික කලකින් උත්වහන්සේ ශාන්තිනිකේතනයට වැඩමවා පස් අවුරුද්දක් පමණ ඉගැන්වීම කෙළේය. "ශාන්තිනිකේතනය" විශ්වභාරතී නාමයෙන් විශ්වවිද්‍යාලයක් බවට පමුණුවන ලද්දේ 1919 ජුලිමස දී ය. ඒ ආරම්භය සම්බන්ධයෙන් 'රබීන්ද්‍රනාත් තාගෝර් චරිත යෙහි' මෙසේ දක්වා තිබේ:-

"1919 ජුලි මස 3 වෙනිදින විශ්වභාරතිය පිළිබඳ ප්‍රාථමික වැඩ ආරම්භ වූයේය. රබීන්ද්‍රනාත් තාගෝර් තුමා සහ සී. අෆ්. ඇන්ඩ්‍රූස් මහතාත් වංග සහ ඉංග්‍රීසි සාහිත්‍යයත් ද, මහාස්ථවිර ධර්මාධාරරාජගුරු හිමියෝ බෞද්ධදර්ශනය ද, මහා මහොපාධ්‍යාය විධුශෙඛර භට්ටාචාර්යමහතා සංස්කෘතව්‍යාකරණය ද, ක්ෂිතිමෝ-හන්සේන් මහතා හින්දිසාහිත්‍යය පිළිබඳ මධ්‍යයුගයෙහි ධර්ම ද, රබීන්ද්‍රනාත් තාගෝර් මහතා ජීවවිද්‍යාව ද ඉගැන්වීමෙහි නියුක්ත වූහ. (පණ්ඩිත මඩිතියවෙල සුමංගලස්ථවිරයන් විසින් සිංහලට නැගූ රබීන්ද්‍රනාත් තාගෝර් චරිතයේ 49 වෙනි පිටෙනි.) 1923 දී ලක්දිවට හැරී ආ මුන්වහන්සේ එතැන් සිට අපවත්වෙන තෙක් අගගාරාමයෙහි විසූහ. 1927 දී ඇස්වල ආබාධයකට ශල්‍යකර්මයක් කරවීම සඳහා මද්‍රාසියට ගොස් මාසකීපයකින් හැරී ආහ. ඒ ශල්‍යකර්මයෙන් ද සුවයක් නොවූයෙන් අන්තිම කාලයේදී උත්වහන්සේගේ ඇස්පෙනීම සම්පූර්ණයෙන් නැතිවිය. 78 වර්ෂයක් පමණ ආයු වැලඳූ මෙතුමා 1936 ජනවාරි මස 7 වෙනිදා අගගාරාමයේදී අපවත් විය. ඒ මස 10 වෙනිදා ආදාහනොත්සවය පවත්වන ලදී.

මහාකවි රවීන්ද්‍රනාත් තාගෝර්තුමා මෙතුමාට දී තිබෙන ඉංග්‍රීසි සහතිකයේ අනුවාදය මෙසේයි:-

“ශාන්තිනිකේතන
ජූලි 24, 1924

සද්ධර්ම වාගීශ ශ්‍රී ධර්මාධාරරාජගුරු
මහාස්ථවිරපාදයන් වෙතටයි,

සනීප මදිකම නිසා ඔබවහන්සේ මේ ආශ්‍රමය හැරයන බැවින් 1917 සිට 1922 දක්වා අවුරුදු පහක් මේ ශාස්ත්‍රශාලාවට කළ සේවය ගැන ඔබ සම්බන්ධ කෘතඥතාසහගතවූ අපගේ පිළිගැනීම සටහන් කර තබනු කැමැත්තෙමි. ඔබතුමන් යටතේ හෝ ඔබතුමන් සමග වැඩකළ සියලුදෙන ත්‍රිපිටකයෙහි, විශේෂයෙන් අභිධර්මපිටකයෙහි පවත්නා ඔබගේ පාණ්ඩිත්‍යයත් ගැඹුරු දැනුමත් ගැන හැඟීමක් ඇතිකරගත්හ. කොයිසම් විශ්වවිද්‍යාලයක් වුවත් ඔබ වැනි උගත් ආචාර්යවරයකු ස්වකීයාචාර්ය මණ්ඩලයෙහි සිටිනු දැක්මට ආඩම්බර වෙනවා ඇත. බෞද්ධ විනයනීතිවලට එකඟව දිනපතා ඔබ ගතකළ ජීවිතය අන්‍යයන්ට ආදර්ශයක් වූ බව විශේෂයෙන් කියනු කැමැත්තෙමි.

ඔබගේ අතිවිශ්වස්ත
රවීන්ද්‍රනාත් තාගෝර්”

දැන් කලිකතා විශ්වවිද්‍යාලයේ සංස්කෘත මහාචාර්යපදවිය දරණ විධුශේඛර භට්ටාචාර්ය පඬිතුමා එකල විශ්වභාරතියේ ප්‍රධානාචාර්ය (Principal) විය. එතුමා අභිධර්මය ඉගෙන තිබෙන්නේ මාගේ ආචාර්යවරයාගෙනි. 1923 දී ඒ මහාචාර්යවරයා විසින් මාගේ ආචාර්ය පාදයන්ට එවූ පාළි ලිපියක් මෙසේයි:-

“Santiniketana
Feb 28, 1923

“සද්ධම්මවාගීසං සිරිධම්මාධාරරාජගුරුං මහාථෙරවරියං සාඤ්ජලි බන්ධං පණිපච්ච එසො තදීසො සිස්සො අප්පාතඞ්කං අප්පාබාධං පුච්ඡති; ඉදං ච නිවෙදෙති:-

භන්තෙ ආචරිය, ලද්ධං මයා පෙසිතං සාසනං. ඉදානි පන මෙ අතීව දුක්ඛං යං අස්සමං පච්චාගන්තෙන මයා ආයස්මා එත්ථ න දිට්ඨො. තප්පති මෙ හදයං, අභිධම්මස්ස උග්ගණ්හනත්ථාය ආගතෙසු පි සිස්සෙසු න තං සම්පන්නං, බහූ ඛො සුත්තන්තිකා දිස්සන්ති, අභිධම්මිකා පන න තථා හොන්ති, තෙ හි අතීව දුල්ලභා: විසෙසන

පන ඉධ අම්හාකං ජම්බුදීපෙ, තස්මා එව මය්හං අභිධම්මෙ මහන්තො ආදරො ච අනුරාගො ච, න ජානාමි කදා බො ආයස්මා පුන ඉධ පච්චාගමිස්සතීති.

නිච්චානන්දොපි සීහලදීපෙ ගන්ත්වා භොතො සන්තිකෙ අභිධම්මං පරියාපුණිතුං ඉච්ඡති, තුං පන කාතුං සක්කා වා න වාති කිච්චාධිකාරිනො විමංසිස්සන්ති. යදි සක්කා ගිම්හාකාසෙ සො ගවෙජ්ජිය්‍යසො තතො පුබ්බං.

කච්චි දානි සබ්බථා නිරොගො භවං? ............... සාමණෙරො සරණංකරො දානි කිං කරොති? අපි එතස්ස සබ්බං කුසලං?

සිරිවිධුසෙඛරභට්ටාචරියො."

සිංහලානුවාදය මෙසේයි:-

"සඬර්මවාගීශ ශ්‍රී ධර්මාධාර රාජගුරු මහතෙරුන්ට ඇඳිලි බැඳ වැඳ එතුමාගේ ශිෂ්‍යතමේ නිරෝගිබව විචාරයි, මෙය ද දැනුම්දෙයි:

ආචාර්ය ස්වාමීනි; එවූ ලියුම ලදිමි. (නිවාඩුවෙන් පසු) විද්‍යාලයට පැමිණි මට ඔබවහන්සේ දකින්ට නොලැබීමෙන් මහත් දුකක් උපණි. එයින් මාගේ හෘදය තැවේ. අභිධර්මය ඉගනීමට ආ ශිෂ්‍යයන්ට ද එය සිඩකරගත නොහැකි විය. සූත්‍ර උගත් බොහෝ දෙනෙක් විද්‍යමානවෙති. අභිධර්මය දත්තෝ එසේ සුලභ නොවෙත්. විශෙෂයෙන් අපේ දඹදිව අභිධර්මිකයෝ අතිශයෙන් දුර්ලභවෙති. එහෙයින්ම අභිධර්මය කෙරෙහි මහත් ආදරයක් හා ඇල්මක් මා තුළ පවතී. ඔබවහන්සේ කවදා හැරී එන්නාහුදැයි නොදනිමි.

නිත්‍යානන්ද තෙමේ ලක්දිවට ගොස් ඔබවහන්සේ වෙත අභිධර්මය ඉගනීමට කැමතිවෙයි. එය කරවන්ට හැකිද නොහැකි දැයි මෙහි කාර්‍ය්‍යාධිකාරීහු විමසන්නාහ. හැකිවූවොත් ලබන ග්‍රීෂ්ම නිවාඩුවේදී හෙතෙම එන්නේය, ඉන් පෙර නොඑන්නේය.

ඔබවහන්සේ දැන් සම්පූර්ණයෙන් නිරෝගි වෙත්ද? සරණංකර සාමණෙරතෙම දැන් කුමක් කරයිද? ඔහුගේ වැඩ සාර්ථකද?

විධුශෙඛර භට්ටාචාර්‍ය"

මෙහි "නිත්‍යානන්ද" යයි කියවුනේ දැන් ශාන්තිනිකේතනයේ පාලි-සංස්කෘත මහාචාර්‍ය්‍යධුරය දරන නිත්‍යානන්ද ගොස්වාමි පඬිතුමා ගැනයි. සරණංකර යයි කීවේ උඩකැන්දවෙල සරණංකර ස්ථවිරයන් ගැනයි. මේ ගොස්වාමි පඬිතුමා මාගේ ආචාර්‍ය්‍යපාදයන් අපවත් වූ බව දැනගත්විට මවෙත එවූ ලිපියෙන් ඒ මහතා එතුමන් තුළ පැවැත්වූ ආචාර්ය භක්තිය මැනවින් ප්‍රකට වේ; ඉංග්‍රීසියෙන් ලියා තිබෙන ඒ ලියුමේ සිංහලානුවාදය මෙසේයි:- 6

ශාන්තිනිකේතන්,
බෙංගාලය, ඉන්දියාව
ජනවාරි 16, 1936

අම්බලම්ගොඩ බුද්ධදත්ත සවාමීන් වහන්සේ වෙතටයි-

මාගේ ආචාර්යවරයකු වූ ශ්‍රී ධර්මාධාර මහාසථවිරතුමාගේ අභාවය ගැන අසා මහත් ශොකයට පත්වීමි. අභිධර්මය සම්බන්ධ මූලික කරුණු මට පලමුකොට ඉගැන්වීම ගැන මම එතුමාට කෙතරම් කෘතඥවෙම් ද යන්න වචනවලින් ප්‍රකාශ කිරීම අපහසුය. එතුමාගේ පාමුල වාඩිවූ මට ද, අනික් සියල්ලන්ට ද ඇතිවූයේ සිත්වල නොමැකී පවත්නා, ශ්‍රෙෂ්ඨ ආචාර්යවරයකුගේ මූර්තියක්ය යන හැඟීමකි. මම මුළු හිතින්ම උන්වහන්සේට ආදර ගෞරව කරමි.

මේ වියෝගය නිසා ඇතිවූ මාගේ ගැඹුරු හැඟීම එතුමාගේ සියලු ශිෂ්‍යයන් වෙත දැනුම් දෙනු මැනවි.

ඔබ හා ශෝකවෙන
නිත්‍යානන්ද විනෝද ගොසවාමි,
(පාලි සංස්කෘත මහාචාර්ය.)''

අටවෙනි ඇඩ්වර්ඩ් මහරජු වේල්ස්හි කුමාරයා වශයෙන් 1921 දී ඉන්දියාවට පැමිණි අවස්ථාවේදී එතුමා ඉදිරියෙහි පාලි ගාථා සජ්ඣායන කිරීම සඳහා තෝරාගන්නා ලද්දේ මාගේ ආචාර්ය වරයාය. ඒ ගැන පිලිගැණිමේ කොමිටියේ ලේකම් තැන්පත් මහාරාජ බහදූර් සර් ප්‍රද්‍යොතකුමාර'' තගිර්තුමා විසින් 1921 දෙසැ. 4 දතමින් උන්වහන්සේ වෙත එවූ ලියුමක් මාලඟ තිබේ. පිලිගැනීම පවත්වන ලද්දේ දෙසැම්බර් 27 වෙනි දාය.

## 42. කෘපාචරණ වංගමහාසථවිරතුමා
(ක්‍රි. ව. 1862-1920 පමණ)

ඉන්දියාවේ බෞඬනාමය සම්පූර්ණයෙන් ම වාගේ විනාශවී ගිය නමුත් වංගදේශයේ නැගෙනහිර පෙදෙසෙහිවූ චට්ටිගම පරම්පරා ගත බෞඬයෝ විසූහ. එහි නාමමාත්‍රයෙන් පැවිදිපිරිසක් ද සිටි නමුත් ඒ පිරිස ඉගනීමෙන් හා බෞඬශ්‍රමණයන්ගේ සිරිත්විරිත් වලින් පිරිහී සිටියේය. මෙසේ මහත් අඳුරු කාලපරිච්ඡේදයක් පවත්නා කල්හි ඒ පෙදෙසෙහි උපන් වීරපුරුෂයෙක් අරකන්රටට ගොස් පැවිදිවී බෞඬාගම නැවත දඹදිව පතුරුවන අදහසින් කල්කටා නගරයට පැමිණ 1892 දී බෞඬධර්මාංකුරසභා නමැති සභාවක් එනුවර විසූ චට්ටිග්‍රාමික බෞඬයන්ගේ මූලිකත්වයෙන්

පිහිටුවාගත්තේය. අනගාරික ධර්මපාලතුමා එමනුවරට මුලින්ම යනවිට එතුමාට නවාතැන් දීමට හෝ උපකාර කිරීමට සැරසී සිටියෝ මේ බෞද්ධයෝය.

නොයෙක් බාධා මධ්‍යයෙහි ක්‍රමයෙන් මේ සමිතිය දියුණුවූ බැවින් මේ කෘපාචරණ මහාස්ථවිරතුමා කලිකතාවේ බෞද්ධ විහාරයක් ගොඩනංවනු කැමතිව නොයෙක් රටවල ඇවිද රු. විසිදහසක් එක්කොට ගෙන කල්කටාවේ බෝ බැසාර්හි බෞද්ධ ධර්මාංකුර විහාර නමැති දඟීනිය බෞද්ධාරාමයක් පිහිටුවිය. වර්තමාන යුගයේදී කල්කටා නුවර ඇතිවූ ප්‍රථම බෞද්ධවිහාරය මෙයයි. ධර්මපාලතුමන් විසින් "ධර්මරාජික විහාරය" එහි පිහිටුවන්ට පෙර දඹදිව වන්දනාවට ගිය බෞද්ධයන්ට හැමලෙසින්ම උපකාරවූයේ මේ ධර්මාංකුර විහාරයයි. වන්දනාකාරයන්ගේ වැඩිපහසුව සඳහා 1926 යේදී මෙහි උඩුමහල් ගොඩනැඟිල්ලක් තනනලදී. ඒ වර්ෂයේදීම කැසිම්බසාර්හි මණීන්ද්‍රචන්ද්‍රනන්දි මහාරාජා විසින් පරිත්‍යාගකළ බිම්කොටසෙහි මේ විහාරයේ සිට බෝබැසාර් වීථිය දක්වා අලුත් වීථියක් විවෘතකොට එයට Buddhist Temple Lane (බෞද්ධාශ්‍රමවීථිය) යි නම් තබනලදී.

බෞද්ධධර්මාංකුර සභාව පිහිටෙව් වර්ෂයේදී මේ පොත ලියන මාගේ ආචාර්යවරයාවූ ශ්‍රීධර්මාධාරරාජගුරු මහාස්ථවිරතුමා ද කල්කටාවට පැමිණ සිටියේය. මුලදීම ධර්මාංකුරවිහාරයෙහි පාලි ඉගැන්වීම කෙළේ මුන්වහන්සේය ඒ කාලයේදී මුන්වහන්සේ ගෙන් පාලි ඉගෙනගත් ශිෂ්‍යයන් අතුරෙන් ඒ සමිතියේ ලේකම් තැනවූ බාබු වෙණිමාධව බරුවා මහතාට එංගලන්තයට ගොස් පාලිසාහිත්‍යය ඉගනීමේ ශිෂ්‍යත්වයක් ලැබුණි. ඒ ශිෂ්‍යත්වය මේ සමිතියේම ඉල්ලීම ලෙස බෙංගාලේ ආණ්ඩුව විසින් පිහිටුවනලද්දකි. එංගලන්තයට ගොස් බෞද්ධ සාහිත්‍යය ඉගෙන ග්‍රන්ථසම්පාදනයෙන් ඩී. ලිට් උපාධිය ලැබූ මේ මහතා එංගලන්තයෙන් ආපසු කලිකතා විශ්වවිද්‍යාලයේ පාලිභාෂාව හා බෞද්ධසාහිත්‍යය පිළිබඳ කොටසේ- මහාචාර්යවරයාව පත්විය. ඒ විශ්වවිද්‍යාලයේ බෞද්ධපීඨයක් ඇතිකර වීමට සර් ආශුතෝෂ් මුඛර්ජි මහතාණන් පෙලඹවූවෝ නම් කෘපාචරණ මහාස්ථවිර, මාගේ ආචාර්යතුමා, ශ්‍රීමත් ධර්මපාලතුමා යන උතුමෝය මින් අවුරුදු තිපයකට උඩදී ලක්දිවට ඇවිත් මහාචාර්ය බී ඇම්. බරුවා නමින් ඇල්පිතා රත්නායක අරමුදලේ බෞද්ධධර්ම කථාව පැවැත්වූයේ මේකී තරුණයාය.

බෞද්ධ ධර්මාංකුරසභාවේ ආරක්ෂකයා බුරුමරට ආණ්ඩුකාරයාව සිටි සර් හාකට් බට්ලර් (කේ.සී.ඇස්.අයි; සී.ඇස්.ඊ; අයි.සී.ඇස්.)

මහතා විය ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරයෝ ද නානා උපාධිධාරීහු ද මෙහි සාමාජිකයන් අතර වූහ. සමිතිය විසින් බෞද්ධ ධර්මප්‍රචාරය සඳහා ජගජ්ජ්‍යෝති නමැති මාසික වංග සඟරාවක් පවත්වනුලැබේ. කොමිලයේ උගන්වන පාඨශාලාදෙකක් පිහිටුවන ලදී. එසේම සමිතිය විසින් සැවැත්නුවර ජේතවනාරාමය දකින්ට යන වන්දනාකාරයන්ට විශ්‍රාමශාලාවක් සෑදවීම පිණිස බල්රාම්පූර්හි මහාරාජාවූ භගවතී ගංගාප්‍රසාද්සිංහ මහතාගෙන් ඉඩමක් ලබාගෙන තිබේ. චට්ටිග්‍රාමයේ අනාත් බසාර් බෞද්ධාශ්‍රමය අසල විශ්‍රාමශාලාවක් ගොඩනංවා තිබේ. යථෝක්ත ආණ්ඩුකාරතුමාගේ ආධාරයෙන් ලක්නව්නුවර ඉඩමක් ලබාගෙන ආරාමයක් ගොඩනගා භික්ෂුනමක් නවත්වා තිබේ. කලිකතාවිශ්වවිද්‍යාලයට පැමිණෙන බෞද්ධ ශිෂ්‍යයන් උදෙසා පිහිටෙව් බෞද්ධ ශිෂ්‍ය නිවාසයේ ආරක්ෂක ධුරය මේ සමිතියට පවරනලදින් කලක් දෙඩන්දූවේ ශෛලබිම්බාරාමයේ නැවතී ඉගනීම කළ ආශීලංකාරභික්ෂු තෙම එහි භාරකාරයාසේ පත්කරනලදී

බුද්ධාගම ගැන ඉන්දියාවේ මෙතරම් ප්‍රබෝධයක් ඇතිකළ කෘපාවරණමහාසථවිරතුමන් සිහිපත් කිරීම යුතු බැවින් නාතානූණ වේදීත් විසින් එතුමාගේ රූපයක් ඉතාලියේදී මාබල්ගලෙන් කප්පවා ගෙනැවිත් ධර්මාංකුරවිහාරයේ මහගර මන්දිරයක පිහිටුවනලදී. 1917 තේ පෙබරවාරි 28 වෙනිදා බෙංගාලේ ආණ්ඩුකාරධුරය ඉසුලූ කාර්මයිකල් සාමිවරයා මේ විහාරය බැලීමට ගියේය. ඒ අවස්ථාවේ දී සර් මණීන්ද්‍ර චන්ද්‍රනන්දි මහාරාජාතුමා මේ සමිතිය ඉන්දියාණ්ඩුවෙන් ලබාගත් (තක්සලාවෙන් ලැබුණු) සර්වඥ ධාතු නිදන්කොට චෛත්‍යයක් බැඳීමට යෝග්‍ය භූමියක් සමිතියට පරිත්‍යාග කෙළේය.

## 43. මහගොඩ ඥානේශ්වර නායකමාහිමියෝ.

(ක්‍රි. ව. 1864-1922)

හික්කඩුවේ ශ්‍රීසුමංගල නායකමාහිමියන්ගේ ඇවෑමෙන් පුරප්පාඩුවූ විද්‍යෝදය පරිවෙණාධිපති ධුරයට පත්වූයේ ඥානේශ්වර නායකමාහිමියෝය. බෙන්තර වලල්ලාවිටිකෝරළයේ මහගොඩ නම් ගමේදී ක්‍රි ව. 1864 මැයි 17 වෙනිදා උපන් මේතුමාගේ පියා ''දොන් ආබ්‍රහම් ගුණවර්ධන වික්‍රමාරච්චි'' වෙදමහතාය. භාග්‍යසම්පන්නවූ මේ ළදරුවා ඔහුගේ මාමාකෙනෙකු විසින් බෙන්තර සිය නිවසට ගෙනැවිත් නවත්වාගත්තාලදී ඒ මාමා ඉංග්‍රීසි උගතකු වූ බැවින් මේ බාලයාටත් ඉංග්‍රීසි උගන්වනු කැමති වූ නමුත් පළමුවෙන් සිංහල ඉගැන්වියයුතුයයි වටහාගත් [illegible]

අකුරුකරවන වයස පැමිණිවිට බෙන්තර වනවාස මහාවිහාරයේ වැඩවිසූ යාත්‍රාමුල්ලේ ධම්මාරාම මහාස්ථවිරතුමන් වෙත පමුණුවා අතපොත් තැබ්බවිය. ඉගනීමෙහි දක්‍ෂ වූ මේ කුමරතෙමේ එක් ශ්ලෝකයක් දෙවරක් කියවූ පමණින් පාඩම් කරගත හැක්කෙක් විය.

මෙකුමරු පැවිදිකරවීම මුලසිටම මෑණියන්ගේ අදහස වූ නමුත් බෙන්තර විසූ මාමා එයට විරුද්ධ විය. වැඩිකල් නොගොස් ඒ මාමා පරලෝසැපත්වූ බැවින් මෑණියන්ගේ අදහසට ඉඩ ලැබුණි. වනවාස විහාරයෙහි විසූ කෝම්මල ඉන්දසාර මහාස්ථවිරතුමා මෙකුමරුට ඥාතිසම්බන්ධය ඇත්තෙක් විය. අලුත්ගම කත්දේ විහාරාධිපතිව වැඩවිසූ මහගොඩ නායක ස්ථවිරතුමා ද මෙකුමරුන්ගේ සීයා කෙනෙක් විය. මෙසේ ඥාතිසම්බන්ධය ඇති ස්ථවිර දෙනමක් විසූනමුත් ඒ කාලයතුළදී කාලක්‍රියා කළ මෑණියන්ගේ කැමැත්ත තිබුණ පරිදි මෙකුමරු පැවිදිකිරීම සඳහා කෝම්මල මහාස්ථවිරතුමාට බාරදෙනලදී. අටහැවිරිදි වයසේදී මෙතුමාගේ පැවිදිවීම සිදුවිය

පැවිදිවූ තැන් පටන් ස්වකීයාචාර්යයන් වෙතින් ඉගෙණීම් කළ ඤාණිස්සර සාමණේරතෙමේ නොබෝ කලකදීම ව්‍යක්තධර්මකථිකයෙක් විය. වරක් එතුමා බණකියනු අසාසිටි වලල්ලාවිටි කෝරළය පාලනයකළ ආර්තර් ජයවර්ධන මුදලිතුමා අතිශයෙන් පැහැදී ඒ සාමණේරයන්ගේ දියුණුවට උවමනා හැමඋපකාරයක්ම කරනබවට පොරොන්දුවිය. ඉන්පසු මේ සාමණේරයන් විද්‍යෝදය පිරිවෙණට ඇරීම යුතුයයි ඒ මුදලිතුමා යෝජනා කෙළේය. ඒ යෝජනාව අනුව ක්‍රි. ව. 1883 මැයි මාසයේදී ආචාර්යවරයා ද ජයවර්ධන මුදලිතුමා ද ඒ. ආර්. ගුණරත්න මුදලිතුමා ද මේ හෙරණපාණන් කැඳවාගෙනවුත් විද්‍යෝදය පරිවෙණාධිපතීන් වහන්සේට බාරකළහ. එයින් තුන්වර්ෂයකට පසු කෝම්මල මහාස්ථවිරතුමා අපවත් විය. කලක් ධර්මශාස්ත්‍ර ඉගෙන ස්වකීය වනවාස විහාරයට හැරිගොස් ටිකකලක් එහි වැස වෑවල ශංඛාරාමයෙහි වර්ෂතුනක් පමණ විසීය

මෙතුමාට උපසම්පදාව ලැබීමට යෝග්‍යවයස පැමිණිවිට ස්වකීයාචාර්යවරයා නැති බැවින් විද්‍යෝදය පිරිවෙණේ අභිවෘද්ධිය පතන බටුවන්තුඩාවේ පඬිතුමා, ධර්මගුණවර්ධන මුහන්දිරම්තුමා, හේවාවිතාරණ මුදලිතුමා ආදීන්ගේ ද මාබොටුවන සිද්ධාර්ථ, වේරගොඩ බුද්ධරක්ඛිත ආදි මහාස්ථවිරයන්ගේ ද මෙහෙයීම ලෙස ශ්‍රී සුමංගල මාහිමියන් වහන්සේ හා වලානේ ධම්මානන්ද නායකස්ථවිරපාදයන් වහන්සේ ආචාර්යවරයන්කොට 1889 යේ මැයි 20 දින මේ ඤාණිස්සරයන් තෙමේ මල්වතුවිහාරයේදී උපසම්පදාවට පමුණුවනලදී.

1893 ජනවාරි මාසයේදී මූන්වහන්සේ විද්‍යෝදය පිරිවෙනේ උපාචාර්ය ධුරයකට පත්කරනලදහ. 1899යේදී උපප්‍රධානාචාර්ය ධුරයකට පත්වූහ. සියම් මහරජතුමන් ලක්දිවට පැමිණි අවස්ථාවේදී ලක්දිව බෞද්ධයන්ගේ ආශංසනපත්‍රය රජු ඉදිරියේදී කියවීමට සුදුස්සා මෙතුමා යයි තෝරාගන්නාලදී. මෙතුමා පාලිභාෂාවෙන් ව්‍යක්තකථාවක් කොට ඒ පත්‍රය කියවීය. රජතුමා ඉතා සතුටුව එකෙණෙහිම එතුමාට ප්‍රශංසා කෙළේය. විද්‍යෝදය පිරිවෙන්හි පාලි ඉගනීමේ යෙදී සිටි සතීශචන්ද්‍රවිද්‍යාභූෂණ පඬිතුමා මෙතුමන් කෙරෙහි පැහැදී පහත සඳහන් ශ්ලෝකය රචනා කෙළේය:-

"ප්‍රඥන්විතං හතකදග්‍රහමග්‍ර්‍යවිතතං
ඥනෙශ්වරාරුණසමං ග්‍ර්‍යවලම්බ්‍ය .සූනම්
ශ්‍රීමාන් සුමංගලරවිඃ පරිවෙණයාතං
සම්‍යක් ප්‍රවාද්‍යති ජාඩ්‍යතමොපහාරී"

මහනුවර මල්වතු විහාරයේ සංඝසභාව 1910යේදී සබරගමු පළාතේ නායකපදවිය මෙතුමන්ට පැවරීය. ශ්‍රී සුමංගල මාහිමියන්ගේ ඇවෑමෙන් 1911යේදී විද්‍යෝදය පිරිවෙනේ ආධිපත්‍යය මූන්වහන්සේට පවරනලදී. ඒ කාලයේදී පිරිවෙනේ ශිෂ්‍යසංඛ්‍යාව දෙසියයක් පමණවූ නමුත් මෙතුමාගේ කාලයේදී ඒ සංඛ්‍යාව හයසියයක් පමණ විය. ඉංග්‍රීසිය ද දත සිටි මූන්වහන්සේ එහි ප්‍රයෝජනය සලකා පිරිවෙන්හි ඉංග්‍රීසි ඉගැන්වීම ද ආරම්භ කරවූහ. මෙතුමා නිඝණ්ඩු-සමාසනාඛ්‍යාත වර්ණනා යන පොත් දෙකට සන්න ලීවා පමණක් නොව දම්පියාඅටුවා ආදී බොහෝ පොත්ශුද්ධකොට ප්‍රචාරය කරවිය. හේවාවිතාරණ පොත් ශුද්ධියේදී මූලස්ථානය ගෙන ක්‍රියාකළේ මූන්වහන්සේය.

කලක සිට බහුමූත්‍ර රෝගයෙන් පෙළෙමින් සිටි මූන්වහන්සේගේ ඒ රෝගය 1922 අගෝස්තු මාසයේදී බලවත්විය. දක්ෂ වෛද්‍යයන් විසින් නොයෙක් ප්‍රතිකාර කරනලද නමුත් එය සුව කරන්නට නොහැකිවූ බැවින් 1922 නොවැම්බර් 6 වෙනිද රාත්‍රිකාලයේදී මූන්වහන්සේ අපවත්වූහ.

## 44. විද්‍යෝදය පරිවෙණාධිපතිව වැඩවිසූ කහවේ රතනසාර නායකමාහිමිතුමා.

(ක්‍රි ව 1872-1936)

මූන්වහන්සේ දකුණුලක හික්කඩුව-තෙල්වත්ත යන ප්‍රකට ගම්දෙකට මදක් උතුරෙන් පිහිටි කහව නම් ගමේදී ක්‍රි. ව. 1872 සැප්තැම්බර් 2 වෙනිද උත්පත්තිය ලැබූහ. පුදුමයකට මෙන

විද්‍යෝදය පිරිවෙණ ආරම්භකර තිබෙන්නේ මුන්වහන්සේ උපන් මේ වර්ෂයේදී බැවින් පිරිවෙණේ වයසත් මුන්වහන්සේගේ වයසත් එකසමානය. එතුමාගේ පියා දොන් "දියෝනිස් නාගම්පේනායක ලොකුමහත්මයා" ය. මෙතුමන්ගේ මෑණියෝ මෙතුමා හත්හැවිරිදි කල්හි පරලොව ගතවිය. ඒ අවස්ථාවේදී මෑණියෝ පුත්‍රයා ලඟට කැඳවා "මට නිවන්සැප ලැබීම පිණිස ඔබ මහණවිය-යුතුය"යි කියා නිසිවයස පැමිණිවිට පුත්‍රයා පැවිදිකරනසේ සිය සැමියාට තරයේම කීහ.

මෑණියන්ගේ ඇවෑමෙන් මේ බාලයාගේ මාතෘස්ථානයට පැමිණියේ දෙටු සොහොයුරියයි. බද්දේගම "කාවල්ල" යයි ප්‍රකට පෙදෙසේ විසූ "බටුවත්තේගමගෙයි ගොතෝපිස් ද සිල්වා" මහතා සමග සරණ බන්ධනයට පත්වූ ඒ කාන්තාව පස්හැවිරිදි මලනුවන් කැටුව බද්දේගම පදිංචියට ගියාය. එහි ගිය බොහෝ කලකින් මේ බාලයාට අකුරු උගැන්වීම පිණිස බද්දේගම පිහිටි එංගලන්ත සභාවේ පාඨශාලාවට බාරදෙනලදී. ඉගනීමේ දක්‍ෂතාවය නිසා ආචාර්යයන්ගේ ද එකල එහි දේවස්ථානය බාරව සිටි ජෝන් බේල්හම් දේවගැතිතුමාගේ ද කරුණාව දිනාගත් මේ බාලයා එකල පවා අන්‍යයන් විසින් ආදර්ශයට ගතයුතු චරිත ඇත්තෙක් විය.

දසහැවිරිදි කල්හි මොහුට වැලඳුණු රෝගයක් නිසා ඉගනීම නැවැත්වීමට සිදුවිය. ඒ කාලයේදී තැම්බන ගමට ගොස් වසන්නේ පේරගොඩ සුභද්‍රාරාමාධිපතිව වැඩවිසූ මාපුළුවානෝ ශ්‍රී සිද්ධාර්ථ මහාස්ථවිරතුමන් ආශ්‍රයකරන්නට පටන්ගත්තේය. මේ බාලයා ඉගනීමේ දක්‍ෂයෙක්, විනීත පැවතුම් ඇත්තෙකැයි දැනගත් මහාස්ථවිරතුමා සවකීය මිත්‍ර ගාමිණිගම් හැඩිදෙමලකන්දේ විහාරාධිපතිව සිටි කෝරළේගොඩ උන්නාන්සේ මහාස්ථවිරතුමාට මේ කාරණය දැන්විය. ඒ ස්ථවිරතුමා ලමයා පැවිදිකරන්නට කැමතිවූවිට මාපුළුවානෝ ස්ථවිරතුමා පියා හමුවීමට ඇවිත් මේ ලමයා පැවිදිකරගැනීමට ඉල්විය. පියා ඊට නොකැමැති විය. නමුත් ස්ථවිරතුමා යනාගොස් කරුණු කියා මෑණියන්ගේ මරණමංචකයේ කීමද සිහිපත්කොට පියාණන් ඒ සඳහා කැමතිකරවාගත්තේය. ඉක්බිති ශුභදිනයකදී මාපුළුවානෝ මහාස්ථවිරතුමා පියාණන් හා ලමයා සමග ගණේගමට ගොස් ලමයා කෝරළේගොඩ මහාස්ථවිරතුමාට බාරකරවිය.

ලමයා පැවිදිකරවීමට උත්සාහවත් වූ ඒ ස්ථවිරතුමන් ඔහුට සාමණේර බණදහම් ඇදීම උගන්වමින් වසනාතර සාරමසකට පසු එතුමා හදිසියෙන් අපවත්විය. ඉක්බිති ඒ මහාස්ථවිරතුමාගේ එකම ශිෂ්‍යයාවූ පේරගොඩ සුමංගල ස්ථවිරතුමා මේ ලමයාට

ඉගැන්වීම නොකඩවා කරගෙන ගොස් කෝරළේගොඩ මහාස්ථවිර තුමන් අපවත්වී වර්ෂයක් පිරුණුකල 1889 යේ ඇසළ පුරපසළොස්වක්දා වේරගොඩ ශ්‍රී සුමංගල බුද්ධරක්ෂිත නායකස්වාමිපාදයන් උපාධ්‍යායකොට මාබොටුවන සිද්ධාර්ථ මහාස්ථවිරපාදයන් කර්මාචාර්ය කොට චාර්ලස් විජේනායක නමැති මේ කුලදරුවා පැවිදිකර විය.

පැවිදිවීමේදී රතනසාර යන නම ලැබූ මේ සාමණේරතෙමේ ටිකකලක් ස්වකීයාචාර්ය සෝණුත්තර මහාස්ථවිරයන් වෙතින්ම ඉගනීම කෙළේය. මින්පසු වැඩිදුර ඉගනීම සඳහා මේ සාමණේර-යන් වේරගොඩ ක්ෂේත්‍රාරාමයෙහි නවත්වා තොටගමුවිහාරයේ වැඩ විසූ මකලාන්ඩුවේ රාහුල මේධංකර නායකස්ථවිරතුමන් වෙතින් ධර්මශාස්ත්‍ර ඉගනීමට යැවිය අවුරුද්දක් පමණ එහි ඉගනීම කළ පසු මකලාන්ඩුවේ නායකස්ථවිරතුමා සාමණේරනමගේ තත්වය දැන ගෙන එතුමන් විද්‍යෝදය පිරිවෙනේ ඉගනීම පිණිස යැවිය යුතුයයි ආචාර්ය ස්ථවිතුරමාට දැනුම්දුණි.

කෝරළේගොඩ ස්ථවිරතුමන් අපවත්වී වර්ෂයක් පිරීමේදී පැවැත්වූ පුණ්‍යෝත්සවයට පැමිණීමට හික්කඩුවේ නායකමාහිමි තුමන්ට ද ආරාධනාකොට තිබුණ නමුත් කෘත්‍යබාහුල්‍යය නිසා එතුමන්ට එහි පැමිණිය නොහැකිවීය. ඉන්පසු නායකමාහිමියන් ගාල්ලේ බෝගහගොඩැල්ලේ විහාරයට වැඩමවා සිටිනබව දැන ගත් සෝණුත්තර ස්ථවිරතුමා උන්වහන්සේ හමුවීමට පැමිණිවිට නායකස්වාමීන්ද්‍රයෝ තමන්ට ඒ පින්කමට පැමිණීමට නොහැකිවීම ගැන කණගාටුව ප්‍රකාශකොට ඒ ගැන තමා ණයකාරයෙක්ව සිටින බව කීහ. එවිට එතැන වැඩසිටි වේරගොඩ බුද්ධරක්ෂිත නායකහිමියෝ "එසේනම් ඒ ණයෙන් නිදහස්වීම සඳහා කෝරළේ ගොඩ හාමුදුරුවන්ගේ මුනුබුරා වන මේ රතනසාර කුඩානම බාර ගෙන හොඳින් උගන්වා දියයුතුය"යි කීහ. හික්කඩුවේ නායක මාහිමියෝ ඉතා යහපතැයි කියා ඒ ශිෂ්‍යයා බාරගෙන උගන්වන්ට කැමති බව කීහ.

ඒ අනුදැනීම පරිදි සෝණුත්තර මහාස්ථවිරතුමා 1891 මැයි මස 1 වෙනිදින සාමණේරයන් විද්‍යෝදය පිරිවෙණට කැඳවාගෙන ගොස් නායකමාහිමියන්ට බාරකෙළේය. මුන්වහන්සේ ඒ ඒ පන්තිවල ප්‍රමුඛස්ථානයට පත්වෙමින් ඉගනීම කරමින් දිනාගත් තෑගිද බොහෝවූහ. මෙසේ සාමණේර කාලයේදීම උගතකුසේ ප්‍රකටවූ මුන්වහන්සේගේ උපසම්පදාව 1897 වෙසක් පසළොස්වක්දා මහනුවරදී සිදුවිය. මේ සඳහා ශ්‍රී සුමංගල නායකමාහිමියන් ඇතුළු තිස්නමක් පමණ මහාස්ථවිරවරු ගාලු-කොළඹ දෙපළාතෙන්

මහනුවරට පැමිණියහ. තිබ්බොටුවාවේ ශ්‍රී සුමංගල මහානායක මාහිමියන් ප්‍රමුඛ සංඝසභාවෙන් මුන්වහන්සේ උපසම්පදාව ලැබූ අවස්ථාවේදී හික්කඩුවේ නායකමාහිමියන් කථාවක් පවත්වා තමන්වහන්සේගේ ඇවෑමෙන් මේ ශිෂ්‍යතමට සංඝසභාවෙන් ලැබියයුතු සැලකිලි ලැබෙනවා ඇතැයි බලාපොරොත්තු වන බව ප්‍රකාශකොළේය.

1901දී පිරිවෙණේ ඉගනීම අවසන් කළ රතනසාර යතිතුමා හික්කඩුවේ නායකමාහිමියන් විසින් ඒ පිරිවෙණේ උපාචාර්ය ධුරයකට පත්කරනලදි. අවුරුදු දහයක් උපාචාර්ය පදවියේ සිටි මුන්වහන්සේ නායකමාහිමියන්ගේ ඇවෑමෙන් පසු උපප්‍රධානාචාර්ය පදවියට පත්විය. ශ්‍රී ඥානෙශ්වර නායකමාහිමියෝ එකල පරිවෙණාධිපති වූහ. 1922 දී ඒ මාහිමියන් අපවත්වූවිට සම්පණස්වියෙහි සිටි රතනසාර මහාස්ථවිරතුමා විද්‍යෝදය පරිවෙණාධිපතිත්වයට පත්විය. ඒ බව දැනගත් අමුණුගම රාජගුරු ශ්‍රී නිවාස ප්‍රියදර්ශි මහා නායකමහාස්වාමීන්වහන්සේ ප්‍රමුඛ කාරක සංඝසභාව මුන්වහන්සේට කොළඹ නවකෝරළේ ප්‍රධාන නායකපදවිය පත්කොට දන්වා එවීය. ඒ සන්නස්පත්‍රය දීමේදී "ශ්‍රී සුමංගල" යන උපාධිය ද මෙතුමන්ට දෙනලදී

මුන්වහන්සේගේ කාලයේදී පිරිවෙණේ දියුණුව අධිකවිය. ශිෂ්‍යසංඛ්‍යාව අධික බැවින් විශාල පිරිවෙන් ශාලාවක් ඕනෑවිය. මුන්වහන්සේගේ උත්සාහයෙන් විශාල ශාලාවක් ගොඩනැංවීම සඳහා රු. තිස්දහසක් පමණ ලබාදෙනලදින් විද්‍යාධාරසභාව දැන් පිරිවෙණට අලංකාරයක්ව තිබෙන ශ්‍රී සුමංගල ධර්මශාලාව ගොඩනැංවීය. එය 1926දී සර් හියුක්ලිෆර්ඩ් ලංකේශ්වරයන් ලවා විවෘතකරවනලදී. එසේම ශිෂ්‍යනිවාසත් වැඩිපුර ඕනෑවූයෙන් මුන්වහන්සේගේ මෙහෙයීම නිසා සෙනසුන් 51 කින් යුත් ශිෂ්‍යනිවාස තුනක් මහජනයාගේ ආධාරයෙන් ගොඩනංවනලදී. අලුත් ක්‍රමයේ වැසිකිළි පෙළක් ද සාදවනලදී.

ආචාර්යසංඛ්‍යාව අධිකවූ බැවින් ආචාර්යනිවාස ද වැඩිපුර ඕනෑවූයෙන් ඒ සඳහා ගොඩනැගිලි කීපයක් ද සාදවා පෙර පැවති දානශාලාව ද විශාල කරවනලදී. නානගෙවල් තුනක් ද සාදවනලදී. ධර්මශාලාවේ උඩුමාල පාතමාල යන දෙකේම ඉගැන්වීම කළ නමුත් එයද ප්‍රමාණවත් නොවූයෙන් ආරාමයේ නිරිතකොණේ පිහිටි දෙමහල් ශ්‍රී සුමංගලානුස්මරණ ශාලාව ගොඩනැංවීමට 1934 දී අත්තිවාරම් දමනලදී. බොධිප්‍රාකාරය දුර්වලව තිබුණ බැවින් මුන්වහන්සේ විසින් එය විශාලකොට අලුතෙන් බන්දවන ලදී.

බරණැස ඉසිපතනාරාමයේ ගොඩනැගූ මූලගන්ධකුටි විහාරය විවෘතකරනලද්දේත් එහි සීමාබන්ධනය කරනලද්දේත් මූන්වහන්සේගේ ප්‍රධානත්වයෙනි. මූන්වහන්සේගෙන් උගත් ශිෂ්‍යයන් අතරෙහි පරිවෙණාධිපති තෙරවරුම පණස්දෙනෙක් වෙති. පණ්ඩිත දෙඹගස්පේ ප්‍රඥාසාර නායකස්ථවිරතුමා ද දෙවුන්දර වාචිස්සර ස්ථවිරතුමා ද මූන්වහන්සේ වෙතම පැවිදිව උපසම්පදාව ලැබූ ශිෂ්‍යයෝ වෙති.

මූන්වහන්සේ කළ ශතායෙක් ග්‍රන්ථයන් අතුරෙන් සාරාර්ථ චන්ද්‍රිකා නමැති සාරස්වතව්‍යාඛ්‍යානය ඉතා උසස් තැනක් ගනී. සංස්කෘත ප්‍රවේශය හා එහි විස්තරය ද උසස් කෘතියකි "සිදත් සඟරා භාවසන්නය," "සැලලිහිණිසන්දේශ සාරාර්ථව්‍යාඛ්‍යාව," "ලඝු සංස්කෘත ප්‍රවේශය" යන ග්‍රන්ථ ද මූන්වහන්සේගේ කෘතීන් අතරෙහි වෙති. හේවාවිතාරණ මහතුන්ගේ ත්‍රිපිටක මුද්‍රණ සභාවේ ප්‍රධානත්වය මූන්වහන්සේ පරිවෙණාධිපතිවූ කාලයේ පටන් ඉසුළූහ. ඒ පොත්වල අවසාන ශුද්ධිපත්‍ර බැලීම කරනලද්දේ මූන්වහන්සේ විසිනි. ධම්මපදට්ඨකථාව මූන්වහන්සේ විසින්ම සංශෝධිතවිය.

1925 දී පිරිවෙණේ අධ්‍යාපනක්‍රමය සකස්කොට "ප්‍රථම අධ්‍යාපන විද්‍යාපීඨය," "උපරිම අධ්‍යාපන විද්‍යාපීඨය" යි දෙකොටසකට බෙදනලදී. උපරිමපීඨයෙහි ප්‍රථම - මධ්‍යම - අවසාන වශයෙන් පරීක්ෂණ තුනක් පවත්වනයේ පිළිවෙළ කළහ. මූන්වහන්සේ අපවත්වීමට පෙර වර්ෂයෙහි ශිෂ්‍යයෝ 863 දෙනෙක් මෙහි ඉගනීම ලැබූහ. 1935 යේදී මූන්වහන්සේගේ මෙහෙයීමෙන් ආදිශිෂ්‍ය සංගමයක් පිහිටුවනලදී.

මෙසේ ලෝකශාසනෝපකාරීව ක්‍රියාකළ මූන්වහන්සේ 1936 යේ පෙබරවාරි 21 වෙනිදා හෘදයරෝගයකින් පීඩිතවූහ. ඉංග්‍රීසි සිංහල ප්‍රතිකාර කරනලදින් මාර්තු 3 වෙනිදා සම්පූර්ණයෙන් මෙන් සුවය ලැබීයයි වෛද්‍යවාදීයන් ප්‍රකාශ කළ නමුත් එදා රාත්‍රී රෝගය නැවත උත්සන්නවූයෙන් මූන්වහන්සේගේ අපවත්වීම හදිස්සියෙන්ම සිදුවිය.

## 45. ලුණුපොකුණේ ශ්‍රී ධර්මානන්ද නායක මාහිමියෝ.

(ක්‍රි. ව. 1869-1945)

විද්‍යාලංකාර මහාවිද්‍යාලය ගොඩනැඟිලිවලින් හා අධික ශිෂ්‍ය සංඛ්‍යාවකින් පමණක් නොව ස්වකීය ගුණමහිමයෙන් බැබලෙව් කරුණාපිණ්ඩායමාන මේ නායකහිමිතුමා ක්‍රි. ව. 1869 යේ

සැප්තැම්බර් 13 වෙනිදින උතුරු කොළඹ නගරයට අයත් ලුණුපොකුණේදී උපන්නේය "දොන් ඒබ්‍රහම් ඇලෙක්සැන්ඩර් තිලකරත්න" වෙදමහතා මෙතුමාගේ පියා විය. "පොල්වත්තගේ කාච්චිනා පිස්කල් පෙරේරා" හාමිනේ මව විය. එකල කොළඹ ක්‍රිස්තියානි බලකොටුවක් විය. "බෞද්ධාධ්‍යාපනය" යන වචනය වත් එහි අසන්ට නොලැබුණි. මේ බාලයා එකල ලුණුපොකුණේ ගණේගොඩැල්ලේ පිහිටි කතෝලික පාඨශාලාවට ඉගනීම පිණිස යවනලදී මේ කාලයේදී මොහොට්ටිවත්තේ ගුණානන්ද හිමියෝ දීපදුත්තමාරාමයෙහි වසමින් පරවාදීමර්දනයෙහි යෙදී සිටියහ. දිනක් උන්වහන්සේ අග්‍රශ්‍රාවක චරිතය මාතෘකාකොට දේශනාවක් පැවැත්විය. දෙළොස්වියේ සිටි මේ බාලයා ද ඒ දේශනාව අසමින් සිටි පිරිස අතරේ විය.

සැරියුත් මහතෙරුන් පන්සියක් ජාතියකදී පැවිදි වූ බව ඇසූ මේ බාලයා තෙමේත් පැවිදිවෙනු කැමතිව ඒ අවස්ථාවේදීම මහණවෙන්ට උත්සාහ කළ නමුත් නෑයන්ගේ නොකැමැත්ත නිසා එය කරගත නොහැකි විය. මේ කාලයේදී බණ පිරිත් පින්කම් ආදිය සඳහා කොටහේනේ විහාරයට පැමිණෙන ස්ථවිරනමක් විය. එතුමා නම් බලබෝවේ රජමහාවිහාරාධිපති මාබඩ ගුණරතන ස්ථවිරතුමාය. මේ ළමයා දෙමව්පියන්ට නොදන්වා පැවිදිවෙන අදහසින් මේ තෙරුන් සමග බලබෝවට ගියේය. ඒ තොරතුර පසුව දෙමව්පියන්ට දන්වා අවසර ගෙන මෙකුමරු පැවිදිකෙළේය. පැවිදිවී ටිකකලකට පසු ඉගනීමේ ආශාව උපදවාගත් හෙරණතුමා තමන් පිරිවෙණකට බාරදෙනසේ ආචාර්යතෙරුන්ගෙන් ඉල්විය. ආචාර්යතෙරණුවෝ මේ සාමණේරයන් විද්‍යාලංකාර පිරිවෙණට කැඳවාගෙන ගොස් පරිවෙණාධිපතීන් වහන්සේගේම ශිෂ්‍යයකු කරගෙන උගන්වනසේ භාරකළහ.

පරිවෙණාධිපතිවූ ධර්මාලෝක මාහිමිතුමා හෙරණුන් දැකීමෙන්ම බුද්ධිමතෙකැයි වටහාගෙන සවකීයාරාමයවූ රත්මලානේ පුරාණ විහාරයට කැඳවාගෙන ගොස් නැවත පැවිදිකරවා පෙර පැවති රත්නපාල යන නාමය වෙනස්කොට ධම්මානන්ද යයි නම තැබීය. මින්පසු ධර්මාලෝක ස්වාමිපාදයෝ ස්වකීය ප්‍රධාන ශිෂ්‍ය ධර්මාරාම ස්ථවිරතුමන්ට මේ ශිෂ්‍යයා බාරදී තමාගේ ශිෂ්‍යයකු මෙන් වඩීනය කරගත යුතුයයි කීහ. දම්රම හිමියන් යටතේ ඉගනීම කළ මේ හෙරණපාණන්ට උපසම්පදාව ලැබීමට යොග්‍යවයස පැමිණි විට 1892 දී දොන් දානියෙල් ජයතිලක සේනානායක ගරාදියේ ආරච්චි මහතාගේ දායකත්වය ඇතිව ධර්මාරාම මාහිමියන් ආචාර්ය කොට මල්වතු විහාරයේදී උපසම්පදාව ලැබීය.

ඉන් කලකට පසු මෙතුමා පිරිවෙණේ උපාචාර්යයකු වශයෙන් පත්කරනු ලැබීය. ඒ කාලයේදී එතුමා හුණුපිටියේ විජයසුන්දරාරාමයෙහි නැවතී සිටගෙන පිරිවෙණේ ඉගැන්වීමට ආවේය. මින්පසු කලක පී. බී. තුඟවෙල දිසාවඩන නිලමිතුමාගේ මූලිකත්වයෙන් බෙලිගම්මන විද්‍යාවර්ධන පිරිවෙණ ආරම්භ කරන ලදින් උඩරුවියන්ගේ බලවත් ඉල්ලීම ලෙස ධම්මානන්ද මහාස්ථවිරතුමා ඒ පිරිවෙණේ අධිපතිභාවයට පත්කරගන්නාලදී. වීරකෙත්තේ විද්‍යාරත්න නමැති පිරිවෙණක් පටන්ගන්නාලදින් එහි මූලිකයාවූ ඊ. ඒ පීරිස් අප්පුහාමිගේ බලවත් ඉල්ලීම ලෙස ලුණුපොකුණේ මහාස්ථවිරතුමා ඒ පිරිවෙණේ ප්‍රධානාචාර්ය ධුරය භාරගෙන බෙලිගම්මන පිරිවෙණට කම්බුවට්ටවන පියදස්සි ස්ථවිරතුමන් යැවීය. මෙය සිදුවූයේ 1904 දීය.

ශ්‍රී ධර්මාරාම මාහිමියන් ක්‍රමයෙන් ගිලන්බවට පත්වූ නිසා ධම්මානන්ද මහාස්වාමිතුමා 1917 දී විද්‍යාරත්න පිරිවෙණ හැරදමා විද්‍යාලංකාර පිරිවෙණට හැරී අවුත් ආචාර්යයන්වහන්සේගේ බර සැහැල්ලු කෙළේය. මේ කාලයේදී මූන්වහන්සේට කොළඹ හලාවත දෙදිශාවේ උපසංඝනායකධුරය පමුණුවනලදී. 918 මැයිමස තෙවෙනිදා මහපඬිවර ධර්මාරාම නායකමාහිමියන් අපවත්වූ බැවින් ඒ මස 11වෙනිදා ධම්මානන්ද නායකමාහිමියෝ විද්‍යාලංකාරයේ පරිවෙණාධිපතිත්වයට පත්වූහ. ඉක්බිති මල්වතු සංඝසභාව විසින් "ධර්මකීර්ති ශ්‍රී" යන උපාධිය සහිත කොළඹ හලාවත ප්‍රධාන සංඝනායක පදවිය මෙතුමන්ට දෙනලදී.

මේ නායක මාහිමියන් විසින් 1. මොග්ගල්ලායන ව්‍යාකරණය, 2. මොග්ගල්ලායන වීරිතසත්තය, 3. පදසාධනය, 4 එම සන්නය. 5. මොග්ගල්ලායන පඤ්චිකා (ටීකා) ව, 6. ණ්වාදිවුත්ති යන මේ ආදී ග්‍රන්ථ සංශෝධනයට පමුණුවනලදහ. මෙ පොත් අතුරෙන් මොග්ගල්ලායන පඤ්චිකාව අභාවප්‍රාප්තයයි සම්මතව තිබුණු ග්‍රන්ථයකි. එය කොයිරටකින්වත් සොයාගත නොහැකිවූ බැවින් බුරුම රටේ විසූ "ලේතීසයාතෝ" මහතෙරුන්වහන්සේ නිරුත්ති-දීපනී නමැති අභිනව ටීකාවක් ලිවීය. එය ඒ රටේ මුද්‍රණයෙන් ප්‍රචාරයවූ පසු අස්ගිරි විහාරයේ තිබුණු පඤ්චිකාවේ එකම පිටපත අඹගස්වැවේ රතනජෝති මහානායකහිමිතුමන් විසින් විද්‍යාලංකාර පිරිවෙණට පරිත්‍යාග කරනලදින් මේ නායක ස්වාමිපාදයන් විසින් මහත් පරිශ්‍රමයෙන් ශෝධනය කරනලදී. රොබර්ට් චාමර්ස් මහතාගේ අලුවිහාර පොත්පෙළට අයත් මැදුම්සඟි අටුවාවේ දෙවෙනි කොටස ද හේවාවිතාරණ ත්‍රිපිටක මුද්‍රණයට අයත් අටුවා පොත් දෙකක් ද මූන්වහන්සේ විසින් ශෝධිතවූහ.

මුන්වහන්සේගේ කාලයේදී පිරිවෙණේ ඇතිවූ දියුණුව ආශ්චර්යජනකය. අලුත් ගොඩනැගිලි ඇතිවූවාසේම අලුත් ඉගැන්වීම් ක්‍රම ද ඇතිවූහ. හැමදෙනටම සාධාරණවූ ත්‍රිපිටක පරීක්ෂණ සාහිත්‍ය පරීක්ෂණ වෛද්‍යවිභාග ද ඇතිවූහ. එයින් උත්තීර්ණවූ කෑටත් ඒ ඒ උපාධි ලබාගත හැකිවිය. අද දඹදිව බුද්ධශාසනවර්ධනයෙහි පුරෝගාමීව ක්‍රියාකරන රාහුල සාංකෘත්‍යායන මහපණ්ඩිතයා මෙහි පැමිණ පැවිදිවී ත්‍රිපිටකය ඉගෙන එහි පැමිණියෙකි. එසේම නොයෙක් බෞද්ධ පොත් හින්දි භාෂාවට නගමින් එහි පළකරවන ආනන්ද කෞශල්‍යායන, ජගදීශ-කාශ්‍යප ආදී මාන්‍යතර පණ්ඩිතයෝ මුන්වහන්සේගේ ශිෂ්‍යයෝ වෙති. ලොකප්‍රකට කීර්තිමතෙක්වූ සර් සර්වපල්ලිරාධාකෘෂ්ණන් පඬිතුමා ද කල්කටා විශ්වවිද්‍යාලයේ පාලිමහාචාර්යවරයාව සිටි චේණිමාධව බරුආ (බී ඇම් බරුවා) ආදී උසස් පඬිවරු ද මුන්වහන්සේගේ කාලයේදී මෙහි පැමිණ මේ විද්‍යාස්ථානය දැක මහත් ප්‍රීතියට පත්වූහ. බරුවා පඬිතුමා සියරට හැරීගොස් කල්කටාවේ වසන මහාධනවතෙක් ද ශාස්ත්‍රාභිලාෂී පණ්ඩිතයෙක්වූ විමලාචරන්ලාහ (=බී සී ලෝ) මහතා ලවා මේ පිරිවෙණට රුපියල් දසදහසක පරිත්‍යාගයක් කරවා පොත්පත් රාශියක් ද එවන්ට සැලැස්විය.

මේ සියල්ලට වඩා මේ කාලයේදී සිදුවූ වැදගත් කාරණයක් නම් ඉන්දියාවේ චෛත්‍යයකින් ලැබී එංගලන්තයට ගෙන ගොස් එහි පෞද්ගලික අයිතියකට පත්ව තිබුණු සර්වඥධාතු කොටසක් ශ්‍රීමත් ජයතිලක ඇමතිතුමාගේ උත්සාහයෙන් මේ පිරිවෙණට ලබාදීමයි. ඒ ධාතු ලැබුණුදා පටන් නායකස්වාමීහිමියෝ නිතර ධාතු පූජාවෙහිම නත්පරවූහ. ඒ ධාතූන්වහන්සේ තැන්පත් කිරීම සඳහා විශාල දෙමහල් ධාතුමන්දිරයක් ගොඩ-නැංවීමට ද ආරම්භ කළවූහ. 1938 වේදී මුන්වහන්සේ රෝගීවූ බැවින් කාර්යභාරයෙන් නිදහස්ව විවේක ගතයුතුයයි වෛද්‍යයන් නියම්කළ නමුත් කාරණයක් පැමිණි අවස්ථාවේදී උන්වහන්සේ ඒ ගැන වැඩි සැලකිමක් නොකළහ.

මෙසේ දුර්වල අවස්ථාවක සිටි මුන්වහන්සේ භික්ෂූන්ගේ කීර්තිය කෙලෙසෙනසේ ඇතැම් බෞද්ධප්‍රභූන් ක්‍රියාකරන්ට පටන්ගත් විට ඊට විරුද්ධව නැගීසිටි භික්ෂුගෞරවය රැකගන්ට උත්සාහකළ ඒ පිරිවෙන් වැසි භික්ෂුසමූහයාට හැමඅතින්ම අධාරදෙමින් ක්‍රියාකළහ. අවසාන කාලය වනතුරුත් ශරීරයේ බලතර පිරිහීමක් නැතුව වැඩසිටි මුන්වහන්සේ ස්වල්ප ආබාධයකින් පසුව 1945 ජූනි මස 18 වෙනිදා ලක්දිව අන්ධකාර කෙරෙමින් අපවත්වූහ.

උත්වහන්සේ ජීවත්ව සිටියදී උපශාන්තයකුවූවා සේම උත්වහන්සේගේ ආදාහනෝත්සවය ද භෙරිනාදාදි ඝෝෂාවිරහිතව උපශාන්ත ලෙසින්ම සිදුකරනලදී. බොරගඩ තැනක් ඒ සඳහා පැමිණ සිටි පිරිස කලකින් කොළඹ රැස්නොවූ තරම් විශාල පිරිසක් විය.

## 46, ආභිධම්මික මොරටුවේ මේධානන්ද මහා ස්ථවිරතුමා.

(1868-1929)

ජිනවංසදීප මහාකාව්‍යය ආදී ග්‍රන්ථකීපයක් සම්පාදනය කිරීමෙන් පාලිසාහිත්‍යය වර්ධනයට උපකාර කළ මූත්වහන්සේ 1878 දී මොරටුවේදී උපන්න මෙතුමාගේ පියා "මෙරඤ්ඤගේ කලිස්තෝරු ප්‍රනාන්දු" නමැති වෙදමහතාය. මොරටුවේ වේල්ස් කුමාර විද්‍යාලයේ ඉගනීම ලැබූ මේ බාලයා පරීක්ෂණවලදී දක්ෂලෙස උත්තීර්ණවිය. පවුලේ පස්වෙනියාවූ මෙකුමරා කුඩාකලම ශුභ අනාගතයක ලකුණු පහළකළ බැවින් මොහු පැවිදිකරවනු කැමතිවූ පියා මොහුට එකළොස් හැවිරිදි කල මොරටුවේ ලක්ෂපතියේ ක්ෂෙත්‍රාරාමාධිපතිව වැඩවිසූ වැලිගම සංඝානන්ද මහාස්ථවිරතුමන්ට බාරදී පැවිදිකරවිය.

ටිකකලක් සවකීයාචාර්යයන් වෙත ඉගනීම කළ මේධානන්ද සාමණේරතැන වැඩිදුර ඉගනීම සඳහා රත්මලානේ පරමධම්ම චේතිය පිරිවෙණට බාරදෙනලදින් අවුරුදු කීපයක් ඉගනීම කෙළේය. ඒ අතර 1898 දී බුරුමරට "පඤ්ඤාභිසිරිසද්ධම්මධජ මහාධම්මරාජාධිරාජගුරු" වජිරාරාමික මහතෙරුන්වහන්සේ ඉතා අගනා දළදාකරඬුවක් රැගෙන විශාල පිරිසක් සමග මෙහි පැමිණියන ඒ අවස්ථාවේදී වැලිගම සිරිසුමංගල නායකමාහිමි තුමා ද අම්බලම්ගොඩ දේවානන්ද (පසුව උපසංඝරාජ) මහාස්ථවිර තුමා ද යථොක්ත වැලිගම සංඝානන්ද මහාස්ථවිරතුමා ද යන මේ උතුමන් විසින් විසිවයස් පිරී සිටි මේධානන්ද හිමිනම අභිධර්මය උගන්වා එවීම පිණිස ඒ වජිරාරාමික මහාස්ථවිරතුමන්ට බාරදෙනලදී.

ඒ පිරිස සමග බුරුමරටට පිටත්ව ගිය මෙතුමා කලක් වජිරාරාම මහතෙරුන් වෙත වැස එහිදී ඒ මහතෙරුන් ප්‍රමුඛ සංඝයා වෙතින් උපසම්පදාව ලැබීය. පසුව රත්ගුත් නුවර මහා අතුලවේයන් ආරාමයේ වැඩවිසූ "සංයුත්භයානෝ" යන නාමයෙන් බුරුමරටේ ප්‍රකටවූ "කුමාරාභිවංසතිනාසනධජ-මහාධම්මරාජගුරු" නාමය ලැබූ කුමාරමහතෙරුන්ගෙන් අභිධර්මය ඉගෙන අවුරුදු සය[illegible] පසු

ලක්දිවට පැමිණියේය. උත්පත්තියෙන්ම පිහිටි දක්ෂකවිත්වයක් ඇති මූන්වහන්සේ මෙහි පැමිණ කළ විචිත්‍ර ධර්මදේශනාදිය නිසා මෙතුමාගේ කීර්තිය ඉක්මණින්ම ලක්දිව පැතිර ගියේය.

පාලිපද්‍යබන්ධනයෙහි දක්ෂවූ මෙතුමන් විසින් නානාවෘත්තඇති ගාථා දෙදහසකින් යුක්තකොට සම්පාදිතව සිංහල සන්නයකින් ද සරසා පළකරවූ ජිනවංසදීප මහාකාව්‍යය වනාහි පාලියෙන් ලියූ අතිවිශාල බුද්ධචරිතය යයි කියයුතුය. එසේම උන්වහන්සේ විභංග අටුවාවට ලියූ පිටු දෙදහසක් පමණැති සිංහල සන්නය වර්තමාන කාලයේ ආචාර්ය්‍යවරයකු ලියූ අතිවිශාල සන්නය යි කිය යුතුය. සාරත්ථසූදනී නමැති සච්චසංඛෙප සන්නය, "ආහාරතණ්හාවතා-රය," සිංහලෙන් ලියූ අභිධර්ම ග්‍රන්ථයක්වූ "පරමාර්ථධර්මකරණ්ඩය," නලෝදය නමැති සංස්කෘත කාව්‍යයට ලියූ සිංහලසන්නය, සචකීනා-චාරී සංයුත් මහතෙරුන්වහන්සේගේ චරිතය ඇතුළත්කොට ලියූ අච්ඡරියාසදනචම්පූ නමැති පාලිපොත, කුමාරසම්භවයට ලියූ "කල්පලතා" ව්‍යාඛ්‍යාව, ගාථා 380 කින් යුත් මරණානුස්මෘති ග්‍රන්ථය යන මේවා මූන්වහන්සේගේ කෘතීන් අතර වෙති

පානදුරේ අභයකරුණාර න මුදලිඳුරාමයේ අධිපතිභාවයට පත්ව මහත් ශිෂ්‍යසමූහයකට ඉගැන්වීම ද කළ මූන්වහන්සේ මෙසේ නොයෙක් ධර්මශාස්ත්‍රසංග්‍රහයන් කළනමුත් එතුමාට ජීවත් විය හැකිවූයේ අවුරුදු 51 ක් පමණය. නොනැසෙන කීර්තියක් ඇතිකරගත් මූන්වහන්සේ 1929 මාර්තු 7 වෙනිදා අපවත්වූහ.

ජිනවංසදීපයේ මුල් ගාථාව මෙසේයි:-

"මහාදයො යො භදයොදයො'දයො
හිතාය දුක්ඛානුභවෙ භවෙ භවෙ
අකාසි සම්බොධිපදං පදං පදං
තමාභිවන්දමි ජිනං ජිනං ජිනං"

මෙය රචනාකළේ තිස්අට හැවිරිදි කල්හියයි පහත දැක්වෙන ගාථාවලින් පෙනේ:-

"ලඞ්කිස්සරෙ මොරටුනාමපුරෙ සුරම්මෙ
ජාතෙන ඉස්සර ජනායතනම්හි ජාත්‍යා
වස්සට්ඨතිංසපරිමාණ වයොගුණෙන
පාසාණදූරපුරගොචරගාමිකෙන"

"පීතිප්පමොදජනනං සමණෙන මෙධා-
නන්දාභිධෙන කවිනා කවිකුඤ්ජරානං
ආදිච්චබන්ධුජිනරාජගුණප්පබන්ධ-
සුද්ධාපදානපරිදීපකථා සරීරං".

මුන්වහන්සේ හා පානදුරේ විසූ ඩී ඇම් ඇස්. ඇස් කවිරාජ පඬිතුමා අතර 1910 දී බංකු උඩ වාඩිවී බණ ඇසීම සම්බන්ධයෙන් බලවත් විවාදයක් ඇතිවිය. ධර්මාසනය උසින් තිබුණත් බංකු උඩ ඉඳ බණ ඇසීම ධර්මයට අගෞරවයකැයි සථවිරතුමා කීය. නිවාසතවල හිඳගෙන බණ ඇසීමේ දොසක් නැතැයි පඬිතුමා කීය. තමතමන්ගේ කීම් සවිරකිරීම සඳහා දෙපක්ෂයෙන් කුඩා පොත් හා පත්‍රිකා පළකරනලදී. සථවිරතුමා ඒ සඳහා "ධම්මගාරවදීපනී" නමැති පොතක් ලිවීය. කවිරාජ පඬිතුමා එකල බුරුමරටේ සිටි මට ලියා යවා එහි විසූ අග්ගමහාපණ්ඩිත ලේඩී මහතෙරුන් වහන්සේගෙන් ගාරවාගාරවවිනිච්ඡය නමැති පාළි ලිපියක් ලබාගෙන පළකරවිය. නිවාසතයක හිඳ බණ ඇසීමේ වරදක් නැතැයි එතුමා නිශ්චය කෙළේය.

කවිරාජපඬිතුමා වනාහි 1900 දී පළකළ මාඝධිකා නමැති පාළි සඟරාවේ ද 1908 පමණේ සිට වර්ෂිකීපයක් පළකළ කවිකල්පතරුව නමැති සඟරාවේ ද කතෘවිය. මේතුමා විකට කවිකීමෙහිත් විකට ගාථා ලිවීමෙහිත් දක්ෂයෙකි. බංකුවාදය සඳහා ලියූ "බංකුවාද විභංගය" නමැති පොතේ මුල තිබෙන ගාථාව මෙසේයි:-

"යං කුමෙධාවීනං මොඝ-
සංකුලාවජ්ජදුමමතං
හඩකුවාදවිභංගොයං
තඩකුවජ්ඣං කරීයතෙ"

එහි තවත් ගාථාවක්:-

"කරුණාචෙතසා කොපං
විමුඤ්චසවඨ කණණඩි
රාධිතොයං මයා ජාතෙ
ජයායා මේධනඥන."

එහි තිබෙන ගීයක්.-

"ඒ දැයක පිරිස, පාදැගත්ත වාද
සාදලූ බාද හැර, මේදැනඥ සොයවා."

මෙසේ වාදකරගත් නමුත් පසුකලක මේ දෙදෙන හිත මිත්‍රයෝව විසූහ යි අසන්ට ලැබේ.

## 47. වැලිපටන්විල දීපංකර මහාසවාමිපාදයෝ.

(ක්‍රි ව. 1872-1944)

තංගල්ලේ ගෞතමවිද්‍යාලයාධිපතිව වැඩවිසූ මුන්වහන්සේ ක්‍රි. ව. 1872 පෙබරවාරි 12 දා හම්බන්තොට දිස්ත්‍රික්කයේ තැගෙනහිර ගිරුවාපත්තුවට අයත් වැලිපටන්විල ගමේ

මැදගොඩ පියසේදී උපන්හ. වෛද්‍යාචාර්ය බී. ඒ. ජයසූරිය මහතා හා කහකච්චි පටබැඳිගේ බබාහාමි උපාසිකාව මෙතුමාගේ මව්පියෝ වූහ. අකුරුකියවීමට යොග්‍යවයස පැමිණිවිට එගම පුලිනතලාරාමාධිපතිව වැඩවිසූ වැලිපටන්විල සරණතිස්ස මහාස්ථවිරතුමන් විසින් අක්ෂරාභ්‍යාසය කරවනලදී. කුඩාකලම පණ්ඩිතලක්ෂණ දක්වූ මේ බාලයා පැවිදිකරවීම යෙහෙකැයි සිතූ මව්පියවරු සරණතිස්ස මහාස්ථවිරතුමන්ගේ ද කැමැත්ත ලෙස මෙකුමරු පැවිදිකිරීම සඳහා එතුමාට බාරදෙනලදින් සාමණේර බණදහම් ඉගැන්නූ පසු ඒ මහාස්ථවිරතුමන් විසින් 1886 ජූලි මස 16 වෙනිදා පැවිදිකරණලදී.

පැවිදිවීමේදී අභිධානවූ දීපංකර නාමය ලැබූ හෙරණනමේ ටිකකලකට පසු වැඩිදුර ඉගණීම සඳහා අම්බලන්තොට ගිරිහඬු විහාරාධිපති සුමන මහාස්ථවිරතුමන් වෙත පමුණුවනලදී. එහි කලක් විසූ පසු දික්වැල්ලේ දීඝවාලුකාරාමාධිපති චූලපදුම නායකහිමිතුමන් වෙත පමුණුවනලදී. මෙසේ සාමණේරයෙක් උගතයුතුදේ ඉගෙනගත් පසු වැඩිදුර ඉගණීම සඳහා 1896 ජූලි මස 9 වෙනි දින දෙඩන්දූවේ ශෛලබිම්බාරාමයට පමුණුවනලදින් ඒ විහාරාධිපතිව වැඩවිසූ පියරතනතිස්ස නායක මාහිමිතුමන්ගේ අනුමතිය පරිදි ඒ ආරාමයේ සරස්වතීමණ්ඩප පිරිවෙන් හිමි බෞද්ධ සිද්ධාන්තාචාර්ය චන්ද්‍රකීර්ති ශ්‍රී ශීලස්කන්ධ මහාස්ථවිර තුමන්ට බාරදෙනලදී.

මෙතුමාගේ උපසම්පදාකර්මය 1900 දෙසැම්බර් 13 වෙනිදා ශෛලබිම්බාරාමාසන්න උදකුක්ඛෙප සීමාවේදී සිදුවිය. දෙඩන්දූවේ පියරතනතිස්ස මහානායක මාහිමියෝ එතුමාට උපාධ්‍යාය වූහ. 1. බූස්සේ සද්ධාතිස්ස මහානායකස්ථවිර, 2 ජම්බුවත්තේ පියරතන මහාස්ථවිර, 3. අම්බලම්ගොඩ රාජගුරු ශ්‍රී ධර්මාධාර මහාස්ථවිර යන තුන්නම කර්මාචාර්යවරයෝ වූහ. බණ කීමෙහි දක්ෂවූ මුන්වහන්සේ නොයෙක් තැන ධර්මදේශනාකිරීමෙන් ද "දෙඩන්දූව තරුණ බෞද්ධ සමිතිය" ආදි සමිති කීපයක් පිහිටුවීමෙන් ද ඉරුදින පාඨශාලා පැවැත්වීමෙන් ද ඒ පලාත්වැසියන්ට සංග්‍රහකරන අතර සරස්වතීමණ්ඩපයේ ආචාර්යපදවියකට පත්ව මහත් ශිෂ්‍යපිරිසකට ඉගැන්වීම ද කළහ. කොළඹ කොටහේනේ දායකමහතුන්ගේ ආරාධනාවෙන් එහි බ්ලූමැන්ඩල්පාරේ ආවාසයක වස්තුනක් විසීය. දෙඩන්දූවට නුදුරු කිරාණගම සුනන්දාරාමවිහාරයෙහි අවුරුදු සතරක් පමණ වාසයකරමින් බොහෝ පිරිසකට ධර්මශාස්ත්‍ර ඉගැන්වීය.

1915දී දෙවුන්දර මහදේවාලය අසල පිහිටි පරමවිචිත්‍රාරාමයේ ශෛලතරුමූල පිරිවෙණ ආරම්භකළ අවස්ථාවේ එහි ආචාර්ය ධුරයකට පත්වූ මුත්වහන්සේ 1916දී එහි ප්‍රධාන ධුරයට පත්වූහ. අවුරුදු අටක් පමණ කල් එහි ඉගැන්වීම කළ මුත්වහන්සේ සිය ගමට නුදුරු කංගල්ලේ දයක මහතුන්ගේ බලවත් ඉල්ලීම ලෙස එහි "ගෞතමවිද්‍යාලය" නමැති පිරිවෙණක් පිහිටුවා ප්‍රධානාචාර්යත්වයට පත්ව ජීවිතාවසානය දක්වා එහි විසූහ.

මෙසේ ඉගැන්වීම් කරන අතරම මුත්වහන්සේ තමන් හා එක්ව ඉගනීම කළ බටපොලේ ධම්මපාල මහාස්ථවිරතුමන් සහාය කොට ගෙන අතිදුෂ්කර බන්ධනයන්ගෙන් යුත් ජිනාලංකාර නමැති පාලිපද්‍යයට සන්නයක් ලියා පළකරවූහ. එසේම "ජිනාලංකාර වණ්ණනා" නමැති ටීකාව සංශෝධනය කොට පළකරවූහ. පරිවාරපාළිය හා ධම්මපදට්ඨකථා ප්‍රථමභාගය ද මෙතුමන් විසින් සංශෝධිත වූහ. 1. මයූර සන්දේශ සන්නය, 2. පාරමීමහාශතක සන්නය, 3 වෘත්තෝදය වර්ණනා, 4 සඳැස් ලකුණු වර්ණනා යන පොත් ද මෙතුමන් විසින් සම්පාදිත වූහ. මේ සියල්ලට වඩා ප්‍රකට වූයේත් මහාජනයාට ප්‍රයෝජනවත් වූයේත් මෙතුමා ලියූ සිඛාසත දීපිකා නමැති ජිනකාපදේශ සන්නයයි. ඒ පොත කාම්බෝජයේ මහරජතුමන් වෙත ඉදිරිපත් කරන ලදින් "ප්‍රාබට් සොම්දච් ප්‍රාසිසොවත්මොණීවොංග් චක්‍රපොංස් හරිරක්ෂ" නමැති ඒ මහරජු විසින් අභිධානාචාර්ය උපාධිය සහිත සන්නසක්ද රන්පදක්කමක් හා තවත් පූජාවස්තූන් ද මෙතුමන් වෙත එවනලදහ.

මෙතුමා විසින් සම්පාදිත ව මෙතෙක් මුද්‍රණයට නොපැමිණි ග්‍රන්ථයෝ නම් 1. නෙමිචරිත සන්නය, 2. සුභූතසංගීත පදගතාව හා විස්තරභාවය, 3 ශානාවිහත වර්ණනා, 4 උපදේශරත්නාකරය, 5. කව්මිණිරුවන සන්නය, 6. ද්‍රව්‍යගුණ ශතක සන්නය, 7. බෞද්ධොපදේශය, 8. "බුද්ධම්පිය චරිතය" නමැති පාලිගාථා දහසකින් බැඳි බුද්ධචරිතය සහ ඒවායි. 9 ශිෂ්‍යබොධාවලී නමැති දූලිභග්‍රන්ථය සංශෝධනය කොට ඇත. මුත්වහන්සේගේ ගිහි ශිෂ්‍යයන් විසින් ද නොයෙක් කාව්‍යග්‍රන්ථයන්ට ව්‍යාඛ්‍යාදිය සම්පාදිතය.

මෙසේ මහත් උත්සාහයෙන් නොයෙක් ලෝකශාසන සංග්‍රහ කළ මුත්වහන්සේ 1944 ඔක්තෝබර් මස 2 වෙනිදා රෝගාතුරවී කරනලද නොයෙක් ප්‍රතිකාරවලින් ඵලයක් නොවී ඒ මස 14 වෙනිදා අපවත්වූහ.

# 48. දොන් ජොහැන්නස් පණ්ඩිතතිලක කොග්ගල ගුරුතුමා.

(උපදීම 1800 පමණේදී.)

කොග්ගල ධම්මතිලක නමින් මීරිපැන්නේ ධම්මරතන යතිවරයන් වෙත පැවිදිව සිටි මේ තෙමේ ක්‍රි. ව. 1853-4 යන වර්ෂවලදී පැවති සව්සත්දම් වාදයෙන් පසුව සිවුරු හැර 1863දී "ලක්මිණිපහන්" පත්‍රය පටන්ගෙන බොහෝ කලක් එහි කර්තෘධුරය දැරීය. සව්සත්දම්වාදය කුමක්දැයි බෝවලතායක ස්වාමීන්ද්‍රයන්ගේ චරිතයේදී දක්වනලදී. වැඩිදුරටත් පැහැදිලිවීම සඳහා 1908දී ඥානාදර්ශය සඟරාවේ පළවූ වාර්තාවක් මෙහි දක්වමි:- "ක්‍රි. ව 1805දී පමණ මාතර ගඟබඩපත්තුවේ මුදලිකමට පත්ව සිටි "දවිත් ද සරම් විජයසේකර ජයතිලකරත්න" මුදලිතුමා විසින් මාතර නිල්වලාගඟේ කරවනලද මාහැඟි පින්කමක් අරභයා "දොන් තෝමිස් සමරසේකර දිසානායක" මුහන්දිරම් මහත්මයා විසින් ගංගාරෝහණවර්ණනාව ප්‍රබන්ධකළ පසු එහි ගුණ දෙස් දැක්වීම පිණිස ගාල්ලේ සිටි අබයසිංහ මුදලිතුමාගේ මාර්ගයෙන් බම් සාමීන්නාන්සේ* වෙත ලැබුණේය. මේ ස්වාමීන්වහන්සේ ඒ ගැන වචනයක්වත් කීමට අප්‍රසන්න බැවි අගවා ගැව්තුමුත් නැවත නැවතත් ඒ ගැණම ඉල්ලා සිටිනෙයින් එම කාව්‍යයෙහි සිවුවෙනි ශ්ලෝකයේ

"සසර සරණ සව්සත්දම් අමාවෙන් සතොස්වා"

යන්නෙහි පෙර මැද අග තිබෙන වර්ණතුනෙන් "සරම්" කියා නොව අල්දුම් ම යන්නට පෙර තිබෙන ද-යන්නද එක්ව සරදම් කියා සැ[illegible]නේයයි මේ සාමීන්නාන්සේ කීය. ඉතින් මේ කාරණය සම්බන්ධව ලියකියමින් කීපයක් මීරිපැන්නේ සාමීන්නාන්සේත් තෝමිස් මුහන්දිරම් මහතාත් අතර ලියවුනු පසු දෙපක්ෂයම නිශ්ශබ්දවූවාහ. මීට කලකට පසු ගරු ජේම්ස් ද අල්විස් අද්වකාත්තුමා සිදත් සඟරාව ඉංග්‍රීසියට නගා අච්චුගැස්විය එහි ද මේ කාරණය සඳහන් කරමින් මීරිපැන්නේ සාමීන්නාන්සේගේ කීම සදෝෂය, තෝමිස් මුහන්දිරම් මහත්මයාගේ කීම නිදොස්යයි ප්‍රකාශවිය. මේ කාලයේ එනම් ක්‍රි ව 1852දී, මීරිපැන්නේ සාමීන්නාන්සේ සහ තෝමිස් මුහන්දිරම් මහතාත් ජීවත්ව නොසිටියේය. එහෙත් මීරිපැන්නේ සාමීන්නාන්සේගේ පක්ෂයට එම සාමීන්නාන්සේගේ

---

* "බම් සාමීන්නාන්සේ" යයි කියනුලබන්නේ මීරිපැන්නේ ධම්මරතන හිමිතුමා.

ගෝලයන්වූ "කොග්ගල ගුරුන්නාන්සේ" යයි ප්‍රසිද්ධ දොන් ජෙහාන්ස් පණ්ඩිතතිලක ගුරුතුමා සහ තවත් අයද අතික් පක්ෂයට ලංකාවේ එවකට සිටි සියලු ගිහිපැවිදි උතුමෝ ද සිටගෙණ 'සරම් සරදම්" වාදය ජෝන් පෙරේරා මහත්මයාගේ "ශාස්ත්‍රාලංකාරය" සහ බටුවන්තුඩාවේ පඬිතුමාගේ යතලබ සඟරාව යන දෙකෙන් කළ බැව් පෙණේ"

ජේම්ස් අල්විස් මැතිතුමාගේ කීමට විරුද්ධව කොග්ගල-ගුරුතුමන් පළකළ කවිපෙළක් මෙසේසි:-

1 "සක තරන වසින් එක්වාදහස් සත්සියක්හා
විසිඅටෙහි තවත්මස්හි තොම්ස් නම් කිවිත්ද
ගඟරුවණනා නම් සාදා පොතක් ගත් සියේකින්
සැක නොව මෙහි දෙස් කීවොත් කදිමියි කියාලා

2. එවර එපොත කවිසත් දත් වියත්කැත් තිවස්නා
නොහැර මෙලක නෙක් දික්හී යැවීමෙත් නොලස්නෙත්
කුවෙර පුරසෙ දුල්නිත් සව්සිරින් යුත් විපුල්වූ
පවර පුරවරෙක්හි ගාලුනම්යුත් පසස්නා

3 මුදලිඳු වෙන එව්සල්හි අබේසිංහ නම්ලත්
විලසිඳු ගුණපුත් පිත්වන් පසත් ඒ මැතින්ද
පිරිසිදු ලෙස කව්සත් දත් සමත් මීරිපැත්තේ
හිමිසඳු කැඳවා කීවය් මෙසේ සිත් විලස්නෙත්

4. නරිඳු සිරිදුරු පවර සම්ඳුනි, ඇසුවමැන මෙකරුණ බැසි ත්
සුරිඳුපුර පසුකරණ නෙකසිරි සරුනි මහනොට පුරවරි ස්
සුරුඳුයස දසදෙසෙහි මුදලිඳු තුමේකුසෙව් කිවිදෙක් විසි ත්
වි රිදු ලෙස කව්පොතක් පදබැඳ එවිය මෙහි ඇද කියනමෙ ත්

5. මෙර ග සියබස නගා විසිතුරු ලෙසට පදබැඳ සිතුලෙසි ත්
ත ර ගරග අගවමිනි අපවෙන එවිය කිසිබිය නොවසෙදි ත්
ත ර ඔමින් හිමිසඳින් මෙහි ඇතිදෙසක් කිවහොත් නොවලසිත්
ත ර ගමෙන් පුරගණෙහි ඔබ යස පැතිරයෙයි දසදෙස ගෙනෙත්

6. මෙලෙස සැලකළ බසට එසම්ඳු නොකොට මදකුත් සිතුපෙමා
එලෙස අත්හට දෙසක් පලකර කීම යුතු නැත නොව ස මා
අයස මිස නොමදවම වන කිසි වැඩක් නැත ඉන් දෙලොව මා
දියැසයුරු මැතිතුමෙනි මෙකරුණ හරින් ඔබසිතු නොගැනමා

7. මෙසේ ඒහිමි පැවසු එබසට නොසතුටුව මැතිතුමන් සි ත්
එ සේ වුව හිමිතුමනි මෙහි කිසි දෙසක් වෙද යම්තමක් ව ත්
වි සේ සව ඒ කිවොත් යෙහෙකැයි අයදි සඳ එමැතිඳු යලි ත්
දෙසේ දස නෙක යසැති එසම්ඳු කිවයි දෙස ඒ කෙසේ ය ත්

8. සසර සරණ සව්සත් දම් කියන මෙගණතුතින් සොබ න
නොහැර පෙරදු මැදු අගවණ රුගෙණ සරම් කියනලෙසි න
එවර යොදා තිබෙන මෙගණ පිළිවෙල විලසරම යෙහෙ න
පවර මැතිනි, සරදම් වෙසි ගතහොත් මේ අකුරු කෙමෙ න

9. සොඳ මුල දෙනගණ යෙත් සර යන ළුහුදෙක ගෙන මොනවට
යෙදූ අග මගණෙත් දම් යන ගුරු එහි ගලපා තිසිකො ට
එද සරදම් වතරග පිළිවෙලට පෙණෙති විමසු කල ට
සඳසතැරේ කෙමෙත් මැතිනි, මෙහි දෙස පලවෙයි කදිම ට

10. මෙලෙසට සැහෙවම්නෙහි මුල තිබුන එකවිදෙස දකිම් න
කදිමට සිතැගෙන ලෙස කීකල ඒ තිම්තුමත් සොබ න
එකලට සව්සත සොඳලෙස දැන විසු කිවිඳෙ හැමදෙ න
මොනවට පිළිගත්තුය එම බස තියුකරමින් නොමදි න

11. එ දි න නොමිස් කිවිඳ එදෙන නිදෙස ලෙසට තිසි කව් බැ ඳ
සෙ දින එහිම් වෙන එව්කල පිළිතුරු දෙනමෙත් නිවර ද
සොඳින එතතු හැගෙන විලස කව්බැඳ හැරිකල විලිවැ ද
න දි න පැවති කිවිමත් සැහ ගිය ඔහු එඩිබල සිඳ බි ද

12. රි සි යු රු සකු-සිහලබස තොරතුරු දැන මොනව ට
ඉ සි ව රු දෙදෙනෙකු ලෙස මෙම ලක්දිව සුදිලෙව් හැමවි ට
ය සි යු රු සොමි ගුණදුරු බෝවලහිමි සම්ගිත් කරනො ට
කිසිබොරු නැති මෙයනි දෙදෙන කිවයි එමදෙස කදිම ට

13. එවක් සිටම් තැණ යුතු දැන දෙන නොක තියුහොස ලබමි න
නොයෙක් උරණ කිවි දප බිඳ දියතුරු දියදද බඳිමි න
මෙලක්දිවට බට සුරගුරු සුරු සිරිසර පලුකරම් න
කලක් නොමද සැපවිඳ දවසැරිගසි එසම්දුන් සොබ න

14. එසම්දු දියතෙත් සසුන් වියත්කුස්
සපැමිණියෙන් සතරැස් යෙහෙත් සුදුල්වා
පබිඳහසරම්ල් පිපි දිලීගොස්
ගලිදු අකිස් හිමකැන් සෙයින් අදිස්වි.

(15, 16, 17; 18 කවි හැරදමනලදි.)

19. විතරණ රලමෙත් රසින් මහත්වූ
විදුදන මිත්සර රුවත් රුසින් යුත්
එසම්දු දලරුස් මෙලක්දිවේ දුල්
මරණග තිත් මුවතුල් සෙදින් සැපත්වී

20\. සව්සත් දත් වියතෙක් වෙතත් මෙහෙම නැත්මය් සිත්
දයාවෙන් මගත්වූ
සිව්වත් කත් සතුටින් තිවෙස් කල මුවැත් වත් අත්විලස්
ගත් තැණින්
සිව්බස් දත් තෙව්යත් මුදුන් මිණිකිරුල්වන් ඒ සම්න්ද
බොහෝ
ලෙව් සත් සිත් තෙක දුක් දෙමින් මරණ පත් විමෙත්
ගියෝ කම්ලෙසින්."
("මිරිපැන්තේ ප්‍රබන්ධ" නමැති පොතෙන් ගත්තලදී )

## 49. දොන් අන්දිරිස් ද සිල්වා බටුවන්තුඩාවේ පඬිතුමා.

(ක්‍රි. ව. 1819 - 1892)

අද්‍යුරෘතීතයෙහි ලක්දිව විසූ ගිහිපඬිවරයන් අතුරෙන් අග්‍රෙසර වූ බටුවන්තුඩාවේප ඬිතුමා ක්‍රි. ව. 1819 යේ මැසිමායේ දී දකුණුලක බටුවන්තුඩාව නම් ගමේදී උපන්නේය. කුඩාකල "අන්දිරිස්" යන නම ලැබූ මේතෙම පස්හැවිරිදි කල්හි මවගේ ජාතභූමිය වූ බද්දේගම ක්‍රිස්තියානි පාඨශාලාවට යවනලදී. මොහුගේ ඉගනීමේ දක්‍ෂභාවය දුටු මවුපියෝ දහතුන් හැවිරිදි කල්හි ඔහු පාසැලින් අස්කරවා නාඳුගල රේවත මහතෙරුන්ට බාරකළහ යොග්‍ය කාලයේදී ඔහු පැවිදි කල රේවත මහාස්ථවිරතුමා වැඩිදුර ඉගනීම සඳහා මේ දේවරක්ඛිත සාමණේරයන් කෝට්ටේ රජමහවෙහෙර විසූ සවකීය ඥතිවරයකු වූ මලිගස්පේ මංගල නායකස්ථවිරතුමන් වෙත පැමිණවිය. එහි කලක් ඉගෙනගත් හෙරණතැන තවත්දුර ඉගනීම් සඳහා මහනුවර මල්වතුවිහාරයේ විසූ ගල්ගිරියාවේ සුමංගල මහනායකස්ථවිර තුමන් වෙත යවනලද්දේය එහි වසන කාලයේදී (1840 දී) උපසම්පදාව ලබා සියගමට හැරී අවුත් ටිකකලක් වැස රත්මලානේ විසූ පණ්ඩිතාචාර්ය වලානේ ශ්‍රී සිද්ධාර්ථ මහාස්වාමිතුමන් වෙත පැමිණ තවදුරටත් ඉගනීම කෙලේය.

ඉන්පසු මහනුවර සාංඝසභාවෙන් "ශ්‍රී" යන්න ප්‍රදානය කරන ලදින් කලක් කොලොන්නාවේ පුරාණවිහාරයේ ආධිපත්‍යය දරමින් වැස පන්තිස්වියෙහි දී (1855 දී) සිවුරු හැර ගිහිබවට පත්විය. එකල සිටි ප්‍රකට දේවගැතිවරයෙක් වූ ඩී. ජේ. ගොගර්ලි තුමා තමාගේ ප්‍රධානත්වයෙන් පැවති නෝර්මල් පාඨශාලාවේ ආචාර්ය ධුරයක් බටුවන්තුඩාවේ මහතාට ලබා දී තෙමේ ද ඒ මහතාගෙන්

සිංහල ඉගෙනගත්තේය. වරක් ඒ දේවගැතිතුමා බුද්ධාගමට විරුද්ධව ලියූ "ක්‍රිස්තියානි ප්‍රඥප්ති" නම් පොතක ශුද්ධපත්‍ර බලන ලෙස මේ මහතාගෙන් ඉල්ලා සිටි නමුත් ඊට නොකැමැතිවූ විට පාසැලෙන් අස්කරනබව කීය. එවිට තමාගේ හිතට විරුද්ධව ක්‍රියා කරනු නොකැමැති පඬිතුමා ඒ ධුරයෙන් ඉල්ලා අස්විය. එයින් අස්වී වැඩිකලක් යන්ට පෙර ඒ මහතා සෙලෙස්තිනා රාජකරුණා නමැති කුලකාන්තාවක් හා සරණබන්ධනයට පත්විය.

සඳොක්ත "ක්‍රිස්තියානි ප්‍රඥප්ති" නමැති පොතට උත්තර වශයෙන් "ක්‍රිස්තියානි ප්‍රඥප්ති ඛණ්ඩනය" නමැති පොතක් මේ මහතා ලියූ නමුත් එකල බෞද්ධ යන්ත්‍රාලයක් නොතිබුණු බැවින් එය මුද්‍රණය කරවන්ට මගක් නැතිවිය. එවිට දක්ෂ ශිල්පියකු ලවා ලී තහඩුවල අකුරු කපපවා* ඒ පොත මුද්‍රණය කරවන ලදී. මුද්‍රායන්ත්‍රාලයක ආවශ්‍යකත්වය දුටු මේ පඬිතුමා බොහෝ වෙහෙස ගෙන "ලංකාභිනව විශ්‍රැත" නමැති යන්ත්‍රාලයක් පිහිටුවිය. ආධුනිකයන්ට සිංහල-පාළි ආදිය ඉගනීමට උපකාර වූ බාලාවතාර - සිදත් සඟරාදිය මුලින්ම මුද්‍රණය කරන ලද්දේ මේ යන්ත්‍රාල යෙහිය. සතලඹ නම් සඟරාවක් ද සාරාර්ථ ප්‍රදීපිකා නැමති සඟරාවක් ද මේ පඬිතුමාගේ කර්තෘත්වයෙන් පවත්වනලදී.

1888 වේ අප්‍රේල් 20 වෙනි දින බෞද්ධ විවාහලේකම් ධුරයට පත්කරනුලැබූ මෙතුමා මහලුකාලය දක්වා ඒ තිලය දැරීය. ආණ්ඩුව මුදලි නාමයක් මේ මහතාට දීමට කැමතිවූ නමුත් හෙතෙම එය ලබාගන්ට නොකැමැති විය.

මෙතුමා විවාහකොට ගත්තේ රණමුක රාජකරුණා මුලත් සිංහල දළුවඩන මුදියන්සේ රාලහාමිලාගේ ජේකබ් කුරේ මහතා ණන්ගේ දූවූ සෙලෙස්තිනා හාමිනේය. මේ විවාහයෙන් පුත්‍රයෝ සතරදෙනෙක් ද දූවරු දෙදෙනෙක් ද ඇතිවූහ. ඩොනොමෝර් ආණ්ඩුකාලයේදී ඇමතිධුරයක් දැරූ සී. බටුවන්තුඩාවේ මහතා එයින් එක් පුත්‍රයෙකි. ඒ මහතා ප්‍රථම බෞද්ධ (බැරිස්ටර්) අධිනීතිඥමහතා ද වීය. ශ්‍රීමත් ඩී. බී. ජයතිලක ඇමතිතුමාගේ බිරිඳ බවට පත්ව සිටියා මේ පඬිතුමාගේ එක් දුවණියකි.

"ගුත්තිලකාව්‍යවර්ණනා" මුඛබන්ධයෙහි මේ පඬිතුමා ගැන මෙසේ කියවේ:-

"බටුවන්තුඩාවේ පඬිතුමාගේ කීර්තිදේහය ලංකාවෙහි හැම කල් දීප්තිමත්ව බැබළීම නියත වේ. මේ උසස් පඬිවරයා කෙරෙහි

---

* අත්‍ය ලියවිල්ලකින් පෙනෙන්නේ ලීවලින් පෑස්එකක් සාදා පොත මුද්‍රණය කරවූ බවයි. ඒ කීම සත්‍යයයි පිළිගත හැක. ලී තහඩුවල අකුරු කපා ගැසූ පොතක් ගැන අසන්ට නොලැබේ.

පැවැත්තේ යයි සිතිය යුතුවූ ප්‍රෝත්සාහී භාවය මෙතෙකැයි කිය නොහැක්කේය. මේ තෙමේ බොහෝ වූ ශිෂ්‍යසංඛ්‍යාවකට හැම කල්හි ශාස්ත්‍රදානය කෙළේය. මේ පිණිස ස්වකීය කාලයෙන් වැඩි කොටස ව්‍යාපෘතවී නමුදු අඛණ්ඩපරිශ්‍රමයෙන් යුක්තව එළුය, පාලිය, සංස්කෘතය යන ත්‍රිභාෂායෙහිම පුරාණ ග්‍රන්ථයන් ශුද්ධ කරමින් ද ව්‍යාඛ්‍යානකරමින් ද මුද්‍රණයකොට විසුරුවා හැරීමෙන් සියලු විද්‍යාර්ථීන්ට සංග්‍රහකෙළේය. ලංකාණ්ඩුව විසින් යොදවන ලදුව මේ පඬිවරතෙමේ හික්කඩුවේ ශ්‍රී සුමංගල සංඝනායක ස්වාමීන්වහන්සේ සමග මහාවංසය සිංහලට නැගුවේය. එහි මාගධීපාඨය ද මුද්‍රණය පිණිස ශුද්ධකර දින. මේ පඬිතුමා විසින් සුලභකරවනලද පොත්වලින් සමහරක් නම්:- බාලාවතාරය, කච්චායනධාතුමඤ්ජුසාව, අනුරුද්ධශතකය, සූර්‍යශතකය, වෘත්තමාලාඛ්‍යාව, අමරකෝෂය, මාධවය, සිදත්සඟරාපෙළ. සිදත්සඟරා පුරාණ සන්නය, රුවන්මල, පියුම්මල යනාදිය. ගුත්තිලකාව්‍යය ද මේ පඬිවරයාණන්ගේම ව්‍යාඛ්‍යානයක් සමග ප්‍රසිද්ධකරන ලදී”

ක්‍රි ව. 1910 සේ මාර්තු මාසයේ පළවූ සත්‍යසමුච්චය සඟරාවෙහි මෙතුමන් ගැන මෙසේ දක්වා තිබේ:-

ක්‍රි. ව. 1892 දී පරලෝකප්‍රාප්තවූ දොන් අන්ද්‍රිස් ද සිල්වා බටුවන්තුඩාවේ රාජකීය පඬිතුමා කවරෙක් ද යනු දැන් වසන තරුණපෙළේ ඇතැම් අය නොදනිත්දෝ සිතමු. මෙතුමා කීර්තිශේෂභාවයට පැමිණ 18 අවුරුද්දක් ඉකුත්විය. මෙතුමාගේ ජීවිත කාලයේ විසිපස් අවුරුද්දක් පමණ කාලය තුළ ලක්දිව මහාපණ්ඩිතත්වයෙන් මෙතුමා විරාජිතවීය. මෙතුමාගේ ආචාර්යවරයෝ මලිගස්පේ ධම්මකිර්ති මංගලාභිධාන නායක ස්ථවිරපාදයන්වහන්සේ ද, වලානේ සිද්ධාර්ථාභිධාන මහාස්ථවිරපාදයන්වහන්සේ ද, ගල්ගිරියාවේ ධම්මරක්ඛිත සුමංගලාභිධාන මහානායකස්ථවිර පාදයන්වහන්සේ ද යනාදි උත්තමයෝය. මෙතුමාගෙන් ඉගෙන ගත් අය වංශාධිපති ජේම්ස් ද අල්විස් සිංහල මන්ත්‍රීතුමා, විද්‍යෝදය පරිවෙණාධිපති නායක ස්ථවිරතුමා, එහිම උපප්‍රධාන ස්ථවිරතුමා යනාදි පඬිවරයෝය. මෙතුමාගේ පාණ්ඩිත්‍යයෙන් ලක්දිව සැරසුණු කල්හි ප්‍රතිවිරුද්ධව ඉදිරියට එන පඬිවරයකු දුර්ලභ තරම් පාණ්ඩිත්‍ය තේජසක් මෙතුමා කෙරෙහි පැවැත්තේය. බුද්ධවර්ෂයෙන් 25 වෙනිවූ මේ ශතවර්ෂයෙහි ලක්දිව පොත් ශුද්ධකොට අච්චුගැස්වීමේ පළමුවෙනි ආචාර්යවරයා මෙතුමාය.”

1880 වේදී එතුමා ශුද්ධකළ අමරකෝෂ ප්‍රස්තාවනාවෙහි තිබෙන ශ්ලෝකයක් මෙසේයි:-

"ශෞද්ධොදනෙර් වරමුනෙ රුපශාසනවර්තීනත්
ලොකශ්‍රවාබ්ධිනයනෙ තරුණෙ හරිසෙථ
ශ්‍රීදෙවරක්ෂිත ඉති ගුරුදත්තනාමා
ව්‍යාඛ්‍යාමිමාංකෘත ශිෂ්‍යජනස්‍ය තුෂ්ටෙය්‍ය"

1892 ක් අප්‍රෙල් 20 වෙනිදින මේ පඬිතුමා හෘදයාබාධයකින් පරලොකප්‍රාප්ත විය. වයස හැත්තෑ තුනක් විය.

## 50. ගරු ජේම්ස් ද අල්විස් පඬිතුමා.

(ක්‍රි. ව. 1823 - 1878)

ක්‍රිස්තුභක්තිකයකුව සිටි මේ මහතාගේ චරිතයට බෞද්ධාචාර්යයන් පිළිබඳ මේ පොතේ අවකාශයක් නැත නමුත් මෙහි දැක්වූ බෞද්ධ පඬිවරුන්ගේ චරිතවලදී මේ මහතාගේ නම කියවුණු බැවිනුත් බෞද්ධයන් හා සම්බන්ධකම් ඇති පාලිව්‍යාකරණ ඉංග්‍රීසියට නැඟීමාදිය කළ බැවිනුත් එය හැරදැමීම ආධුනිකයන්ට බලවත් පාඩුවක් වියහැකි බැවිනුත් එය ද මෙහි ඇතුළත් කරමි. මේ මහතා උගත් මහතෙරවරුන් නිතර ආශ්‍රයකරමින්, ලියුම් ගනුදෙනු කරමින් සිටිබව ද පෙනේ. (මේ චරිතය මට ලැබුනේ 1935 ගේ දෙසැම්බර් මාසයේ පළවූ ප්‍රභාෂොදය සඟරාවේ තිබෙන ශාස්ත්‍රාචාර්ය ඩී. ජ්. හෙට්ටිආරච්චි මහතාගේ ලිපියකිනි)

මේ තෙමේ ක්‍රි. ව. 1823 දෙසැම්බර් 14 වෙනිදා 'ඒබ්‍රහම් ද අල්විස් අභයසිරිවර්ධන ගුණතිලක" මුදලිතුමාට හා "ජලෝරන්තිනා ද අල්විස්" ලමාතැනියට පුත්‍රව උපන්නේය. පස්හැවිරිදි කල්හි මැණියන් විසින් අකුරුකරවනු ලැබූ මේ තෙමේ ගල්ඇටුඹේ නොතාරිස් රාළහාමිගෙන් ද පසුකලක බටුවන්තුඩාවේ පඬිතුමාගෙන් හා තුඩාවේ පණ්ඩිත ගුණවර්ධන මහතාගෙන් ද ශාස්ත්‍ර උගත්තේයයි අසන්ට ලැබේ. ඉංග්‍රීසි ඉගනීමේ ද යෙදී සිටි මේ මහතාගේ පියා 1837 දී මහත් ධනහානියකට පත්ව ඊළඟ වර්ෂයේ දී කාලක්‍රියා කළ බැවින් මොහුට මහත් කරදරවලට මුණ පාන්ට සිදුවිය. ඔහු ගිය පාඨශාලාවේ ප්‍රධානාචාර්යව සිටි ජේ. මාර්ච් නමැති දේවගැතිතුමකුගෙන් හා බාප්පාකෙනෙකුගෙන් ඒ කාලයේදී ඔහුට උපකාර ලැබුණි. මැකෑන්සි නම් ආණ්ඩුකාරතුමාගෙන් ද උපකාර ලැබුණු බව ඒ මහතා විසින්ම ප්‍රකාශකොට තිබේ.

ඉගෙනගන්නා කාලයේදී පවා ලිපිකරුවැඩ ආදිය කරමින් වියදමට යමක් සපයා ගැනීම ඒ මහතාගේ සිරිතවිය. 1840දී පාඨශාලාවෙන් අස්වූ හෙතෙමේ "සිලෝන් හැරල්ඩ්" නම් පත්‍රකාර්යාලයේ වැඩට පත්විය. මැකෑන්සි ආණ්ඩුකාරතුමා මෙරට හැර යන

විට මේ තරුණ අල්විස් මහතාට සෑහෙන තනතුරු ලබාදිය යුතුයයි තමාගේ බෑණාකෙනෙකුට* දක්වා තිබුණු බැවින් ඒ මහතා විසින් කොළඹ දිස්ත්‍රික් නඩුකාරමහතාගේ† භාෂා පරිවර්තක ධුරයට මේ මහතා පත්කරන ලදී. උසාවියට ගිය පළමු දවසේදී ඩබ්ලිව්. සී. ගිබ්සන් නමැති ඒ නඩුකාරමහතා කී වචන සිංහලට පෙරළන්ට ගිය මොහුට වචන දෙකතුනටවඩා කියාගන නොහැකිවිය උසාවියේ සිටි සියල්ලන් සිනාසෙන්ට පටන්ගත් බැවින් මහත් ලජ්ජාවට පත් හෙතෙමේ එදා ඇති-කරගත් මහත් අධිෂ්ඨානයෙන් යුක්තව සිංහල පමණක්නොව පාලිභාෂාව ද ඉගෙන පසුකලක උසස් පඬිවරයෙක් විය

භාෂාපරිවර්තකයට ගොස් ලජ්ජාවට පත්වූ හෙතෙමේ පසු කලක (1844 දී) නීතිඥයෙක් විය. 1859 දේදී කළුතර පොලිස් හා දිස්ත්‍රික් නඩුකාරධුරයට ද පසුව කොළඹ විනිශ්චයකාරධුරයකට ද පත්කරනලදී ‡ 1864 අගෝස්තුමාසයේ දී ආණ්ඩුවේ සේවයෙන් අස්ව ව්‍යවස්ථාදායක සභාවේ මන්ත්‍රීධුරයකට පත්විය 1875දී ඒ සභාවේ සිංහලයන්ගේ මන්ත්‍රීධුරය ලැබීය. මේ මහතාගේ ශාස්ත්‍රීය කෘති අතුරෙන් අද දක්වාත් මහත් සම්භාවනාවක් ලබන්නේ සිංහලසාහිත්‍යය පිළිබඳ කරුණු ඇතුළත් දීර්ඝ ප්‍රස්තාවනාවකින් යුත් සිදත්සඟරාවේ ඉංග්‍රීසි පරිවර්තනයයි. කච්චායන ව්‍යාකරණ-ය ද මෙතුමා විසින් ඉංග්‍රීසියට නගනලදී අත්තනගලුවංසය ආදි පොත් කීපයක් ශුද්ධකොට පළකරවනලදී එතුමා නිපදවූ "මංගල සිරිත්," "අශ්වාරෝහණවර්ණනා" ආදී සිංහල කාව්‍ය කීපයක් ද වෙති.

මෙතුමා පළමුවර "ද ලිවේරා" අනපත්තු මුදලිතුමාගේ දියණියක් සමග විවාහ විය. ඒ විවාහයෙන් එකම පුතෙක් ලැබුණි. දෙවෙනිවර ෆ්ලොරන්ස් දියස් මැතිණිය හා විවාහ විය. ඒ විවාහයෙන් "ඇඩ්වින් ද අල්විස්" නමැති පුත්‍රයෙක් ද දූ වරුන් තිදෙනෙකුත් ද ලැබිය. ඒ දූවරුතිදෙන පීටර් ද සේරම් විනිශ්චය කාරතුමා, ඇස් සී උභයසේකර නයිට්තුමා, සර් ෆිලික්ස් ආර්. ඩයස් යන උසස් මහතුන් තිදෙනට පාවා දෙන ලදහ

පසුකලක මෙසේ උසස් තත්වයකට පැමිණි නමුත් මුල්කාලයේ දී තමාගේ දුගීබව කීමට ලජ්ජා නොවූ මේ මහතා විසින් ඒ ගැන

---

* මෙරට මහාලේකම් ධුරය දැරූ පිලිප් ඇන්ස්ට්‍රුදර් මහතාය.

† සර් හැරී දියස් මහතායයි 16-9-49 ලංකාදීපයේ පළවිය

‡ රෙද්ද ඇඳ කෙළින් පනාව ගසා සිංහල ඇඳුමෙන් විනිශ්චයාසනාරූඪවූ පළමුවෙනි සිංහලයා මේ මහතායයි යශෝක්තදිත ලංකාදීපයේ පළවිය.

ලියා තිබෙන ලිපියක් මෙසේයි:- "මාගේ වස්ත්‍ර බොහෝ අපවිත්‍රව කිලුටුව තිබුණේය. සතියකට නොහොත් දසදිනකට වරක් වත් මාගේ කමිසය මාරුකර ගැන්මට මට කවදාවත් නුපුළුවන් විය. මට මුදල් සවල්පයක්වත් තිබුණේනැත. දුම්කොළයක් ගැනීමට වුවමනා සුළු මුදලක් පවා නොමැතිව බොහෝ අසරණ සවභාවයක සිටියෙමි. ශරීරය දුර්වලකරන මේ දුම්කොළ කවෙලෑමේ සිරිත පුරුදුව තිබුණුබව කීම මට කණගාටුවකි. දුම්කොළභාවිතය කැත පුරුද්දකි. ඒ කැත පුරුද්දෙන් වෙන්වන ලෙස සියලුදෙනා-ටම දයාවෙන් දැනුමැතිකම් දෙමි."

දුඃඛිතකාලයේ පැවැත්ම එසේවූ නමුත් නොපසුබට වීර්‍ය ඇත්තාට ශ්‍රී කාන්තාව ලභාකරගත හැකිබව එතුමාගේ තවත් ලියුමකින් පෙනේ:- "නීතිඥධුරයේ වැඩ ආරම්භ කොට දින තුනක් පසුවෙන අතර බලාපොරොත්තු නොවූ තරම් වැඩ ලැබෙන්නට විය. එක දිනක මට ලැබුණු මුදල පවුම් 69 කි. මපියාණන්ගේ අති සමෘඩ දිනවල වීනා ඊට පසු මා දුටු මුදල්-වලට වඩා ලොකු ගණනකි." (මේ ලියුම් පිටපත් කරගනු ලැබුවේ ගන්දර පී. ඩී. ඇස්. වීරසූරිය මහත්මා විසින් සම්පාදිතවූ "සිංහල කවීන්ද්‍රයෝ" නමැති පොතෙනි.)

1860 පමණේදී ආරම්භවූ රාජකීය ආශියාතික සමිතියේ ප්‍රථම සිංහල සභිකයාවූ මේ මහතා 1870 දී ආණ්ඩුවේ ඉල්ලීම් ලෙස ලංකාවේ පුස්තකාලයවල තිබෙන පාලි-සිංහල-සංස්කෘත පුස්කොළ පොත්වල නාමාවලියක් පලකරවිය.

ප්‍රාචීනභාෂාවන්ගේ ව්‍යාපතිය සඳහා මහත් පරිශ්‍රමයෙන් ක්‍රියා කළ මේ මහතා 1878 ජුලි මස 5වෙනිදා පරලොකප්‍රාප්ත විය.

## 51 තුඩාවේ ගුණවර්ධන පඬිතුමා.

(ක්‍රි. ව. 1825-1890)

මාතර පෙදෙසේ තුඩාව නම් ගමේදී 1825 ජුනි 25 වෙනිදා උපන් මෙතුමාගේ මවුපියදෙදෙන නම් "මිල්ලව ආරච්චිගේ දොන් ජානිස් අභයගුණවර්ධන ගුණසේකර" මහතා හා "දොනාදියානා විජයසේකර" හාමිනේය. බාලවියෙහිදීම විනීතභාවයකුත් ඉගෙනීමේ දක්ෂභාවයකුත් දැක්වූ මෙකුමරු පැවිදිකරවීමට ඒ පලාතේ තෙරවරු කීපනමක්ම උත්සාහවත්වූහ. එයින් වැලිගම පොල්වත්තේ තිභූම්කාරාමාධිපති මිරිස්සේ ගුණසාර සථවිරතුමා මෙකුමරු පැවිදිකොට සුමනසාර යන නම තැබීය. කලක් සවකීයාචාර්යවරයා වෙතින් ඉගනීම කළ හෙරණතෙමේ වැඩිදුර

ඉගනීම සඳහා මීරිපැන්නේ ධම්මරතන ස්වාමීන් වහන්සේ වෙත පැමිණියේය. එහිදී එළු-පාලි සංස්කෘත භාෂාතුනම ඉගෙන ව්‍යක්තයකුවූ නමුත් කලකට පසු සිවුරු හැර සියතැයකු සමග වෙළඳාම්කිරීමේ යෙදුණි

මේ කාලයේදී මොහුට මුණගැසුණු ගරු ජේම්ස් ද අල්විස් මහතා මේ මහතාට නුපුරුදු වෙළඳාම හැරදමා පුරුදු ශාස්ත්‍රීය කටයුතුවල යෙදෙන සේ අවවාද කෙළේය. ඒ අවවාදය පිළිගත් හෙතෙමේ කොළඹ නැවතී බොහෝ දෙනෙකුන්ට ඉගැන්වීම කෙළේය. ජේම්ස් අල්විස් මහතා ද මෙතුමාගේ මිත්‍රයෙක්ව සිටගෙන මෙතුමාගෙන් ඉගනීම්ද කෙළේය. 1860දී සිවිල්නිලධාරීන්ට ඉංග්‍රීසි ඉගැන්වීම සඳහා මේ මහතා ආණ්ඩුව විසින් පත්කරනලදී

එකල ඇටර්නිජනරාල් ධුරය දැරූ "චාර්ල්ස් ලෙයාඩ්" මහතා ද, සැළලිහිණි සන්දේශය ඉංග්‍රීසියට නැගූ මැක්කිඩ් දිසාපතිතුමා ද, බී. ගුණසේඛර ආණ්ඩුවේ භාෂාපරිවර්තක මුදලිතුමා ද, ඩබ්ලිව්. පී. රණසිංහ නීතිඥමහතා ද, මහාවංශය ඉංග්‍රීසියට නැගූ විජයසිංහ මුදලිතුමා ද මෙතුමාගෙන් කොළඹදී ඉගෙනගත් ශිෂ්‍යයෝ වූහ. ඩබ්ලිව්. ඈ. ජ්. ගුණවර්ධනවාසලමුදලිතුමා, ජෝන් කවිතිලක පඬිතුමා, රාමඤ්ඤනිකායේ මහානායකව සිටි ඤාණිඤාසභ මහාස්ථවිරතුමා, සද්ධම්මයුත්තික නිකායේ නායකධුරයක් දරමින් ගන්දර විසූ සරණංකර මහාස්ථවිරතුමා ආදීහු මාතරපලාතේදී උගත් ශිෂ්‍යයෝ වූහ

ආණ්ඩුවේ නෝර්මල්විද්‍යාලයේ ආචාර්යපදවියකට ද පත්වූ මේ මහතා සිදත්සඟරාවට පදගත සන්නයක් ලිවීය, සැළලිහිණි සන්දේශය ශුද්ධකෙළේය. මේ අතර වැල්ලවත්තේ විසූ ඈරොන් ෆොන්සේකා ආරච්චිමහතාගේ දුවණියක් විවාහකරගත් මොහුට එක් ගැණුලමයකු ලැබුණු පසු ඒ භාර්යාව කාලයාත්‍රා කළබැවින් දෙවනිවර වැලිගම පැලෑනේ විසූ සේරසිංහ මුහන්දිරම් මහතාගේ බාලසොහොයුරියවූ ජොනගිමාරා සේරසිංහ නමැත්තිය විවාහකොට ගත්තේය. ඒ විවාහයෙන් ද්‍රම්රිය දෙපාතීමේන්තුවේ උසස් ධුර ඉසුළූ පී. පණ්ඩිත ගුණවර්ධන මහතා, පැලෑනේ වජිරඥාන නායක මහාස්වාමීන්වහන්සේ ආදි පුත්තු සත්දෙනෙක් ද දූවරු සිවුදෙනෙක් ද ඇතිවූහ.

පැලෑනේ පදිංචියට පැමිණ නොබෝකලකින් ඒ මහතාට මුහන්දිරම් නාමයක් ලැබුණි. එහි විසූ කාලයේදී "කුසදාවත, මුවදෙව්දාවත, පරෙවිසන්දේශය, කාව්‍යශෙඛරය" ආදි පොත් ද ඒවායේ සන්නද ශුද්ධකරදෙමින් ශාස්ත්‍රසංග්‍රහ කෙළේය. සැට වසක් ආයුවැළඳූ මේ මහතා 1890 දී පරලොකප්‍රාප්තවිය.

(මේ චරිතය ලිවීමට උපකාරවූයේ ප්‍රභාසෝදය සඟරාවේ 1939 යේ ජනවාරි කලාපයේ පළවූ ශාස්ත්‍රාචාර්ය ඩී. ජ්. හෙට්ටි ආරච්චි මහතාගේ ලිපියකි.)

## 52. පාලිභාෂාව යුරෝපයට අඳුන්වාදුන් රොබට් සීසර් චිල්ඩර්ස් මහතා.

(ක්‍රි. ව. 1838-1876)

පළමුවෙන්ම පාලි-ඉංග්‍රීසි ශබ්දකෝෂයක් සම්පාදනය කිරීමෙන් ඒ බසට මහත් සංග්‍රහයක් කළ මේ මහතා නීස්ති ඉංග්‍රීසි සේවා හමුදාවේ දේවගැතිව සිටි ඡ්. චිල්ඩර්ස් මහතාගේ පුත්‍රයෙකි. සූවිසි හැවිරිදි කල්හි 1862 දී ලක්දිව සිවිල්තිලයකට පත්කරනු ලැබූ මේ තෙමේ සර් සී. මැකාර්ති ලංකාණ්ඩුකාරතුමාගේ පෞද්ගලික ලේකම් තැන මෙන් තෙමසක් ක්‍රියාකෙළේය ඉක්බිති මහනුවර උපදිශාපති ධුරයේ කටයුතුකරමින් සිටින අතර 1864 දී රෝගීවූයෙන් යුරෝපයට හැරීයන්ට සිදුවිය. නමුත් මෙහි සිටි අල්පකාලය තුළදී ශාස්ත්‍රාභිලාෂියෙක් වූ මේ මහතා මෙරට මිනිසුන්ගේ භාෂාව හා පොත්පත් ආදිය ගැන ඇල්මක් ඇතිකර ගෙන ඒවා විමසා බැලීය. ටිකකලක් බෙන්තර තානායමේ නැවතී සිටගෙන යාත්‍රාමුල්ලේ ධම්මාරාම මහාසථවිරතුමන් වෙතින් පාලිභාෂාවද ඉගෙන ගත්තේය.

එංගලන්තයේ විසූ මේ මහතා 1869 යේ නොවැම්බර් මාසේදී (එංගලන්තයේ) රාජකීය ආසියාතිකසමිතියේ සඟරාවේ ඉංග්‍රීසි සෝරුම් සහිත බුද්ධඝෝෂාඨය පළකරවිය. 1870 දී Trubner's Literary Record නැමැති සඟරාවේ ද 1871 මැයිමාසයේ දී ආසියාතික සමාගමේ සඟරාවේ ද "ධම්මපදය පිළිබඳ දූතයුතුදේ" යන මැයෙන් ලිපියක් පළකරවමින් නිර්වාණය ගැන තමාගේ අදහසද ලිවීය. 1871 දී පාලි-ඉංග්‍රීසි ශබ්දකොෂයේ ප්‍රථමභාගය පළකරවිය. 1872 දී ඉන්දියාඔෆිස් කෘශීාලයට අයත් පුස්තකාලයේ උපාධ්‍යක්ෂක ධුරයට පත්වූ මේ මහතා පූර්විදිග භාෂාශාස්ත්‍ර පරීක්ෂණයට කැමති වූවන්ට බොහෝ සේ ආධාරකෙළේය. 1873 දී "කෝල්බෲක්" මහතාගේ නිබන්ධයන් ඇතුළත් කොට කොවෙල් පඬිතුමා පළකරවූ පොතට බුද්ධාගමේ අභිධර්මය පිළිබඳ ලිපියක් සම්පාදනය කොට දුන්නේය. ඒ වර්ෂයේදීම ලන්ඩන්නුවර යුනිවර්සිටි කොලේජ් මහාවිද්‍යාලයේ පාලිභාෂාව හා බෞද්ධාගම පිළිබඳ ආචාර්යධුරයට මේ මහතා පත්කරනලදී.

මහාපරිනිර්වාණ සූත්‍රය ඉංග්‍රීසියට නගා 1874-76 යන වර්ෂවලදී කොටස් වශයෙන් පළකරවිය. 1876යේදී පාලි අකාරාදියේ දෙවෙනි (අවසන්) කොටස පළකරවිය තවත් නොයෙක් ශාස්ත්‍රීය කටයුතු කරන්ට ආරම්භකරමින් සිටි මේ තරුණ පඬිවරයා ප්‍රතිශ්‍යාය නිසා ඇතිවූ කාශරෝගයකින් අටතිස් හැවිරිදිකල්හි 1876යේදී පරලෝක ගතවිය. ප්‍රංශ පණ්ඩිතසභාවක් විසින් ඒ වර්ෂයේදී පළකළ පොත් අතුරෙන් ඉතා අගනා පොත ලෙස මේ මහතාගේ පාලි-ඉංග්‍රීසි ශබ්ද-කෝෂය තෝරාගන්නා ලදින් ඒ සඳහා දියයුතු තෑගග මේ මහතාට හිමිවනබව දැනුම්දී ටිකකලකින් මේ මහතාගේ අභාවය සිදුවිය.

මේ ජීවිතකථාව 1876 නොවැම්බර්මාසේ "ද ඉන්ඩියන් ඇන්ටික්වරි" සඟරාවේ පලවූයෙන් 1907තේදී සිංහලට නගා ඥානාදර්ශය සඟරාවේ 9 වෙනි කලාපයේ පළකරනලදී. මාවිසින් එයින් කරුණු උපුටා මෙය සංග්‍රහකරනලදී.

## 53. තෝමස් විලියම් රයිස් ඩේවිඩ්ස් පඬිතුමා.

(1843-1922.)

විල්ඩර්ස් පඬිතුමා විසින් යුරෝපයේ දල්වනලද බෞද්ධධර්ම-ප්‍රදීපය නිවීයන්ට නොදී දිගුකලක් පවත්වා මහත් ප්‍රභාවයෙන් යුක්ත කරනලද්දේ තෝමස් විලියම් රයිස් ඩේවිඩ්ස් නමැති මහ පඬිවරයා විසිනි 'ඈෆ්. බී. ඒ; ඩී ඈස්. සී; පී එච් ඩී; එල්. එල් ඩී; ඩී. ඈල්." ආදී ඉතා උසස් ශාස්ත්‍රීය උපාධි ලැබූ මේ මහතා ද විල්ඩර්ස් මහතා මෙන්ම දේවගැතිවරයකුගේ පුත්‍රයෙකි. එංගලන්තයේ ක්ලොචැස්ටර් පෙදෙසේ විසූ "ටී. ඩබ්ලිව් ඩේවිඩ්ස්" නමැති දේවගැතිතුමාට දාව 1843 මැයිමස 12 වෙනිදා උපන් මේතෙමේ බ්‍රයිටන්හි පාඨශාලාවේ ඉගෙන නීතිඥයකු වීමට තිබුණු අදහස හැර දමා බ්‍රෙස්ලෝ විශ්වවිද්‍යාලයට පැමිණ එහි "ස්ටැන්සලර්" නම් පඬිතුමාගෙන් සංස්කෘත ඉගෙන පී. එච් ඩී උපාධිය ලැබීය. 1864දී ලක්දිව සිවිල්මෙහෙයට පත්වූ හෙතෙම පළමුකොට ආණ්ඩු-කාරතුමාගේ පෞද්ගලික ලේකම්තැන මෙන් වැඩ කෙළේය.

උගතකුව සිටි බැවින් නොබෝ කලකදී සිංහල හා දෙමළ තරමක් දුරට ඉගෙනගත් මේතෙම පසුව විනිශ්චයකාරධුරයට පත්විය (ගාල්ලේ!) දිසෙත්‍රක් විනිශ්චයකාරයාව සිටියදී මෙතුමා ඉදිරියට බෞද්ධවිහාරයක් පිළිබඳ නඩුවක් පැමිණියේය. ඒ නඩුවේ සාක්ෂිවලදී විනය නීති පිළිබඳ ලිපියක් උසාවිය ඉදිරියට ගෙනාවිට අධිකරණශාලාවේ සිටි කිසි නීතිඥයකුට හෝ අනිකකුට එහි තිබෙන භාෂාව තේරුම් කළ නොහැකිවිය බෞද්ධගුරු

ලියවිලි තිබෙන්නේ මේ පාලිභාෂාවෙන්යයි දැනගත් මෙතෙමේ වහාම ඒ භාෂාව ඉගෙනගන්ට අදහස් කෙළේය. ඒ සඳහා ගුරුවරයකු සෙවීමේදී බෙන්තර විසූ යාත්‍රාමුල්ලේ ධම්මාරාම ස්ථවිරතුමා මොහුට හමුවිය. මේ ගුරුවරයාගෙන් ඉගනීම ලබන අතර මේ මහතා පුරාවිද්‍යාපරීක්ෂකධුරයට පත්කරනු ලැබීය. (එංගලන්තයට ගියපසු 1881දී පැවැත්වූ කථාවක මේ ස්ථවිරතුමන් ගැන ඒ මහතා මෙසේ කීය:-

"උක්වහන්සේ පළමුවර මාවෙත පැමිණෙන විට මාරයාගේ හස්තය උන්වහන්සේ වෙත දිගුකොට තිබුණි. දුක් ගෙන දෙන අසාධ්‍ය රෝගයකින්* මරණයට ළංවෙමින් සිටි එවැනි අවස්ථාවක-දීත් තමාගේ අමාරුකම් නොසලකා ආගන්තුකයකුට ඉගැන්වීම සඳහා මාවෙත පැමිණීම ගැන මම උන්වහන්සේට කෘතඥ වීමි.")

පුරාවිද්‍යාධ්‍යක්ෂධුරයට පත් මෙතෙමේ ශිලාලිපි පිටපත් කෙළේය, අනුරාධපුරයේ බොහෝ තැන් පෑදුවේය. සීගිරිය සොයා ගත්තේය. ඒඅතර ලක්දිව බෞද්ධඉතිහාසය ද ඉගෙනගත්තේය. මෙසේ ක්‍රියාකරන අතර වැඩිසිටි නිලධාරියකු හා නොගැළපීමක් ඇතිවී 1872දී සියරටට හැරීගියේය. එහිදී නීතිය ඉගෙන 1877දී මිඩල්ටැම්පල්හි අධිනීතිඥයෙක් විය. නමුත් ඔහු නීතියට ඇල්මක් නොකළබැවින් බෞද්ධපොත් ඉංග්‍රීසියට නැගීමේ යෙදුණේය. 1871දී රාජකීය ආසියාතික සමිතියේ සඟරාවෙහි "පරාක්‍රමබාහුගේ ශිලාලිපි," 'සීගිරි හෙවත් සිංහපර්වතය" ආදී ලිපි පළකරවිය

මේ මහතා ලක්දිව හැරයන්ට අවුරුදු අටකට උඩදී චිල්ඩර්ස් මහතා එංගලන්තයට පැමිණ සිටියේය. ඒ කාලයේදීම ස්පැන්ස්-හාඩි මහතා සිංහලපොත් ඇසුරයෙන් බුද්ධාගම ගැන ලියූ පොත් දෙකක් පළව තිබුණාය. ඩෙන්මාර්ක්රටේ ෆවුස්බෝල් මහතා ද වර්තා බෞද්ධග්‍රන්ථයන් පළකරමින් සිටියේය. 1872-1876 යන වර්ෂ-වලදී චිල්ඩර්ස් මහතාගේ පාලි අකාරාදිය පළවිය. 1869 යේ සිටම රයිස්ඩේවිඩ්ස් මහතා චිල්ඩර්ස් මහතාට ආධාර කරන්නෙක් විය. ලංකාවේදී සැලුණු කැලෑ උණෙන් බොහෝ පීඩා විදිනමුත් ඩේවිඩ්ස් මහතා පාලිභාෂාව ඉගනීම අත්නොහළේය. තමා ලක්දිවින් ගෙනා දීපවංසය මුද්‍රණය කරවීමට සිතමින් ඉන්නාවිට ඉන්දියා ඔෆිස් මහාකාර්යාලයේ විනයපිටකය මුද්‍රණයට පිළියෙළ කරමින් සිටි "ඕල්ඩන්බර්ග්" මහතා එතුමා වෙත පැමිණ දීපවංස මුද්‍රණය ගැන කථාකෙළේය. තමා ඒ වෙනුවෙන් එක්කොට තිබුණු දේ ඒ ආචාර්යතුමාට පෙන්නූවිට ඒ මහතා මහත් ප්‍රීතියට පත්විය.

---

* මේ රෝගය නම් මුත්‍රකෘච්ඡාව බව දැනගන්ට තිබේ.

1887 දී රයිස්ඩේවිඩ්ස් මහතා "ලක්දිව පුරාණ මැණුම් හා කාසි (Ancient Coins and Measures of Ceylon) නමැති පොත පළකරවිය බෞද්ධාගමේ සාරාංශය උපුටා සංග්‍රහකළ The Buddhism (බෞද්ධාගම) නමැති පොත 1878 දී මුද්‍රණයට පැමිණ විය ඒ පොත කෙතරම් ජනප්‍රියවීදැයි කියතොත් 1914 වෙන විට එය විසිතුන් වරක් මුද්‍රණය කරන්ට සිදුවිය නිර්වාණය සම්පූර්ණ විනාශයක් නොවේයයි පළමුවෙන් යුරෝපයේ පළකර හරිනලද්දේ මේ පොතෙනි.

ෆවුස්බෝල් මහතා ශුද්ධකොට පළකරවූ ජාතක අටුවාවේ මුල්කොටස මේ මහතා විසින් ඉංග්‍රිසියට නගන ලදින් 1880 දී පළවිය. ඊළඟ වර්ෂයේදී "පෙරදිග ශුද්ධපොත් Sacred Books of the East" යන පොත් පෙළේ 11වෙනි පොත වශයෙන් තෝරාගත් බෞද්ධසූත්‍ර කීපයක පරිවර්තනයක් මේ මහතා විසින් පළකරවන ලදී ඒ පොත් පෙළේම පළවූ විනය පොත් තුනක පරිවර්තනයන් සඳහා මේ මහතා ඕල්ඩන්බර්ග් පඬිතුමාට සහායවිය.

මෙසේ ක්‍රියාකරන අතර යුරෝපයේ නොයෙක් පුස්තකාලයන්හි තැන් පත්ව තිබුණු මුද්‍රණයට නොපැමිණි ත්‍රිපිටකයට අයත් පාළිපොත් මුද්‍රණයකරවීම සඳහා "පාළිපොත් සමාගම" The Pali Text Society නමැති සමිතිය 1882 දී ආරම්භ කෙළේය මුලදී බොහෝ අපහසුවෙන් ගෙන ගිය මේ සමිතිය මගින් කෙතරම් ලෝකාර්ථ සිද්ධියක් වීද යන්න දැන් බොහෝදෙනෙකුන් දන්න කාරණයකි දැන් අවුරුදු 67 ක් ගතවීත් නිරුපද්‍රැතව පවත්නා මේ සමිතිය විසින් ත්‍රිපිටක පෙළපොත් හා එම අටුවා පොත් කාණ්ඩ 141 ක් මුද්‍රණයට පමුණුවා තිබේ (මෙයින් ඇතැම් පොත් කාණ්ඩවල පිටු 400-500 පමණත් ඇත්තාහ.) මෙපමණකින් නොනැවතුණු සමිතිය ඒ පොත්වල ඉංග්‍රීසි පරිවර්තන ද පළකරවීමට පටන්ගෙන දැන් කොටස් 28 ක් පළකොට තිබේ. අන්‍යසමිති ලවා පළකරවූ පරිවර්තන කොටස් 16 ක්ද ඇත්තාහ.

මේ සමිතිය නමැති වෘක්ෂයේ හටගත් ඉතා අගනා ඵලය නම් චිල්ඩර්ස් මහතාගේ පාලි අකාරාදිය පළවූ තැන් සිට අවුරුදු 40 ක් මුළුල්លේ රයිස්ඩේවිඩ්ස් මහතා ඇතුළු පඬිවරුන් කීපදෙනෙකුන්ගේ උත්සාහයෙන් සම්පාදිතවූ පාලි-ඉංග්‍රිසි මහාශබ්දකෝෂයයි.

1882 දී ලන්ඩන් විශ්වවිද්‍යාලයේ පාලිමහාචාර්යතැන මෙන් පත්කරනු ලැබූ මෙතුමා 1904 දක්වා ඒ තනතුර දැරීය 1885 සිට 1904 දක්වා රාජකීය ආසියාතික සමිතියේ ලේකම්තැන ද පොත් ගුලේ භාරකාරයා ද වෙමින් තවත් නොයෙක් ශාස්ත්‍රීය කටයුතුවල

යෙදුණි. මිලින්ද ප්‍රශ්නය සම්පූර්ණයෙන් ඉංග්‍රීසියට නැඟූ මෙ මහතා එහි 1 වෙනි කොටස 1890 දී ද දෙවෙනි කොටස 1894 දී ද පළකරවිය. සම්පූර්ණ දීඝනිකාය ඉංග්‍රීසියට නඟනලදින් 1 වෙනි කොටස 1889 යේදී ද දෙවෙනි කොටස 1910 දී ද තෙවෙනි කොටස 1921 දී ද පළවූහ.

1894 දී ඇමෙරිකාවට පැමිණි ඒ මහතා එහි හාවර්ඩ් විශ්ව විද්‍යාලයේදී "බෞද්ධාගම හා එහි ඉතිහාසය හා සාහිත්‍යය" සම්බන්ධ කථා පත්තියක් පැවැත්විය. ලක්දිව සිටි නමුත් ඉන්දියාව නොදුක සියරටට හැරී ගිය බැවින් ඉන්දියාව දැකීමට බලවත් ආශාවක් ඇතිකරගත් ඒ මහතා 1899-1900 යන වර්ෂ දෙක අතරේ දී ඉන්දියාවට පැමිණ බුද්ධගයාව ආදි බෞද්ධ ශුද්ධස්ථානයන් බැලීමට ගියේය. බුද්ධාගම පැතිර තිබුණු භාරතීය රටවල් පිළිබඳව මෙතුමා ලියූ බෞද්ධභාරතය හෙවත් Buddhist India නමැති පොත මේ ගමනේ ප්‍රතිඵලයකි. පළමුවෙන් 1903 දී මුද්‍රිතවූ මේ පොත අදත් ආධුනිකයන්ට මහත් වැඩ සාදදෙමින් අගයෙන් අඩුනොවීම පවතී. ඒ ගමනේදී එකල අග්‍රාණ්ඩුකාරව සිටි කර්සන්සාමි වෙත ගොස් ඉන්දියා ඉතිහාසය පිළිබඳ පොත් පෙළක් පළකරවීමේ පිළිවෙලක් පෙන්වා සිටියෙන් 1900 දී ආසියාතික සමිතියේ කාරක සභාව විසින් ඒ පිළිවෙළ පිළිගන්නාලදී.

1904 දී මේ මහතා මැන්චැස්ටර්හි වික්ටෝරියා විශ්ව විද්‍යාලයේ සමාන ආගම් පිළිබඳ ආචාර්යධුරය බාරගත්තේය. මේ ආචාර්යධුරය එංගලන්තයේ පළමුවෙන්ම පිහිටුවනලද්දේ මේ අවස්ථාවේදීය. 1905 දී මෙතුමා ලන්ඩන් නගරය අත්හැර මැන්චැස්ටර් නුවර පදිංචියට ගියේය. 1908 දී පුරාණ බුද්ධාගම Early Buddhism නමැති පොත ලියා පළකරවිය "ඉන්දියාවේ කේම්බ්‍රිජ් ඉතිහාසය" නමැති පොතේ පළකරවීම සඳහා "බෞද්ධයන්ගේ පුරාණ ඉතිහාසය" ද ලියා දුන්නේය.

1908 දී ඩෙන්මාර්ක් රටේ කෝපන්හේගන් නුවර පැවැත්වූ ප්‍රාචීනභාෂා පිළිබඳ මහා සම්මේලනයේදී ජාත්‍යන්තර සම්බන්ධයක් ඇතිකොට පාලි මහාශබ්දකෝෂයක් පිළියෙළකිරීම සඳහා එක් එක් අකුරට අයත් වචන එක්කිරීමට නොයෙක් රටවල සිටි පඬිවරුන්ට බාරදෙනලදී. නමුත් ප්‍රථම මහායුද්ධය නිසා එහි කටයුතු බොහෝසේ ප්‍රමාද වූහ. වයසින් හා උපාධිවලින් පිරුණු රය්ස් ඩේවිඩ්ස් පඬිතුමා 1915 දී මැන්චැස්ටර් නුවර හැරගියේය. එයින් යන්තපෙර ඇඩින්බරෝ විශ්වවිද්‍යාලයෙන් ඇල් ඇල්. ඩී. උපාධිය ද මැන්චැස්ටර් විශ්වවිද්‍යාලයෙන් ඩී. ඇල්. උපාධිය ද

කෝපන්හේගන් ෂැෆීල්ඩ් විශ්වවිද්‍යාලය දෙකෙන් ඩී. ඇස්. සී. උපාධිය ද ලැබී තිබුණි. 1902 දී පිහිටෙව් ශිල්පශාස්ත්‍ර පිළිබඳ මහාවිද්‍යාලයේ ආදිකතෘවරයා මෙතුමාය.

1912 හේදී ග්‍රීසියේ ඇතැන්ස් නුවර පැවැත්වූ ප්‍රාචීනශාස්ත්‍රඥයන්ගේ මහාසම්මේලනයට පැමිණීමට එරට ආණ්ඩුවෙන් ආරාධනාලත් එතුමා එහි ගියේය. එහිදී බොහෝ ශාස්ත්‍රඥයන්ගේ ගරු සම්භාවනා ලබා සියරටට හැරීගිය ඒ මහතා සරේ දිස්ත්‍රික්කයේ චිප්ස්ටෙඩ් ගමේ නැවතී "මැන්චැස්ටර් ගාඩියන්" පත්‍රයට වැදගත් ලිපි සපයන අතර පාලි අකාරාදියේ වැඩවල යෙදී සිටියේය. ඒ කාලයේදී ඒ කටයුත්තට ඩබ්ලිව්. ස්ටීඩ් නම් මහතකු ද සහායකර ගත්තේය. ඩේවිඩ්ස් පඬිතුමා ජීවත්ව සිටියදී ශබ්දකෝෂයේ කොටස් තුනක් පමණක් පළකරන්ට හැකිවූ බැවින් අවුරුදු 40 ක් මුළුල්ලේ පඬිවරුන් කීපදෙනෙකුන්ගේ උත්සාහයෙන් සම්පාදනය කළ මේ බැරෑරුම් වැඩේ අවසන් කිරීම අන්තිමේදී ආචාර්ය ස්ටීඩ් මහතා වෙත පත්විය. මහලු වයසේ වේදනා උපදවන රෝගවලින් පෙළී සිටියදීත් මේ පඬිතුමා ශබ්දකෝෂයේ කටයුතුවලට නිතරම ස්ටීඩ් මහතාට උපකාරවිය. තමාගේ යහපත් වැඩවල ප්‍රතිඵල දකිමින් ප්‍රීතිමත්ව සිටි මෙතුමා අසූවෙනි වයසේදී 1922 දෙසැම්බර් 27 වෙනිදා නියුමෝනියා රෝගයෙන් අපවත්විය.

ලන්ඩන්හි ප්‍රාචීනමහාවිද්‍යාලය පිහිටුවීමට මෙතුමාගේ නොපසුබට උත්සාහයම හේතුවූ බව වාර්තාවල දක්වා තිබේ. ඉගැන්වීම හා පොත්පත් ලිවීම කරන අතරම මේ මහතා නොයෙක්විට බුද්ධාගම පිළිබඳ ප්‍රසිද්ධ කථාවන් පැවැත්විය. නොයෙක්විට කම්කරු ජනයාට බුද්ධාගම දේශනා කළබවත් අසන්ට ලැබේ. වෘද්ධාවස්ථාවේදී රෝගීවූ සිටගෙනත් පාලිඅකාරාදියේ වැඩ සම්පූර්ණ කිරීමට කෙතරම් උත්සාහවත්ව සිටියේද යත් ඇතැම්විට පෑන අතේ තිබියදී ඇස්දෙක පියවී යන බව කියාතිබේ. එතුමන් සමඟ ඒ වැඩවල යෙදී සිටි ආචාර්ය ස්ටීඩ් මහතා විසින් පාලි ශබ්දකෝෂයේ 4 වෙනි කොටසේ සංඥපනයේ මෙසේ දක්වා තිබේ:- "එතුමා අවුරුදු පහක් රෝගීව සිටි නමුත් වැඩකිරීමට ඇති ආශාව කිසිසේත් අඩුනොවීය; සිතේ පැහැදිලිකම නොවැසී තිබුණි. මා ආ සැමවිටම එතුමා සතුටට පත්විය. ශීතකාලයේ ඇතැම් සන්ධ්‍යාවලදී එතුමාගේ චිප්ස්ටෙඩ්හි පිහිටි ගෙයි වාඩිවී අපි දෙදෙන නොයෙක්විට බෞද්ධන්‍යායශාස්ත්‍රය හා පාලිභාෂාව ගැන කථා කෙළෙමු. එකල්හි ඔහුට තිබුණු සියලු වේදනා යටපත්වූහ, ඇස් දීප්තිමත්වී මූණ ද බැබළුණේය."

මේ මහතා ලක්දිව සිටි කාලයේදී මෝටෝරිය තබා දුම්රියවත් මෙහි නොතිබුණි. එකල ගමන් කිරීම අශ්වරථ ආදියෙනි. මේ මහතා අසකුපිට නැග ඇතැම්විට ගමන් කළබව පෙනේ. එසේ ගිය ගමනක විස්තරයක් එතුමා විසින් පොතකට ලියාදුන් සංග්‍රහයක දක්නාලැබේ. ඒ පොත නම් "මේරි ඇල්. හෙඩ්ලොක්" නමැති ග්‍රන්ථකර්තෘවරිය විසින් 1910 දී බාලයන්ගේ ප්‍රයෝජනය සඳහා ලියූ ජාතකකථා ඇතුළත් එකකි එය මෙසේයි:-

"එක් රාත්‍රියකදී ගාල්ලේ සිට කොළඹට අසුපිටින් ගමන් කළ සැටි මට සිහිවේ. මාර්ගය මුහුදුවෙරළ දිගේය. වම් පැත්තේ ඉන්දියන් සාගරය විය. දකුණු පැත්තේ ගණන්කළ නොහැකි තරම් පොල්ගස්වල මුදුන් උයන්වැනි තණබිම් මත්තෙහි වැනෙමින් තිබුණාහ. ඒ ගස්යට ඒ මේ තැන ගම්වැසියන්ගේ කුඩාගෙවල් වූහ. එක් තැනකදී තණබිමක රැස්වහුන් පිරිසක් දැක මේ සඳපහනැති රෑ ඔවුහු කුමක් සඳහා පැමිණ සිටිත්දැයි දැනගැනීම පිණිස මම එහි ගියෙමි එහි අණ්ඩාකාර ලෑලි තට්ටුවක් තිබුණි. කහ සිවුරු පොරවාගත් භික්ෂූහු පුස්කොළපොත් උකුලේ තබාගෙන වාඩිවී උන්හ. එක් නමක් නැගිට එහි සිටි පිරිසට කථාවක් කෙළේය. මේ දේශනා කළේ ජාතක කථාවකි. තමන්ගේ ඉතා හොඳ ඇඳුම් ඇඳගත් බාල-මහලු-ස්ත්‍රී-පුරුෂයෝ රාත්‍රිය මුළුල්ලේ මැලිකමක් නැතිව සතුටින් යුතුව මේ කථාවන් ඇසූහ. ඇතැම් විට ඔවුහු ළඟ ඉන්නා අයවලුන් සමග සෙමින් සෙමින් කථාකළහ. ඇතැම් විට සෙමින් නැගිට ගොස් කැමති විට හැරී ආහ. මේ අවස්ථාවන්හි ගෞතමයන්වහන්සේගේ ඉගැන්වීමට එකඟවූ කරුණා-සහගතභාවය මෘදුවූ සඳඑළිය සමග ඔවුන්කෙරෙහි දකින්ට තිබුණි."

මේ මහතාගේ ඇවෑමෙන් පසු පාලිපොත් සමාගමේ හැම කටයුතුම සොයාබලා පවත්වාගෙන ගියේ ඒ මහතාගේ භාර්යාව වූද මහාබෞද්ධ පඬිවරියක්සේ ලොව ප්‍රකටවූද කැරොලයින් ඒ. ඇෆ්. රිස්ඩේවිඩ්ස් මැතිණිය විසිනි. ඇම්. ඒ; ඩී ලිට්. උපාධි ලබා සිටි මේ මැතිණිය බොහෝ කලක් ලන්ඩන්විශ්වවිද්‍යාලයේ බෞද්ධදර්ශනය පිළිබඳ ආචාර්යධුර දැරීය. ලක්දිවට හෝ ඉන්දියාවට කිසිවිටක නොපැමිණි මේ මැතිණිය ස්වකීය ස්වාමිපුරුෂයාගෙන්ම පාලි භාෂාව හා බුද්ධධර්මය ඉගෙනගති. ඈය විසින් 1. විභංගප්‍රකරණය, 2. යමකප්‍රකරණය, 3. දුකපට්ඨානය, 4 යමකපට්ඨාන දෙකේ අටුවා, 5. විසුද්ධිමග්ග, 6 පුග්ගලපඤ්ඤත්තිඅටුවා යන පාලිපොත් ශුද්ධකරන ලදහ. අභිධර්මාර්ථසංග්‍රහය, ධම්මසංගණිය, කථාවත්ථුව යන

අභිධර්මපොත් ඉංග්‍රීසියට නගනලදහ. සම්පූර්ණ විසුද්ධිමාර්ගය හා සංයුක්තනිකාය අන්‍යයන්ගේ සහාය ඇතිව ඉංග්‍රීසියට නැගීය. “බෞද්ධ චින්තන ධර්මශාස්ත්‍රය” ආදිය සම්බන්ධ බෞද්ධපොත් කීපයක් වෙන් වශයෙන් ලියා පළකරවීය. “Outlines of Buddhism” “Gotama the Man” “The Sakya” යන පොත් ඒ අතරෙහි වෙති. සවකීය ස්වාමිපුරුෂයා මෙන්ම පාලිපොත් සමාගමේ කටයුතු ගැන උත්සාහවත්ව ක්‍රියාකළ මෙතුමිය විසින් ඒ සමිතියේ කටයුතු සම්බන්ධයෙන් (ලේකම් හා සභාපති වශයෙන්) මවෙත එවූ ලිපි 148 කටත් වැඩිය. 1941 පෙබරවාරි 19 වෙනිදා මවෙත එවූ ලිපියක ජර්මනුන්ගේ බෝම්බයකින් සමාගමට අයත් පොත් ගබඩාවකට ගිනි ඇවිලී පොත්කාණ්ඩ දහස්ගණනක් දැවිය බව ලියා තිබුණි. ඒ මැතිණියගේ අන්තිම තැපැල්පත මට ලැබුණේ 1942 යේ අගෝස්තු 20 වෙනිදාය. එය එංගලන්තයෙන් තැපැල්කර තිබුනේ ඒ වර්ෂයේ මැයි 11 වෙනිදාය. මේ ලිපිය මට ලැබෙන විට ඇය පරලොවගොස් සිටිබව පුවත්පත් මගින් දැනගන්ට ලැබුණි. මේ කාලය යුද්ධයේ දරුණු අවස්ථාවක් වූ බැවින් මරණය ගැන වැඩි විස්තර දැනගන්ට නොලැබුණි.

## 53. විල්හෙල්ම් ගයිගර් මහපඬිවරයා.

(1856-1945 පමණ.)

මහාවංශපෙළ ශුද්ධකොට එංගලන්තයේ මුද්‍රණය කරවීමෙන්ද එය ඉංග්‍රීසියට නගා පළකරවීමෙන් ද ගයිගර්මහතාගේ නම ලාංකිකයන් අතර ප්‍රකට වූවකි. එසේම සිංහල මහාඅකාරාදියට ගුරුකම්දීම සඳහා ඒ මහතා මෙහි පැමිණ සිටි බැවින් බොහෝ දෙනෙක් එතුමා ගැන දනිත්. ජර්මනියේ බැවේරියාවේ අගනුවර වූ මියුනික් පෙදෙසෙහි 1856 දී උපන් මෙතුමා මියුනික් විශ්වවිද්‍යාලයේ ඉන්දියානු-ඓරේනීය භාෂාවන් පිළිබඳ ආචාර්යධුරය දැරීය. බෞද්ධ සාහිත්‍යය ගැන මහත් ඇල්මක් දක්වූ මේ මහතා පළමුවර 1895 හේදී ලක්දිවට පැමිණියේය. මෙහිදී සිංහලභාෂාව ගැන පරීක්ෂණ පැවැත් වූ ඒ මහතා 1897 දී Sinhalischen Etymologie නමැති සිංහලනිරුක්තිය පිළිබඳ ග්‍රන්ථයක් පළකරවීය 1900 දී Litteratur und Sprache der Singhalischen (සිංහලයන්ගේ භාෂාව හා සාහිත්‍යය) නමැති පොතක් පළකරවීය.

අපේ “දීපවංස-මහාවංස” යන පාලි ඉතිහාස පොත් දෙක ගැන විවේචනයක් ඒ මහතා විසින් ජර්මන් බසින් ලියනලදින් 1905 දී ලයිප්ජගින් නුවරදී පළවිය. ඒ පොත “ඇතැල් ඇම් කුමාරස්වාමි” මැතිණිය විසින් ඉංග්‍රීසියට නගනලදින් 1908 දී

ලංකාණ්ඩුව විසින් මුද්‍රණය කරවනලදී. ඒ මහතා බුරුම-කාම්බෝජ-සිංහල පුස්කොළපොත් ආදිය ගලපා බලා මහත් වෙහෙසකින් ශුඩකල මහාවංශ පෙල 1908 දී එංගලන්තයේ පාළි පොත් සමාගම විසින් පලකරනලදී. එසේම ශුඩකල චූලවංශ පෙල 1925 දී ඒ සමිතිය මගින්ම පලවිය. මහාවංශයේ ඉංග්‍රිසි පරිවර්තනය ලංකාණ්ඩුවේ ආධාර ඇතුව පාළිපොත් සමිතිය විසින් 1925 දී පලකවරනලදී. චූලවංශ පරිවර්තනයේ මුල්කොටස 1929 යේදී ද දෙවෙනි කොටස 1930 යේදී ද ඒ පිළිවෙළින්ම පලකරනලදී.

මේ මහතා සිංහල අකුරු ලිවීමට ද පාළියෙන් ලියුම් ගැලපීමටද සමර්ථව සිටියේය. 1928 දී මා ස්විට්සර්ලන්තයේ සිටින බව දැනගත් මේ පඬිතුමා පාළිභාෂාවෙන් ගලපා සිංහල අකුරෙන් ලියූ ලියුමක් ජර්මනියේ සිට මා වෙත එවීය. එතැන් පටන් නොයෙක් කාරුණ්‍ය සම්බන්ධයෙන් මා හා ලියුම් ගනුදෙනු කල මේ මහතා අන්තිම වර සිංහල මහාශබ්දකෝෂයේ වැඩට උපදෙස් දීම සඳහා ලක්දිවට පැමිණසිටි කාලය තුලදී 1932 ජනවාරි 16 වෙනිද මා දැකීම සඳහා පොල්වත්තේ අගාරාමයට පැමිණියේය. මෙහිදී මහත් ගෞරවයෙන් පිළිගනු ලැබූ මෙතුමාට ඒ මහතා ළඟ නොතිබුණු පාළිපොත් කීපයක් ද මෙරට ගැටපත්වලින් වියූ විශාල රටා පැදුරක් ද පරිත්‍යාග කෙළෙමි. ඒ පැදුර එරටට ඉතා වටිනා එකක් බව ඒ මහතා ප්‍රකාශකෙළේය.

මේ මහතා දෙවෙනි වර ලක්දිවට පැමිණියේ 1926 දීය. ඒ ගමනේදී සචකීය මිත්‍ර ඒ මැන්දිස් ගුණසේකර මුදලිතුමන් හමුවීම සඳහා බලපිටියට අවුත් මහාවංශ-චූලවංශ පොත්වල සඳහන්වෙන දුටුගැමුණු රජු යුඩකරමින් ගිය මාගීයත්, පරාක්‍රමබාහු රජු යුඩ කල පෙදෙසුත් දැනගැනීම සඳහා මාගම්පත්තුවේ ද ඌවපලාත ආදියෙහිද සංචාරක ගමනක යෙදුණි. තෙවෙනිවර එතුමා ලක්දිවට පැමිණෙනවිට වයස 76 ක් පමණ විය. එතුමාගේ 75 වෙනි ජන්මෝත්සවය පවත්වනලද්දේ 1931 ජූලි මස 21 වෙනිදාය. ඒ ජන්මොත්සවය සිහිපත්කිරීම සඳහා එතුමාගේ ශිෂ්‍යයන් හා මිත්‍රයන් විසින් නානා ශාස්ත්‍රීය නිබන්ධයන් ඇතුලත් විශාල අනුස්මරණ සංග්‍රහයක් මුද්‍රණය කොට ඒ මහතාට පිළිගන්වනලදී. ඒ ග්‍රන්ථයෙහි මා විසින් සම්පාදිතවූ පාළි ගාථා පනතියක් ද ඇතුලත්ව තිබේ. ටිකකලක් මෙහි වැස ජර්මනියට ගිය පසුත් නොයෙක්විට මා වෙත ලියුම් එවූ මේ මහපඬිවරයා දෙවෙනි මහා යුඩය පවත්නා කාලයේදී පරලෝක ගතවිය.

## 54. සයිමන් ද සිල්වා වාසලමුදලිතුමා.

(ක්‍රි. ව. 1840-1922)

මෙය ලියන මා පාඨශාලාවේ අකුරු ඉගනීමට ගිය කාලයේදී පාඨශාලාවල භාවිතයට පැමිණ තිබුණු කියවීම්පොත් සියල්ල (හෝඩියේ සිටම) සම්පාදිතව තිබුණේ සයිමන් සිල්වා මුදලිතුමන් විසිනි. එකල මෙකල්හි මෙන් දුසිම්ගණන් කියවීම් පොත් නොතිබුණු බැවින් පොත් තෝරාගැනීම සඳහා ගුරුවරුන්ට හෝ ශිෂ්‍යයන්ට වෙහෙසක් නොවීය. ඒ කියවීම් පොත් අදත් පාඨශාලාවල පාවිච්චි කරනුලැබේ නම් යහපතක්ම සිද්ධවෙන බව මගේ වැටහීමයි. ඒ පොත්වල යහපත් උපදේශද සිංහල කවි ද ඇතැම් තැන සංස්කෘත ශ්ලෝක ද ඇතුලත් වූහ. සවෙනි පොත දක්වා ඒ පාඩම්පොත් ඉගෙනගත් මට ශ්ලෝකාදිය කියවීමට කිසි අපහසුවක් නොවීය.

මේ පොත් සම්පාදනය කළ මුදලිතුමා රාජගුරු ශ්‍රී සුභූති නායකස්වාමීන්වහන්සේගේ බෑනාකෙනෙකැයි අසන්ට ලැබේ. කළුතර දිස්ත්‍රික්කයේ වස්කඩුව නම් ගමේදී 1840 සැප්තැම්බර් මස 17 වෙනිද උපන් මේතෙමේ බාලකාලයේදීම ධාරණශක්ති ආදියෙන් යුක්ත විය. සැන්ට් තෝමස් විද්‍යාලයෙන් ඉංග්‍රීසි ඉගනීම කළ මේතෙමේ කල්කටා විශ්වවිද්‍යාලයේ පරීක්ෂණයකින් ද සාමර්ථ්‍යය ලැබ 1866 දී ආණ්ඩුවේ පාඨශාලාචාර්යවරයෙක් විය, 1878 දී මේ මහතා අධ්‍යාපන මණ්ඩලයේ භාෂාපරිවර්තක ධුරයට පත්කරන ලදී. එහි කටයුතු මනාසේ ඉටුකළ බැවින් 1883 දී මේ මහතාට මුදලිනාමය ලැබුණි. බී. ගුණසේකර මුදලිතුමාගේ ඇවෑමෙන් මහලේකම්කාර්යාලයේ ප්‍රධාන භාෂාපරිවර්තක ධුරය මේ මහතාට පවරනලදී. මින් පසු එතුමාට වාසලමුදලි නාමය ද ලැබුණි.

පැලියගොඩ විද්‍යාලංකාර පරිවෙණාධිපතිව වැඩවිසූ රත්මලානේ ධම්මාලෝක, ධර්මාරාම යන ස්වාමීන්වරුන්ගෙන් ප්‍රාචීන භාෂා පිළිබඳ පවුත්වයක් ලැබූ මේ මහතා විසින් ලංකාකථාව නම් ඉතිහාස ග්‍රන්ථය ද ශබ්දානුශාසනය නම් සිංහල ව්‍යාකරණය ද සිංහලෙන් ඉංග්‍රීසි ඉගනීමට උපකාරවන අභ්‍යාස සහිත පොතක් ද පාඨශාලා කියවීම්පොත් පෙළක් ද සම්පාදිතවූහ. උම්මග්ගජාතකය සුබකොට පලකරවීය. මෙතුමාගේ පොත් අදත් ගෞරවාදරයට පාත්‍රව පවතින්.

ගම්පොල විසූ ප්‍රකට වෙළඳ මහතකුගේ දූවක්වූ ඇන්තනි නමැති කාන්තාව සරණපාවාගත් මෙතුමාට දරුවෝ සිවුදෙනෙක්

වූහ. මෙතුමා කළ උසස් සේවයට ගෞරවයක් වශයෙන් 1920 දී මුළු ලක්දිව සමාදානවිනිශ්චයකාර ධුරයකට පත්කරනුලැබූ මේ මහතා අනූදෙවසක් ආයුවළඳා 1922 සැප්තැම්බර් මාසයේ 23 වෙනිදා අභාවප්‍රාප්තවිය.

මේ මහතා සිය අත්අකුරෙන් ලියා මවෙත එවූ ලිපි දෙකක් මාළඟ තිබේ. ඉන් එකක් මෙසේයි:-

“30. 10. 18

සතුති පෙරටුකොට ලියා එවමි,

මා තමට එවූ ලියමන ගැන සතුතිකරමි, ඒ ලියමනේ සඳහන් පොත් දෙක එනම් “නාමරූපපරිච්ඡෙද පොරණටීකා” “පරමත්ථ විනිච්ඡය පොරාණටීකා” යන පොත්දෙක තවම මට ලැබී නැ. ඒ පොත් දෙක මේ ලියමන ගෙන එන අය අතේ එව්වොත් මෙහේදී කොපිකරවාගෙන ප්‍රවේසමින් එවමි. මෙය ලොකු උපකාරයක් වශයෙන් සලකමි. මා සමඟ කී කාරණය ගැන මම හැකිතරම් හිතට ගතිමි.

මීට නොවෙනස්,

Simon de Silva.”

මෙකියන පොත් සියම්රටේ නැති බැවින් ඒවා මෙහි තිබෙතොත් සොයා එවනලෙස සියම් ආණ්ඩුවෙන් ලංකාණ්ඩුවට දන්වනලදින් ඒ කටයුත්ත මේ මුදලිතුමාට බාරකර තිබුණි. ලක්දිවත් නැති ඒ පොත් දෙක මා විසින් බුරුමරටෙන් ලියා ගෙනැවිත් තිබුණ බැවින් ඒ සඳහා දියහැකිවිය. මේ මහතා අන්තිමකාලයේදී තමාගේ පුත්‍ර නීතිඥමහතකු විසූ බොරැල්ලේ කොටාරෝඩ් පාරේ නිවසක විසීය. 1920 පමණේදී දිනක් මම කුඩාකල සිට තම දූන සිටි මේ මහලු පඬිවරයා දකීම සඳහා ඒ ස්ථානයට ගියෙමි. මා සාදරයෙන් පිළිගත් ඒ මහතා නිහතමානී සත්පුරුෂයකු බව පෙනුණි. එකල අනූවක් පමණ වයස් ගතවී සිටි නමුත් එතුමාට ඉන්ද්‍රියවිකලත්වයක් නොවිය. හැටපහකට වඩා වයස්ගත වූවෙක යන හැඟීමක් එතුමා දුටු මට ඇතිනොවිය.

## 56. ශ්‍රී ධර්‍මසෙන විද්‍යාසාගර පඬිතුමා.

(ක්‍රි. ව. 1861–1924)

මගේ ආචාර්‍ය්‍යපරම්පරාවට අයත් මේ පඬිවරයාගේ චරිතය මාගේ භාෂාවෙන් ලියනවාට වඩා 1936 යේදී මහාචාර්‍ය්‍ය ඩී. ජ්. හෙට්ටිආරච්චි මහතා විසින් සම්පාදිතව ප්‍රභාෂෝදය සඟරාවේ පලවූ වාක්‍යයන්ම උපුටා දක්වීම යෙහෙකැයි සිතමි. මේ මහතා ණ - න - ල - ළ වාදයේදී ශ්‍රී ධර්‍මාරාම නායකමාහිමියන්ට විරුඩ පක්ෂයේ සිටගෙන වාදකළ බැවින් පැලියගොඩින් නිකුත්වූ සඟරාවක මෙය පලවීම එහි වැදගත්කම වැඩිවීමට තවත් හේතුවකි.

"ලංකාතලයා ශාස්ත්‍රාලොකයෙන් බැබලවූ පණ්ඩිතොත්තමයන් අතුරෙන් උච්චස්ථානයක ලා ගිණියයුතු දෙඩන්දූවේ ශ්‍රී ධර්‍මසේන පඬිතුමා ශ. ව. 1782 ක්වූ පොසොන්මස අට දියවක්ලත් කුජදිනැ දෙඩන්දූවේ සියනිවසෙහි ජාතවිය.* මොහු බාලකල්හිදීම ප්‍රඥාපාටවයෙන් ආචාර්‍ය්‍යවරාදීන්ගේ චිත්තාරාධනය කරමින් ශිල්ප උගත්තේය. දිනක් දෙඩන්දූවේ ශෛලබිම්බාරාමාධිපතිව වැඩවිසූ පූජ්‍ය පණ්ඩිත ශ්‍රී පියරතනතිස්සාභිදාන නායක ස්ථවිරපාදයන් වහන්සේ ගමේ පාඨශාලාචාර්‍ය්‍යතුමන්ගෙන් ඉගනීමේ දක්ෂ ළමෝ ඇත්දැයි විචාළ විට ගණිතශාස්ත්‍රාදියෙහි දක්ෂයකු වශයෙන් පෙන්වනු ලැබූයේ මොහුය. උන්වහන්සේ ද දෙමව්පියන්ගේ අනුදැනීම ඇතිව කුඩා ළමයාට දෙලොස්වස් පිරිසඳ ඔහු පැවිදිකරවා තමන්වහන්සේගේ ශිෂ්‍ය දෙඩන්දූවේ ශ්‍රී සීලක්ඛන්ධනායක සවාමිපාදයන් වෙත ශාස්ත්‍රාද්‍යුග්‍රහණය කරවනලෙස පැවරූසේක.

"දිනක් ආචාර්‍ය්‍යයන්වහන්සේ කුඩා සාමණේරයන්ගේ යම්කිසි වරදකට දඬුවමක් වශයෙන් "සිංහල ජාතක පොත" අතට දී පහනක් ළඟ සිටුවා එළිවනතුරු පොත කියන්ට විධානයකොට නින්දට ගියහ. එසේ විධාන කළ මුත් එය එසේ පැවැත්වීමට උන්වහන්සේ බලාපොරොත්තු නුවූහ. එහෙත් සාමණේරයෝ ගුරුවදන නොයික්මවා ආචාර්‍ය්‍යයන්වහන්සේ කෙරෙහි මහත් ගෞරවයෙන් ජාතකපොත කියමින් රෑ ගතකළහ. අලුයම් වේලෙහි ආචාර්‍ය්‍යන්වහන්සේ නින්දෙන් පිබිදැවිත් පොත කියමින් සිටි සාමණේරයන් දුටහ. හෙරණුන්දැගේ ගුරුභක්තිය හා

---

* පියාගේ නම කාරියවසන් පටුවන විතාන දෙන් තියනේරිස් මහතාය. මේ පවුලේ සොහොයුරියෝ දෙවිසි දෙනෙකැයි කියත්.

(අඬෝලිපිය මාගේය)

සුවිනීතතාව ද වටහාගැන්මට මේ සිද්ධියම ප්‍රමාණමැයි. සාමණේරයෝ වත්පිළිවෙත් පිරීමෙහි ද නොපසුබටව සිංහල පාළි සංස්කෘතාදි භාෂාශාස්ත්‍රයන් ද මහත් උත්සාහයෙන් උගත්හ.

“පසුව අධිශීලශික්ෂායෙහිද පිහිටා තවවසක් ගතවූ පසු ශ්‍රමණ භූමියෙන් ඉවත්ව ගිහිබවට පැමිණ ගිංතොට ශ්‍රී ධර්මදාස ජයවර්ධන† පඬිතුමාත් සමඟ සියම්දේශය බලා නික්මුණේය. එහිදී පඬිවරුන් දෙපොළගේ දැනීමෙහි පහත් සියම්දේශවාසීහු පාළි-සංස්කෘත සිංහල යනාදි භාෂාවන් ඉගැන්වීමට විද්‍යාලයක් පිහිටුවා ධර්මසේන පඬිතුමා ප්‍රධානාචාර්ය ධුරයට ද ජයවර්ධන පඬිතුමා උපාචාර්ය පදවියකට ද පත්කළහ. කල්යාමෙන් ජයවර්ධන පඬිතුමා එහිදී හෘදයාබාධයක් වැළඳී මියගියෙන් සංවේගයටපත් ධර්මසේන පඬිතුමා ද එයින් අස්විය. විදේශසංචාරයේ ප්‍රතිඵල වඩාත් ලබා ගන්නා අටියෙන් කල්කටානගරයෙහි හා බුරුම දේශයෙහි ද පණ්ඩිතොත්තමයන් ආශ්‍රයකර සංස්කෘත දැනීම හා අභිධර්මඥතාය ද වඩාත් දියුණු කරගෙන ආපසු සියරට බලා නික්මුණේය.

“මැණියන්ද කෙරෙහි ද මාතෘභූමිය කෙරෙහි ද මහත් වාත්සල්‍යයෙකින් ක්‍රියාකළ පඬිතුමා ගම්පෙදෙසෙහි විසූ “රහුබැද්දේ කංකානම්ගේ කාරලු සිල්වා” උපාසක මහත්මයාගේ දූ වූ ගිරෙස්හාමි ද සිල්වා හාමිනේ හා ක්‍රි. ව 1892 වර්ෂයේ දී විවාහප්‍රාප්තවී ය.” (මේ විවාහයෙන් දරුවන් කිපදෙනකුන් ලැබුණ නමුත් මෙකල ජීවත්ව සිටින්නී එකම දුවක් පමණය.)

“මේ කාලයේදී විශාල ගිහිපැවිදි ශිෂ්‍යපිරිසක් පඬිතුමා කෙරෙන් ශාස්ත්‍රෝද්ග්‍රහණය කළහ පඬිතුමා විද්‍යෝදය පරිවේණාධිපතිව වැඩවිසූ හික්කඩුවේ ශ්‍රී සුමංගල නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ කැමැත්ත පරිදි “ලක්රිවි කිරණ” පත්‍රයෙහි ප්‍රධාන කර්තෘධුරය ද කලක් ඉසිලීය. “දිනමිණ” පත්‍රයෙහි ද කලක් කර්තෘවරයෙක්ව සිට ඉන් අස්වූ පසුත් “ශාස්ත්‍රීය ලිපි” යන ශීර්ෂයෙන් අගනා ලිපිපෙළක් එම පත්‍රයෙහි පළකෙළේය කලකට පෙර “සිද්ධාන්තදර්ශන” යන නමින් ශාස්ත්‍රීය සඟරාවක් ද පැවැත්විය.

† ගිංතොට පිටිවැල්ලේ ජයවර්ධනාරාමාධිපතිව වැඩසිටි කල්‍යාණී වංශ නිකායේ සංඝපිතෘතැන්පත් ශ්‍රී මේධංකර මහාස්වාමීන්ගේ බාලසොහොයුරා ධම්මසකන්ධ නමින් පැවිදිවසිට සීලසකන්ධ මාහිමියන්වෙත ඉගනීම කොට සිවුරු හැරියේය. මේ කියවෙන්නේ ඔහු ගැනයි. ජයවර්ධනාරාමය යන නම ඒ විහාරයට ලැබී තිබෙන්නේ මේ ජයවර්ධන පවුලේ ප්‍රධානත්වයෙන් එය ආරම්භ කළ බැවිනි.

"කව්මිණකොඬොල," "ශතශ්ලොකකී" "සුශ්‍රැත සූත්‍රස්ථානය'' යන ග්‍රන්ථවලට අභිනව ව්‍යාඛ්‍යාන ද "කාව්‍යාදර්ශ" නම් අලංකාර ග්‍රන්ථයට මනොහර ව්‍යාඛ්‍යානයක් හා පැරණි ග්‍රන්ථකීපයෙක සංශොධනය ද මෙතුමන් විසින් කරන ලදී. මේ හැර පඬිතුමා නොයෙක් වාද විවාදයන්හි ද යෙදී මහත් සේවයක් කෙළේය. පඬිතුමා ගම්පල වනවාස විහාරාසන්න පිරුවෙන්හි ද වේයන්ගොඩ නිට්ටඹුවේ විද්‍යානන්ද පිරුවෙන්හි ද ධර්මශාස්ත්‍රයන් හැදෑරවී. කලක් මොරටුවේ වේල්ස්කුමාර විද්‍යාලයෙහි ද ඉගැන්වීම කෙළේය.

"ධර්මජෝත පඬිතුමාට නොයෙක් ශාස්ත්‍රයුක්තීන් පිළිබඳ මනා අවබොධයක් තිබුණුබවද බාලකාලයෙහි කී පොත්පත්වල අන්තර්ගත කරුණු සියල්ලම පාඩේ කියහැකි තරම් සමරණ ශක්තියක් තිබුණු බවද කියයුතුවේ. මොහු විසින් නොයෙක් අවස්ථාවන්හිදී කරන ලද ත්‍රිභාෂාමය පද්‍යයෝ බොහෝ වෙත්. ක්‍රි. ව. 1911 අගෝස්තු මස 18වැනි දින මොහු විසින් කරනලද ලොකාර්ථයන් සලකා ආචාර්යපාදයෝ පඬිතුමාට "විද්‍යාසාගර තර්කපඤ්චානන" යන ගෞරවාන්විත නාමය ප්‍රදානය කළහ.

"සැහැල්ලුවූ පැවැත්මකින් යුක්තවූ නිරහංකාර ජීවිතයක් ගතකරමින් නිර්ලොභීව ලෝකයාට ශාස්ත්‍රඥානය බෙදා දුන් ශ්‍රී ධර්මජෝත විද්‍යාසාගර තර්කපඤ්චානන පඬිතුමා සූසැට වසකගේ ඇවෑමෙන් ක්‍රි. ව 1934ක්වූ සැප්තැම්බර් මස 17වැනි දින කීර්තිශෙෂභාවොපගතවිය''.

(හෙට්ටිආරච්චි මහතාගේ ලිපිය මෙපමණකි.)

මාගේ ආචාර්යපාදයෝත් මේ පඬිතුමාත් සමාන වයස්කයෝව ශෛලබිම්බාරාමයෙහි ඉගනීම කළෝය. ඒ සම්බන්ධය නිසා පඬිතුමා මටත් ස්වශිෂ්‍යයකුට මෙන් ඇල්මක් ඇතිව විසීය. හෙට්ටිආරච්චිමහතාගේ ලිපියෙහි අතිශයොක්තියක් නැත. ඒ පඬිතුමාගේ සමරණශක්තිය පුදුම එළවන එකක් බව ප්‍රත්‍යක්ෂ ලෙස මට දැනගන්ට ලැබුණි. ගැටලු විනයප්‍රශ්නයක් විසඳීම හෝ අමාරු ව්‍යාකරණ පදයක්විස්තර කිරීමහෝ ඒ මහතාට අපහසු දෙයක් නොවීය. ජ්‍යොතිශ්ශාස්ත්‍රයේ ගැඹුරුතැනක් විචාළත් මොහොතකින් පිළිතුරු දීමට එතුමා සමර්ථ විය. අභිධර්මය ගැනත් එසේය. අසවල් කාරණය අසවල් පොතේ අසවල් තැන තිබේයයි ඒ මහතා කිසි පතපොතක් නොබලා කී සැටි මා නොයෙක්විට දැක තිබේ.

සියම්රටට පැමිණිවිට එහි සංඝරාජතුමා ද පඬිවරු ද මොවුන්ගෙන් නොයෙක් ප්‍රශ්න විචාරා තත්වය දැනගත් පද්‍ර චූලාලංකාර මහරජුගේ සොහොයුරුවූ චන්ද්‍රදත්තචූඩාධර කුමරුගේ අනුමැතියෙන් සංඝසාවුටසීගාගම නමැති විද්‍යාලයක් පිහිටුවා එහි ප්‍රධාන ධුරයට ධර්මසෙන පඬිතුමා පත්කරනු ලැබිය. සියම් ගුරුවරු කීපදෙනෙක් ද පත්කරනු ලැබූහ.

---

# සංඥානාම සූචිය

# සංඥානාම සූචිය

## අ. ආ.


අක්මීමන 98.
—ධම්මාරාම 75.
—සොභිත 99.
අකුරැස්සේ සුවණ්ණජෝති 10, 11.
අගම්පොඩි සාලිස් සිල්වා 128.
අගලකඩ මහාසවාමි 16.
අග්ගධම්මාලංකාර මහතෙර 149, 50
අග්ගසාර තෙර 24.
අඟුලුගහ සීලරතන 50.
අග්‍රබොධි විහාරය 16.
අච්ඡරියාපදානවම්පූ 175.
අටදහෙවත්ත 34.
අටමස්ථානේ සිරිසුමන 72.
අටවෙනි ඇඩ්වඩ් රජ 162.
අඨසාලිනී අත්ථයොජනා 75, 77
අඹුජේ සොණුත්තර 88, 89.
අත්තරගම බණ්ඩාර රාජගුරු 3, 4, 5, 11, 28.
අත්තුඩාවේ ධම්මරක්ඛිත 10, 32, 34, 39, 43, 48, 51, 83.
අත්ථදස්සී තෙර 68, 69.
අතුකෝරල දශනායක 16.
අදිරියන් ආබෲව් රාජපක්ෂ 29.
අද්‍රියානා හාමිනේ 88.
අධිමාසභේදය 149.
අනගාරික ධර්මපාල 158, 163.
අනාත්බසාර් ආශ්‍රමය 164.
අනොමසිරි තෙර 67.
අන්ද්‍රීස් ධීරසේකර 19.
අන්ද්‍රිස් පෙරේරා ධර්මගුණවර්ධන 95.
අපපාශාස්ත්‍රී විද්‍යාවාචස්පති 142, 43, 165
අබයරත්න ගුණවර්ධන 147.
අබයසිංහ මුදලි 179, 180.
අබ්‍රත් ද සොයිසා 45.
අබේසේකර මුදලි 147.
අභයකරුණාරත්න මුදලිඳු රාමය 151, 175.
අභයතිස්ස චරිතය 23, 53, 133
—මාහිමි 122.
අභයතිලකරත්නාරාමය 124.
අභයසිංහ මුදලි 60.
අමරතුංග අප්පුහාමි 145.
අමරසේකර මුදලි 147.
අමරපුරය 20, 24, 40, 42, 66, 74, 85.
—නිකාය 24, 45, 46, 50, 54-5-7-8, 86.
—තොට 30.
අම්රමොලි තෙර 68.
අම්බලම්ගොඩ 60, 108.

අම්බලංගොඩ දෙවානන්ද 108.
අඹගස්වැවේ රතනජෝති 172.
අඹගහපිටිවිහාරය 21, 52, 69, 139.
—ඤාණවිමලතිස්ස 10, 20, 24, 25, 26, 29, 30.
අඹගහවත්තේ මහාසවාමි 103, 104-7-8-9, 117-8.
—ඉන්දසභ 132.
අම්බරුකබාරාමය 24, 111-2, 139
අර්නෝල්ඩ් දියස් 119.
අරකන්රට 99, 162.
අරියාලංකාර සාමණේර 55.
අරුග්ගමුවේ රේවත තෙර 93.
අරුග්ගොඩ සීලානන්ද 72.
අලපලාදෙනිය 16.
අලුත්ගම 140.
— කත්දේවිහාරය
— වාලුකාරාමය 39.
— සංඝරතන 50.
අලුත්තල නන්දාරාමය 151.
— සරණංකර 79, 105.
අලුත්නුවර පඤ්ඤාතිස්ස 73, 74,

ඇ.

ඇඩ්මන්ඩ් ගුණරත්න මුදලි 77.
ඇඩ්වඩ් පෙරේරා නීතිඥ 138.
ඇඩ්වඩ් මහරජ 129.
ඇඩ්වින් ආනෝල්ඩ් 119.
ඇඩ්වින් ද අල්විස් 186.
ඇතැත්ස්නුවර 194.
ඇතැල් ඇම්. කුමාරසවාමි 196.
අලුවිහාර පොත් පෙල 172.
අව්මාහන්ද් ලක්ෂසිදේ 110.
අවන්තිරට 58.
අවානුවර 30, 68.
අස්ගිරිවල්පොල 145
අසොකාරාමය 30.
අශ්වාරෝහණ චණ්ඩිනා 186.
අහංගම ධම්මධජ 33.
— ධම්මරතන 44.
— මහාවිහාරය 48, 50.
— සීලවිමල 48.
අහුංගල්ලේ විමලකිත්තිතිස්ස 26, 112.
අංගනෙත්තාසුසානා 152.
ආචාරවංසධජ තෙර 38.
ආනන්ද කුමරා 131.
ආනන්දකෞශල්‍යායන 173.
ආබ්‍රහම් ප්‍රනාන්දු 90.
ආබ්‍රහම් මැත්දිස් ගුණසේකර 185.
ආසීාලංකාර භික්ෂු 164.
ආර්තර් ජයවර්ධන මුදලි 165.
ආංගුතොෂමුඛර්ජි 157, 158, 163.
ආසභතිස්ස 111.
ආසියා ලේඛනය 119.

ඇ.

ඇන්ඩෲ පෙරේරා 148.
ඇන්ඩෲස් සී. ඇජ්f. 159.
ඇත්නැපිටිය 151.
ඇල්ගිරියේ වාදය 153.
ඇසැම්රට 25, 26.
ඇපා අප්පුහාමි 71, 90, 95, 144.

## ඉ.

ඉද්දමල්ගොඩ දිසාපති 77, 87, 95-7, 113-8.
ඉත්ඹියත් ඇත්ටික්වරි සහරු 109
ඉදුරුවේ ඉන්දජෝති 34.
— සුමංගල 71.
ඉන්දරතන තෙර 68.
ඉන්දවිමල තෙර 45.
ඉන්දසාර 74.
ඉන්දසභවරඤාණසාමි 76-8-9, 84, 98, 100-1-4-5-6.
ඉලංගකෝන් මුදලි 10
ඉලුක්වත්තේ නායකසථවිර 33

## උ. ඌ.

උඩකැන්දවෙල සරණංකර 161.
උඩබුලත්ගම 73.
උඩුගම්පිටියේ සිරිසුමනතිස්ස 57, 62, 78, 81-2-6-7, 102-6 8, 112-3, 141, 155.
උඩුගම්පල රතනපාල 71, 88.
උත්තමධීරතිස්ස 23.
උත්තර මහතෙර 38.
උපදේශ රත්නාකරය 178.
උපදේශ වාක්‍යමඤ්ජරී 143.
උපසංඝරාජපදවිය 150.
උපාධ්‍යාය පාඨශාලාව 114.
උපාලි මහතෙර 1, 2, 4, 13.
උයන්වත්තේ රේවත 20.
ඌව මේ උත් ඇමැති 37.

## එ. ඒ.

එක්නැළිගොඩ දිශාපති 124, 125.
එඩ්වඩ් බාර්නස් ආණ්ඩුකාර 25
ඒබ්‍රහම් ද අල්විස් 185.

## ඔ.

ඔමත්තේ අභයතිස්ස 121-2-4.
ඔල්කට් මහතා 138.
ඔල්ඩන්බර්ග් මහතා 191.

## ක. ඛ.

කච්චායන ව්‍යාකරණය 186.
කච්චිවත්තේ විහාරය 3.
කටුකුරුන්දේ ධම්මානන්ද 8, 17, 18.
කටුකොලිහේ බෙන්තාරාමය 122
කතළුවේ ගුණරතනතිස්ස 10, 12, 32-3-4-9 42-3-4-7-8, 52, 80-3, 121, 149.
—ධම්මරතන 79, 105, 113.
—සුමංගල 16.
කඳුරුපොකුණේ සුවණ්ණජෝති 3, 5.
කත්දේවිහාරයේ රාහුල 126.
කතංකේ අත්ථදස්සි 20.
කපුගම ගුරුන්නාන්සේ 24.
කපුගම ධම්මක්ඛන්ධ 22-8-9, 50-3, 73.

කඹුරුපිටියේ ගුණරතන 3, 4, 143.
—වාදය 153
කම්බුවටවන පියදස්සි 172.
කර්නල් ඕල්කට් 75, 114.
කර්සන් සාමි 193
කරතොට ධම්මාරාම 3, 5, 6, 7, 8, 10, 18, 64.
කරතොටවත 2, 3, 8, 11, 14, 24.
කරන්දෙනියේ තපොධනාරාමය 122-4.
කරපුටුගල ධම්මදින්න 57.
කරිත්තකන්දේ විහාරය 108, 149.
කරුණාතිලක සෙනෙවිරත්න 7.
කරුණාමුණි පතිස් ද සිල්වා 126.
කලපළුවාව 144
කලමුල්ලෙ සුමනාරාමය 126.
කලිකතානුවර 27, 151, 163.
—විශ්වවිද්‍යාලය 157, 164.
කලිස්තෝරු ප්‍රනාන්දු 174.
කල්‍යාණපජ්ජෝත රාජගුරු 114, 115.
කල්‍යාණාරාමය 140
කල්‍යාණිවංශය 33, 65, 102, 103-4-7, 118
කල්‍යාණි සීමාව 36, 37, 83.
කල්‍යණි ශාසනවංශය 75.
කවිකල්ප තරුව 176.
කවීඤ්ඤුහි සද්ධම්මධජ 23.
කවිරාජපඬි 176
කහගල, කහදගල 3.
කහතුඩුවේ චන්දජෝති 145.
කහඳමෝදර ධම්මානන්ද 48, 104-8.
—පඤ්ඤාසීහ 155.
කහඳුවේ මුදියන්සේ 2.
—රතනසාර 44.
කහවේ ඤාණානන්ද තිස්ස 25, 139, 140.
කහවේ රතනසාර 166.
කළුගමුවේ නිලමේ 152.
කළුගල විහාරය 11.
කළුතර අශෝකාරාමය 50.
—තොටමුණ 126
—වැල්ලබඩ විහාරය 39.
කළුපෙරුම බස්තියන් සොයිසා 139.
කළුවාමෝදර 69, 139.
කංඛාවිතරණී අටුවා 116.
කාම්බෝජය 27, 178.
කාච්චිනා පිස්කල් පෙරේරා 171.
කාරක පුෂ්පමඤ්ජරී 5.
කාර් මයිකල් සාමි 164.
කාරලු සිල්වා 21, 201
කාවල්ල 167.
කාශීනාථ 94.
කිරම ධම්මානන්ද 10, 11, 17.
කිරින්දේ ධම්මානන්ද 40.
—සීලානන්ද 35, 48.
කිරිසැලියේ මහතෙර 3.
කිරිමැටියේ විහාරය 123.
කිරිවත්තුඩුවේ පඤ්ඤාසාර 148.
කිරුළපනේ විමල 72.
කිංග්ස් කොලීජිය 130.
කීර්ති ශ්‍රී රාජසිංහ 1, 2, 4, 5, 13-4, 65.
කිඹියේ සුමනජෝති 133.
කුමාරස්වාමි පඬි 145.
කුට්ටාපිටිය 2.
කුමාරදාස වෙදමහතා 33.
කුමාර මහාවිහාරය 120, 136.
කුමාර විද්‍යාලය 131

කුමාරසිංහ වෙද ආරච්චි 19.
කුලීගොඩ වනවාස විහාරය 63.
කුනත්වාහල 155.
කෘපාවර්ණ මහතෙර 156, 162-3-4.
කෛලාස මහතෙර 38.
කේසර තෙර 82, 115.
කොග්ගල ගුරුතුමා 179, 180.
—ධම්මතිලක 12, 179
කොග්ගල ධම්මසාර 35-7-8, 48, 92, 112, 3.
—සංඝතිස්ස 77.
කොටවාය 2, 15.
කොටුවෙගොඩ ඤාණානන්ද 73.
කොණ්හවිහාරය 158.
කොත්දූව 125.
කොතෝට්ටි ආදිපාද 128.
කොබ්බෑකඩුවේ සිරිනිවාස 4.
කොරහගොඩ තෙර 33.
කොලොත්තාවේ විහාරය 182.
කොස්ගොඩ 45.
—විපුලතිස්ස 23.
කෝට්ටෙගොඩ ධම්මානන්ද 48, 79, 105
කෝට්ටේ 13, 39.
කෝත්ගස්තැන්නේ 3.
කෝදුගොඩ පඤ්ඤාසේඛර 75, 77.
—සුමංගල 99 100.
කෝම්මල ඉන්දසාර 64, 132, 195.
—විහාරය 117
කෝරලේගොඩ උපනන්ද 168.
කෝසම්බි ධම්මානන්ද 95.
කෝසල්ලාලංකාරතෙර 150.
කැකිරිවත්තේ විහාරය 122.
කැටගොඩ රතනජෝති 3.
කැප්ටන් කොටෙන් 30.
කැරොලයින් රය්ස් ඩේවිඩ්ස් 195.
ක්ලොමැස්ටර් පෙදෙස 190.
ක්ෂිතිමෝහන්සේන් 159.
ඛිරචෛත්‍යාරාමය 44.

## ග.

ගඟරුවණක 12.
ගගුලපිටිය 17.
ගණේගම 167.
ගණේගොඩ 122-4.
ගම්පල වාදය 139.
ගම්පහ රේවත 89.
ගල්ඇටුඹේ නොතාරිස් මහතා 185.
—පියදස්සී 10, 11.
ගල්ගිරියාවේ ධම්මරක්ඛිත 94.
—සුමංගල 182-4.
ගල්වෙහෙර වලව්ව 45.
ගල්තුරුමූල පිරිවෙණ 178.
ගංගාප්‍රසාද්සිංහ 164.
ගංගාරාමය 13.
ගංගාරෝහණ පූජාව 11, 18.
ගාල්ලේ ගංගාරාමය 46, 119.
ගාල්ලේ මේධංකර 8, 10, 11, 71.
—සුමංගල 79, 105
—වැලිවත්ත 117.
ගිඩ්ඩව මහතෙර 70.
ගිනිගත්පිටියේ සංඝරක්ඛිත 1.
ගිබ්සන් තඩුකාරතුමා 186.
ගිමාරා විජයසිංහ 151.
ගිරිහඬු විහාරය 177.
ගිරිසමන්තාරාමය 122.
ගිරිහෙළපුර 45.

ගිංතොට මේධංකර 200.
ගුණතිලක නීතිඥ 146.
ගුණරත්න මුදලි 95, 111, 165.
ගුණරතන භික්ෂු, 29
—තෙර 106
—තිස්ස 83.
ගුණරතනතිස්ස ශාසනවංශය 52, 53.
ගුණවර්ධන මුදලි 143
ගුණසිරිතෙර 51, 31.
ගුණානන්ද හෙරණ 84, 85
—මහතෙර 121 - 3,
ගුත්තිලකාව්‍ය වර්ණනා 11, 143, 183.
ගුත්තැපාත වජිරඤාණ 14.
ගොගර්ලිදේවගැති 126, 182.
ගොඩපිටියේ විහාරය 12-6
ගෝවින්ද බමුණා 31.
ගෞඩදේශය 99.
ගෞතම විද්‍යාලය 176-7
ග්‍රන්ථප්‍රකාශ සභාව 76.

ච.

චව්විගම 162-3
චන්ද්‍රජෝතිතෙර 68.
චන්ද්‍රමූර්ති පිළිමය 30.
චන්දිමතෙර 82, 115
චන්ද්‍රඋපාසක 99.
චන්ද්‍රදත්තකුමරා 203.
චන්ද්‍රශෙඛර මුදලි 120.
චාර්ල්ස් හෙන්රි ද සොයිසා 119, 147
චිප්ස්වෙඩිගම 194
චිල්ඩර්ස් පඬිතුමා 127-8-9, 131-3-5, 190-2
චුල්ලපදුමනායක 177.
චූලාලංකාර මහරජ 74-5, 96, 97, 115, 140, 142, 128, 203.
චූලවංශපෙළ 197.

ජ.

ජගජ්ජෝති සභා 164.
ජගදීශ කාශ්‍යප 173
ජනනන්දාරාමය 151
ජිනානන්ද හෙරණ 29.
—භික්ෂු 31.
ජිනිඥාභිධජතෙර 23
ජම්බුධජඤාණරංසි 100, 104.
ජම්බුවත්තේ පියරතන 177.
ජයතිලක ඇමති 88, 148, 173, 183.
ජයතුජිනතිස්ස 23, 45.
ජයසිංහ කළුහාමි 28.
ජයසූරිය වෛද්‍ය 177
ජයසේඛරාරාමය 64, 137.
ජාගරමහතෙර 100, 110, 115, 318, 119.
ජාතකාභරණය 147.
ජිනබෝධාවලී 178.
ජිනවරවංස 129.
ජිනවංසදීපය 175.
ජිනානන්දස්ථවිර 131.
ජිනාලංකාරටීකා 178.
—සන්නය 177.
ජීවානන්ද විද්‍යාසාගර 115
ජුවානිස් මැන්දිස් කරුණාරත්න 124.
ජේකබ්කුරේ 183.

ජේම්ස් ද අල්විස් 12, 11, 95, 179, 184.
ජේම්ස් පීරිස් තසිට්තුමා 158.
ජොහානිස් පණ්ඩිතතිලක 19
ජෝන් ඕල්කට් දේවහැති 167.
ජෝන් ඩොයිලි 7.
ජෝන් පෙරේරා 180.

ඤ. ඥ.

ඤාණගම්භීරධජ 38.
ඤාණවක්කතෙර 41.
ඤාණජෝති තෙර 68.
ඤාණවිමලතිස්ස මාහිමි 35, 40, 42-3-4, 74, 109, 139.
ඤාණානන්දතිස්ස 59, 60, 69, 110.
ඤාණාභිවංශ සංඝරාජ 22, 23, 31, 37, 40-2-4-6, 50-1, 82, 139.
ඤාණාලංකාර සිරිසුමන
—රාජගුරු 51-4, 64
ඤාණාලංකාර සද්ධම්මධජ 31.
ඤාණෝපාශනී සහරාව 99.
ඤෙය්‍යධම්ම සංඝරාජ 51, 3, 6, 58, 99, 104, 114
ඥානාදශීසභරා 26, 116, 132-3. 179, 190,
ඥනෙශ්වර මාහිමි 169.
ඥෙය්‍යාර්ථදීපනී 114

ට. ණ.

ටියුඩර් රාජපක්ෂ 125
ණිවාදිවුතනි 172.

ත.

තපොධනාරාමය 124-5.
තල්අරඹේ ධම්මක්ඛන්ධ 19.
තල්පිටිය 59.
තලත්ගම මහතෙර 71.
—සොභිත 88-89
තලල්ලේ ධම්මරක්ඛිත 63.
තංගල්ලේ කැටත්තොට 34.
—ජිනරතන 48
—ධම්මදින්න 47.
—සුමනතිස්ස 19.
ටාගෝර් මහාකවි 159-160
තාරානාථ පඬි 115, 141.
තිබ්බොටුවාවේ බුද්ධරක්ඛිත 1, 14.
තිබෙත් පෙදෙස 155.
—රජ 75.
තිරාණගම සුනන්දාරාමය 177.
තිලකරත්නාරාමය 151.
තුඩාවේ පණ්ඩිත ගුණවර්ධන 19, 187
තුඩුවෙවත්තේ පඤ්ඤාසීහ 57. 120, 2-3-4.
තෙඅප්නිස් පෙරේරා 71.
තෙතෝරිස් සිල්වා 167.
තෙල්වත්ත 166
තෙලිකඩ සෝණුත්තර 47, 136.
තොටගමු විහාරය 3, 35, 93-94.
තෝමස් ඊඩන් 7
—මෙට්ලන්ඩ් 7.
—මුහන්දිරම් 12, 179.
තෝලංගමුවේ තෙර 20, 33, 66.
තැනුම්පත විහාරය 20, 152.

## ද. ධ.


දඩයක්කාර මුහන්දිරම් 88.
දඹල්ලේ වාලුකාරාමය 32, 64.
—විමලජෝති 121-3
දඹුලු ශාසනවංශය 22, 29, 33, 43.
දත්ගෙදර සුමනජෝති 50.
දම්පහල 1.
දරම්ටිපොල ධම්මරක්ඛිත 10, 14.
දශරූපාවතාරය 142.
දලුවත්තේ ජිනානන්ද 19.
දිපදුත්තමාරාමය 130-1-2.
දිශානායක අප්පුහාමි 151.
—මුහන්දිරම් 179.
දීඝවාලුකාරාමය 177.
දීපවංශය 176.
දීපංකරතෙර 176.
දීපේගොඩ සීලක්ඛන්ධ 99, 103.
දුල්වැවේ නායකස්ථවිර 33.
දූවේ චන්දසාර 121-2-3-4.
දූවේමෝදර බෙතනාරාමය 121, 124.
දෙගල්දොරුව 13.
දෙගල්ලේ විහාරය 39.
දෙණගම ගුණරතන 10-11.
දෙදියවල බුද්ධරක්ඛිත 147.
දෙල්දූව ධම්මරක්ඛිත 63.
දෙවප්‍රතිරාජාරාමය 125.
දෙවානන්ද උපසංඝරාජ 149, 174.
දෙව්නුවර රතනජෝති 44.
දෙවුන්දර 14, 178
—ඉතිහාසය 28.
—වාචිස්සර 170.
දෙහිගස්පේ පඤ්ඤාසාර 170
දෛවඥ කාමධෙනු 142.
දොඩන්දූවේ පියදස්සි 149.
—පියරතන 87
—වරාය 32-38
—ශෛලබිම්බාරාමය 62, 102.
දොඩම්පහල දීපංකර 20, 95.
දොන් අන්ද්‍රියස් 151.
—අල්විස් 122.
—ආබ්‍රහම් ගුණවර්ධන 164
—ජයසූරිය 116.
—ඊදිරිස් අප්පුහාමි 122-3
—උපාරිස් අප්පුහාමි 122.
—එබ්‍රහම් ඇලෙක්සැන්ඩර් 171
—කරෝලිස් හේවවිතාරණ 95.
—කොරනේලිස් අප්පුහාමි 88.
—ජානිස් අභයගුණවර්ධන 187.
—ජුවානිස් 85.
—ජුවානිස්-ගුණවර්ධන 93.
—ජොහානස් 151.
—ජොහානිස් අබයසේකර 154.
—තියඩෝරිස් 200.
—දනියෙල් විජයරත්න 114.
—වීරසූරිය 112, 137.
—ජයතිලක 172.
—බස්තියන් ප්‍රනාන්දු 140.
—ජයසූරිය 49.
—පිලිප්පු ද සිල්වා 17.
—පුරෝලිස් රාලහාමි 71.
—ලුවිස් වණ්ණසූරිය 85.
දොම්පේ බුද්ධරක්ඛිත 72.
දොවන් ආරච්චි මහතා 75.
දෝන ඉසබෙලා සිරිවර්ධන 144.
දෝන දිසානා විජයසේකර 187.

ධඤ්ඤවතී නුවර 99.
ධම්මකිත්ති භික්ෂු 55-7, 60.
—මාහිමි 43
ධම්මගාරවදීපනී 176.
ධම්මචේතිය මහරජ 36, 69, 101.
ධම්මතිලක නායක 69.
ධම්මතිස්ස 23
ධම්මදින්න 29, 59, 60
—රේවත 153.
ධම්මධජනායක 48.
ධම්මධර (සියම්) තෙර 68.
ධම්මයුත්තිකනිකාය 51, 67, 77, 94.
ධම්මරක්ඛිතතිස්ස 29, 41, 23,
—වංශය 39.
ධම්මසාර ගණනායක 54, 81, 83.
ධම්මාධාර තිස්ස 58, 110.
ධම්මානන්දතිස්ස 139.
ධම්මානන්ද 34, 55, 171,
ධම්මාලංකාර මාහිමි 129.
ධර්මගුණවර්ධන මුහන්දිරම් 165
ධර්මගුප්ත පිරිවෙණ 108-9.
ධර්මදාස ජයවර්ධන 201,
ධර්මපාල මහතා 156.
ධර්මප්‍රසාද විහාරය 148.
ධර්මරක්ෂිත චරිතය 42-5,
—පිරිවෙණ 41.
ධර්මසේන පඬි 200-1, 144,
ධර්මරාජික විහාරය 163.
ධර්මාංකුර විහාරය 156, 163
ධර්මාධාර රාජගුරුතෙර 154, 177.
ධර්මාරාම මාහිමි 88, 90, 144, 152, 172.

න.

නන්දාරාමතිස්ස 111.
නාඹටුත්තේ ලංකාවිහාරය 47.
නාගපට්ටනම 32-5.
නාදුගල රේවත 182
නල්ලවත්ත 39
නාමරූප පරිච්ඡේදය 150.
—ටීකා 199.
නාරත්දෙණියේ ගුණසාර 35.
නිකුලස් ගුණතිලක 145.
නිත්‍යානන්ද ඝොසවාමිපඬි 161, 162.
නිලමුනි බස්තියන් සිල්වා 126.
නෝම්පූ ධම්මසිද්ධිරාජා 49.
නෑදිමාලේ රේවත 70.

ප. ඵ.

ප්ලොපින්තිනා ද අල්විස් 185.
ෆ්ලොරන්ස් දියස් 186.
පඤ්ඤමොලිතෙර 55, 59, 60, 61.
පඤ්ඤමොලි තිස්ස 111
පඤ්ඤසාමි රාජගුරුතෙර 51, 100, 114
පඤ්ඤසාරතෙර 38, 51.
පඤ්ඤසීහතෙර 59, 61.
පට්ටිගපොල සොභිත 151.
පතලියේ ගල්ලෙණ 1.
ෆ්‍රැන්ග්‍රාෆ් ආණ්ඩුකාරයා 7.
පරකුඹුරේ සරණංකර 89.
පරපාමුල්ලේ ධම්මාරාම 20.
පරමධම්මචේතිය පිරිවෙණ 72, 93, 174.
පරමත්ථවිනිච්ඡය 150.
පරමවිචිත්‍රාරාමය 178.

පරමවිඥානාථ සමාගම 113, 138, 139.
පරමාර්ථධම් මකරන්දය 175.
පරමානන්ද විහාරය 138.
පල්ලත්තර පුඤ්ඤසාර 3.
පල්ලේවත්තේ මහතෙර 89.
—පල්ලේ බැද්ද 6.
පවර නිවෙසාරාමය 68
පවර බොධිරාජාරාමය 125.
පව්ස්බෝල් පඬි 122, 198, 192.
පානදුරවාදය 97, 138.
පානදුරේ ඉන්දසර 69, 133.
—ඛෙමානන්ද 72
—ගුණරතනතිස්ස 149.
පානබොක්කේ, ටී. බී 95.
පාසාදවිහාරවාසී තෙර 23.
පාලිපොත් සමාගම 192.
පියරතනතිස්ස මාහිමි 54, 62, 75, 76, 78, 81, 82, 101, 108, 112, 113, 114, 115, 119, 120, 140, 141, 149, 155, 158, 177, 200.
පිලානේ සොමානන්ද 20.
පිලික්ස් ආර්. ඩයස් 186.
පිලිප් ඇන්ස්මුදර් 186.
පිලින්දවච්ඡ (සිගම්) තෙර 68.
පිංවත්තේ සීලානන්ද 129.
පිටර් ද සේරම් 186.
පිරිස් මැතිණිය 158.
පුණ්ණානන්ද තෙර 157-8.
පුණ්ණාචාර ධම්මධාරී 100.
පුඤ්ඤප්පිය තෙර 68.
පුප්ඵාරාම සාමණේර 82.
පුරන්ද සඟරා 26, 41.
පුරාණ සුභද්‍රාරාමය 39.
පුලිනතලාරාමය 177.
පුවක්දණ්ඩාවේ පඤ්ඤානන්ද 78, 79, 81-2, 100-2-4-5-7-8, 121.
පෙතංගහවත්ත 10, 34, 39.
—සුගුණ 44.
පෙතියාගොඩ විහාරය 146.
පෙරදිග ගුඩිපොත් 192
පෙරේරා, ඇම්. සී. ඇප්. 116
පේගු දිස්ත්‍රික්කය 82.
පොත්ගුල් විහාරය 3.
පොතුපිටියේ සීලරතන 50.
පොතුවිල ඉන්දජොති 64, 117, 132.
පොත්තම්බලම් මුදලි 145.
පොල්දූවේ ධම්මසාර 50
පොල්වත්තේ අග්‍රාරාමය 78, 79, 80, 81, 113, 121, 154, 158, 197
—තිහුමම්කාරාමය 187.
—විහාරය 86.
—සරණපාල 40.
—සිඩාජී 20.
පොළොම්මාරුවේ 2.
පෝරඹ වලව්ව 154.
පෝල්කේරස් පඬි 142.
පෝහද්දරමුල්ල 124.
පැග්ඩන් මහතා 128.
පැපලියානේ නායක ස්ථවිර 69.
පැරලියේ ජිනරතන 33, 48-9. 52, 79, 104-5.
පැල්පොලධම්මදස්සී 71, 99, 100.
පැල්මඩුල්ල 3, 86-7, 129
—පොත්ගුඩිය 121.
—විහාරය 71.
—ශ්‍රී සුමංගල 126.
පැලියගොඩ 91.

පැලෑනේ ධම්මානන්ද 121.
ප්‍රතාපසිංහ රජ 142.
ප්‍රද්‍යුම්නකුමාර් බහදූර් 162.
ප්‍රන්සිස් ද සොයිසා රාජනීතිඥ 111.
ප්‍රභාෂෝදය සඟරා 90, 185, 220.
ප්‍රිස්ඩන් කුමාරයා 129
ඵුස්සදෙව 6.

බ. භ.

බ්ලවැට්ස්කි මැතිණිය 75, 138.
බ්ලුමැන්ඩල් පාර 182.
බටපතේ වාදය 153.
බටපොළේ කල්‍යාණතිස්ස 35, 48, 49, 80, 83.
—ධම්මපාල 178.
බටුවන්තුඩාවේ පඬි 69, 71, 94, 98, 127, 144. 165, 180-2.
—අධිනීතිඥ 183
බත්තරමුල්ලේ පුඤ්ඤජි 133.
බද්දේගම වාදය 76.
—සරණංකර 71.
බදුරලියේ සිරානන්ද 72.
බඹරගල විහාරය 89.
බඹරැන්දේ රතනපාල 20.
බරුවා, බී ඇම් 156-8.
බල්රාම්පුර් 164.
බලපිටියේ ගුණරතන 48:
—සුභද්‍රාරාමය 125.
බලබෝවේ විහාරය 171.
බලල්ලේ වාදය 153.
බස්තියන් මැන්දිස් ගුණසේකර 114, 125.
බස්නායක වලව්ව 125.
බංකුවාද විභංගය 176.
බාරසකාව්‍යගභී චක්‍රය 8, 9.
බී. ගුණසේකර මුදලි 198.
බුද්ධදත්ත මාහිමි 63.
බුද්ධධර තෙර 68.
බුද්ධරක්ඛිත රාජගුරු 32.
බුද්ධවංසසාරදස්සී 31.
බුද්ධසිරිතිස්ස 111.
බුරුම අගබිසොව 115.
බුලත්ගම සිරිසුමනතිස්ස 60, 73, 74-5-6-7, 86-7, 94-6-9, 102-3, 114.
—ධම්මාලංකාර 132.
බූස්සේ සද්ධාතිස්ස 99, 177.
බෙන්තර අත්ථදස්සී 64, 68, 76, 96, 99, 117, 132.
—ගඟ 140.
—වනවාස විහාරය 64-6.
බෙලිගම්මන 172.
බෙලිවත්තේ පඤ්ඤාසාර 41.
බෙලිගහවත්ත 110.
බේරතුඩුවේ ධම්මාධාරතිස්ස 25.
බේරුවල මහතෙර 123.
බෝධිමළු විහාරය 64, 65.
බෝධිරුක්ඛාරාමතිස්ස 30, 32.
බෝගහගොඩැල්ලේ විහාරය 168.
බෝදුදුර දිනෙස් සිල්වා 28.
බෝගහපිටියේ ධීරක්ඛන්ධ 47.
—ධම්මජෝති 45, 46, 52.
—සරණපාල 74.
—සීලක්ඛන්ධ 47.
බෝගහවත්තේ ස්ථවිර 35, 83, 89.
බෝපාගොඩ නායකමාහිමි 50, 53-4-5-6, 60-2, 73, 121-3.
බෝපිටියේ සීලවංස 132.

බෝවල ධම්මානන්දනාහිමි 7, 10, 11, 21-2, 34-9, 40, 179.
බෞද්ධධර්මාංකුර සභා 162-3.
බෞද්ධ සහෝදරයා 100-9.
බැදිගම රතනපාල 151-153.
බැදිගම සෝභිත 102-4.
බැලගම සුබෝධානන්ද 153.
බ්‍රවුන්රිග් ආණ්ඩුකාර 7.
බ්‍රාහ්මණවත්තේ ජිනපාල-තිස්ස 23.
බ්‍රාහ්මණාරාමතිස්ස 30.
බ්‍රෙස්ලෝ විශ්වවිද්‍යාලය 190.
භගවාන්චන්ද්‍ර රාජගුරු 158.
භුවනෙකබාහු (සවෙනි) රජ 36.
භූමිපාල (සියම්) රජ 131.


## ම.


මකලාන්දුවේ මේධංකර 168.
මංගල ඤාණාගාර 23.
මඩිතියවෙල සුමංගල 159
මඩිගේ සිරිසුමිත්ත 19.
මණිමාලාලංකාරතෙර 31, 51.
මණිචන්ද්‍ර චන්ද්‍රනන්දිරජ 164.
මණ්ඩලාරාමය 57, 58.
මදලේනා උපාසිකා 21.
මන්ඩලේ නුවර 99, 114-9
මයිලවැවේ ඤාණකසථවිර 33.
මලිගස්පේ මංගලනාහිමි 68, 88, 89, 96, 132, 182-4
මහඅරුග්ගොඩ 70.
මහකැරුව 21, 109.
මහගොඩඤාණිස්සර 164.
—ධම්මදස්සී 96.
—ඤාණකසථවිර 165.
මහවලතැත්තේ දිශාපති 19.
මහාඅතුලවේයන් 174.
මහාකප්පිනමුදලින්ද්‍රාරාමය 124.
—වලව්ව 110, 129.
මහාවක්‍රීතැව 77.
මහානාමසිරිවද්දන 151.
මහාමංගලසීමාව 31, 51.
—සමුද්‍රාරාමය 39, 120-2-3.
මහාමනානන්දපිරිවෙණ 153.
මහාමුනි පිළිමය 31.
මාගධිකා සඟරාව 135, 176.
මාගල්ලේ පඤ්චතොට 48.
මාජුවාතේ සිඬාණී 167.
මාතලේ රතනජෝති 93.
මාතර ධම්මාරාමනාහිමි 20, 44, 48, 104, 117.
—නිකාය 47, 104.
—සරණපාල 25.
මාදම්පාමෝදර 61, 121-3.
මාදම්පේ 63.
—ගුණරතන 121.
—සිරිවඩ්ඪනාරාමය 69.
මාදිලිගමතෙර 33.
මාතෘභූතේශ්වර ශර්මී 145.
මාපිටිගම බුද්ධරක්ඛිත 90.
—ධම්මරක්ඛිත 146.
මාබඩ ගුණරතන 171.
මාබොට්ටුවන සිඬාණී 165.
මාර්ච් දේවගැති 185.
මාලිම්බඩ මහතෙර 3.
මාලේවන සෝභිත 71.
මාවැල්ලේ ගුණානන්ද 141.
—ධම්මානන්ද 64, 132.
මිගෙට්ටුවත්ත 136.
මිණිවන්ගොඩ පරමානන්ද විහාරය 73-5-7
මිදිගම ධම්මානන්ද 28.
මිනැයෝෆ් පඬිතුමා 141.
මිරන්දාරාමය 123.

මිරිස්වත්තේ මේධානන්ද 35, 48.
මිරිස්සේ ධම්මානන්දමාහිමි 28, 50, 57, 78-9, 86, 132-3-4-5, , 112-3-7-8-118, 121, 141.
මිරිස්සේ ගුණසාර 187.
—සංඝරක්ඛිත 47, 48
මිරිපැන්නේ පඤ්ඤාරාමය 18.
—ප්‍රබන්ධ 17, 18, 182.
—ධම්මරතන 8, 12, 17, 171 179, 180, 187.
මුග්ධ බෝධසත්තය 119
මුනින්දඝෝස මහතෙර 23.
මුංකොටුවේ අභයසිංහ 14.
මේධානන්දධජමාහිමි 34, 36, 37, 38.
මෙත්ඩුන් මහරජ 49.
මේරි සෙඩ්ලොක් 195.
මේෂත් නඩුකාරතැන 75.
මොරගල්ල 139.
—බුද්ධසිරිතිස්ස 134.
මොරතොට ධම්මක්ඛන්ධ 13.
—වත 14.
මොරටුවේ මේධානන්ද 174.
මොහොට්ටිවත්තේ ගුණානන්ද 75, 127, 136-7, 171.
මෝල්මෙයින් නුවර 150.
මැකැන්සි ආණ්ඩුකාර 185.
මැද්දේපොල විහාරය 1.
මැදගම දෙවමිත්ත 152.
—රේවත 72.
මැදවල රතනජෝති 14.
මැන්චැස්ටර් ගාඩියන් පත්‍රය 194.
—විශ්වවිද්‍යාලය 193.
මැත්දිස් ගුණසේකර මුදලි 128, 197.
මැලෑගොඩ ගුණරතන 93.
මෞතික් නුවර 196.
ම්‍රම්මවංශ විනිශ්චය 29.


ය.


යකිරල මහාස්වාමි 96.
යතලබ සඟරා 180.
යාත්‍රාමුල්ලේ ධම්මාරාම 64, 117, 131-4, 160, 191.


ර.


රණසිංහ, වි. ජෙ. 146.
—මුදලි 13.
රත්ගම රාජාරාමය 56.
—මණ්ඩලාරාමය 58.
—සිරිසුමන 28, 122.
රත්නචෛත්‍යය 131.
රත්තපාල මහාස්වාමි චරිතය 153.
රත්මලානේ ධම්මාලෝකමාහිමි 71, 88, 92-1-2, 145-7, 152, 198.
—ධම්මාරාමමාහිමි 145, 198.
—පුරාණවිහාරය 71, 88, 90, 91-2, 171.
රතනකොසින්ද නුවර 68.
රතනපුරය 30, 37.
රතනාපුණ්ණනුවර 55, 84, 99. 100-1-2-7.
රතනභූමිරම්ම විහාරය 46.
රත්කොත් විහාරය 120, 151.
රත්දූනු බස්නායක 90.
රත්දෙඹේ ධම්මාලංකාරමාහිමි 120-3,
—ධම්මජෝති 121.

රත්වැල්ලේ විහාරය 77.
රත්නෑගොඩ ධම්මදස්සී 11.
රඹවල වාදය 153.
රඹුක්වැල්ලේ සිද්ධාර්ථ 158.
රය්ස්ඩේවිඩ්ස් පඬි 115, 131, 132, 133, 141.
රවිවංසකිත්තිසුරාමච්ච 46.
රවීන්ද්‍රනාත් තාගෝර් 159, 160.
රාජපක්ෂ මුදලි 27, 29.
රාජප්‍රශස්ති 142.
රාජරාජේශ්වර ප්‍රශස්ති 143.
රාජාධිරාජසිංහ 5, 10, 14, 15, 16.
රාධාකෘෂ්ණන් පඬි 103.
රාමඤ්ඤරට 35, 36.
—නිකාය 76.
රාස්විහාරී මුඛෝපාධ්‍යාය 142.
රාහුල සංඝානුශාසක 173.
රිදී විහාරය 1.
රිවිරැස පත්‍රය 1[illegible]8.
රෑණහාමිනේ 27.
රූපසිංහ ඇම්. ඩී. සිල්වා 125.
රොබර්ට් චාමර්ස් 130, 172.
—විල්මට් හෝර්ටන් 53.
—ලුවිස් ගුණවර්ධන 79.
රෝස්ට් මහතා 128.
රුකව ධම්මසාර 48.
රුත්ගුත් නුවර 32, 82.
—වරාය 30, 36.

## ල.

ලක්මිණිකිරුළ 138.
ලක්මිණිපහන 150, 183.
ලක්රිවිකිරණ 79, 80, 201.
ලක්ෂපතියේ ක්ෂෙත්‍රාරාමය 174.
ලන්ඩන්මහාවිද්‍යාලය 192-4.
ලබුගම ලංකානන්ද 14.
—සෝණුත්තර 72.
ලංකාලෝකපත්‍රය 76, 97.
ලංකාගොඩ ධීරානන්ද මහාස්වාමි 53-4-5-6-8, 62-3, 74, 121-3-4-7.
ලංකාහිතව විශ්‍රැතයන්ත්‍රාලය 183.
ලංකොපකාරයන්ත්‍රාලය 76, 78, 96.
ලිවේරාමුදලි 186.
ලී මහතා 128.
ලුණුපොකුණේ ධම්මානන්ද 148, 170-2
ලුයි විජයසිංහ මුදලි 95.
ලුවිස් ද සොයිසා මහමුදලි 111.
ලේතීෂයානෝ 172

## ව.

වණේගොඩ ධම්මකුසල 35
වජිරසෝමතෙර 41.
වජිරඤාණ මහරජ 77, 115, 142.
—සංඝරාජ 51.
වජ්‍රාරාමික මහතෙර 97, 115, 119, 174.
වජ්‍රඥාන නායකහිමි 41.
වටගෙදර විහාරය 39.
—සුධර්මාරාමය 20.
වත්තේගම නායකහිමි 20.
වතුගෙදර මුදලිඤුරාමය 122
—අමරසීහතෙර 78.
වතුරාවිට සුමනසාර 125

වතුරේගම ධම්මධාරතිස්ස 23, 25, 26.
වනරතන භික්ෂු 55, 57, 99.
වනවාස විහාරය 202.
වරාගොඩ වාදය 138.
වරාවත්තේ වාදය 153.
වරාපිටියේ සුගතපාල 133.
වල්පල ගුරුන්නාන්සේ 11, 28
වල්පිට සුමනතිස්ස 38, 48.
වල්පොල මහතෙර 28.
වලගෙදර ධම්මදස්සී 8.
වලල්ලාවිටි කෝරළේ 122, 164, 165.
වලස්මුල්ලේ වාසිවාදය 153.
වලානේ ධම්මානන්ද 165.
—විහාරය 71.
—සිද්ධාර්ථ මහාස්වාමි 64, 69, 70, 88-9, 93, 133, 182-4.
වස්කඩුවේ අභිනවාරාමය 127, 129-30.
—සරණපාල 57.
වාගීශ්වරධර්මාධාර 98.
වායාම ස්ථවිර 82.
වික්ටෝරියා අධිරාඥිය 75, 140.
වික්‍රමරත්න මුදලි 111.
විජයසුන්දරාරාමය 172.
විජයශ්‍රීවර්ධන මුදලින්දාරාමය 28
විජයානන්ද විහාරය 101.
විජේනායක ලොකුමහතා 167.
විජේසිංහ අප්පුහාමි 5.
විදුරුපොල රතනජෝති 46.
විද්‍යාභූෂණ පඬි 157.
විද්‍යාලංකාර පිරිවෙණ 90, 144, 170-1-2
විද්‍යානන්ද පිරිවෙණ 202.
විද්‍යාරත්න පිරිවෙණ 172.
විද්‍යාවර්ධන පිරිවෙණ 172.
විද්‍යාරවින්ද සඟරා 72.
විද්‍යෝදය පිරිවෙණ 92-5-7, 165-6.
විධුශෙඛරභට්ටාචාර්ය 159, 160, 161.
විපස්සී භික්ෂු 67.
විමලධර්ම රජ 4.
විමලධීරතිස්ස 111.
විමලගුණවර්ධන මුදලි 148.
විමලජෝති භික්ෂු 55.
විමලසාරතිස්ස මාහිමි 109, 110, 111
විමලාවරත්ලාභ මහතා 173
විමොක්ඛ මහතෙර 41.
විල්හෙල්ම් ගයිගර් පඬි 196.
විලියම් හැන්රි ග්‍රිගැරි 130.
විලේගොඩ පුඤ්ඤසාර මාහිමි 33, 52, 117
විශ්වනාථශිවාචාර්ය 146.
විශ්වප්‍රකාශය 142.
විශුද්ධාචරිය තෙර 68.
විසුංගාම සීමාව 100.
විහාරගොඩ සෙලුත්තරාරාමය 122
වීරගුලේ ගුරුතුමා 28, 45, 78, 80.
වීරසිංහ අප්පුහාමි 144.
වීරසූරිය, පී. ඩී. ඇස්. 28, 187.
වෙංකටරංගනාථ ස්වාමි 142.
වේනිමාධව බරුවා 163, 173.
වේරගම පුංචිබණ්ඩාර 95.
වේරගම්පිට නන්දාරාම 8
—විහාරය 3, 5, 9.
වේරගොඩ බුද්ධරක්ඛිත 165, 167

වේරගොඩ සොණුත්තර 167.
—ක්ෂේත්‍රාරාමය 167.
වේරතෑර සොභිත 71.
වේල්ස්කුමාර විද්‍යාලය 174, 202.
වේකැල්ලේ ධම්මදින්න 2, 4, 15, 16, 65.
වැරැල්ලාතේ පඤ්ඤතිස්ස 149.
—සාමිදරුවෝ 106.
වැලිකන්දේ සුදර්ශනාරාමය 45, 120-3.
—සුමංගල මාහිමි 129.
වැලිකොන්දේ ධම්මරතන 35, 36-7-8, 48, 83.
—පඤ්ඤතිස්ස 35.
වැලිකැටැල්ලේ මහතෙර 71.
වැලිගම ධම්මපාල 99.
—සංඝානන්ද 174.
වැලිගම ශ්‍රී සුමංගල 49, 64, 87, 108, 114-6-8-9, 141, 149, 155, 174.
වැලිතර මාදුගහ 53.
—ඤාණවිමලතිස්ස 52-3.
වැලිපටන්විල දීපංකර 176.
—සරණතිස්ස 177.
වැලිවේරියේ සිරිවඩ්ඪන විලච්ච 11.
වැලිහිටියේ සුමන 20.
වැව්ගොන්නේ විපස්සි 152.
වැවපරම්පරාව 64.
—ඉන්දසාර 64.
වැල්ලබඩ චන්දජෝති 121.
වැවල ගංගාරාමය 165.

## ශ. ෂ. ස.

ශබ්දනුශාසනය 198.
ශාන්තිනිකේතනය 159, 160, 162.
ශාස්ත්‍රාලංකාර සඟරා 12, 180.
ශීලස්කන්ධ මාහිමි 140, 177.
ශෛලබිම්බාරාමය 53-4, 76, 81-5-6, 108, 113-6, 140-2.
ශ්‍රීනිවාස ප්‍රියදර්ශී 169.
ශ්‍රීවික්‍රමරාජසිංහ 66
ශ්‍රී ධර්මාධාර රාජගුරු 160-2.
ශ්‍රී සුමංගල චරිතය 93-6, 118
—ධර්මශාලාව 169
ෂ්වේදංගුං මහසෑය 82, 85.
ස්ටිඩ් පඬිතුමා 194
ස්වැන්සලර් පඬි 190.
ස්පැන්ස් හාඩි 191.
සච්චම්බුගෙසි කර්ලිනා 17.
සතීශචන්ද්‍රවිද්‍යාභූෂණ 95, 142, 158, 166.
සත්‍යසමුච්චය සඟරා 92, 184
සද්ධම්ම මහතෙර 81-2-4-5, 102-4.
සද්ධම්මවර ජෝතිපාල 104.
සද්ධම්මයුක්තික නිකාය 47, 48. 117
සද්ධම්මවංස නිකාය 55-6, 121.
සද්ධර්මාකරපිරිවෙන 143.
සදම්මිණ පත්‍රය 47.
සපුගහගොඩ 46.
සපුගොඩ සිඩාඊව් 11.
සබරගමුවේ ධම්මපාල 125.
සමය සඟරාව 96.
සමරකෝන් ලොකුහාමිනේ 5.
සමරනායක මුදලි 33.
සමරසිංහ කවිරත්න 72.
සමෝගාභවිනෝදනී අත්වල යොජනා 78.
සයිමන් ද සිල්වා මුදලි 90, 198

සර් ආතර් බ්ලේක් 120.
සර් උභයසේකර 186.
සර් හාකට් බට්ලර් 163.
සර් හැරී දියස් 186.
සර් හ්‍යුක්ලිෆර්ඩ් 169.
සරණංකර සංඝරාජ 1, 4, 13,
15, 20, 28.
සරණපාල සළුවිර 61.
සරණපාල සීලක්ඛන්ධ 126-7.
සරණපාලාරාමය 51.
සරම් මුදලි 10, 11, 12, 18,
179.
සරසවි සඳරැස 96.
සරස්වතී මණ්ඩප 143, 177.
සලමොන් ද සොයිසා
අප්පුහාමි 60.
සලමොන් ඩයස් බණ්ඩාරනායක
120.
සලෝ උපාසක 40.
සව්සත්දම් වාදය 12, 18, 179.
සහබන්ධු මුදලි 21, 22.
සංඛපාල විහාරය 6.
සංඝතිස්ස 29, 31.
සංඝරක්ඛිත 90.
සංඝරාජසාධුචරියා 3.
සංයුක්ෂයංතෝ-කුමාර මහ
—තෙර 174.
සාධුජනපූරණී 150.
සාමියෙල් ද සිල්වා අබේසේකර
154.
සාරාත්ථ මඤ්ජූසා 170.
සාරාත්ථප්‍රදීපිකා සඟරා 183.
සාසනවංසදීපය 109, 110.
සාසනවංසප්පදීපිකා 23.
සාලිඇලේ මණිරතන 11.
සිට්නාමලුවේ ධම්මජෝති 2, 4
—ධම්මාරාම 19.
සිද්ධාර්ථ භික්ෂු 67.
සිද්ධාර්ථ සුමංගල මාහිමි 147.
සිද්ධාන්ත දර්ශනය 201.
සිද්ධාන්තදීපිකා 178.
සිත්තපට්ටනම 30.
සිප්කඩුවේ සිරිසුමංගල 69, 137
සිම්බලී ආවාසය 111.
සියඹලාකටුවේ අත්ථදස්සී 152.
සියබස් මල්දම 11.
සිරිදියෙස් ගුරුතුමා 72, 149.
සිරිධම්මක්ඛන්ධ රාජගුරු 31.
සිරිනන්දසූර ඇමති 30, 51.
සිරිසිද්ධත්ථාරාමය 72.
සිරිසුමනතිස්ස 53-4-9, 60, 61.
සිලෝන් හැරල්ඩ් පත්‍රය 185.
සිංහල කවීන්ද්‍රයෝ 187.
සිංහල මිත්‍රයා සඟරාව 14.
සීගිරිය සෙවීම 191.
සීනිමෝදර සාරානන්ද 44
සීමානයදප්පණ 121.
සීමාලක්ඛණදීපනී 110.
සීමාලංකාර සංග්‍රහ 140.
සීමාසංකර වාදය 52-6-7, 112
සීලක්ඛන්ධ තෙර 55, 200.
සීලානන්ද තෙර 140.
සුගතබිම්බාරාමය 151.
සුගතවිදත්විධානය 142
සුගතශාසනෝදය පිරිවෙණ 111
සුදර්ශන ධර්මශාලා 86.
සුදර්ශන පරමානන්ද විහාර 94.
සුධම්ම තෙර 38.
සුධර්මශාලාව 41.
සුනන්ද භික්ෂු 74.
සුනන්දාරාමය 79.
සුබෝධාරාමය 39, 151.
සුබෝධිකාටීකා 98.
සුභූති මාහිමි 126-9, 130, 193.
—(සියම් තෙර) 68.
සුමන තෙර 29, 177.

සුවණ්ණගුහා සීමා 23, 41-6.
සුසෙව් ද සොයිසා මුදලි 119.
සූරියගොඩ සොණුත්තර 72.
සෙනෙවිරත්න මුදලි 45.
සෙලෙස්තිනා රාජකරුණා 183.
සෙලුත්තරාරාමය 121.
සොණුත්තර මහතෙර 168.
සෞගත විද්‍යාලය 120.
සැම්සොන් රාජපක්ෂ මුදලි 111, 124.

හ.

හක්මන ඉන්දසාර 44.
—සීලරතන 48.
හත්වෙති ඇඩ්වඩ් 127.
හයිඩෙල්බර්ග් නුවර 201.
හංසදූත කාව්‍යය 142
හංසාවතී නුවර 32, 36, 51, 81-2-3-4, 99.
—සද්ධම්මමහතෙර 115.
හාවඩ් විශ්වවිද්‍යාලය 193.
හික්කඩුවේ තිලකාරාමය 93.
—ශ්‍රී සුමංගල 3, 62, 71, 76, 87, 92, 120, 148, 164, 168-9 184.
—සුමනතිස්ස 44, 48, 117, 118.
හිඟුල්වල ජිනරතන 72.
හිත්තැටියේ විහාරය 10, 64.
හිප්පොල සෝභිත 152
හුණුපිටියේ ගංගාරාමය 137.
හුණුවල සාගත 46.
හෙට්ටිආරච්චි, ඩී. ජේ. 185, 200, 202.
හෙට්ටිගොඩ සුමංගල 8.
හේනකඩුවේ ධම්මරතන 47.
හෙයියන්තුඩුවේ නායක ස්ථවිර 154.
හොරේතුඩුවේ ගංගාරාමය 151.